# කාර්ය සාධන වාර්තාව

# 2018

ප්‍රධාන ලේකම් කාර්යාලය

සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

උතුරු මැද පළාත් සභාව

අනුරාධපුර

+94252222238/+94252225295/ncpplanning@yahoo.com

# කාර්ය සාධන වාර්තාව - 2018

## සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## උතුරු මැද පළාත

## 2018

**මග පෙන්වීම**
ප්‍රධාන ලේකම් උතුරු මැද පළාත - එච්.එම්.පී.බණ්ඩාර මයා
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) - පී.බී.දයාරත්න මයා

**නිර්මාණය සැකසීම හා අධීක්ෂණය**
සහකාර ලේකම් (සැලසුම්) - කේ.ඒ.නොයෙල් මයා

**සහාය**
සංවර්ධන නිළධාරි - එච්.එම්.එන්.පී.හේරත් මෙය

## ප්‍රධාන ලේකම්තුමාගේ පණිවිඩය



2018 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව එළි දක්වන මේ අවස්ථාවේ පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම ඉමහත් සතුටට කරුණකි. 2018 වර්ෂයේ උතුරු මැද පළාතේ සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවමින් අපේක්ෂිත ඉලක්ක කරා පළාත රැගෙන යාමට කටයුතු කිරීමට හැකිවීම විශේෂ කොට සලකමි.

2018 වර්ෂයේදී ද පළාත් සභාව ප්‍රධාන කාර්යයන් 39 ක් ඔස්සේ සංවර්ධන ක්‍රියාවලිය මෙහෙය විය. අධ්‍යාපන, සෞඛ්‍ය, කෘෂිකර්මය, ප්‍රාදේශීය සංවර්ධන, වාරිමාර්ග, පශු සම්පත්, සමාජ ආරක්ෂණ හා සමාජ සුභසාධනය, ග්‍රාම සංවර්ධනය, පරිවාස හා ළමා රක්ෂණ සේවා, මාර්ග සංවර්ධන යන අංශ මගින් පළාතේ සැලසුම්ගත සංවර්ධන කාර්යය සඳහා කැපී පෙනෙන දායකත්වයක් සැපයීමට හැකිවිය.

මධ්‍යම රජය, මධ්‍යම රජයේ රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු , පළාත් අරමුදල් හා වෙනත් විදේශීය අරමුදල් යටතේ පළාත් සංවර්ධන කාර්යය වඩාත් කාර්යක්ෂමව මෙන්ම ඵලදායීව ඉලක්කගත අරමුණු ළඟාකර ගැනීම සඳහා පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා වෙනත් අනුබද්ධිත ආයතන මනාව මෙහෙය විය හැකි වූ වසරකි. ඒ නිසාම අපේක්ෂිත ඉලක්ක සාධනය කර ගැනීම සඳහා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් අනුබද්ධිත ආයතන මනා අභිප්‍රේරණයකින්, කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම සඳහා මග පෙන්වීමට හැකිවීම තුළ 2017 වර්ෂයට සාපේක්ෂව ඉහළ කාර්ය සාධනයක් කරා පළාත රැගෙන යාමට හැකි වූ බව විශ්වාස කරමි.

විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාගේ මත් උවදුර මැඩලීම, දිළිඳුකම පිටුදැකීම, සමාජ රැකවරණය තහවුරු කිරීම, යහපාලන සංකල්පය සමාජගත කිරීම වැනි ප්‍රමුඛ අභිමතාර්ථයන් සාධනය කර ගැනිම කෙරෙහි අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ප්‍රතිපාදන යොදවමින් ඒ සඳහා ප්‍රමාණවත් ආරම්භයක් ලබා දීමට හැකි වූ වර්ෂයක් ලෙස දකිමි.

විශේෂයෙන්ම පළාත් අධ්‍යාපන අංශය නගා සිටුවීම කෙරෙහි අභියෝගයක්ව පැවති භෞතික සම්පත් වල ඌනතාවය සැලකිය යුතු ප්‍රමාණයකින් මගහරවා ගැනීමට අධ්‍යාපන විශේෂ ව්‍යාපෘතිය තුළින් ලද සහය සිහිපත් කරන අතර උතුරු මැද පළාතට දැවැන්ත සමාජ ගැටළුවක්ව පවතින වකුගඩු රෝගය නිවාරණය සඳහා විවිධ වැඩසටහන් කිරීමට ද හැකි විය.එපමණක් ද නොව මේ වන විටත් වකුගඩු රෝගයෙන් පිඩා විඳින හා ප්‍රතිකාර ලබා ගැනිම සඳහා පැමිණෙන්නන්හට සුභසාධනය සැලසිම අරමුණු කොට ඉදිකරන ලද **“මෙත් සිරි සෙවන ”**ව්‍යාපෘතිය ජනතා සුභසිද්ධිය උදෙසා විවෘත කොට ලබා දිමට හැකිවිම ද ලද විශාල ජයග්‍රහනයකි.

සමස්තයක් ලෙස බලන විට 2018 වර්ෂය වඩාත් ඉලක්කගත සංවර්ධන වැඩසටහනක් සැලසුම් සහගතව ක්‍රියාත්මක කළ හැකි වූ මෙන්ම 2017 වර්ෂයට සාපේක්ෂව පළාතට ජයග්‍රහණ රැසක් අත්කර ගැනීමට හැකි වූත් සාර්ථක වර්ෂයක් ලෙස සිහිපත් කරන අතර 2018 වර්ෂයේ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ගරු පළාත් ආණ්ඩුකාරතුමාගේ හා අමාත්‍යාංශ ලේකම්වරු, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් විසින් ලබාදුන් සහයෝගය තුළ මෙම සියළු ජයග්‍රහණ ලබාගත හැකිවූ බවට සිහිපත් කරමි.

එච්.එම්.පී.බණ්ඩාර,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත් සභාව,අනුරාධපුර.

## නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) තුමාගේ පණිවිඩය



භූමිය වශයෙන් විශාල ප්‍රදේශයක පැතිරී පවතින උතුරු මැද පළාත, තිරසර සංවර්ධනය,පරිසර,සමාජ හා ආර්ථික යන කරුණු ඔස්සේ සලකා බලන විට ඉතාම වැදගත් වූ පළාතක් ලෙස සඳහන් කළ හැකිය. ප්‍රදේශයට වාර්ෂිකව ලැබෙන අඩු වර්ෂාපතනය එල්ලංගා තුළ පිහිටි වාරිමාර්ග පද්ධතිය තුළින් රටට අවශ්‍ය බත සහ අනෙකුත් ධාන්‍ය, එළවළු හා පළතුරු සපයන වාසනාවන්ත ප්‍රදේශයකි.

2018 වර්ෂය තුළ පළාත් සභාවේ සියළු ආයතන සමස්ත සංවර්ධනය සඳහා අනෙකුත් පාර්ශව හා ඒකාබද්ධව ඉටු කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල කාර්ය සාධනය ඉදිරිපත් කිරීම සතුට දනවන කරුණකි.

අධ්‍යාපන, සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ, කෘෂිකර්ම හා සත්ත්ව නිෂ්පාදන, මාර්ග පද්ධතිය තුළ සැලකිය යුතු සංවර්ධනයක් ඇති කිරීමටත්, පළාතේ ආදායම් උත්පාදන මාර්ග පුළුල් කිරීමටත් ,පළාත් සංචාරක අංශයේ සංවර්ධනය උදෙසා අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සැලකිය යුතු මට්ටමකින් සංවර්ධනය කිරීමටත් පළාතේ ජනතාවට අවශ්‍ය පිරිසිදු පානීය ජලය ලබා ගැනීම සඳහා පානීය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පළාතේ ප්‍රබල ගැටලුවක්ව පවතින වකුගඩු රෝග නිවාරණ කටයුතු සඳහා හැකි පමණින් දායකත්වය සැපයිමටත් හැකිවු වසරක් ලෙසද සඳහන් කරමි.

තවද විදේශ අරමුදල් යටතේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධීකරණය කරමින් සමස්ත පළාත් සංවර්ධන වැඩසටහන නියාමනය හා ඇගැයුම් කරමින් සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට හැකි විය.

පළාතේ සංවර්ධන ක්‍රියාවලිය තිරසර පදනමක් තුළ ක්‍රියාත්මක කිරිම සඳහා අවශ්‍ය පළාත් සැලස්ම සකස් කිරිමේ කාර්යය ''තිරසර, ඒකාබද්ධ ප්‍රතිඵල පාදක සංවර්ධන සැලැස්ම''නමින් වසම් මට්ටමින් තොරතුරු ලබාගෙන පළාත් සැලසුම සැකසීමේ කටයුතු අවසන් අදියරට ගෙන ඒමට හැකි විය.


පළාතේ සමස්ත සංවර්ධන ක්‍රියාවලියේදී ගරු ආණ්ඩුකාරතුමා, ප්‍රධාන ලේකම්තුමා, අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින් හා ප්‍රාදේශීය ලේකම්තුමන්ලා ඇතුළු රාජ්‍ය ආයතන හා සංවිධාන ද ප්‍රජා දායකත්වය ද සපයමින් පළාත් සංවර්ධන කාර්යය ශක්තිමත්කර ගැනීම සඳහා දායකත්වය සැපයු සියළු දෙනාටත්, මෙම කාර්ය සාධන වාර්තාව පිළියෙල කිරීම සඳහා දායකත්වය දැක්වූ මෙම ආයතනයේ හා අනෙකුත් ආයතනවල නිලධාරීන් ද ගෞරවපූර්වකව සිහිපත් කරමි.

පි.බී . දයාරත්න,

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( සැලසුම් ),

ප්‍රධාන ලේකම් කාර්යාලය,උතුරු මැද පළාත.

# උතුරු මැද පළාත පිළිබඳව සැකෙවින්....





රජරට නුවරකලාවිය නොහොත් වැව් බැඳි රාජධානිය ලෙස විරුදාවලිය ලද උතුරු මැද පළාත, ශ්‍රී ලංකාවේ ප්‍රථම සහ ද්විතීය රාජධානි ඇතුළත් වූ අතිශයින්ම පුණ්‍යවන්ත වූ ස්වර්ණ භූමියකි.

අනුරාධපුර සහ පොළොන්නරුව ලෙස වර්තමානයේදී භාවිතාවන පරිපාලන දිස්ත්‍රික්ක දෙකෙන් සමන්විත උතුරු මැද පළාත එයටම ආවේණික, අනන්‍ය, අද්විතීය අගයන්ගෙන් හා ශ්‍රී විභූතීන්ගෙන් සමන්විතය. අග්‍රගණ්‍ය සහ අසමසම අගයන් හා ජාතික උරුමයන් රැසක් දැයට දායාද කරමින් එම පෞඩත්වය මිහිදන්ව සහ ඇතැම් විට ඉස්මතු වී පෙනෙමින් ශ්‍රේෂ්ඨ ජාතියක විශ්මයජනක ගමන් මඟ යළි යළිත් සුජාතවන පරපුරට නිහඬව කියා දෙයි. සිංහල රාජ්‍ය වංශකතාව, ශිෂ්ටාචාරය හා සංස්කෘතියේ ප්‍රභවය හා විකාශනය මෙන්ම සිදු වූ ප්‍රවණතා පිළිබඳ සැලකීමේදී ශ්‍රී ලංකාව සංවර්ධිත රටක් බවට පත් කිරීමේදී ඒ සඳහා අවශ්‍යවන ඓතිහාසික ශක්තිමත් අඩිතාලම රජරටින් සපයයි.



ශ්‍රී ලංකාවේ ජනාවාසකරණය, ජල ශිෂ්ටාචාරය, රාජ්‍ය වංශ කතාව, දේශපාලනය, කළමනාකරණය හා පරිපාලනය, බෞද්ධ දර්ශනය, පුරාවිද්‍යාව-වාස්තු විද්‍යාව, මූර්ති හා කැටයම් කලාව, භාෂාව හා සාහිත්‍ය ආදී සංස්කෘතිකාංග මෙන්ම ඒ මත ගොඩනැගුණු ශිෂ්ටාචාරයන් හා සභ්‍යත්වයන් ලොවට කියාපාන්නේ රජරට පුණ්‍ය භූමියෙන් ය. නවතම ප්‍රතිපත්ති, සැලසුම්, ක්‍රමෝපායන් සහ තාක්ෂණය සොයා අප යා යුතු වන්නේ රජරට පැවති ශ්‍රී විභූතිය වෙතට ගමන් කිරීමෙනි.




ක්‍රි.පූ. 543 දී පමණ එනම් සම්බුද්ධ පරිනිර්වාණ දිනයේදීම සිදු වූ විජයාවතරණයෙන් පසු අනුරාධ නම් සෙනෙවියෙකු අනුරාධ නැකතින් මල්වතු ඔය අසල අනුරාධපුර ජනාවාසය ආරම්භ කරන ලදී. ක්‍රි.පූ. 4 දී පමණ ජෝතිය නැමැති ජෛන බමුණකුගේ සැලසුමකට අනුව පණ්ඩුකාභය රජතුමා විසින් අනුරාධපුර නගරය නිර්මාණය කර ඇත. එම නගර නිර්මාණය වර්තමානයේදී අගනගර නිර්මාණයේදී අනුගමනය කරනු ලබන අංගෝපාංග බහුතරයකගෙන් සමන්විත වී තිබීම විශ්මයජනකය.

පොළොන්නරුව මුලින්ම අගනුවර කරගත්තේ චෝල ආක්‍රමණිකයන් විසින්ය. ක්‍රි.ව 1070 පමණ චෝල ආක්‍රමණිකයන් පළවා හැර පළමුවන විජයබාහු රජු විසින් අගනුවර ලෙස පොළොන්නරුව තෝරා ගෙන ඇත. චෝල පාලන සමයේදී ජනනාතමංගලම් ලෙස හැඳින් වූ පොළොන්නරු යුගය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දී ශ්‍රී ලංකාවේ කැපී පෙනෙන වකවානුවකි.

අනුරාධපුර මෙන්ම ජල ශිෂ්ටාචාරය මත පදනම් වූ මෙම යුගය විශ්මිත කලා නිර්මාණ හා භාෂා සාහිත්‍ය අතින්ද ස්වර්ණමය යුගයකි. එම කාලයේදී මෙරටින් පිට රටට පවා සහල් යැවූ බව පැරණි පොත පතෙහි සඳහන් වේ.



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන සංශෝධනයට සමගාමීව 1987 අංක 42 දරණ පළාත් සභා පණතින් සැලසුණු අවකාශයට අනුව ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත විය. මේ අනුව යහපාලන සංකල්පයට අනුගත වීම රජයේ ප්‍රධාන අරමුණක් වන අතර ඊට අනුව යමින් ශ්‍රී ලංකාවේ දේශපාලන හා පරිපාලන ව්‍යුහය තුළ පළාත් සභා ක්‍රමය හැරවුම් ලක්ෂයක් වන අතර පළාත් සභා ක්‍රමය තුළින් බලය බෙදා හැරීම සහ ප්‍රාදේශියව පවත්නා සමාජ ආර්ථික සංවර්ධන විෂමතා අවම කිරීම සඳහා මූලික දායකත්වයක් පළාත තුළින් සපයා ඇත. මධ්‍යම රජයට අමතරව මධ්‍යම රජයේ නියාමනයට අනුව පළාතේ සංවර්ධන පරිපාලන සමාජ සුභසාධන හා සමාජ ආරක්ෂණ මෙන්ම පුනරුත්ථාපන හා ප්‍රතිසංවර්ධන කටයුතු වලදී ද ප්‍රධානම කළමනාකරණ කේන්ද්‍රස්ථානය වන්නේ පළාත් සභාවයි. පළාතක ජන ජීවිතයේ යහපැවැත්ම, සමෘද්ධිමත් බව, සුභසිද්ධිය, තිරසාර බවට බාධා පමුණුවන පීඩාවන්, ප්‍රබල අභියෝග හා ගැටලු හඳුනාගෙන ඒ සඳහා තිරසාර, කඩිනම්, විධිමත් සහ ඉලක්කගත පිළියම් යෙදීමට පළාත් සභා ක්‍රමය යොදාගෙන ඇත.





පරිපාලන දිස්ත්‍රික්ක අටකින් ද [8] මායිම්ව පිහිටා ඇති උතුරු මැද පළාත, දිවයිනේ විශාලම පරිපාලන දිස්ත්‍රික්කය වේ. පළාතේ සම්පූර්ණ ජනගහනය 1,401,561ක් වන අතර මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර 10,645ක් පමණ වේ. එය ශ්‍රී ලංකාවේ සමස්ත භූමි ප්‍රමාණයෙන් 16% ක ප්‍රමාණයකි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ විසිනවයකින් ද [29], මහනගර සභා දෙකකින් ද [02], ප්‍රාදේශීය සභා විසිපහකින් ද [25], ග්‍රාම නිලධාරී වසම් නමසිය අසූ අටකින් ද [988] සමන්විත වේ. උතුරු මැද පළාතේ ජනගහනය ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් 6.5%ක පමණ ප්‍රතිශතයකි. පළාතේ මුළු පවුල් සංඛ්‍යාව 365,000 ක් පමණ වන අතර සමෘද්ධි සහනාධාර හිමි පවුල් සංඛ්‍යාව 83,180ක් පමණ වේ. දළ දේශීය නිෂ්පාදිතයට පළාතෙන් කරනු ලබන දායකත්වය 5.8%ක ප්‍රතිශතයකි. ජනඝනත්වය දෙස බැලීමේදී වර්ග කිලෝ මීටර එකක පදිංචි පුද්ගලයන් සංඛ්‍යාව 142 කි. මෙහිදී විශේෂත්වය වන්නේ ජනඝනත්වය අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කයට වඩා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනඝනත්වය ඉහළ අගයක් ගැනීමයි. පළාතේ භූමි ප්‍රමාණයෙන් විවිධ ප්‍රමාණයේ ජලාශයන්ගෙන් වර්ග කිලෝමීටර 782ක් පමණ ආවරණය වී ඇත. සමස්ත ජනගහනයෙන් 5%ක් පමණ නාගරිකව ජීවත් වේ. පළාතේ පවතින විවිධ සම්පත් සහ විභව ශක්තීන් අතර මානව සම්පත, සරුසාර පස, ජලය, වනාන්තර, දැව, පොස්පේට්, රෝස තිරුවානා, සත්ව හා මිරිදිය ධීවර සම්පත, පරිසර පද්ධතිය සහ විශේෂයෙන්ම එල්ලංගා වාරි පද්ධතිය සහ 250,000 ද ඉක්මවා ඇති පළාතේ ගව සම්පත විශේෂිත වේ.

## උතුරු මැද පළාතේ වැදගත් සමාජ ආර්ථික තොරතුරු

### 01. භූමි ප්‍රමාණය හා විශාලත්වය

| දිස්ත්‍රික්කය | ප්‍රමාණය (ව.කි.මී) | | |
|---|---|---|---|
| | ගොඩබිම් ප්‍රමාණය | අභ්‍යන්තර ජලාශ | මුළු භූමි ප්‍රමාණය |
| අනුරාධපුර | 6,601 | 578 | 7,179 |
| පොළොන්නරුව | 3,262 | 204 | 3,466 |
| උතුරු මැද පළාත | 9,863 | 782 | 10,645 |

**මූලාශ්‍රය: මූලික සංඛ්‍යාන අත්පොත 2015,සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

### 02. ජනගහනය හා ජනඝනත්වය

| විස්තරය | 2012* | 2016** | 2017*** | 2018*** |
|---|---|---|---|---|
| මුළු ජනගහනය | 1,266,700 | 1,401,561 | 1,349,000 | 1,366,000 |
| නාගරික ජනගහනය (5.9%) | 50,600 | 55,866 | 54,162 | 54,870 |
| ග්‍රාමීය ජනගහනය (94.1%) | 1,216,100 | 1,345,695 | 1,294,838 | 1,311,130 |
| ජනඝනත්වය | 128 | 142 | 138 | 139 |

**මූලාශ්‍රය: මූලාශ්‍රය: සමාජ ආර්ථික දත්ත - 2018, ශ්‍රී ලංකා මහ බැංකුව** * 2012 ජන හා නිවාස සංගණනය ** සංඛ්‍යාලේඛන හා භූගෝලීය තොරතුරු ඒකකය මගින් රැස්කරන ලද දත්ත *** 2012 ජන හා නිවාස සංගණනයට අනුව ඇස්තමේන්තු කරන ලද තොරතුරු

### 03. ජාතික දළ දේශීය නිෂපාදිතයට පළාතේ දායකත්වය

| වර්ෂය | උ.මැ.ප (රු.මි.) | ජාතික (රු.මි.) | පළාතේ දායකත්වය (%) | පළාත් අතර ස්ථානය |
|---|---|---|---|---|
| 2012 | 379,243 | 7,578,554 | 5 | 7 |
| 2013 | 489,622 | 9,592,125 | 5.1 | 7 |
| 2014 | 561,261 | 10,361,151 | 5.4 | 8 |
| 2015 | 643,673 | 10,950,621 | 5.9 | 6 |
| 2016 | 690,728 | 11,906,752 | 5.8 | 7 |

**මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව - 2017**

## 04. පළාතේ දළදේශීය නිෂ්පාදිතයේ ආශික බෙදීයාම (%)

| කර්මාන්ත ප්‍රභවය | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| කෘෂිකාර්මික | 19.51 | 12.35 | 12.77 | 12.76 | 10.66 |
| කර්මාන්ත | 25.85 | 21.24 | 18.62 | 18.92 | 19.44 |
| සේවා | 54.63 | 59.60 | 61.81 | 61.12 | 61.45 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව - 2017

## 05. දිස්ත්‍රික්ක අනුව දරිද්‍රතා දර්ශකය

| දිස්ත්‍රික්කය | දරිද්‍රතා දර්ශකය (%) | | | | | |
|---|---|---|---|---|---|---|
| | 1995/96 | 2002 | 2006/07 | 2009/10 | 2012/13 | 2016 |
| අනුරාධපුර | 27 | 20.4 | 14.9 | 5.7 | 7.6 | 3.8 |
| පොළොන්නරුව | 20.1 | 23.7 | 12.7 | 5.8 | 6.7 | 2.2 |
| උ.මැ.ප | 24.7 | 21.5 | 14.2 | 5.7 | 7.3 | 3.3 |
| ශ්‍රී ලංකාව | 28.8 | 22.7 | 15.2 | 8.9 | 6.7 | 4.1 |

මූලාශ්‍රය: මූලාශ්‍රය: සමාජ ආර්ථික දත්ත - 2018, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 06. දිළිඳු ගෘහ ඒකක සහ දරිද්‍රතා පරතරය

| දිස්ත්‍රික්කය | දිළිඳු ගෘහ ඒකක (%) | | | දරිද්‍රතා පරතරය (%) | | |
|---|---|---|---|---|---|---|
| | 2009/10 | 2012/13 | 2016 | 2009/10 | 2012/13 | 2016 |
| අනුරාධපුර | 4.6 | 6.3 | 2.7 | 1.0 | 1.1 | 0.5 |
| පොළොන්නරුව | 4.5 | 5.6 | 1.7 | 1.0 | 0.9 | 0.5 |
| උ.මැ.ප | 4.6 | 6.1 | 2.4 | 1.0 | 1.0 | 0.5 |
| ශ්‍රී ලංකාව | 7.0 | 5.3 | 3.1 | 1.7 | 1.2 | 0.6 |

මූලාශ්‍රය: සමාජ ආර්ථික දත්ත - 2018, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 07. සේවා වියුක්ති අනුපාතය සහ සේවා නියුක්තියේ ප්‍රතිශත ව්‍යාප්තිය - 2017

| | සේවා වියුක්ති අනුපාතය | සේවා නියුක්තියේ ව්‍යාප්තිය | | | |
|---|---|---|---|---|---|
| | | වැටුප් සහිත සේවා නියුක්තික | සේවා යෝජක | තමාගේම රැකියාවක් කරන | පවුලේ රැකියා සඳහා දායකවන |
| උ.මැ.ප | 3.7 | 40.6 | 1.5 | 41.8 | 16.1 |
| ශ්‍රී ලංකාව | 4.2 | 57.7 | 3 | 31.3 | 8 |

මූලාශ්‍රය:ශ්‍රම බලකා සමීක්ෂණය - වාර්ෂික වාර්තාව 2017, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 08. තරුණ විරැකියා ප්‍රතිශතය

| වර්ෂය | උ.මැ.ප | ශ්‍රී ලංකාව |
|---|---|---|
| 2013 | 15.2 | 19.2 |
| 2014 | 13.6 | 20.3 |
| 2015 | 16.3 | 20.8 |
| 2016 | 19.7 | 21.6 |
| 2017 | 17.3 | 18.5 |

මූලාශ්‍රය: ශ්‍රම බලකා සමීක්ෂණය - වාර්ෂික වාර්තාව 2017, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 09. අධ්‍යාපන

| විස්තරය | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| පාසල් සංඛ්‍යාව | 806 | 811 | 814 | 815 |
| ගුරුවරුන් සංඛ්‍යාව | 16,101 | 16,264 | 16,674 | 16,905 |
| ශිෂ්‍ය සංඛ්‍යාව | 273,806 | 280,963 | 289,971 | 297,845 |
| ගුරු සිසු අනුපාතය | 1:17 | 1:17 | 1:17 | 1:18 |
| පරිගණක සාක්ෂරතාව [%] | 21.2 | 21.6 | 20.9 | 22.1 |

**මූලාශ්‍රය: පාසල් නාමාවලිය හා අධ්‍යාපනික දත්ත 2019 , උතුරු මැද පළාත**

## 10. ජාතික විභාග ප්‍රතිඵල

| | 2015 | | | 2016 | | | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | උ.මැ.ප | ශ්‍රී ලංකා | පළාත් ස්ථානය | උ.මැ.ප | ශ්‍රී ලංකා | පළාත් ස්ථානය | උ.මැ.ප | ශ්‍රී ලංකා | පළාත් ස්ථානය | උ.මැ.ප | ශ්‍රී ලංකා | පළාත් ස්ථානය |
| අ.පො.ස.(සා. පෙළ)ළ සමත් ප්‍රතිශතය (උ.පෙළ.සඳ හා සුදුසුකම් ලැබූ) | 66.61 | 69.33 | 6 | 66.34 | 69.94 | 7 | 70.03 | 73.05 | 6 | 72.78 | 75.0 | 5 |
| අ.පො.ස (උ.පෙළ.) සමත් ප්‍රතිශතය (විශ්ව විද්‍යාල ප්‍රවේශය ලැබීමට සුදුසුකම් ලැබූ) | 59.56 | 62.35 | 9 | 59.27 | 63.36 | 9 | 63.01 | 66.02 | 9 | 62.23 | 64.7 | 7 |

**මූලාශ්‍රය:- අ.පො.ස. (සා.පෙළ) සහ (උ.පෙළ) විභාග - අපේක්ෂකයින්ගේ කාර්ය සාධනය, විභාග දෙපාර්තමේන්තුව**

## 11. උතුරු මැද පළාතෙන් විශ්ව විද්‍යාල සඳහා ඇතුළත් වීම.

| පළාත් සහ දිස්ත්‍රික්ක | 2009/10 | 2010/11 | 2011/12 | 2012/13 | 2013/14 | 2014/15 | 2015/16 | 2016/17 |
|---|---|---|---|---|---|---|---|---|
| උමැප | 879 | 992 | 1,374 | 1,186 | 1,294 | 1,327 | 1,472 | 1,554 |
| අනුරාධපුර | 619 | 714 | 972 | 830 | 935 | 966 | 1,054 | 1,097 |
| පො/නරු | 260 | 278 | 402 | 356 | 359 | 361 | 418 | 457 |

**මූලාශ්‍රය: සමාජ ආර්ථික සංඛ්‍යාලේඛන දත්ත 2017, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

## 12. අනෙකුත් සෞඛ්‍ය අංශය හා සම්බන්ධ තොරතුරු

| විස්තරය | 2018 |
|---|---|
| ශික්ෂණ රෝහල් සංඛ්‍යාව | 1 |
| මහ රෝහල් සංඛ්‍යාව | 1 |
| මූලික රෝහල් සංඛ්‍යාව | 5 |
| ප්‍රාදේශීය රෝහල් සංඛ්‍යාව | 48 |
| ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර ඒකක සංඛ්‍යාව | 35 |

**මූලාශ්‍රය: මූලික සංඛ්‍යාන අත්පොත 2015, සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

## 13. සෞඛ්‍ය තොරතුරු

| විස්තරය | 2016 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | පුරුෂ | ස්ත්‍රී | ජාතික | එකතුව | පුරුෂ | ස්ත්‍රී | ජාතික |
| දළ උපත් අනුපාතිකය | 17.0 | 17.8 | 16.2 | 15.6 | 16.7 | 17.5 | 15.9 | 15.2 |
| දළ මරණ අනුපාතිකය | 5.1 | 6.3 | 4.0 | 6.2 | 6.0 | 7.1 | 5.0 | 6.5 |

**මූලාශ්‍රය: සමාජ ආර්ථික සංඛ්‍යාලේඛන දත්ත 2017, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

## 14. වී නිෂ්පාදනය

### යල හා මහ කන්නය -2017

| | යෝජනා ක්‍රමය | 2016/17 මහ | | | | 2017 යල | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | අනු/පුර | පොළ/ නරුව | උ.මැ.ප | ශ්‍රී ලංකාව | අනු/පුර | පොළ/ නරුව | උ.මැ.ප | ශ්‍රී ලංකාව |
| බීජ වැපුරූ ප්‍රමාණය (හෙක්.) | මහ වාරිමාර්ගය | 12,610 | 43,672 | 56,282 | 259,734 | 5,833 | 36,736 | 42,569 | 176,965 |
| | සුළු වාරිමාර්ග | 15,784 | 5,175 | 20,959 | 110,937 | 2,410 | 4,138 | 6,548 | 42,537 |
| | වර්ෂා ජලය | 9,459 | 774 | 10,233 | 171,885 | 282 | 8 | 290 | 29,621 |
| | **එකතුව** | **37,853** | **49,621** | **87,474** | **542,556** | **8,525** | **40,882** | **49,407** | **249,123** |
| අස්වැන්න නෙලා ගත් භූමි ප්‍රමාණය (හෙක්.) | මහ වාරිමාර්ගය | 11,643 | 42,034 | 53,677 | 240,860 | 5,726 | 36,363 | 42,089 | 174,381 |
| | සුළු වාරිමාර්ග | 7,704 | 5,175 | 12,879 | 71,535 | 2,274 | 3,861 | 6,135 | 38,378 |
| | වර්ෂා ජලය | 389 | 573 | 962 | 70,461 | 272 | 4 | 276 | 23,720 |
| | **එකතුව** | **19,736** | **47,782** | **67,518** | **382,856** | **8,272** | **40,228** | **48,500** | **236,479** |
| දළ නිෂ්පාදිතය (MT) | | 73,127 | 214,722 | 287,849 | 1,473,832 | 26,004 | 173,595 | 199,599 | 909,321 |

**මූලාශ්‍රය: වී වගා තොරතුරු- 2018, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

## යල හා මහ කන්නය වී වගාව -2018

| | යෝජනා ක්‍රමය | 2016/17 මහ | | | | 2017 යල | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | අනු/පුර | පොා/ නරුව | උ.මැ.ප | ශ්‍රී ලංකාව | අනු/පුර | පොා/ නරුව | උ.මැ.ප | ශ්‍රී ලංකාව |
| බීජ වැපුරූ ප්‍රමාණය (හෙක්.) | මහ වාරිමාර්ගය | 23,519 | 54,997 | 78,516 | 322,217 | 15,434 | 55,651 | 71,085 | 242,542 |
| | සුළු වාරිමාර්ග | 28,352 | 7,572 | 35,924 | 148,616 | 5,666 | 5,907 | 11,573 | 84,858 |
| | වර්ෂා ජලය | 7,687 | 2,834 | 10,521 | 196,358 | 141 | 1 | 142 | 46,363 |
| | එකතුව | **59,558** | **65,403** | **124,961** | **667,191** | **21,241** | **61,559** | **82,800** | **373,763** |
| අස්වැන්න නෙලා ගත් භූමි ප්‍රමාණය (හෙක්.) | මහ වාරිමාර්ගය | 23,051 | 54,515 | 77,566 | 318,626 | 15,213 | 54,192 | 69,405 | 237,645 |
| | සුළු වාරිමාර්ග | 21,436 | 7,371 | 28,807 | 133,325 | 4,916 | 5,672 | 10,588 | 80,590 |
| | වර්ෂා ජලය | 3,214 | 2,791 | 6,005 | 167,977 | 121 | 1 | 122 | 44,731 |
| | එකතුව | **47,701** | **64,677** | **112,378** | **619,928** | **20,250** | **59,865** | **80,115** | **362,966** |
| දළ නිෂ්පාදිතය (MT) | | 169,316 | 277,349 | 446,665 | 2,396,926 | 85,691 | 268,472 | 354,163 | 1,532,905 |

මූලාශ්‍රය: සංඛ්‍යා නිබන්ධන 2017, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 15. අතිරේක බෝග නිෂ්පාදනය - යල හා මහ කන්නය

| | 2014/15 මහ | | | | 2015 යල | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | අ/පුර | පොා/ නරුව | උ.මැ.ප | ශ්‍රී ලංකාව | අ/පුර | පොා/ නරුව | උ.මැ.ප | ශ්‍රී ලංකාව |
| කුරක්කන් | 2051 | 112 | 2163 | 7407 | 49 | 27 | 76 | 1509 |
| බඩ ඉරිඟු | 61741 | 968 | 62709 | 230871 | 1356 | 163 | 1535 | 30244 |
| ඉදල් ඉරිඟු | -- | 6 | 6 | 85 | -- | -- | -- | 16 |
| මෙනේරි | -- | -- | -- | 19 | -- | -- | -- | 24 |
| මුං ඇට | 449 | 220 | 669 | 7620 | 134 | 80 | 214 | 7438 |
| කවුපි | 638 | 187 | 825 | 7241 | 73 | 50 | 123 | 5035 |
| තල | 93 | 31 | 124 | 3191 | 7053 | 6 | 7059 | 10094 |
| රටකජු | 540 | 640 | 1180 | 12513 | 130 | 450 | 580 | 15990 |
| මඤ්ඤොක්කා | 3736 | 5869 | 9605 | 181737 | 1655 | 4061 | 5716 | 143360 |
| බතල | 589 | 995 | 1584 | 31953 | 74 | 1307 | 1380 | 20035 |
| අර්තාපල් | -- | -- | -- | 54312 | -- | -- | -- | 43079 |
| රතු ළූණු | 125 | 112 | 237 | 35215 | 34 | 46 | 80 | 25987 |
| ලොකු ළූණු | 151 | 150 | 301 | 4586 | 23509 | 2337 | 25846 | 84737 |
| අමු මිරිස් | 7034 | 838 | 7372 | 42831 | 2480 | 275 | 2755 | 20035 |
| අබ | 94 | -- | 94 | 228 | 1 | -- | 1 | 20 |
| අමු ඉඟුරු | 2 | 86 | 88 | 17273 | -- | -- | -- | -- |
| අමු කහ | -- | 74 | 74 | 14397 | -- | -- | -- | -- |

මූලාශ්‍රය: සංඛ්‍යා නිබන්ධන 2017, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 15. අතිරේක බෝග නිෂ්පාදනය - යල හා මහ කන්නය

| | 2014/15 මහ | | | | 2015 යල | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | අ/පුර | පො/ නරුව | උ.මැ.ප | ශ්‍රී ලංකාව | අ/පුර | පො/ නරුව | උ.මැ.ප | ශ්‍රී ලංකාව |
| කුරක්කන් | 1805 | 84 | 1889 | 7509 | 43 | 52 | 95 | 1506 |
| බඩ ඉරිගු | 55825 | 1079 | 56904 | 207075 | 14580 | 736 | 15116 | 36885 |
| ඉදල් ඉරිගු | -- | 6 | 6 | 96 | -- | -- | -- | 18 |
| මෙනේරි | -- | -- | -- | 12 | -- | -- | -- | 13 |
| මුං ඇට | 347 | 220 | 567 | 7975 | 156 | 134 | 290 | 6571 |
| කවුපි | 2190 | 120 | 2310 | 8811 | 70 | 60 | 130 | 4929 |
| තල | 1111 | 20 | 1131 | 2486 | 7040 | 20 | 7060 | 9928 |
| රටකජු | 401 | 504 | 905 | 16564 | 93 | 346 | 439 | 7636 |
| මඤ්ඤොක්කා | 3559 | 6062 | 9621 | 184256 | 2017 | 4085 | 6102 | 139824 |
| බතල | | 1120 | 1120 | 22388 | 91 | 928 | 1019 | 22327 |
| අර්තාපල් | 367 | | 367 | 48427 | -- | -- | -- | 47256 |
| රතු ළූණු | | 65 | 65 | 35485 | 4 | 65 | 69 | 28192 |
| ලොකු ළූණු | 60 | 278 | 338 | 7549 | 10277 | 2932 | 13209 | 57671 |
| අමු මිරිස් | 3559 | 803 | 4362 | 50717 | 2618 | 471 | 389 | 21594 |
| අබ | 12223 | | 12223 | 200 | 1 | 1 | 2 | 20 |
| අමු ඉඟුරු | 93 | 99 | 192 | 23183 | -- | -- | -- | -- |
| අමු කහ | 99 | 61 | 160 | 14100 | -- | -- | -- | -- |

මූලාශ්‍රය: සංඛ්‍යා නිබන්ධන **2017,** ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 16. මධ්‍යනය මාසික ආදායම

| අංශය | 2003/04 | | 2016 | |
|---|---|---|---|---|
| | උ.මැ.ප | ශ්‍රී ලංකාව | උ.මැ.ප | ශ්‍රී ලංකාව |
| ඒක පුද්ගල ආදායම | 3,814 | 3,968 | 16,567 | 16,377 |
| කුටුම්භ ආදායම | 15,624 | 17,109 | 60,298 | 62,237 |
| ආදායම් ලබන්නෙකුගේ ආදායම | 11,093 | 10,754 | 35,186 | 33,894 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව - **2017**

## දැක්ම

සංවර්ධනයේ ප්‍රතිලාභ මැනවින් හිමිකරගත් අභිමානවත් ප්‍රජාවක්.

## මෙහෙවර

සියළුම පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන්, පළාතේ පවතින සියළුම සම්පත්වල හා විභවතාවන්ගෙන් ප්‍රශස්ත උපයෝජනයෙන්, පළාතේ මානව සම්පත් සංවර්ධනය ප්‍රමුඛ කරගත් ආර්ථික සංවර්ධන ප්‍රවේශයකින් විනිවිදභාවයෙන් යුතුව පළාත සංවර්ධනය කරමින් ජාතික සංවර්ධනයට ඍජු හා අඛණ්ඩ ලෙස දායක වීම.

## පළාත් සභාවේ ප්‍රධාන කාර්යයන්

- නීතිය හා සාමය පවත්වාගෙන යාම.
- පළාත් සභා පරිපාලනය.
- මූල්‍ය කළමනාකරණය.
- මානව සම්පත් කළමනාකරණය.
- ඉඩම් පරිපාලනය හා සංවර්ධනය.
- වාරිමාර්ග සංවර්ධනය.
- කෘෂිකර්ම සංවර්ධනය.
- පශු සම්පත් සංවර්ධනය.
- කර්මාන්ත සංවර්ධනය.
- ප්‍රාදේශීය සංවර්ධනය.
- සමූපකාර සංවර්ධනය.
- ප්‍රජා සංවර්ධනය.
- රෝහල් සේවාවන් සංවර්ධනය හා පවත්වාගෙන යාම.
- මහජන සෞඛ්‍ය සේවාවන් සංවර්ධනය.
- පොදු සෞඛ්‍ය සේවාවන් සහ පෝෂණ කටයුතු.
- දේශීය වෛද්‍ය සේවාවන්.
- පර්යේෂණ හා සංවර්ධන.
- ප්‍රාථමික හා ද්වීතීයික අධ්‍යාපනය.
- අධ්‍යාපන ප්‍රවේශය සහ සහභාගීත්වය දියුණු කිරීම.
- අධ්‍යාපන සැලසුම් හා පාලන සේවා.
- ක්‍රීඩා සංවර්ධනය.
- සංස්කෘතික සංවර්ධනය.
- සමාජ ආරක්ෂණය හා සමාජ සුභසාධනය.
- සංවර්ධන සැලසුම්කරණය හා මෙහෙයවීම.
- මාර්ග සංවර්ධනය.
- තොරතුරු තාක්ෂණය.
- මාර්ගස්ථ මගී ප්‍රවාහනය.
- ග්‍රාම සංවර්ධනය.
- ඉදි කිරීම් සහ ඉංජිනේරු සේවා.
- නිවාස සංවර්ධනය.
- පළාතේ විගණන හා විමර්ශන කටයුතු.
- පළාතේ ප්‍රතිපත්ති, සැලසුම්කරණය හා පසුවිපරම් කටයුතු.
- පළාත් ආදායම් කටයුතු.
- පළාත් පාලන කටයුතු.
- සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ.
- සංස්කෘතික හා කලා සංවර්ධනය.
- මුල් ළමාවිය සංවර්ධනය.
- පරිවාස හා ළමාරක්ෂක.
- මාර්ග සංවර්ධන හා මගී ප්‍රවාහන කටයුතු.

## පළාත් ගීතය

දිලේ රන්වැලි සෑ හිසින් හිරු
රන් කිරණ ගෙන සිළුමිණේ
සැලේ මහ බෝ ළදළු පවනින්
සිසිල පතුරා බුදු ගුණේ

සයුරු පරදන වැව් තලා මත
සිය දහස් සියපත් පිපේ
අතවනා සිරිකතට හිනැහෙයි
රන් කරල් පුලතිසි කෙතේ

සව් සිරින් ගැදි පැදි කුසුම් මී
පන්හිදෙන් උතුරා හැලේ
රළු පරළු සෙල් කුළු මෙලෙක් වී
රූ රටා විස්කම් මැවේ


සියකමින් නොව යුතුකමින් සිත්
පහන්කළ විරු පරපුරේ
ගැමුණු පැරකුම් රජුන් විකුමන්
දිසෙයි යළි රජරට බිමේ

| | | |
|---|---|---|
| පද රචනය | - | පූජ්‍ය පල්ලේගම හේමරතන හිමි |
| සංගීතය | - | විශාරද කරුණාරත්න විජේවර්ධන |


**පළාත් පුෂ්පය (ඇහැල මල)**



**පළාත් ධජය**



## උතුරු මැද පළාත - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ





### අනුරාධපුර දිස්ත්‍රික්කය

1. ගලෙන්බිඳුණුවැව
2. ගල්නෑව
3. හොරොව්පොතාන
4. ඉපලෝගම
5. කහටගසදිගිලිය
6. කැබිතිගොල්ලෑව
7. කැකිරාව
8. මහවිලච්චිය
9. මැදවච්චිය
10. මිහින්තලේ
11. නාච්චාදූව
12. නොච්චියාගම
13. මධ්‍යම නුවරගම් පළාත
14. නැගෙනහිර නුවරගම් පළාත
15. පදවිය

### පොළොන්නරුව දිස්ත්‍රික්කය

1. දිඹුලාගල
2. ඇලහැර
3. හිඟුරක්ගොඩ
4. ලංකාපුර
5. මැදිරිගිරිය
6. තමන්කඩුව
7. වැලිකන්ද

# උතුරු මැද පළාත් සභා සංවිධාන ව්‍යුහය



# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 01. | ආණ්ඩුකාරවර ලේකම් කර්යාලය | 1-14 |
| 02. | පළාත් සභාව සහ පළාත් සභා ලේකම් කාර්යාලය | 15-20 |
| 03. | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 20-32 |
| 04. | පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව | 33-36 |
| **05.** | **ප්‍රධාන ලේකම් කාර්යාලය** | **37-44** |
| 5.1. | පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 45-60 |
| 5.2. | පළාත් භාණ්ඩාගාරය | 61-70 |
| 5.3. | පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | 71-80 |
| 5.4. | පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව | 81-86 |
| 5.5. | පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය | 87-94 |
| 5.6. | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | 95-100 |
| **06.** | **පළාත් ප්‍රධාන අමාත්‍යාංශය** | **101-114** |
| 6.1. | පළාත් පාලන දෙපාර්තමේන්තුව | 115-126 |
| 6.2. | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 127-152 |
| 6.3. | පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව | 153-166 |
| 6.4. | සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය | 167-174 |
| 6.5. | මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය | 175-184 |
| 6.6. | පුස්තකාල සේවා මණ්ඩලය | 185-198 |
| **07.** | **පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය, ධීවර සහ නිවාස කටයුතු අමාත්‍යාංශය** | 199-214 |
| 7.1. | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 215-240 |
| 7.2. | පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 241-268 |

**08.** **පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය** **269-276**

8.1. පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව 277-294

8.2. පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව 295-312

8.3. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව 313-320

8.4. පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව 321-342

**09.** **පළාත් ප්‍රවාහන, ක්‍රීඩා සහ යෞවන කටයුතු, සමුපකාර වෙළඳ හා අහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය** **343-352**

9.1. පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව 353-360

9.2. පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව 361-366

9.3. කර්මාන්ත සංවර්ධන අධිකාරිය 367-370

9.4. මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය 371-382

9.5. පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව 383-392

**10.** **පළාත්, ඉඩම් , වාරිමාර්ග ,මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස හා කාන්තා කටයුතු අමාත්‍යාංශය** **393-398**

10.1. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව 399-412

10.2. පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව 413-428

10.3. පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව 429-438

10.4. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය 439-448

**ඇමුණුම්**

ඇමුණුම් 01 - පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් අනුමැතිය ලබා දුන් සංවර්ධන ව්‍යාපෘති - 2018 449-458

ඇමුණුම් 02 - උතුරු මැද පළාතේ ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘති ප්‍රගති සාරාංශය- 2018.12.31 දිනට 459-461

ඇමුණුම් 03 - පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වාර්ෂික මුදල් වෙන් කිරීම -2018 462-463

ඇමුණුම් 04 - පළාත් භාණ්ඩාගාරය මගින් අමාත්‍යාංශ මට්ටමින් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ අක් මුදල් නිදහස් කිරීම -2018 464-469

ඇමුණුම් 05 - උතුරු මැද පළාත් කළමනාකරණ හා සංවර්ධන පුහුණු ඒකකයේ ලියාපදිංචි සම්පත් දායක සංචිතය 470-474

# උතුරු මැද පළාත් සංවර්ධන වැඩසටහන පිළිබඳ විශ්ලේෂණය - 2018

# OVERVIEW OF NORTH CENTRAL PROVINCIAL DEVELOPMENT PROGRAMME - 2018

2018 වර්ෂයේ උතුරු මැද පළාත් සභාව සතු ප්‍රධාන කාර්යයන් 39ක් ඔස්සේ සංවර්ධන ක්‍රියාවලිය මෙහෙය වූ අතර ඒ සඳහා මූලධන වැය ලෙස රු.මි.9764.70ක් දරා ඇති අතර සේවාවන් මහජනතාව කෙරෙහි සමීප කරවීම සඳහා දරන ලද පුනරාවර්තන වැය රු.මි.18635.37කි. එසේම අත්තිකරම් ගිණුම් යටතේ වියදම් ද ඇතුළුව සමස්ත ආයෝජනය රු.මි.29151.65කි.

පළාත් අධ්‍යාපන අංශයේ සංවර්ධනය උදෙසා සියළු මූලා ප්‍රභවයන්ගෙන් කරන ලද සංවර්ධන ආයෝජනය හා දායකත්වය අතිමහත්ය. පළාතේ දූවාදරුවන්ගේ අධ්‍යාපනය ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකව ඉහළ මට්ටමකට ගෙන ඒමට කරන ලද ආයෝජනය තුළින් පාසැල් පද්ධතියේ අත්‍යාවශ්‍යයෙන්ම සිදු කළ යුතුව පැවති පංති කාමර ගොඩනැගිලි, විද්‍යාගාර හා අනෙකුත් අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා කරන ලද ආයෝජනය කැපී පෙනේ. මේ සඳහා රු.මි.2241.26ක මුදලක් ආයෝජනය කරන ලදී. එපමණක්ද නොව අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නැංවීම මගින් පහ වසර ශිෂ්‍යත්ව ප්‍රතිඵල , අධ්‍යායන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ, අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ ප්‍රතිඵල ලබා ගෙන ඇති ප්‍රගතිය සැලකිය යුතු මට්ටමක පවතී.

**2018 වර්ෂය සඳහා රු.මි.29151.65 ක ආයෝජනයක්**

පළාතේ සෞඛ්‍ය සේවා නගා සිටුවීම සඳහා බටහිර ප්‍රතිකාරක සේවා හා රෝග නිවාරණ සේවා සඳහා සුවිශාල දායකත්වයක් වර්ෂය තුළදී සැපයිය හැකි විය. ඒ යටතේ මෙත්සිරි සෙවන ව්‍යාපෘතියද ඇතුළුව 2018 වර්ෂයේදී රු.මි. 521.7ක් ආයෝජනයකර ඇත. එසේම පළාතේ ගැටළුවක්ව පවතින වකුගඩු රෝගයෙන් පෙළෙන මෙන්ම ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පළාතේ විවිධ ප්‍රදේශවලින් පැමිණෙන රෝගීන්ගේ සුභසාධනය වැඩිදියුණු කිරීම සඳහා 2016 ආරම්භ කරන ලද "මෙත්සිරි සෙවණ " ව්‍යාපෘතිය 2018 වර්ෂයේදී රු.මි. 94.365ක් වැය කරමින් අවසන්කර ජනතා අයිතියට පත් කරන ලදී. එසේම පාරම්පරික මෙන්ම උතුරු මැද පළාත තුළ දේශීය වෛද්‍ය ක්‍රමය නගා සිටුවීම සඳහා 2018 වර්ෂයේදී කැපී පෙනෙන ආයෝජනයක් සිදුකර ඇත.

2030 වර්ෂයේදී සපුරා ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක 01 සියළු තන්හී සෑම ආකාරයෙන්ම පවතින දුගී බව තුරන් කිරීම. අංක 02 සාගින්න නැතිකර ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය සහිත තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම, අංක 12 තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටාවක් සහතික කිරිම යන අරමුණු කරා පළාතේ දායකත්වය සැලකිය යුතු මට්ටමකින් සැපයීම සඳහා පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය,පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මධ්‍යම රජයේ සහ රේඛීය අමාත්‍යාංශවල සහය සහිතව ඒකාබද්ධව සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කරන ලදී.

ඒ සඳහා රු.මි. 97.43ක් ආයෝජනය කර ඇත. එසේම සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පළාතේ පසු සම්පත් සංවර්ධනය මෙන්ම පශු සම්පත් අංශයේ නියැලී ගොවීන්ගේ ආදායම් තත්වය ඉහල නැංවීම සඳහා ප්‍රතිපාදන ආයෝජනය කරන ලදී. ඒ යටතේ රු.මි.81.68ක් ආයෝජනය කර ඇත. ඒ අනුව කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය උදෙසා රු.මි.179.11 ක් ආයෝජනයකර ඇත.

පළාත් වාරි පද්ධතියේ සංවර්ධනය උදෙසා මෙන්ම ප්‍රශස්ත වාරි කළමනාකරණයක් තුළින් සෞභාග්‍යමත් ගොවි ප්‍රජාවක් නිර්මාණය කිරීම සඳහා 2018 වර්ෂයේදී රු.මි. 154.45ක ආයෝජනයක් කර ඇත. ඒ යටතේ වාරි පද්ධති පුනරුත්ථාපනය කිරීම, නිරන්තර නඩත්තුව , වාරි පද්ධතිවල අවශ්‍ය අංග අළුතින් එකතු කිරීම ,ගොවි සංවිධාන බලගන්වමින් ජල කළමනාකරණ භාවිතයන් සංවර්ධනය කිරිම, ජල ගැලීම් හා හානි කළමනකරණය කිරීම සඳහා ආපදා කළමනාකරණ කමිටු සක්‍රීයව පවත්වාගෙන යාම ,පෝෂක ප්‍රදේශ සංවර්ධනය කිරීම, තත්ත්ව පාලන ඒකකය පවත්වාගෙන යාමට අදාල ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් ක්‍රියාවට නංවන ලදී. එසේම කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා මෙන්ම සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය අංශයේ සංවර්ධනය උදෙසා මෙම ආයෝජනය ඉවහල්වන බව කිව යුතුය.

පළාතේ සමාජ ආරක්ෂණය උදෙසා පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් හා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් ඒ ඒ විෂයපථයන්ගේ සංවර්ධනය උදෙසා 2018 වර්ෂයේදී කැපී පෙනෙන ආයෝජනයක් සිදුකර ඇත. ඒ යටතේ ළමා නිවාස හා රැඳවුම් නිවාස සංවර්ධනය කිරීම, ළමා රැකවරණය හා සුභසාධනය නගා සිටුවීම, ළමා අයිතිවාසිකම් සුරැකීම හා ළමා අපයෝජන හා අපචාර අවම කිරීම , උපදේශන මධ්‍යස්ථාන හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා රු.මි.39.46ක් ආයෝජනයකර ඇත. එසේම පළාතේ වැඩිහිටි නිවාස, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ රැකවරණ මධ්‍යස්ථාන, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය මෙන්ම විවිධ මහජන ආධාර සපයමින් සමාජ ආරක්ෂණය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත. ඒ සඳහා පළාත් ආයෝජනය රු.මි. 390.97කි. ඒ අනුව අංශයේ සංවර්ධන උදෙසා සමස්ත ආයෝජනය රු.මි.430.43කි.

පළාතේ පළාත් පාලන විෂය යටතේ පවතින සේවා සංවර්ධනය උදෙසා 2018 වර්ෂයේ දායකත්වය කැපී පෙනේ. ඒ යටතේ පළාත් පාලන ආයතන බලප්‍රදේශවල ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම , වෙළෙඳ පහසුකම් වැඩිදියුණු කිරීම, ප්‍රජා ජල පහසුකම් වැඩි දියුණු කිරීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා තිරසර යාන්ත්‍රණයක් සැකසීම, පොදු සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදුයුණු කිරීම, ග්‍රාමීය පුස්තකාල, පෙර පාසල්,ළමා උද්‍යාන, සුසාන භූමි සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු විය. ප්‍රධාන අමාත්‍යාංශය, රේඛීය අමාත්‍යාංශයන්හී මූල්‍ය සහය සහිතව මෙම ව්‍යාපෘති ක්‍රියාවට නංවන ලදී. පළාත් සභාව සතු මාර්ග පද්ධතිය පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්, මාර්ගවල යටිතල පහසුකම් එනම් පාලම්,බෝක්කු හා නිර්මිතයන් සංවර්ධනය කිරීම ,මාර්ග සංඥා සහ සලකුණු ස්ථාපිත කිරීම, දෛනික කාලීන හා හදිසි අවස්ථා සහිත ක්‍රමානුකූල නඩත්තුව සඳහා පළාත් සංවර්ධන ආයෝජනයන් සිදු කරන ලදී.

සමුපකාර අංශය යටතේ පළාතේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය,රැකියා විරහිත තරුණයින් ඉදි කිරීම් යන්ත්‍ර හා බරවාහන ක්ෂේත්‍රයට යොමු කිරීම, දේශීය ආහාර නිෂ්පාදනය ප්‍රවර්ධනය, සහනදායි මූල්‍ය පහසුකම් සැලසීම වැනි කාර්යයන් සිදු කරනු ලැබූ අතර ඒ සඳහා රු.මි. 34.89ක මුදලක් ආයෝජනය කරන ලදී.

උතුරු මැද පළාතේ සමුපාකාර අංශයේ සංවර්ධනය උදෙසාත් හස්ත කර්මාන්ත, පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත ක්ෂේත්‍රය ප්‍රවර්ධනය සඳහාත් සමුපකාර අමාත්‍යාංශය, සමුපකාර දෙපාර්තමේන්තුව, කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව, කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් සිදු කරනු ලැබූ අතර ඒ සඳහා රු.මි. 68.46ක මුදලක් ආයෝජනය කරන ලදී.

ක්‍රිඩා අංශය මගින් පළාත තුළ ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රිඩා ක්ෂේත්‍රයේ දියුණුව උදෙසා රු.මි.28.96ක මුදලක් 2018 වර්ෂය තුළදී ආයෝජනය කරන ලදී.

2018 වර්ෂයේ ඉඩම්වල වටිනාකම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා හඳුනාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල යටිතල පහසුකම් සංවර්ධනය හා නිලධාරින්ගේ ධාරිතා සංවර්ධනය උදෙසා රු.මි. 7.98ක මූල්‍ය ආයෝජනයක් සිදු කරන ලදී.

ග්‍රාම සංවර්ධන අංශය යටතේ පළාත තුළ ග්‍රාම සංවර්ධන සමිති හා කාන්තා සමිති ශක්තිමත් කිරීම, ග්‍රාම සංවර්ධන සමිති පිහිටුවා පවත්වාගෙන යාම, කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන හා ලිය සවිය මධ්‍යස්ථාන මගින් මැහුම් පාඨමාලා පවත්වාගෙන යාම , දැහැමි නිවහන, ශ්‍රමාභිමානී වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ගම්දොර අභියස වැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු වූ අතර මේ සඳහා රු.මි.23.65ක මුදලක් ආයෝජනය කෙරිණි.

සංචාරක අංශයේ සංවර්ධනය උදෙසා පළාත් ප්‍රධාන අමාත්‍යාංශය මගින් හා සංචාරක සංවර්ධන ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය මගින් ලද ප්‍රතිපාදන මත ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. ප්‍රධාන අමාත්‍යාංශය මගින් රු.මිලි.70ක් ද සංචාරක සංවර්ධන ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය මගින් ලබා දුන් ප්‍රතිපාදන රු.මි. 39.71කි. ඒ අනුව සමස්ත අංශයේ සංවර්ධනය උදෙසා රු.මිලි.109.71ක් ආයෝජනය කර ඇත.

හබරවත්ත එල්ලංගාව සංවර්ධනය කිරීම, පාරිසරික සංවේදී කළාප සංවර්ධනය, මහවැලි ගංගා ද්‍රෝණි සංවර්ධනය යටතේ පළාත් සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවට හා පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ද වැව්ගම් පුබුදුව ව්‍යාපෘතිය යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ද මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මගින් ප්‍රතිපාදන ලබා දුන් අතර එම ප්‍රතිපාදනය රු.මි.31.62කි.

එක්සත් ජාතින්ගේ 2030 තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා වන මූලික දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමෙන් සියළු රාජ්‍ය නිළධාරින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත් වූ අතර ඒ සඳහා තිරසර සංවර්ධන හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය මගින් රු.මි 01ක ප්‍රතිපාදන ලබා දෙන ලදී.

එසේම ප්‍රධාන ලේකම් කාර්යාලය හා ඒ යටතේ පවතින ආයතන මගින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සඳහා රු.මි.288.27ක් වැයකර ඇත.2018 වර්ෂයේදී උතුරු මැද පළාතේ අනුමත සේවක සංඛ්‍යාව 9198ක් වුවද වර්ෂය තුළදී සේවයේ නියුතු සංඛ්‍යාව 6919කි.විශේෂයෙන්ම පළාත් සෞඛ්‍ය අංශයේ සේවාවන් ජනතාව වෙත සමීප කරලීම සඳහා සේවයේ නියුතු වූ සේවකයින් සංඛ්‍යාව 3960කි. එසේම පළාතේ අධ්‍යාපන අංශය සැලකූ විට 2018 වර්ෂයේදී 297845ක් වන ශිෂ්‍ය ශිෂ්‍යයාවන්ගේ අධ්‍යාපනය නගා සිටුවීම සඳහා ගුරුවරුන් 16090කගේ මෙන්ම ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් 787ක් ඇතුළු අනෙකුත් නිලධාරීන්ගේ ද දායකත්වය සපයන ලදී.

ඒ සියල්ල සමග 2018 වර්ෂයේ පුනරාවර්තන වියදම් ලෙස රු.මි.18635.37ක්ද, මූලධන වියදම් ලෙස රු.මි. 9764.70ක්ද ,අත්තිකාරම් ගිණුම යටතේ වියදම් රු.මි.751.58 ක්ද වශයෙන් රු.මි. 29151.65 ක ආයෝජනයක් ද සිදුකර ඇත.

- මෙය හිස්ව තබන ලද පිටුවකි -

# 01.ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය

## ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය පිළිබඳ මූලික විග්‍රහය

### ජාතික විධායකයේ පළාත් නියෝජනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ආ (1) අනු ව්‍යවස්ථාව අනුව සෑම පළාත් සභාවකම ආණ්ඩුකාර ධූරයක් පවතී. 154 ආ (2) අනුව ව්‍යවස්ථාවප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමාගේ අත්සන යටතේ වූ අධිකාරී පත්‍රයකින් පත් කෙරෙන ආණ්ඩුකාර ධූරය පළාත් සභාවක ජනාධිපතිතුමාගේ නියෝජිතයා ලෙස වූ කාර්යභාරයක් ද ඉටු කරනු ලබයි.

ජනාධිපතිතුමාගේ විධානය මත ආණ්ඩුකාරතුමා විසින් ගනු ලබන තීරණ අවසානාත්මක වන අතර, එය අධිකරණයක දී ප්‍රශ්න කළ නොහැකි බලයකි.

### ආණ්ඩුකාරධූරය සතු බලතල

- විධායක බලතල
- මූල්‍ය බලතල
- පරිපාලන බලතල

### 01. විධායක බලතල

13 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභාවක විෂය ක්ෂේත්‍රය පිළිබඳ ආණ්ඩුකාරවර ධූරය සතු විධායක බලතල 154 හා (ඇ) 154 (ඊ) ව්‍යවස්ථා පරිදි සෘජුව හෝ අමාත්‍ය මණ්ඩලය මගින් හෝ නිළධාරීන් මගින් හෝ ක්‍රියාත්මක කළ හැකිය.

### අමාත්‍ය මණ්ඩලය පිළිබඳ බලතල

- 154 ඊ (4) වගන්තිය අනුව ප්‍රධාන අමාත්‍යවරයා පත් කිරීම.
- 154 ඊ (5) වගන්තිය අනුව අමාත්‍යවරුන් 4 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් පළාත් අමාත්‍ය මණ්ඩලය පත් කිරීම.
- අමාත්‍යවරු අතර විෂයන් බෙදීම.
- 154 අ (11) (අ) වගන්තිය අනුව පළාතේ පරිපාලනය සම්බන්ධ සහ නීති සම්පාදනය පිළිබද අමාත්‍ය මණ්ඩලය ගන්නා සියලු යෝජනා දැන ගැනීම.
- 154 අ (11) (ආ) වගන්තිය අනුව පළාතේ පරිපාලනය සම්බන්ධ සහ නීති සම්පාදනය සඳහා වූ යෝජනා පිළිබඳ තොරතුරු ලබා ගැනීම.
- 154 අ (11) (ඇ) වගන්තිය අනුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී නොමැති එහෙත් අමාත්‍ය වරයෙකු විසින් ගන්නා ලැබූ තීරණයක් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලෙස ආණ්ඩුකාරවරයාට නියම කළ හැකිය.

## පළාත් සභා කටයුතු පිළිබඳ බලතල

- 154 අ (8) (අ) වගන්තිය අනුව ආණ්ඩුකාරවරයා නිශ්චය කරන අවස්ථාවකදී නියම කරනු ලබන වේලාවක සභාව කැඳවීම.
- 154 අ (8) ( ආ) වගන්තිය අනුව සභාව වාර අවසාන කිරිම.
- 154 අ (10) (අ) වගන්තිය අනුව සභාව ඇමතීම හා ඒ සඳහා මන්ත්‍රීවරුන් කැඳවීමට නියමයන් කිරිම.
- 154 අ (8) (ඇ) වගන්තිය අනුව සභාව විසුරුවා හැරීම.

## 02. මූල්‍ය බලතල

- 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 19 (5) වගන්තිය අනුව පළාත් සභා අරමුදල් භාරය, අරමුදලට මුදල් ගෙවීම ආදී සියලු රිති මගින් විධිමත් කිරිම.
- 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 20 (1) වගන්තිය අනුව පළාතේ හදිසි අවස්ථා අරමුදල පිළිබඳ භාරය දැරීම හා පාලනය සඳහා රීති සෑදීම.
- 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 23 (2) වගන්තිය අනුව පළාත් සභා අරමුදලේ ගිණුම් සම්බන්ධ විගණකාධිපතිවරයාගේ වාර්තා අනුව පළාත් සභාවට ඉදිරිපත් කිරීම.
- 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතේ 27 (4) වගන්තිය අනුව පළාත් සභාව විසුරුවා හැර හෝ කටයුතු කිරිම නතර කර ඇති අවස්ථාවක පළාතේ පරිපාලන කටයුතු සඳහා අරමුදලෙන් වියදම් කිරිමට අනුමැතිය දීම.
- 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 24 (1) වගන්තිය අනුව බදු පැනවීම, අහෝසි කිරීම, අඩු කිරීම, වෙනස් කිරීම, විධිමත් කිරීම, ඊට අදාල නීති සංශෝධනය , පළාත් සභා අරමුදල් විසර්ජනය කිරිම , පළාත් සභා අරමුදලට මුදල් භාර ගැනීම සහ වියදම් දැරීම සඳහා වූ ප්‍රඥප්ති නිර්දේශ කිරිම.
- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 24 (1) වගන්තිය අනුව වාර්ෂික විසර්ජන ප්‍රඥප්තිය ඇතුළු ක්‍රියාත්මක වන ප්‍රඥප්ති සහ නව ප්‍රඥප්ති අනුමැතියට පෙර සලකා බලන ලෙස සභාවට දැන්වීම.
- 154 (ඌ) වගන්තිය අනුව පළාත් සභාවෙන් අනුමත කළ වියදම් සඳහා බලය දීම.
- 154 (ඌ) වගන්තිය අනුව පරිපූරක ප්‍රදානයන් සඳහා අනුමැතිය ලබා දීම.
- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 28 (2) වගන්තිය අනුව ප්‍රදාන කිරීමට නිර්දේශ කිරීම.
- 154 (ඌ) වගන්තිය අනුව වාර්ෂික විසර්ජන ප්‍රඥප්තිය අනුමත කිරීම.

## 03. පරිපාලන බලතල

- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 (1) වගන්තිය අනුව පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරීන් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහකිරීම සහ විනය පාලන කටයුතු කිරීම.

- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 33 වගන්තිය අනුව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත් කිරීම.
- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 (2) වගන්තිය අනුව බලතල පැවරීම, නියෝග නිකුත් කිරීම.
- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 33 (8) වගන්තිය අනුව විනය අභියාචනා පිළිබඳ අවසන් තීරණ ගැනීම.

1987 අංක 42 දරන පළාත් සභා පනතට අනුව උතුරු මැද පළාත් රාජ්‍ය සේවය සම්බන්ධයෙන් හා මූල්‍ය පාලනය සම්බන්ධයෙන් හා මූල්‍ය පාලනය සම්බන්ධ සියලු බලතල ආණ්ඩුකාර ධූරයට හිමිව ඇත. එම බලතල අවස්ථානුකූලව අදාළ නිලධාරීන් වෙත පවරා උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ , පළාතේ මූල්‍ය පාලනයේ හා පළාත සංවර්ධනයේ , සියලු කටයුතු මෙහෙයවීම, අධීක්ෂණය හා මග පෙන්වීම සඳහා පහත කාර්යයන් සිදු කෙරේ.

- පළාත් සභාවේ අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම.
- විසර්ජන ප්‍රඥප්ති නිර්දේශ කර ඉදිරිපත් කිරීම, පරිපූරක ඇස්තමේන්තු නිර්දේශ කිරීම.
- විසර්ජන ප්‍රඥප්ති අනුමත කිරීම.
- දීප ව්‍යාප්ත සේවයේ නිලධාරීන් අනුයුක්ත කිරීම/ස්ථාන මාරු කිරීම/නිදහස් කිරීම.
- විශ්‍රාමික නිලධාරින් කොන්ත්‍රාත් පදනම මත පත් කිරීම.
- දීප ව්‍යාප්ත සේවයේ වැඩ බැලීම , පත් කිරීම, පාරිශ්‍රමික අනුමත කිරීම.
- විධිමත් විදේශ ගමන් වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් බැහැරට යාමට අනුමැතිය දීම.
- සියලු නව බඳවා ගැනීම්, පත් කිරීම් සඳහා අනුමැතිය ලබා දීම.
- දීමනා හා ගාස්තු අතිරේක පාරිශ්‍රමික ගෙවීමට අනුමැතිය දීම.
- බඳවා ගැනීමේ පටිපාටි සහ ව්‍යවස්ථා සංග්‍රහ අනුමත කිරීම / සංශෝධන සඳහා අනුමැතිය ලබා දීම.
- අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ පෞද්ගලික ලිපි ගොනු සම්බන්ධ කටයුතු කිරීම වැටුප් වර්ධක හා කාර්ය සාධන වාර්තා අනුමත කිරීම.
- ආණ්ඩුකාරවර අරමුදලින් ලබා දෙන ආධාර හා පරිත්‍යාග පිළිබඳව කටයුතු කිරීම.

- පළාත් සහා රාජ්‍ය සේවයට අදාල නිලධාරීන්ගේ ආයතන කටයුතු සඳහා ආයතන අධ්‍යක්ෂ ලෙස ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දීම.
- මධ්‍යම රජයේ චක්‍රලේඛ පළාත් සභා රාජ්‍ය සේවයට අදාල කිරීම.
- උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ විනය නියෝගවලට එරෙහිව අභියාචනා පිළිබඳ තීරණ ලබා දීම.
- උතුරු මැද පළාත් සභා නිලධාරීන්ගෙන්, අමාත්‍යංශවලින් , ආයතනවලින් ලැබෙන ලිපි පෙත්සම් පිළිබඳ කටයුතු කිරීම.
- පළාත් සභාවේ රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ අභියාචනා දුක් ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- වෘත්තීය සමිති ඉල්ලීම් අනුව සාකච්ඡා කැඳවීම, රැස්වීම් පැවැත්වීම, වාර්තා නිකුත් කිරීම.

## දැක්ම

"අභිමානවත් ජනතාවක්, සමෘද්ධිමත් පළාතක්"

## මෙහෙවර

"ව්‍යවස්ථාපිත කටයුතු, ප්‍රතිපත්ති සම්පාදනය, ආයතනික කටයුතු, මූල්‍ය නියාමනය සහ සමාජ - ආර්ථික කටයුතු සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව ජාතික ප්‍රතිපත්තියට අනුගතව සාධාරණ හා සමාන ක්‍රමවේද අනුව අභිමානවත් ජනතාවක් ජීවත්වන සමෘද්ධිමත් පළාතක් බිහිකිරීම සඳහා අඛණ්ඩව දායකවීම".

## අරමුණු

- ගුණාත්මක පළාත් රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම.
- විධිමත් මූල්‍ය කළමනාකරණයක් ඇති කරලීම.
- පළාතේ සංවර්ධනය සඳහා ප්‍රතිපත්තියක් සකස් කිරීම.
- මහජන ගැටලු විසඳීම සඳහා මගපෙන්වීම.
- සාරධර්ම පිළිපදින සමාජයක් කරා යොමු කිරීමට කටයුතු කිරීම.

## කෙටිකාලීන අරමුණු

- ඵලදායිතාවය වැඩිදියුණු කරලීම සඳහා පංචවිධ සංකල්පය යොදා ගැනීම, ඵලදියිතාවය මඟින් සේවක පිරිස් අභිප්‍රේරණය කරලීම,පළාත් රාජ්‍ය සේවයේ අක්‍රමිකතා අඩුකරලීම හා ඵලදායිතාවය ඉහල නැංවීම සඳහා අභ්‍යන්තර චක්‍රලේඛ, පුහුණු වැඩමුළු, සාකච්ඡා, සම්මන්ත්‍රණ සංවිධානය හා පසුවිපරම් කාර්යය ක්‍රියාත්මක කරලීම . ( අහඹු පරීක්ෂා කිරීම් හා සමීක්ෂණ මඟින්)
- වාර්ෂික මුදල් ප්‍රකාශයට අනුව ඇස්තමේන්තු කරන ලද කාර්යයන් අපේක්ෂිත අයුරින් ක්‍රියාත්මක කරවීම. (පළාත් භාණ්ඩාගාරය මඟින් සිදුකරන දැනුවත් කිරීම් සඳහා මඟපෙන්වීම, උපදෙස් හා අනුමැතීන් ලබාදීම, පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තු මඟින් වාර්ෂික වැඩසටහන් ක්‍රියාත්මක කරවීම හා පසු විපරම් ක්‍රියාවලියක් ඇති කරවීම. සිදුකරන ලද විමර්ශන වාර්තා අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අදාල බලධාරීන් දැනුවත් කිරීම හා අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම. )
- සාරධර්ම ප්‍රවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් සමාජ සංවර්ධනයට අත්වැලක් සැපයීම, ආගමික හා සිවිල් සමාජ සංවිධාන හරහා අධ්‍යාපනික මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අඩු පහසුකම් සහිත විහාරස්ථාන සංවර්ධනය හා සාමනේර වහන්සේලා සඳහා අධ්‍යාපන උපකාර කිරීම හා දහම් පාසල් සංවර්ධනය කිරීම හා රණවිරු පවුල් සුභසාධනයට මඟ පෙන්වීම.

ප්‍රධාන කාර්යයන්



## ප්‍රධාන උපාය මාර්ගයන්

පළාතේ පරිපාලන හා මූල්‍ය යාන්ත්‍රණය ක්‍රියාකරවීමේ ප්‍රධානම ආයතනය වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හා පළාත් සභා පනතින් ගරු ආණ්ඩුකාරතුමා වෙත පැවරී ඇති බලතල පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා ප්‍රධාන ලේකම් ඇතුළු පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ක්‍රියාත්මක කරවීම.


එසේම ජනතා සුභසාධනය හා සමාජ සංවර්ධනය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමට අවශ්‍ය ජාතික හා පළාත් සැලසුම් නිර්දේශයන් අනුව ක්‍රියාත්මක වෙමින් ඒ සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට පළාත් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

ජාතික ප්‍රතිපත්තියට අනුගතව, වසර 2030 වනවිට පළාත් සංවර්ධනයට අදාල තිරසර අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් හා මගපෙන්වීම අනුව , පළාතේ සියලුම අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාල අරමුණු ක්‍රියාවට නැංවීම මඟින් පළාතේ තිරසර සංවර්ධනය ඇති කිරීම මූලික අරමුණවේ .

## කාර්යය මණ්ඩල සංයුතිය - 2018

| විස්තරය | ගරු ආණ්ඩුකාරතුමා සහ පුද්ගලික කාර්යය මණ්ඩලය | ආණ්ඩුකාර ලේකම් ඇතුලු කාර්ය මණ්ඩලය |
|---|---|---|
| අනුමත සංඛ්‍යාව | 25 | 21 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 09 | 17 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 16 | 04 |
| අනියම් | 05 | 00 |




## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2018 වර්ෂයේ වියදම(රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 25.51 | 18.08 | 7.43 | 70.87 |
| ගමන් වියදම් | 0.47 | 0.50 | (0.03) | 106.38 |
| සැපයීම් | 5.97 | 4.56 | 1.41 | 76.51 |
| නඩත්තු වියදම් | 3.24 | 2.53 | 0.71 | 78.09 |
| ගිවිසුම්ගත සේවා | 3.64 | 2.47 | 1.17 | 67.86 |
| මාරු කිරීම් | 0.13 | 0.13 | | 100 |
| **එකතුව** | **38.96** | **28.27** | **10.69** | **72.56** |

## මූලධන වියදම - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය | 2018 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1.5 | 1.2 | 0.3 | 80 |
| යන්ත්‍ර සූත්‍ර සවිකිරීම් උපකරණ | 0.2 | - | 0.2 | - |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 0.6 | 0.06 | 0.54 | 10 |
| ගොඩනැගිලි අළුත්වැඩියා | 1.4 | 2.82 | (1.42) | 201.43 |
| සාරධර්ම ප්‍රවර්ධන ව්‍යාපෘතිය | 3.0 | 2.75 | 0.25 | 91.67 |
| **එකතුව** | **6.7** | **6.83** | **0.13** | **101.94** |

## කාර්ය සාධන ඉලක්ක - 2018

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ ප්‍රධාන ලේකම් කාර්යාලය/ අමාත්‍යමණ්ඩලය හා අමාත්‍යාංශවල නිර්දේශ සහිතව ඉදිරිපත් කරන සියලු පත්කිරීම්, උසස්කිරීම් , විශ්‍රාම ගැන්වීම් ,චක්‍රලේඛ ප්‍රඥප්ති හා උපදෙස් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීම සඳහා නිරීක්ෂණ හා නිර්දේශ සහිතව ඉදිරිපත් කිරීම හා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබුණු පසු නැවත ඒවා අදාල ආයතන වෙත යොමු කිරීම

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

### සාරධර්ම ප්‍රවර්ධනය සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය

| ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කල (රු.මි.) | වැය කල (රු.මි.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| සාහිත්‍යමය රස වින්දන වැඩසටහන් | සියලුම ජනයාගේ රස වින්දනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම. | 0.26 | 0.17 | 65.8 |
| මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් | මත්ද්‍රව්‍ය උවදුරෙන් තරුණ පරපුර බේරා ගැනීම. | 0.28 | 2.75 | 98.21 |

| ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කල (රු.මි.) | වැය කල (රු.මි.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| පාසල් ළමුන් වෙනුවෙන් විශේෂ අධ්‍යාපන වැඩසටහන් | සදාචාර සම්පන්න දරු පරපුරක් ගොඩනැගීම | 0.4 | 0.35 | 87.5 |
| අධ්‍යාපන ආධාර ලබාදීම | පහ ශ්‍රේණිය, අ.පො.ස. (සා.පෙ.) හා අ.පො.ස. (උ.පෙ.) විභාගයන්හී දිස්ත්‍රික් කුසලතාවයන් ඇගයීම සඳහා මුදල් ආධාර ලබාදීම මඟින් සිසු දරු දැරියන් දිරිමත් කිරීම. | 1.01 | 1.01 | 100 |
| සමාජ පුරෝගාමීන් ඇගයීම | පළාත වෙනුවෙන් පුරෝගාමී මෙහෙවරක් කිරීම සඳහා පුද්ගලයින් දිරිමත් කිරීම හා ඒ සඳහා පුද්ගලයින් පෙළඹවීම | 0.25 | 0.24 | 0.96 |
| අවම පහසුකම් සහිත ආගමික ස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය හා දහම් අධ්‍යාපනය වැඩිදියුණු කිරීම හා අසරණභාවයට පත් අයට උපකාර කිරීම හා කාලීන වෙනත් වැඩසටහන් | දහම් අධ්‍යාපනය සඳහා පහසුකම් වැඩිකිරීමෙන් පළාතේ සුචරිතවත් ආගමික නායකයින් බිහිවීම හා සදාචාර සම්පන්න දරු පරපුරක් බිහිකරලීම | 0.80 | 0.71 | 88.75 |

## 01. උතුරු මැද පළාත් සාරධර්ම ප්‍රවර්ධන ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලද වැඩසටහන් පිළිබඳ විස්තර

### i. අධ්‍යාපන ආධාර ලබාදීම.

| ආධාර වර්ගය | ස්ථානය | අනුරාධපුර දිස්ත්‍රික්කය | | පොළොන්නරුව දිස්ත්‍රික්කය | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | මුදල (රු.මි.) | සංඛ්‍යාව | මුදල (රු.මි.) | සංඛ්‍යාව | මුදල (රු.මි.) |
| 2017 වර්ෂයේ සහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ දිස්ත්‍රික් කුසලතාවයන් ඇගයීම සඳහා මුදල් ආධාර ලබාදීම | 1 ස්ථානය | 3 | 0.045 | 3 | 0.045 | 6 | 0.09 |
| | 2 ස්ථානය | 2 | 0.02 | 3 | 0.03 | 5 | 0.05 |
| | 3 ස්ථානය | 3 | 0.015 | 8 | 0.04 | 11 | 0.055 |
| 2017 වර්ෂයේ අ.පො.ස. සා/පෙළ විභාගයේ දිස්ත්‍රික් කුසලතාවයන් ඇගයීම සඳහා මුදල් ආධාර ලබාදීම | 1 ස්ථානය | 1 | 0.02 | 1 | 0.02 | 2 | 0.04 |
| | 2 ස්ථානය | 1 | 0.05 | 1 | 0.015 | 2 | 0.03 |
| | 3 ස්ථානය | 2 | 0.02 | 2 | 0.02 | 4 | 0.04 |
| 2017 වර්ෂයේ උසස් පෙළ විභාගයේ දිස්ත්‍රික් කුසලතාවයන් ඇගයීම සඳහා මුදල් ආධාර ලබාදීම | 1 ස්ථානය | 5 | 0.125 | 6 | 0.015 | 11 | 0.14 |
| | 2 ස්ථානය | 7 | 0.14 | 6 | 0.12 | 13 | 0.26 |
| | 3 ස්ථානය | 4 | 0.06 | 5 | 0.075 | 9 | 0.135 |
| **මුළු එකතුව** | | 28 | 0.46 | 35 | 0.38 | 63 | 0.84 |

### ii. ආගමික ස්ථාන නගා සිටුවීම සඳහා ආධාර ලබාදීම.

| අනු අංකය | කරන ලද කාර්යය |
|---|---|
| 01. | පිරිවෙන් 59ක් සඳහා පොත් කට්ටල ලබාදීම. |
| 02. | ආගමික ස්ථාන 12ක් සඳහා ආධාර කිරීම |

### iii. රසවින්දන වැඩසටහන්.

| වැඩසටහනේ නම | ආරාධිත දේශක | පැවැත්වූ ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| සාරධර්ම පිරි දරු පරපුරක් උදෙසා ගුණාත්මක බවින් යුත් සාහිත්‍යමය ඉහළ රසවින්දනය | ආචාර්ය අත්තනායක එම් හේරත් මහතා | විජයපුර ම.වි. | 400 |
| | | ආනන්ද බාලිකා වි. | 550 |
| | | තලාව ම.වි. | 500 |
| | | නිවත්තකචේතිය ම.වි. | 600 |
| | | නුවරගල ම.වි. | 250 |
| | | සිරිපුර ම.වි. | 250 |

**iv. ලේ දන්දීමේ වැඩසටහන.**

| ක්‍රියාකාරකම් | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|
| 01. ලේ දන්දීම | 150 |
| 01. දියවැඩියා පරීක්ෂාව<br>02. අධි රුධිර පීඩන පරීක්ෂාව<br>03. වකුගඩු පරීක්ෂාව<br>04. අක්ෂි හා ශ්‍රවන පරීක්ෂාව<br>05. ලේ දන්දීම | 200<br>200<br>200<br>200<br>221 |

**v. ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්.**

| වැඩසටහනේ නම | ආරාධිත දේශක | පැවැත්වූ ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන | කැබිත්ගොල්ලැව පොලිස් ස්ථානාධිපති | පදවිය මහසෙන් විද්‍යාලය | 300 |
| | | බුද්ධංගල විද්‍යාලය | 250 |

**vi. විශිෂ්ටයන් ඇගයීම.**

| වැඩසටහනේ නම | ආරාධිත දේශක |
|---|---|
| මනෝමයෙන් ගණන් සාදා ලෝකයේ තුන්වන ස්ථානය | ආර්.ඒ.ටී.රණසිංහ මයා |
| දෙරණ 60+ ජනප්‍රියම තරුව | බෙන්තරගේ ආරියවංශ මයා |

**02. ආණ්ඩුකාර ලේකම් කාර්යාලය මගින් පවත්වන ලද වෙනත් වැඩසටහන්.**

රට, දැය, සමය වෙනුවෙන් සම ජීවිතය පුජාකල විරෝධාර රණවිරුවන් අනුස්මරණය කිරීම සඳහා වාර්ෂිකව පවත්වනු ලබන රණවිරු සැමරුම් උළෙල 2018 වර්ෂයේද ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් උතුරු මැද පළාත් රණවිරු ස්මාරකය අභියසදී උත්සවාකාරයෙන් පවත්වන ලදී. ඒ සම්බන්ධයෙන් වන සවිස්තර සටහනක් පහතින් සඳහන් කර ඇත.

| අනු අංකය | සහභාගී වූ පිරිස් | සහභාගී වූ සංඛ්‍යාව | සිදුකරන ලද ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| 01. | පළාතේ ආගමික නායකයින් , ගරු ආණ්ඩුකාරතුමා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා හා පළාත් සභාවේ අනෙකුත් ගරු අමාත්‍යතුමන්ලා රණවිරු සේවා අධිකාරියේ සභාපතිනිය ඇතුළු රාජ්‍ය නිලධාරීන් හා උළෙල සඳහා අනුග්‍රහය දක්වන ලද රාජ්‍ය නොවන ආයතනවල ප්‍රධානීන් | 80 | මියගිය රණවිරුවන් අනුස්මරණය කරමින් රණවිරු ස්මාරකය අභියස පුෂ්පෝපහාර දැක්වීම හා රණවිරු උළෙල මෙහෙයවීමේ කටයුතු. |
| 02. | ත්‍රිවිධ හමුදා නිලධාරීන්, පොලිස් නිලධාරින් හා සිවිල් ආරක්ෂක බලකා නිලධාරින් | 300 | ආචාර පෙළපාලියහා බියුගල් වාදනය |
| 03. | මියගිය රණවිරුවන්ගේ දෙමාපියන් ඇතුළු ඥාතීන් | 1000 | රණවිරු ස්මාරකය අභියස පුෂ්පෝපහාර දැක්වීම. |

| | | |
|---|---|---|
| අධ්‍යාපන ආධාර ලබා දීමේ වැඩසටහන | සංඛ්‍යාව-63 මුදල- රු.975000.00 |  |
| ආගමික ස්ථාන නගා සිටුවීම | පිරිවෙන්- 59 ආගමික ස්ථාන- 12 |  |
| රසවින්දන වැඩසටහන් | වැඩසටහන් - 06 සහභාගී වූ සංඛ්‍යාව- 2550 |   |

| | | |
|---|---|---|
| ලේ දන්දීම ඇතුළු අනෙකුත් රෝග පරීක්ෂා කිරීම | වැඩසටහන්- 06 සහභාගීත්වය- 2170 |  |
| පළාත් රණවිරු උළෙල පැවැත්වීම හා විශිෂ්ටයින් ඇගයීම | වැඩසටහන්- 02 |   |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

උතුරු මැද පළාත් සභාව විසිරුවා හැරීමෙන් පසු ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් හා සියළුම ලේකම්වරුන්ගේ සහභාගීත්වයෙන් මහජන දින වැඩසටහන් සෑම සතියකම බදාදා දින පළාත් සභා ශ්‍රවණාගාරයේදී පවත්වනු ලබන අතර එහිදී පළාතේ ජනතාවගේ ගැටළුවලට විසඳුම් ලබා දීමක් සිදු කරනු ඇත.

2018 වර්ෂය තුළ පහත සඳහන් කාර්යයන් ගරු ආණ්ඩුකාරතුමා විසින් සිදු කර ඇත.

01. ප්‍රඥප්ති සකස් කිරීමට ප්‍රධාන ලේකම් වෙත අනුමැතිය ලබා දීම
02. 2019 වාර්ෂික මුදල් ප්‍රකාශය අනුමත කිරීම.
03. පරිපූරක අනුමත කිරීම.
04. බඳවා ගැනීමේ පරිපාටි අනුමත කිරීම් හා සංශෝධනය කිරීම් අනුමත කිරීම.
05. ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කරන අභියාචනා සඳහා කටයුතු කිරීම.
06. පළාත් පාලන ආයතනවලට අදාල උසාවි දඩ මුදල් නිදහස් කිරීම් සඳහා අනුමැතිය ලබා දීම.
07. පළාත් සභාවේ අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම.
08. විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත පත් කිරීම.
09. දීප ව්‍යාප්ත සේවයේ වැඩ බැලීම, පත් කිරීම,පාරිශ්‍රමික අනුමත කිරීම.
10. දීමනා හා ගාස්තු අතිරේක පාරිශ්‍රමික ගෙවීමට අනුමැතිය දිම.
11. අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ පෞද්ගලික ලිපි ගොනු සම්බන්ධ කටයුතු කිරිම වැටුප් වර්ධක හා කාර්ය සාධන වාර්තා අනුමත කිරිම.
12. මධ්‍යම රජයේ චක්‍රලේඛ පළාත් සභා රාජ්‍ය සේවයට අදාල කිරිම.

ඒ අනුව බලන විට 2018 වර්ෂයේදි පළාත් අණ්ඩුකාරවර කාර්යාලය සතු විෂයපථය මැනවින් ඉටුකරමින් වර්ෂය තුළ කාර්ය සාධනය යහපත් ලෙස සාධනය කර ගත හැකි වූ වසරකි.

- මෙය හිස්ව තබන ලද පිටුවකි -

# 02.පළාත් සභා ලේකම් කාර්යාලය

**පළාත් සභා ලේකම් කාර්යාලය පිළිබඳ මූලික විග්‍රහය**
**පළාත් සභා ඉතිහාසය**
**ආයතනයේ කටයුතුවලට බලාධිකාරිය ලැබී ඇති ආකාරය**

- ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (සංශෝධනය)
- පනත් -- 1987 අංක 42 දරණ පළාත් සභා පනත
- ප්‍රඥප්ති -- 1990 අංක 14 දරණ පළාත් සභා (ලේකම් කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය
- චක්‍රලේඛ හා වෙනත්

**ආයතනය ආරම්භ කරන ලද දිනය හා ඊට අදාළ මූලික තොරතුරු**

- දිනය - 1988 මැයි මස
- 1987 අංක 42 දරණ පළාත් සභා පනතතේ 17.1, 17.2 වගන්ති ප්‍රකාර පිහිටුවන ලද පළාත් සභාවේ කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාම සඳහා සභා ලේකම් කාර්යාලය පිහිටුවා ඇත.

**ආයතනයේ අතීතය**

1988 මැයි මස ආරම්භ කරන ලද පළාත් සභා ලේකම් කාර්යාලයට ස්ථිර වශයෙන් ගොඩනැගිල්ලක් නොතිබූ අතර මහ ලේකම් කාර්යාලයේ ලබාගත් කුඩා කාමරයක කාර්යාලයක් ස්ථාපිත කරන ලදී. පළාත් සභා රැස්වීම් පැවැත්වීම සඳහා නිසි ස්ථානයක් නොතිබුණි. අනුරාධපුර පණ්ඩුලගම ගම් උදා භූමියේ ඇති ගොඩනැගිල්ලක 1988.05.12 වෙනි දින ප්‍රථම සභා රැස්වීම් පවත්වා ඇත.පසුව අනුරාධපුර විවේකානන්ද විද්‍යාලයේ සන්ථාගාර ශාලාව ද මාස කිහිපයත් ප්‍රයෝජනයට ගත් අතර, නැවත අනුරාධපුර මහලේකම් ගොඩනැගිල්ලේ කුඩා රැස්වීම් ශාලාවක් ස්ථාපිත කර 2004 සැප්තැම්බර් දක්වා එහි සභා රැස්වීම් කටයුතු පවත්වාගෙන ගොස් ඇත.

**පළාත් සභාවේ සංයුතිය - 2018**

| | සංඛ්‍යාව |
|---|---|
| අමාත්‍යවරුන් | 05 |
| සභාපති | 01 |
| නියෝජ්‍ය සභාපති | 01 |
| විපක්ෂනායක | 01 |
| සභා නායක | 01 |
| ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක | 01 |
| විපක්ෂයේ ප්‍රධාන සංවිධායක | 01 |
| අනෙකුත් මන්ත්‍රීවරුන් | 22 |
| එකතුව | 33 |

**මහජන නියෝජිතයින්**

| දිස්ත්‍රික්කය | පාර්ලිමේන්තු | පළාත් සභා |
|---|---|---|
| අනුරාධපුර | 08 | 22 |
| පොළොන්රුව | 05 | 11 |
| එකතුව | 13 | 33 |

## දැක්ම

"මනා ක්‍රියාකාරිත්වයෙන් යුත් ජනතාවාදි පළාත් සභාවක්, සමෘද්ධිමත් පළාතක්".

## මෙහෙවර

"උතුරු මැද පළාතේ සමස්ත පළාත් සභා කටයුතුවල සංවර්ධනය උදෙසා සැසි හා රැස්වීම් කටයුතු සහ කාරක සභා කටයුතු අදාල පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව බල ගැන්වීම"

## දිගුකාලීන අරමුණු

පළාත් ව්‍යවස්ථාදායකයේ තීරණ කාර්යක්ෂම ලෙස ක්‍රියාවට නංවමින් පොදුවේ පළාතේ ජන ජීවිතය ඉහළ නැංවීමට දායක වීම.

## කෙටි කාලීන අරමුණු

- පළාත් සභාවට පැවරී ඇති නෛතික බලතල ක්‍රියාත්මක කිරීම උදෙසා පිහිටුවා ඇති ආයතන (පළාත් සභාව සහ කමිටු) විධිමත්ව හා අඛණ්ඩව පවත්වා ගෙන යෑම තුළින් ජනතාවගේ එදිනෙදා ප්‍රශ්න හා ගැටළු නිරාකරණය කිරීම.
- ගරු පළාත් අමාත්‍යවරුන්ට මන්ත්‍රී වරප්‍රසාද යටතේ හා ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා, ගරු විපක්ෂනායකතුමා, ගරු සභානායකතුමා, ගරු ආණ්ඩු පක්ෂයේ හා ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරුන්ට ජන ජීවිතය ඉහළ නැංවීම සඳහා වරප්‍රසාද හා අවශ්‍ය පහසුකම් සැලසීම.
- ඉහත I හා II කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම උදෙසා ලේකම් කාර්යාලය පවත්වාගෙන යාම.

## ප්‍රධාන කාර්යයන්




## ප්‍රධාන උපාය මාර්ගයන්.

ව්‍යවස්ථාදායකයේ තීරණ කාර්යක්ෂම ලෙස ක්‍රියාවට නැංවීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 22 |
| 2 | සේවයේ නියුතු | 26 |
| 3 | පුරප්පාඩු | 02 |
| 4 | අනියම් | 01 |

## පුනරාවර්තන වියදම් - 2018

### පළාත් සභා ලේකම් කාර්යාලය

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 15.26 | 14.37 | 0.88 | 94.17 |
| ගමන් වියදම් | 0.2 | 0.17 | 0.23 | 85.00 |
| සැපයිම් | 0.95 | 0.94 | 0.01 | 98.95 |
| නඩත්තු වියදම් | 1.52 | 1.40 | 0.1 | 92.11 |
| ගිවිසුම්ගත සේවා | 0.25 | 0.21 | 0.04 | 84.00 |
| මාරු කිරීම් | 0.01 | 0 | 0.01 | 0 |
| **එකතුව** | **18.19** | **17.09** | **1.1** | |

## පුනරාවර්තන වියදම් - 2018

### පළාත් සභාව

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 72.05 | 5.51 | 66.53 | 7.65 |
| ගමන් වියදම් | 0.25 | 0.12 | 0.11 | 48.00 |
| සැපයිම් | 10.64 | 2.90 | 7.73 | 27.26 |
| නඩත්තු වියදම් | 2.37 | 1.41 | 0.95 | 59.49 |
| ගිවිසුම්ගත සේවා | 6.00 | 2.93 | 3.07 | 48.83 |
| **එකතුව** | **91.32** | **12.90** | **70.92** | |

## මූලධන වියදම් - 2018

පළාත් සභා ලේකම් කාර්යාලය

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| වාහන | 0.5 | - | 0.5 | 0 |
| **එකතුව** | **0.5** | **-** | **0.5** | **0** |

## මූලධන වියදම් - 2018

පළාත් සභාව

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| 1. ගොඩනැගිලි හා ඉදිකිරීම | - | - | - | - |
| 2. යන්ත්‍ර සූත්‍ර සවි කිරීම හා උපකරණ | - | - | - | - |
| 3. වාහන | 0.5 | - | 0.5 | 0 |
| 4. වෙනත මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩි දියුණු කිරීම | - | - | - | - |
| **එකතුව** | **0.5** | **-** | **0.5** | **0** |

## පළාත් සභා ලේකම් කාර්යාලය

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| 1. ගොඩනැගිලි හා ඉදිකිරීම | 0.5 | 0.49 | - | 98.00 |
| 2. ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 0.5 | 0.45 | 0.04 | 90.00 |
| 3. යන්ත්‍ර සූත්‍ර සවි කිරීම හා උපකරණ | 0.4 | 0.08 | 0.31 | 20.00 |
| 4. වාහන | 0.6 | - | 0.6 | 0 |
| **එකතුව** | **0.5** | **-** | **0.5** | **0** |

තිරසර සංවර්ධනය මගින් ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්ව ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම සඳහා අවශ්‍ය දේශපාලන නායකත්වය ලබා දීම සඳහා ක්‍රියාත්මකවන ප්‍රධානම ආයතනයවන මෙම පළාත් සභාව එහි ගෞරවය හා අභිමානය සුරැකෙන ආකාරයෙන් පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය මූලික පහසුකම් සියල්ලක්ම පාහේ සපුරා ගැනීමට මේ වනවිට සමත්ව ඇත.

ගොඩනැගිලි පහසුකම්, ප්‍රවාහන පහසුකම් අවශ්‍ය මට්ටමට සපුරා ගෙන ඇති අතර, අවශ්‍ය කාර්ය මණ්ඩල පුරප්පාඩු නොමැති වීමද හේතුවෙන් මෙම කාර්යාලයේ සේවාවන් අඛණ්ඩව හා යාවත්කාලීනව ඉටු කිරීමට සමත්වී ඇත.  කාර්යාලයේ ගිණුම් කටයුතු හා අනෙකුත් රාජකාරි කටයුතු යාවත්කාලීව පවත්වා ගෙන යමින් අපේක්ෂිත සේවාවන් උපරිම තලයකට ගෙන ඒමට කටයුතු කර ඇත.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

තිරසාර සංවර්ධනය මගින් ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්වය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම සඳහා අවශ්‍ය දේශපාලන නායකත්වය ලබා දීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රධානම ආයතනය වන මෙම පළාත් සභාව එහි ගෞරවය හා අභිමානය සුරැකෙන ආකාරයෙන් පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය මූලික පහසුකම් සියල්ලක්ම පාහේ සපුරා ගැනීමට සමත් වී ඇත.

පළාත් සභාව විසුරුවා හැරීමත් සමග පළාත් සභාව හා සම්බන්ධ කාර්යයන් වර්ෂය තුළ ක්‍රියාත්මක නොවිය.

- මෙය හිස්ව තබන ලද පිටුවකි -

# 03. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලතල පැවරෙන ආකාරය

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ, 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ විධිවිධාන අනුව, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත.

1987 අංක 42, 1989 අංක 12 දරණ පළාත් සභා අනුශාංගික විධිවිධාන පනත හා 1990 අංක 28 දරණ පළාත් සභා සංශෝධිත පනත අනුව, ගරු ආණ්ඩුකාරතුමා සතු පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධ කටයුතු සිදු කිරීමේ බලතල පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරේ.

උතුරු මැද පළාත් සභාව ස්ථාපනය කරන ලද දින සිට උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක වන අතර පළාත් සභා පනතේ හා සංශෝධිත වගන්ති අනුව සහ ගරු ආණ්ඩුකාරතුමා විසින් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරා ඇති බලතල අනුව කටයුතු කරනු ලබයි.

## දැක්ම

"ප්‍රශංසනීය පළාත් රාජ්‍ය සේවයක්, සංවර්ධිත පළාතක් "

## මෙහෙවර

"බඳවා ගැනීමේ පරිපාටි සහ පළාත් රාජ්‍ය සේවා කළමනාකරණය, සිය පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව විධිමත්ව ඉටුකරමින් ප්‍රශංසනීය පළාත් රාජ්‍ය සේවයක් සඳහා අඛණ්ඩව දායකවීම."


## දිගුකාලීන අරමුණු

- තෘප්තිමත් රාජ්‍ය සේවයක් ගොඩනැංවීම පිණිස පළාත් රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩල අවශ්‍යතා නිවැරදිව පුරෝකථනය කිරීම, කාලීනව සුදුසු තීරණ ගැනීම හා ක්‍රියා කිරීම.
- පළාත් රාජ්‍ය සේවය තුළ විනය පවත්වාගෙන යාම සහ නියාමනය කිරීම
- ප්‍රශස්ත රාජ්‍ය සේවයක් පවත්වා ගැනීම සඳහා අඛණ්ඩව මැදිහත්වීම.

## කෙටිකාලීන අරමුණු

- උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැන්වීම දක්වා වූ ආයතනික කටයුතු විධිමත් කිරීම.
- වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම.
- විනය නියෝගවලට අදාල අභියාචනා සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියා කිරීම.
- නිසි කලට කාර්යක්ෂමතා කඩඉම් විභාග හා දෙපාර්තමේන්තුගත පරීක්ෂණ පැවැත්වීම.

## ප්‍රධාන කාර්යයන්




## ප්‍රධාන උපාය මාර්ගයන්

- කාර්ය මණ්ඩල තොරතුරු හඳුනා ගැනිම හා යාවත්කාලීන කිරීම.
- බඳවා ගැනීමේ පරිපාටි විධිමත්ව අනුමතකර ගැනීම හා කාලීන අවශ්‍යතා අනුව අදාල සංශෝධන කිරීම.
- පත් කිරීමේ සිට විශ්‍රාම ගැන්වීම දක්වා ආයතනික කටයුතු ක්‍රියාත්මක කිරීම.
- විනය පාලනයට අදාල අභියාචනා පිළිබඳව සමාලෝචනය හා තීරණ ගැනීම.
- පත් කිරීම හා ස්ථානමාරු පිළිබඳව මධ්‍යම රජය හා අනෙකුත් පළාත් සභා සමග කටයුතු කිරීම.
- බඳවා ගැනීමේ හා උසස්වීම් සඳහා වූ වාර්ෂික විභාග සැලැස්ම විධිමත්ව සකස් කිරීම හා සැලසුම්සහගතව ක්‍රියාත්මක කිරීම.
- විනය කටයුතු හා කාර්ය මණ්ඩල නියාමනය සඳහාවන උපදෙස් හා චක්‍රලේඛ නිකුත් කිරීම.
- අවශ්‍යතා පරිදි නිසි කල්හී පුරප්පාඩු පිරවීම, උසස්වීම්, ස්ථිර කිරීම ලබා දීම හා විනය ක්‍රියාමාර්ග ගැනීම.

## අංශ නියෝජනය කරන තිරසාර සංවර්ධන අරමුණු

8 DECENT WORK AND ECONOMIC GROWTH

තිරසාර පරිපූර්ණ ආර්ථික වර්ධනය සුරක්ෂිත කිරීම පූර්ණ හා ඵලදායිත්වයෙන් යුත් සේවා නියුක්තිය සුරක්ෂිත කිරීම, සියලු දෙනාටම වැදගත් රැකියාවක් කිරීමට ඇති අයිතිය සුරක්ෂිත කිරීම සඳහා රාජ්‍ය සේවයට බඳවා ගැනීම්, මාරු කිරීම්, උසස් කිරීම් ආදි කටයුතුවලදී රාජ්‍ය ක්‍රමවේදයන්ට අනුව සාධාරණව හා යුක්තිගරුකව කටයුතු කිරීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත සංඛ්‍යාව | 30 |
| 2 | සේවයේ නියුතු සංඛ්‍යාව | 26 |
| 3 | පුරප්පාඩු | 03 |
| 4 | කොන්ත්‍රාත් | 01 |

## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි.) | 2018 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 16.29 | 15.68 | 0.61 | 96.24 |
| ගමන් වියදම් | 0.10 | 0.10 | 0.00 | 98.36 |
| සැපයීම් | 1.79 | 1.73 | 0.06 | 96.71 |
| නඩත්තු වියදම් | 0.90 | 0.88 | 0.01 | 98.41 |
| ගිවිසුම්ගත සේවා | 5.16 | 4.81 | 0.35 | 93.20 |
| මාරු කිරීම් | 0.21 | 0.18 | 0.03 | 87.97 |
| **එකතුව** | 24.45 | 23.39 | 1.06 | 95.65 |

## මූලධන වියදම් - 2018

| වියදමෙ ස්භාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2018 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය ( %) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0.70 | 0.60 | 0.10 | 85.10 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 0.40 | 0.40 | 0.00 | 98.99 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 0.90 | 0.80 | 0.10 | 89.29 |
| **එකතුව** | **2.00** | **1.80** | **0.20** | **89.78** |

## කාර්ය සාධන ඉලක්ක - 2018

| අනු අංකය | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 |
| 1 | උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැන්වීම දක්වා වූ ආයතනික කටයුතු විධිමත් කිරීම. | | | | |
| | බඳවා ගැනීම් | බඳවා ගැනීම් ප්‍රමාණය | 1099 | 146 | ඉල්ලීම් ලැබෙන පරිදි |
| | සේවය ස්ථිර කිරීම් | සේවය ස්ථිර කිරීම් ප්‍රමාණය | 223 | 271 | ඉල්ලීම් ලැබෙන පරිදි |
| | උසස්වීම් | උසස්වීම් ප්‍රමාණය | 390 | 208 | ඉල්ලීම් ලැබෙන පරිදි |
| | විශ්‍රාම ගැන්වීම් | විශ්‍රාම ගැන්වීම් ප්‍රමාණය | 45 | 66 | ඉල්ලීම් ලැබෙන පරිදි |
| 2 | වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම | | | | |
| | සංවර්ධන නිලධාරී | ප්‍රමාණය | - | 169 | 128 |
| | කළමනාකරණ සහකාර | ප්‍රමාණය | 81 | 106 | 127 |
| | කාර්යාල කාර්ය සහයක | ප්‍රමාණය | 09 | 18 | 33 |
| | රියදුරු | ප්‍රමාණය | 22 | 31 | 32 |

| අනු අංකය | ආයතනයේ අරමුණු | කාර්යසාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 |
| 3 | විනය නියෝගවලට අදාළ අභියාචනා සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියා කිරීම<br>• පළමු අභියාචනා බලධරයා වශයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ග | ක්‍රියා මාර්ග සංඛ්‍යාව | 04 | 05 | ඉල්ලීම් ලැබෙන පරිදි |
| 4 | නිසි කලට කාර්යක්ෂමතා කඩඉම් විභාග හා දෙපාර්තමේන්තුගත පරීක්ෂණ පැවැත්වීම (කාර්යක්ෂමතා කඩඉම් ප්‍රමාණය) | කාර්යක්ෂමතා කඩඉම් ප්‍රමාණය) | 45 | 36 | 64 |
| 5 | තෘප්තිමත් රාජ්‍ය සේවයක් ගොඩනැංවීම පිණිස පළාත් රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩල අවශ්‍යතා නිවැරදිව පුරෝකථනය කිරීම, කාලීනව සුදුසු තීරණ ගැනීම හා ක්‍රියා කිරීම (ගෙන ඇති ක්‍රියා මාර්ග) | (ගෙන ඇති ක්‍රියා මාර්ග සංඛ්‍යාව) | - | - | 01 |
| 6 | පළාත් රාජ්‍ය සේවය තුළ විනය පවත්වාගෙන යාම සහ නියාමනය කිරීම.<br><br>වාර්ෂික විනය සංචිතය පිහිටුවීම | | 01 | 01 | 01 |
| 7 | ප්‍රශස්ත රාජ්‍ය සේවයක් පවත්වා ගැනීම සඳහා අඛණ්ඩව මැදිහත්වීම<br>• බඳවා ගැනීම් පරිපාටි සකස් කර අනුමත කර ගැනීම | අනුමත කළ බඳවා ගැනීම් පරිපාටි සංඛ්‍යාව | 04 | 01 | 05 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

2018 වර්ෂය තුළදී පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු විෂයපථය තුළ පළාත් රාජ්‍ය සේවයට බඳවා ගැනීම් සඳහා බඳවා ගැනීමේ විභාග පැවැත්වීම හා ඒ අනුව පත්කිරීම් සිදු කිරීම ද , කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම හා උසස්වීම ලබා දීමද සිදු විය. එසේම සේවය ස්ථිර කිරීම්, විශ්‍රාම ගැන්වීම් මෙන්ම වාර්ෂික ස්ථානමාරු ප්‍රතිපත්තිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම ද විනය නීතිවලට අදාල අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම ද සිදු විය.

## 2018 වර්ෂය තුළ බඳවා ගැනීම් හා පත් කිරීම්

| අනු අංකය | තනතුරු හා ආයතන විස්තර | බඳවා ගත් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | කාර්මික නිලධාරී 111 ශ්‍රේණිය (පුහුණු ශ්‍රේණියේ සිට ස්ථිර කිරීම) | 6 |
| 2 | පළාත් ආයුර්වේද සහකාර කොමසාරිස් | 1 |
| 3 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 1 |
| 4 | කළමනාකරණ සහකාර 111 ශ්‍රේණිය - සීමිත | 33 |
| 5 | ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ මැහුම් උපදේශිකා | 8 |
| 6 | පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ බදු නිලධාරී | 4 |
| 7 | පරිවාසහා ළමාරක්ෂකසේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරී | 5 |
| 8 | ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද නිලධාරී (සේවා මුක්ත භට) | 1 |
| 9 | ශ්‍රීලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1 (ආ) ශ්‍රේණියට පත් කිරීම. | 54 |
| 10 | ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරී 111 ශ්‍රේණියේ තනතුරට පත් කිරීම. | 3 |
| 11 | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමූපකාර සංවර්ධන නිලධාරී තනතුරට පත් කිරීම. | 8 |
| 12 | පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරී 11 ශ්‍රේණියේ තනතුරට පත් කිරීම. | 1 |
| 13 | උතුරුමැද පළාත් ගණකාධිකාරී තනතුරු සඳහා පත් කිරීම. (කොන්ත්‍රාත්) | 7 |
| 14 | ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරී (පළාත් පාලන දෙපාර්තමේන්තුව) | 1 |
| 15 | උතුරුමැදපළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්) එක් අවුරුදු පුහුණු කිරීමේ ශ්‍රේණියේ නිලධාරීන් ස්ථිර සේවයට පත් කිරීමට අදාළ පරීක්ෂණය.– 2018 (ලිඛිත පරීක්ෂණය) | 12 |
| 16 | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම. | 1 |
| | **බඳවා ගත් මුළු ප්‍රමාණය** | **146** |

## 2018 වර්ෂයේදී පවත්වන ලද බඳවා ගැනීමේ විභාග

| තනතුර | ආයතනය | විභාගය පැවැත්වූදිනය |
|---|---|---|
| ආදායම් පරීක්ෂක | පළාත් පාලන දෙපාර්තමේන්තුව | 2018.08.19 |
| ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරී | පළාත් පාලන දෙපාර්තමේන්තුව | 2018.08.26 |
| විගණන හා විමර්ශන නිලධාරී | අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව | 2018.10.27,28 / 2018.11.03 |
| සමාජ සේවා නිලධාරී | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 2018.10.27 |
| භාෂා පරිවර්තක | පළාත් පාලන දෙපාර්තමේන්තුව | 2018.10.27 , 28 |
| රෝහල් ඕවර්සියර් | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 2018.06.23 |
| උපස්ථායක/ උපස්ථායිකා | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 2018.09.15 |

## 2018 වර්ෂයේදී පවත්වන ලද කාර්යක්ෂමතා කඩඉම් විභාග

| අනු අංකය | කාරණය | පෙනී සිටඅයදුම්කරුවන් ගණන |
|---|---|---|
| 1 | **පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව -කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2017 (ප්‍රායෝගික)** | |
| | I. වඩුකර්ම උපදේශක II | 02 |
| | II. පේෂකර්ම උපදේශක II | 26 |
| | III. පේෂකර්ම උපදේශක III | 01 |
| 2 | **පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව** | |
| | I. නිවාස මාතා II | 3 |
| | II. සහකාර මේට්‍රන් III | 2 |
| 3 | පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව - වාස්තු විද්‍යාඥ සේවය III | 1 |
| 4 | **පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව** | |
| | I. අරක්කැමි I | 1 |
| | II. අරක්කැමි/ ඕවර්සියර් III | 9 |
| 5 | පළාත් පාලනආයතන - සහකාර ගිණුම් නිලධාරී III | 3 |

| අ.අ | කාරණය | අයදුම්කරුවන් ගණන |
|---|---|---|
| 6 | පළාත්ආයුර්වේද දෙපාර්තමේන්තුව - වාට්ටු ලිපිකරු III | 1 |
| 7 | පළාත් පරිවාස භාළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව - උප වෝර්ඩන් II | 1 |
| 8 | අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ කාර්යාල - රියදුරු II | 3 |
| 9 | අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ කාර්යාල - රියදුරු III | 15 |
| 10 | පළාත්පරිවාස භාළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව-පෙරපාසල් ගුරු II | 1 |
| 11 | උතුරුමැද පළාතේ රාජ්‍ය සේවයේ තාක්ෂණ සහායක IIIශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.– 2018 (ලිඛිත පරීක්ෂණය) | 4 |
| 12 | උතුරු මැද පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරී IIශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම්පරීක්ෂණය.– 2018 (ලිඛිතපරීක්ෂණය) | 2 |
| 13 | උතුරු මැද පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මැනුම් ක්ෂේත්‍රසහායක Iශ්‍රේණියේ කාර්යක්ෂමතාකඩඉම් පරීක්ෂණය.– 2018 (වාචික පරීක්ෂණය) | 6 |
| 14 | උතුරුමැද පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ වඩු / පේෂ Iශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.– 2018 (ලිඛිත පරීක්ෂණය) | වඩු - 02<br>පේෂ - 05 |
| 15 | උතුරුමැද පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ වඩු / පේෂ IIශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය .– 2018 (ලිඛිත පරීක්ෂණය) | වඩු - 01<br>පේෂ - 09 |
| 16 | උතුරු මැද පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ වඩු / පේෂ IIIශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම්පරීක්ෂණය. – 2018 (ලිඛිත පරීක්ෂණය) | පේෂ - 01 |
| 17 | උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ රියදුරු Iශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය– 2018 (වාචික පරීක්ෂණය) | 1 |
| 18 | උතුරුමැද පළාත් රාජ්‍ය සේවයේ රියදුරු IIශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.– 2018 (ප්‍රායෝගික පරීක්ෂණය) | 2 |
| 19 | උතුරුමැද පළාත් රාජ්‍ය සේවයේ රියදුරු IIIශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.– 2018 (වාචික පරීක්ෂණය) | 8 |
| 20 | උතුරු මැදපළාත් ආයුර්වේදදෙපාර්තමේන්තුවේ සම්භාහණකරු / සම්භාහණකරු IIIශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.– 2018 | 1 |
| 21 | උතුරු මැද පළාතේ පළාත් පාලන ආයතනවල ගිනිහට කාර්යක්ෂමතා කඩඉම්පරීක්ෂණය.– 2018 (ලිඛිත පරීක්ෂණය) | 1 |
| 22 | ප්‍රධානලේකම් කාර්යාලයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී II කාර්යක්ෂමතා කඩඉම්පරීක්ෂණය.– 2018 (ලිඛිත පරීක්ෂණය) | 2 |

| අ.අ | කාරණය | අයදුම්කරුවන් ගණන |
|---|---|---|
| 23 | උතුරු මැද පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආදායම්පරීක්ෂක III කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2018 | 22 |
| 24 | උතුරුමැද පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආදායම් පරීක්ෂක II කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2018 | 03 |
| 25 | උතුරු මැද පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආදායම්පරීක්ෂක I කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2018 | 01 |
| 26 | උතුරු මැද පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ වැඩ පරිපාලක / සෞඛ්‍ය පරිපාලක / පොදු වෙළඳසැල් පරිපාලක III කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2018 | 01 |
| 27 | උතුරු මැද පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ වඩු IIශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය– 2018 (ප්‍රායෝගික පරීක්ෂණය) | 01 |
| 28 | උතුරු මැද පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ පේෂ IIශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම්පරීක්ෂණය– 2018 (ප්‍රායෝගික පරීක්ෂණය) | 02 |
| 29 | උතුරු මැද පළාතේ පළාත් පාලන ආයතනවල ගිනිභට කාර්යක්ෂමතා කඩඉම්පරීක්ෂණය– 2018 (ප්‍රායෝගික පරීක්ෂණය) | 01 |
| 30 | උතුරු මැද පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2018 | 04 |
| 31 | ශ්‍රී ලංකාඉංජිනේරු සේවයේ IIIශ්‍රේණියේ නිලධාරීන් සඳහා වනකාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2018 | 09 |
| 32 | උතුරු මැද පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමූපකාර සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2018 | 29 |
| 33 | උතුරු මැද පළාතේ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ (උපස්ථායක / අරක්කැමි) III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම්පරීක්ෂණය. – 2018 | 02 |
| 34 | උතුරු මැද පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පෙරපාසල් ගුරු (පාලිකා)Iශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2018 | 01 |
| 35 | උතුරුමැද පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පෙර පාසල් ගුරු (පාලිකා)II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2018 | 01 |
| 36 | උතුරු මැද පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පෙරපාසල් ගුරු (පාලිකා)IIIශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2018 | 04 |

## කොමිෂන් සභා වාර්ෂික ප්‍රගති වාර්තාව - 2018.12.31 දිනට

| අ.අ | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | උතුරු මැද පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණයකිරීම | 79 |
| 02 | i. අන්තර් පළාත් ගුරු ස්ථාන මාරු (මුදා හැරීම) | 181 |
| | ii. අන්තර් පළාත් ගුරු ස්ථාන මාරු (සුහද) | 22 |
| | iii. අන්තර් පළාත් ගුරු ස්ථාන මාරු (තුන්කොන් සුහද) | 01 |
| | iv. අන්තර් පළාත් ගුරු ස්ථාන මාරු (පැමිණීම්) | 111 |
| 03 | i. අන්තර් පළාත් / රාජ්‍ය වෙනත් ස්ථාන මාරු (මුදා හැරීම්) | 32 |
| | ii. අන්තර් පළාත් / රාජ්‍යවෙනත් ස්ථාන මාරු (සුහද) | 09 |
| | iii. අන්තර් පළාත් / රාජ්‍ය වෙනත් ස්ථාන මාරු (තුන්කොන් සුහද) | 02 |
| | iv. අන්තර් පළාත් / රාජ්‍යවෙනත් ස්ථාන මාරු (පැමිණීම්) | 38 |
| 04 | i. අභ්‍යන්තර ස්ථාන මාරු (මුදාහැරීම්/ පැමිණීම්) | 25 |
| | ii. අභ්‍යන්තර ස්ථාන මාරු (සුහද) | 04 |
| 05 | විධිමත් පත්වීම් ලිපි නිකුත් කිරීම. | 80 |
| 06 | පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කිරීම. | 271 |
| 07 | උසස්වීම්. | 208 |
| 08 | විශ්‍රාම ගැන්වීම් | |
| | i. ශ්‍රී ලංකා විදුහල්පති සේවය | 35 |
| | ii. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 02 |
| | iii.පළාත් රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු | 29 |
| 09 | **වෙනත් තීරණ**<br>**i.** කොමිෂන් සභාව විසින් කරන ලද නිර්දේශ<br>අ) කාර්යක්ෂමතා කඩඉම් සමත් වීම සඳහා සහන කාලයක් ලබා දීම.<br>(ආ) පළාත් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ පරිපාටි අනුව අන්තර්ග්‍රහණය<br>(ඇ) වෙනත් | 709 |
| | ii.කොමිෂන් සභාව විසින් අනුමත කරනලද තීරණ | 111 |
| | iii.කොමිෂන්සභාවේ ආවරණ අනුමැතියට යොමු කළ ලිපි | 08 |
| | iv.උතුරුමැද පළාත් රාජ්‍ය සේවයට අදාළව කොමිෂන් සභාව විසින්ගන්නා ලද වෙනත් තීරණ | 07 |
| 10 | **වෙනත් කාර්යයන්**<br>**i.** කොමිෂන් සභාවේ බලතල සංශෝධනය කිරීම<br>**ii.** පළාත් විනය කාර්ය සංග්‍රහය සංශෝධනය කිරීම.<br>**iii** පළාත් කාර්ය පරිපාටි සංග්‍රහය අනුමත කිරීම.<br>**iv.** ආයතනික ධාරිතා සංවර්ධන වැඩසටහන්<br>• සම්පත්දායක සංචිතය පුහුණු කිරීම.<br>• කාර්යය මණ්ඩලය සඳහා පුහුණුව<br>• අධ්‍යාත්මික සංවර්ධණ වැඩසටහන.<br>**v.එලදායිතා වැඩසටහන්**<br>• අධ්‍යන චාරිකාවක යෙදීම<br>• ශ්‍රමදානයක් පැවැත්වීම | <br><br><br><br><br>01<br>01<br>01<br><br>01<br>01 |

## සම්පත් උපයෝජනය හා කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

සමාලෝචිත වර්ෂයේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික සංඛ්‍යාව 03 ක් වූ අතර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව 27 ක් විය. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මෙහෙවර ප්‍රකාශය අනුව යමින් අනුමත රාජ්‍ය ප්‍රතිපත්තිවලට හා විධිමත් කාර්ය පටිපාටිවලට අනුකූලව 2018 වර්ෂය තුළදී ක්‍රියාකර ඇත.

2018 වර්ෂය තුළදී 602 වැය ශීර්ෂය යටතේ පෞද්ගලික පඩිනඩි වශයෙන් රු. 15,679,095/- ක මුදලක් සහ අනෙකුත් පුනරාවර්තන වියදම් වශයෙන් රු. 7,706,437.00 ක මුදලක් වියදම් දරා ඇත.
2018 වර්ෂයේදී මූලධන වියදම් යටතේ මෙම ආයතනයට වාර්ෂික ඇස්තමේන්තු අනුව රු. 1,861,000.00ක ප්‍රතිපාදන මුදලක් වෙන්කර තිබුනි. එයින් යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම සඳහා රු. 404,000.00ක ප්‍රතිපාදනයක් වෙන්කර තිබූ අතර, රු. 399,937.00ක මුදලක් වැයකර කාර්ය මණ්ඩලයේ හා පරිපාලනයේ කාර්යක්ෂමතාවය ඉහළ නංවන පරිදි යන්ත්‍ර සූත්‍ර, ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ සපයා ගන්නා ලදි. කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විභාගවල කටයුතු පහසුකර ගැනීම සඳහා දත්ත පද්ධතියක් සකස් කරගැනීමට රු. 896,000.00ක මුදල් ප්‍රතිපාදන වෙන්කරගෙන, රු. 800,000.00 වැයකර එම දත්ත පද්ධතිය සකස් කර ගන්නා ලදි.

ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වෙන් කර දුන් රු.700,000.00ක ප්‍රතිපාදනයෙන් රු. 595,729.00 ක මුදලක් වැයකර කාර්යාලයේ සහ සභා කාමරයේ පිවිසුම් කොරිඩෝව ටයිල් අතුරා අලුත්වැඩියා කර ගන්නා ලදි. මෙම කාර්යාලයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් අංක 60201 සඳහා වාර්ෂික ඇස්තමේන්තු යටතේ රු.2,000,000.00ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර, ඒ යටතේ රු.1,993,818.00ක මුදලක් කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම් වශයෙන් ගෙවීමට හා ණයශේෂ පියවීමට කටයුතු කර ඇත. එසේම වාර්ෂික ඇස්තමේන්තු යටතේ අවම බැර සීමාව රු.1,150,000.00 ක් වූ අතර තත්‍ය බැරකිරීම් ප්‍රමාණය රු. 1,153,000.00 ක් විය.

කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් කැපවීම වැදගත් විය. ඒ අනුව 2018 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිත කාර්යක්ෂමතා කඩයිම් විභාග , බඳවා ගැනීමේ විභාග හා පත් කිරීම් ආදිය සිදුකර ඇත. එමෙන්ම පළාත් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැන්වීම දක්වා නියාමනය කිරීමට අදාල රාජ්‍ය සේවකයින්ගේ සියළුම කටයුතු මෙම ආයතනයට ලැබෙන පරිදි ඉටු කිරීම සිදු කර ඇත.

- මෙය හිස්ව තබන ලද පිටුවකි -

# 04. පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව

## දැක්ම

“තෘප්තිමත් සමුපකාර කාර්යය මණ්ඩලයක්, උසස් මට්ටමේ සේවාවක්”.

## මෙහෙවර

“සමුපකාර සේවකයින්ගේ ආයතනික ගැටළු හා සේවා සේවක ගැටුම් නිරාකරණය සහ ආයතනික ධාරිතාව වර්ධනය සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් යහපාලනය පවත්වා ගනිමින් තෘප්තිමත් කාර්යය මණ්ඩලයක් බිහිකොට සමුපකාර සේවාව උසස් මට්ටමකට ගෙන ඒමට අඛණ්ඩව දායක වීම”.

## අරමුණු

- ගුණාත්මක සමුපකාර සේවක ආයතනික ක්‍රියාවලියක්.
- යහපත් සේවා සේවක සබඳතාවක්.
- ගුණාත්මක සේවා සේවක සබඳතාවක්.
- ගුණාත්මක සේවාවක් සපයන ආයතනයක්.
- සංහිඳියාවෙන් යුත් ආයතනයක්.

## කෙටිකාලීන අරමුණු

- සමුපකාර සේවක පත් කිරීම්, උසස් කිරීම්,සේවා ස්ථිරත්වය ලබා දීම.
- සමුපකාර සේවක පුහුණු පැවැත්වීම.
- සේවක අභියාචනා සලකා බැලීම.

## ප්‍රධාන කාර්යයන්



## ප්‍රධාන උපාය මාර්ගයන්


- සමුපකාර සේවකයින්ගේ ආයතනික ගැටළු නිරාකරණය.
- සේවා සේවක ගැටුම් නිරාකරණය.
- යෝජිත නව වැටුප් සංශෝධනයක් ක්‍රියාත්මක කිරීම තුළින් සේවක මානසික වර්ධනය ඇති කිරීම.
- ආයතනය තුළ යහපාලනය හා සම්බන්ධ මූලධර්ම ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය කටයුතු කෙරෙහි මැදිහත්වීම.

## අංශය නියෝජනය කරන තිරසාර සංවර්ධන අරමුණු

- සමුපකාර සේවක පත්වීම්, ස්ථිර කිරීම්, උසස් වීම් ලබා දීම මගින් විධිමත් ආයතනික ක්‍රියාදාමයක් අනුගමනය කිරීම.
- සමුපකාර සේවක පුහුණු වැඩ මුළුව පැවැත්වීම මගින් සේවකයින්ගේ දැනුම වර්ධනය වීම, සමිතිවල උසස් මට්ටමේ සේවාවක් පවත්වාගෙන යාමට හැකි වීම, මහජන සේවාවන් උසස් මට්ටමින් ලබා දීමට හැකි වීම.
- සමුපකාර සේවක අභියාචනා පිළිබඳව නිවැරදි තීරණ ගැනීම, සමුපකාර සේවක අභිප්‍රේරණය වැඩි දියුණු වීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 08 |
| 2 | සේවයේ නියුතු | 06 |
| 3 | පුරප්පාඩු | 02 |




## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 4.90 | 4.32 | 0.58 | 88.16 |
| ගමන් වියදම් | 0.16 | 0.12 | 0.04 | 75 |
| සැපයීම | 0.50 | 0.49 | 0.01 | 98 |
| නඩත්තු වියදම් | 0.31 | 0.29 | 0.02 | 93.54 |
| ගිවිසුම්ගත සේවා | 0.87 | 0.72 | 0.15 | 82.75 |
| **එකතුව** | **6.74** | **5.94** | **0.80** | **88.13** |

## මූලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 0.11 | 0.11 | 0.00 | 100 |
| **එකතුව** | **0.11** | **0.11** | **0.00** | **100** |

## කාර්ය සාධන ඉලක්ක 2017 – 2019

| අනු අංකය | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|---|---|
| | | | **2017** | **2018** | **2019** |
| 01 | සමුපකාර සේවකයින් පුහුණු කිරීම | සේවකයින්ගේ දැනුම වර්ධනය | 180 | 351 | 400 |
| 02 | සමුපකාර සේවක පත් කිරීම, උසස් කිරීම් සේවා ස්ථිරත්වය ලබා දීම | විධිමත් ආයතනික ක්‍රියාදාමයක් අනුගමනය කිරීමට හැකි වීම | 40 | 67 | 75 |
| 03 | සේවක අභියාචනා සලසා ගැනීම | සේවකයින්ට සහන සැලසීම | 08 | 10 | 20 |

## කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින්හි ප්‍රගතිය

| ප්‍රධාන අරමුණු | ඉටු කර ගැනීම සඳහා කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ මුදල (රු.මි) | වැය කළ මුදල (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| ප්‍රධාන අරමුණු 01 | සමුපකාර සේවක පුහුණු වැඩමුළු පැවැත්වීම | සමුපකාර සේවකයින්ගේ ආකල්ප දැනුම, කුසලතා වර්ධනය | 0.32 | 0.31 | 97 |
| ප්‍රධාන අරමුණු 02 | සමුපකාරවල පුරප්පාඩු වී ඇති සාමාන්‍යාධිකාරී, ගණකාධිකාරී තනතුර සඳහා බඳවා ගැනීම | සමුපකාර සමිතිවල ස්ථාවරත්වය තහවුරු කිරීම | 0.08 | 0.03 | 37 |
| ප්‍රධාන අරමුණු 03 | ආයතනයේ සේවකයින්ට පරිගණක හා උපාංග මිලදී ගැනීම | සේවක කාර්ය සාධනය ඉහළ නැංවීම | 0.08 | 0.08 | 100 |

## ආයතනයේ අනාගත අපේක්ෂාවන්

| අරමුණු | ඉලක්ක | | අපේක්ෂිත ප්‍රතිඵල | |
|---|---|---|---|---|
| | 2020 | 2021 | කෙටිකාලීන | දිගුකාලීන |
| සමුපකාර සේවක පුහුණු පැවැත්වීම | 450 | 500 | සේවක දැනුම වැඩි කිරිම | ගුණාත්මක සේවාවන් සැපයීම |
| සමුපකාර සේවක පත් කිරීම්, උසස් කිරීම්,සේවා ස්ථිරත්වය ලබා දීම | 85 | 90 | සේවක ස්ථාවරත්වය ඇති කිරිම | ගුණාත්මක සමුපකාර සේවක ආයතනික ක්‍රියාවලියක් අනුගමනය කිරිම |
| අභියාචනා සලකා බැලීම | 25 | 30 | සේවක සහන සැලසීම | යහපත් සේවා සේවක සබතාවය ඇති වීම |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස...

2018 වර්ෂයේදී සැලසුම් කළ ආකාරයට සංවර්ධන කටයුතු මෙහෙයවීමට හැකියාව ලැබුණි. ඒ යටතේ සමුපකාර සේවකයින්ගේ දැනුම වර්ධනය කිරීම අරමුණු කරගනිමින් ඒ සඳහා සමුපකාර සේවක පුහුණු පැවැත්වීමට හැකි විය. තවද විධිමත් ආයතනික ක්‍රියාදාමයක් අනුගමනය කරමින් සමුපකාර සේවක පත්කිරිම්, උසස්විම් හා ස්ථිර කිරිම් වඩාත් ඵලදායිව මෙන්ම කාර්යක්ෂමව කිරිමට හැකි විය.

2018 වර්ෂය සඳහා වෙන් වු ප්‍රතිපාදන යොදවා සමුපකාර ක්ෂේත්‍රයේ නවතාවයන් ඇති කිරීමට හැකියාව ලැබීම හා සමුපකාර සමිතිවල සේවකයින් පුහුණු කිරීම මගින් සේවාවන් උසස් මට්ටමකට රැගෙන ඒමට හැකි වීම.

# 05. ප්‍රධාන ලේකම් කාර්යාලය

ප්‍රධාන ලේකම් කාර්යාලයේ සංයුතිය ආයතන 06කින් සමන්විත වේ.




## දැක්ම

"කාර්යක්ෂම, ඵලදායි හා ජනතාවාදී පළාත් රාජ්‍ය සේවයක්, සංවර්ධිත පළාතක්"

## මෙහෙවර

"පළාත් රාජ්‍ය සේවයේ පරිපාලන, මානව සම්පත්, මූල්‍ය, සැලසුම්, ඉංජිනේරු කටයුතු හා මධ්‍යම රජය ප්‍රමුඛ බාහිර පාර්ශව සමග සම්බන්ධීකරණය, විශේෂ සමාජ ආර්ථික වැඩසටහන්වලට පහසුකම් සැපයිම, ආපදා කළමනාකරණය සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් සහ විනිවිද භාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම. "

## දීර්ඝකාලීන අරමුණු

- ❖ පළාත් රාජ්‍ය සේවයේ පරිපාලන කටයුතු සහ මානව සම්පත් සංවර්ධනය ප්‍රශස්ත මට්ටමින් ඉටු කිරීම තුළින් මහජනතාවට තෘප්තිමත් හා කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ලබාදෙන කුසලතා පූර්ණ කාර්ය මණ්ඩලයක් බිහි කිරීම.
- ❖ මහජනතාවට ගුණාත්මක සේවයක් සපයන සංහිදියාවෙන් යුතු ආයතන පද්ධතියක් බිහි කිරීම.
- ❖ ඉහළ ඵලදායිතාවයකින් යුතු සමාජයීය, ආර්ථික හා සංවර්ධන වැඩසටහන් දියත් කිරීම.

## කෙටිකාලීන අරමුණු

- ❖ කාර්යය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය.
- ❖ කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් ලබා දීම සඳහා ආයතනික පරිසරය සකස් කිරීම.
- ❖ මහජනතාවට ඵලදායි දීර්ඝකාලීනව ප්‍රතිලාභ ලැබිය හැකි සමාජයීය හා ආර්ථික සංවර්ධන වැඩසටහන් හඳුනා ගැනීම, තක්සේරුකරණය සහ ක්‍රියාත්මක කිරීම.

## ප්‍රධාන කාර්යයන්


- පළාත් රාජ්‍ය සේවයේ පරිපාලන කටයුතු හා මානව සම්පත් සංවර්ධනය.
- අනුබද්ධ දෙපාර්තමේන්තු හා ආයතනවල කටයුතු නියාමනය.
- මධ්‍යම රජය ප්‍රමුඛ බාහිර පාර්ශව සමග සම්බන්ධීකරණය සංවර්ධනය.
- විශේෂ සමාජ ආර්ථික වැඩසටහන්වලට පහසුකම් සැපයීම සංවර්ධනය.
- ආපදා කළමනාකරණය සංවර්ධනය.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහපාලන කටයුතු සංවර්ධනය.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ❖ වර්තමාන නෛතික හා පරිපාලන ව්‍යුහයට අනුගත වෙමින්, මානව සම්පත් සංවර්ධනය සහ අභිප්‍රේරණය.
- ❖ සංවර්ධන,සැලසුම් හා පරිපාලන යන ත්‍රිත්ව කාර්යයන්හී මෙහෙයුම් හා අධීක්ෂණ ක්‍රියාවලිය විධිමත් කිරීම.

## කාර්යය මණ්ඩල සංයුතිය - 2018

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| අනුමත | 86 |
| සේවයේ නියුතු | 67 |
| පුරප්පාඩු | 21 |
| අනියම් | 02 |
| කොන්ත්‍රාත් | 03 |




## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 34.07 | 33.90 | 1.24 | 100 |
| ගමන් වියදම් | 309.00 | 17.45 | 10.05 | 6 |
| සැපයීම් | 7.90 | 4.69 | 3.21 | 59.36 |
| නඩත්තු වියදම් | 15.81 | 9.47 | 5.74 | 59.89 |
| ගිවිසුම්ගත සේවා | 5.00 | 0.83 | 4.17 | 16.60 |
| **එකතුව** | **371.78** | **66.34** | **24.41** | **17.84** |

## මූලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 306.20 | 335.91 | 3.62 | 109.70 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම් හා උපකරණ | 0.20 | - | - | 0 |
| වාහන | 0.50 | - | - | 0 |
| **එකතුව** | **306.90** | **335.91** | **3.62** | |

## අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 16

**තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සෑම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම.**

16.6. සියළුම මට්ටම්වලදී ඵලදායි වගවීමෙන් යුක්ත සහ විනිවිදභාවයෙන් යුත් ආයතන පිහිටුවීම.

16.7. සියළුම මට්ටම්වලදී ප්‍රතිචාරාත්මක , සියළු දෙනා අන්තර්ගත වූ සහභාගීත්වයෙන් යුත් සහ නියෝජනයෙන් යුත් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් පැවතීම තහවරු කිරීම.

## මානව සම්පත් සංවර්ධනය සඳහා ප්‍රධාන ලේකම් කාර්යාලයේ දායකත්වය

2018 වසර තුළ මානව සම්පත් සංවර්ධනය යටතේ උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් අලුතින් අනුමත කළ තනතුරු සංඛ්‍යාව පහත පරිදි වේ.

| තනතුර | ප්‍රමාණය |
|---|---|
| රියදුරු | 01 |
| උද්‍යාන කළමනාකරු | 02 |
| කැබිතිගොල්ලෑව පිරිමි පාසල සඳහා සියවම තනතුරු | 19 |
| පොළොන්නරුව නගර සභාව සඳහා සියළුම තනතුරු | 10 |
| ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා සියළුම තනතුරු | 02 |

එමෙන්ම විවිධ රාජ්‍ය ආයතනවලින් ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීමට යොමු කෙරෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන් 195 දෙනෙකු 2018 වසරේදී ප්‍රායෝගික පුහුණුව ලබා දීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

එමෙන්ම 2018 තුළදී උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ 194 දෙනෙකු පුහුණු වීම සඳහා විදේශගත කිරීම්වලට අදාල කටයුතුද ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් සිදු කර ඇත.

**01. පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කටයුතු නියාමනය.**

උතුරු මැද පළාත් සභාව යටතේ ක්‍රියාත්මකවන අමාත්‍යාංශ 05ක් ඇති අතර ඒ ඒ අමාත්‍යාංශ යටතේ සහ ප්‍රධාන ලේකම් කාර්යාලය යටතේ ඇති දෙපාර්තමේන්තු 18ක සියළුම පරිපාලන කටයුතු සම්බන්ධ කාර්ය භාරය උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් ඉටු කරනු ලබයි. ඒ අනුව අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල කටයුතු නියාමනය කිරීම සඳහා අමාත්‍යාංශ දෙපාර්තමේන්තු මට්ටමින් විවිධ සාකච්ඡා සහ රැස්වීම් විශාල සංඛ්‍යාවක් ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලැබීය. එමෙන්ම 2018 වසරේදී ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ලේකම් කමිටු 03ක් පවත්වා ඇත.

## නීතිමය අංශය සවිබල ගැන්වීම සඳහා 2018 වසරේ සෘජු දායකත්වය

උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය යටතේ නීති ඒකකයක් පිහිටුවා ඇති අතර මෙම ඒකකය හරහා උතුරු මැද පළාත් සභාවට අයත් ආයතනයන්හී සියළුම නෛතික කටයුතු සහ අවශ්‍ය අවස්ථාවන්වලදී නීති සහය සිදු කරනු ලැබේ. 2018 වසරට අදාලව ලැයිස්තු ගත වූ නඩු සංඛ්‍යාව 30වන අතර 2018 වසරේ අවසන් වූ නඩු සංඛ්‍යාව 03 කි.

## 2018 වර්ෂය තුළ සකස් කරන ලද ගිවිසුම්

| අනු අංකය | ගිවිසුම | ආයතන |
|---|---|---|
| 01 | විභාග පැවැත්වීමේ හා ඇගයීමේ කටයුතු කඩිනමින් සිදු කිරීමේ අරමුණෙන් ප්‍රාදේශීය වශයෙන් ඇගයීම් මධ්‍යස්ථානයක්, විභාග මධ්‍යස්ථානයක් හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ස්ථිර කාර්යාලයක් ආරම්භ කිරීම | ප්‍රධාන ලේකම් කාර්යාලය හා විභාග කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව |
| 02 | උතුරු මැද පළාතේ ආර්ථික, සමාජීය හා පාරිසරික සංවර්ධන කටයුතුවලදී උතුරු මැද පළාත් සභාව හා රජරට විශ්ව විද්‍යාලය එක්ව සහයෝගයෙන් කටයුතු කිරීම සම්බන්ද ගිවිසුම | ප්‍රධාන ලේකම් කාර්යාලය හා රජරට විශ්ව විද්‍යාලය,මිහින්තලේ |
| 03 | උතුරු මැද පළාතේ සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්නා විශ්‍රාමික වැඩිහිටි නිවාසයට පුද්ගලයින් ඇතුළත්කර ගැනීම සඳහා වන ගිවිසුම | පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව සහ බුල්නෑව සුපසන් වැඩිහිටි නිවාස අධිකාරිය |
| 04 | වාර්ෂික නඩත්තු ගිවිසුම | ප්‍රධාන ලේකම් කාර්යාලය |
| 05 | ජල සම්පාදන මණ්ඩලය සම්බන්ධ ගිවිසුම | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 06 | ගුවන් හමුදා පර්යන්තය සම්බන්ධ ගිවිසුම | ප්‍රධාන අමාත්‍යාංශය |

## පළාතේ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති නියාමනය කිරීම සඳහා දායකත්වය

උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් උතුරු මැද පළාතේ සංවර්ධන කටයුතු නියාමනය, අධීක්ෂණය හා තිරසර සංවර්ධනය සඳහා අවශ්‍ය කටයුතු ඉටු කරනු ලබයි. මේ යටතේ 2018 වසර තුළදී ප්‍රධාන ව්‍යාපෘතීන්වන මෙත්සිරි සෙවණ ව්‍යාපෘතිය, කොරකහවැව ඉදි කෙරෙන පළාත් කළමනාකරණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ නව ගොඩනැගිල්ල ඉදි කිරීම ප්‍රධාන ලේකම් කාර්යාලයේ සෘජු අධීක්ෂණය සිදු කරනු ලබයි. එමෙන්ම ප්‍රධාන ලේකම්තුමාගේ මූලිකත්වයෙන් ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය, කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සෘජු මැදිහත් වීම් සිදු කරන ලදි.

## පළාතේ වකුගඩු රෝගීන්ට ප්‍රශස්ත පහසුකම් සැලසීම සඳහා මෛත්‍රී සෙවණ ව්‍යාපෘතිය...

### ඇස්තමේන්තු මුදල රු.මි. 276.00

| වර්ෂය | වියදම |
|---|---|
| **2016** | 22,008,575.34 |
| **2017** | 35,887,978.64 |
| **2018** | 96,345,484.57 |
| **මුළු වියදම** | **154,242,038.55** |

උතුරු මැද පළාතේ ගැටළුවක්ව පවතින වකුගඩු රෝගය හේතුවෙන් පීඩාවට පත්වන ජනතාවට පහසුකම් සැපයීමේ අරමුණින් මෛත්‍රී සෙවණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. ජනාධිපති ලේකම් කාර්යාලයේ කාර්ය සාධන බලකායේ ප්‍රතිපාදන මත උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ මෙහෙයවීම හා අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා ශ්‍රම දායකත්වය ත්‍රිවිධ හමුදාව මගින් ලබා දෙන ලදී. මෙහිදී ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණෙන රෝගීන්හට පහසුකම් සැපයීම සිදු කරයි.

**මෛත්‍රී සෙවණ ව්‍යාපෘති ප්‍රතිලාභ**

**බිම් මහල**
කාන්තාවන් හා පිරිමි ලෙස නවාතැන් ගැනීම සඳහා පහසුකම් ඇත.
කාන්තාවන් හා පිරිමින් 38 බැගින් 76 දෙනෙකුට පහසුකම් සලසා ඇත

**දෙවන මහල**
ලේ මාරු කිරීම සඳහා පැමිණෙන්නන්හට ස්ථිර නවාතැන් සැපයීම
කාමර 18

**තෙවන මහල**
විශේෂඥ වෛද්‍යවරුන්ට රෝගීන් පරීක්ෂාව සඳහා හා රසායනාගාර පහසුකම් සැපයීම

**සිව්වන මහල**
රැස්වීම් ශාලාව පර්යේෂණ හා සමීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම




## උතුරු මැද පළාත තුල ප්‍රධාන ලේකම් කාර්යාලයේ මුලිකත්වයෙන් සිදු කළ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්හී ප්‍රගතිය

| අ.අ | වැඩසටහන | පැවැත්වූ සංඛ්‍යාව |
|---|---|---|
| 01 | සිවිල් ආරක්ෂක වැඩසටහන් | 02 |
| 02 | නීතිය බලාත්මක කිරීමේ නිලධාරීන් සවිබල ගැන්වීමේ පුහුණු වැඩසටහන් | 03 |
| 03 | ගුරු පුහුණු වැඩසටහන් | 13 |
| 04 | පාසැල් වැඩසටහන්(සිසුන් සඳහා) | 09 |
| 05 | පාසල් වැඩසටහන්(දෙමාපියන් සඳහා) | 07 |
| 06 | රාජ්‍ය නිලධාරීන් සඳහා (ප්‍රාදේශීය ලේකම් කාර්යාල) | 04 |
| 07 | බන්ධනාගාර නිලධාරීන් සඳහා | 01 |
| 08 | පොලිස් ජංගම සේවා | 07 |
| 09 | ප්‍රජා විශෝධන වැඩ සටහන් | 12 |
| 10 | කණ්ඩායම් උපදේශන වැඩසටහන් | 28 |
| 11 | පළාත් මත්ද්‍රව්‍ය පාලන කමිටු රැස්වීම් | 02 |
| 12 | ජනාධිපති මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් | දින 07 |

තිරසර සංවර්ධන අරමුණු අංක 03 යටතේ දක්වා ඇති නීරෝගී ජීවිත සහතිකකර සැම වයසකම සිටින සියල්ලනගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සහතික කිරීම සඳහා දිනෙන් දින උග්‍ර වන මත්ද්‍රව්‍ය භාවිතයෙන් සමාජය මුදවා ගැනීම අරමුණුකොට මත් නිවාරණ වැඩසටහන් පවත්වන ලදී.

ඒ යටතේ සියළු පාර්ශවකරුවන් ආවරණයවන පරිදි වැඩසටහන් අනු පහ (95)ක් වර්ෂය තුළදී පවත්වන ලදී.

විශේෂයෙන්ම පාසල් සිසුන් හා දෙමාපියන්,රාජ්‍ය නිලධාරීන්,බන්ධනාගාර නිලධාරීන්, පළාත් මත්ද්‍රව්‍ය පාලන කමිටු ආවරණයවන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. අතිගරු ජනාධිපතිතුමාගේ මත් නිවාරණ වැඩසටහන යටතේ පළාතේ මත් නිවාරණ වැඩසටහන් හත (07)ක් ක්‍රියාත්මක කරන ලදී.

### පළාත තුළ යහපාලන සහ කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් ස්ථාපිත කිරීම සඳහා

උතුරු මැද පළාත තුළ යහපාලන සහ කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් ස්ථාපිත කිරීමේ අරමුණින් මධ්‍යම රජය විසින් පවත්වනු ලබන විවිධ චක්‍ර ලේඛ හා අණපනත් මෙම පළාතට අදාලකර ගැනීම, ක්‍රියාවට නැංවීම උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් සිදු කරනු ලබයි. ඒ අනුව 2018 වසර තුළදී පහත චක්‍ර ලේඛනයන් උතුරු මැද පළාත් සභාව තුළ ක්‍රියාත්මක වී ඇත.

ඒ යටතේ අභ්‍යන්තර චක්‍රලේඛ 03ක් නිකුත්කර ඇත. එසේම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 17ක්, සෞඛ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛ 22ක්, අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 01ක්, ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 01ක් කළමනාකරණ සේවා චක්‍රලේඛ 01ක් ද වශයෙන් චක්‍ර ලේඛ 42ක් පළාතට අදාල කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලදී.

## ආයතනික ධාරිතා සංවර්ධනය

උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය, එම කාර්යාලයේ පමණක් නොව සමස්ත උතුරු මැද පළාත් සභාවේ සියළුම ආයතනයන්හි ආයතනික ධාරිතා සංවර්ධනය සඳහා සෘජු දායකත්වයක් දක්වයි. ඒ අනුව 2018 වසර තුලදී,උදෑසන ප්‍රධාන රැස්වීම් පැවැත්වීම, සතියේ සෑම සඳුදා සහ බදාදා දිනකම උතුරු මැද පළාත් සභාවේ ප්‍රධාන රැස්වීම ප්‍රධාන ලේකම්තුමාගේ මූලිකත්වයෙන් පවත්වනු ලැබේ. එහිදී 2018 වසර තුළ ප්‍රධාන රැස්වීම් 98ක් පවත්වා ඇති අතර පළාත සභාව යටතේ ඇති ආයතන 07කට එම රැස්වීම්වල වගකීම පවරා ඇත.

## උතුරු මැද පළාත කේන්ද්‍රකර ගනිමින් 2018 වසරේදී පැවැත්වූ විවිධ උත්සව සඳහා සහභාගීත්වය හා සංවිධානය

පළාත තුළ වාර්ෂිකව ක්‍රියාත්මක වන ජාතික අලුත් සහල් මංගල්‍ය,57 වන බුද්ධගයා ජාතික මහා පෙරහර, 70 වන නිදහස් සමරු උළෙල, අනුරාධපුර ඓතිහාසික ශ්‍රී දළදා පෙරහර,ජාතික පොසොන් පැන් පෙරහර, අනුරාධපුර මහා විහාර පොසොන් සති පිරිත් පිංකම,ජාතික පොසොන් උත්සව සතිය සාරානන්ද වෙසක් කලාපය, වාර්ෂික පිච්ච මල් පූජාව,උතුරු මැද පළාත් රණවිරු සැමරුම් උළෙල සාරානන්ද වෙසක් කලාපය වැනි උත්සව සඳහා දායකත්වය ලබා දෙන ලදී.

නිසලනිම්නය පුණ්‍යානුමෝදනා වැඩසටහන,ශ්‍රී සංඝමිත්තා මහරහත් මෙහෙණින් වහන්සේගේ 2326 වන ගුණ සමරු උළෙල,පිණ්ඩපාත දානය,සර්වඥ ධාතු ප්‍රදර්ශනය වැනි උත්සව සඳහා දායකත්වය ලබා දෙන ලදී.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

**2018** වර්ෂයේ ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් වාර්ෂික කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා සැලසුම්ගත ක්‍රියාවලියක නිරත විය. පළාතේ සංවර්ධනය උදෙසා විවිධ විෂයන් සඳහා ගිවිසුම් සකස් කිරීම, උපදෙස් හා නිරීක්ෂණ ලබා දෙමින් මග පෙන්වීම, උතුරු මැද පළාත දූමින් මතින් නිදහස් සෞඛ්‍යමත් ප්‍රදේශයක් බවට පත් කිරීම සඳහාවන ක්‍රියාමාර්ග ගැනීම, අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම, ආයතනික ධාරිතා සංවර්ධනය උදෙසා රැස්වීම් පැවැත්වීම, ශ්‍රමදාන, ක්‍රීඩා හා ශරීර සුවතා ප්‍රවර්ධන සතිය ක්‍රියාත්මක කිරීම හා රජරට අභිමන් පුරවැසි හරසර, අලුත් සහල් මංගල්‍යය, සති පිරිත, ඒ අනුව ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යයන් 2017 වර්ෂයට සාපේක්ෂව වඩාත් ඵලදායිව මෙන්ම කාර්යක්ෂමව ඉටු කිරීමට හැකි වී ඇත.

2018 වර්ෂය, විශේෂයෙන්ම රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මෙන්ම විදේශීය අරමුදල් මගින් ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධීකරණය මගින් පළාතේ සංවර්ධන කාර්යය සඳහා සම්බන්ධ වීමට හැකි වූ මෙන්ම ඉහළ කාර්ය සාධනයක් කරා ළඟා විය හැකි වූ වර්ෂයකි.

- මෙය හිස්ව තබන ලද පිටුවකි -

# 5.1. පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

1988.05.12 දින උතුරු මැද පළාත් සභාව ස්ථාපනය කිරීමත් සමඟම ප්‍රධාන ලේකම් කාර්යාලයට අයත් ඒකකයක් වශයෙන් මෙම ආයතනය ආරම්භ කරන ලදී. පසුව මෙම ආයතනය පළාත් සභා කැබිනට් තීරණයක් මඟින් පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව වශයෙන් නම් කරන ලදී. ප්‍රධාන ලේකම් කාර්යාලයට අයත් ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වේ.

**දැක්ම**

“ඵලදායි පළාත් සංවර්ධන සැලසුම්කරණ ක්‍රියාවලියක්, සෞභාග්‍යමත් පළාතක්.”

**මෙහෙවර**

“පළාතේ සමස්ත සංවර්ධන ක්‍රියාවලියේ සැලසුම්කරණය , ප්‍රගති පාලනය හා ඇගයීම , අංගසම්පූර්ණ දත්ත පද්ධතිය , අධ්‍යයන හා පර්යේෂණ , විදේශ ව්‍යාපෘති අධීක්ෂණය , පළාතේ සංවර්ධන සැලසුම් අංශ මනාව මෙහෙයවීම, ප්‍රතිපත්ති, කාර්ය සාධනය සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් , විනිවිදභාවයෙන් හා සමතාවයෙන් ක්‍රියාවට නංවමින් ජාතික සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට අඛණ්ඩව දායකවීම”

**දිගුකාලීන අරමුණු**

- රාජ්‍ය ආයතන ප්‍රධානීන් අතර සැලසුම්කරණ ක්ෂේත්‍රය පිළිබඳ සාමුහික බවක් ඇති කිරීම.
- නායකත්වය අතර සාමුහික වගකීමක් සහ පැවැත්මක් ඇති කිරීම.
- පාර්ශවකරුවන් අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම.
- කළමනාකරණ තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම.
- පළාතේ යහපාලනය ඇති කිරීමට සැලසුම්කරණය තුළින් මග පෙන්වීම.
- කළමනාකරණ තොරතුරු පද්ධතියක් ඇති කිරීම මඟින් පාර්ශවකරුවන් අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම.

**පළාතේ සංවර්ධනය කඩිනම් කිරීම**

**කෙටිකාලීන අරමුණු**

- තොරතුරු තාක්ෂණය පදනම් කරගෙන දත්ත පද්ධතිය වඩා නිවැරදිව යාවත්කාලීන කර දත්ත පාර්ශවකරුවන් අතට පත් කිරීම.
- පළාත් ආයෝජනයේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- රැකියා විරහිත උපාධිධාරීන් ලියාපදිංචි කිරීම
- උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම
- වාර්ෂික ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කිරීම.
- වාර්ෂික කාර්ය සාධන වාර්තාව නිකුත් කිරීම.
- ජනාධිපති ලේකම් කාර්යාලය හා මුදල් කොමිෂන් සභාවේ කාර්යයන් ඉට කිරීම.
- ජාතික ප්‍රතිපත්ති සැලසුම් හා වැඩසටහන් පළාත තුළ ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛස්ථානය ලබා දීම.
- විශේෂ ව්‍යාපෘති, විදේශ ව්‍යාපෘති, විමධ්‍යගත ආදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

## ප්‍රධාන කාර්යයන්


01. පළාත සඳහා දීර්ඝකාලීන හා මධ්‍යකාලීන සැලසුම් පිළියෙල කිරීම.
02. වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලසුමක් පිළියෙලකර එය ක්‍රියාත්මක කිරීම, ප්‍රගතිය ඇගයීම අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීම.
03. සංවර්ධන සැලසුම් සඳහා දත්ත රැස් කිරීම, පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම.
04. සමීක්ෂණ හා පර්යේෂණ පැවැත්වීම.
05. පළාත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ප්‍රගතිය ඇගයීම හා ඉලක්කයන් කරා ළඟා වීම.
06. නව ව්‍යාපෘති හඳුනා ගැනීම, ඇගයීම හා තක්සේරුව.
07. විදේශාධාර හා ණය ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
08. ආංශික සැලසුම් හා ආයතනික සැලසුම් පිළියෙල කිරීම හා ඒ සඳහා ආයතනවලට සහාය වීම.
09. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සැලසුම් ඒකක මෙහෙයවීම හා සම්බන්ධීකරණය.
10. ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් රැස්කර ගැනීම හා පළාත් සැලසුම් සඳහා අදාල කර ගැනීම.
11. රජයේ ආයතන සමඟ සැලසුම් කටයුතු සම්බන්ධීකරණය.
12. අනෙකුත් පළාත් සභාවල සැලසුම් දෙපාර්තමේන්තු සමඟ කටයුතු කිරීම.
13. සැලසුම්වලට අදාල මුදල් කොමිෂම, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ එක්ව කටයුතු කිරීම.
14. ප්‍රධාන අමාත්‍යවරයාට, අමාත්‍යවරුන්ට හා ප්‍රධාන ලේකම් වරයාට සැලසුම්කරණයට සහය වීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

1. දිගුකාලීන, මධ්‍යකාලීන හා කෙටිකාලීන සංවර්ධන සැලසුම් සැකසීම.
2. වාර්ෂික ක්‍රියාකාරි සැලසුම සැකසීම, ක්‍රියාත්මක කිරිම හා ප්‍රගතිය මැනීම.
3. සංවර්ධන සැලසුම්කරණය සඳහා යාවත්කාලීන කරන ලද දත්ත භාවිතය.
4. නව ව්‍යාපෘති අවස්ථා හඳුනා ගැනිම හා ක්‍රියාත්මක කිරිම.
5. අන්තර් ආයතන සම්බන්ධීකරණය.
6. විදේශ ව්‍යාපෘති සම්බන්ධීකරණය.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අ .අං | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 55 |
| 2 | සේවයේ නියුතු | 43 |
| 3 | පුරප්පාඩු | 12 |




## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 28.51 | 25.35 | 3.16 | 89 |
| ගමන් වියදම් | 1.50 | 1.43 | 0.07 | 95 |
| සැපයීම් | 3.27 | 2.79 | 0.48 | 85 |
| නඩත්තු වියදම් | 1.69 | 1.65 | 0.04 | 98 |
| ගිවිසුම්ගත සේවා | 3.31 | 3.18 | 0.13 | 96.07 |
| මාරු කිරීම් | 0.54 | 0.53 | 0.0023 | 100 |
| **එකතුව** | **38.82** | **34.94** | **3.88** | **90** |

## මූලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 0.50 | 0.39 | 0.11 | 78 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම හා උපකරණ | 0.0005 | 0.00 | 0.0005 | - |
| වාහන | 0.84 | 0.83 | 0.01 | 99 |
| විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය | 230 | 207.48 | 22.52 | 90.21 |
| **එකතුව** | **231.34** | **208.7** | **22.64** | **90.21** |

## අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු




පළාත් සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවීමේ භාරදූර වගකීම ඉටු කරන ආයතනයක් ලෙස කටයුතු කරමින් 2030 වර්ෂය වනවිට ළඟාකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන ඉලක්ක කරා ගමන් කිරීමට පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මෙහෙයවීම සිදු කරන ලදී.

ඒ යටතේ පළාත් හා මධ්‍යම රජයේ රාජ්‍ය නිලධාරීන් තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදු කරන ලදී. එපමණක් ද නොව පළාතේ සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කෙරෙහි අවධනය යොමු කරවීමටත්, සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පළාත් මට්ටමෙන් ජාතික මට්ටමට සැලකිය යුතු දායකත්වයක් ලබා දීමටත් හැකිවන පරිදි තිරසර සංවර්ධන ඉලක්ක කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කරවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදි.


| දිස්ත්‍රික්කය | වැඩසටහන් ගණන | සහභාගීත්වය | සහභාගී වූ සංඛ්‍යාව | වියදම(රු) |
|---|---|---|---|---|
| අනුරාධපුර | 22 | මාණ්ඩලික නිලධාරීන්, සංවර්ධන නිලධාරින්,ක්ෂේත්‍ර නිලධාරීන්,ග්‍රාම නිලධාරින්, ප්‍රාදේශීය සභා නිලධාරීන්,කළමනාකරණ සහකාරවරු | 1543 | 1,000,004.00 |
| පොළොන්නරුව | 07 | | 506 | |
| පළාත් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල | 02 | | 161 | |
| එකතුව | | | 2210 | |

## 01.විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

පළාත් නිශ්චිත අරමුදල් යටතේ ලද රු.මි.230 භාවිතා කරමින් අත්‍යාවශ්‍ය අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ප්‍රා දේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තෝරා ගන්නා ලද, ප්‍රමුඛතාගත කරන ලද ව්‍යාපෘති දෙසිය විසි නවය (229)ක් ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ විශේෂයෙන්ම ග්‍රාමීය පාලම්,බෝක්කු ඉදි කිරීම හා නවීකරණය, පානීය ජල අවශ්‍යතා සම්පූර්ණ කිරීම, අත්‍යාවශ්‍ය ග්‍රාමීය මාර්ග පද්ධතියේ සංවර්ධන කටයුතු ,ඇළ වේලි, අමුණු, වගා ළිං ලබා දීම, විදුලි සම්බන්ධතා ලබා දීම ක්‍රියාත්මක කරන ලදී. ඒ සඳහා රු.මි.207.47ක් වැය කරන ලදී.

## විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ප්‍රගතිය - 2018

| අංශය | ව්‍යාපෘති ගණන | වෙන්කල මුදල (රු) | සමුච්චිත වියදම (රු.) | අතැති බිල් වටිනාකම (රු) |
|---|---|---|---|---|
| බෝක්කු, පාලම් හා අත්‍යවශ්‍ය ඉදිකිරීම් | 106 | 59,473,597.58 | | |
| ජලය (පානීය හා සනීපාරක්ෂක) | 46 | 74,043,246.67 | | |
| මාර්ග හා පැති කාණු | 57 | 69,014,783.58 | | |
| ඇළ වේලි, වගා ලිං හා වැව් වල අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු | 6 | 1,718,909.90 | 175747068.64 | 31729324.23 |
| බොක්කු සහිත මාර්ග ඉදිකිරීම් | 4 | 4,990,775.75 | | |
| වෙනත් අත්‍යවශ්‍ය යෝජනා | 10 | 19,731,326.32 | | |
| **එකතුව** | **229** | **228,972,639.80** | | |




විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඉදිකර අවසන් කළ නමුත් ආරක්ෂිත වැටවල් නොමැති පාලම් නවය(9)ක ආරක්ෂිත වැටවල් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ තාක්ෂණික සහයෝගය මත අවසන් කළ හැකි විය. ඒ තුළින් විශේෂයෙන්ම අවදානමට පාත්‍ර වී තිබූ පාපැදි වලින් ගමන් ගන්නා පාසල් දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට හැකි විය.

**විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ විවිධ සංවර්ධන අවස්ථා...**







## 02. පළාත් සංවර්ධන සැලැස්ම සැකසීම හා මෙහෙයුම් සහ ප්‍රගති සමාලෝචනය කිරීම.

2018 වර්ෂයේ උතුරු මැද පළාතේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා අදාල ව්‍යාපෘතීන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීම ප්‍රමුඛ කාර්යය විය. (ඇමුණුම් අංක 02). මේ යටතේ විවිධ මට්ටම්වලදී කාර්තුමය හා මාසිකව සහ විශේෂයෙන් අත්‍යාවශ්‍ය අවස්ථාවන්හීදී විශේෂ ප්‍රගති සමාලෝචන රැස්වීම් මගින් අදාල ව්‍යාපෘති ඉලක්ක කරා රැගෙන යාමට අවශ්‍ය පියවර ගන්නා ලදී. මේ අනුව පළාතට උචිත ප්‍රතිපත්ති, සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ද පසුවිපරම් ඇගයුම්, මෙහෙයුම් සහ ප්‍රගති සමාලෝචන කටයුතු සඳහා පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මඟින් විධිමත් සහ කඩිනම් වැඩසටහන් රැසක්ම ක්‍රියාත්මක කිරීමට 2018 වසරේදීද කටයුතු කරන ලදී. ඒ අනුව 2018 වර්ෂයේදී පහත සඳහන් පරිදි සංවර්ධන වැඩසටහන විවිධ මට්ටම්වලදී ප්‍රගතිය සවිස්තරාත්මකව සමාලෝචනය කරන ලදී.

01
- 2018 සංවර්ධන සැලැස්මට අදාල සංවර්ධන ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම(උතුරු මැද පළාත් අමාත්‍යාංශ සහ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු මට්ටමින්) 09

02
- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම අනුරාධපුර 02, පොළොන්නරුව 03

03
- සංවර්ධන ව්‍යාපෘති මෙහෙයුම්කරණ මෘදුකාංග පද්ධතිය (DPMS) යාවත්කාලීන කිරීම සම්බන්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීම (ව්‍යාපෘතිය, වියදම, භෞතික ප්‍රගතිය, මූල්‍ය ප්‍රගතිය, අතැති බිල්පත් විස්තර යනාදිය ඇතුළත් කිරීම) 06


04
- ප්‍රතිඵල පාදක මධ්‍යකාලීන සංවර්ධන සැලසුම සකස් කිරීම සඳහා විවිධ පාර්ෂවකරුවන් සමග දැනුවත් කිරීමේ වැඩසටහන් 21ක් පැවැත්වීම

05
- සංවර්ධන නිළධාරින් සමග සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචන රැස්වීම් 09ක් පැවැත්වීම

## 03. විමධ්‍යගත සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

2018 වර්ෂයේදී පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් විමධ්‍යගත සංවර්ධන වැඩසටහන පළාත් සභාව විසිරීමත් සමග ක්‍රියාත්මක නොවිණි. එසේ වුවද 2017 වර්ෂයේදී ප්‍රධාන සංරචක 05ක් ඔස්සේ ව්‍යාපෘති 2654 ක් පළාත තුළ ක්‍රියාත්මක කර ඇත.

එසේම ප්‍රාදේශීය සහ පසුගාමී මෙන්ම ප්‍රත්‍යන්ත ප්‍රදේශවල ජනතාවට අවශ්‍ය ආර්ථික හා සමාජ යටිතල පහසුකම් සහ සහය සේවා ලබා දීමේ කටයුතුවල ප්‍රගතිය ලබා ගැනීම 2018 වර්ෂයේදී සිදු විය.




## 04. උතුරු මැද පළාත සඳහා ප්‍රතිඵල පාදක මධ්‍යකාලීන සංවර්ධන සැලැස්ම සකස් කිරීම.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ(UNDP) ආධාර මත උතුරු මැද පළාත සඳහා ප්‍රතිඵල පාදක කරගත් මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මක් සකස් කිරීම සඳහා විධිමත් හා කඩිනම් වැඩ පිළිවෙලක් සැකසීම සඳහා කටයුතු 2017 වර්ෂයේදී ආරම්භ වුවද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් නිලධාරීන් දැනුවත් කරමින් සැලැස්ම සැකසීම සඳහා අවශ්‍ය මූලික තොරතුරු “ගම” පොත හරහා ලබා ගැනීම සිදු විය.

පළාත් සංවර්ධන ක්‍රියාවලිය තුළ ළඟා කරගත යුතු හා ළඟාකර ගත හැකි ප්‍රතිඵලයන් හඳුනා ගැනීම මෙහි ප්‍රමුඛතම කාර්යය විය. පළාතේ ආර්ථික, සමාජ හා සංස්කෘතික ලෙස භෞතික හා ආධ්‍යාත්මික සංවර්ධනයක් සඳහා මෙම සැලැස්ම දිගුකාලීන සහ තිරසාර ලෙස ඉදිරියට විකාශය කළ යුතුය. ඒ සඳහා තොරතුරු හා දත්තයන් අඩංගු අත්පොතක් සකස්කොට ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ලබා දීම සඳහා කටයුතු ක්‍රමික වැඩපිළිවෙළක් තුළ ක්‍රියාත්මක කරන ලද ගම පොත සම්පූර්ණකර භාර දීම සඳහා වසම් භාර සංවර්ධන නිලධාරියාට රු.1000ක දීමනාවක් ලබා දෙන ලදී. ග්‍රාම නිලධාරී වසම් 988ක් සඳහා වූ වියදම රු.988,00.00කි.

| දැනුවත් කිරීමේ වැඩසටහන | පවත්වන ලද ස්ථානය/ ස්ථාන | සහභාගී වූ නිලධාරීන් | වැය වූ මුදල(රු) |
|---|---|---|---|
| "ගම" අත්පොත සම්පූර්ණ කිරීම පිළිබඳව දැනුවත් කිරීම | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 28 | සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) සහ වසම්භාර නිලධාරීන් 2018 මැයි - 2018 ජූලි | 235,320.00 |
| "ගම" පොත සම්පූර්ණ කිරීම සඳහා වසම්භාර සංවර්ධන නිලධාරීන් ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් වැඩසටහන් පැවැත්වීම | අනුරාධපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 21ක ග්‍රාම නිලධාරී වසම් 656 | වසම්භාර සංවර්ධන නිලධාරීන් 2018 ජූනි - 2018 නොවැම්බර් | 1,610,744.00 |
| | පොළොන්නරුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 7ක ග්‍රාම නිලධාරී වසම් 294 | වසම්භාර සංවර්ධන නිලධාරීන්2018 ජූනි - 2018 නොවැම්බර් | 702,690.00 |

## 05. වාර්ෂික සංගණන කටයුතු සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම.

ශ්‍රී ලංකා මහබැංකුව මඟින් පවත්වනු ලබන රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ අර්ධ වාර්ෂික සංගණන කටයුතු සිදු කිරීමටත් 2018 වසරේදී සෘජු දායකත්වයක් සැපයීමට හැකි විය.

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සිදු කරන ලද උතුරු මැද පළාතේ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවා නියුක්තිකයන් පිළිබඳ සංගණන කටයුතු මේ යටතේ සිදු කරන ලදී.

## 06. ජාතික වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සඳහා පළාත වෙනුවෙන් දැක්වූ දායකත්වය.


2017 වර්ෂය දිළිඳුකම පිටුදැකීමේ වර්ෂය ලෙස ප්‍රකාශිත ජාතික වැඩපිළිවෙලට අවශ්‍ය දිළිඳුකම පිළිබඳ පළාතට අදාළ තොරතුරු සැපයීමටද කටයුතු කෙරිණි.

## 6.1. වකුගඩු රෝග නිවාරණය ජාතික වැඩසටහන වෙනුවෙන් පළාත නියෝජනය කිරීම.

උතුරු මැද පළාත තුළ ව්‍යාප්ත වෙමින් පවතින මෙන්ම ගැටළුවක්ව පවතින වකුගඩු රෝගය නිවාරණය හා පාලනය කිරීම සඳහාත් පළාතේ දැනට පවතින රෝගීන් සංඛ්‍යාවට අලුතින් එකතුවන ප්‍රමාණය ප්‍රමාණාත්මකව පාලනය කිරිම සඳහාත්, ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක කරනු ලබන වකුගඩු රෝග නිවාරණ වැඩසටහන සඳහා පළාත සම්බන්ධීකරණය කරමින් දායකත්වය ලබා දීමත් පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් සිදු වේ. එසේම වකුගඩු රෝග නිවාරණය සඳහා ජාතික මට්ටමේ සැලසුම් සකස් කිරීමේදී පළාත නියෝජනය කරමින් වඩාත් ඵලදායි මෙන්ම ප්‍රායෝගික යෝජනා ලබාදීමෙන්ද ක්‍රියාත්මක තලයේදී පළාත් දායකත්වය කාර්යක්ෂමව ලබා දෙමින්ද පළාත තුළ සමාජ ගැටළුවක්ව පවතින වකුගඩු රෝගය සැලකිය යුතු මට්ටමකින් පාලනයකර ගැනීම සඳහා පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය හා පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමග සහසම්බන්ධව කටයුතු කිරීමට හැකි විය.

ජාතික වකුගඩු රෝග නිවාරණ වැඩසටහනට සමගාමීව පළාත් වකුගඩු රෝග නිවාරණ ආදර්ශ ගම්මාන වැඩසටහන "නිරෝගිමත් ජනතාවක් - සපිරි ගමක්" යන තේමාවෙන් යුක්තව උතුරු මැද පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ මුලිකත්වයෙන් පළාතේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ගණනාවක සහයෝගයෙන් ක්‍රියාත්මක වන වැඩසටහනකි.

"නිරෝගිමත් ජනතාවක් - සපිරි ගමක්" යටතේ ක්‍රියාත්මක වන
ප්‍රධාන අංශ 05




## 07.වෙනත් විදේශ අරමුදල් යටතේ පළාත තුළ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධීකරණය හා ප්‍රගති සමාලෝචනය වෙනුවෙන් දැක්වූ දායකත්වය.

### 7.1. අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතිය 2016 – 2021.

සංවර්ධනය සඳහා වූ ප්‍රංශ නියෝජිතායතනය හා ශ්‍රී ලංකා රජය ඒකාබද්ධව මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය මෙහෙයවීමෙන් සිදු කරන මෙම ව්‍යාපෘතිය සඳහා අනුරාධපුර නගරය ආශ්‍රිත කලාපය පහත අංග 4 යටතේ සංවර්ධනය කරයි.

- ජල කළමනාකරණය.
- ගමනාගමන පහසුකම් සංවර්ධනය.
- නගර අලංකරණය හා පහසුකම් සංවර්ධනය.
- නගර සංවර්ධනයට හා උරුම කළමනාකරණයට සම්බන්ධ ආයතනවල ධාරිතා සංවර්ධනය.

**අනුරාධපුර** නගරයට මෙතෙක් වෙන්වූ විශාලම මුදල වන ඇමරිකානු ඩොලර් මිලියන 57.5ක මුදලක් මේ සඳහා ආයෝජනය කිරීමට නියමිත අතර, මෙම ව්‍යාපෘතියේ ප්‍රධානතම සම්බන්ධීකාරක ලෙස පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

2013-2024 දක්වා උතුරු මැද පළාතේ ක්‍රියාත්මක වන පළාත් සැලසුම් දෙපාර්තමේන්තුව මගින් සම්බන්ධීකරණය කරනු ලබන විදේශාධාර ව්‍යාපෘති ප්‍රගතිය - 2018.12.31 දිනට ප්‍රගතිය ඇමුණුම් අංක 02 හි දැක්වේ.

**පළාත තුළ විදේශ අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති නියාමනයේදී උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්වරයා වශයෙන් පළාතේ සියළු විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති ප්‍රගතිය අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රගති සමාලෝචනය කරනු ලබයි. එහිදී අවශ්‍ය තීන්දු තීරණ ගැනීම හා නියාමන කටයුතු පළාත් මට්ටමින්, ජාතික මට්ටමින් පිහිටුවා ඇති කමිටු නියෝජනය කරමින් අපේක්ෂිත අරමුණු කරා ව්‍යාපෘතිය මෙහෙයවීම සඳහා ප්‍රමාණවත් ලෙස අවශ්‍ය මැදිහත්වීම් 2018 වර්ෂය තුළ දී සිදුකර ඇත.**

## 08.පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අයත් සියළුම සංවර්ධන අංශ ආවරණය වන පරිදි ඉදිරි වසර සඳහා පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම.

ඉදිරි වසරෙහි පළාතේ සංවර්ධන කටයුතු වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති හඳුනා ගනිමින් එම ව්‍යාපෘති සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල පිළිබඳව ගණනය කිරීම හා එය මුදල් කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම මෙහිදී සිදු කරන ලදි. මුදල් කොමිෂන් සභාව මගින් හඳුන්වා දී ඇති ආකෘතිප්‍රකාරව උතුරු මැද පළාත් සභාවට අයත් සියළුම ආයතන වෙත යොමුකර නිලධාරීන් දැනුවත් කිරීම සිදු කරනු ලබන අතර සංවර්ධන යෝජනාවන්හී යෝග්‍යතාවය පිළිබඳ සාකච්ඡා සිදු කරනු ලබයි. මෙහිදී වඩාත් ඵලදායි යෝජනා ලබාගත් පසු උතුරු මැද පළාත වෙනුවෙන් ඉදිරි වසර සඳහා ප්‍රාග්ධන අවශ්‍යතාවය තක්සේරුකර මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.


## 09. වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීම.


ඉදිරිපත් කරනු ලැබූ ප්‍රාග්ධන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ එක් එක් විෂයට අදාලව ලබා දිය හැකි ප්‍රතිපාදන ප්‍රමාණය මුදල් කොමිෂන් සභාව මගින් දැනුම් දීමෙන් පසු සංවර්ධන සැලැස්ම සකස් කරනු ලබයි. මුදල් කොමිෂන් සභාව මගින් හඳුන්වා දී ඇති ආකෘති ප්‍රකාරව අදාල වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස්කර මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබයි.(ඇමුණුම් අංක 03)


2018 වර්ෂයේදී වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීම සම්බන්ධයෙන් වැඩමුළු 02ක් පවත්වන ලදී. මෙම වැඩමුළු සඳහා මුදල් කොමිෂන් සභාවේ සභාපති, ලේකම්, අධ්‍යක්ෂවරු හා සහකාර පර්යේෂණ නිලධාරීන්, උතුරු මැද පළාතේ ප්‍රධාන අමාත්‍යතුමා, ප්‍රධාන ලේකම්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු, අමාත්‍යාංශ ලේකම්වරු, සහකාර ලේකම්වරු සහ විෂය සම්බන්ධ නිලධාරීන් සහභාගී විය.

## 10. පළාත් සංවර්ධනය උදෙසා තොරතුරු තාක්ෂණ භාවිතය.

### 10.1 වෙබ් අඩවි යාවත්කාලීන කිරීම.





උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ මානව හා භෞතික සම්පත් වඩාත් ඵලදායීව හා කර්යක්ෂමව පළාතේ සමස්ත සංවර්ධනය සඳහා යොමු කිරීමේදී ලොව වේගවත්ම තාක්ෂණය වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කරමින් එය වඩාත් සාර්ථකව ඉටු කිරීමේ අවශ්‍යතාවය මත ස්ථාපනයකර ඇති උතුරු මැද පළාතේ තොරතුරු තාක්ෂණ ඒකකය මගින් 2018 වර්ෂය තුළදී පළාතේ පවතින රාජ්‍ය ආයතන 34 ක් සඳහා වන වෙබ් අඩවි යාවත් කාලීනව පවත්වාගෙන යාමට පියවර ගෙන ඇත.

ඒ අනුව වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමේ වැඩමුළු හතරක් මෙම වර්ෂයේදී සිදු කරන ලදී. ආයතන 34හි සිටින නව්‍යකරණ නිලධාරින් එකම ස්ථානයකට කැඳවා වෙබ් අඩවිවල තිබෙන අඩුපාඩු සහ දෝෂ නිරාකරණය කිරීම සහ යාවත්කාලීන කිරීම මෙමගින් සිදු කරන ලදී. මීට අමතරව තොරතුරු තාක්ෂණ ඒකකයේ සහාය අවශ්‍ය වූ ආයතන සඳහා පරිගණක පුහුණු අභ්‍යාසලාභීන් යොදවා එම ආයතනවල වෙබ් අඩවි යාවත්කාලින කිරීම දිගින් දිගටම සිදු කරන ලදී. සෑම මසකම වෙබ් අඩවි 34 පිළිබඳවම පරීක්ෂා කර බලා අඩුපාඩු ඇති ආයතන වෙත දැනුවත් කිරීම් කර ඒවා යාවත්කාලීනව පවත්වා ගැනීම සඳහා කටයුතු කරන ලදී.

## 10. 2.පරිගණක පුහුණු වැඩසටහන් පැවැත්වීම.

පරිගණක පුහුණු අවශ්‍යතාවයන් අනුව පුහුණු වැඩසටහන් පවත්වා නිලධාරීන් දැනුවත් කරන ලදි. ඒ අනුව සංවර්ධන නිලධාරීන් සඳහා පරිගණක පුහුණු වැඩසටහන් දෙකක් පවත්වන ලදි.

## 10.3.තොරතුරු තාක්ෂණය හා බැඳුණු උපකරණවල දෝෂ නිරාකරණය කිරීම.

උතුරු මැද පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රය තුල ඇති සියළුම පරිගණක හා උපාංග වල හා පරිගණක හරහා අන්තර්ජාල භාවිතා කිරීම පිළිබඳ දැනුවත් කිරීම හා ගැටළු නිරාකරණය කිරීමත් පළාත් සභා පරිපාලන ගොඩනැගිල්ලේ ඇති අන්තර්ජාලය හා දුරකථන පද්ධතිය සම්බන්ධ Server Room එක සහ Switching Rooms පහක ක්‍රියාකාරීත්වය රැකගැනීමත් සිදු කරන ලදි.

පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින්ට බාධාවකින් තොරව තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම සඳහා අවශ්‍ය දැනුම හා සහාය ලබා දීම ඇතුළු පහත සඳහන් කාර්යයන් ඉටු කරමින් පළාත් තොරතුරු තාක්ෂණ ඒකකයේ කාර්යභාරය ඉටු කරමින් අදාල කාර්යසාධනය වෙත ළඟාවී ඇත.පළාත් සභා පරිපාලන ගොඩනැගිල්ල තුළ ජාලගත කරන ලද 450 කට අධික පරිගණකවල ක්‍රියාකාරිත්වය යාවත්කාලීනව පවත්වා ගැනීම, දෝෂයක් පැනනැගුන හොත් එම පරිගණක සියල්ලේම නඩත්තු කටයුතු සියල්ලක්ම තොරතුරු තාක්ෂණ ඒකකය මඟින් නිරාකරණය කර දෙමින් සේවා පහසුකම් ලබා දෙන ලදී.



පළාත් සභා පරිපාලන ගොඩනැගිල්ල තුළ පැය 24 පුරාම ක්‍රියාකාරිත්වයෙන් යුත් කැමරා 16 ක් පවතින CCTV කැමරා පද්ධතිය සම්බන්ධ දෝෂ නිරාකරණය කරමින් යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු සිදු කර ඇත.එසේම ඇඟිලි සලකුණු යන්ත්‍ර මනා ක්‍රියාකාරිත්වයෙන් පවත්වා ගැනීම හා මාසිකව ඇඟිලි සලකුණු වාර්තා ලබාදීම සම්බන්ධයෙන් කටයුතු සිදු කර ඇත.

## 11. පළාත් සංවර්ධනය උදෙසා GIS භාවිතය .











සිතියම් සකස් කිරීම සඳහා තොරතුරු ලබා ගැනීම සඳහා ක්ෂේත්‍රයට යාම.

පළාතේ සංවර්ධන සැලසුම්කරණය සඳහා භාවිතයට ගත හැකි වන අයුරින් විවිධ ක්ෂේත්‍ර සඳහා GIS භාවිතයෙන් සිතියමක් ලබා දීමට භූගෝලීය තොරතුරු පද්ධතිය භාවිතයෙන් හැකි විය.පළාත් පාලන ආයතනවල වරිපණම් බල ප්‍රදේශ සිතියම්ගත කිරීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සහ පළාත් පාලන ආයතනවල සේවය කරන තාක්ෂණික නිලධාරීන් සහ තාක්ෂණ සහායක නිලධාරීන්ට සිතියම් සකස් කිරීම සඳහා අවශ්‍ය පුහුණුව ලබා දෙන ලදි.

## භූගෝලීය තොරතුරු පද්ධතිය මගින් සකස් කරන ලද සිතියම්

| සකස් කරන ලද සිතියම් පිළිබඳ විස්තරය | |
|---|---|
| උතුරු මැද පළාතේ භූමි පරිහරණ සිතියම සකස් කිරීම |  |
| උතුරු මැද පළාතේ ජනගහන සිතියම සකස් කිරීම. |  |
| බෝ නොවන රෝග නිවාරණ ආදර්ශ ගම්මාන සිතියම් ගත කිරීම. |  |
| උතුරු මැද පළාතේ ග්‍රාම නිලධාරී තුලාන 988 සිතියම්ගත කිරීම. |  |

<table>
<tr><th colspan="2">සකස් කරන ලද සිතියම් පිළිබඳ විස්තරය</th></tr>
<tr><td>විදේශ ව්‍යාපෘතියක් වන JICA ව්‍යාපෘතිය සඳහා ගම්මාන සිතියම් ගත කර දීම</td><td>
</td></tr>
<tr><td>ලෝක බැංකු ආධාර මත ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘතියකට අදාලව ඉදිරිපත් කරන වාර්තාවක් සඳහා මෙම ව්‍යාපෘතිය මගින් ඉදි කිරීමට යෝජිත මාර්ග පිළිබඳ තොරතුරු අතුළත් සිතියම සකස් කිරීම</td><td>
</td></tr>
<tr><td>උතුරු මැද පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සිතියම්ගත කිරීම.</td><td>
</td></tr>
</table>

2018 වර්ෂයේදී භූගෝලීය තොරතුරු පද්ධති භාවිතයෙන් පළාත් සැලසුම්කරණය ශක්තිමත් කිරීම සඳහා සිදු කරනු ලැබූ කාර්යයන් සඳහා රු.1732280.00. මුදලක් ආයෝජනය කර ඇත.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

ජාතික ප්‍රතිපත්තීන්ට සහ නියාමනයන්ට සමගාමීව ජාතික සංවර්ධනයට සෘජුවම දායක වෙමින් පළාතේ ජනතාවගේ අභිවෘද්ධිය සහ යහපැවැත්ම සඳහා 2018 වර්ෂයේදීද පළාත් සභා සංවර්ධන කටයුවලදී පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුවට සුවිශාල වගකීමක් සහ කාර්යභාරයක් ඉටුකරන ලදී.

මෙහිදි  පළාතට උචිත ප්‍රතිපත්ති, සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ද ක්‍රමානුකූල වැඩපිළිවෙලක් තුළ ක්‍රියාත්මක වූ මෙහෙයුම් සහ ඇගයුම් ක්‍රියාවලිය තුළින් පළාතේ සංවර්ධන කාර්යය වඩාත් ක්‍රමික එකක් කිරිම සඳහා දායකත්වය සපයන ලදී. 2018 වර්ෂයේදී සියළු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු  මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහනෙහි ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මඟින් විධිමත් සහ කඩිනම් වැඩසටහන් රැසක්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී.

පළාතේ සංවර්ධන, පරිපාලන, සමාජ සුභසාධන, සමාජ ආරක්ෂණ, ආදායම් උත්පාදන, ව්‍යවසායකත්ව සහ ජීවනෝපාය සංවර්ධන ආදී ක්ෂේත්‍රයන් වෙත විශේෂ අවධානයක් යොමු කරන ලදී. මෙහිදී විනිවිදභාවය, ඵලදායිතාව සහ ආයෝජනයන්ට සාපේක්ෂ ප්‍රතිලාභ ඉලක්කගත පුද්ගලයන්ට ලැබීම පිළිබඳවද සංවර්ධන ව්‍යාපෘතිවල ගුණාත්මක අගය සහ යෙදවුම් පිළිබඳවද විවිධ මෙහෙයුම් කටයුතු සිදු කෙරිණි.

ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශ අනුව ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති 100% නිරීක්ෂණ පදනම මත පරීක්ෂා කිරීමටත් එහි ප්‍රගතිය මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා ඉදිරිපත් කිරීමටත් පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කර ඇත. ඒ අනුව 2018 වර්ෂයේදී ද ප්‍රතිලාභ රැසක් පළාතේ ජනතාවට ලබා දීම සඳහා පළාත් සභා යාන්ත්‍රණය වෙත සෘජු සහ සක්‍රීය දායකත්වයක්  ලබා දීමට හැකි විය.

2018 වර්ෂය තුළදි පළාත් සංවර්ධන සැලසුම ක්‍රියාවට නංවමින් පළාත් සංවර්ධන ක්‍රියාවලිය මෙහෙය වූ අතර විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරමින් පළාතේ අත්‍යාවශ්‍ය අවශ්‍යතා සැලකිය යුතු ප්‍රමාණයකින් සම්පූර්ණ කිරීමටත් හැකි විය. එසේම ප්‍රතිඵල පාදක සංවර්ධන සැලස්ම සකස් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කළ අතර පළාත තුළ විදේශීය අරමුදල් වලින් ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති නියාමනය කිරීම ද සිදු විය.

-මෙය හිස්ව තබන ලද පිටුවකි-

-මෙය හිස්ව තබන ලද පිටුවකි-

# 5.2. පළාත් භාණ්ඩාගාරය

## දැක්ම

"ප්‍රශස්ත මූල්‍ය කළමනාකරණයක්, සංවර්ධිත පළාතක්"

## මෙහෙවර

"සංවර්ධිත පළාතක් බිහි කිරීම සඳහා පළාතේ මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, මූල්‍ය කටයුතු පිළිබඳ උපදේශනය, පළාතේ ගිණුම් පවත්වාගෙන යාම සහ ප්‍රසිද්ධ කිරීම මූල්‍ය කළමනාකරණ තොරතුරු සැපයීම හා සියළු පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් යුක්තව ගිණුම් ක්‍රම සංවර්ධනය කිරීම".

## දිගුකාලීන අරමුණු

- දීර්ඝකාලීන සංවර්ධන සැලසුම් හා ව්‍යාපෘති යෝජනා පදනම් කරගෙන සම්පත් වෙන් කිරීම.
- ගිණුම්කරණ කටයුතු සඳහා තොරතුරු හා සන්නිවේදන යෙදවුම් භාවිතය ඉහළ නැංවීම.
- මූල්‍ය කළමනාකරණය හා වත්කම් කළමනාකරණය ශක්තිමත් කිරීම.

## කෙටිකාලීන අරමුණු

- මනා සම්බන්ධීකරණයක් තුළින් පළාත් සභාව සහ මධ්‍යම රජය විසින් කරනු ලබන ආයෝජනයන්හීදි එකම කාර්යය සඳහා දෙඅංශයෙන්ම සිදුවන ආයෝජන වැළැක්වීම.
- ගුණාත්මක හා යාවත්කාලීන වාර්තාකරණ ක්‍රමයක් ඇති කිරීම.
- වියදම් ප්‍රමුඛතා හා අග්‍රිම නිදහස් කිරීම සම්බන්ධ අඛණ්ඩ අවධානය
- නිමැවුම් පදනම් කරගත් ඇගයීමේ ක්‍රමයක් පිහිටුවීම
- ආයෝජන සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය

## ප්‍රධාන කාර්යයන්


- පළාත් ආදායම් අයවැය ප්‍රතිපත්ති සහ ගිණුම් ප්‍රතිපත්ති සම්පාදනය හා සංවර්ධනය.
- පළාත් අරමුදල, අවිනිශ්චිත අවස්ථා අරමුදල සහ වෙනත් අරමුදල් පවත්වාගෙන යාම සහ සංවර්ධනය.
- මධ්‍යගත මූල්‍ය පාලනය, මූල්‍ය උපදෙස් ලබා දීම සහ මූල්‍ය කළමනාකරණ තොරතුරු ලබා දීම.
- පළාත් ආදායම් රැස් කිරීමේ කටයුතු නියාමනය සහ සංවර්ධනය.
- පළාතේ ක්‍රමවත් ගිණුම් ක්‍රමයක් පවත්වා ගැනීම සහ පළාතේ ගිණුම් ප්‍රසිද්ධ කිරීම.
- ගිණුම් ක්‍රම සංවර්ධනය.
- ප්‍රසම්පාදන කටයුතු නියාමනය හා සංවර්ධනය.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහපාලනය

## ප්‍රධාන උපාය මාර්ගයන්

මූල්‍ය කළමනාකරණය, වියදම් පාලනය

## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 32 |
| 2 | සේවයේ නියුතු | 25 |
| 3 | පුරප්පාඩු | 07 |




## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 20.51 | 19.81 | 0.70 | 96.6 |
| ගමන් වියදම් | 10.09 | 10.05 | 0.04 | 99.5 |
| සැපයීම් | 3.55 | 3.47 | 0.08 | 97.8 |
| නඩත්තු වියදම් | 0.69 | 0.66 | 0.03 | 95.6 |
| ගිවිසුම්ගත සේවා | 17.81 | 16.56 | 1.25 | 93 |
| මාරු කිරීම් | 390.06 | 304.58 | 85.48 | 78.09 |
| **එකතුව** | **442.71** | **355.13** | **87.58** | |

## මූලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 3.00 | 3.00 | 0 | 100 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම් හා උපකරණ | 0.20 | 0.09 | 0.11 | 45.1 |
| වාහන | 46.05 | 46.05 | 0 | 100 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම | 1.02 | 1.01 | 0.01 | 100 |
| වෙනත් මූලධන (ආයෝජන) | **1.50** | **0.00** | **1.50** | **0** |
| **එකතුව** | **51.77** | **50.15** | **1.62** | **96.87** |

| ශිර්ෂය | ඉලක්කම (රු.මි) | සත්‍ය ආදායම (රු.මි) | එකතු කිරීමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| 10.02.05.04 මෝටර් රථ ලියා පදිංචි ගාස්තු | 150.00 | 137.07 | 91.38 |
| 10.02.07.00 මුද්දර ආදායම | 700.00 | 433.23 | 61.89 |
| 10.02.12.00 ජාතිය ගොඩ නැඟීමේ බද්ද | 1900.00 | 1716.66 | 90.35 |
| 10.03.07.09 වෙනත් බලපත්‍ර ගාස්තු | 0.05 | 0.014 | 28.3 |
| 20.02.01.01 නිවාස කුලී | 22.00 | 27.00 | 122.74 |
| 20.02.02.02 රජයේ නිලධාරීන්ගේ ණය සහ අත්තිකාරම් පොළී | 60.00 | 63.32 | 105.53 |
| 20.02.02.03 ආයෝජන පොළී | 35.00 | 103.03 | 294.38 |
| 20.03.02.99 විවිධ ලැබීම් | 100.00 | 155.54 | 155.54 |
| 20.06.02.00 භාවිතයට නොගන්නා ප්‍රාග්ධන වත්කම් විකිණීම | 30.00 | 3.66 | 12.21 |

- උතුරු මැද පළාත " ප්‍රශස්ත මූල්‍ය කළමනාකරණයක්, සංවර්ධිත පළාතක්" යන දැක්ම කරා ගමන් කිරීමේදී, දායකත්වය දක්වන මානව සම්පත් හා භෞතික සම්පත් සංවර්ධනය කිරීමේ අරමුණින් කටයුතු කිරීමට වාර්ෂිකව අවශ්‍ය මූල්‍ය සම්පත් ලබා ගැනීම සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කරමින්, රාජ්‍ය භාණ්ඩාගාරයෙන් අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම.
- එමඟින් ලබා ගන්නා මූල්‍ය ප්‍රතිපාදන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනුබද්ධිත ආයතන වෙත නිදහස් කිරීම තුළින් ඒ,ඒ අමාත්‍යාංශ වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමට සහාය වීම.
- පළාතේ සංවර්ධනය උදෙසා විදේශයන් ගෙන් ලැබෙන ණය හා ආධාර උපයෝගී කරගනිමින් ඉටු කරනු ලබන විදේශ ව්‍යාපෘති ඉටුකිරීමේදී මැදිහත්කරුවෙකු වශයෙන් දායකත්වය ලබා දී ප්‍රශස්ත මූල්‍ය පාලනයක් සහ පසු විපරම් කිරීම මඟින් සංවර්ධයට දායකත්වයක් ලබා දීම.
- සංවර්ධන කටයුතු ක්‍රමවත්ව විනිවිධභාවයකින් යුක්තව ඉටු කිරීම උදෙසා අයවැය ප්‍රතිපත්ති සකස් කිරීම, නව ගිණුම් පාලන ක්‍රම හඳුන්වා දීම, ඒ වෙනුවෙන් කලින් කලට චක්‍රලේඛ හා පූර්වාදර්ශ නිකුත් කිරීම.
- ඉහත කාර්යයන් කරගෙන යාමේදී මූල්‍ය පාලනය හා විනය ඇති කිරීම උදෙසා
  - ✓ චක්‍රලේඛ අණපනත් නිකුත් කිරීම
  - ✓ විවිධ රැස්වීම් පවත්වමින් උපදෙස් හා මඟ පෙන්වීම් ලබා දීම.
  - ✓ අදාළ ක්ෂේත්‍රවල කටයුතු කරන නිලධාරීන් සඳහා පුහුණුවීම් හා වැඩමුළු පැවැත්වීම.
- වත්කම් කළමනාකරණ මෘදුකාංගය හඳුන්වා දෙමින්, පළාත පුරා විසිරී ඇති පළාත් රාජ්‍ය සේවයට අනුබද්ධිත ආයතන වල ඇති සියළුම ස්ථාවර වත්කම්, ඉඩම් හා ගොඩනැඟිලි, මහා මාර්ග, වැව් ආදී තොරතුරු එක් ස්ථානයකින් ලබා ගැනීමට හැකි වන පරිදි සකස් කිරීම.
- ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත්ව හා කඩිනමව ඉටු කිරීමට අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම් ලබා දීම.
- උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනුබද්ධිත ආයතන කාර්යයන් ඉටු කිරීමේදී සිදු වන දෝශයන් සම්බන්ධයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව සහ පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවෙන් පෙන්වා දෙන වැරදි සහ අඩුපාඩු නිවැරදි හා අවම කර ගැනීමට උපදෙස් ලබා දීම.

- විවිධ අරමුදල් පවත්වා ගෙන යමින් අවශ්‍ය අවස්ථා වලදී ඒවා නිකුත් කිරීම.

## සමස්ත උපයෝජනය පිළිබඳව ප්‍රගතිය

උතුරු මැද පළාත සංවර්ධිත පළාතක් කිරීම උදෙසා පළාත් භාණ්ඩාගාරය විසින් මූල්‍ය ප්‍රතිපාදන සකසා ගත යුතුව ඇත. එහිදී රාජ්‍ය භාණ්ඩාගාරයෙන් ඍජුව ප්‍රතිපාදන ලබා ගැනීමට මැදිහත් වන්නාසේම විදේශීය අරමුදල්, විදේශීය ණය ආධාර සහ වෙනත් රේඛීය අමාත්‍යාංශ වෙතින් ලබා දෙන ප්‍රතිපාදන වල අතරමැදි වශයෙන් කටයුතු කිරීම, සම්බන්ධීකාරක වශයෙන් කටයුතු කිරීම පළාත් භාණ්ඩාගාරයේ කාර්යය භාරයයි.

**2018 වර්ෂයේ පළාතේ සංවර්ධනය වෙනුවෙන් අවශය මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම හා ඒ වෙනුවෙන් වැයවන වියදම් වෙනුවෙන් සකසන ලද අයවැය ඇස්තමේන්තුවේ සාරාංශය**

| ලැබීම් | | මුදල (රු) |
|---|---|---|
| 1 | රජයෙන් ලැබුණු ප්‍රදාන | |
| | I සාමූහික ප්‍රදාන | 14706.61 |
| | Ii උපමාන පාදක ප්‍රදාන | 481.60 |
| | Iii පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 2472.54 |
| | Iv විදේශීය සහයෝගිතා ව්‍යාපෘති | |
| | ලෝක බැංකු හා ඕස්ට්‍රේලියානු ආධර - අධ්‍යාපන | 52.00 |
| | ලෝක බැංකු ආධාර - සෞඛ්‍ය | 324.80 |
| | ආසියානු සංවර්ධන බැංකු අධාර- මාර්ග | 20.37 |
| | ලෝක බැංකු ආධාර - අධ්‍යාපන නවීකරණ | 42.00 |
| | V රේඛීය අමාත්‍යාංශ ලැබීම් හා වෙනත් ලැබීම් | 100.00 |
| 2 | ඇස්තමේන්තුගත ආදායම රැස් කිරීම | 4240.00 |
| 3 | විවිධ අත්තිකාරම් ගිණුම් යටතේ අපේක්ෂිත ලැබීම් | 481.40 |
| | එකතුව | **22921.32** |
| වියදම් | | |
| 1 | පුනරාවර්තන වියදම් | 18635.37 |
| 2 | මූලධන වියදම් | 9764.70 |
| 3 | අත්තිකාරම් ගිණුම් යටතේ වියදම් | 751.58 |
| | එකතුව | **29151.65** |

## 2018 වර්ෂයේ උතුරු මැද පළාතේ මූල්‍ය විශ්ලේෂණය

### සාමූහික ප්‍රදාන:-

පළාත් සභාවේ පුනරාවර්තන ස්වභාවයේ වියදම් දැරීම සඳහා මධ්‍යම රජයේ ඇස්තමේන්තුවෙන් 2018 වර්ෂයේදී රු. 14,706,613,000 ක්ද පරිපූරක ප්‍රතිපාදන ලෙස රු.648,010,000/- ක්ද වශයෙන් වෙන් වූ මුළු ප්‍රතිපාදනරු. 15,354,623,000/- ක් වේ.

### උපමාන පාදක ප්‍රදාන:-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 154 9(ආ) වගන්තියට අනුව මුදල් කොමිෂන් සභාවේ නිර්දේශය පරිදි පළාත් අතර ආර්ථික හා සාමාජීය විෂමතාවන් අඩු කිරීම සඳහා මෙම ප්‍රතිපාදන ලබා දී ඇත. 2018 වර්ෂයේදී මධ්‍යම රජයේ ඇස්තමේන්තුවෙන් රු. 481,600,000ක ප්‍රතිපාදනයක් වෙන් වන ලදී. ඒ සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබූ අග්‍රිමය රු.150,000,000/- කි.

### පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන:-

ජාතික වශයෙන් වැදගත්කමක් ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ පළාත් සභාවලට මධ්‍යම රජයේ ඇස්.මේන්තුවෙන් රු. 2,472,544,000 ප්‍රතිපාදනය වෙන් වූ අතර, මහා භාණ්ඩාරයෙන් ලැබූ අග්‍රිමය රු. 1,650,000,000/- කි.

### විදේශීය සහයෝගිතා ව්‍යාපෘති:-

ශ්‍රී ලංකා ජනරජය සහ ලෝක බැංකුව හා ඔස්ට්‍රේලියානු රජය අතර ඇති කර ගත් ගිවිසුම් ප්‍රකාරව අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ලෝක බැංකු හා ඕස්ට්‍රේලියානු රජය මඟින් ලබා දෙන විදේශ ණය හා අධාර වශයෙන් රු. 52,000,000 ක්හා පරිපූරක ප්‍රතිපාදන වශයෙන් රු.25,000,000/ ක් ද, සෞඛ්‍ය ආධාර වශයෙන් රු. 324,800,000 ක් හා පරිපූරක ප්‍රතිපාදන වශයෙන් රු. 210,000,000/- ද මාර්ග සංවර්ධනය උදෙසා ආසියානු සංවර්ධන බැංකු ආධාර වශයෙන් රු.20,370,000 ක් හා පරිපූරක ප්‍රතිපාදන රු.30,190,000/- අධ්‍යාපන නවීකරණ වශයෙන් රු. 42,000,000 ක්ද ප්‍රතිපාදන ලබා දී ඇත.

2018 වර්ෂයේදී අධ්‍යාපන අමාත්‍යාංශය, සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, ක්‍රීඩා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, අභ්‍යන්තර වෙළඳ හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, සෞඛ්‍ය, පෝශණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යන අමාත්‍යාංශ වලින් ප්‍රතිපාදන වෙන් වෙන ලදී.

## වෙන් වූ ප්‍රතිපාදන සැලකීමේදී ..............

- අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ළඟම පාසැල - හොඳම පාසැල ව්‍යාපෘතිය යටතේ රු. 4,525,853,819 ක ප්‍රතිපාදනයක් ලබා දී තිබූ අතර, ලැබූ අග්‍රිමය රු.1,976,138,066 කි. මුදල් ලැබීමේ ප්‍රගතිය 44% කි.
- සංචාරක කර්මාන්තයේ ප්‍රගතිය උදෙසා සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් රු 40,727,730 ක මූලධන ප්‍රතිපාදන වෙන්කර තිබුණි.

එසේම රු 147,000ක පුනරාවර්තන ප්‍රතිපාදනයක් වෙන් කර දී තිබූ අතර, මුදල් ලැබීම මූලධන වශයෙන් රු. 40,727,730 හා පුනරාවර්තන අක් මුදල් ලැබීම රු. 147,000/=ක් වශයෙන් මුදල් ලැබීමේ ප්‍රගතිය 100% කි.

- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් හබරවත්ත එල්ලංගාව පුනරුත්තාපනය කිරීම, පාරිසරික සංවේදි කලාප ඇති කිරීම, මහවැලි ගංගා ද්‍රෝණිය යටතේ සත්ත්ව නිෂ්පාදනය සහ කෘෂිකර්මය වෙනුවෙන් වැව් ගම් පුබුදුව යටතේ රු. 50,600,408/- ක ප්‍රතිපාදනයක් ලබා දී ඇති අතර, ඒ සඳහා ලැබූ අග්‍රිමය රු. 26,484.593.67 කි.
- පළාත් පාලන මාර්ග වැඩි දියුණු කිරීම , වාරි මාර්ග වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති සඳහා නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබා දී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු. 42,879,334.54 ක් වන අතර, 2017 වසරේ අවිච්ඡේද වූ ව්‍යාපෘති ඇතුළුව ලැබූ අග්‍රිමය රු. 46,527,393.13 කි.
- කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරි මාර්ග සහ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් ජීවනෝපායයන් සංවර්ධනය කිරීම ව්‍යාපෘතිය යටතේ රු. 1,847,889/- ක ප්‍රතිපාදනයක් වෙන් කර ඇති අතර, ලැබූ අග්‍රිමය රු. 1,887,888.31 කි.
- ළමා නිවාස අළුත්වැඩියාව සහ වෙළඳ සංකීර්ණ අළුත්වැඩියාව සහ කඩිනම් ජාතික ආහාර නිෂ්පාදනය යන ව්‍යාපෘති වෙනුවෙන් අභ්‍යන්තර වෙළඳ හා ස්වදේශ කටයුතු සහ පළාත් සහ සහ පළාත් පාලන අමාත්‍යාංශ ය රු 235,589,953/- ප්‍රතිපාදනයත් වෙන් කර තිබූ අතර, ඒ සඳහා ලැබුණු අග්‍රිමය 209,004,207.14 කි.
- සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් ආයුර්වේද රෝහලේ 3 වන මහල ඉදිකිරීම සහ ඔසු උයන් සඳහා නළ ළිං සකස් කිරීම සඳහා වන ව්‍යාපෘති වෙනුවෙන් රු.24,558,259/- ක ප්‍රතිපාදනයක් වෙන් කර ඒ සඳහා රු. 21,212,516/- ක අක් මුදලක් ලබා දී ඇත.
- කෘෂි නිෂ්පාදන ඉහළ නැංවීම, නව්‍යකරණය උදෙසා කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් රු. 6,986,060/- ප්‍රතිපාදනයක් වෙන් කර දී තිබුණු අතර, ඒ සඳහා, 2017 වසරේ අවිච්ඡේද වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ඇතුළුව ලැබූ අග්‍රිමය රු. 8,597,804.79 කි.

2018 වර්ෂය තුළ ලද ප්‍රතිපාදන පළාත් සභාවේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු සහ අනුබද්ධිත ආයතන වලට බෙදා හැරීම ඇමුණුම 04 වශයෙන් දක්වා ඇත.

**අරමුණු කරා යාමේදී ඇතිවන ගැටළු හා අභියෝග විනය හා මූල්‍ය පාලනය උදෙසා නිකුත් කරන ලද පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ නාමාවලිය**

| අනු අංකය | චක්‍රලේඛ අංකය | නිකුත් කළ දිනය | අන්තර්ගතය |
|---|---|---|---|
| 01 | 2018/01 | 2018.01.02 | වියදම් සඳහා බලාධිකාරය පැවරීම සහ රාජ්‍ය වියදම් කළමනාකරණය |
| 02 | 2018/02 | 2018.01.09 | 2018 වර්ෂය තුළදී වැටුප් සහ වැටුප් අත්තිකාරම් ගෙවීම |
| 03 | 2018/03 | 2018.01.09 | ගිණුම් ආරම්භ කිරීම හා වියදම් ගිණුම්ගත කිරීම |
| 04 | 2018/04 | 2018.01.23 | උතුරු මැද පළාත් මූල්‍ය රීති සංග්‍රහයට සංශෝධන |
| 05 | 2018/05 | 2018.01.23 | අග්‍රිම නිදහස් කිරීම හා මූල්‍ය ප්‍රගතිය වාර්තා කිරීම |
| 06 | 2018/06 | 2018.01.24 | විසර්ජන ගිණුම -2017 |
| 07 | 2018/06(i) | 2018.03.13 | විසර්ජන ගිණුම - 2017 සංශෝධනය |
| 08 | 2018/07 | 2018.02.01 | ආදායම් ගිණුම -2017 |
| 09 | 2018/08 | 2018.02.14 | ආදායම් හා වියදම් ඇස්තමේන්තුව -2017 |
| 10 | 2018/09 | 2018.02.28 | අත්තිකාරම් ගිණුම -2017 |
| 11 | 2018/10 | 2018.03.06 | පළාත් සභාවට අයත් වාහන වල ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටළු නිරාකරණය කිරීම |
| 12 | 2018/11 | 2018.03.06 | 2014 අයවැය යෝජනා අනුව පර්යේෂණ දීමනා ගෙවීම |
| 13 | 2018/12 | 2018.03.11 | ප්‍රසම්පාදන කාල සටහන තුළින් පූර්ව ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම් |
| 14 | 2018/13 | 2018.04.17 | උතුරු මැද පළාත් සභාවේ ව්‍යවස්ථාපිත අධිකාරී ආයතන වල නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් |
| 15 | 2018/14 | 2018.04.17 | උතුරු මැද පළාත් සභාවේ ව්‍යවස්ථාපිත අධිකාරී ආයතන වල නිලධාරීන්ට සන්නිවේදන පහසුකම් සැලසීම |
| 16 | 2018/15 | 2018.04.17 | උතුරු මැද පළාත් සභාවේ ව්‍යවස්ථාපිත අධිකාරී ආයතන අධ්‍යක්ෂ මණ්ඩල වල සාමාජිකයින්ට දීමනා |
| 17 | 2018/16 | 2018.04.17 | උතුරු මැද පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා වන රීති සංශෝධනය කිරීම |
| 18 | 2018/17 | 2018.11.12 | 2018 වර්ෂයේ භාණ්ඩ සහ වත්කම් සමීක්ෂණය |
| 19 | 2018/18 | 2018.11.29 | 2018 මුදල් වර්ෂය සඳහා වූ ගිණුම් පියවීම |
| 20 | | 2018.12.03 | 2018 වර්ෂයේ ගිණුම් පියවීමේ කටයුතු වල නියැලෙන මාණ්ඩලික නිලධාරීන්ට සති අන්ත සහ රජයේ නිවාඩු දින වල සේවයේ යෙදවීමට අනුමැතිය ලබා දීම |
| 21 | 2018/19 | 2018.12.31 | පළාත් සභාවේ ව්‍යවස්ථාපිත ආයතන වල වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම - 2018 |
| 22 | 2018/20 | 2018.12.31 | මූල්‍ය ප්‍රකාශන - 2018 |

### ඉහතින් නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස් ක්‍රියාත්මක කිරීමට පළාත් රාජ්‍ය සේවයට හා රාජ්‍ය සේවයට උපකාරී වීම සඳහා පළාත් භාණ්ඩාගාරය විසින් 2018 වර්ෂය තුලදී පවත්වන ලද පුහුණු සැසි

| අනු අංකය | පුහුණු පාඨමාලාව | පවත්වන ලද පුහුණු සැසි |
|---|---|---|
| 01 | වත්කම් කළමනාකරණ වැඩ සටහනට අදාළ වැඩමුළු හා දැනුවත් කිරීම් | 21 |
| 02 | විසර්ජන ගිණුම සකස් කිරීම - 2018 | 01 |
| 03 | රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන | 01 |
| 04 | ගණකාධිකාරිවරුන්ගේ ඉදිරි වැඩ සැලැස්ම පිළිබඳ සාකච්ඡාව | 01 |
| 05 | අයවැය සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීම් | 02 |

## කාර්ය සාධනය කරා ළඟා වීමේදී මුහුණ දුන් අභියෝග හා ගැටළු .

- අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මට්ටමින් ක්‍රියාකාරී සැලසුම් හා ප්‍රසම්පාදන සැලසුම් තාත්විකව සකස් කර නොතිබීම.
- නියමිත කාල වකවානු වලදී, අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මට්ටමින් භාණ්ඩාගාරයට එවිය යුතු වාර්තා නියමිත දිනට නොලැබීම.
- භාණ්ඩාගාරයෙන් රැස්වීම් පවත්වා දෙන උපදෙස් ඒ අයුරින් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මට්ටමින් පිළිනොපැදීම.
- ඉදිරි වර්ෂය වෙනුවෙන් අයවැය සකස් කිරීමේදී ඒ සඳහා නිකුත් කරන ලද චක්‍ර ලේඛ හා මාර්ගෝපදේශ කෙරෙහි අවධානය යොමු නොකොට, හඳුන්වා දෙන ආකෘති පත්‍ර වලට අදාළ නොවන තොරතුරු සැපයීම.
- පුද්ගල අනන්‍යතාවය සඳහන් වන හැඳුනුම්පත් අංක නිවැරදිව සඳහන් නොකිරීම.
- වැටුප් ක්‍රම සහ වැටුප් වර්ධක නිවැරදිව සඳහන් නොකිරීම ආදිය කාර්ය සාධනය ළඟාකර ගැනීම කෙරෙහි බලපෑ ගැටළු හා අභියෝග අතර වේ.


## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ශ්‍රී ලංකාවේ පළාත් සභා, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අධිකාරී ආයතනවල වාර්ෂික වාර්තා ඇගයීම් සඳහා සකස් කළ වැඩ සටහන අනුව 2015,2016 වර්ෂ වෙනුවෙන් උතුරු මැද පළාත් සභාවේ පළාත් භාණ්ඩාගාරය විසින් සකස් කළ වාර්තාව සඳහා ප්‍රථම ස්ථානය හිමිව ඒ සඳහා සම්මානයක් පිරිනමා ඇත. 2018 වර්ෂය වෙනුවෙන් අයවැය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී , මූල්‍ය වාර්තාකරණය හා මූල්‍ය කළමනාකරණය සිදු කිරීමේදී, නියමිත ආයතන සඳහා සමගාමීව ප්‍රශස්ත ආකාරයට උපයෝජනය කිරීමට හා ප්‍රතිඵල ළඟා කර ගැනීමටත් ඒ තුළින් කාර්යසාධනය කරා ළඟාවීමට හැකිව ඇත.

-මෙය හිස්ව තබන ලද පිටුවකි-

# 5.3. පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

## පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව මගින් ආවරණය කරනු ලබන ප්‍රදේශයන්.




## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

1999 ජනවාරි මස 01 වන දින ආරම්භ කළ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ පහත සදහන් ව්‍යුහයන්ගෙන් සමන්විත වේ.

01. ප්‍රධාන කාර්යාලය
02. අධ්‍යක්ෂ කාර්යාලය
03. තත්ව පාලන ඒකකය
04. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය-අනුරාධපුර
05. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය-මැදවච්චිය
06. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය-මහඉලුප්පල්ලම
07. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය-කැකිරාව
08. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය-මින්නේරිය
09. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය-පොළොන්නරුව

## ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල මගින් ආවරණය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස

| අනු අංකය | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය | ආවරණය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස |
|---|---|---|
| 01 | අනුරාධපුර | නැගෙනහිර නුවර ගම් පළාත |
| | | මධ්‍යම නුවර ගම් පළාත |
| | | තලාව |
| | | විලච්චිය |
| | | නොච්චියාගම |
| 02 | මැදවච්චිය | පදවිය |
| | | කැබිතිගොල්ලෑව |
| | | මැදවච්චිය |
| | | රඹෑව |
| | | හොරොව්පතාන |
| | | කහටගස්දිගිලි |
| | | මිහින්තලේ |
| 03 | කැකිරාව | කැකිරාව |
| | | තිරප්පනේ |
| | | ගලෙන්බිඳුණුවැව |
| | | පළුගස්වැව |
| 04 | මහඉළුප්පල්ලම | රාජාංගනය |
| | | තඹුත්තේගම |
| | | ඊපලෝගම |
| | | ගල්නෑව |
| | | පලාගල |
| 05 | මින්නේරිය | මැදිරිගිරිය |
| | | හිඟුරක්ගොඩ |
| | | ඇලහැර |
| 06 | පොළොන්නරුව | තමන්කඩුව |
| | | ලංකාපුර |
| | | දිඹුලාගල |

### දැක්ම

"ගුණාත්මක හා ජනහිතකාමී ඉංජිනේරු ක්‍රියාවලියක්, සෞභාග්‍යමත් පළාතක්"

### මෙහෙවර

"ඉංජිනේරු කටයුතු , ප්‍රජා සහභාගීත්වය, ඉංජිනේරු කටයුතුවලදී නවීන තාක්ෂණය භාවිතය, සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම "

### දිගුකාලීන අරමුණු

කාලීන පැවැත්මක් ඇති ඉදි කිරීම් පද්ධතියක් ඇති කිරීම උදෙසා තාක්ෂණ කාර්ය මණ්ඩල ශක්තිමත් කිරීම, දීර්ඝ කාලීන ප්‍රශස්ත ප්‍රමිතියක් ලබා ගැනීමට අවශ්‍ය තාක්ෂණ පරිගණක ශක්‍යතාව ලබා ගැනීම හා ක්‍රමයෙන් දියුණු කිරීම.

### කෙටිකාලීන අරමුණු


නියමිත වේලාවට ඉදි කිරීම් ඇස්තමේන්තු කිරීම, තත්ව පාලන ක්‍රියාවලියට ක්ෂණික විසඳුම් ලබා දීම, කාලීන අවශ්‍යතාවය වෙනුවෙන් පුහුණුවීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

### ප්‍රධාන කාර්යයන්

- ඉංජිනේරු කටයුතු සංවර්ධනය.
- උතුරු මැද පළාතේ සියළුම දෙපාර්තමේන්තුවල සංවර්ධන සැලැස්මට අදාල අළුත්වැඩියා හා නවීකරණ කටයුතුවල ඇස්තමේන්තු සැකසීම, අධීක්ෂණය හා බිල්පත් නිර්දේශ කර යැවීම.
- උතුරු මැද පළාතේ සියළුම නව ඉදිකිරීම්වල වාස්තු විද්‍යාත්මක සැලසුම්, ව්‍යුහගත සැලසුම් හා සවිස්තරාත්මක වාස්තු විද්‍යාත්මක සැලසුම් සකස් කිරීම.
- නව ඉදිකිරීම්වලට අදාල අධික්ෂණය, වැඩ බිම් පරීක්ෂාව හා රැස්වීම පැවැත්වීම හා බිල්පත් නිර්දේශකර යැවීම.
- ප්‍රජා සහභාගීත්ව සංවර්ධනය.
- ඉංජිනේරු කටයුතුවලදී නවීන තාක්ෂණය භාවිතය සංවර්ධනය.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අනු අංකය | විස්තර | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත සංඛ්‍යාව | 190 |
| 2 | සේවයේ නියුතු සංඛ්‍යාව | 154 |
| 3 | පුරප්පාඩු සංඛ්‍යාව | 36 |
| 6 | කොන්ත්‍රාත් | 16 |




## පුනරාවර්තන වියදම් - 2018

| වියදම් ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු. මි.) | 2018 වර්ෂයේ වියදම (රු. මි.) | ඉතිරිය (රු. මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 87.74 | 87.55 | 0.19 | 99.78 |
| ගමන් වියදම් | 2.90 | 2.90 | 0.00 | 100 |
| සැපයීම් | 6.70 | 6.46 | 0.24 | 96.47 |
| නඩත්තු වියදම් | 7.21 | 7.11 | 0.10 | 98.62 |
| ගිවිසුම්ගත සේවා | 6.63 | 6.34 | 0.29 | 95.63 |
| මාරු කිරීම් | 0.52 | 0.47 | 0.05 | 89.89 |
| **එකතුව** | **111.69** | **110.82** | **0.87** | **99.22** |

## මූලධන වියදම් - 2018

| වියදම් ස්වාභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 9.20 | 9.20 | 0.00 | 100 |
| වාහන | 0.50 | 0.50 | 0.00 | 100 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 2.28 | 2.28 | 0.00 | 100 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම හා උපකරණ | 0.02 | 0.02 | 0.00 | 100 |
| ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 10.00 | 10.00 | 0.00 | 100 |
| **එකතුව** | **22.00** | **22.00** | **0.00** | **100** |

*අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 09*

**සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසාර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම.**

**9.4. 2030 වන විට යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ කර්මාන්ත තිරසර කිරීම සඳහා නව තාක්ෂණය මගින් සංවර්ධනය කිරීම, කර්මාන්ත ක්‍රියාවලියේදී සම්පත් කාර්යක්ෂම ආකාරයට භාවිතා කිරීම වැඩිදියුණු කිරීම සහ පිරිසිදු සහ පරිසරයට සුදුසු ගුණාත්මකභාවයෙන් ඉහළ තාක්ෂණයන් උපයෝගි කර ගැනීම.**

**9.5. විද්‍යාත්මක පර්යේෂණ වැඩි දියුණු කිරිම.**

**පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව මගින් සපයන සේවාවන්.**

01. වාස්තු විද්‍යාත්මක සැලසුම් සකස් කිරීම.
02. ව්‍යුහගත සැලසුම් සකස් කිරීම.
03. ඇස්තමේන්තු සකස් කිරීම.
04. ප්‍රසම්පාදන කටයුතු.
05. කොන්ත්‍රාත් කළමනාකරණය.
06. තත්ත්ව සහතික ලබා දීම.
07. තාක්ෂණික නිලධාරීන් හා කොන්ත්‍රාත්කරුවන් සඳහා දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

**පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව හා සම්බන්ධ සේවාදායක ආයතන**

01. පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
02. පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව
03. පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව
04. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
05. පළාත් සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව
06. පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව
07. පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව
08. පළාත් ආදායම් දෙපාර්තමේන්තුව
09. ප්‍රධාන ලේකම් කාර්යාලය.
10. රාජ්‍ය සේවා කොමිෂන් සභාව
11. මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය
12. මධ්‍යම රජයේ දෙපාර්තමේන්තු
13. මණ්ඩල සහ සංස්ථා

## ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල මගින් සිදු කළ කාර්යභාරය -2018.12.31 දිනට

| ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය | ව්‍යාපෘති සංඛ්‍යාව | ගිවිසුම් ගත වූ ව්‍යාපෘති සංඛ්‍යාව | ඇස්තමේන්තු මුදල (රු.මි) | ගිවිසුම්ගත මුදල (රු.මි) |
|---|---|---|---|---|
| අනුරාධපුර | 204 | 121 | 627.47 | 156.47 |
| මැදවච්චිය | 58 | 27 | 80.83 | 24.01 |
| මහඉලුප්පල්ලම | 80 | 22 | 179.08 | 55.36 |
| කැකිරාව (නව වැඩ) | 45 | 25 | 58.31 | 17.14 |
| මින්නේරිය | 42 | 12 | 101.79 | 49.92 |
| පොළොන්නරුව (නව වැඩ) | 115 | 72 | 724.90 | 278.76 |

පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල මගින් 2018 වර්ෂයේ ව්‍යාපෘති 544කට අදාල ඇස්තමේන්තු සකස්කර ඇති අතර එහි වටිනාකම රු.මි. 1772.38කි. එසේ වුවද ගිවිසුම්ගත වී ඇත්තේ ව්‍යාපෘති 279ක් වන අතර එහි වටිනාකම රු.මි. 581.66කි.

## පළාතේ සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රමුඛ කාර්යයකත් වන ඉදි කිරීම්වල ගුණත්වය ආරක්ෂා කිරිම සඳහා තත්ව පාලන ඒකකයේ දායකත්වය

තත්ව පාලන ඒකකය මගින් පාංශු පරීක්ෂා, කොන්ක්‍රීට් පරීක්ෂා, සමස්ත (Aggregate) පරීක්ෂා, ඇළුමිණියම් පරීක්ෂාවන් හා අනෙකුත් පරීක්ෂණ සිදු කරනු ලබයි.

පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය සභා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, මධ්‍යම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ උපදේශක කාර්යංශය, පෞද්ගලික ආයතන හා උතුරු හා මධ්‍යම පළාතට අයත් ආයතන තත්ව පාලන සේවා ලබා ගන්නා ආයතන අතර වේ.

2018 වර්ෂයේදී පළාත් තත්ව පාලන ඒකකය මගින් විවිධාකාර පරීක්ෂාවන් හත්දහස් නවසිය පනස් හතර (7954) ක් සිදුකර ඇති අතර ඒ තුළින් රු.මි 3.66 ක ශුද්ධ ආදායමක් උපයන ලදී.

## 01. තත්ව පාලන ඒකකය මගින් සිදු කරන ලද කාර්යභාරය

| පරීක්ෂා වර්ගය | ප්‍රාදේශීය සභා | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල සංවිධායාව | අර්ධ රාජ්‍ය ආයතන | ප්‍රාදේශීය ලේකම් කාර්යාල | පෞද්ගලික ආයතන | මහවැලි සංවර්ධන අධිකාරිය | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | වැවගම් පුබුදුව ව්‍යාපෘතිය | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අමුද්‍රව්‍ය පරීක්ෂාව(Meterial Testing) | 123 | 113 | 15 | 62 | 143 | 0 | 0 | 57 | 0 | 513 |
| ක්ෂේත්‍ර පරීක්ෂාව(Field Testing) | 915 | 292 | 0 | 270 | 15 | 04 | 0 | 16 | 0 | 1512 |
| කොන්ක්‍රිට් පරීක්ෂාව(Concrete Testing) | 271 | 886 | 318 | 334 | 318 | 17 | 0 | 107 | 36 | 2287 |
| අන්තර් සම්බන්ධිත කුට්ටිගල්(Inter Lock) | 1378 | 17 | 08 | 1549 | 177 | 0 | 226 | 0 | 0 | 3355 |
| සිමෙන්ති ගල්(Cement Block) | 02 | 0 | 06 | 26 | 14 | 0 | 0 | 0 | 06 | 54 |
| Protector පරීක්ෂාව | 111 | 29 | 02 | 21 | 54 | 0 | 0 | 16 | 0 | 233 |
| **මුළු එකතුව** | **2800** | **1337** | **349** | **2262** | **721** | **21** | **226** | **196** | **42** | **7954** |

## 02.ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය සඳහා දායකත්වය ලබා දීම

පළාත් අධ්‍යාපන ක් ෂේත්‍ර යේ අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට අවශ්‍ය යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම සඳහා පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව මගින් 2018 වර්ෂයේදී සැලකිය යුතු දායකත්වයක් සපයන ලදී. එසේම මෙම ව්‍යාපෘති 2016 සිට 2019 දක්වා ක්‍රියාත්මක වීමට නියමිතව ඇත.

| අනු අංකය | ව්‍යාපෘති කාර්යය | ව්‍යාපෘති සංඛ්‍යාව | ඇස්තමේන්තු වටිනාකම(රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|---|
| 01 | ගුරු නිවාස සඳහා පහසුකම් සැපයීම | 31 | 444.78 | 284.71 |
| 02 | පාසල් සඳහා ජල පහසුකම් ලබා දීම | 76 | 22.41 | 2.47 |
| 03 | පාසල් සඳහා වැසිකිළි පහසුකම් ලබා දීම | 331 | 328.04 | 353.53 |
| 04 | පාසල් සඳහා විදුලි පහසුකම් ලබා දීම | 812 | 174.08 | 88.93 |
| 05 | ප්‍රාථමික අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථාන | 74 | 801.90 | 681.49 |
| 06 | සෞන්දර්යය ඒකක පිහිටුවීම | 05 | 79.36 | 80.92 |
| 07 | පන්ති කාමර හා අනෙකුත් ගොඩනැගිලි | 42 | 1152.00 | 923.88 |
| 08 | අත්‍යාවශ්‍ය සුළු අළුත්වැඩියා කටයුතු | 520 | 747.62 | 634.25 |
| 09 | මහා පරිමාණ අළුත්වැඩියා කටයුතු | 39 | 216.50 | 170.79 |
| 10 | විදුහල්පති නිල නිවාස ඉදි කිරීම | 30 | 227.75 | 181.16 |
| 11 | කණිෂ්ඨ දෙවන මට්ටමේ විද්‍යාගාර ඉදි කිරීම | 44 | 630.38 | 385.55 |
| 12 | ක්‍රිඩා සංකීර්ණ ඉදි කිරීම | 04 | 45.48 | 26.60 |
| 13 | තාක්ෂණික ගොඩනැගිලි ඉදි කිරීම | 32 | 604.00 | 344.79 |
| 14 | පාසල් දන්ත සෞඛ්‍ය සේවාව සඳහා නව ඉදි කිරීම් හා පුනරුත්ථාපන කටයුතු | 09 | 43.45 | 27.47 |
| 15 | භෝජනාගාර පහසුකම් | 13 | 88.50 | 90.26 |
| 16 | වෙනත් | 00 | 00 | 1.14 |
| | එකතුව | 2062 | 5606.25 | 4277.94 |

### “ළඟම පාසල හොඳම පාසල” රු.මි.5606.25 අධ්‍යාපන ව්‍යාපෘතිය


පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත පාසල් යටිතල පහසුකම් සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක කරන ලද “ළඟම පාසල හොඳම පාසල” ව්‍යාපෘතියට අදාල සියළු ඇස්තමේන්තු කටයුතු පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලදී.ඒ අනුව 2018 වර්ෂයේදී සංවර්ධන ව්‍යාපෘති 2062කට අදාල ඇස්තමේන්තු සකස්කර ඇති අතර එහි වටිනාකම රු.මි. 4277.94කි.

මෙම ව්‍යාපෘතිය යටතේ උතුරු මැද පළාතේ පාසල්වල ජල පහසුකම්, විදුලි පහසුකම්, වැසිකිළි පහසුකම් සැපයිම වැනි යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම, පාසල් දන්ත සෞඛ්‍ය සේවාව ප්‍රවර්ධනය, ගුරු හා විදුහල්පති නිල නිවාස සංවර්ධනය, පාසල් සිසුන් සඳහා සෞන්දර්ය ඒකක පිහිටුවීම හා ක්‍රිඩා සංකීර්ණ ඉදි කිරීම යන සංවර්ධන කාර්යයන් සිදු කරන ලදී.

## 03.උතුරු මැද පළාත් ඒකක මිල ගණන් සකස් කිරීම

## SCHEDULE OF RATES FOR BUILDING,IRRIGATION & MARERIAL TESTING IN NORTH CENTRAL PROVINCE 2018

පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව මගින් සෑම වසරකටම අදාල උතුරු මැද පළාත තුළ භාවිත කිරීම සඳහා ඒකක මිල ගණන් සකස් කිරීම පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. එය




සකස් කිරීමේදී මූලිකවම අනුරාධපුර පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් තුමා විසින් මිල කමිටු රැස්වීමේදී අනුමත කරන ලද භාණ්ඩවල මිල උපයෝගී කර ගනී. ඊට අමතරව අවශ්‍ය කරන ඉදි කිරීම් ද්‍රව්‍යවල මිල ගණන් උතුරු මැද පළාතෙන් මිල ගණන් කැඳවා යොදා ගනු ලබයි. මෙම මිල පොත උපයෝගී කරගෙන සෑම වසරකම පළාත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සියල්ලට අදාල නව ඉදි කිරීම්, නවීකරණ, අළුත්වැඩියාවන්ට අදාල ඇස්තමේන්තු සකස් කිරීම සඳහා භාවිතා කරනු ලැබේ. එසේම මෙම ඒකක මිල ගණන් මධ්‍යම රජයට අයත් ආයතනවල ඉදි කිරීම් ඇස්තමේන්තු සකස් කිරීම සඳහාද භාවිතා කරනු ලබයි. මෙය සකස් කිරීමේදී නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු), විධායක ඉංජිනේරුවරුන්, වාස්තු විද්‍යාඥයින්, කාර්මික නිලධාරීන්, සැලසුම් ශිල්පීන්ගෙන් සමන්විත කමිටුවක් දායකත්වය ලබා දෙනු ලදී.

### 04. අමාත්‍යාංශ 05ට අදාල

### වාස්තු විද්‍යාත්මක සැලසුම් හා ව්‍යුහගත සැලසුම්වල ප්‍රගතිය - 2018

රු.මි.

**1,727**ක

ඇස්තමේන්තු සකස් කර ඇත..

| ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය | ව්‍යාපෘති සංඛ්‍යාව | ගිවිසුම් ගත ව්‍යාපෘති සංඛ්‍යාව | ඇස්තමේන්තු මුදල(රු) | ගිවිසුම් ගත මුදල(රු) |
|---|---|---|---|---|
| අනුරාධපුර | 205 | 124 | 633.69 | 188.77 |
| මැදවච්චිය | 58 | 27 | 80.82 | 24.00 |
| මහඉලුප්පල්ලම | 37 | 35 | 91.25 | 54.50 |
| කැකිරාව | 45 | 25 | 58.31 | 17.14 |
| පොලොන්නරුව | 115 | 40 | 724.90 | 278.76 |
| මින්නේරිය | 72 | 51 | 138.81 | 83.07 |
| එකතුව | **532** | **302** | **1,727.78** | **646.24** |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව පළාත් සභාවේ සියළු ආයතන ඉංජිනේරු සේවා සපයා දෙන ලෙස කරනු ලබන ඉල්ලීම් වෙනුවෙන් අවශ්‍ය කරන වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරු සේවා සපයා දීම සිදු කරනු ලබන අතර 2018වර්ෂය තුළ දී ඉල්ලා සිටි සියළුම ඉල්ලීම් ඉටු කිරීමට හැකි වී ඇත.

2018 වර්ෂයේදී අධ්‍යාපන සංවර්ධනය සඳහා උතුරු මැද පළාත් සභාව වෙත ලැබුණු විශේෂ ප්‍රතිපාදන වඩා කාර්යක්ෂමව හා ඵලදායිව භාවිතා කිරීම සඳහා අවශ්‍ය සැලසුම්, ඇස්තමේන්තු හා අනෙකුත් අත්‍යාවශ්‍ය සියළු තාක්ෂණික කාරණා ඉටු කිරීම කෙරෙහි කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම තුළ ඉතා සාර්ථක ප්‍රතිඵල කරා ළඟා විය හැකි විය.

එපමණක් ද නොව ඉදිකිරීම් ආරම්භයේ දී, ක්‍රියාත්මක වන අතරතුර හා එකී ව්‍යාපෘති සාර්ථකව නිමකර ජනතා අයිතියට පත් කරන තුරු නිරන්තර ක්ෂේත්‍ර මට්ටමේ අධීක්ෂණ කටයුතු කරමින් හා වැඩ බිම් රැස්වීම් පවත්වමින් ව්‍යාපෘතිය හා සම්බන්ධ අනෙකුත් පාර්ශවකරුවන්ද මනාව සම්බන්ධීකරණය කරමින් කාර්යාවලිය මෙහෙයවීම මගින් අපේක්ෂිත ප්‍රතිඵල කරා ඉලක්ක සහගත ක්‍රියාවලියක් ඉටු කිරිමට 2018 වර්ෂයේදී හැකි විය.

-මෙය හිස්ව තබන ලද පිටුවකි-

# 5.4. පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව

## දැක්ම

"ඵලදායී මූල්‍ය හා මානව සම්පත් කළමනාකරණයක්, විනයගරුක පළාත් රාජ්‍ය සේවයක් "

## මෙහෙවර

"ඵලදායී මූල්‍ය හා මානව සම්පත් කළමනාකරණයක් මගින් විනයගරුක පළාත් රාජ්‍ය සේවයක් බිහිකරනුවස් විගණන කාර්යයන් හා විමර්ශන කටයුතු සියලු පාර්ශවකරුවන්ගේ විධිමත් සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව අඛණ්ඩව හා කාලානුරූපිව ශක්තිමත් කිරිම. "

## අරමුණු

- සමස්ත ප්‍රතිපාදන වැය කිරීම් විනිවිද භාවයෙන් යුක්තව සහ අවශ්‍ය ප්‍රතිඵල ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමට සියළු ආයතනවලට අවශ්‍ය මග පෙන්වීම හා උපකාර විම.
- පළාත් සභාවට අයත් සියළු ආයතනවල එදිනෙදා සිදු කරනු ලබන රාජකාරී විධිමත් හා නීත්‍යානුකූලව සිදු වේදැයි විපරම් කර ඉහළ කළමනාකාරීත්වයට වාර්තා කිරිම.

## ප්‍රධාන කාර්යයන්

- 01 • විගණන කාර්යයන් සංවර්ධනය
- 02 • විමර්ශන කටයුතුවල ඵලදායිතා වර්ධනය.
- 03 • ආයතනික ධාරිතා වර්ධනය
- 04 • යහපාලන කටයුතු

## ප්‍රධාන උපාය මාර්ගයන්

- පළාත් සභාවට අයත් සියලු ආයතන වලට ගොස් (වාර්ෂික සැලැස්මට අනුව) ස්ථානීය පරීක්ෂාවන් කිරීම.
- ක්ෂේත්‍රයට ගොස් විමසුම් කිරීම.
- පුද්ගලයින් හා එක්වී ක්‍රියා කිරීම, සාකච්ඡා කිරීම, ප්‍රකාශ ලබා ගැනීම.
- ලැබෙන නියෝජන/ නියෝග අනුව ක්‍රියා කිරීම.
- සමූහ ක්‍රියාකාරකම් වලට සහභාගී වීම ( විදුහල්පති රැස්වීම් වලට සහ සහභාගී වීම සහ පළාත් ගිණුම්කාරක සභාවට සහභාගී වීම).
- විගණන වාර්තා නිකුත් කිරීම.
- විනය කටයුතු සඳහා චෝදනා පත්‍ර කෙටුම්පත්කර අදාළ ආයතන වෙත ලබා දීම.
- විනය පරීක්ෂණ/ නීතීමය කටයුතු වලට ඉදිරිපත් වීම. (අධිකරණ කටයුතු වලට සහයවීම).

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු





උතුරු මැද පළාත තුළ පිහිටුවා ඇති අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/සංස්ථා සහ පළාත් සභාවට අයත් අනෙකුත් ආයතනවල කටයුතු තිරසර සංවර්ධන ඉලක්ක 17ට අනුව හා එහි අන්තර්ගත දර්ශනයන්ට අනුව ළඟා කර ගැනීමට කටයුතු කිරීම සම්බන්ධව අවධානය යොමු කරමින් එම අරමුණු ළඟාකර ගැනීම සඳහා පළාතේ සියළුම ආයතනවලට අවශ්‍ය සහය ලබා දීම සිදු කරනු ලබයි.

**විශේෂයෙන්ම 12-vii ඉලක්කයට ළඟා වීම සඳහා තිරසර රාජ්‍ය ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධව පූර්ණ අවධානය යොමු කරමින් එම අරමුණු කරා ළඟා වීමට පළාතේ සියළුම ආයතන මෙහෙයවීම සිදු කරයි.**

## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 38 |
| 2 | සේවයේ නියුතු | 11 |
| 3 | පුරප්පාඩු | 27 |



## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 9.05 | 7.14 | 1.91 | 78.88 |
| ගමන් වියදම් | 0.80 | 0.46 | 0.34 | 58.12 |
| සැපයිම් | 2.50 | 0.89 | 1.61 | 35.45 |
| නඩත්තු වියදම් | 0.90 | 0.64 | 0.26 | 70.90 |
| ගිවිසුම්ගත සේවා | 1.64 | 1.05 | 0.59 | 64.01 |
| මාරු කිරීම් | 0.25 | 0.19 | 0.06 | 78.40 |
| **එකතුව** | **15.14** | **10.37** | **4.77** | **68.52** |

## මුලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 1.58 | 0.51 | 1.07 | 32.44 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම් හා උපකරණ | 1.27 | 0.03 | 1.24 | 2.72 |
| දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 0.25 | 0.24 | 0.01 | 94.24 |
| **එකතුව** | **3.10** | **0.78** | **2.32** | **43.13** |

## කාර්ය සාධන ඉලක්ක 2017 - 2019

| ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|---|
| | | 2017 | 2018 | 2019 |
| පළාත් සභාවේ අමාත්‍යාංශ 05 සහ අමාත්‍යාංශ යටතට නොගැනෙන ආයතනයන්හි සියළුම පරිපාලන ඒකක පරීක්ෂාවට ලක්වන පරිදි විගණන හා විමර්ශන කටයුතු සිදු කිරීම | වර්ෂයේ අනුමත විගණන වාර්තා නිකුත් කිරීම | 121 | 112 | 144 |

## විධිමත් මූල්‍ය පාලනයක් ඇති කිරීම සඳහා වෙන් වෙන් වශයෙන් පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු - 2018

| අනු අංකය | සහභාගී වූ අමාත්‍යාංශය/ආයතනය | පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | පළාත් ප්‍රධාන අමාත්‍යාංශය | 03 |
| 02 | පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය | 03 |
| 03 | පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය | 03 |
| 04 | පළාත් සමුපකාර අමාත්‍යාංශය | 03 |
| 05 | පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය | 03 |
| 06 | ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය | 02 |
| 07 | පළාත් සභාව හා පළාත් සභා ලේකම් කාර්යාලය | 01 |
| 08 | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 01 |
| 09 | සමුපකාර සේවක කොමිෂන් සභාව | 02 |
| 10 | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 02 |
| 11 | පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව | 03 |
| 12 | පළත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 04 |
| 13 | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 02 |
| 14 | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | 03 |
| 15 | පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව | 01 |
| 16 | පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 02 |
| 17 | පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | 03 |
| 18 | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 01 |
| 19 | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 03 |
| 20 | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | 01 |

සමස්ත ප්‍රතිපාදන වැය කිරීම් විනිවිද භාවයෙන් යුක්තව සහ අවශ්‍ය ප්‍රතිඵල ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමට සියළු ආයතනවලට අවශ්‍ය මග පෙන්වීම හා උපකාර විමත් පළාත් සභාවට අයත් සියළු ආයතනවල එදිනෙදා සිදු කරනු ලබන රාජකාරි විධිමත් හා නීත්‍යානුකූලව සිදු වේ දැයි විපරම් කර ඉහළ කළමනාකාරීත්වයට වාර්තා කිරීමත් අරමුණු කොට වඩාත් ශක්තිමත් මෙන්ම කාර්යක්ෂම කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරිම සඳහා 2018 වර්ෂයේ දී විගණන හා කළමනාකරණ රැස්වීම් පැවැත්වීම සිදුවිය.

ඒ තුළින් උතුරු මැද පළාතේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන තුළ මූල්‍ය කළමනාකරණයේදී ඇති ගැටළු හඳුනා ගැනීමටත් එම ගැටළු සාකච්ඡාකර විසඳුම් ඉදිරිපත් කිරීමත් තුළින් වඩාත් කාර්යක්ෂම මෙන්ම විනිවිදභාවයෙන් යුතු මූල්‍ය විනයෙන් යුතු ආයතන පද්ධතියක් නිර්මාණය කිරිම සඳහා අවශ්‍ය දායකත්වය ලබා දෙන ලදී.

## අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය 2020 - 2021

උතුරු මැද පළාතේ ආයතන තුල වඩාත් විනිවිදභාවයකින් යුක්තව මූල්‍ය හා මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය සහය ලබා දීමත් කාර්ය මණ්ඩලවල ධාරිතාවය ඉහල නැංවීම තුළින් ඵලදායක සේවාවක් ලබා දීමත් යන ප්‍රතිඵල අපේක්ෂාවෙන් 2020 හා 2021වර්ෂ වලදී වඩාත් ඉලක්ක සහගත වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිතය.

| අරමුණු | ඉලක්ක | |
|---|---|---|
| | 2020 | 2021 |
| උතුරු මැද පළාත තුළ පිහිටුවා ඇති අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ සංස්ථා සහ පළාත් සභාවට අයත් අනෙකුත් ආයතනවල කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමට අවශ්‍ය වන අභ්‍යන්තර පාලන ක්‍රම වේද ශක්තිමත් කරලිම මගින් පළාතේ මහජනතාවට වඩාත් යහපත් ඵලදායි සේවාවක් ජනිත කිරීම. | පළාත තුළ විගණන කාර්යාල 02ක් ස්ථාපිත කිරීම. | පළාතේ සියළුම ආයතන තුළ අභ්‍යන්තර විගණන ඒකකයන් ස්ථාපිත කිරිම. |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම නිසා වාර්ෂික සැලැස්මේ ඉලක්කයන් 100%ක් සම්පූර්ණ කර ගැනීම දුෂ්කර කටයුත්තක්ව පවති.විගණන නිලධාරීන් ප්‍රමාණය 25 දෙනෙක් දක්වා වැඩිකර ගැනීම සඳහා අනුමැතිය ලබාගෙන එම නිලධාරින් බඳවා ගැනීම සඳහා අවශ්‍ය විභාග පවත්වා ඇති අතර එහි ප්‍රතිඵල නිකුත් කිරීමට නියමිතව ඇත.එම බඳවා ගැනිමෙන් අනතුරුව ආයතනයේ කාර්ය සාධනය යහපත් මට්ටමකට ගෙන ඒමට හැකිවනු ඇත.

එක් එක් අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා අධිකාරී තුළ ඇති වූ ගැටළු හඳුනා ගැනිම සහ ඒ සඳහා සාධාරණ විසඳුම් යෝජනා කර විධිමත් මූල්‍ය පාලනයක් ඇති කිරීම තුළින් කාර්යක්ෂමතාවය හා ඵලදායී රාජ්‍ය සේවයේ නිර්මාණය කිරීම සඳහා සක්‍රිය දායකත්වයක් සැපයීමට හැකිවූ ඉලක්ක සහගතව හා සුභවාදිව ගමන් කිරිමට හැකිවූ වර්ෂයක් ලෙස 2018 වර්ෂය විග්‍රහ කළ හැක.

සෑම ආයතනයකම යම් නිශ්චිත කාලයකදි කරන ලද ආයතනික කටයුතු මෙන්ම ගිණුම් ක්‍රියාවලියද ඇතුලත්ව සමස්ත කළමනාකරණ කාර්යයන් පිරික්සීම මෙම දෙපාර්තමේන්තුවට නියම් වී ඇත. එම නිසා කුඩා කණ්ඩායමක් ලෙස විශාල කැපවීමකින් යුක්තව ක්‍රියා කිරිම තුළින් මහජන ප්‍රසාදයට ලක්ව ඇත.මහජන මුදල් වැය කිරීමේදී වංචා දූෂණ හෙලිවීම මාධ්‍ය මගින්ද හෙළිදරව් කිරීම නිසා සාමාන්‍ය ජනතාවගේ දැනුවත්භාවය තුළ මහජනයා විසින් විවිධ පෙත්සම් හා ලිපි එව්මද සිදු විණි. සියළු රාජකාරි වල විනිවිද භාවය මෙන්ම නීත්‍යානුකූල හා නිවැරදිභාවය ඇති කිරීමට ක්‍රියා කිරිම සහ මේවායේ ප්‍රතිඵල ඉදිරිකාලයේදී ලැබෙනු ඇත. ඒ තුළින් රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාවය හා ඵලදායි බව වැඩි කිරීමට හැකි විය.

-මෙය හිස්ව තබන ලද පිටුවකි-

# 5.5.පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය

පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය යටතේ පවතින ආයතනයක්වේ. පළාතේ මානව සම්පත් සංවර්ධනය සඳහා කටයුතු කරනු ලබන ප්‍රධාන තම ආයතනය වේ. එමගින් පළාත් රාජ්‍ය සේවයේ මානව සම්පත් සංවර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීමේ ක්‍රියාවලිය සිදුකරනු ලැබේ. පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් හා පුහුණු) කාර්යාලය හා පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය යන ප්‍රධාන අංශ වලින් සමන්විතවේ. කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකයේ ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පවතින මානව සම්පත්, මූල්‍ය සම්පත් හා භෞතික සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් භාවිතා කරමින් වාර්ෂික පුහුණු සැලැස්ම හා බාහිර ආයතනවල ඉල්ලීම් අනුව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කෙරේ.

## දැක්ම

“පරිපූර්ණ මහජන සේවකයෙක්, ගුණාත්මක රාජ්‍ය සේවයක්”

## මෙහෙවර

“ජාතික ප්‍රතිපත්තියට අනුගතව පළාතේ රාජ්‍ය සේවකයින්ගේ ධාරිතා ඉහළ නැංවීම, පුහුණු අවශ්‍යතා තක්සේරුව, කාර්ය සාධන නියාමනය සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවිධානය කරමින් ජනතාවාදී රාජ්‍ය සේවයක් බිහි කිරීමට අඛණ්ඩව දායකවීම.”

## දිගුකාලීන අරමුණු

රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නිළධාරීන් පුහුණු කිරීම තුළින් කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවයක් ඇති කිරීම.

## කෙටිකාලීන අරමුණු

රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නිළධාරීන් පුහුණු කිරීම.

## ප්‍රධාන කාර්යයන්


- රාජ්‍ය සේවකයින්ගේ ධාරිතා සංවර්ධනය
- පුහුණු අවශ්‍යතා තක්සේරුව
- කාර්ය සාධන නියාමනය
- ආයතනික ධාරිතා සංවර්ධනය
- යහ පාලනය

## ප්‍රධාන උපාය මාර්ගයන්

- පුහුණුලාභීන්ගේ ඉල්ලීම් පදනම් කරගනිමින් පවතින අවශ්‍යතාවය අනුව පුහුණු පාඨමාලාවන් සංවිධානය කිරීම.
- සුදුසුකම්ලත් ප්‍රවීණ දේශක මණ්ඩලයකගේ සම්පත්දායකත්වය ලබා ගැනීම.
- නවීන තාක්ෂණික ක්‍රමවේදයන් ද භාවිතා කරමින් පුහුණු පාඨමාලා පැවැත්වීම සඳහා හැකි උපරිම අයුරින් නවීන තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතා කිරීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අ.අ | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අනුමත සංඛ්‍යාව | 37 |
| 02 | සේවයේ නියුතු සංඛ්‍යාව | 26 |
| 03 | පුරප්පාඩු සංඛ්‍යාව | 11 |
| 04 | අනියම් | 01 |




## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 12.025 | 15.476 | 0.109 | 128.7 |
| ගමන් වියදම් | 0.500 | 0.277 | 0.222 | 55.44 |
| සැපයීම් | 3.500 | 1.406 | 1.452 | 49.19 |
| නඩත්තු වියදම් | 3.100 | 2.036 | 1.063 | 66.57 |
| ගිවිසුම්ගත සේවා | 15.600 | 8.711 | 6.897 | 55.84 |
| මාරු කිරීම් | 0.090 | 0.025 | 0.064 | 28.36 |
| **එකතුව** | **34.815** | **27.931** | **9.807** | **80.23** |

## පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන වැඩ ඉටු කිරීම.

| අනු අංකය | ව්‍යාපෘතිය/වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 01 | 2018 වාර්ෂික පුහුණු සැලැස්ම අනුව සහ පළාත් රාජ්‍ය ආයතනවල ඉල්ලීම අනුව මනාව සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම. | උතුරු මැද පළාත් සභාවේ සියළුම රාජ්‍ය සේවකයින් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරිම,පැවැත්වීම හා පසුවිපරම් කිරීම | උතුරු මැද පළාත් සභාවේ සියළුම රාජ්‍ය සේවකයින්ගේ දැනුම, කුසලතා වර්ධනය හා ආකල්ප සංවර්ධනය තුලින් ගුණාත්මක රාජ්‍ය සේවයක් ඇති කිරිම | 2018 වර්ෂයේ පුහුණුව ලැබු පුහුණුලාභීන් ගණන 2,895 |

## මූලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම- පුනරුප්ථාපනය හා වැඩිදියුණු කිරීම | 3.00 | 2.427 | 0.572 | 80.92 |
| වාහන | 1.00 | 0.00 | 1.00 | 0 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම- මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 2.00 | 0.201 | 1.798 | 10.06 |
| **එකතුව** | **6.00** | **2.629** | **3.370** | **43.81** |

## කාර්ය සාධක ඉලක්ක - 2018

| අ.අ | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශකය | ඉලක්ක (පුහුණු වැඩසටහන්) | | |
|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 |
| 01 | වාර්ෂික පුහුණු සැලැස්ම අනුව රාජ්‍ය සේවයේ සහ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් පුහුණු වැඩසටහන් සංවිධානය කිරිම,පැවැත්වීම හා පසුවිපරම් කිරීම | වර්ෂය තුළ පවත්වන ලද පුහුණු වැඩසටහන් | 60 | 55 | 65 |

**ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය**

| ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | පුහුණු වැඩසටහන් ගනන | වෙන් කළ මුදල (රු.මි) | වැය කළ මුදල (රු.මි.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| වාර්ෂික පුහුණු සැලැස්ම අනුව වැඩසටහන් පැවැත්වීම | සංවර්ධන ක්‍රියාවලිය වේගත් කිරිම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දිම. | 55 | 6.6 | 6.6 | 100 |

**විදේශ ආධාර මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති තුලින් ජනිත කළ ප්‍රතිලාභ විශ්ලේෂණය කිරීම.**

**UNDP ව්‍යාපෘතිය - 2018**

| තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | | ලැබුණු කෙටිකාලීන දිගුකාලීන ප්‍රථිඵල |
|---|---|---|---|---|---|
| | වෙන් කල (රු.මි.) | වැය කල (රු.මි.) | භෞතික (%) | මූල්‍ය (%) | |
| 01. රාජ්‍ය අංශයේ ගුණාත්මක සේවා සැපයීම තහවුරු කිරීම සඳහා පළාතේ තෝරාගත් ආයතනවල සේවා සැපයීම වැඩිදියුණු කිරීම සඳහා සහයවීම.<br>❖ පළාත් පාලන ආයතන තුළ පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.<br>❖ තොරතුරු දැන ගැනීමේඅයිතිවාසිකම් පනත පිළිබඳව රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම. | 4.250 | 1.634 | 75 | 38.45 | ❖ පළාත් පාලන ආයතන සඳහා පුරවැසිප්‍රඥප්තිය සකස් කිරීම හා ඊට අදාළ කාර්ය පටිපාටි සංග්‍රහය සකස් කිරීම සිදුකර ඇත.<br>❖ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත පිළිබඳව පළාත් නිලධාරීන් දැනුවත් කර ඇත. |
| 03. උතුරු මැද පළාත සඳහා අංගසම්පූර්ණ පුහුණු සැලැස්මක් සකස් කිරීම. | | | | | ❖ පළාත් රාජ්‍ය සේවයේ සියළුම නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඇත.<br>❖ පුහුණු ඒකකය සඳහා පුහුණු කළමනාකරන දත්ත පද්ධතිය ස්ථාපිත කර ඇත. |

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය.

| අරමුණු | ඉලක්ක | | අපේක්ෂිත ප්‍රතිඵල | |
|---|---|---|---|---|
| | 2020 | 2021 | කෙටිකාලීන | දිගුකාලීන |
| රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින් පුහුණු කිරිම | පුහුණු වැඩසටහන් 65 | පුහුණු වැඩසටහන් 70 | රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින්ගේ පුහුණු අවශ්‍යතා සපුරාලීම. | කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවයක් තුලින් මහජන අපේක්ෂා ඉටුකිරිම |

## 2018 වර්ෂයේදී පවත්වන ලද වෙනත් පුහුණු වැඩසටහන්

| වැඩසටහන | දින ගණන | සහභාගීවූ සංඛ්‍යාව | මුළු වියදම රු. |
|---|---|---|---|
| දෙමළ භාෂා පුහුණු පාඨමාලාව | පැය 60 | 50 | 0.114 |
| ශ්‍රී ලංකාවේ වත්මන් දේශපාලන හා සමාජ සංසර්භය තුල රාජ්‍ය නිලධාරියාගේ කාර්යභාරය | 1 | 100 | 0.033 |
| තාක්ෂණික නිලධාරීන්ගේ ප්‍රාරම්භක පුහුණු වැඩ වැඩසටහන හා<br>පරිගණක පුහුණු වැඩසටහන | 03<br>05 | 30<br>45 | 0.05 |
| බඳවාගැනීම් පරිපාටිය සකස් කිරීම. | 01 | 30 | 0.022 |
| සංවර්ධන නිර්මාණ යන්ත්‍ර ඒජන්සියට ගෙවීම්(සහතික පත්‍ර මුද්‍රණය කිරීම.) | | | 0.011 |
| කාල කළමනාකරණය/<br>පරිගණක පුහුණු වැඩසටහන | 02 | 84 | 0.06 |
| සමීක්ෂණ තොරතුරු විශ්ලේෂණය කිරීම./spss මෘදුකාංග භාවිතය පිළිබඳ පුහුණු වැඩමුළුව | 04 | 40 | 0.09 |
| පරිගණක පුහුණු වැඩසටහන | 2 | 35 | 0.051 |
| මුලික විමර්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන | 2 | 30 | 0.05 |
| අත්තිකාරම් ගිණුම් පිළිබඳ පුහුණු වැඩසටහන<br>හා ගබඩා කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව | 3 | 45<br>40 | 0.06 |
| පරිගණක පුහුණු පාඨමාලාව | 5 | 42 | 0.14 |
| .එස්.පී.එස්.එස්. වැඩසටහන (සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 04 | 30 | 0.30 |
| නවක රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරිම/<br>පරිගණක පුහුණු වැඩසටහන | 7<br>03 | 35<br>50 | 0.07 |
| වත්කම් කළමනාකරණ පිළිබඳ පුහුණු වැඩමුළුව / මහජන සම්බන්ධතාවය හා විනය පිළිබඳ පුහුණු වැඩමුළුව | 2 | 43<br>42 | 0.05 |

| වැඩසටහන | දින ගණන | සහභාගීවූ සංඛ්‍යාව | මුළු වියදම රු. |
|---|---|---|---|
| ප්‍රසම්පාදන ලියවිලි සකස් කිරිම/<br>පරිගණක පුහුණු වැඩමුළුව | 03<br>7 | 42<br>40 | 0.15 |
| කළමනාකරණ සහකාර සේවයට උසස් වූ නිලධාරීන්ගේ ප්‍රරම්භක පුහුණු වැඩමුළුව | 6 | 35 | 0.12 |
| කණිෂ්ඨ සේවක පුහුණු වැඩමුළුව | 7 | 30 | 0.13 |
| මූලික දෙමළ භාෂා පුහුණු පාඨමාලාව | පැය 50 | 210 | 0.11 |
| මූලික විමර්ශණ පැවැත්වීම<br>විගණන නිලධාරි පුහුණුව | 03<br>1 | 42<br>38 | 0.07 |
| පැමිණිල්ල මෙහෙයවීම පිළිබඳ පුහුණු වැඩමුළුව<br>ඵලදායීතාව පිළිබඳ පුහුණු වැඩමුළුව | 03<br>03 | 41<br>38 | 0.12 |
| ප්‍රාදේශීය සම්පත් භාවිතයෙන් තිරසාර සංවර්ධනය ඇති කිරිම සඳහා වන අත්දැකීම් හුවමාරු කර ගැනීමේ වැඩසටහන. | 1 | 75 | 0.25 |
| පරිගණක පුහුණු වැඩළමුව | 04 | 35 | 0.08 |
| පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග සංචිතයේ දැනුවත් කිරිමේ පුහුණු වැඩසටහන<br>කණිෂ්ඨ සේවක පරිගණක පුහුණු වැඩසටහන | 01<br>03 | 27<br>27 | 0.06 |
| වැටුප් සකස් කිරිමේ පරිගණක මෘදුකාංග පිළිබඳ වැඩසටහන | 06 | 35 | 0.15 |
| පරිගණක පුහුණු වැඩසටහන | 02 | 37 | 0.031 |
| උපදේශනය පිළිබඳ පුහුණු වැඩසටහන<br>පරිගණක පුහුණු වාඩසටහන | 02<br>02 | 34<br>37 | 0.070 |
| පරිගණක පුහුණු වැඩසටහන | 02 | 30 | 0.034 |
| මූලික විමර්ශන පැවැත්වීම පිළිබඳ පුහුණු වැඩසටහන | 03 | 35 | 0.120 |
| වැටුප් සකස් කිරිමේ පරිගණක මෘදුකාංගය පිළිබඳ වැඩසටහන | 05 | 35 | 0.120 |
| ලේඛනාගාර නඩත්තුව පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | 39 | 0.029 |
| විශ්‍රාම වැටුප් සකස් කිරිම පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | 37 | 0.07 |
| ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | | | 0.60 |
| ව්‍යාපෘති වාර්තා සකස් කිරිම. | 03 | 53 | 0.07 |
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | 40 | 0.06 |
| කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකයට පොත් මිලදී ගැනීම. | | | 0.07 |

2018 වර්ෂයේදී පවත්වන ලද වෙනත් පුහුණු වැඩසටහන් ඉතිරි කොටස...

| වැඩසටහන | දින ගණන | සහභාගීවූ සංඛ්‍යාව | මුළු වියදම රු. |
|---|---|---|---|
| පෞද්ගලික ලිපිගොණු නඩත්තුව පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | 45 | 0.06 |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | 03 | 40 | 0.072 |
| වැටුප් පරිවර්තනය කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | 40 | 0.048 |
| පරිගණක පුහුණු වැඩසටහන | 02 | 15 | 0.028 |
| වාරිමාර්ග හා ජල කළමනාකරණ පිළිබඳ පුහුණු ආයතනය කොත්මලේ | | 17 | 1.70 |
| අධීක්ෂණ කළමනාකරණය | 2 | 32 | 0.049 |
| ඵලදායීතාව පිළිබඳ පුහුණු වැඩසටහන | 03 | 50 | 0.079 |
| පරිගණක පුහුණු වැඩසටහන | 02 | 17 | 0.029 |
| ජාතික විගණන පනත පිළිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම. | 01 | 500 | 0.028 |
| වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගය පිළිබඳ පුහුණු වැඩසටහන | 05 | 55 | 0.014 |
| පෞද්ගලික ලිපි ගොනු කළමනාකරණය | 02 | 43 | 0.051 |
| මූලික දෙමළ භාෂා පුහුණු පාඨමාලාව | 07 | 55 | 0.166 |
| මූලික දෙමළ භාෂා පුහුණු පාඨමාලාව | 07 | 70 | 0.169 |
| විශ්‍රාම දිවියට පෙර සූදානම | 01 | 33 | 0.038 |
| සංවර්ධන නිර්මාණ ඒජන්සිය | | | 0.015 |
| එකතුව | දින 168 | 2895 | 6.636 |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී පුහුණු මධ්‍යස්ථානයේ පවතින භෞතික සම්පත් හා පහසුකම් ප්‍රමාණවත් නොවීම, පළාත් පුහුණු මධ්‍යස්ථානයේ පවතින අවම පහසුකම් යටතේ පුහුණුලාභීන් සඳහා අවශ්‍ය නේවාසික පහසුකම් සැපයීමේදී දුෂ්කරතාවයන්ට මුහුණදීම ආදී අභියෝග හා ගැටළුවලට මුහුණ දීමට සිදු විය .

එසේ වුවද 2018 වර්ෂයේ පුහුණු සැලැස්මට අනුව පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වර්ධනය කිරීමේ අරමුණින් විවිධ ක්ෂේත්‍රය ඔස්සේ වැඩ සටහන් 46ක් පැවැත්වීමට සැලසුම් කරන ලදි. 2018 වර්ෂය අවසන් වන විට විෂය ක්ෂේත්‍රයන්ට අදාල මෙන්ම විෂය බාහිර හා වෙනත් ආයතනවල ඉල්ලීම් මත වැඩසටහන් 59 ක් පවත්වන ලදී. ඒ අනුව 2018 වර්ෂයේදී පළාත් රාජ්‍ය සේවයේ නියුතු විවිධ කාර්ය මණ්ඩල නිලධාරීන් 2895 ක් පමණ පුහුණුව ලබා දී ඇති අතර ඒ සඳහා රු.මි.6.636 ක මුදලක් වැය කර ඇත.

-මෙය හිස්ව තබන ලද පිටුවකි-

# 5.6.පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු.

1991 වර්ෂයේ ජනවාරි මස දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත වූ උතුරු මැද පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ආරම්භක පළාත් ආදායම් කොමසාරිස් වූයේ ඒ.ඩී.ජයවර්ධන මහතාය. පළාත් ආදායම් නියෝජ්‍ය කොමසාරිස් වූයේ එච්.බී.ඒ.සෙනෙවිරත්න මහතාය. ආරම්භයේ දී පළාත් ආදායම් කොමසාරිස්, නියෝජ්‍ය පළාත් ආදායම් කොමසාරිස්වරුන්ට අමතරව තක්සේරුකරු,බදු නිලධාරීන් සහ අනෙකුත් නිලධාරීන්ද ඇතුළුව නිලධාරි මණ්ඩලය 08 දෙනෙකුගෙන් සමන්විත විය. ක්‍රමානුකූලව වර්ධනය වූ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව 1992 වර්ෂයේ ආයතන හා ගිණුම් අංශ පිහිටුවන ලදි. 2003 වර්ෂයේ දී පොළොන්නරුව නියෝජ්‍ය පළාත් ආදායම් කාර්යාලයක් පිහිටුවා ඒ සඳහා නිලධාරීන් බඳවා ගන්නා ලදි.

පළාතේ ප්‍රශස්ත බදු රැස් කරන්නා වශයෙන් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව නවතම පරිගණක ක්‍රමවේදයක් ස්ථාපිත කරමින් හා නිලධාරීන් පුහුණු කිරීම මඟින් බදු රැස්කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කර පළාතේ සංවර්ධනයට විශාල මෙහෙයක් ඉටු කරයි. වර්තමානයේ ඒ සඳහා නිලධාරින් හතළිස් දෙදෙනෙකුගේ( 42) සහය ලැබේ.

## දැක්ම

"ප්‍රශස්ත බදු රැස්කිරීමේ ක්‍රියාවලියක්, සංවර්ධිත පළාතක්."

## මෙහෙවර

"සංවර්ධිත පළාතක් බිහිකිරීම සඳහා බදු හා ගාස්තු රැස් කිරීම, බදු හා ගාස්තු ගෙවන්නන්ගේ ආකල්ප සහ අනෙකුත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය, අදාල පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම."

## දිගු කාලීන අරමුණු

- සියළු බදු හා ගාස්තු ආදායම් රැස් කිරීම ඉහළ නැංවීම.
- ස්වේච්ඡා බදු අනුකූලතාව වර්ධනය.

## කෙටිකාලීන අරමුණු

- උතුරු මැද පළාත් සභාව විසින් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත, වාර්ෂික මුදල් ප්‍රකාශයෙන් එක් එක් ආදායම් ප්‍රභවයන් සඳහා ඇස්තමේන්තු කර ඇති ආදායම්, හැකි උපරිමයෙන් රැස් කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- බදු හා ගාස්තු පැනවීම හා අයකිරීම.
- රැස් කරනු ලබන ආදායම මාසිකව වාර්තා කර පළාත් භාණ්ඩාගාරය වෙත මාරු කිරීම.
- අධිකරණ දඩ හා මුද්දර ගාස්තු වශයෙන් රැස්කරන ආදායම පළාත් පාලන ආයතනවලට බෙදාහැරීම සඳහා නිර්දේශ ලබාදීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- බදු හා ගාස්තු ගෙවන්නන්ගෙන් හා විවිධ ආයතන වලින් තොරතුරු කැඳවීම.
- බදු හා ගාස්තු ගෙවන්නන් කැඳවා සම්මුඛ සාකච්ඡා තුළින් පෙර බදු හා ගාස්තු අය කිරීම.
- බදු/ ගාස්තු ගෙවන්නන් හා නොතාරිස්වරුන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම.
- හිඟ බදු හා ඌණ මුද්දර ගාස්තු අය කිරීම.


I.චංචල හා නිශ්චල දේපළ තහනම් කිරීම.

II.බැංකු ගිණුම් තහනම් කිරීම.

III.නඩු පැවරීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 51 |
| 2 | සේවයේ නියුතු | 42 |
| 3 | පුරප්පාඩු | 10 |
| 4 | අනියම් | 01 |




## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි.) | 2018 වර්ෂයේවියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 37.11 | 36.80 | 0.32 | 99 |
| ගමන් වියදම් | 0.50 | 0.50 | - | 100 |
| සැපයීම් | 1.25 | 1.21 | 0.04 | 97 |
| නඩත්තු වියදම් | 0.91 | 0.77 | 0.14 | 84 |
| ගිවිසුම් ගත සේවා | 1.58 | 1.51 | 0.07 | 95 |
| මාරු කිරීම් | 0.47 | 0.46 | - | 98 |
| **එකතුව** | **41.82** | **41.25** | **0.57** | **98** |

## මුලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි.) | 2018 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම හා උපකරණ | 1.76 | 1.69 | 0.07 | 96 |
| වාහන | 0.20 | 0.16 | 0.04 | 80 |
| වෙනත් මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 5.76 | 4.63 | 1.13 | 80 |
| **එකතුව** | **7.72** | **6.48** | **1.24** | **83** |

## ආදායම් ඉපයීම්

| ශීර්ෂය | ඉලක්කය (රු.මි) | සත්‍ය ආදායම (රු.මි) | එකතු කිරීමේ ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 10-02-04-05 මත්පැන් බලපත්‍ර ගාස්තු | 62.9 | 64.3 | 102 |
| 10-02-07-01 දේපල පැවරීම මත මුද්දර ගාස්තු | 165.0 | 167.2 | 101 |
| 10-02-07-02 අධිකරණ ලියවිලි මත මුද්දර ගාස්තු | 5.0 | 5.2 | 104 |
| 10-02-09-00 පිරිවැටුම් බද්ද | 0.3 | 0.8 | 266 |
| 20-03-02-27 ඖෂධ හා රසායන බද්ද | 2.0 | 0.9 | 45 |
| 20-03-02-30 ඛනිජ බද්ද | 5.3 | 6.2 | 116 |
| 20-03-03-01 උසාවි දඩ | 225.0 | 237.7 | 105 |
| **එකතුව** | **465.5** | **482.3** | |

## *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු හා සම්බන්ධ ක්‍රියාකාරකම්*

**01.** සියළු බදු හා ගාස්තු රැස් කිරීම, ඉහල නැංවීම මගින් පළාතේ සංවර්ධනය.




**02.** නොතාරිස්වරුන් දැනුවත් කිරීම තුලින් නිසි කලට රජයේ බදු ආදායම් රැස්කර දීම.

**03.** බදු පැනවීමේ හා රැස් කිරීමේ සියළු ක්‍රියාවලීන් පරිගණක පද්ධතියක් තුලින් විධිමත් කිරීම මඟින්, වඩාත් නිවැරදිව හා කාර්යක්ෂමව බදු රැස් කර ආදායම් ඉහල නැංවීම.

04. ඉඩම් ඔප්පුවල වටිනාකම් පිළිබඳව **මතය** ලබා ගැනීමේ ක්‍රියාදාමය වර්ධනය කිරීම තුලින්, කාර්යක්ෂමව, විධිමත්ව, බදු ආදායම් කඩිනමින් රැස් කර දීම.

## කාර්ය සාධන ඉලක්ක

| ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|---|
| | | 2017 | 1018 | 2019 |
| කාර්යක්ෂමව නිවැරදිව බදු ආදායම් රැස්කර දීම. | දෙපාර්තමේන්තු අභ්‍යන්තර ඉලක්ක ලබා දීම හා සාමූහිකව එම ඉලක්ක සපුරාලීම. | 389.3 | 465.5 | 480.1 (ඇස්තමේන්තු අගය) |

## විදේශාධාර මත ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය

මුද්දර ගාස්තු නිවැරදිව ගෙවීම සඳහා නොතාරිස්වරුන් පෙළඹවීම මත මුද්දර ආදායම ඉහල නැංවීම.

නිවැරදි තොරතුරු කඩිනමින් ලබා ගැනීම තුලින් දෙපාර්තමේන්තුවේ ආදායම් ඉහල නැංවීම.අනෙකුත් පළාත්වල නිලධාරීන් සමඟ සුහදත්වය තුළින් දැනුම හුවමාරු කර ගැනීමනිවැරදි තොරතුරු කඩිනමින් ලබා ගැනීම හා දේපල තක්සේරු කිරීම සඳහා නිවැරදි ක්‍රමවේද අනුගමනය කිරීම මඟින් ඇතිවන දෙපාර්තමේන්තු කාර්යක්ෂතාවය තුළින් බදු රැස් කිරීමේ කාර්යක්ෂමතාවය ඉහල නංවාගනිමින් පළාතේ ආදායම් එකතු කිරීම ඉහල නැංවීම යන කෙටි කාලීන/දිගු කාලීන ප්‍රතිඵල ලඟාකර ගැනීමේ අරමුණින් UNDP ආධාර මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

**UNDP ආධාර මත ක්‍රියාත්මක කරන ලදී ව්‍යාපෘතිය.**

| ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | වෙන් කළ රු.මි. | වැය කළ රු.මි. | භෞතික (%) | මූල්‍ය (%) |
| නොතාරිස්වරුන් දැනුවත් කිරීමේ වැඩමුළු 2 ක් පැවැත්වීම | වෙළඳපල වටිනාකමට ඔප්පු ලිවීමට පෙළඹවීම හා වටිනාකම් පිළිබඳව තක්සේරුකරුවන්ගේ මතය ලබා ගැනීමට දැනුවත් කිරීම. | 0.50 | 0.50 | 100 | 100 |
| දෙපාර්තමේන්තුවේ නව දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම. | ආදායම් එකතු කිරීම පරිපාලනය කිරීම සඳහා පරිගණක ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම. | 1.20 | 1.05 | 90 | 88 |
| වෙනත් පළාත් ආදායම් කාර්යාලවල අධ්‍යයන | දෙපාර්තමේන්තු පරිපාලන කටයුතු හා ආදායම් රැස් කිරීමේ කටයුතු අධ්‍යයනය කිරීම. | 0.30 | 0.18 | 60 | 61 |
| ධාරිතා සංවර්ධන වැඩසටහන් හා G I S පුහුණු පාඨමාලා පැවැත්වීම,පේරාදෙණිය/ජයවර්ධනපුර විශ්වවිද්‍යාල | තාක්ෂණික දැනුම හා කුසලතා වර්ධනය කිරීම | 0.50 | 0.36 | 55 | 71 |
| නව පද්ධතිය සඳහා දත්ත ඇතුළත් කිරීම | මෘදුකාංගය යාවත්කාලීන කිරීම | 0.30 | 0.11 | 70 | 35 |
| පරිපාලන වියදම් | කමිටු රැස්වීම | 0.20 | 0.19 | 98 | 97 |
| උපකරණ මිලදී ගැනීම. | පරිගණක,කැමරා,ස්කෑනර්, ලැප්ටොප් මිලදී ගැනීම. | 0.50 | 0.38 | 80 | 76 |

## ආයතනයේ අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

ඉඩම් ඔප්පු පරීක්ෂා කිරීම හා යාවත්කාලීන කිරීම, මහජනතාව දැනුවත් භාවයෙන් යුක්තව බදු ගෙවීම, වාර්ෂිකව ආදායම් ඉලක්ක සම්පූර්ණ කර ගැනීම,නිලධාරීන් තාක්ෂණික ක්‍රමවේදයන් පිළිබඳ දැනුම අවබෝධය ලබා දීම, මුද්දර ආදායම ඉහළ නැංවීම, මුද්දර බදු ආදායම ඉහල නැංවීම, නිවැරදි තොරතුරු කඩිනමින් ලබා ගැනීමෙන් දෙපාර්තමේන්තු කාර්යක්ෂමතාවය වැඩි කිරීම තුළින් පළාතේ ආදායම ඉහළ නැංවීම, ආදායම් පරිපාලනය කිරීමේ කටයුතු නිවැරදිව හා කාර්යක්ෂමව කිරීමට හැකි වීම තුළ පළාතේ නව ආදායම් මාර්ග හඳුනා ගැනීම මඟින් ආදායම් උත්පාදනය ඉහළ නැංවීමටත් ඒ තුළින් ජාතික මට්ටම කෙරෙහි උතුරු මැද පළාතේ දායකත්වය වර්ධනය කිරීමටත් 2020-2021 වර්ෂවලදී ඉලක්කගත කෙරේ.

| අරමුණ | ඉලක්ක | |
|---|---|---|
| | 2020 | 2021 |
| සියළු බදු හා ගාස්තු ආදායම රැස් කිරීම,ඉහල නැංවීම | 2020 දී කාර්ය මණ්ඩලය සම්පූර්ණ කර ගැනීම. | – |
| ස්වේච්ඡා බදු අනුකූලතා වර්ධනය | 2020 වර්ෂය වන විට මතය ලබා ගැනීමේ ප්‍රතිශතය 50%ක් දක්වා ඉහල නංවා ගැනීම. | 2021 වර්ෂය වනවිට මතය ලබා ගැනීමේ ප්‍රතිශතය 75%ක් දක්වා ඉහල නංවා ගැනීම. |
| වාර්ෂික මුදල් ප්‍රකාශයෙන් එක් එක් ආදායම් ප්‍රභවයන් සඳහා ඇස්තමේන්තු කර ඇති ආදායම් හැකි උපරිමයෙන් රැස් කිරීම. | බදු කාර්ය මණ්ඩල නිලධාරීන් සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම. | නව දුරටත් අවශ්‍ය පුහුණුව ලබාදීම. |
| ආදායම එකතු කිරීම, පරිපාලනය කිරීම සඳහා පරිගණක ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම. | පරිගණක ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම.(මාසික ආදායම් වාර්තා හා හිඟ ආදායම් වාර්තා පිළියෙල කිරීම) | සියළු ආදායම් ප්‍රභවයන් සඳහා පරිගණක ක්‍රමවේදය ව්‍යාප්ත කිරීම. |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස.

ඛනිජ බද්ද , උසාවි දඩ, අධිකරණ ලියවිලි මත මුද්දර ගාස්තු ආදායම් ඉලක්ක ඉක්මවීමට හැකි වී තිබේ. ප්‍රධාන බදු හා ගාස්තු ආදායම් මාර්ග 07න් ඖෂධ හා රසායන බද්ද හැර ඉතිරි සියළු ආදායම් ප්‍රභව වාර්ෂික ඉලක්ක සම්පූර්ණ කර ඇත. සමස්තයක් වශයෙන් මුළු ආදායම 103%ක වර්ධනයක් ලබා ගෙන ඇත. මේ සඳහා දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ සියළුදෙනාගේ හැකියාවන් හා එකමුතුව, උනන්දුවෙන් වැඩකිරීම හේතුපාදක විය. දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, පුරප්පාඩු පැවැතියද ඉලක්ක කරා ලඟා වීමට හැකි වී ඇත.

කාර්ය සාධනය කරා ළඟා වීමේ දී ගැටළු කිහිපයකට මුහුණ දීමට සිදු විය. බදු හා ගාස්තු අයකිරීමේ දී ව්‍යවස්ථාපිත බලතල ඇත්තේ තක්සේරුකරුවන්ටය. අනුමත කාර්ය මණ්ඩලය අනුව තක්සේරුකරුවන් 11දෙනෙක් සිටිය යුතු නමුත්, දැනට සිටින්නේ 05 දෙනෙක් පමණි. ඉන් නිලධාරීන් දෙදෙනෙක් අනුරාධපුර හා පොළොන්නරු කාර්යාල වල නියෝජ්‍ය කොමසාරිස් තනතුරු වල රාජකාරි ආවරණය කරයි. පොළොන්නරුව කාර්යාලයේ තක්සේරුකරුවන් 04 දෙනෙක් සිටිය යුතු නමුත්, දැනට පරිපාලන හා බදු අයකිරීමේ සියළු කටයුතු කරනු ලබන්නේ එක් නිලධාරියෙක් පමණි. නිලධාරීන් විසින්ම උසස්වීම් සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග



වලට එළඹීම නිසා පවතින පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත. මෙම තත්ත්වය ආදායම් රැස්කිරීමට බාධාවක් වී ඇත. තවද පොළොන්නරු කාර්යාලයේ ක්ෂේත්‍ර රාජකාරි සඳහා යෙදවීමට සුදුසු වාහනයක් නොමැති අතර තාවකාලික පිළියමක් ලෙස ප්‍රධාන ලේකම්ගේ උපදෙස් මත කොමසාරිස්ගේ නිල රථය යොදවා ඇත.

තවද කාණ්ඩායම් වශයෙන් වීථි සමීක්ෂණ , ස්ථාන පරීක්ෂා වැනි කටයුතු සඳහා යාමට ප්‍රමාණවත් වාහන පහසුකම් නොමැති වීමද දෙපාර්තමේන්තුවේ පවතින ප්‍රධාන ගැටළුවකි.අධිකරණ ලියවිලි මත මුද්දර ගාස්තු, ව්‍යාපාර පිරිවැටුම් බද්ධ, ඖෂධ හා රසායන බද්ධ සහ ඛනිජ සම්පත් බද්ධ වර්ෂයේ ආදායම් ඉලක්ක කරා ළගා වීමට නොහැකි වූ අතර, සමස්ත ආදායම 118.02% කින් සම්පූර්ණ කිරීමට හැකි වී ඇත. ඊට හේතු වූයේ දෙපාර්තමේන්තුවට සෘජු බලපෑමක් කළ හැකි ආදායම වන දේපළ පැවරීම මත මුද්දර ගාස්තු අය කිරීම යටතේ ඔප්පු විමර්ශනය කිරීම විධිමත් කිරීම තුළින් ඌණ මුද්දර ගාස්තු අය කිරීම හා දේපළ මිලදී ගන්නන් වෙළඳපොළ වටිනාකමට ඔප්පු ලිවීමට පෙළඹීම තුළින් එම ආදායම 140.08% කින් සම්පූර්ණ කිරීමට හැකිවීමයි. තවද මත්පැන් බලපත්‍ර ගාස්තු ආදායම එම වර්ෂය තුළදීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ගෙන්වා ගැනීමට ක්‍රියා කිරීම ද ඊට බලපා ඇත.

උසාවි දඩ ආදායම109.08% ඉහළ යාමද මීට බලපෑ එක් හේතුවකි.අධිකරණ ලියවිලි මත මුද්දර ගාස්තු , පිරිවැටුම් බද්ද ඖෂධ හා රසායන බද්ද හා ඛනිජ සම්පත් බද්ද ප්‍රායෝගික හේතුන් මත ඉලක්ක කරා ලගා වීමට නොහැකි වුව ද අනෙකුත් ආදායම් විශාල වශයෙන් ඉලක්ක ඉක්ම වීමටත් 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී යහපත් කාර්ය සාධනයක් ළඟාකර ගැනීමට හැකි විය.

# 06.ප්‍රධාන අමාත්‍ය හා උතුරු මැද පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදන, පළාත් පාලන, ග්‍රාමීය යටිතල පහසුකම් හා විශේෂ ව්‍යාපෘති, සංචාරක, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ, ඉංජිනේරු ඉදි කිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

## දැක්ම හා මෙහෙවර

**මෙහෙවර**

“ සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව පළාත් පාලනය, පළාත් මාර්ග, ග්‍රාමීය යටිතල පහසුකම්,විකල්ප බලශක්ති,ජනමාධ්‍ය හා සන්නිවේදනය,පුස්තකාල,මුද්‍රණ හා තාක්ෂණික සේවා, ජනතා සුභසාධනය හා සව්බල ගැන්වීම, සංචාරක, අධ්‍යාපනය, සංස්කෘතික, මුල් ළමාවිය අධ්‍යාපන කටයුතු සංවර්ධනය කිරීම සහ පළාතේ තොරතුරු තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම

**දැක්ම**

යහපත් සමාජයක්, සෞභාග්‍යමත් පළාතක්

## දිගුකාලීන අරමුණු

1.තිරසාර සංවර්ධනයක් කරා සමාජීය,ආර්ථික කටයුතු ඵලදායීව සහ කාර්යක්ෂමව ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම


2.ප්‍රමාණාත්මක හා ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනයක් ඇති කිරීම.

3.උතුරු මැද පළාතේ සංස්කෘතික උරුමයන් ආරක්ෂාකර ගනිමින් සංචාරක ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම.

## කෙටිකාලීන අරමුණු

1. පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම හා විධිමත් සංවර්ධනයක් තුළින් ජනතාවගේ දෛනික කටයුතු පහසු කිරීම.
2. ජනතාවගේ සමාජ සංවර්ධනය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා අධ්‍යාපන සංවර්ධනය තහවුරු කිරීම.
3. පළාතේ තරුණ තරුණියන් සම්පතක් ලෙස සලකා ඒකාබද්ධ සංවර්ධනයට වැඩි දායකත්වයක් ලබාගත හැකිවන පරිදි තරුණ සංවර්ධන වැඩසටහන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.
4. මාර්ග පද්ධතිය විධිමත්ව හා සංවිධානාත්මකව වැඩි දියුණු කිරීම තුළින් ජනතාවගේ කාර්යයන් පහසු කිරීම හා පළාත තුළ ඒකාබද්ධ සංවර්ධනයට ඉඩකඩ සැකසීම.
5. රටේ ජීවනාලිය බඳු ළමා පරපුරේ අනාගතය ශක්තිමත් කිරීම සඳහා පූර්ව ළමා සංවර්ධන මධ්‍යස්ථාන නගා සිටුවීම.
6. පළාත් සාම්ප්‍රදායික සංස්කෘතික සාරධර්ම ආරක්ෂාකර ගැනීම හා වර්තමාන පරම්පරාව ඒ පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම තරුණ තරුණියන්ගේ සෞන්දර්යාත්මක හැකියාවන් වර්ධනය කිරීම.
7. අධික විදුලි අවශ්‍යතාවයන්ට පිළියම් වශයෙන් විකල්ප බලශක්ති ක්‍රම හඳුන්වාදීම.
8. සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරීම උදෙසා විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීම හා සංචාරක ගම්මාන ඇති කිරීම සඳහා පහසුකම් සැලසීම.

## ප්‍රධාන කාර්යයන්




### ප්‍රධාන උපාය මාර්ගයන්.

- නීතිය හා සාමය පවත්වා ගැනීමට පළාත් සභාව සියළු ආරක්ෂක අංශ ඒකාබද්ධව ක්‍රියාත්මක වීම.
- පළාත් පාලනය ආයතන පරිපාලනය කිරීම හා මූල්‍ය පාලනය සඳහා මාසික,ත්‍රෛමාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
- පළාතේ ජන ජීවිතය යථාවත් කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය.
- ආර්ථික සමාජීය යටිතල පහසුකම් සංවර්ධනය.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- අධ්‍යාපන සංවර්ධනය.
- යහපාලනය

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු





**4** පරිපූර්ණ ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරිම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම.




**5** ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම.




**7** සංචාරක ප්‍රවර්ධන කටයුතු තුළින් රැකියා විරහිත ඔබට අභිමානවත් වෘත්තියකට විශිෂ්ඨ පුහුණුවක් ලබා දීම.





**8** සංචාරක ප්‍රවර්ධන කටයුතු තුළින් රැකියා විරහිත ඔබට අභිමානවත් වෘත්තියකට විශිෂ්ඨ පුහුණුවක් ලබා දීම.




**9** සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම..

### කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අ.අ | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 111 |
| 2 | සේවයේ නියුතු | 71 |
| 3 | පුරප්පාඩු | 40 |
| 4 | අනියම් | 01 |




### පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 62.63 | 50.63 | 12.00 | 80.84 |
| ගමන් වියදම් | 7.11 | 5.15 | 1.97 | 72.43 |
| සැපයීම | 10.42 | 8.05 | 2.37 | 77.26 |
| නඩත්තු වියදම් | 8.50 | 5.29 | 3.21 | 62.24 |
| ගිවිසුම්ගත සේවා | 21.50 | 17.23 | 4.27 | 80.14 |
| මාරු කිරීම් | 114.29 | 113.83 | 0.46 | 99.60 |
| එකතුව | 224.46 | 200.18 | 24.28 | 472.50 |

## මුලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| 1.ගොඩනැගිලි සහ ඉදි කිරීම | 27.00 | 17.42 | 9.58 | 64.51 |
| 2.යන්ත්‍ර සූත්‍ර සවි කිරීම හා උපකරණ | 1.50 | 0.14 | 1.36 | 98 |
| 3.වෙනත් මුලධන වත්කම් පුනරාවර්තන හා වැඩි දියුණු කිරීම | 2.00 | 0.70 | 1.30 | 35 |
| **එකතුව** | **30.50** | **18.26** | **12.24** | **59.36** |

## කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

**පළාතේ ග්‍රාමීය ජනතාවගේ ආදායම් උත්පාදන අවස්ථා ජනිත කිරීම සඳහා දායකත්වය 2018**

*ව්‍යාපෘතියේ අරමුණු :-*

- ✶ පළාතේ T.J.C අඹ නිෂ්පාදනය වැඩි කිරීම.
- ✶ වැඩි පාර්ශවකරුවන් ප්‍රමාණයක් අඹ වගාව සඳහා යොමුකරලීම.
- ✶ නිෂ්පාදනයන්ගෙන් වැඩි ප්‍රමාණයක් දේශීය හා විදේශීය වෙළඳපොල වෙත යොමුකරලීම.
- ✶ පළාතේ ආන්ත්‍රික ඉඩම්වලින් වැඩි ප්‍රමාණයක් අඹ වගා කිරීම සඳහා යොදා ගැනීම.
- ✶ පළාතේ වාණිජ බෝග වගාව ප්‍රචලිත කිරීම.



ව්‍යාපෘතියේ පළමු අදියර 2015 වර්ෂයේ ආරම්භ කළ අතර අක්කර 289.88ක අඹ වගාකර ඇත.ප්‍රතිලාභීන් ගණන 521කි.ඒ සඳහා රු. 8 ,889 ,950.50 ක් වැය කරන ලදි.වගා කටයුතු සඳහා පුහුණු වැඩසටහන් හා උපදේශකත්වය සපයන අතර වගාව කප්පාදු කිරීමට අවශ්‍ය උපකරණ ද ලබා දීම.මේ සඳහා වෙන් කරන ලද මුදල රු. 6,308 ,132.00 කි.

2017/2018 වර්ෂ ව්‍යාපෘතියේ දෙවැනි අදියර යටතේ අක්කර 203.25 ක ප්‍රතිලාභීන් 301 ක් අඹ වගා කර ඇත.වගා කටයුතු සඳහා පුහුණු වැඩසටහන් හා උපදේශකත්වය සපයන අතර වගාව කප්පාදු කිරීමට අවශ්‍ය උපකරණ ලබා දී ඇත.2018 වර්ෂය සඳහා පසුගිය වර්ෂ වලදී ක්‍රියාත්මක වූ TJC අඹ වගා ව්‍යාපෘති පාර්ශවකරුවන්ගේ ධාරිතා සංවර්ධනය හා වගාව සම්බන්ධයෙන් මෙහෙයුම් හා අධීක්ෂණ කටයුතු සිදුකිරීම වෙනුවෙන් රු. 600,000ක මුදලක් වෙන් කරඇත.

2015/2016 සහ 2017/2018 වර්ෂ වල TJC අඹ වගා ව්‍යාපෘතියේ පාර්ශවකරුවන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් පළාත් සභා ශ්‍රවණාගාරයේදී 2018.12.27 දින පවත්වන ලදී.

## සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා පළාතේ දායකත්වය

**01.** සංචාරක මාර්ගෝපදේශකයින් පුහුණු කිරීම තුළින් දෙස් විදෙස් සංචාරකයින් සඳහා නිවැරදි හා ගුණාත්මක බවින් යුත් තොරතුරු ලබාදීම.

**02.** සංචාරක සත්කාරක සේවා පුහුණු වැඩසටහන යටතේ පුහුණු පාඨමාලා පිළිබඳ දැනුවත් කර හෝටල් ක්ෂේත්‍රයේ විදේශීය රැකියා සඳහා පළාතේ තරුණ තරුණියන් යොමු කිරීම.

**03.** ප්‍රංශ භාෂා පුහුණු වැඩසටහන යටතේ විදේශ භාෂා පුහුණු ලබාදීම තුළින් විවිධ ක්ෂේත්‍රයන්හි විදේශීය රැකියා අවස්ථාවන් සඳහා පළාතේ තරුණ තරුණියන් යොමු කිරීම.

**04.**සංචාරක කර්මාන්තයේ නියැලි සිටින විවිධ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ මාධ්‍යයන් ක්‍රියාත්මක කිරීම තුළින් ගුණාත්මක සංචාරක කර්මාන්තයක් පළාත තුළ ඇති කිරීම.

**05.** සංචාරක කර්මාන්තයට සම්බන්ධ පර්ශවකරුවන් පුහුණු කිරීම හා ධාරිතා සංවර්ධනය

### 2017-2018 වර්ෂවල දී සංචාරක අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන වලින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති.

හබරණ සංචාරක තොරතුරු මධ්‍යස්ථානය ඉදිකිරීම ක්‍රියාත්මක වෙමින් පවතින විශේෂ ව්‍යාපෘතියකි

**වෙන් කල මුදල - රු.මි.600**

**වැයකල මුදල - 2017 - රු.මි.165**

**2018 - රු.මි.206**

දෙස් විදෙස් සංචාරකයින්ගේ නෙත ගැටෙන ආකර්ෂණීය ස්ථාන බොහෝමයකින් සමන්විත අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක මෙන්ම දඹුල්ල, සීගිරිය, මාතලේ ඓතිහාසික නගර හා වන අලින් පහසුවෙන් දැකගත හැකි මින්නේරිය,කවුඩුල්ල වන රක්ෂිත මෙන්ම ත්‍රිකුණාමලය ආකර්ෂණීය වෙරළ තීරය යනාදී ලංකාවේ ප්‍රධාන සංචාරක ස්ථානයන්හි කේන්ද්‍රස්ථානයක් ලෙස හබරණ නගරය ඉතා වැදගත් ස්ථානයක් හිමිකර ගනී. අනුරාධපුරය හා පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙක මැද පිහිටි හබරණ නගරය දඹුල්ල,මහනුවර,මාතලේ අළු විහාරය හා කොළඹ හා අනෙකුත් ප්‍රදේශ සම්බන්ධ කිරීම මෙන්ම සංචාරකයින්ගේ ආකර්ෂණය දිනා ඇති ත්‍රිකුණාමලය හා උතුර යා කරන සංදිස්ථානයක් වීම ද හබරණ නගරයේ ඇති විශේෂත්වයකි.විශේෂයෙන් ලංකාවේ සංචාරය සඳහා පැමිණෙන විදේශීය සංචාරකයාන් මෙන්ම දේශීය සංචාරකයින් ද වැඩි වශයෙන් මෙම ප්‍රදේශවල සංචාරය කරනු ලබයි.



## ලෝක සංචාරක දින ප්‍රදර්ශණය - 2018
**මෙහෙයවීම :- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**
**උතුරු මැද පළාත් ප්‍රදර්ශණ කුටිය**

2018 වර්ෂයේ ලෝක සංචාරක දිනය **'සංචරනය හා ඩිජිටල් පරිවර්තන'** යන තේමාව යටතේ පුරා දින03ක් යාපනයේ දී පැවැත්වූ අතර මෙම ප්‍රදර්ශණය සංචාරක හා ක්‍රිස්තියානි කටයුතු අමාත්‍යාංශය හා සංචාරක සංවර්ධන අධිකාරිය එක්ව සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියකි.

### සංචාරක ප්‍රවර්ධන කටයුතු හා පුහුණු වැඩසටහන්

- **සංචාරක** ක්ෂේත්‍රයේ කර්මාන්තකරුවන් හා රැකියාවල නියුතු වූවන්ගේ ධාරිතා සංවර්ධන පුහුණුවක් පොලොන්නරුව දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ලදි.
- ඒ සඳහා මෙම ක්ෂේත්‍රයේ කටයුතු කරන පාර්ශවකරුවන් 65 දෙනෙකු දින 03ක් පමණ සංචාරක කර්මාන්තය පිළිබඳ මූලික දැනුවත් කිරීම් රජරට විශ්වවිද්‍යාලය සංචාරක පීඨය කථිකාචාර්යවරුන් විසින් දේශන පවත්වන ලදි.මේ සඳහා සංචාරක අමාත්‍යාංශය මූල්‍යමය ප්‍රතිපාදන ලබාදෙන ලදි.





### ශ්‍රී ලංකා ගුවන් හමුදා අනුරාධපුර කඳවුරේ ගුවන් ගමන් පර්යන්තය වැඩිදියුණු කිරීම.

වෙන් කල මුදල - රු.මි.30607360.37

වැයකල මුදල - රු.මි.

උතුරු මැද පළාතේ සංචාරක කර්මාන්තය සංවර්ධනය හා ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.

- සංචාරකයන්ගේ ප්‍රවර්ධනයට ඉවහල් වන විස්තර පත්‍රිකා මාර්ග උපදේශන සංග්‍රහන අලෙවිය සඳහා පහසුකම් ලබා දි උ.මැ.ප. සංචාරක ප්‍රවර්ධනය සඳහා සහයෝගය ලබා දීම.
- මෙම ගුවන් ගමන් පර්යන්තය ඓතිහාසික අනුරාධපුර පුරවරයට ගුවන් මගින් පැමිනෙන විදේශීය සංචාරකයන්ගේ ප්‍රධාන සහ එකම දොරටුව වන අතර අනුරාධපුර නගරයෙහි ඇති ඓතිහාසික බව හා පෞරාණිකත්වය සම්බන්ධයෙන් නගරයට පිවිසීමට පෙර අවබෝධයක් ලබාදිය හැකි අනගි ස්ථානයකි. ඒ සම්බන්ධයෙන් විදේශීය සංචාරකයන් දැනුවත් කිරීම.

- ❖ ගුවන් ගමන් පර්යන්තය මගින් සංචාරක ව්‍යාපාරයට යොදා ගත හැකි අතර එමගින් දැනට පවතින සංචාරකයන්ගේ පැමිණීමට වඩා වැඩි ප්‍රමාණය ගුවන් මගින් පෞද්ගලික ගුවන් සමාගම් හරහා ගෙන්වා ගැනීම දිගුකාලීන අරමුණු අතර ප්‍රධාන තැනක් ගනී.




- ❖ ශ්‍රී ලංකා ගුවන් හමුදා අනුරාධපුර කඳවුරේ ගුවන් ගමන් පර්යන්තයේ වැඩිදියුණු කිරීමට අපේක්ෂිතය.

### ජීවිතාරක්ෂක පුහුණු වැඩ සටහන

උතුරු මැද පළාතේ පිහිනීමේ හැකියාවන් ඇති තරුණ තරුණියන් හා සංචාරක ගෙවල් තුල පිහිණුම් තටාක තුළ සේවය කරන ජීවිතාරක්ෂකයින්ගේ තත්වය වැඩි දියුණු කර ගැනීමේ අරමුණින් I.L.S. ජාත්‍යන්තර ජීවිතාරක්ෂක පිහිනුම් තටාක සහතික පාඨමාලාවන් පවත්වන ලදී. ඒ සඳහා 53 දෙනෙකු සහභාගි වූ අතර දින 06 ක් පමණ පවත්වන ලදී. එම පුහුණුව න්‍යායාත්මක හා ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලින් යුත් ජාත්‍යන්තර මට්ටමේ පුහුණුකරුවන් විසින් පවත්වන ලදි. ඒ සඳහා සම්පත් දායකත්වය ලබා දෙනු ලැබුයේ ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමය මගිනි. එම පුහුණුව අවසන් කරන පුහුණු ලාභීන් සඳහා දේශිය හා විදේශීය රටවල පිහිනුම් තටාක , ජීවිතාරක්ෂක රැකියා ලබා ගැනිම සඳහා සුදුසුකම් සපුරා ගත හැකි පුහුණු වැඩසටහනකි.



### ප්‍රජා සංචාරක ගම්මාන වැඩසටහන (Home Stay)

සංචාරක කර්මාන්තයේ එක් අංගයක් වන ප්‍රජා සංචාරක ක්‍රියාකාරකම් හා ව්‍යාපෘතීන් ගම් මට්ටමින් එළි දැක්වීමත් , ශ්‍රී ලාංකීය ගැමි සංස්කෘතික විභූතිය සංචාරකයින්හට අත්දැකීම් ලබා ගැනිමටත්, අපගේ සංස්කෘතිය විදීමට අවස්ථාව ලබාදීමේ අරමුණින් ගෘහස්ථ සංචාරක වැඩසටහන විල්පත්තුව (හුණුවිලගම) ප්‍රතිලාභින් 17 දෙනෙකු සහභාගිත්වයෙන් ආරම්භ කරන ලදි.

2018 වසර තුළ ඔවුන්ගේ ආකල්ප සංවර්ධන පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කළ අතර 2019 වසර තුළදී ප්‍රතිලාභින් සඳහා අවශ්‍ය මූල්‍ය හා භෞතික ප්‍රතිලාභ ලබා දීමට කටයුතු සංවිධානයකර ඇත. ඒ සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හා සංචාරක අමාත්‍යාංශය සම්බන්ධ වී ඇත.

### ලෝක සංචාරක දින සැමරුම 2018

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංචාරක ක්ෂේත්‍රයේ නියැලී සිටින පාර්ශවකරුවන්ගේ එකමුතුව හා ඔවුන්ගේ ධාරිතාවන් සංවර්ධනය කිරීමේ අරමුණින් ලෝක සංචාරක දින සැමරුම් උත්සවය උතුරු මැද පළාත් සභා ශ්‍රවණාගාරයේදී 2018/09/27 වන දින පවත්වන ලදී. මේ සඳහා පාර්ශවකරුවන් 600කට අධික පිරිසක් හා සංචාරක ක්ෂේත්‍රයේ සේවා සපයන ආයතනවල නියෝජිතයකු සහභාගී විය. එහිදී එම උත්සවය වර්ණවත් කිරීම සඳහා අංගම් හරබ සංදර්ශනයක් හා උඩරට පහතරට සබරගමුව නැටුම් සංදර්ශනයක් පවත්වන ලදී. තවද, හෝටල් හිමියන්ගේ සහභාගිත්වයෙන් රථ වාහන පෙළපාලියක් උතුරු මැද පළාත් සභා ශ්‍රවණාගාරයේ සිට නගරය වටා ගොස් නැවත එම ස්ථානයට පැමිණීම එහි විශේෂ අංගයක් බවට පත්විය.

### ධාරිතා සංවර්ධන පුහුණු - 2018

සංචාරක අමාත්‍යාංශයේ මූල්‍ය දායකත්වය මත සංචාරක ක්ෂේත්‍රයේ නියැලී සිටින පාර්ශවකරුවන්ගේ දැනුම , කුසලතා හා ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් මෙම වැඩසටහන තෙදිනක් පුරා අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පවත්වන ලදී. එහිදී රජරට විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරුන්ගේ හා සංචාරක සේවා සපයන ආයතනවල ප්‍රධානීන්ගේ අදහස් හා දැනුම පාර්ශවකරුවන් අතර බෙදාගන්නා ලදි. මේ සඳහා පාර්ශවකරුවන් 65 දෙනෙකු සහභාගී විය.



### ප්‍රාදේශීය සංචාරක මාර්ගෝපදේශන බලපත්‍රයක් ලබා දීම

සංචාරක කරමාන්තයට සම්බන්ධ පාර්ශවකරුවන් පුහුණු කිරීම හා ධාරිතා සංවර්ධනය යටතේ සංචාරක කර්මාන්තයට සම්බන්ධ පුද්ගලයන්ට හා සම්බන්ධ වීමට අපේක්ෂිත පුද්ගලයින් හට ප්‍රාදේශීය සංචාරක මාර්ගෝපදේශන බලපත්‍රයක් ලබා දීම.

වෙන්කල මුදල - **1,000,000.00**

වැයකල මුදල - **986,368**

## පුනර්ජනනීය බලශක්ති භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

**2015 වර්ෂයේ දී ග්‍රාමීය ප්‍රදේශවල මංසන්ධි ආශ්‍රිතව සියලුම පළාත් පාලන කොට්ඨාශ ආවරණයවන පරිදි විජී ලාම්පු 58ක් ස්ථාපිත කිරිම.**

**2016 වර්ෂයේ දී සංචාරක ආකර්ශනිය ස්ථානවල සහ වෙනත් විශේෂිත ස්ථානවල විජී ලාම්පු 160ක් ස්ථාපිත කිරිමට කටයුතු කරමින් පවතී.**

**2017 වර්ෂයේ දී 41ක් විජී ලාම්පු ස්ථාපිත කරන ලදි.**

**2018 වර්ෂයේ දී 125 ක් විජී ලාම්පු ස්ථාපිත කරන ලදි.**

### පළාතේ පාසල් සංවර්ධනය උදෙසා "හොඳම පාසල ළඟම පාසල"

පාසල් පද්ධතිය තුළ තිබෙන භෞතික අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමේ අරමුණින් රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහයෝගය මත පළාත් ප්‍රධාන අමාත්‍යාංශය හොඳම පාසල ළඟම පාසල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

| විස්තරය | ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන | 2018 සඳහා වෙන් කිරීම් | මූල්‍ය ප්‍රගතිය 12/30 දිනට |
|---|---|---|---|
| පාසල්වල කුඩා නවීකරණ කටයුතු - පාසල් (461) | 615.61 | 250.32 | 155.23 |
| පාසල්වල ප්‍රධාන නවීකරණ කටයුතු-පාසල් (100) | 424.07 | 233.6 | 121.02 |
| ප්‍රාථමික ඉගෙනුම් ආධාරක මධ්‍යස්ථාන (Single Stored - පාසල් 54) | 689.68 | 535.67 | 170.95 |
| ප්‍රාථමික ඉගෙනුම් ආධාරක මධ්‍යස්ථාන (Double Stored - පාසල් 12) | 337.82 | 259.11 | 69.25 |
| පන්ති කාමර ගොඩනැගිලි ඉදිකිරීම - (පාසල් 36) | 1,450.22 | 967.95 | 441.61 |
| විදුහල්පති නිල නිවාස ඉදිකිරිම - (30) | 232.39 | 109.69 | 58.63 |
| ගුරු නිවාස ඉදිකිරීම් (22) | 402.46 | 205.39 | 87.61 |
| ද්විතියක විද්‍යාගාර ඉදිකිරිම - (42) | 909.26 | 578.14 | 256.03 |
| ආපනශාලා ඉදිකිරිම - (13) | 179.03 | 123.19 | 34.42 |
| ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම - (08) | 204.80 | 185.2 | 7.14 |
| සෞන්දර්ය ඒකක ඉදිකිරිම - (04) | 164.73 | 109.79 | 25.98 |
| තාක්ෂණික ගොඩනැගිලි ඉදිකිරිම - (32) | 678.04 | 543.39 | 169.02 |
| සනීපාරක්ෂක ඒකක ලබාදීම - (331) | 397.71 | 110.01 | 65.83 |
| ජල පහසුකම් ලබාදීම - (75) | 20.78 | 17.41 | |
| විදුලි පහසුකම් ලබාදීම - (810) | 173.51 | 115.7 | 31.12 |
| පාසල් දන්ත වෛද්‍ය ඒකක ඉදිකිරිම - (03) | 36.07 | 14.40 | 5.12 |
| පාසල් දන්ත වෛද්‍ය ඒකක නවීකරණය කිරීම - (06) | 8.75 | 4.60 | 0.2 |
| එකතුව | **6,585.49** | **6481.45** | **1956.73** |

### පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ පළාත් පාසල් සංවර්ධනය - 2018

උතුරු මැද පළාතේ පාසල් 814ක් ස්ථාපිත ඇති අතර, සමස්ත පාසල් පද්ධතියේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක සංවර්ධනය සඳහා 2018 වර්ෂයේ දී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ පහත පරිදි රු.මිලියන 823.8ක ප්‍රතිපාදන මුදලක් වෙන්කර තිබුණි.

01. පාසල් ගොඩනැගිලි සංවර්ධනය රු.මිලියන 298.3

02. පළාතේ තෝරාගත් පාසල් අංග සම්පූර්ණ පාසල් ලෙස සංවර්ධනය කිරීම රු.ම. 176.5

03. ප්‍රාථමික පාසල් ගොඩනැගිලි සංවර්ධනය සඳහා රු.මි. 124

04. අඩක් නිමකළ පාසල් ගොඩනැගිලි සංවර්ධනය සඳහා රු.මි. 148.7

05. කාර්යාල ගොඩනැගිලි සංවර්ධනය සඳහා රු.මි. 16.7

06. වැට මායිම් නිරවුල් කිරීම සඳහා රු.මි. 2.3



### දිරිය සහන වැඩසටහන

උතුරු මැද පළාතේ ජනතාවගේ ජීවනෝපාය ඉහළ නැන්වීම සඳහා උතුරු මැද පළාතේ ස්වයං රැකියාලාභීන් සහ කුඩා පරිමාන නිෂ්පාදකයින් සවිබල ගැන්විමේ අරමුණින් දිරිය සහන වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ යටතේ නව ස්වයං රැකියා සඳහා ජනතාව පෙළඹවීම හා දැනට ස්වයං රැකියාවක නියුතුව සිටින ජනයාගේ ආදායම් තත්වය ඉහළ නැන්විම තුලින් ආර්ථික මට්ටම ඉහළ නැන්වීමට නියමිතයි.මෙම අරමුණු පෙරදැරිව 2015 වර්ෂයේදී ආරම්භ කළ දිරිය සහන වැඩසටහන 2018 වර්ෂයේදීද ක්‍රියාත්මක විය.

## දිරිය සහන ව්‍යාපෘතියේ ප්‍රගතිය - 2018

| ක්‍රියාත්මක කළ පුහුණු වැඩසටහන | සහභාගීත්වය | මුල්‍ය පිරිවැය | |
|---|---|---|---|
| කර්මාන්ත පදර්ශය හා පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම.මූලික (රුසුවීම) | 300 | 67,080.00 | |
| ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 100 | 47,400.00 |  |
| මහන මැෂින් අලුත්වැඩියාව(නොර්මල් මැෂින්, ජුකි මැෂින්,ඕවලොක් මැෂින්) | 90 | 72,551.00 |  |
| තිර රෙදි නිර්මාණය හා මදුරු දැල් මැසීම | 100 | 73,977.00 |  |

| | | | |
|---|---|---|---|
| මැහුම් මූලික දැණුම හා ළදරු ඇඳුම, පෙයාඩ් සාය, බලවුසය, සුදු ගවුම | 20 | 19,470.00 |  |
| බෑග් නිෂ්පාදනය | 15 | 203,787.39 |  |
| මංගල සාරි ජැකට් | 20 | 70,455.00 |  |

| | | | |
|---|---|---|---|
| පාවහන් නිෂ්පාදනය | 15 | 232794.60 |  |
| රූපලාවන්‍ය වැඩසටහන | 20 | 465940.00 |  |
| බොන්සායි හා ඕකිඩ් වගාව පුහුණුව | 55 | 54,955.00 |  |

**ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා දායකත්වය.**

2018 වසරේ දි ක්‍රියාත්මක කරනු ලැබුවේ 99% ම අවිච්ඡේද ව්‍යාපෘතින්ය. මේ යටතේ ප්‍රධාන වශයෙන් ,ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය, හුදකලා හා පසුගාමි ගම්මාන සංවර්ධනය, ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය මුලික කර ගනිමින් ව්‍යාපෘතින් ක්‍රියාත්මක කරන ලදී.

- ග්‍රාමීය මාර්ග වැඩි දියුණු කිරිම
- ඇල මාර්ග නවිකරණය කිරිම
- කුඩා පාලම් ඉදිකිරිම
- ජල ව්‍යාපෘති
- ග්‍රාමීය මට්ටමේ පොදු ගොඩනැගිලි ඉදිකිරිම්
- විදුලිය ලබා දිම්
- ක්‍රිඩා පිටි සංවර්ධනය කිරිම
- පාසල් අලුත්වැඩියා කටයුතු

ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය යටතේ දිඹුලාගල අරුණපුර R.O. පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා කාමරයක් ඉදිකිරීම, නොච්චියාගම හල්මිල්ලකුලම පානීය ජල ළිඳ ඉදිකිරීම, දිඹුලාගල 241 අරුණපුරගම වසමේ RO පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා කාමරය ඉදිකිරීම , නොච්චියාගම ඔත්තප්පුව පාසලේ පානීය ජල ව්‍යාපෘතිය , තමන්කඩුව ට්‍රැක් 26 දමන ගැමුණුපුර මාර්ගය මීටර් 100ක් කුට්ටිගල් ඇතිරීම, මැණික් ඇල - බෝගස් වැව මාර්ගය හා නුවරගල - පහල යක්කුරේ මාර්ගය ඉදි කිරීම යන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.


දමන ගැමුණුපුර මාර්ගය


මැණික් ඇල බෝගස්වැව මාර්ගය


නොච්චියාගම ඔත්තප්පුව පානීය ජල ව්‍යාපෘතිය


නුවරගල පහළ යක්කුරේ මාර්ගය

**කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස**

විශේෂයෙන්ම පළාතේ අධ්‍යාපන අංශයේ සංවර්ධනය සඳහා පැවැති භෞතික මෙන්ම මානව සම්පත් අවශ්‍යතා 2018 වර්ෂය තුළ දී සැලකිය යුතු මට්ටමකින් සම්පූර්ණකර ගැනීමට හැකි විය.එහිදි පාසල් ගොඩනැගිලි, පන්ති කාමර අවශ්‍යතා, විද්‍යාගාර අවශ්‍යතා ආදි පාසල් පද්ධති යේ සංවර්ධනය උදෙසා භෞතික අවශ්‍යතා සම්පූර්ණ කිරීමට හැකි විය.

එසේම පළාත් රැකියා විරහිත ජනතාව සඳහා ස්වයං රැකියා අත්වැලක් සැපයීම සඳහා දිරිය සහන වැඩ සටහන යටතේ විවිධ ධාරිතා සංවර්ධන වැඩසටහන් ද වගාව සඳහා භාවිතා නොකළ ඉඩම්වල ආර්ථික වගාවක් ලෙස ටොම් ජේ සී අඹ වගා ව්‍යාපෘතිය ද කැපී පෙනේ.

එමෙන්ම,සංචාරක, අධ්‍යාපන,පූර්ව ළමාවිය, නිවාස ,ග්‍රාමීය යටිතල පහසුකම් සැපයීම යන ක්ෂේත්‍රයන්හී සංවර්ධනය උදෙසා 2018 වර්ෂයේ දී දායකත්වය සැපයිණි.

# 6.1. පළාත් පාලන දෙපාර්තමේන්තුව

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

මහජන සෞඛ්‍ය, පොදු මංමාවත්, උපයෝගිතා සේවා විධිමත් කිරිම, පාලනය කිරිම, පරිපාලනය කිරිම තුළින් සුබ විහරණය හා පහසුකම් සුහසාධනය ආරක්ෂා කිරිම වැඩි දියුණු කිරිම අරමුණු කර ගනිමින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්තාවේ 9 වන උපලේඛනය අනුව පළාත් ආයතන පිහිටුවා ඇත.

ඒ අනුව පළාත් පාලන ආයතනයක් යනු නෛතික පුද්ගලභාවයක් ඇති ,අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් සහිත, ආයතනය නමින් නඩු පැවරිමට හා නඩු පැවරිමකට යටත්ව දේපල අත්පත්කර ගැනීම , දැරිම බැහැර කිරිම හා ගිවිසුම්වලට එළඹීමට හැකි ආයතනයක් ලෙස ක්‍රියාත්මකව පවති. මේ සඳහා මහනගර සභා පනතේ 34 (1) (2), නගර සභා පනතේ 31 හා ප්‍රාදේශීය සභා පනතේ (2)92) වගන්ති වලින් ප්‍රතිපාදන සැලසී ඇත.

ඉහත කාර්යයන් කාර්යය අධීක්ෂණය හා මෙහෙයවීම සඳහා උතුරු මැද පළාතේද පළාත් පාලන දෙපාර්තමේන්තුව හා පොළොන්නරුව සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය පිහිටුවා ඇත. එහි පළාත් පාලන කොමසාරිස්වරයෙකු හා සහකාර පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන් දෙදෙනෙකු පත්කර ඇති අතර එම කාර්යාල යටතේ පිහිටුවා ඇති පළාත් පාලන ආයතන 27ක් මගින් උතුරු මැද පළාතේ වෙසෙන ජනතාව වෙත සේවා සැපයීම් කරනු ලැබේ.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 19ක් ක්‍රියාත්මක වේ. ඒවා නම් අනුරාධපුර මහ නගරසභාව,පදවිය,කැබිතිගොල්ලෑව,කහටගස්දිගිලිය,හොරොව්පතාන,ගලෙන්බිඳුණුවැව,මිහින්තලේ, මැදවච්චිය, රඹෑව, තලාව, නොච්චියාගම, රාජාංගනය, කැකිරාව,තිරප්පනේ,ගල්නෑව,පලාගල,ඉපලෝගම , ම.නු.ප හා නැ.නු.ප යන ප්‍රාදේශිය සභා වේ. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ උප කාර්යාලය මගින් පළාත් පාලන ආයතන 09ක් පාලනය වේ. පොළොන්නරුව මහා නගර සභාව, ඇලහැර ප්‍රා දේශීය සභාව,හිඟුරක්ගොඩ,ලංකාපුර, මැදිරිගිරිය, දිඹුලාගල, වැලිකන්ද,පොළොන්නරුව ප්‍රා දේශීය සභා ලෙස මේවා ක්‍රියාත්මක වේ.

| විස්තරය | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| මහ නගර සභා | 1 | 1 | 2 |
| ප්‍රාදේශිය සභා | 18 | 7 | 25 |
| ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරු | 401 | 173 | 574 |

## ප්‍රාදේශිය සභා - අනුරාධපුර

| | | |
|---|---|---|
| 1. මිහින්තලේ | 8. ඉපලෝගම | 15. රාජාංගනය |
| 2. ගලෙන්බිදුනුවැව | 9. කහටගස්දිගිලිය | 16. නොච්චියාගම |
| 3. රඹෑව | 10. නැගෙනහිර නුවරගම් පළාත | 17. හොරොව්පොතාන |
| 4. කැබිතිගොල්ලෑව | 11. මධ්‍යම නුවරගම් පළාත | 18. පලාගල |
| 5. පදවිය | 12. කැකිරාව | |
| 6. ගල්නෑව | 13.තිරප්පනේ | |
| 7. මැදවච්චිය | 14. තලාව | |

## ප්‍රාදේශිය සභා - පොළොන්නරුව

| | |
|---|---|
| 1. ඇලහැර | 5. ලංකාපුර |
| 2. වැලිකන්ද | 6. පොළොන්නරුව |
| 3. මැදිරිගිරිය | 7. හිගුරක්ගොඩ |
| 4. දිඹුලාගල | |

## පළාත් පාලන මාර්ග

| ග්‍රාමීය මාර්ග | අනුරාධපුර (කි.මි) | පොළොන්නරුව (කි.මි) | එකතුව |
|---|---|---|---|
| තාර මාර්ග | 270 | 292 | 562 |
| බොරළු මාර්ග | 7,893.27 | 3,079.41 | 10,972.68 |
| කොන්ක්‍රීට් මාර්ග | 90.62 | 101.79 | 192.41 |
| කුට්ටිගල් මාර්ග | 90.52 | 191.40 | 281.92 |
| කාපට් මාර්ග | 639.30 | 61 | 700.30 |
| **එකතුව** | **8,983.71** | **3,728.60** | **12,709.32** |

## පළාත් පාලන පොදු පහසුකම්

| අනු අංකය | පොදු පහසුකම් වර්ගය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | පුස්තකාල | 66 |
| 2 | ප්‍රාදේශීය සභා ජල ව්‍යාපෘති | 152 |
| 3 | නල ළිං | 3899 |
| 4 | සුසාන භූමි | 1144 |
| 5 | ප්‍රජා ශාලා | 1036 |
| 6 | මාතෘ නිවාස | 229 |
| 7 | පොදු වෙළඳපල | 698 |
| 8 | ක්‍රීඩා භූමි | 428 |
| 9 | ගිනි නිවන මධ්‍යස්ථාන | 02 |
| 10 | පෙර පාසල් | 826 |
| 11 | උද්‍යාන | 24 |
| 12 | ආදාහනාගාර | 05 |
| 13 | සතිපොළ | 45 |
| 14 | ආයුර්වේද බෙහෙත් ශාලා | 29 |
| 15 | බටහිර බෙහෙත් ශාලා | 54 |
| 16 | උත්සව ශාලා | 44 |
| 17 | පිහිණුම් තටාක | 02 |
| 18 | ගිනි නිවන මධ්‍යස්ථාන | 02 |
| 19 | වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන | 33 |

### දැක්ම

"අවශ්‍යතා සපුරා ගත් තෘප්තිමත් ප්‍රජාවක්".

### මෙහෙවර

පළාත් පාලන ආයතනවල මිතුරෙකු, මගපෙන්වන්නෙකු, නියාමකයෙකු සහ දාර්ශනිකයෙකු වශයෙන් විනිවිද භාවයකින් යුතුව සමාජ හා ආර්ථික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, සේවා සැපයීම, කාර්යක්ෂම කිරීම සියළුම පාර්ශවකරුවන් අතර මනා සම්බන්ධතා ශක්තිමත් කිරීම මගින් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට සහය වීම.

### දිගු කාලීන අරමුණු

1. පළාත් පාලන ආයතනවල ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය.
2. පළාත් පාලන ආයතනවල සමාජ යටිතල පහසුකම් සංවර්ධනය.
3. පාර්ශවකරුවන් අතර මනා සම්බන්ධීකරණය.
4. ආයතනික ධාරිතා සංවර්ධනය.
5. යහ පාලනය ස්ථාපිත කිරීම.

### කෙටි කාලීන අරමුණු

1. පළාත් පාලන ආයතන වල මං මාවත් වැඩි දියුණු කිරීම.
2. කාර්යක්ෂම වෙළඳ පහසුකම් ඇති කිරීම.
3. ප්‍රජා ජල පහසුකම් වැඩි දියුණු කිරීම.
4. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා තිරසාර යාන්ත්‍රණයක් සැකසීම.
5. පොදු සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම.
6. පුස්තකාල පහසුකම් වැඩි දියුණු කිරීම.
7. පෙර පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය.
8. කාලීනව අතුරු ව්‍යවස්ථා පැනවීම.
9. පළාත් පාලන බල ප්‍රදේශවල සුසාන භූමි සංවර්ධනය.
10. පළාත් පාලන බල ප්‍රදේශවල ළමා උද්‍යාන, ක්‍රීඩා පිටි සංවර්ධනය.

11. පළාත් පාලන ආයතනවල සඵලතාවය හා කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම.
12. පළාත් පාලන ආයතන පුද්ගලික අංශය, මධ්‍යම රජය හා පළාත් සභාව අතර මනා සම්බන්ධතාවක් පවත්වා ගැනීම.
13. පළාත් පාලන ආයතනවල කාර්යක්ෂම මනා පුහුණුවකින් යුත් කාර්යය මණ්ඩල ස්ථාපිත කිරීම.
14. පළාත් පාලන ආයතන හරහා ක්‍රියාත්මක කර්මාන්ත අධීක්ෂණය.

## ප්‍රධාන කාර්යයන්

1. පළාත් පාලන ආයතනවලට තේරී පත්වූ මහජන නියෝජිතයින් පළාත් පාලන විෂය ක්ෂේත්‍රයෙහි දැනුවත් කිරීම හා මර්ගෝපදේශකත්වය ලබා දීම.
2. පළාත් පාලන ආයතනවල ශක්තීන් ගොඩනැගීම.
3. පළාත් පාලන ආයතනවල මූල්‍යම ශක්තීන් ගොඩනැගිම.
4. සම්බන්ධිකරණ කටයුතු.

## ප්‍රධාන උපායමාර්ගය

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන්, පළාත් පාලන ආයතන භාර විමර්ෂණ නිළධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් පළාත් පාලන ආයතන වල කටයුතු නිරීක්ෂණය හා අධීක්ෂණය.

## අංශය සෘජුව හා වක්‍රව නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු




2030 වනවිට ජලය එක්රැස් කිරිම,පිරිපහදු කිරිම, ජලය කාර්යක්ෂමව භාවිතා කිරිම,අප ජලය පිරිසිදු කිරිම,ප්‍රතිචක්‍රිකරණය, නැවත භාවිතා කිරීම සඳහා තාක්ෂණයද ඇතුළත්ව ජලය හා සනීපාරක්ෂක පහසුකම් පිළිබඳ වැඩසටහන් හා ක්‍රියාකාරකම් සංවර්ධනය කිරිම


2030 වනවිට අපද්‍රව්‍ය උත්පාදනය වීම වැළැක්වීම, අඩු කිරීම, ප්‍රතිචක්‍රිකරණය සහ ඒවා නැවත භාවිතා කිරිම මගින් අඩ කිරීම.

ජලය හා සනිපාරක්ෂක කටයුතු කළමනාකරණයේදී ප්‍රාදේශීය ප්‍රජාවගේ සහභාගීත්වය දිරිගැන්වීම සහ සහය ලබා දීම.

යටිතල පහසුකම් නිසි ප්‍රමිතියෙන් යුතුව සංවර්ධනය කිරීම

## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 124 |
| 2 | සේවයේ නියුතු | 65 |
| 3 | පුරප්පාඩු | 63 |
| 4 | අතිරික්ත | 04 |




## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්භාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2018 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 46.35 | 44.27 | 2.07 | 95 |
| ගමන් වියදම් | 1.74 | 1.68 | 0.06 | 96 |
| සැපයීම් | 3.93 | 3.90 | 0.03 | 99 |
| නඩත්තු වියදම් | 2.87 | 2.82 | 0.05 | 98 |
| ගිවිසුම් ගත සේවා | 2.89 | 2.72 | 0.18 | 94 |
| මාරු කිරීම් | 799.30 | 777.72 | 21.58 | 97 |
| **එකතුව** | **857.08** | **833.12** | **23.97** | **97** |

## මුලධන වියදම් - 2018


| වියදමේ ස්භාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2018 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 0.40 | 0.33 | 0.07 | 83 |
| වාහන | 0.80 | 0.77 | 0.03 | 96 |
| **එකතුව** | **1.20** | **1.10** | **0.10** | **92** |

## කාර්ය සාධන ඉලක්ක - 2018

| අ.අ | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 |
| 01 | පළාත් පාලන මාර්ග සංවර්ධනය | නවීකරණය කරන ලද හා අළුතින් ඉදිකරන ලද මාර්ග ප්‍රමාණය | 65 | 69 | 150 |
| 02 | ප්‍රජා ජල පහසුකම් ලබා දීම | ප්‍රජා ජල පහසුකම් සපයන ලද ස්ථාන ගණන | 03 | 01 | 02 |
| 03 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | ඝන අපද්‍රව්‍ය සම්බන්දයෙන් ස්ථාපිත කරන ලද මධ්‍යස්ථාන ගණන | 10 | 11 | 21 |
| 04 | වෙනත් සේවා | පුස්තකාල සේවා,ක්‍රිඩා පිටි සංවර්ධණය, පුජා භූමි සංවර්ධනය.පුජා බූමි සංවර්දනය, වෙනත් යටිලත පහසුකම් සංවර්ධනය කරන ලද ස්ථාන ගණන | 12 | 08 | 25 |

## 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය

| ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වයාපෘතිය | ව්‍යාපෘති සංඛ්‍යාව | වෙන් කළ මුදල (රු.මි) | වැය කළ මුදල (රු.මි) |
|---|---|---|---|
| ප්‍රාදේශීය සභා මාර්ග වැඩිදියුණු කිරිම<br>1.ප්‍රවේශ පහසුකම් වැඩි දියුණු කිරිම | 54 | 79.99 | 43.26 |
| වෙනත් පළාත් පාලන සේවා 1.යටිතල පහසුකම් සංවර්ධනය කිරීම<br>2. පුස්තකාලවල ගුණාත්මක භාවය වැඩි කිරිම<br>3. පෙර පාසල්වල පහසුකම් සංවර්ධනය කිරිම<br>4. සුසාන භූමි ආදාහනාගාර පහසුකම් ඇති කිරීම | 26 | 22.49 | 14.07 |
| ග්‍රාමීය ජනතාවට පිරිසිදු පානීය ජල පහසුකම් සැපයීම | 12 | 40.01 | 9.76 |
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණය<br>1. පෙර පාසල්වල පරිසරය සුරක්ෂිත කිරිම<br>**2.** සෞඛ්‍ය කම්කරුවන් සඳහා සායන පැවැත්විම | 10 | 20.00 | 8.55 |
| එකතුව | **102** | **162.49** | **75.64** |



**01.** පළාත් පාලන අංශයේ දියුණුව උදෙසා 2018 වර්ෂයේදී ප්‍රධාන සංරචක කිහිපයක් ඔස්සේ ආයෝජනය කර ඇත. ඒ යටතේ පළාතේ ප්‍රා දේශිය සභා පරිපාලනය යටතේ පවතින මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම කැපී පෙනේ. දිස්ත්‍රික්ක දෙකේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල සියල්ල ආවරණය වන පරිදි ප්‍රා දේශිය සභා මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති පනස් හතර (54)ක් ක්‍රියාත්මක විය. ඒ සඳහා රු.මි.43.26ක් වැය කර ඇත.

**02.** එසේම වෙනත් පළාත් පාලන සේවා සැපයීම යටතේ ව්‍යාපෘති විසි හය(26)ක් ක්‍රියාත්මක කර ඇති අතර එහි වැය රු.මි.14.07කි. මේ යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ පවතින මෙන්ම ප්‍රා දේශීය සබා යටතේ පාලනය වන පෙර පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ද ප්‍රාදේශීය සභා පුස්තකාලවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ද සනිපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීම ද සුසාන භූමි ආදාහනාගාර පහසුකම් වැඩිදියුණු කිරීමද සිදු විය.

**03.** ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවගේ අත්‍යාවශ්‍ය අවශ්‍යතාවයක් වන පිරිසිදු පානීය ජල පහසුකම් සැපයීම කෙරෙහි 2018 වර්ෂයේ අවධානය යොමු විය.ඒ යටතේ පානීය ජල ව්‍යාපෘති දොළහ(12)ක් ක්‍රියාත්මක කර ඇති අතර ඒ සඳහා වියදම රු.මි.7.6කි.

**04.** පළාත් පාලන විෂයපථය යටතට ගැනෙන ප්‍රධාන සංරචකයක්වන ඝන අපද්‍රව්‍ය කළමණාකරණය කෙරෙහි පළාත් පාලන ආයතන සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මේ යටතේ සිදු විය. ඒ යටතේ පළාත් පාලන ආයතන 26ක කසල කළමනාකරණය හා පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සෞඛ්‍ය කම්කරුවන් සඳහා සායන පැවැත්වීම,ප්‍රා දේශීය සභා 04ක් සඳහා බේල් යන්ත්‍ර ලබා දීම, ප්‍රා දේශීය සභා 07ක් සඳහා ගලි බවුසර් ලබා දීම, ප්‍රතිචක්‍රිකරණ කසල මිලදී ගැනීමේ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම හා කසල පිළිසරු මධ්‍යස්ථානවල අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම් වලට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක විය.ඒ සඳහා වැය වු මුදල රු.මි.8.55කි.

**03.** ඒ අනුව ඉහත සංරචක 04 යටතේ ව්‍යාපෘති 102ක් ක්‍රියාත්මක කර ඇති අතර ඒ සඳහා දරා ඇති මුළු වැය රු.මි 75.64 කි.

**වෙනත් රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති**

| පළාත් පාලන ආයතනය | අනුමත මුදල(රු.මි) | ගිවිසුම්ගත මුදල(රු.මි) |
|---|---|---|
| හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව | 31.65 | 31.37 |
| පොළොන්නරුව ප්‍රාදේශීය සභාව | 47.74 | 45.36 |
| වැලිකන්ද ප්‍රාදේශීය සභාව | 7.79 | 7.99 |
| පොළොන්නරුව මහනගර සභාව | 16.56 | 16.39 |
| **එකතුව** | **103.76** | **101.13** |

පළාත් පාලන හා ක්‍රිඩා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත තෝරාගත් ප්‍රාදේශීය සභා කිහිපයක අත්‍යාවශ්‍ය ප්‍රාදේශීය මාර්ග සංවර්ධනය කිරිම සිදු විය. ඒ සඳහා රු.මි.103.76ක් අනුමත වී තිබූ අතර රු.මි.101.13ක් ඒ සඳහා ගිවිසුම්ගත වී ඇත.

**පළාත් පාලන හා ක්‍රිඩා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ප්‍රාදේශීය සභා ශක්තිමක් කිරිමේ ජාතික වැඩ සටහන - 2018**

| අ.අ | පළාත් පාලන ආයතනය | ව්‍යාපෘතිය | 2017 වර්ෂයේ ව්‍යාපෘතිය සඳහා අනුමත මුදල(රු.මි) | 2018 දී තවදුරටත් අවශ්‍ය මුදල (අවිච්ඡේද මුදල) |
|---|---|---|---|---|
| 01 | ගලෙන්බිඳුණුවැව | ගලෙන්බිඳුණුවැව නගරයේ සති පොළ භූමිය හා වෙළඳ කුටි නවිකරණය කිරිම | 4.65 | 1.92 |
| 02 | කැබිතිගොල්ලෑව | පෙර පාසල් හා දිවා සුරකුම් මධ්‍යස්ථානය සඳහා පැරණි සභා ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරිම | 7.48 | 1.93 |
| 03 | හොරොව්පොතාන | හොරොව්පොතාන සති පොළ අළුත්වැඩියා කිරිම | 17.46 | 3.20 |
| 04 | රාජාංගනය | රාජාංගනය ප්‍රාදේශිය සභාව සඳහා 5 වන සැතපුම් කණුවේ සති පොළ පැත්තේ සාප්පු සංකීර්ණයක් අලුත්වැඩියා කිරිමේ ව්‍යාපෘතිය | 26.05 | 18.59 |
| 05 | මැදවච්චිය | ප්‍රාදේශිය සභාවට අයත් ළමා උද්‍යානය නවීකරණය කිරිම | 3.48 | 2.56 |
| 06 | ඉපලෝගම | මහ ඉලුප්පල්ලම ගබඩා සංකීර්ණය අළුත්වැඩියා කිරිම සහ පුනරුත්ථාපනය කිරිම | 19.49 | 4.62 |
| 07 | මිහින්තලය | මිහින්තලේ නගරයේ වෙළඳ මධ්‍යස්ථානය නවීකරණය කිරිම | 14.63 | 7.38 |
| | | එකතුව | **93.24** | **40.20** |

පළාත් පාලන හා ක්‍රිඩා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ප්‍රාදේශීය සභා ශක්තිමක් කිරිමේ ජාතික වැඩසටහන යටතේ උතුරු මැද පළාත් ප්‍රාදේශීය සභා විෂය සීමාවේ ඇති විෂයන් කිහිපයක අත්‍යාවශ්‍ය යෙන්ම ඉටු කළ යුතු සංවර්ධන කාර්යයන් සඳහා ප්‍රතිපාදන ලබාදී ඇත.

ඒ යටතේ ගලෙන්බිඳුණුවැව,හොරොව්පොතාන හා රාජාංගනය සති පොළ භූමිය හා වෙළඳ කුටි නවිකරණය කිරිම , දිවා සුරකුම් මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම, ළමා උද්‍යානය නවීකරණය කිරිම , මහ ඉලුප්පල්ලම හා මිහින්තලේ වෙළඳ මධ්‍යස්ථානය නවීකරණය කිරිම 2017 -2018 වර්ෂවලදී ක්‍රියාත්මක කර ඇත.

**පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ග්‍රාමීය ප්‍රදේශ වල මාර්ග කි.මී. 1000 ක් සංවර්ධනය කිරිමේ වැඩසටහන - 2018**

| පළාත් පාලන ආයතනය | ව්‍යාපෘතිය | 2017 වර්ෂයේ ව්‍යාපෘතිය සඳහා අනුමත මුදල(රු.මි) | 2018 දී තවදුරටත් අවශ්‍ය මුදල (අවිච්ඡේද මුදල) |
|---|---|---|---|
| රඹෑව | රත්මල්ගහ වැව ප්‍රධාන මාර්ගයේ සිට සියඹලාගස්වැව ගම හරහා නැවත අත්මල්ගහවැව ප්‍රධාන මාර්ගය දක්වා සංවර්ධනය කිරීම | 5.95 | 5.95 |
| කහටගස්දිගිලිය | කහටගස්දිගිලිය කිරලාගල පාර කාපට් කිරිම | 5.99 | 5.99 |
| | **එකතුව** | **11.94** | **11.94** |

**පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත පසුගාමී පළාත් පාලන ආයතන සංවර්ධන සහාය වැඩසටහන- 2018**

| පළාත් පාලන ආයතනය | ව්‍යාපෘතිය | 2017 වර්ෂයේ ව්‍යාපෘතිය සඳහා අනුමත මුදල(රු.මි) | 2018 දී තවදුරටත් අවශ්‍ය මුදල (අවිච්ඡේද මුදල) |
|---|---|---|---|
| මැදවච්චිය | සී.පි. නගරයේ පිත්තල බඩු හා අත්යන්ත්‍ර රෙදිපිළි අළෙවි කිරිමේ මධ්‍යස්ථානයක් ඉදිකිරිම | 4.67 | 1.34 |
| ගල්නෑව | ගල්නෑව නගරයේ නව වෙළඳ සංකීර්ණය ඉදිකිරිම | 14.91 | 6.71 |
| | **එකතුව** | **19.58** | **8.05** |

පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත පසුගාමී පළාත් පාලන ආයතන සංවර්ධන සහාය වැඩසටහන හා ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග කි.මී. 1000 ක් සංවර්ධනය කිරිමේ වැඩසටහන යන ව්‍යාපෘති 02 ම 2017 වසරේ ආරම්භ කර ක්‍රියාත්මක කළ ද ගෙවීම් කටයුතු 2018 වසරේදී සිදු කිරීමට අවශ්‍ය කටයුතු කරන ලදී. එසේම සෞඛ්‍ය කම්කරුවන්ගේ සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති මගින් කසල එක්රැස් කරන කටයුතුවල නිරත සියළුම සෞඛ්‍ය කම්කරුවන්ගේ හා පවුලේ සාමාජිකයින්ගේ සෞඛ්‍ය පරීක්ෂාවක් හා රෝග විනිශ්චය පරික්ෂාවක් සිදු කිරිම කරන ලදි. මෙම වැඩසටහන ඉතා සාර්ථක වැඩසටහනක් වූ අතර පළාත තුළ වෙසෙන වකුගඩු රෝගීන් හා බරපතල රෝග සහිත පුද්ගලයින් රාශියක් හඳුනා ගැනීමට හැකි වූ අතර ඔවුන්ට වෛද්‍ය ප්‍රතිකාර ලබා ගන්නා ලෙස දැනුවත් කර ඇත. මෙම ව්‍යාපෘතිය 2019 වර්ෂයේදි පළාත් පාලන ආයතන බලප්‍රදේශය තුළ හඳුනා ගන්නා ලද වෙනත් ස්ථානයක් පැවැත්වීම මගින් බල ප්‍රදේශය තුළ ජීවත් වන ග්‍රාමීය ජනතාවගේ රෝග පරීක්ෂාවන් ඉටුකර ගැනීමට අවස්ථාවක් ලබා දීමට අපේක්ෂිතය.

**ග්‍රාමීය ප්‍රදේශ වල මාර්ග කි.මී.1000ක් සංවර්ධනය කිරීම හා පසුගාමී පළාත් පාලන ආයතන සංවර්ධනය සහාය වැඩ සටහනේ ප්‍රගතිය 2017 – 2018**

| වැඩසටහන | ව්‍යාපෘති ගණන | අනුමත මුදල(රු.මි) | ගෙවා ඇති මුදල |
|---|---|---|---|
| ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග කි.මී.1000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන -2018 | 54 | 103.76 | බිල්පත් ඉදිරිපත්කර ඇත |
| පසුගාමී පළාත් පාලන ආයතන සංවර්ධනය සහාය වැඩසටහන -2017 | 02 | 8.05 | 12.36ක බිල්පත් ඉදිරිපත්කර ඇත |
| ග්‍රාමීය ප්‍රදේශ වල මාර්ග කි.මී.1000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන - 2017 | 02 | 11.94 | |
| **එකතුව** | **58** | **123.75** | **12.36** |

**පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කළ විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන වැඩසටහන - 2018**

2018 වර්ෂයේදී පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කළ විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන වැඩසටහන යටතේ පළාත් පාලන බලප්‍රදේශවල අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු කෙරෙහි අවධානය යොමු කළ හැකි විය.ඒ යටතේ සංවර්ධන ව්‍යාපෘති 55ක් ක්‍රියාත්මක කළ අතර රුපියල් මිලියන 30.92ක් වැය කර ඇත. ඒ යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘතින්හි ප්‍රගතිය

| සංවර්ධන කාර්යය | ව්‍යාපෘති ගනන | වෙන්කළ මුදල රු.මිලි | වැයකළ මුදල රු.මිලි | අතැති බිල් වටිනාකම රු.මිලි |
|---|---|---|---|---|
| සුසාන භූමි සංවර්ධනය | 55 | 50.92 | 30.92 | 8.66 |
| පානීය ජල ව්‍යාපෘති | | | | |
| ග්‍රාමීය මාර්ග සංවර්ධනය | | | | |
| වෙනත් අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු | | | | |

**කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස**

2018 වර්ෂය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව සඳහා වාර්ෂික විසර්ජන ගිණුමෙන් පහත පරිදි ප්‍රතිපාදන වෙන් කර තිබුණි.

**පුනරාවර්තන වියදම් - රු. මි.857**

**පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - රු.මි. 160**

**පළාත් සභා සංවර්ධන ප්‍රදාන - රු.මි 1.65**

**වෙනත් මූලධන වියදම් - රු.මි.54**

**2018** වර්ෂය තුළදී ලබා ඇති මූල්‍ය ප්‍රගතිය ලෙස වෙන් කර දෙන ලද පුනරාවර්තන ප්‍රතිපාදන වලින් රු.මි.833 ක් වියදම් දරා තිබුනි . එය වෙන්කරන ලද ප්‍රතිපාදනයෙන් 95% ක ප්‍රතිශතයකි. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වෙන්කර දී තිබූ රු.මි. 160 ක මුදලින් රු.මි.72 ක වියදම් දරා 45% ක ප්‍රගතියක් පෙන්වා දී ඇත. නමුත් වර්ෂ අවසානයේ දෙපාර්තමේන්තුව වෙත ලැබුණු අතැති බිල්පත් අනුව අක් මුදල් ලැබුනේ නම් 85% පමණ ප්‍රතිශතයකින් ප්‍රගතිය පෙන්වීමට හැකියාව තිබුණි. පළාත් සභා සංවර්ධන ප්‍රදාන යටතේ වෙන්කර දී තිබූ රු.මි.1.65 ක මුදලින් රු. මි.1.549 ක වියදම් දරා 97% ක මූල්‍ය ප්‍රගතියක් පෙන්වා දී ඇත. එසේම වෙනත් මූලධන වියදම් යටතේ වෙන්කර දී තිබූ රු.මි.54 න් රු.මි.54 ම වියදම් දරා 100% ප්‍රගතියක් පෙන්වා දී ඇත.ඒ අනුව පළාත් පාලන දෙපාර්තමේන්තුව සඳහා 2018 වර්ෂයේ ලබාදෙන ලද ප්‍රතිපාදන වලින් 95% ක පමණ සමස්ත මූල්‍ය ප්‍රගතියක් පෙන්වා ඇත.

**කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස ඉතිරි කොටස...**

| | ප්‍රධාන අරමුණ | නව | අඛණ්ඩ |
|---|---|---|---|
| 01. | පළාත් පාලන මාර්ග සංවර්ධනය | 26 | 23 |
| 02. | පානීය ජලය | 03 | 04 |
| 03. | ඝන අපද්‍රව්‍ය කළමනාකරනය | 09 | 01 |
| 04. | වෙනත් සේවා | 10 | 15 |
| 05. | රේඛීය අමාත්‍යංශ | 01 | 09 |
| 06. | වෙනත් රේඛීය අමාත්‍යංශ /දෙපාර්තමේන්තු යටතේ | 250 | |

ඒ අනුව නව වැඩ යටතේ පවතින ව්‍යාපෘතිවල 65% ක පමණ ප්‍රගතියක් පෙන්වා දී ඇති නමුත් ,අඛණ්ඩ ව්‍යාපෘවල 100% ප්‍රගතියක් පෙන්වා දී ඇත.

මානව සම්පත් පිළිබඳව සැලකීමේදී පළාත් පාලන දෙපාර්තමේන්තුව සඳහා අනුමත කාර්ය මණ්ඩලය 124 ක් වුවත් දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය වන්නේ 65කි. දෙපාර්තමේන්තුව සඳහා පැවරී ඇති කාර්යභාරය සමඟ අධීක්ෂණ මට්ටමේ රාජකාරී කටයුතු බොහෝසෙයින් අවශ්‍ය කාරණයක් වුවත් යම් යම් අවස්ථාවන්වලදී කාර්ය මණ්ඩලය හිඟකමින් එම අවස්ථාවන් මඟ හැරී යාම ගැටළුවට කරුණකි. ඉදිරියේදී පුරප්පාඩුව පවතින කාර්ය මණ්ඩලය සම්පූර්ණකර ගැනීම අත්‍යාවශ්‍යය.

2018 වර්ෂයේදී පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කළ විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන වැඩසටහන යටතේ පළාත් පාලන බලප්‍රදේශවල අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු කෙරෙහි අවධානය යොමු කරමින් සංවර්ධන ව්‍යාපෘති 55ක් ක්‍රියාත්මක කළ අතර රුපියල් මිලියන 30.92ක් වැය කර ඇත.

එසේ වුවද 2018 වර්ෂයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය සාධනය පිළිබඳව 2017 වර්ෂයට සාපේක්ෂව යහපත් මට්ටමක පවතී.

- මෙය හිස්ව තබන ලද පිටුවකි -

# 6.2. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මකවන ආයතන

1. පාසල්
2. කලාප අධ්‍යාපන කාර්යාල
3. කොට්ඨාස අධ්‍යාපන කාර්යාල
4. අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථාන
5. ගුරු සංවර්ධන මධ්‍යස්ථාන
6. පළාත් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන
7. පරිගණක සම්පත් මධ්‍යස්ථාන

## උතුරුමැද පළාත් පාසල් වර්ගීකරණය - 2018

| කලාපය | ජාතික පාසල් | පළාත් පාසල් | | | | එකතුව |
|---|---|---|---|---|---|---|
| | | 1AB | 1C | TYPE 2 | TYPE 3 | |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | | | | | | |
| අනුරාධපුර | 3 | 12 | 29 | 46 | 53 | 140 |
| කැකිරාව | 1 | 8 | 28 | 28 | 65 | 130 |
| තඹුත්තේගම | 1 | 8 | 11 | 26 | 27 | 72 |
| ගලෙන්බිදුණුවැව | 0 | 4 | 18 | 26 | 47 | 95 |
| කහටගස්දිගිලිය | 1 | 6 | 12 | 41 | 68 | 127 |
| **එකතුව** | **6** | **39** | **100** | **164** | **161** | **564** |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | | | | | | |
| පොළොන්නරුව | 1 | 9 | 8 | 15 | 22 | 54 |
| හිගුරක්ගොඩ | 3 | 9 | 9 | 26 | 50 | 94 |
| දිඹුලාගල | 0 | 7 | 16 | 17 | 63 | 103 |
| **එකතුව** | 4 | 25 | 33 | 58 | 135 | 251 |
| **මුළු එකතුව** | 10 | 64 | 133 | 222 | 396 | 815 |

1AB- අ.පො.ස(උ.පෙළ) විද්‍යා විෂය ධාරාව සහිත පාසල්
1C- අ.පො.ස(උ.පෙළ) පවතින නමුත් විද්‍යා විෂය ධාරාව නොමැති පාසල්
T2-පළමුවන ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ඇති පාසල්
T3- පළමුවන ශ්‍රේණියේ සිට 5 හෝ 8 ශ්‍රේණිය දක්වා ඇති පාසල්


## උතුරු මැද පළාතේ මූලික අධ්‍යාපන තොරතුරු

2018 වර්ෂයේදී පළාත් සභාව විවිධ මූලාශ්‍රයන්ගෙන් ලද ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් උතුරු මැද පළාත් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනය උදෙසා ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මකකල හැකි විය. උතුරු මැද පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවත් ඒ යටතේ ක්‍රියාත්මක කලාප අධ්‍යාපන කාර්යාල සහ කොට්ඨාස අධ්‍යාපන කාර්යාල සහ සමස්ත පාසල් පද්ධතියේ භෞතික හා මානව සම්පත් සංවර්ධනය මඟින් ගුණාත්මක අධ්‍යාපනයක්කරා උතුරු මැද පළාත ගෙනයාම මුඛ්‍ය පරමාර්ථය විය.

උතුරින් උතුරු පළාතටත්, නැගෙනහිරින් නැගෙනහිර පළාතටත්, බටහිරින් වයඹ පළාතටත්,දකුණින් මධ්‍යම පළාතටත් මායිම් වන රජරට නුවරකළාවිය හෙවත් වැව්බැඳි රාජධානිය ලෙස විරුධාවලිය ලද උතුරු මැද පළාත පරිපාලන දිස්ත්‍රික්ක දෙකකින් සමන්විත වේ.

පරිපාලන දිස්ත්‍රික්ක දෙකකින් සමන්විත උතුරු මැද පළාත අධ්‍යාපන කලාප 08 කින් යුක්ත වේ.අනුරාධපුර,කැකිරාව,තඹුත්තේගම,ගලෙන්බිඳුණුවැව හා කැබිතිගොල්ලෑව යන අධ්‍යාපන කලාප 05 අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් අතර පොළොන්නරුව,හිඟුරක්ගොඩ හා දිඹුලාගල යන අධ්‍යාපන කලාප 03 පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් වේ.

අධ්‍යාපන කලාප හා කොට්ඨාස පිහිටීම - උතුරු මැද පළාත




මෙම කලාප අධ්‍යාපන කාර්යාල 08 යටතේ අධ්‍යාපන කොට්ඨාස තිහක් පාලනය වන අතර,උතුරු මැද පළාතට අයත් අධ්‍යාපන කලාප 08 හා අධ්‍යාපන කොට්ඨාස 30 සහ පාසල් 815 හි ව්‍යාප්තිය පහත වගුව පරිදි දැක්වේ.

කොට්ඨාස සහ පාසල් සංඛ්‍යාව අධ්‍යාපන කලාප අනුව

| දිස්ත්‍රික්කය | කලාපය | කොට්ඨාස සංඛ්‍යාව | මුළු පාසල් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|
| | | | ජාතික පාසල් සංඛ්‍යාව | පළාත් පාසල් සංඛ්‍යාව | එකතුව |
| අනුරාධපුර | අනුරාධපුරය | 6 | 3 | 137 | 140 |
| | කැකිරාව | 5 | 1 | 129 | 130 |
| | තඹුත්තේගම | 4 | 1 | 71 | 72 |
| | ගලෙන්බිඳුණුවැව | 3 | 0 | 95 | 95 |
| | කැබිතිගොල්ලෑව | 4 | 1 | 126 | 127 |
| අනුරාධපුර දිස්ත්‍රික්කය | | 22 | 6 | 558 | 564 |
| පොළොන්නරුව | පොළොන්නරුව | 2 | 1 | 53 | 54 |
| | හිඟුරක්ගොඩ | 3 | 3 | 91 | 94 |
| | දිඹුලාගල | 3 | 0 | 103 | 103 |
| පොළොන්නරුව දිස්ත්‍රික්කය | | 8 | 4 | 247 | 251 |
| උතුරු මැද පළාත | | 30 | 10 | 805 | 815 |

මෙම පාසල් අටසිය පහළොව (815) 1 ඒබී පාසල් හැට හතරකින් (64 ) , 1 සී පාසල් එකසිය විසි හතකින් (133) , 2 වර්ගයේ පාසල් දෙසිය තිස් හතකින් (222) සහ 3 වර්ගයේ පාසල් තුන්සිය අසූ හයකින් (396) සමන්විත වේ.

පාසල් වර්ගීකරණය අනුව පාසල් සංඛ්‍යාව අධ්‍යාපන කලාප මට්ටමින්

| කලාපය | 1 AB | 1 C | 2 | 3 | එකතුව |
|---|---|---|---|---|---|
| අනුරාධපුර | 12 | 29 | 46 | 53 | 140 |
| කැකිරාව | 9 | 30 | 26 | 65 | 130 |
| තඹුත්තේගම | 8 | 11 | 26 | 27 | 72 |
| ගලෙන්බිඳුණුවැව | 4 | 18 | 25 | 48 | 95 |
| කැබිතිගොල්ලෑව | 6 | 12 | 41 | 68 | 127 |
| අනුරාධපුර දිස්ත්‍රික්කය | **39** | **100** | **164** | **261** | **564** |
| පොළොන්නරුව | 9 | 8 | 15 | 22 | 54 |
| හිඟුරක්ගොඩ | 9 | 9 | 26 | 50 | 94 |
| දිඹුලාගල | 7 | 16 | 17 | 63 | 103 |
| පොළොන්නරුව දිස්ත්‍රික්කය | **25** | **33** | **58** | **135** | **251** |
| උතුරු මැද පළාත | **64** | **133** | **222** | **396** | **815** |

උතුරු මැද පළාතේ 2018 වර්ෂය අවසන් වන විට පාසල් 815 ක් පැවති අතර එහි සිසුන් දෙලක්ෂ අනූහත්දහස් අටසිය හතලිස් පහක් (297,845) ඉගෙනුම ලබයි. ක්‍රියාත්මක පාසල් 815 න් 805 ක් පළාත් සභා පාසල් වන අතර පාසල් 10 ක් ජාතික පාසල් වේ.මෙම පළාත් සභා පාසල් 805 තුල 2018.12.31 වන විට ගුරුවරුන් 16090 කින් සමන්විත වේ.

## ගුරුවරුන් සංඛ්‍යාව සහ ශිෂ්‍ය සංඛ්‍යාව අධ්‍යාපන කලාප අනුව

| දිස්ත්‍රික්කය | කලාපය | ගුරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| අනුරාධපුර | අනුරාධපුරය | 3485 | 68840 |
| | කැකිරාව | 2409 | 41386 |
| | තඹුත්තේගම | 1790 | 38423 |
| | ගලෙන්බිඳුණුවැව | 1873 | 26237 |
| | කැබිතිගොල්ලෑව | 1914 | 31396 |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | | **11471** | **206282** |
| පොළොන්නරුව | පොළොන්නරුව | 1292 | 29124 |
| | හිඟුරක්ගොඩ | 1792 | 37924 |
| | දිඹුලාගල | 1535 | 24515 |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | | **4619** | **91563** |
| **උතුරු මැද පළාත** | | **16090** | **297845** |

උතුරු මැද පළාතේ පවතින පළාත් සභා පාසල් අටසිය හතර සඳහා විදුහල්පති ශ්‍රේණිධාරීන් එක්දහස් අසූ හතක් (1087) අනුමත වුවද 2018.12.31 දිනවන විට විදුහල්පති ශ්‍රේණිධාරීන් හත්සිය අසූහත් දෙනෙකු (787) පමණක් සිටින අතර තුන්සිය දෙනෙකුගේ (300) පුරප්පාඩුවක් පවතී. එමෙන්ම අධ්‍යාපන පරිපාලන සේවයේ නිළධාරීන් එකසිය අනූ අට දෙනෙකු (198) අනුමත වුවද මේ වන විට අධ්‍යාපන පරිපාලන සේවයේ නිළධාරීන් එකසිය දහදෙනෙකු (110) පමණක් සිටින අතර අනූ අට දෙනෙකු (88) හිඟව ඇත.

## ශ්‍රේණිධාරී විදුහල්පති තොරතුරු (අධ්‍යාපන කලාප අනුව)

| කලාපය | අනුමත සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| අනුරාධපුර | 186 | 192 | 0 | 06 |
| කැකිරාව | 171 | 106 | 65 | 0 |
| තඹුත්තේගම | 111 | 90 | 21 | 0 |
| ගලෙන්බිඳුණුවැව | 126 | 77 | 49 | 0 |
| කැබිතිගොල්ලෑව | 154 | 87 | 67 | 0 |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | **748** | **552** | **202** | **06** |
| පොළොන්නරුව | 86 | 87 | 0 | 1 |
| හිඟුරක්ගොඩ | 126 | 70 | 56 | 0 |
| දිඹුලාගල | 127 | 78 | 49 | 0 |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | **339** | **235** | **105** | **01** |
| **උතුරු මැද පළාත** | **1087** | **787** | **307** | **07** |
| **සමස්ත පුරප්පාඩු සංඛ්‍යාව** | | | | **300** |

## අධ්‍යාපන පරිපාලන සේවයේ නිළධාරී තොරතුරු

| කලාපය | අනුමත සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| අනුරාධපුර | 25 | 16 | 09 | 0 |
| කැකිරාව | 24 | 11 | 13 | 0 |
| තඹුත්තේගම | 23 | 11 | 12 | 0 |
| ගලෙන්බිදුණුවැව | 22 | 10 | 12 | 0 |
| කැබිතිගොල්ලෑව | 23 | 08 | 15 | 0 |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | **117** | **56** | **61** | **0** |
| පොළොන්නරුව | 17 | 10 | 08 | 0 |
| හිඟුරක්ගොඩ | 22 | 12 | 10 | 0 |
| දිඹුලාගල | 18 | 08 | 09 | 0 |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | **57** | **30** | **27** | **0** |
| **පළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව** | **23** | **24** | **0** | **01** |
| **අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය** | **1** | **0** | **01** | **0** |
| **උතුරු මැද පළාත** | **198** | **110** | **89** | **01** |

## දැක්ම

"අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි, නිපුණතා සපිරි දරු පිරිසක්, සමෘද්ධිමත් පළාතක්"

## මෙහෙවර

"අධ්‍යාපනයේ සම අවස්ථා සලසමින් මානව සම්පත් හා භෞතික සම්පත් මනා කළමණාකාරිත්වයකින් යුතුව භාවිතා කර උතුරු මැද පළාත සමෘද්ධිමත් කිරීම සඳහා දායකත්වය සැපයීම"

## දිගුකාලීන අරමුණු

- උතුරු මැද පළාතේ පාසල් අධ්‍යාපනය ලබන දරුවන් බුද්ධිමත් හා රැකියා වෙළඳපොළට සුදුසු නිපුණතා ඇති දරුවන් බවට පත් කිරීම.
- ඉපැරණි රජරට සංස්කෘතිය හා කෘෂි ජීවන රටාව මෙන්ම දේශීය හර පද්ධතිය හා සාරධර්ම අගය කරන පුරවැසි පිරිසක් පාසල් අධ්‍යාපනය තුළින් බිහි කිරීම.

## කෙටිකාලීන අරමුණු

- උතුරු මැද පළාතේ අනිවාර්යය අධ්‍යාපන වයස් සීමාව තුළ සිටින සියලුම දරුවන් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සහ එහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම.
- උතුරු මැද පළාතේ පාසල්වල ඉගැන්වීම් කාර්යයයේ නියුතු ගුරුවරුන්ගේ ඉගැන්වීම් කුසලතා හා ක්‍රමවේදයන් ඉහළ තලයට ගෙන ඒමට අවශ්‍ය මග පෙන්වීම් සිදුකිරීම.
- උතුරු මැද පළාතේ අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය වන්නා වූ භෞතික, මානව හා මූල්‍ය සම්පත් සැපයීම.
- පළාතේ පාසල් දරුවන්ගේ කායික, මානසික සංවර්ධනය සහ කුසලතා ඉහළ නැංවීම.
- ඵලදායී ඉගෙනුම් පරිසරයක් ගොඩ නැගිය හැකිවන පරිදි නිලධාරීන්ගේ හා විදුහල්පතිවරුන්ගේ කළමනාකරණ ශක්තිය ඉහළ නැංවීම.

## ප්‍රධාන කාර්යයන්


01. ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ප්‍රවේශය සඳහා සම අවස්ථා වර්ධනය.
02. ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මක බව වර්ධනය.
03. භෞතික සම්පත් සහ යටිතල පහසුකම් සංවර්ධනය.
04. ආයතනික ධාරිතා සංවර්ධනය.
05. යහපාලනය සහ සේවා සැපයීම ශක්තිමත්කිරීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

01. උතුරු මැද පළාත තුළ පාසල්වල මූලික ඉඩකඩ සම්පූර්ණ කිරීම.
02. උතුරු මැද පළාත තුළ පාසල්වල උසස් තලයේ ඉඩකඩ සම්පූර්ණ කිරීම.
03. උතුරු මැද පළාත තුළ පාසල්වල මූලික උපකරණ අවශ්‍යතා සම්පූර්ණ කිරීම.
04. උතුරු මැද පළාත තුළ පාසල්වල උසස් තලයේ උපකරණ අවශ්‍යතා සම්පූර්ණ කිරීම.
05. මානව සම්පත් සංවර්ධනය.
06. ශිෂ්‍ය සංවර්ධනය

## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 146 |
| 2 | සේවයේ නියුතු | 124 |
| 3 | පුරප්පාඩු | 25 |
| 4 | අතිරික්ත | 03 |
| 5 | වෙනත් | 04 |



## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 9,719.15 | 9,698.71 | 20.44 | 100 |
| ගමන් වියදම් | 18.86 | 17.51 | 1.35 | 93 |
| සැපයීම් | 46.66 | 28.77 | 17.89 | 62 |
| නඩත්තු වියදම් | 168.79 | 159.49 | 9.30 | 94 |
| ගිවිසුම්ගත සේවා | 221.69 | 169.18 | 52.51 | 76 |
| මාරු කිරීම් | 82.54 | 74.68 | 7.86 | 90 |
| **එකතුව** | **10,257.68** | **9,882.11** | **109.35** | |

## පුනරාවර්තන වියදම් දරමින් ප්‍රාග්ධන සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම.

| අනු අංක | ව්‍යාපෘතිය / වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 1 | සිසු පුහුණු වැඩසටහන් | 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව අ.පො.ස. (සා/පෙළ) අ.පො.ස. (උසස් පෙළ) සිසු කඳවුරු හා සම්මන්ත්‍රණ පැවැත්වීම. | ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීම. | 204,015 |
| 2 | ගුරු පුහුණු වැඩසටහන් | නව විෂය නිර්දේශ හඳුන්වාදීම, විෂය දැනුම යාවත්කාලීන කිරීම, විෂය නව ප්‍රවණතා හඳුන්වාදීම. නව තාක්ෂණ දැනුම ලබාදීම. | විෂයානුබද්ධ ගුරු සංවර්ධනය | 14,05 |
| 3 | සිසු තරග පැවැත්වීම | කලාප හා පළාත් තරග පැවැත්වීම. | සිසුන් තුළ මෘදු කුසලතා සහ විෂය සංවර්ධනය කිරීම. | 198,12 |
| | | ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ තරග සඳහා සිසුන් සූදානම් කර ඉදිරිපත් කිරීම. | ජාතික හා ජාත්‍යන්තර තරග අත්දැකීම් ලබාදීම සහ පළාතේ ජයග්‍රහණ සංඛ්‍යාව ඉහළ නැංවීම. | 84.00 |
| 4 | විෂය සමගාමී වැඩසටහන් | නායකත්ව වැඩසටහන්, බාලදක්ෂ, ශිෂ්‍ය භට, අධ්‍යාපන ප්‍රදර්ශන, විස්කම් දැක්ම, රසවින්දන හා සෞන්දර්ය වැඩසටහන්, රතු කුරුස, පරිසර නියමු, ශාන්ත ජෝන් ගිලන් රථ වැඩසටහන, | සිසුන් තුළ මෘදු කුසලතා සංවර්ධනය හා උතුරු මැද පළාතේ පදක්කම්ලාභීන් ඉහළ නැංවීම. | 150,05 |

| අනු අංක | ව්‍යාපෘතිය / වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 5 | ක්‍රීඩා සංවර්ධන වැඩසටහන් | කොට්ඨාස, කලාප හා පළාත් ක්‍රීඩා තරග පැවැත්වීම හා තෝරාගත් ක්‍රීඩා 12ක් සංවර්ධනය සඳහා කොට්ඨාස, කලාප හා පළාත් සංචිත ඇති කිරීම, පුහුණු කිරීම හා තරගවලට ඉදිරිපත් කිරීම. | ක්‍රීඩා කෞශල්‍යයන් ඉහළ නැංවීම, පළාත් හා ජාතික මට්ටමේ ක්‍රීඩකයින් බිහිකිරීම. | 125,00 |
| 6 | වාර විභාග පැවැත්වීම | දෙවන හා තෙවන වාර විභාග සඳහා ප්‍රශ්න පත්‍ර සැකසීම, මුද්‍රණය, සෝදුපත් බැලීම, ප්‍රශ්නපත්‍ර බෙදා හැරීම , විභාගය පැවත්වීම. ප්‍රතිඵල විශ්ලේෂණය හා ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | සිසු සාධන මට්ටම ඉහළ නැංවීම. | 205,00 |
| 7 | ඉගෙනුම් සහාය සඳහා නියාමන දර්ශක ලබාදීම | අධ්‍යාපන ලිත, වාර සටහන්, දින පොත හා ක්ෂේත්‍ර පොත මාණ්ඩලික නිලධාරීන් විදුහල්පති හා ගුරු උපදේශකවරු සඳහා ලබාදීම. | එකම කාල වකවානුවක පාසල් තුළ ප්‍රධාන ක්‍රියාකාරකම් සිදු කිරීම, දිරි ගැන්වීම හා කාර්යයන් පහසු කිරීම. | 18,10 |
| 8 | වෘත්තිය මාර්ගෝපදේශනය හා උපදේශන වැඩසටහන් | වෘත්තිය මාර්ගෝපදේශනය හා උපදේශන වැඩසටහන් පැවැත්වීම | ගැළපෙන අනාගත වෘත්තීය අවස්තාවන් හඳුන්වාදීම හා මානසික සමබරතාවයෙන් යුත් දරුවන් බිහි කිරීම. | 121,000 |
| 9 | ප්‍රගති සමාලෝචන රැස්වීම් | ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම. | අන්තර් කලාප අත්දැකීම් හුවමාරු කරගැනීම. වැඩසටහන් නියාමනය | 750 |
| 10 | ගුරු සිසු ඇගයීම | කලාප හා පළාත් ඇගයීම් උළෙල පැවැත්වීම. | ගුරුවරු හා සිසුන් අභිප්‍රේරණය | 50,000 |
| 11 | මානව සම්පත් සංවර්ධනය | ශ්‍රී.ලං.අ.ප.සේ. නිලධාරිවරුන්, විදුහල්පතිවරු, ගුරු උපදේශකවරු, කළමනාකරණ සහකාරවරුන්, කණිෂ්ඨ සේවයකයින් හා සහාය සේවා සපයන නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය | මානව සම්පත සවිබල ගැන්වීම හා අත්දැකීම් හුවමාරු සඳහා අවස්ථා ලබාදීම. | 3,313 |

පුනරාවර්තන වියදම් දරමින් ප්‍රාග්ධන සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම ඉතිරි කොටස...

| අ. අං | ව්‍යාපෘතිය / වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 12 | පාසල් නඟා සිටුවීමේ වැඩසටහන | පාසල් නඟා සිටුවීමේ කමිටු හා නිලධාරීන් දැනුවත් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ප්‍රගති සමාලෝචන | පාසල් බලවත්ත කිරීම. | 5,000 |
| 13 | නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් | නොවිධිමත් අධ්‍යාපන පාඨමාලා පැවැත්වීම. | පාසල් හැරගිය සිසුන් හා ප්‍රජාව සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම මඟින් ජීවන තත්ත්වය ඉහළ නැංවීම. | 3,000 |
| 14 | විශේෂ අධ්‍යාපනය | විශේෂ අධ්‍යාපන ගුරු සිසු පුහුණුව | විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ගේ අන්තර්කරණ අවස්ථා වැඩිදියුණු කිරීම හා විශේෂ අධ්‍යාපන ගුරුවරු බලවත්ත කිරීම. | 2074 |

## මූලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම හා උපකරණ | 12.73 | 11.26 | 1.47 | 88 |
| වෙනත් මූලධන වියදම්(ආයෝජන) | 245.35 | 203.35 | 42.6 | 83 |
| **එකතුව** | **253.08** | **214.61** | **43.47** | **83.16** |

## *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 04*

## පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම.

**4.1.**2030 වන විට ඵලදායි ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගත හැකි ආකාරයෙන් සියළුම ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් නිදහස්, සමාන හා ගුණාත්මකභාවයෙන් ඉහළ ,ප්‍රාථමික,ද්විතීයික අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරු කිරීම.




**Ensure inclusive and equitable quality education and promote lifelong learning opportunities for all**

**4.2.**2030 වන විට සියළුම ගැහැණු ළමුන්ට හා පිරිමි ළමුන්ට ගුණාත්මක වශයෙන් ඉහළ පූර්ව ළමාවිය සංවර්ධනයට ,සත්කාර සේවාවන්ට සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථාව පැවතීම හා එමගින් ඔවුන් ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම්ව සිටින බව තහවුරු කිරීම.

**4.3.**2030 වන විට සියළුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබා ගත හැකි විශ්ව විද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත්ව තාක්ෂණික,වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකි වීම.

**4.4.**තාක්ෂණික හා වෘත්තිය සුදුසුකම් සහිත අදාල කුසලතා ලබා සිටින තරුනයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් ඉහල නැංවීම.


**4.5.**2030 වන විට අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් තුරන් කිරීම,අධ්‍යාපනයේ සියළුම මට්ටම්වලට ප්‍රවේශ වීමේ අවස්ථාව තහවුරු කිරීම.

**4.6.**2030 වන විට සියළුම තරුණ තරුණියන් සහ කාන්තා,පිරිමි,වැඩිහිටි පුද්ගලයින්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අකුරු හැකියාව සහ ගණන් කිරීමේ හැකියාව ලබා සිටීම.

**4.7.**2030 වන විට ඉගෙනුම ලබන සියළුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබාගෙන තිබීම.

## පසුගිය වසර 03ක ප්‍රාග්ධන වැයවීම 201- 2018

| වර්ෂය | PCDG (රු.මි) | WB (රු.මි) | මුළු වියදම (රු.මි) |
|---|---|---|---|
| 2016 | 7.50 | 78.16 | 85.66 |
| 2017 | 0.46 | - | 0.46 |
| 2018 | 11.26 | 203.35 | 214.61 |
| එකතුව | 19.22 | 281.51 | 300.73 |



## රේඛීය අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අංකය | සංවර්ධන ව්‍යාපෘතිය | ව්‍යාපෘති සංඛ්‍යාව | මුදල | |
|---|---|---|---|---|
| | | | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) |
| 1 | ගොඩනැගිලි ඉදිකිරීම් සහ අලුත්වැඩියා | 34 | 286.17 | 158.91 |
| 2 | 13 වසරක අධ්‍යාපන ව්‍යාපෘතිය | 13 | 104.64 | 52.92 |
| 3 | පාසල් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැපයීම | 252 | 265.26 | 183.44 |
| 4 | පිරිවෙන් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැපයීම | 08 | 7.05 | 4.65 |
| 5 | පාසල්වල ආබාධ සහිත දරුවන් සඳහා ප්‍රවේශ පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් සැපයීම | 11 | 19.53 | 3.58 |

## ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනය - උතුරු මැද පළාතේ සිසු සාධනය පිළිබඳ තොරතුරු

අප පළාතේ අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනය සඳහා විවිධ මූලාශ්‍ර මඟින් ලැබෙන අරමුදල් අරපිරිමැස්මකින් යුතුව ආයෝජනය කිරීම සඳහා විවිධ ක්‍රමෝපායන් ද ක්‍රියාත්මක කල අතර ප්‍රාථමික අධ්‍යාපනය හා ද්විතීයික අධ්‍යාපනය සඳහා වන ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම,ගුරු සංවර්ධනය,පාසල් පාදක ඇගයීම් ශක්තිමත් කිරීම,පාසල්වල භෞතික සම්පත් වැඩිදියුණු කිරීම හා අධ්‍යාපන පරිපාලන කටයුතු ශක්තිමත් කිරීම ඒ යටතේ ප්‍රධාන විය.

ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සඳහා වන ප්‍රවේශයන් වැඩි දියුණු කිරීම යටතේ උතුරු මැද පළාතේ සිසු දරුවන්ගේ ප්‍රාථමික අධ්‍යාපන ප්‍රවේශ අවස්ථා වැඩිදියුණු කිරීම සඳහා 2018 වර්ෂයේදී නව ප්‍රාථමික පාසල් 01 ක් ආරම්භ කල අතර උ/පෙළ විද්‍යා විෂයධාරාව ක්‍රියාත්මක පාසල් සංඛ්‍යාව 65 දක්වා ඉහළ දැමීමට හැකිවිය. එමෙන්ම තාක්ෂණ විද්‍යාගාර 83 හි හා තාක්ෂණ විෂයධාරාව හඳුන්වාදීමත් සමඟ පාසල් 22 ක තාක්ෂණ විද්‍යා පීඨ 22 ක් ඉදිකල අතර 2018 වර්ෂය වන විට මෙම සියළු භෞතික සම්පත් සිසුන්ගේ ඉගෙනුම් අවස්ථා වැඩිදියුණු කිරීම සඳහා සිසු අයිතියට පත්කර අවසන් කර ඇත.

සෑම පාසල් දරුවෙකුටම පළමු ශ්‍රේණියේ සිට දහතුන්වන ශ්‍රේණිය දක්වා අඛන්ඩ පාසල් අධ්‍යාපනයක් ලබාදීම අරමුණු කර ගනිමින් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් " 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන " 2017 ඔක්තෝම්බර් මාසයේ සිට ආරම්භ කල අතර, එමගින් අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටි සියලු සිසුන්ට සමත් අසමත් භාවය නොසලකා ඇතුළත් වීමට අවස්ථාව සලසන අනාගත අභියෝග ජයගත හැකි වෘත්තීය අධ්‍යාපනයක් ලබාදීම අරමුණ කරගත් නව වෘත්තීය විෂයයන් 26 ක් ඇතුළත් විෂයය ධාරාවක් ඒ යටතේ හඳුන්වා දී ඇත.

එහි නියමු වැඩසටහන සඳහා 2017 වර්ෂයේදී මුළු දිවයිනේම පාසල් 43 ක් තෝරාගෙන ඇති අතර, උතුරු මැද පළාතෙන් පාසල් 02 ක් තෝරාගෙන ක්‍රියාවට නංවා ඇත. 2018 වර්ෂයේදී දෙවන අදියර ලෙස උතුරු මැද පළාතේ පාසල් 12 ක් තෝරා ගෙන ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව 2018 වර්ෂය අවසාන වන විට පාසල් 14 ක මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. අනුරාධපුර මධ්‍ය විද්‍යාලය හා පොලොන්නරුව රාජකීය විද්‍යාලය 1 වන අදියරේ පාසල් වන අතර, විලච්චිය අ/සිද්ධාර්ථ ම.වි, අනුරාධපුර ජනාධිපති විද්‍යාලය, රඹෑව අ/ඉකිරියගොල්ලෑව මු.ම.වි., ගලෙන්බිඳුණුවැව අ/නිකවැව අනුර ම.වි, අ/පලුගස්වැව ම.වි.,මැදවච්චිය අ/මෛත්‍රීපාල සේනානායක මධ්‍ය ම.වි., හොරොව්පොතාන අ/රුවන්වැලි ම.ම.වි.,තලාව අ/එප්පාවල ශ්‍රී සිද්ධාර්ථ ම.ම.වි.,මැදිරිගිරිය පො/ දිවුලන්කඩවල ම.ම.වි.,දිඹුලාගල පො/ සිරිපුර ම.වි.,තමන්කඩුව පො/පලුගස්දමන ම.වි., පො/ පොලොන්නරුව මු.ම.වි. 2 වන අදියරේ පාසල් වේ. මෙම වෘත්තීය විෂය ධාරාව හඳුන්වාදීමත් සමඟම සිසුන්ට තම අධ්‍යායන කටයුතු පහසුවෙන් ඉටු කර ගැනීම සඳහා සුහුරු පන්ති කාමර (Smart Class Rooms) 29 ක් ඉදිකර සිසු අයිතියට පත් කර අවසන් කර ඇත.

පාසල් සිසු පරපුර පොතපත පරිශීලනය කෙරෙහි වැඩි වශයෙන් යොමු කරවීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ජනාධිපති ලේකම් කාර්යාලය හා එක්ව “කලණ මිතුරු - පොත් සුමිතුරු “ හා “අතීතයට යතුරක් - අනාගතයට පාලමක් “ ලෙස ප්‍රවර්ධන වැඩසටහන් 02 ක් 2017 වර්ෂයේදී ආරම්භ කර 2018 වර්ෂයේදී ක්‍රියාවට නංවන ලදී. “කලණ මිතුරු - පොත් සුමිතුරු “තිරසර කියවීම් ප්‍රවර්ධන වැඩසටහන පාසල් මට්ටම, කලාප මට්ටම, පළාත් මට්ටම හා ජාතික මට්ටම වශයෙන් අදියර 04 කින් ක්‍රියාත්මක කෙරේ. එහිදී තරඟාවලියක් හරහා පදක්කම් ප්‍රදානයන් හා ත්‍යාග පිරිනැමීමක් සිදු කරයි.


ඒ අනුව උතුරු මැද පළාතේ 2018 වර්ෂය අවසන් වන විට පාසල් මට්ටමින් හා කලාප මට්ටමින් තරඟාවලි පවත්වා අවසන් කර ඇත. එමෙන්ම පාසල් ළමුන්ගේ පොත්පත් පිරිශීලනය වැඩිකිරීමේ අභිලාශයෙන් “අතීතයට යතුරක් - අනාගතයට පාලමක් “ ප්‍රවර්ධන වැඩසටහන යටතේ 2017 වර්ෂයේදී පාසල් පුස්තකාල බල ගැන්වීම සඳහා පුස්තකාල පොත් මිලදී ගැනීමට උතුරු මැද පළාතේ පාසල් 288 කට රු.මි. 57.9 ක මුදලක් ලබා දුන් අතර, එම මුදල යොදවා 2018 වර්ෂයේදී පුස්තකාල පොත් මිලදී ගෙන සිසුන්ගේ භාවිතය සඳහා යොදවා ඇත.


2018 වර්ෂයේ උතුරු මැද පළාත 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව ප්‍රතිඵල අනුව දිවයිනෙන් පස්වන ස්ථානයත්, 2018 වර්ෂයේ 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සඳහා සිසුන් 25,054 ක් පෙනී සිටි අතර සිසුන් 22,639 ක් ලකුණු 70 ට වඩා ඉහළ ලකුණක් ගැනීමට සමත් විය. එය ප්‍රතිශතයක් ලෙස 90.36% කි.

## 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව ප්‍රතිඵල ලකුණු 70 ට වැඩි 2015 - 2018

| කලාපය | 2015 පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 2015 70ට වැඩි සංඛ්‍යාව | 2015 70ට වැඩි ප්‍රතිශතය (%) | 2016 පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 2016 70ට වැඩි සංඛ්‍යාව | 2016 70ට වැඩි ප්‍රතිශතය (%) | 2017 පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 2017 70ට වැඩි සංඛ්‍යාව | 2017 70ට වැඩි ප්‍රතිශතය (%) | 2018 පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 2018 70ට වැඩි සංඛ්‍යාව | 2018 70ට වැඩි ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනුරාධපුර | 4929 | 4161 | 84.42 | 4924 | 4119 | 83.65 | 5182 | 4094 | 79.00 | 5346 | 4765 | 89.13 |
| කැකිරාව | 3019 | 2510 | 83.14 | 3192 | 2613 | 81.86 | 3438 | 2719 | 79.09 | 3549 | 3271 | 92.17 |
| තඹුත්තේගම | 2994 | 2657 | 88.74 | 3036 | 2685 | 88.44 | 3340 | 2728 | 81.68 | 3437 | 3113 | 90.57 |
| ගලෙන්බිඳුණුවැව | 1918 | 1563 | 81.49 | 2303 | 1916 | 83.20 | 2273 | 1666 | 73.30 | 2273 | 2046 | 90.01 |
| කැබිතිගොල්ලෑව | 2591 | 2185 | 84.33 | 2546 | 2091 | 82.13 | 2807 | 1848 | 65.84 | 2880 | 2624 | 91.11 |
| හොරොව්පොතාන | 2182 | 1763 | 80.8 | 2558 | 1801 | 79.76 | 2358 | 1953 | 82.82 | 2204 | 2111 | 95.78 |
| හිඟුරක්ගොඩ | 3023 | 2376 | 78.6 | 3081 | 2368 | 76.86 | 5604 | 4411 | 78.71 | 3251 | 2868 | 88.22 |
| දිඹුලාගල | 1998 | 1480 | 74.07 | 1866 | 1365 | 73.15 | 2103 | 1592 | 75.70 | 2114 | 1841 | 87.09 |
| උතුරු මැද පළාත | 22654 | 18695 | 82.52 | 23506 | 18958 | 80.65 | 27105 | 21011 | 77.51 | **25054** | **22639** | **90.36** |
| සමස්ත දිවයින | 333672 | 254690 | 76.33 | 343757 | 260130 | 75.67 | 350462 | 243236 | 69.4 | 350191 | 276978 | 79.09 |

## 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව ප්‍රතිඵල වල ධනාත්මක වර්ධනයක්.......









2015 වර්ෂය හා සමග සසඳා බලන විට පෙනී යන්නේ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව ප්‍රතිඵල වල ධනාත්මක වර්ධනයක් පන්වන බවයි.විභාගය සඳහා පෙනී සිටි සිසුන් ප්‍රමාණයට සාපේක්ෂව ලකුණු 70ට වැඩියෙන් ලබා ගත් සිසුන් ප්‍රමාණයේ ක්‍රමික වර්ධනයක් පෙන්වන බවයි.එසේම ප්‍රතිශතාත්මක වෙනස සලකා බලන විට 2015 සිට 2017 වර්ෂය දක්වා පහළ යාමක් පෙන්නුම් කළ ද 2018 වර්ෂයේ සීඝ්‍ර වර්ධනයක් 90.36% පෙන්වන බවයි.එය සාපේක්ෂව ලද ජයග්‍රහනයකි.

## අ.පො.ස.(සා.පෙළ) විභාග ප්‍රතිඵල - අධ්‍යාපන කලාප මට්ටමින් (2015 -2017 )

| කලාපය | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස(%) | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස(%) | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස(%) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2015 | | | 2016 | | | 2017 | | |
| අනුරාධපුර | 4155 | 2911 | 70.06 | 4704 | 3232 | 68.71 | 4782 | 3440 | 71.94 |
| කැකිරාව | 2283 | 1535 | 67.24 | 2559 | 1691 | 66.08 | 2552 | 1810 | 70.92 |
| තඹුත්තේගම | 2001 | 1299 | 64.92 | 2458 | 1660 | 67.53 | 2396 | 1578 | 65.86 |
| ගලෙන්බිඳුණුවැව | 1400 | 950 | 67.86 | 1582 | 1069 | 67.57 | 1709 | 1235 | 72.26 |
| කැබිතිගොල්ලැව | 1706 | 1144 | 67.06 | 1895 | 1184 | 62.48 | 1996 | 1423 | 71.29 |
| පොළොන්නරුව | 1644 | 1138 | 69.22 | 1841 | 1266 | 68.77 | 1923 | 1345 | 69.94 |
| හිඟුරක්ගොඩ | 2129 | 1288 | 60.50 | 2531 | 1607 | 63.49 | 2625 | 1806 | 68.80 |
| දිඹුලාගල | 1242 | 765 | 61.59 | 1460 | 915 | 62.67 | 1472 | 988 | 67.12 |
| **උතුරු මැද පළාත** | **16560** | **11030** | **66.61** | **19030** | **12624** | **66.34** | **19455** | **13625** | **70.03** |

## අ.පො.ස.(සා.පෙළ) විභාග ප්‍රතිඵල මත ලබා ඇති ප්‍රගතිය.....




**2018** වර්ෂයේ අ.පො.ස.(සා.පෙළ) විභාග ප්‍රතිඵල නිකුත් කර නොමැති අතර, 2017 වර්ෂයේ පැවති අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා සිසුන් 19455 ක් පෙනී සිටි අතර සිසුන් 13625 ක් අ.පො.ස(උ/පෙළ ) සඳහා සුදුසුකම් ලැබීමට සමත් විය. එය ප්‍රතිශතයක් ලෙස 70.03% කි. එමෙන්ම 2016 වර්ෂයට සාපේක්ෂව 3.69% ක වර්ධනයකි.

2018 වර්ෂයේදී අ.පො.ස (උ/පෙළ) ප්‍රතිඵල වලින් දිවයිනේ පළාත් අතුරින් 2017 වර්ෂයට සාපේක්ෂව 8 වන ස්ථානයේ සිට 7 වන ස්ථානය දක්වා වර්ධනයක් ලබා ගත හැකි විය. එමෙන්ම 2018 පැවති


**පළාත් අතර 8 වන ස්ථානයේ සිට 7 වන ස්ථානය දක්වා**


අ.පො.ස(උ/පෙළ) විභාගයේදී ජෛව විද්‍යා ප්‍රතිඵල අනුව සමත් ප්‍රතිශතය 45.83% ක් වේ.එය 2017 වර්ෂයට සාපේක්ෂව 2.79% ක වර්ධනයකි.භෞතික විද්‍යා අංශයේ සමත් ප්‍රතිශතය 48.01% ක් වේ.එය 2017 වර්ෂයට සාපේක්ෂව 4.2% ක වර්ධනයකි. ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයධාරාවේ සමත් ප්‍රතිශතය 60.66% ක් වු අතර, එය 2017 ට සාපේක්ෂව 5.15% ක වර්ධනයක් ද , වෙනත් විෂය ධාරාව යටතේ සමත් ප්‍රතිශතය 36.02% ක් වූ අතර එය 2017 ට සාපේක්ෂව 3.64% ක පමණ වර්ධනයක් ද ලබා ගෙන ඇත. මෙය උතුරු මැද පළාතේ සිසු දරුවන්ට අධ්‍යාපන සාධනය පිළිබඳ ධනාත්මක නැඹුරුතාවයක් පෙන්නුම් කරයි. වාණිජ විෂයධාරාවේ සමත් ප්‍රතිශතය 66.80% ක් වූ අතර එය 2017 ට සාපේක්ෂව 0.25% ක අඩු වීමක් ද, කලා විෂයධාරාවේ සමත් ප්‍රතිශතය 71.01% ක් වූ අතර එය 2017 ට සාපේක්ෂව 2.79% ක අඩු වීමක් ද දැකිය හැක.

එසේම ඉංජිනේරු තාක්ෂණ විෂයධාරාව යටතේ සමත් ප්‍රතිශතය 53.04% ක් වූ අතර, එය 2017 ට සාපේක්ෂව 1.81% ක අඩුවීමක් ද, පෙන්නුම් කර ඇත. මෙය උතුරු මැද පළාතේ පමණක් නොව සමස්ත දිවයිනේම දක්නට ඇති තත්ත්වයකි.


**අ.පො.ස.උසස් පෙළ විභාග ප්‍රතිඵල - විෂය ධාරාව අනුව (2014 -2018 )**


| විෂයය | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස(%) | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස(%) | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස(%) | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස(%) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2015 | | | 2016 | | | 2017 | | | 2018 | | |
| ජෛව විද්‍යා | 2040 | 857 | 42.0 | 2070 | 863 | 41.69 | 1782 | 767 | 43.04 | 1894 | 868 | 45.83 |
| භෞතික විද්‍යා | 1053 | 421 | 39.98 | 1148 | 478 | 41.63 | 1164 | 510 | 43.81 | 1115 | 536 | 48.01 |
| වාණිජය | 2529 | 1726 | 68.24 | 2563 | 1769 | 69.02 | 2653 | 1779 | 67.05 | 2509 | 1676 | 66.80 |
| කලා | 4935 | 3421 | 69.32 | 4644 | 3310 | 71.27 | 5134 | 3857 | 75.12 | 5475 | 3888 | 71.01 |
| ඉංජිනේරු තාක්ෂණ වේදය | 721 | 319 | 44.24 | 1009 | 461 | 45.68 | 731 | 401 | 54.85 | 822 | 436 | 53.04 |
| ජෛව පද්ධති තාක්ෂණ වේදය | 500 | 291 | 58.2 | 675 | 350 | 51.85 | 490 | 272 | 55.51 | 605 | 367 | 60.66 |
| වෙනත් | 132 | 59 | 44.69 | 198 | 63 | 31.81 | 176 | 57 | 32.38 | 161 | 58 | 36.02 |









## විෂය ධාරාව අනුව (2015 - 2018 )අ.පො.ස.උසස් පෙළ විභාග ප්‍රතිඵල විශ්ලේෂණය-



























අනුමත ගුරු සංඛ්‍යාවට සාපේක්ෂව ප්‍රමාණාත්මක ගුරු සංඛ්‍යාවක් උතුරු මැද පළාතේ පාසල් පද්ධතිය තුළ සිටියද විෂයයන් අනුව සුදුසුකම්ලත් ගුරුවරුන්ගේ හිඟතාවයත්,ශ්‍රේණිධාරි විදුහල්පතිවරුන්ගේ හිඟයත්,අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරි හිඟයත්,ගුරුවරුන් හා නිලධාරීන් පළාත තුළ රඳවා ගැනීමේ ගැටලුත්,සුදුසුකම් ලත් ගුරු උපදේශක හිඟයත් වැනි මානව සම්පත් ගැටලු රාශියක් සහ පන්ති කාමර ගොඩනැගිලි ප්‍රමාණවත් නොවීම,ඩෙස් පුටු ප්‍රමාණවත් නොවීම වැනි භෞතික සම්පත් ගැටලු රාශියක් පවතින උතුරු මැද පළාතේ අධ්‍යාපන සාධනය මෙලෙස ක්‍රමික වර්ධනයක් 2018 වර්ෂය වන විට සිදුවී තිබීම පළාතක් ලෙස ලැබූ අතිවිශිෂ්ඨ ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකි වේ.

## කාර්ය සාධන ඉලක්ක ඉටුකර ගැනීම පිළිබඳ තොරතුරු

2017 වර්ෂයේ උතුරු මැද පළාතේ අධ්‍යාපන කාර්ය සාධන ඉලක්ක 20 ක් ඉටුකර ගැනීම අරමුණු කර ගෙන විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර එම කාර්යය සාධන ඉලක්කයන් ඉටුවී ඇති ආකාරය පහත වගුව මඟින් දක්වා ඇත.

| අ.අ | කාර්ය සාධන ඉලක්ක | 2018 වර්ෂයේදී ඉටුකර ගත් ප්‍රමාණය |
|---|---|---|
| 1 | අනිවාර්ය අධ්‍යාපන වයසේ සියළුම දරුවන්ගේ අධ්‍යාපන ප්‍රවේශය තහවුරු කිරීම හා අ.පො.ස (සා/පෙළ) දක්වා සහභාගිත්වය ඉහළ නැංවීම | 280 |
| 2 | ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 100 ට වැඩි ප්‍රතිශතය ඉහල නැංවීම | 67.87% |
| 3 | අ.පො.ස.(සා/පෙළ) සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම (2017 වර්ෂය) | 70.03% |
| 4 | අ.පො.ස (සා/පෙළ) සමත් ප්‍රතිශතය අනුව පළාත් අතරින් උතුරු මැද පළාතේ ස්ථානය ඉහළ නැංවීම (2017 වර්ෂය) | 6 |
| 5 | අ.පො.ස.(සා/පෙළ) සිංහල සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම (2017 වර්ෂය) | 89.22% |
| 6 | අ.පො.ස.(සා/පෙළ) විද්‍යාව සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම (2017 වර්ෂය) | 70.77% |
| 7 | අ.පො.ස.(සා/පෙළ) ඉංග්‍රීසි සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම (2017 වර්ෂය) | 43.05% |
| 8 | අ.පො.ස (උ/පෙළ) සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 62.23% |
| 9 | අ.පො.ස (උ/පෙළ) සමත් ප්‍රතිශතය අනුව පළාත් අතරින් උතුරු මැද පළාතේ ස්ථානය ඉහළ නැංවීම | 7 |
| 10 | අ.පො.ස (උ/පෙළ) විද්‍යා හා තාක්ෂණවේදය විෂය ධාරාව සඳහා සහභාගිත්වය ඉහළ නැංවීම | 33.82% |
| 11 | අ.පො.ස (උ/පෙළ) වාණිජ විෂය ධාරාව සඳහා සහභාගිත්වය ඉහළ නැංවීම | 17.42% |
| 12 | අ.පො.ස (උ/පෙළ) කලා විෂය ධාරාව සඳහා සහභාගිත්වය අඩු කිරීම | 48.77% |
| 13 | අ.පො.ස (උ/පෙළ) විද්‍යා විෂය ධාරාව සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 46.95% |
| 14 | අ.පො.ස (උ/පෙළ) වාණිජ විෂය ධාරාව සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 66.80% |
| 15 | අ.පො.ස (උ/පෙළ) කලා විෂය ධාරාව සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 71.01% |
| 16 | සෞන්දර්ය තරග සඳහා සමස්ත ලංකා ජයග්‍රහණ ලබා ගන්නා ප්‍රමාණය ඉහළ නැංවීමෙන් පළාත් අතරින් උතුරු මැද පළාත ලබා ගන්නා ස්ථානය ඉහළ නැංවීම | 5 |
| 17 | සමස්ත ලංකා මලල ක්‍රීඩා ජයග්‍රහණ සඳහා පළාත් මට්ටමේ ස්ථානය ඉහළ නැංවීම | 7 |
| 18 | සියලු පාසල් වල විෂය සමගාමී ක්‍රියාකාරකම් අවස්ථා පුළුල් කිරිම, සෑම ශිෂ්‍යයෙකුටම අවම වශයෙන් විෂය සමගාමී ක්‍රියාකාරකම් දෙකක නියැලීමට අවශ්‍ය පහසුකම් සපුරා දීම | 50% |
| 19 | සියලු පාසල්වල ක්‍රීඩා අවස්ථා පුළුල් කිරීම, සෑම ශිෂ්‍යයකුටම අවම වශයෙන් ක්‍රීඩා දෙකක නියැලීමට අවශ්‍ය පහසුකම් සපුරා දීම | 50% |
| 20 | පාසල් හැර ගිය සිසුන් සඳහා වෘත්තීය පුහුණු පාඨමාලා 84 ක් පැවැත්වීම | 1528 |

මෙම ඉලක්ක කරා ළඟාවීම සඳහා 2018 වර්ෂයේ දී විශේෂිත වැඩසටහන් පළාත්,කලාප,කොට්ඨාස,පාසල් මට්ටමින් ක්‍රියාත්මක කරඇති අතර එහි ඵලදායි වර්ධනයක් දැකගත හැකි විය.අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන සඳහා 2018 වර්ෂයේ පළාත් සභා ප්‍රතිපාදන රු.මි.190.14 ක් වෙන් කළ අතර 2018 අවසන් වන විට රු.මි. 165.74 ක මුදලක් අධ්‍යාපන සංවර්ධනය සඳහා ඵලදායිව භාවිතා කල හැකි විය.ඒ යටතේ ප්‍රාථමික අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා රු.මි.18.0 ක් ද ද්විතීයික අධ්‍යාපනය සඳහා රු.මි. 167.75 ක් ද විශේෂ අධ්‍යාපන සහ නොවිධිමත් වැඩසටහන් සඳහා රු.මි.2.69 ක් ද අධ්‍යාපන සැලසුම් හා පර්යේෂණ සඳහා රු.මි.1.7 ක් ද වෙන් කර තිබිණ.එය පහත වගුව මඟින් දක්වා ඇත.

**අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන සඳහා වෙන්කළ ප්‍රතිපාදන සහ වියදම - 2018**

| ව්‍යාපෘතිය | වැඩසටහන | වෙන්කළ ප්‍රතිපාදනය රු. | 2018.12.31 දිනට මුළු වියදම රු. |
|---|---|---|---|
| ප්‍රාථමික අධ්‍යාපනය | ගුරු/සිසු සංවර්ධන වැඩසටහන් | 15.00 | 9.89 |
| | සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් | 3.00 | 1.86 |
| ද්විතීයික අධ්‍යාපනය | අභිප්‍රේරණ වැඩසටහන් | 5.50 | 3.51 |
| | ඉගෙනුම් සහාය සඳහා නියාමන දර්ශක | 10.00 | 1.34 |
| | ගුරු සිසු පුහුණු වැඩසටහන් | 1.00 | 0.43 |
| | ගුරු සිසු ඇගයීම | 2.50 | 2.28 |
| | ගුරු/සිසු සංවර්ධන වැඩසටහන් | 35.00 | 37.33 |
| | ක්‍රීඩා සංවර්ධනය | 12.00 | 10.30 |
| | පාඨමාලා ශාස්ත්‍ර | 2.00 | 1.92 |
| | සැලසුම් හා පර්යේෂණ | 1.00 | 0.68 |
| | සිසු සාධන මට්ටම ඉහල නැංවීම | 64.00 | 63.86 |
| | සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් | 3.00 | 1.69 |
| | වැඩමුළු හා සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටන් | 1.75 | 1.29 |
| | පළාත් ජාතික හා ජාත්‍යන්තර තරඟ | 6.00 | 4.79 |
| | සුභසාධන වැඩසටහන්(ශිෂ්‍යාධාර) | 24.00 | 21.98 |
| විශේෂ අධ්‍යාපනය | ගුරු සිසු පුහුණු වැඩසටහන් | 1.31 | 0.98 |
| නොවිධිමත් අධ්‍යාපනය | පුහුණු දීමනා | 0.05 | - |
| | ධාරිතා සංවර්ධනය | 0.58 | 0.47 |
| | උපදේශන සේවා | 0.75 | 0.74 |
| අධ්‍යාපන සැලසුම් හා පර්යේෂණ | සැලසුම් හා පර්යේෂණ | 0.80 | 0.29 |
| | වැඩමුළු, සම්මන්ත්‍රණ හා පුහුණු | 0.90 | 0.09 |
| | **පළාත් සභා මුළු එකතුව** | **190.14** | **165.72** |

ඉගෙනුම් සහය සඳහා නියාමන දර්ශක සැකසීම සඳහා රු.මි.10 ක් වෙන් කළ අතර ඒ යටතේ පළාතේ සියලු පාසල්වල ක්‍රමානුකූල ක්‍රියාවලියක් සඳහා පාසල් ලිත,වාරසටහන්,ක්ෂේත්‍ර සටහන් පොත් සහ කළමණාකරණ දිනපොත් මුද්‍රණය කර ලබාදීම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා පිටුවහලක් විය.

2018 වර්ෂයේ පුනරාවර්තන මුදල් යටතේ රු.මි.11 ක මුදලක් ගොඩනැගිලි හා ඉදිකිරීම් සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට වෙන් වූ අතර ඒ යටතේ එම කාර්යයන් ඵලදායීව ඉටුකර ඇත. එමෙන්ම ප්‍රාථමික පාසල්වල නඩත්තු කටයුතු සඳහා රු.මි.22 ක් හා ද්විතියික පාසල් නඩත්තු කටයුතු සඳහා රු.මි.40.35 ක් භාවිතා කල අතර එය පහත වගුව මඟින් දක්වා ඇත.

| විස්තරය | වෙන්කල ප්‍රතිපාදනය රු. | වියදම රු. |
|---|---|---|
| **ප්‍රාථමික පාසල් නඩත්තු කටයුතු** | 22.00 | 20.79 |
| ද්විතියික පාසල් නඩත්තු කටයුතු | 40.35 | 39.36 |
| ගොඩනැගිලි හා ඉදිකිරීම | 11.00 | 10.39 |

එමෙන්ම සියලුම පළාත් සභා පාසල්වල ප්‍රාථමික අධ්‍යාපන කටයුතු සඳහා රු.මි.15 ක් හා ද්විතීයික අධ්‍යාපන කටයුතු සඳහා රු.මි.27 ක් ලෙස රු.මි.42 ක් ගුණාත්මක යෙදවුම් ලෙස ලබාදී ඇත. මෙම මුදල් භාවිතා කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා අවශ්‍යවන පාරිභෝජ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම හා ඉගෙනුම් ආධාරක මිලදී ගැනීම හෝ සැකසීම සිදුකර එම මුදල් ඵලදායි ලෙස භාවිතාකර සිසු දරුවන්ගේ අධ්‍යාපන සංවර්ධන කටයුතු සඳහා භාවිතාකර ඇත.

2018 වර්ෂයේදී උතුරු මැද පළාතේ සිසු කුසලතා අනුව සමස්ත ලංකා ජයග්‍රහණ රාශියක් ලබාගත හැකි වී ඇත.ඉංග්‍රීසි විෂය සම්බන්ධයෙන් පද්‍ය ගායනා,අසා ලිවීම, අත් අකුරු හා ඉංග්‍රීසි නාට්‍ය යන සියලු අංශ වලින් සමස්ථ ලංකා ජයග්‍රහණ 13ක් අත්පත් කර ගැනීමට හැකි වී ඇත. ගණිත අංශයෙන් ගණිත දැනුම මිනුම තරඟයේදී සමස්ත ලංකා ජ්‍යෙෂ්ඨ, කණිෂ්ඨ 04 වන ස්ථානය හා පිරිවෙන් අංශය යටතේ 01 වන සථානයත් ලබා ගත හැකි විය. 2018 වර්ෂයේදී මළල ක්‍රීඩා තරඟාවලියේ දී 7 වන ස්ථානයට පැමිණීමට හැකි විය.එමෙන්ම බර එසවීම සමස්ත ශූරතාවයන් 03 ක් අත්පත්කර ගත හැකි විය. සමස්ත ලංකා පාසල් සංගීත තරඟාවලියේ උතුරු මැද පළාත සඳහා ප්‍රථම ස්ථාන 12ක් දෙවන ස්ථාන 16 ක් හා තෙවන ස්ථාන 08 ක් ලබා ගැනීමට හැකි වූ අතර, පළාත් අතුරින් 06 වන ස්ථානයත් ලබා ගැනීමට හැකිවිය. සමස්ත ලංකා නර්තන තරඟාවලියේදී උතුරු මැද පළාත සඳහා ප්‍රථම ස්ථාන 06 ක් දෙවන ස්ථාන 10 ක් හා තෙවන ස්ථාන 10 ක් ලබා ගැනීමට හැකි වූ අතර, පළාත් අතුරින් 06 වන ස්ථානයත් ලබා ගැනීමට හැකිවිය.

සිංහල භාෂා සාහිත්‍ය තරඟ සඳහා ජාතික මට්ටමින් ජයග්‍රහණ 27 ක් ද සමස්ත ලංකා ජයග්‍රහණ ප්‍රථම ස්ථාන 26 ක් දෙවන ස්ථාන 27 ක් හා තෙවන ස්ථාන 34 ක් ද ලබා ගැනීමට හැකි වූ අතර, තරඟාවලියේ කථික තරග සඳහා ජාතික මට්ටමින් ප්‍රථම ස්ථානය ඇතුළුව විශාල ජයග්‍රහණ ප්‍රමාණයක් ලබාගත හැකිවිය.

සෑම විෂයයක් යටතේම සිසු කඳවුරු,සිසු පුහුණු,ගුරු පුහුණු හා ගුරු ධාරිතා සංවර්ධන වැඩසටහන් පවත්වා ඇති අතර ඒ මඟින්ද ඒ ඒ විෂයයේ පවත්නා අඩුපාඩු අවම කරගැනීමට ළඟාකරගත යුතු ඉලක්කකරා ළඟා වීමත් ඉලක්ක කරගනිමින් වාරවිභාග ප්‍රතිඵලද විශ්ලේෂණයකර නව වැඩසටහන්, විවිධ ව්‍යාපෘති සකස් කර 2018 වර්ෂයේදී විවිධ වැඩසටහන්,ව්‍යාපෘති ක්‍රියාත්මත කරන ලදී.

විද්‍යාව විෂය - ගුරු පුහුණු හා සිසු පුහුණු




කෘෂි විද්‍යාව සහ ජෛව පද්ධති තාක්ෂණය විෂය - ගුරු පුහුණු සහ සිසු පුහුණු




නර්ථනය විෂය - ගුරු පුහුණු සහ සිසු පුහුණු




## 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන වෘත්තීය විෂය ධාරාව








එක් එක් විෂය සම්බන්ධයෙන් පැවැත්වූ සිසු කඳවුරු සහ පුහුණුවලට අමතරව සිසුන්ගේ ආකල්ප වර්ධනය සඳහා සහ යහපත් ජීවන පුරුදු ඇතිකරලීමටත් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

## පළාත් සභා ප්‍රතිපාදන මත වැඩසටහන් වලට අමතරව ජනාධිපති කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන තිරසර පාසල් වැඩසටහන 2018

තිරසර සංවර්ධන ඉලක්ක ජයගැනීම වෙනුවෙන් උතුරු මැද පළාතේ පාසල් අධ්‍යාපනය තුළ ගුණාත්මක වෙනස්කම් සිදුකළ අතර "සොඳුරු ළමා ලොවක් තිරසර හෙටක්" යන තේමාව ඔස්සේ තිරසර පාසල් වැඩසටහන ක්‍රියාත්මක විය.මේ තුළ පෙළගස්වා තිබූ ක්‍රියාකාරකම්වල නියැලීම තුළින් උතුරු මැද පළාතේ සිසු දරුවන්ගේ සහභාගිත්ව ප්‍රවේශය තුළ වඩා ඵලදායීව හා නිර්මාණශීලීව සිය අධ්‍යාපන කටයුතු සිදුකිරීමට අවස්ථාව ලැබී ඇත.

තිරසර පාසල් වැඩසටහන යටතේ ක්‍රියාත්මක වැඩසටහන් පහත පරිදි වේ.

- ✓ දේශීය ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන
- ✓ පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන
- ✓ දරුවන් සුරකිමු ජාතික වැඩසටහන
- ✓ මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන
- ✓ වකුගඩු රෝග නිවාරණ ජාතික වැඩසටහන

### තිරසර පාසල් වැඩසටහන සඳහා තෝරාගත් පාසල් සංඛ්‍යාව අධ්‍යාපන කලාප අනුව




තිරසර පාසල් වැඩසටහන යටතේ උතුරු මැද පළාතේ තෝරාගත් පාසල් 240ක පහත දක්වා ඇති පරිදි විවිධ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇත.

1. කලාප හා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරු තිරසර පාසල් සංවර්ධන වැඩසටහන පිළිබඳව දැනුවත් කිරීම.
2. විදුහල්පතිවරු දැනුවත් කිරීම.
3. තිරසර පාසල් වැඩසටහන - මාර්ගෝපදේශ සංග්‍රහය සියළු පාසල් වෙත ලබා දී ඇත.
4. තිරසර පාසල් සංවර්ධන පළාත් , කලාප සහ පාසල් කමිටු පත්කර ඇත.
5. සියලුම පාසල් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර ඇත.
6. පළාතේ තෝරාගත් සියලුම පාසල්වල මෙම වැඩසටහන 2017.01.28 දින ආරම්භ කිරීම.
7. තෝරාගත් සියලුම පාසල්වලට රු.50,000/= බැගින් ලබා දී ඇත.
8. පළාත් හා කලාප මට්ටමින් ප්‍රගති සමාලෝචන සිදු කර ඇත.

## 2019 – 2023 කාර්ය සාධන ඉලක්ක

2018 වර්ෂය තුළ උතුරු මැද පළාත අධ්‍යාපනයට ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් අත්පත් කරගත් අතර තවදුරටත් අධ්‍යාපන සංවර්ධනය සඳහා 2019 -2023 කාර්යය සාධන ඉලක්ක පිහිටුවා ගැනීමට කටයුතු කර ඇත.

## 2019 – 2023 කාර්ය සාධන ඉලක්ක 2019 - 2023

| කාර්ය සාධන ඉලක්ක | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 100 ට වැඩි ප්‍රතිශතය ඉහල නැංවීම (%) | 50 | 54 | 58 | 62 | 65 |
| අ.පො.ස.(සා/පෙළ) සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම (%) | 76 | 79 | 82 | 85 | 88 |
| අ.පො.ස (සා/පෙළ) සමත් ප්‍රතිශතය අනුව පළාත් අතරින් උතුරු මැද පළාතේ ස්ථානය ඉහළ නැංවීම | 5 | 4 | 3 | 2 | 1 |
| අ.පො.ස.(සා/පෙළ) සිංහල සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම (%) | 89 | 90 | 91 | 92 | 93 |
| අ.පො.ස.(සා/පෙළ) ගණිතය සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම (%) | 68 | 70 | 73 | 76 | 80 |
| අ.පො.ස.(සා/පෙළ) විද්‍යාව සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම (%) | 73 | 74 | 76 | 78 | 80 |
| අ.පො.ස.(සා/පෙළ) ඉංග්‍රීසි සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 49 | 47 | 50 | 53 | 56 |
| අ.පො.ස (උ/පෙළ) සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම (%) | 66 | 68 | 71 | 73 | 75 |
| අ.පො.ස (උ/පෙළ) සමත් ප්‍රතිශතය අනුව පළාත් අතරින් උතුරු මැද පළාතේ ස්ථානය ඉහළ නැංවීම | 6 | 5 | 4 | 1 | 1 |
| අ.පො.ස (උ/පෙළ) විද්‍යා හා තාක්ෂණවේදය විෂය ධාරාව සඳහා සහභාගිත්වය ඉහළ නැංවීම (%) | 36 | 38 | 40 | 42 | 44 |
| අ.පො.ස (උ/පෙළ) වාණිජ විෂය ධාරාව සඳහා සහභාගිත්වය ඉහළ නැංවීම (%) | 21 | 23 | 25 | 37 | 30 |
| අ.පො.ස (උ/පෙළ) කලා විෂය ධාරාව සඳහා සහභාගිත්වය අඩු කිරීම (%) | 42 | 39 | 35 | 31 | 26 |
| අ.පො.ස (උ/පෙළ) ජීව විද්‍යා විෂය ධාරාව සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම (%) | 50 | 55 | 60 | 65 | 70 |
| අ.පො.ස (උ/පෙළ) භෞතික විද්‍යා විෂය ධාරාව සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම (%) | 52 | 56 | 60 | 64 | 68 |
| අ.පො.ස (උ/පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාව සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම (%) | 57 | 61 | 65 | 69 | 73 |
| අ.පො.ස (උ/පෙළ) ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම (%) | 64 | 67 | 70 | 73 | 76 |
| අ.පො.ස (උ/පෙළ) වාණිජ විෂය ධාරාව සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම (%) | 70 | 72 | 74 | 76 | 78 |
| අ.පො.ස (උ/පෙළ) කලා විෂය ධාරාව සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම (%) | 75 | 80 | 85 | 90 | 92 |
| සෞන්දර්ය තරඟ සඳහා සමස්ත ලංකා ජයග්‍රහණ ලබා ගන්නා ප්‍රමාණය ඉහළ නැංවීමෙන් පළාත් අතරින් උතුරු මැද පළාත ලබා ගන්නා ස්ථානය ඉහළ නැංවීම | 5 | 4 | 3 | 2 | 1 |
| සමස්ත ලංකා මලල ක්‍රීඩා ජයග්‍රහණ සඳහා පළාත් මට්ටමේ ස්ථානය ඉහළ නැංවීම | 6 | 5 | 4 | 3 | 2 |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

කාර්යය සාධන ඉලක්ක කරා ළගා වීමේදී මානව සම්පත් සහ භෞතික සම්පත් ගැටළු රාශියකට මුහුණ දීමට සිදුවිය. එකී තත්වයක් තුළ වුව ද උතුරු මැද පළාතේ සිසු දරුවන්ගේ අධ්‍යාපන සාධන මට්ටම් ඉහළ නංවමින් අධ්‍යාපනයේ ගුණාත්මක සහ ප්‍රමාණාත්මක වර්ධනයක් සඳහා 2018 වර්ෂයේ දී වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී රේඛීය අමාත්‍යාංශයෙන් හා අනෙකුත් ආයතන අතර මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් අනෙකුත් සියලුම පාර්ශවකරුවන්ද සමග සහයෝගයෙන් කටයුතු කරමින් අපේක්ෂිත ප්‍රතිඵල කරා සහ ඉලක්ක කරා ලඟාවීමටත් අධ්‍යාපන පද්ධතිය තුළ ක්‍රමික වර්ධනයක් සිදු කරමින් අධ්‍යාපනයේ කාර්ය සාධනය ඉහළ නැංවීමට හැකිවීම පළාතක් ලෙස ලැබූ ජයග්‍රහණයකි.

# 6.3. පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව

**පළාතේ කලායතන පිහිටීම** | **ආගමික සිද්ධස්ථාන**

| කලායතනය | සංඛ්‍යාව |
|---|---|
| නර්තන | 147 |
| සංගීත | 14 |
| නාට්‍ය | 07 |

| ආගමික සිද්ධස්ථාන | සංඛ්‍යාව |
|---|---|
| පන්සල් | 1112 |
| කෝවිල් | 42 |
| මුස්ලිම් පල්ලි | 198 |
| කතෝලික දේවස්ථාන | 47 |
| පිරිවෙන් | 57 |
| දහම් පාසල් | 978 |

## දැක්ම

"සංස්කෘතිකාංග ගරු කරන සාරධර්ම සපිරි සමාජයක්, සෞභාග්‍යවත් පළාතක්".

## මෙහෙවර

**" දැහැමි කලාකාමී හා අභිමානවත් සමාජයක් බිහි කිරීම සඳහා සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව දහම් අධ්‍යාපනය නංවාලීම, උසස් කලා නිර්මාණකරණය හා රසවින්දනය දිරිගැන්වීම, අතීත සංස්කෘතික උරුමයන් හා ශිල්ප සංරක්ෂණය සහ කලාකරුවන්ගේ කුසලතා ඔප් නැංවීම".**

## දිගු කාලීන අරමුණු

- අත්‍යවශ්‍ය භෞතික සම්පත් සහිත දැහැමි පාසල් පද්ධතියක් සහ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කරගත් දහම් පාසල් ප්‍රජාවක්.
- දක්ෂ කලාකරුවන්ගේ නිර්මාණ එළිදැක්වීමට කාර්යක්ෂම ක්‍රමවේදයක්
- උසස් කලා නිර්මාණ බිහි කිරීම.
- පළාතේ සංස්කෘතිකාංග අඛණ්ඩව පවත්වාගෙන යාමට විධිමත් ක්‍රමවේදයක්.
- ඉහළ ධාරිතාවයකින් යුත් කලායතන පද්ධතියක් හා කලාකරුවන් පිරිසක්.
- උසස් රසාස්වාදනය ප්‍රචලිත කිරීම.

## කෙටි කාලීන අරමුණු

- කාර්යක්ෂම ආයතන පද්ධතියක්.
- නර්තන කලාව, ලේඛණ කලාව, සංගීත හා රංග කලාව වැනි සංස්කෘතික අංගයන් ප්‍රවර්ධනයට කටයුතු සැලසීම.
- පළාතේ කලාකරුවන්ගේ හැකියාවන් හඳුනා ගැනීම හා ඇගයීමට ලක් කිරීම.
- පළාතේ ආගමික පුනර්ජීවය වෙනුවෙන් සංවර්ධන කාර්යයන් ඉටු කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- දහම් අධ්‍යාපනය නංවාලීම.
- උසස් කලා නිර්මාණ බිහි කිරීම සංවර්ධනය.
- උසස් රසාස්වාදය ප්‍රචලිත කිරීම.
- අතීත සංස්කෘතික උරුමයන් හා කලා ශිල්ප සංරක්ෂණය.
- කලාකරුවන්ගේ කුසලතා නංවාලීම.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහපාලන කටයුතු සංවර්ධනය.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ❖ දැනුවත් කිරීමේ වැඩසටහන් හා පුහුණු වැඩමුළු පැවැත්වීම.
- ❖ කලා උළෙල හා එයට සමගාමී ක්‍රියාකාරකම්.
- ❖ සංස්කෘතික සංරක්ෂණය සිදු කිරීම.
- ❖ ආයතනික ධාරිතා සංවර්ධනය.
- ❖ සංවර්ධන ආධාර (දහම් පාසල්, කලායතනාධාර, ආගමික සිද්ධස්ථාන)

## අංශය නියෝජනය කරන තිරසාර සංවර්ධන අරමුණු


**ලෝකයේ ස්වභාවික හා සංස්කෘතක උරුමයන් රැක ගැනීම**

**හා**

**ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම**

## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 18 |
| 2 | සේවයේ නියුතු | 16 |
| 3 | පුරප්පාඩු | 02 |
| 4 | අනියම් | - |
| 5 | තාවකාලික | 01 |
| 6 | කොන්ත්‍රාත් | - |



## පුනරාවර්තන වියදම් - 2018

| වියදම් ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය | 2018 වර්ෂයේ වියදම් (රු. මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 10.04 | 9.83 | 0.20 | 98 |
| ගමන් වියදම් | 0.33 | 0.30 | 0.03 | 90 |
| සැපයීම් | 1.08 | 0.74 | 0.33 | 69 |
| නඩත්තු වියදම් | 3.28 | 2.37 | 0.91 | 72 |
| ගිවිසුම්ගත සේවා | 6.21 | 5.84 | 0.37 | 94 |
| මාරු කිරීම් | 0.18 | 0.12 | 0.06 | 67 |
| **එකතුව** | **21.12** | **19.20** | **1.92** | |

## පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම

| අනු අංකය | ව්‍යාපෘතිය/ වැඩ සටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 01 | ගොඩනැගිලි හා ඉදි කිරීම් | දෙපාර්තමේන්තු භූමියේ ගොඩනැගිල්ල ප්‍රමාණවත් නොවීම නිසා පිටුපස කොටස අළුත්වැඩියා කිරීම | දෙපාර්තමේන්තු සේවකයන් අභි ප්‍රේරණය කිරීම | දෙපාර්තමේන්තු වේ සියළුම සේවකයින් |

## මූලධන වියදම් - 2018

| වියදම් ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම් (රු. මි.) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම හා උපකරණ | 0.1 | 0.99 | 0.01 | 99 |
| **එකතුව** | **0.1** | **0.99** | **0.01** | **99** |

## කාර්ය සාධන ඉලක්ක 2017 - 2019

| අනු අංකය | ආයතනයේ අරමුණු | කාර්යසාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 |
| 01 | අත්‍යාවශ්‍ය භෞතික සම්පත් සහිත දැහැමි පාසල් පද්ධතියක් සහ දැනුම,ආකල්ප හා කුසලතා වර්ධනය කරගත් දහම් පාසල් ප්‍රජාවක් | ආධාර ලබා දුන් දහම් පාසල් සංඛ්‍යාව | 100 | 50 | 100 |
| 02 | දක්ෂ කලාකරුවන්ගේ නිර්මාණ එළි දැක්වීමේ කාර්යක්ෂම ක්‍රමවේදයක් සකස් කිරීම | කලා උළෙලට ඉදිරිපත් වන තරග කරුවන් සංඛ්‍යාව | 1500 | 1800 | 2000 |
| | | කලා උළෙලට ඉදිරිපත් වන නව නිර්මාණ සංඛ්‍යාව | 3 | 5 | 8 |
| | | අළුතින් හඳුනාගත් ලේඛකයන් සංඛ්‍යාව | 5 | 18 | 25 |
| | | සඟරාව සඳහා ලැබෙන ලිපි සංඛ්‍යාව | 60 | 73 | 90 |
| 03 | උසස් කලා නිර්මාණ බිහි කිරීම සඳහා දායක වීම | පවත්වනු ලබන පුහුණු වැඩමුළු සංඛ්‍යාව | 3 | 8 | 3 |
| | | සහභාගී වන ශිල්පීන් සංඛ්‍යාව | 600 | 3000 | 720 |
| 04 | පළාතේ සංස්කෘතිකාංග අඛණ්ඩව පවත්වාගෙන හා සංස්කෘතික සංරක්ෂණය කිරීම. | පවත්වනු ලබන පූජා කර්ම සංඛ්‍යාව | 0 | 5 | 0 |
| | | නරඹන ප්‍රේක්ෂක සංඛ්‍යාව | 0 | 3000 | 0 |
| 05 | පළාතේ ආගමික පුනර්ජීවනය වෙනුවෙන් සංවර්ධන කාර්යන් ඉටු කිරීම. | අධාර ලබා දෙන පෙරහැර සංඛ්‍යාව | 10 | 15 | 18 |
| | | ආධාර ලබා දෙන ආගමික හා සංස්කෘතික උත්සව සංඛ්‍යාව | 5 | 12 | 16 |
| | | අධාර ලබා දෙන ආගමික සිද්ධස්ථාන සංඛ්‍යා | 50 | 50 | 60 |
| 06 | උසස් රසාස්වාදනය ප්‍රචලිත කිරීම. | පවත්වන ලද කලා ප්‍රසංග සංඛ්‍යාව | 04 | 6 | 8 |
| | | නැරඹීමට පැමිණි ප්‍රේක්ෂක සංඛ්‍යාව | 1600 | 1800 | 2300 |
| 07 | ආයතනික ධාරිතා සංවර්ධනය. | මිලදී ගත් කාර්යාල උපකරණ ප්‍රමාණය | 5 | 7 | 9 |
| | | ලැබෙන සේවක පැමිණිලි සංඛ්‍යාව | 12 | 8 | 5 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය - 2018

| ප්‍රධාන අරමුණ | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵලය | වෙන්කළ මුදල (රු.මි) | වැයකළ මුදල (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| 01.අත්‍යාවශ්‍ය භෞතික සම්පත් සහිත දැහැමි පාසල් පද්ධතියක් සහ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කරගත් දහම් පාසල් ප්‍රජාවක් | දහම් පාසල් සංවර්ධනය | උතුරු මැද පළාතේ දහම්පාසල් වල භෞතික අවශ්‍යතා සම්පූර්ණ වීම අපේක්ෂාව විය . මේ යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ දහම් පාසල් 29 කට හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දහම් පාසල් 15 ක් සඳහා භෞතික අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා රු. 100,000.00 බැගින් මූල්‍ය ප්‍රතිපාදන ලබා දී ඇත. | 5.00 | 4.2 | 84 |
| 02.දක්ෂ කලාකරුවන්ගේ නිර්මාණ එළි දැක්වීමේ කාර්යක්ෂම ක්‍රම වේදයක් සකස් කිරීම | උතුරු මැද කලා උළෙල | උතුරු මැද පළාතේ කලාකරුවන්ගේ දක්ෂතා එළි දැක්වීම හා ප්‍රාදේශීය ශිල්පීන් ජාතික තලයට රැගෙන යාම මෙහි ප්‍රතිඵලය වේ. මෙමගින් අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි චිත්‍ර ,නැටුම්,සංගීත,සාහිත්‍ය, නාට්‍ය, කෙටි චිත්‍ර පටි, ඡායාරූප ආදී ක්ෂෙත්‍රයන්ගෙන් තරග පැවැත්විය.<br>මේ සඳහා තරග කරුවන් 3000 කට අධික පිරිසක් සහභාගී විය. මේ සඳහා විවිධ වයස් සීමාවන්ට අයත් තරග කරුවන් තරග වැදුණි. මෙහි විනිශ්චය මණ්ඩල ලෙස යොදා ගනු ලැබුවේ අදාළ ක්ෂෙත්‍රයේ ප්‍රවීනයන් හා විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ය. සියළුම ජයග්‍රාහී තරග කරුවන්ගේ සහභාගීත්වයෙන් අවසන් උත්සවය උත්කර්ෂවත්ව පැවැත්විය | 5.00 | 4.034 | 81 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 03.උසස් කලා නිර්මාණ බිහි කිරීම බිහි කිරීම සඳහා දායක වීම | පුහුණු වැඩමුළු පැවැත්වීම | පළාතේ කලායතන සියළුම කලාකරුවනගේ දැනුම අවබෝධය වර්ධනය කර ගැනීම හා ජාතික තලයට රැගෙන යා හැකි නිර්මාණ පළාත තුල බිහි කිරීම අපේක්ෂාව විය. මේ යටතේ උතුරු මැද පළාතේ සියළුම ප්‍රාදේශීය සහා ආවරණය වන පරිදි ප්‍රාදේශීය පුහුණු වැඩමුළු පැවැත්විය. මෙහිදී ශිල්පීන් 3000 කට අධික සංඛ්‍යාවක් පුහුණුව ලැබීය.<br>එහිදී,<br>• නර්තන පුහුණු වැඩ මුළු 08<br>• සංගීත පුහුණු වැඩමුළු 08<br>• චිත්‍ර පුහුණු වැඩමුළු 08<br>• සාහිත්‍ය පුහුණු වැඩමුළු 08<br>ක් පැවැත්විය.<br>මෙහිදී සියළුම වැඩමුළු සඳහා විශ්ව විද්‍යාල ආචාර්ය වරුන් හා ක්ෂේත්‍රයේ ප්‍රවීන විද්වතුන්ගේ සම්පත් දායකත්වය මේ සඳහා යොදා ගැණුනි. | 3.8 | 3.75 | 99 |
| | සුභාෂණ සංස්කෘතික සඟරාව අටවන කලාපය ප්‍රකාශයට පත් කිරීම | උතුරු මැද පළාත තුල විසිරී සිටින ලේඛකයන්ගේ ලේඛන හැකියාව වර්ධනය කිරීම සඳහා සහ උසස් නිර්මාණ පාඨකයා වෙත ඉදිරිපත් කිරීමේ අරමුණින් සුභාෂණ සංස්කෘතික සඟරාවේ අටවන කලාපය ප්‍රකාශයට පත් කෙරුණි. මෙහි ඇතුළත් කරන ලද සියළුම ලිපි උතුරු මැද පළාතේ ලේඛකයන්ගේ වීම විශේෂත්වයකි. මෙහි සඟරා 600 ක් මුද්‍රණය කරන ලද අතර උතුරු මැද පළාතේ පාසල් හා රාජ්‍ය ආයතන අතර බෙදා දෙන ලදී. | 0.2 | 0.169 | 85 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2.පළාතේ සංස්කෘතිකාංග අඛණ්ඩව පවත්වාගෙන යාම හා සංස්කෘතික සංරක්ෂණය කිරීම | පාරම්පරික පූජාකර්ම පැවැත්වීම | මෙමගින් අපේක්ෂා කරන ලද්දේ සාම්ප්‍රදායික පූජා කර්ම වර්ථමාන පරම්පරාවට දැක ගැනීමට සැලැස්වීම හා පාසල් විෂය නිර්දේශයේ ඇතුලත් වී ඇති බැවින් පාසල් දරුවන්ගේ දැනුම වර්ධනය කිරීම හා මතුපරම්පරාව වෙත දැක ගැනීම සඳහා වීඩියෝ ගත කර සංරක්ෂණය කර තැබීම සිදු විය. මේ යටතේ පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව මඟින් පාරම්පරික පූජා කර්ම 05 ක් පැවැත්විය. ඒවා නම්,<br>• දහඅට සන්නිය ශාන්ති කර්මය<br>• පහන් මඩුව ශාන්ති කර්මය<br>• කෝලම් මඩුව ශාන්ති කර්මය<br>• කොහොඹා කංකාරිය ශාන්ති කර්මය<br>• දෙවොල් මඩුව ශාන්ති කර්මය පවත්වන ලදී. | 4.00 | 3.36 | 84 |
| 3.ඉහළ ධාරිතාවයකින් යුත් කලායතන පද්ධතියක් හා කලාකරුවන් පිරිසක් බිහි කිරීම | කලායතන ආධාර | කලායතනවල භෞතික අවශ්‍යතා සම්පූර්න වීම තුලින් උසස් නිර්මාණ බිහි කිරීමට දායක වීම. මේ යටතේ උතුරු මැද පළාත තුළ පවතින නර්තන කලායතන, සංගීත කලායතන, නාට්‍ය කලායතන සඳහා මූල්‍ය ආධාර ලබා දීම සිදු කරන ලදී. | 5.00 | 5.0 | 100 |
| | ධනාත්මක හැකියාවන් සහිත කලායතන පද්ධතියක් පළාත තුල නිර්මාණය කිරීම | මේ යටතේ 2018 වර්ෂයේ හේවිසි කණ්ඩායමක්, පන්තේරු කණ්ඩායමක්, උඩැක්කි කණ්ඩායමක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය රංග වස්ත්‍රාභරණ හා නර්තන භාණ්ඩ මිලදී ගැනීම සිදු කරන ලදී. උතුරු මැද පළාත තුල පවත්වනු ලබන පෙරහැර සහ අනෙකුත් උත්සව සඳහා පළාත තුළ නර්තන කණ්ඩායම් යෙදවීම තුලින් පළාත තුල මුදල් ඉතිරි කර ගත හැකි වීම අපේක්ෂාව විය. | 1.5 | 1.493 | 99 |
| 4.පළාතේ ආගමික පුනර්ජීවනය වෙනුවෙන් සංවර්ධන කාර්යන් ඉටු කිරීම | මිහින්තලය පොසොන් උත්සවය හා අනුරාධපුර දිස්ත්‍රික්කයේ පෙරහැර සඳහා අනුග්‍රහය දැක්වීම | මිහින්තලය පොසොන් උත්සවයට සහ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවතින පෙරහැර 6 ක් සඳහා මූල්‍යමය අනුග්‍රහය දැක්විය. පාරම්පරිකව සෑම වසරක් පාසාම අනුරාධපුර දිස්ත්‍රික්යේ පවත්වනු ලබන පෙරහැර අඛණ්ඩව පවත්වාගෙන යාමට සහය වීම අපේක්ෂාව විය. | 1.35 | 1.35 | 100 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4.පළාතේ ආගමික පුනර්ජීවනය වෙනුවෙන් සංවර්ධන කාර්යයන් ඉටු කිරීම | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආගමික හා සාම්ප්‍රදායික උත්සව සඳහා අනුග්‍රහය | අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවත්වන ලබන ආදාහණ පූජෝත්සව, අනෙකුත් සංස්කෘතික උත්සව සඳහා මූල්‍යමය අධාර ලබා දෙන ලදී. මේ යටතේ ප්‍රදේශයේ උත්සව 15ක් සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දී ඇත. | 1.5 | 1.31 | 87 |
| | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ආගමික හා සාම්ප්‍රදායික උත්සව සඳහා අනුග්‍රහය | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පවත්වන ලබන ආදාහණ පූජෝත්සව, අනෙකුත් සංස්කෘතික උත්සව සඳහා මූල්‍යමය අධාර ලබා දෙන ලදී. මේ යටතේ ප්‍රදේශයේ උත්සව 08 ක් සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දී ඇත | 0.95 | 0.95 | 100 |
| | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආගමික සිද්ධස්ථාන සංවර්ධනය | අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවතින අඟහිඟකම් පවතින දුෂ්කර විහාරස්ථාන සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දීම මේ යටතේ සිදුවිය. මෙහිදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආගමික සිද්ධස්ථාන 32 ක් සඳහා ආධාර ලබා දී ඇත. | 4.2 | 3.00 | 71 |
| | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ආගමික සිද්ධස්ථාන සංවර්ධනය | අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවතින අඟහිඟකම් පවතින දුෂ්කර විහාරස්ථාන සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දීමට මේ යටතේ අපේක්ෂා කර තිබිණි.<br>එහෙත් මෙම වර්ෂයේ අක් මුදල් නොලැබීම නිසා ලබා දිමට හැකියාව ලැබුනේ විහාරස්ථාන 03 කට පමණි. විහාරස්ථාන 20 ක් සඳහා අධාර ලබා දීමට නියමිතව තිබිණි. | 2.00 | 0.3 | 15 |
| | ඓතිහාසික දළදා පෙරහැර පැවැත්වීම | ඓතිහාසික දළදා පෙරහැර සෑම වසරක් පාසාම උත්කර්ෂවත්ම පැවැත්වේ. මෙය නැරඹීම සඳහා විශාල ප්‍රේක්ෂක පිරිසක් සහභාගී වේ. | 10.00 | 10.0 | 100 |
| උසස් රසාස්වාදනය ප්‍රචලිත කිරීම | කලා ප්‍රසංග පැවැත්වීම | සුරපුර රංග පියයේ හෝ තෝරාගත් සුදුසු ස්ථානයක වේදිකා නාට්‍ය, සාම්ප්‍රදායික සංගීත ප්‍රසංග පැවැත්වීම | 2.00 | 1.88 | 93 |
| ආයතනික ධාරිතා සංවර්ධනය | ගෘහ භාණ්ඩ හා කාර්යාලඋපකරණ, යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම | දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය සඳහා ජෙනරේටර් යන්ත්‍රයක් හා කාර්යාල මේස හා කබඩ් මිලදී ගැනීම | 1.00 | 9.57 | 96 |
| | නර්තන හා සංගීත භාණ්ඩ මිලදී ගැනීම | දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන නර්තන හා සංගීත කණ්ඩායමේ භෞතික අවශ්‍යතා සම්පූර්ණ වීම | 1.00 | 9.9 | 99 |

## සමස්ත සම්පත් උපයෝජනය පිළිබඳව ප්‍රගතිය

දෙපාර්තමේන්තුවේ සංස්කෘතික අධ්‍යක්ෂතුමිය ඇතුළුව කාර්ය මණ්ඩලයේ විස්සක් සේවයේ නියුක්තව සිටී. මෙම දෙපාර්තමේන්තුව සඳහා මූලධන වියදම් සඳහා 2018 වර්ෂයේ රු.මි. 48.5 මුදලක් වෙන් කර තිබිණි. පුනරාවර්තන වියදම් ලෙස රු.මි 21.1 ක මුදලක් වෙන් කර තිබිණි. එසේම දෙපාර්තමේන්තුවට අදාල සියළුම භෞතික සම්පත් මනා ලෙස උපයෝජනය කෙරුණි.

එසේම දෙපාර්තමේන්තු මිලදී ගැනීම් සිදු කිරීමේදී රජයේ ප්‍රසම්පාදන ප්‍රතිපත්තිවලට යටත්ව අවම මුදල් භාවිතා කරමින් මිලදී ගැනීම් සිදු කරන ලදී. එසේම දෙපාර්තමේන්තුව සිදුකල පූජා කර්ම ව්‍යාපෘති වලදී කලායතන සමග එක්ව කටයුතු කළ නිසා ඔවුන් පූජා කර්ම සඳහා අවශ්‍ය භාණ්ඩ දෙපාර්තමේන්තුවට සපයා දෙන ලදී. එම නිසා එම ව්‍යාපෘතිවල මුදල් ඉතිරියක් පෙන්නුම් කෙරුණි. එසේම දෙපාර්තමේන්තුව සතුව ක්ෂේත්‍ර රාජකාරි සඳහා සේවයේ නියුක්ව සිටිනුයේ සංවර්ධන නිලධාරීන් පස් දෙනෙකු හා සංස්කෘතික නිලධාරීන් තිදෙනෙකු පමණි. ඒ අතුරින් සංවර්ධන නිලධාරීන් පස් දෙනා ආයතන කටයුතුවලට වැඩි වශයෙන් දායක වේ. මේ අනුව මානව සම්පත් දෙපාර්තමේන්තුව තුළ උපරිම උපයෝජනයක් සිදුවිය.

එසේම දෙපාර්තමේන්තුවට වෙන් කර තිබූ සියළුම මූලධන වියදම් 95% ක පමණ උපයෝජනයක් සිදු විය.කාර්ය සාධනය කරා ළඟා වීමේදී මුහුණ දුන් අභියෝග හා ගැටළු

01. ක්ෂේත්‍ර නිලධාරීන් ප්‍රමාණවත් නොවීම
02. කළමනාකරණ සහකාර නිලධාරීන් ප්‍රමාණවත් නොවීම
03. දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන්ට පරිගණක නොමැති වීම

## ආයතනයේ සහ අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය.

| අරමුණු | ඉලක්ක | |
|---|---|---|
| | 2020 | 2021 |
| 01.අත්‍යවශ්‍ය භෞතික සම්පත් සහිත දැහැමි පාසල් පද්ධතියක් සහ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කරගත් දහම් පාසල් ප්‍රජාවක්. | දහම් පාසල් 50 | දහම් පාසල් 60 |
| 02.දක්ෂ කලාකරුවන්ගේ නිර්මාණ එළි දැක්වීමේ කාර්යක්ෂම ක්‍රමවේදයක් සකස් කිරීම. | කලා උළෙල 01 | කලා උළෙල 01 |
| | ප්‍රාදේශීය කලා උළෙල 26 | ප්‍රාදේශීය කලා උළෙල 26 |

| | | |
|---|---|---|
| පළාතේ සංස්කෘතිකාංග අඛණ්ඩව පවත්වාගෙන යාම හා සංස්කෘතික සංරක්ෂණය කිරීම. | සාම්ප්‍රදායික නර්තන අංග හා සංගීත අංශ 15 ක් සංරක්ෂණය. | සාම්ප්‍රධායික නර්තන අංග හා සංගීත අංශ 20 ක් සංරක්ෂණය. |
| | ජන කථා හා ජනප්‍රවාද ඇතුළත් කෘති 01 ක් පිටපත් 500 ක් මුද්‍රණය | ජන කථා හා ජනප්‍රවාද ඇතුළත් කෘති 01 ක් පිටපත් 500 ක් මුද්‍රණය. |
| ඉහළ ධාරිතාවයකින් යුත් කලායතන පද්ධතියක් හා කලාකරුවන් පිරිසක් බිහි කිරීම. | නව කලායතන 10 ක් ලියාපදිංචි කිරීම. | නව කලායතන 20 ක් ලියාපදිංචි කිරීම. |
| | පුහුණු වැඩ සටහන් 03 ක් පැවැත්වීම | පුහුණු වැඩ සටහන් 05 ක් පැවැත්වීම |
| | ප්‍රාදේශීය වශයෙන් පුහුණු මධ්‍යස්ථාන 10 ක් ඇති කිරීම. | ප්‍රාදේශීය වශයන් පුහුණු මධ්‍යස්ථාන 10 ක් ඇති කිරීම. |
| පළාතේ ආගමික පුනර්ජීවනය වෙනුවෙන් සංවර්ධන කාර්යන් ඉටු කිරීම. | ඓතිහාසික දළදා පෙරහැර පැවැත්වීම | ඓතිහාසික දළදා පෙරහැර පැවැත්වීම |
| | ප්‍රදේශයේ පවතින ආගමික උත්සව 20ක් සඳහා අනුග්‍රහය දැක්වීම. | ප්‍රදේශයේ පවතින ආගමික උත්සව 25 ක් සඳහා අනුග්‍රහය දැක්වීම |
| | ආගමික සිද්ධස්ථාන 50 ක් සංවර්ධනය කිරීම. | ආගමික සිද්ධස්ථාන 60 ක් සංවර්ධනය කිරීම. |

## 1.පළාත් කලා උළෙල

29 වන උතුරු මැද කලා උළෙල මෙවර ද ඉතා උත්කර්ෂවත් අයුරින් පැවැත්වීමට හැකිවිය. උතුරු මැද කලාකරුවන් ජාතික තලය වෙත දායාද කිරීමේ මූලික පියවර වන්නේ පළාත් කලා උළෙලයි. මෙහි දී පළාතේ කලාශිල්පීන් එකම වේදිකාවක් මතට එක් කිරීම සුවිශේෂී කාර්යයක් විය. මෙහිදී චිත්‍ර, නැටුම්, සංගීත, සාහිත්‍ය, කෙටි චිත්‍රපටි, නාට්‍ය, ඡායාරූප, නිවේදන ආදී විවිධ ක්ෂේත්‍ර ඔස්සේ මෙම තරඟ පැවැත්වේ.

2018 වර්ෂයේ උතුරු මැද කලා උළෙල සඳහා රු.මි.5.00 ක මුදලක් වෙන්කර තිබිණි. ඒ අනුව 2018 වර්ෂයේ 29 වන උතුරු මැද කලා උළෙල අනුරාධපුර මධ්‍ය විද්‍යාලයේදී දින දෙකක් පුරා උත්කර්ෂවත්ව පැවැත්විය.

## 2.සුභාෂණ සඟරාව

උතුරු මැද පළාත තුළ විසිරී සිටින ලේඛකයන්ගේ ලේඛණ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා සහ උසස් නිර්මාණයක් පාඨකයාට ඉදිරිපත් කිරීමේ අරමුණින් සුභාෂණ සංස්කෘතික සඟරාව පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණයකර නොමිලේ පාඨකයා වෙත බෙදා හැරීම සිදු කරයි. 2018 වසරේ රු.මි 0.2 ක මුදලක් පමණක් වෙන් වී තිබීම නිසා එක් කලාපයකින් සඟරා 600 ක් මුද්‍රණය විය.

## 3.කලා ප්‍රසංග පැවැත්වීම

උතුරු මැද පළාත් සභාව යටතේ සුරපුර එළිමහන් රංගපීඨය තුළ හෝ පළාතේ තෝරාගත් සුදුසු ස්ථානයක නාට්‍ය දර්ශනයක් හෝ නර්තන, සංගීත ප්‍රසංගයක් නොමිලේ ප්‍රදර්ශනය කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු විය. මෙහිදී නව පාසල් විෂය නිර්දේශයේ ඇතුළත් නාට්‍ය පාසල් ළමුන්ට ප්‍රදර්ශණය කෙරුණි. එසේම උතුරු මැද පළාතේ දුෂ්කර ප්‍රදේශවල නාට්‍ය ප්‍රදර්ශණය කෙරුණි. මේ යටතේ පහත සඳහන් ස්ථානවලදී වේදිකා නාට්‍ය හා රස වින්දන වැඩසටහන් ප්‍රදර්ශණය කෙරුණි.

- අ/දේවානම්පියතිස්ස විද්‍යාලයේ රසවින්දන වැඩ සටහන.
- සුරපුර එළිමහන් රංගපීඨයේ අන්දරේලා වේදිකා නාට්‍ය.
- දිඹුලාගල විලයාය මහ විද්‍යාලයේ කැළණි පාලම වේදිකා නාට්‍ය.
- සුරපුර එළිමහන් රංගපීඨයේ සකුණ සර ප්‍රසංගය.
- ලෝක ළමා දිනය වෙනුවෙන් සමනලී වේදිකා නාට්‍ය.
- මහඉලුප්පල්පම පුරනැගුම ශ්‍රවණාගාරයේදී සුභ සහ යස වේදිකා නාට්‍ය.
- අනුරාධපුර මධ්‍ය විද්‍යාල ශ්‍රවණාගාරයේදී රාස්ස පරාස්ස වේදිකා නාට්‍ය.
- අනුරාධපුර මධ්‍ය විද්‍යාල ශ්‍රවණාගාරයේදී ඩී.කේ. ආටිගලගේ මෙන්න අපේ රජ්ජුරුවෝ වේදිකා නාට්‍ය.

## 4.ආගමික කටයුතු

i. ඓතිහාසික දළදා පෙරහැර

අතීතයේ සිට ලාංකික ශ්‍රී විභූතිය පෙන්නුම් කරන ඓතිහාසික දළදා පෙරහැර මෙවරද පැවැත්විණි. එහි සංස්කෘතික අංග ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය නර්තන ශිල්පීන් සම්බන්ධ කරමින් දළදා පෙරහැරේ කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය කටයුතු මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලැබෙයි.

ii. අනුරාධපුර පොළොන්නරුව පෙරහැර අවස්ථාවන් සඳහා අනුග්‍රහය දැක්වීම

උතුරු මැද පළාතේ පවත්වන අනෙකුත් පෙරහැර සඳහා දායකත්වය සැපයීම මෙහිදී සිදු කෙරුණි.

iii. අනුග්‍රාහකත්වය ලබාදෙන වෙනත් ආගමික උත්සව

උතුරු මැද පළාත තුළ ඉපැරණි සම්ප්‍රදායන් හා බැඳුණු විශේෂ ආගමික උත්සව රාශියක් පවතී. එම උත්සව සහ අක්ත්‍ර පත්‍ර පිළිගැන්වීම, සෙත් පිරිත් සජ්ඣායනා,ආදාහන පූජෝත්සව සඳහා ද අනුග්‍රහය ලබා දීම මේ යටතේ සිදු කෙරුණි.

iv. ආගමික සිද්ධස්ථාන සංවර්ධනය

විවිධ ආර්ථික දුෂ්කරතා මැද පවත්වාගෙන යන ආගමික සිද්ධස්ථාන සඳහා ආධාර ලබා දීම මේ යටතේ සිදු විය.

## 5.නැටුම් හා ගායන හැකියා වර්ධනය

### 5.1.පළාත් රාජ්‍ය නර්තන කණ්ඩායම

උතුරු මැද පළාතේ නර්තන හැකියාවන්ගෙන් යුත් ආධුනික ශිල්පීන් එක්රැස් කරමින් පුහුණු දීමනාවක් සහිතව පුහුණුවීම් ලබා දෙමින් ඔවුනගේ හැකියාවන් පළාත තුළ (රාජ්‍ය උත්සව වෙනත් උත්සව සඳහා දායකත්වය සපයමින්) මෙන්ම ජාතික හා ජාත්‍යන්තර තලය වෙත රැගෙන යාමත්, රජයේ අදායමට දායක වීමත් සාම්ප්‍රදායික කලාවන් අනාගත පරපුර වෙත දායාද කිරීමත් මෙයින් සිදු වේ. 2018 වර්ෂයේ මූලධන වියදම් යටතේ වෙන් කර තිබූ රු.මි. 0.5 මුදලින් නර්තන කණ්ඩායම සඳහා අවශ්‍ය භාණ්ඩ හා ඇඳුම් මිලදී ගැනීම සිදු විය.

### 5.2 පළාත් රාජ්‍ය සංගීත කණ්ඩායම

පළාතේ ගායන හා වාදන හැකියාවන් ඇති ආධුනික ශිල්පීන් 15 දෙනෙකුගෙන් යුත් මෙම කණ්ඩායම පුහුණුවීම්වල නිරත වේ. සුභාවිත සංගීතය මෙන්ම ශාස්ත්‍රීය සංගීතය පිළිබඳ අවබෝධය ද මෙයින් ලබා දෙනු ඇත. පළාතේ සුවිශේෂි ප්‍රසංගයන් සඳහා මෙම කණ්ඩායමේ දායකත්වය ලබා දෙනු ඇත. 2018 වර්ෂයේ මූලධන වියදම් යටතේ වෙන් කර තිබූ රු.මි. 0.5 මුදලින් සංගීත කණ්ඩායම සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම සිදු විය.

## 6.දහම්පාසල් සංවර්ධනය

දැහැමි ගුණගරුක සමාජයක් බිහි කිරීමේ අරමුණින් යුතුව, උතුරු මැද පළාත තුළ විසිරී පවතින දහම්පාසල් වල භෞතික අවශ්‍යතා සම්පූර්ණ කිරීම මේ යටතේ සිදු විය. දහම් පාසල් වල භෞතික අවශ්‍යතා සම්පූර්ණ වීම මඟින් දහම් අධ්‍යාපනය වෙත සිසුන් වැඩ වැඩියෙන් යොමු කිරීමට අපේක්ෂිතය.

## 7.පුහුණු වැඩමුළු පැවැත්වීම

උතුරු මැද කලා උළෙලට සමගාමීව පළාතේ කලායතන හා සියළුම කලාකරුවන්ගේ දැනුම අවබෝධය වර්ධනය කිරිම අරමුණු කරගනිමින් කලා ක්ෂේත්‍රයේ ප්‍රවීනයන් හා විශ්වවිද්‍යාල අචාර්ය වරුන් සම්බන්ධ කර ගනිමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා මුසු වූ වැඩමුළු පැවැත්වීම මෙහිදී සිදු කෙරේ. 2018 වර්ෂයේ මේ සඳහා රු.මි 3.8ක ප්‍රතිපාදන මුදලක් දෙපාර්තමේන්තුව වෙත ලැබිණි. මෙහිදී උතුරු මැද පළාතේ සියළුම ප්‍රාදේශීය සභා නියෝජනයවන පරිදි ප්‍රාදේශීය සභා මට්ටමින් වැඩමුළු පැවැත්විය.

## 8.පාරම්පරික පූජා කර්ම පැවැත්වීම

මෙමගින් අපේක්ෂා කරන ලද්දේ සාම්ප්‍රදායාක පූජා කර්ම වර්තමාන පරම්පරාවට දැක ගැනීමට සැලැස්වීම හා පාසල් විෂය නිර්දේශයේ ඇතුළත් වී ඇති බැවින් පාසල් දරුවන්ගේ දැනුම වර්ධනය කිරීම හා මතුපරම්පරාව වෙත දැක ගැනීම සඳහා වීඩියෝ ගත කර සංරක්ෂණය කර තැබීම සිදු විය. මේ යටතේ පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව මඟින් පාරම්පරික පූජා කර්ම 05 ක් පැවැත්විය. ඒවා නම්,

- දහඅට සන්නිය ශාන්ති කර්මය
- පහන් මඩුව ශාන්ති කර්මය
- කෝලම් මඩුව ශාන්ති කර්මය
- කොහොඹා කංකාරිය ශාන්ති කර්මය
- දෙවොල් මඩුව ශාන්ති කර්මය පවත්වන ලදී.

## 9.යන්ත්‍ර සූත්‍ර සවිකිරීම හා උපකරණ

මෙහිදී දෙපාර්තමේන්තුවේ ධාරිතා සංවර්ධනය ප්‍රධාන අරමුණු කරගනිමින් දෙපාර්තමේන්තුව සඳහා ජෙනරේටරයක් මිලදී ගැණුනි. එසේම දෙපාර්තමේන්තු සඳහා අවශ්‍ය මේස 04 ක් සහ කබඩ් 28 ක් සවි කරන ලදී.

දෙපාර්තමේන්තුවේ සංස්කෘතික අධ්‍යක්ෂතුමිය ඇතුළුව කාර්ය මණ්ඩලයේ විස්සක් සේවයේ නියුක්තව සිටී. මෙම දෙපාර්තමේන්තුව සඳහා මූලධන වියදම් සඳහා 2018 වර්ෂයේ රු.මි. 48.5 මුදලක් වෙන් කර තිබිණි. පුනරාවර්ථන වියදම් ලෙස රු.මි 21.1 ක මුදලක් වෙන්කර තිබිණි. එසේම දෙපාර්තමේන්තුවට අදාල සියළුම භෞතික සම්පත් මනා ලෙස උපයෝජනය කෙරුණි.

එසේම දෙපාර්තමේන්තු මිලදී ගැනීම් සිදු කිරීමේදී රජයේ ප්‍රසම්පාදන ප්‍රතිපත්තිවලට යටත්ව අවම මුදල් භාවිතා කරමින් මිලදී ගැනීම් සිදු කරන ලදී. එසේම දෙපාර්තමේන්තුව සිදුකල පූජා කර්ම ව්‍යාපෘතිවලදී කලායතන සමග එක්ව කටයුතු කළ නිසා ඔවුන් පූජා කර්ම සඳහා අවශ්‍ය භාණ්ඩ දෙපාර්තමේන්තුවට සපයා දෙන ලදී. එම නිසා එම ව්‍යාපෘතිවල මුදල් ඉතිරියක් පෙන්නුම් කෙරුණි. එසේම දෙපාර්තමේන්තුව සතුව ක්ෂේත්‍ර රාජකාරි සඳහා සේවයේ නියුක්ව සිටිනුයේ සංවර්ධන නිලධාරීන් පස් දෙනෙකු හා සංස්කෘතික නිලධාරීන් තිදෙනෙකු පමණි. ඒ අතුරින් සංවර්ධන නිලධාරීන් පස් දෙනා ආයතන කටයුතුවලට වැඩි වශයෙන් දායක වේ. මේ අනුව මානව සම්පත් දෙපාර්තමේන්තුව තුළ උපරිම උපයෝජනයක් සිදුවිය.

එසේම දෙපාර්තමේන්තුවට වෙන් කර තිබූ සියළුම මූලධන වියදම් 95% ක පමණ උපයෝජනයක් සිදු විය. කාර්ය සාධනය කරා ළඟා වීමේදී මුහුණ දුන් අභියෝග හා ගැටළු, ක්ෂේත්‍ර නිලධාරීන් ප්‍රමාණවත් නොවීම, කළමනාකරණ සහකාර නිලධාරීන් ප්‍රමාණවත් නොවීම, දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන්ට පරිගණක නොමැති වීම වැනි අභියෝග හා ගැටළුවලට මුහුණ දීමට සිදුවිය.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2018 වර්ෂයේ පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව සමස්තයක් වශයෙන් සියළුම ඉලක්ක ළඟා කර ගත හැකි විය. යෝජනා කල සියළු ව්‍යාපෘති ඉටු කර ඇත. ආගමික සිද්ධස්ථාන ව්‍යාපෘතියේ රු. මි.6.2 ක මුදලක් වෙන් කර තිබිණි. එම මුදලින් රු.මි. 2.9 ක මුදල සඳහා ප්‍රධාන අමාත්‍යාංශයය විසින් අක් මුදල් ලබා නොතිබීම නිසා මෙම වර්ෂයේදී ලබා දීමට නොහැකි විය.

එසේම දහම් පාසල් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු. මි.5.00 ක් වෙන් කර තිබුණද අක් මුදල් නොමැති වීම නිසා රු.මි 0.8 ක මුදලක් ලබා දීමට නොහැකි විය. අනෙකුත් සියළුම ව්‍යාපෘති දෙපාර්තමේන්තුව සාර්ථකව ලෙස නිම කර ඇත.

2018 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ අරමුණු කරා ලගා වීම සඳහා පහත සඳහන් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරුණි.

# 6.4. සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු :

1990 අංක 11 දරණ උතුරු මැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය පිහිටුවීම පිළිබඳ වූ ප්‍රඥප්තියට අනුකූලව උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය යටතේ පරිපාලනය වන්නාවූ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස හැදින්විය හැකිය. 1990 මැයි මස 01 දින එවකට හිටපු පළාත් ප්‍රධාන අමාත්‍යය පී. ඩී මහින්ද සෝම මහතා විසින් ග්‍රාමීය මාර්ග සංවර්ධන කටයුතු සඳහා මෙම ආයතනය ආරම්භ කර ඇත.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු වැඩපළක් ලෙස නැවත මෙම පරිශ්‍රය පළාත් සභාව වෙත පවරා ගනිමින් අනතුරුව සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය නමින් ස්ථාපිත කරන ලදි.

ආරම්භයේදී මෙම ආයතනය මගින් පළාතේ කෘෂිකාර්මික , වාරිමාර්ග, මහාමාර්ග ඉදිකිරීම්, ගොඩනැගිලි නඩත්තු කටයුතු සිදු කිරීම වාහන සහ යන්ත්‍ර/සූත්‍ර අළුත්වැඩියාව හා සේවා කිරීම මෙන්ම පළාතේ මුල් පෙලේ මුද්‍රණාලයක්ද මෙම ආයතනය සතුව ඇත. ඒ අනුව ගුණාත්මකභාවයෙන් සහ කාර්යක්ෂම ලෙස අඩු පිරිවැයක් යටතේ අවශ්‍ය මුද්‍රණ ඇණවුම් ලබාදීමේ හැකියාවක් ආයතනය සතුව ඇත.

වර්ෂ 2017 අවසාන භාගයේදී එවක පළාත් ප්‍රධාන අමාත්‍යවරයා ලෙස කටයුතු කළ පේශල ජයරත්න බංඩාර මැතිතුමාගේ සංකල්පය අනුව ආරම්භ කරන ලද උතුරු මැද පළාත් සභා ආරක්ෂක ඒකකයද මෙම ආයතනය හරහා ක්‍රියාත්මක වේ. මේ වනවිට රැකියා විරහිත තරුණ තරුණියන් සියයකට ආසන්න ප්‍රමාණයක් සේවා නියුක්තව සිටී. එයද පළාතේ සේවා වියුක්තියට විසඳුමක් හා ජනතාවගේ ආර්ථික තත්ත්වය නගා සිටුවීමට පිටුවහලක් ලෙස හැදින්විය හැකිය.

## දැක්ම

**"1990 අංක 11 දරණ ප්‍රඥප්තියෙන් ලැබී ඇති විධි විධාන අනුව ස්ථාපිතකර ඇති මෙම ආයතනය මගින් පළාතේ කෘෂිකාර්මික, වාරි මාර්ග හා මහා මාර්ග ඉදි කිරීම්, ගොඩනැගිලි නඩත්තු කටයුතු වාහන හා යන්ත්‍ර සූත්‍ර නඩත්තුව, අලුත්වැඩියා කටයුතු වාහන සේවා කිරීම් කටයුතු හා සියළුම මුද්‍රණ කටයුතු මනා ගුණාත්මක භාවයෙන් යුතුව කාර්යක්ෂම ලෙස අඩු පිරිවැයකින් සපයා දීමෙන් උතුරු මැද පළාත් සභාවේ ඉලක්කගත සැලසුම්වලට සහාය දීම".**

## මෙහෙවර

"උතුරු මැද පළාතේ වාරි මාර්ග ඉදි කිරීම් සඳහා යන්ත්‍ර/වාහන සැපයීම් යන්ත්‍ර හා වාහන අළුත්වැඩියාවන් හා වාහන සේවා සැපයීම, රාජ්‍ය හා පුද්ගලික අංශයන්හී සියලුම මුද්‍රණ කටයුතු කලට වේලාවට කාර්යක්ෂමව ඉටුකර දීම හා වෙනත් ව්‍යාපෘති කටයුතුවලට දායක වීමෙන් පළාතේ ජනතාවගේ ආර්ථික වෘත්තීය සඳහා දායක වීම".

## දිගුකාලීන අරමුණු හා කෙටිකාලීන අරමුණු

- උතුරු මැද පළාත් සභාවට අරමුදල් සපයන මූලාශ්‍රයක් බවට පත් වීම සඳහා කටයුතු කිරීම.
- පළාත් සභාවට බහුවිධ සේවාවන් සපයන ආයතනයක් බවට පත් කිරීමේ අරමුණින් මුද්‍රණ, යාන්ත්‍රික හා සේවා අංශයන්ගෙන් ලබා දෙන සේවාවන් පුළුල් කිරීම තුළින් උතුරු මැද පළාත තුළ ප්‍රමුඛතම සේවා සපයන ආයතනයට පත්වීම
- විවිධ අංශ කෙරෙහි වෙන්වෙන් වශයෙන් වූ පරිපූර්ණ දැනුම හා කුසලතාවයෙන් උසස් මානව සම්පතක් බිහි කිරීම තුළින් පළාතේ හදිසි ඕනෑම අවශ්‍යතාවයකදී දායක වීමට හැකිවන අයුරින් කටයුතු කිරීම.
- නවීන තාක්ෂණය හා කාර්යක්ෂමතාවයකින් ඉහළ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහිත ආයතනයක් බවට පත්වීම තුළින් පළාත් සංවර්ධනයට දායක වීම.
- රජය විසින් ක්‍රියාත්මක කරන ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාවට නැංවීම සඳහා එමගින් රජය විසින් අපේක්ෂා කරන අරමුණු ළඟා කිරීම සඳහා සක්‍රීයව දායකවන ආයතනයක් බවට පත් වීම.

## කෙටිකාලීන අරමුණු

- යාන්ත්‍රික, මුද්‍රණ හා සේවා අංශයන් සංවර්ධනය කිරීම සඳහා නව යන්ත්‍ර සූත්‍ර මිලට ගැනීම.
- සියළුම ඉදි කිරීම් හා යාන්ත්‍රික කටයුතු නිසිප්‍රමිතියට හා කලටවේලාවට සිදු කර ගැනීම.
- පෞද්ගලික අංශය හා තරඟ කිරීමට හැකිවන පරිදි මුද්‍රණ අංශය සංවර්ධනය කිරීම.
- යන්ත්‍ර වාහන කුලී පදනම මත ලබාදීම තුළින් ආදායම් තත්වය වර්ධනය කිරිමටකටයුතු කිරීම.
- වාහන සේවා අංශ මගින් අවම මිලට කඩිනම් සේවය.

## ප්‍රධාන කාර්යයන්


- රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි මුද්‍රණ කටයුතු සිදු කිරීම.
- වාහන අළුත්වැඩියා හා සේවා කටයුතු.
- ටයර් සේවා කටයුතු සිදු කිරීම.
- උතුරු මැද පළාත තුළ විශේෂ ව්‍යාපෘති සඳහා දායක වීම.
- යන්ත්‍ර කුලී පදනම මත ලබා දිම.
- පළාත් සභාවට හා අනුයුක්ත රාජ්‍ය ආයතනයන්ට ආරක්ෂක හා සනීපාරක්ෂක සේවා සැපයීම.
- ආපදා කටයුතුවලදී ජංගම සේවාවන් පැවැත්වීම.
- ප්‍රායෝගික පුහුණු හා උපදේශන කටයුතු සපයමින් සම්පත්දායකයෙකු ලෙස කටයුතු කිරීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ❖ මුද්‍රණ අංශය මගින් කරනු ලබන සියළුම මුද්‍රණ කටයුතු සඳහා නිසි ප්‍රමිතියට අනුව නියමිත වේලාවට ලබා දීම සඳහා නවීන යන්ත්‍ර සූත්‍ර උපයෝගී කර ගැනීම.
- ❖ යන්ත්‍ර/වාහන කුලියට දීමෙන් ලැබෙන ආදායම් වැඩිකර ගැනීම සඳහා වැඩි වශයෙන් රාජ්‍ය හා පුද්ගලික අංශයන් වෙත යන්ත්‍ර/වාහන සැපයීම අරමුණකි.
- ❖ වාහන සේවා අංශය මගින් අවම මිලට කඩිනමින් සේවාවන් ලබා දීම.
- ❖ ආයතනයේ පළපුරුදු කාර්යක්ෂම කාර්මිකයින් ලවා වාහන අළුත්වැඩියා කිරීම සඳහා නවීන යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීම.
- ❖ සියළුම ඉදි කිරීම් හා වෙනත් ව්‍යාපෘති කටයුතු නිසි ප්‍රමිතියට අනුව කලට වේලාවට සිදුකර ගැනීම.
- ❖ ඉහත ප්‍රධාන කාර්යයන්වලට අදාලව දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතනවල අනුග්‍රහය ලබා ගැනීම සඳහා ප්‍රධාන අමාත්‍යාංශයේ සහාය ලබා ගැනීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 58 |
| 2 | සේවයේ නියුතු | 53 |
| 3 | පුරප්පාඩු | 05 |
| 4 | අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් | 19 |
| 5 | අධිසේවක පදනම | 01 |
| | එකතුව | 78 |




## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| 1. පුද්ගල පඩිනඩි | 31.60 | 27.20 | 4.40 | 86.10 |
| **එකතුව** | **31.60** | **27.20** | **4.40** | **86.10** |

## මුලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදි කිරිම් | 1.50 | 1.24 | 0.26 | 82.66 |
| වාහන | 3.50 | 3.07 | 0.43 | 87.71 |
| වෙනත් මුලධන වත්කම් පුනරාවර්තන හා වැඩි දියුණු කිරීම | 1.50 | 1.30 | 0.19 | 86.66 |
| **එකතුව** | 6.50 | 5.61 | 0.88 | 86.4 |

## ආදායම් ඉපයීම - 2018

| ශීර්ෂය | ඉලක්කය (රු.මි) | සත්‍ය ආදායම (රු.මි) | එකතු කිරීමේ ප්‍රගතිය (%) |
|---|---|---|---|
| මුද්‍රණාල ආදායම | 100.00 | 80.09 | 80.1 |
| යන්ත්‍ර කුලී ආදායම | 6.00 | 5.42 | 90.3 |
| වාහන අළුත්වැඩියාව | 4.00 | 2.59 | 64.8 |
| සේවා අංශය | 4.00 | 2.39 | 59.6 |
| ටයර් සේවා ආදායම | 2.50 | 1.68 | 67.1 |
| ආරක්ෂක සේවය වෙනත් ඉපයීම් | 40.00 | 37.37 | 93.4 |
| **එකතුව** | **156.50** | **129.54** | **82.8** |

## දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධ ව්‍යාපෘති ප්‍රගතිය.

### මුද්‍රණ අංශය මගින් කරන ලද ආදායම් උත්පාදන කටයුතු - 2018


| අනු අංකය | ආයතනය | අරමුණු ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය/ ව්‍යාපෘති | වටිනාකම |
|---|---|---|---|
| 01. | මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය | 01.වසරේ සෑම මසකම මුද්‍රණය කරන ටික්කි ටිකිරි පුවත් පත. | 11,076,963.50 |
| | | 02.2018 පෙරපාසල් නාම ලේඛන මුද්‍රණය. | 145,500.00 |

| අනු අංකය | ආයතනය | අරමුණ ඉටු කර ගැනීම ස දහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය/ ව්‍යාපෘති | වටිනාකම(රු) |
|---|---|---|---|
| 02. | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 01. 2018 මධ්‍ය වාර විභාග ප්‍රශ්ණ පත්‍ර මුද්‍රණය.<br>02. 2018 අවසාන වාර විභාග ප්‍රශ්ණ පත්‍ර මුද්‍රණය.<br>03. ප්‍රතිප්‍රබෝධා ප්‍රශ්ණ පත්‍ර මුද්‍රණය.<br>04. දින පොත් සහ ක්ෂේත්‍ර සටහන් පොත් මුද්‍රණය.<br>05. විවිධ සහතික පත්‍ර සහ පොත් මුද්‍රණය. | 25,605,581.00<br>26,871,683.00<br>4,412,198.00<br>1,310,580.00<br>2,309,042.50 |
| 03 | කළමණාකරන පුහුණු ඒකකය | ආකෘති පත්‍ර මුද්‍රණය. | 348,540.00 |
| 04 | පලාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව. | ආකෘති පත්‍ර මුද්‍රණය. | 233,210.00 |
| 05 | ප්‍රධාන අමාත්‍යාංශය | නිබන්ධන පොත් මුද්‍රණය. | 480,000.00 |
| 06 | පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව | සහතික පත්‍ර මුද්‍රණය. | 292,320.00 |

## සේවා අංශය ආදායම් උත්පාදන කටයුතු - 2018

වර්ෂ 2018 දී සේවා අංශය ඉහල ප්‍රගතියක් ලගා කරගෙන තිබෙන අතර ආයතනය විසින් විශාල ආයෝජනයක්ද ඒ වෙනුවෙන් සිදු කර තිබේ.

| වර්ෂය | සේවා කළ වාහන ප්‍රමාණය | වටිනාකම රු.මිලි |
|---|---|---|
| 2017 | 34 | 0.70 |
| 2018 | 143 | 2.39 |




2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂය තුළ සේවා කළ වාහන ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහල ගොස් ඇති බව පෙනී යන අතර ඒ තුළින් ලද ආදායම ද ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි

## ආරක්ෂක අංශය උත්පාදන කටයුතු - 2018

වර්ෂ 2018 දී රාජ්‍ය ආයතන සමග ආරක්ෂක සේවාව සැපයුම සම්බන්ධව ගිවිසුම් ගත වීමට හැකිවිය.

| අනු අංකය | ආයතනය | ආරක්ෂක නිළධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | පලාත් සභා සංකීර්ණය | 14 |
| 02 | කළමණාකරන සංවර්ධන හා පුහුණු ඒකකය | 05 |
| 03 | පලාත් වාරිමාර්ග දෙපාර්ථමේන්තුව | 02 |
| 04 | පලාත් ඉංජිනේරු දෙපාර්ථමේන්තුව | 08 |
| 05 | ප්‍රධාන අමාත්‍යංශය - සුරපුර | 02 |
| 06 | මැදවච්චිය ආර්ථික මධ්‍යස්ථානය | 02 |
| 07 | පොළොන්නරුව අධ්‍යාපන කළාපය | 08 |
| 08 | හිඟුරක්ගොඩ අධ්‍යාපන කළාපය | 08 |
| 09 | දිඹුලාගල අධ්‍යාපන කළාපය | 08 |
| 10 | පලාත් ග්‍රාම සංවර්ධන දෙපාර්ථමේන්තුව | 01 |
| 11 | පලාත් සමූපකාර සංවර්ධන දෙපාර්ථමේන්තුව | 02 |
| 12 | පලාත් සමාජ සේවා දෙපාර්ථමේන්තුව | 06 |
| 13 | පලාත් සෞඛ්‍ය සේවා දෙපාර්ථමේන්තුව | 02 |
| 14 | පරිවාස හා ළමා රක්ෂණ දෙපාර්ථමේන්තුව | 02 |
| 15 | මහ ඇමති නිළ නිවස | 04 |
| 16 | මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය | 02 |
| 17 | සැලසුම් දෙපාර්ථමේන්තුවේ ව්‍යාපෘති කාර්යාලය | 02 |
| 18 | පලාත් ක්‍රීඩා දෙපාර්ථමේන්තුව | 08 |
| 19 | කර්මාන්ත සංවර්ධන දෙපාර්ථමේන්තුව | 02 |
| **එකතුව** | | **88** |





## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස 2018

සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සියට වර්ශ 2018 ඉතා කාර්යබහුල වර්ශයක් විය. මන්ද යත්, වර්ෂ 2017 දී ආරම්භ කරන ලද ව්‍යාපෘතීන් රාශියක් අවසන් කර ගැනීමට හැකි වූ වර්ෂයක් ලෙස පෙන්වා දිය හාකිය. එමෙන්ම ආයතනයක් ලෙස අපේක්ෂිත අරමුදල් හා ඉලක්ක ලඟා කර ගත් වර්ශයක් ලෙස ද වර්ෂ 2018 හැඳින්විය හැකිය.

උතුරු මැද පලාත් හිටපු ආණ්ඩකාරවර එම්.පී.ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අලුත්වැඩියා කරන ලද නව සේවා අංගනය විවෘත කිරීමට හැකි විය. නව සේවා අංගනය සඳහා ආයතනය විසින් ආසන්න වශයෙන් රු.මි.2.5 ක පමණ ආයෝජනයක් සිදු කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ශ 2017 දී සේවා කටයුතු සිදු කළ වාහන 34 ක ප්‍රමාණය වර්ශ 2018 දී 143 දක්වා වර්ධනය කර ගත හැකිවිය.එය ආයතනය ලැබූ විශාල ජයග්‍රහනයකි.උතුරු මැද පලාතේ බොහෝ ආයතන සතු වාහන මේ වන විට මෙම ආයතනය තුල ස්ථාපිත සේවා පරිශ්‍රයෙන් සිය කටයුතු සිදු කර ගනු ලැබේ.

එමෙන්ම 2017 දී මූලික සාකච්චා මට්ටමේ පැවති ටොයොටා ලංකා සමාගම සමඟ පැවති අවබෝධතා ගිවිසුම වර්ශ 2018දී ක්‍රියාත්මක කිරීමට ආයතනයට හැකිවිය. එමගින් උතුරු මැද පලාත් සභාව සතු ටොයොටා මාදිලියේ වාහන ඉහල ගුණාත්වයෙන් හා ප්‍රමිතියෙන් යුක්තව සේවා කටයුතු සිදු කර දීමට ආයතනයට හැකිවිය. ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම සහ උපදෙස් ටොයොටා ලංකා සමාගමින් ලැබිණි.

සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සියේ ප්‍රධානම අංශය වන මුද්‍රණ අංශයද වර්ෂ 2017 දී ඉතා කාර්යය බහුල වර්ෂයක් විය. එහි ප්රධාන අභියෝගය වූයේ උතුරු  මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මධ්‍යවාර විභාග පරීක්ෂණය හා අවසාන වාර විභාග ප්‍රශන පත්‍ර මුද්‍රණය කර බෙදාහැරීමයි. මෙය ඉතා වගකීම් සහිත කාර්යක් විය. නමුත් ආයතනයේ සමස්ත සේවකයන්ගේ අප්‍රතිහත ධෛර්ය හා කැපවීම මත වාර දෙකෙහිම ප්‍රශන පත්‍ර මුද්‍රණය කර බෙදා හැරීමේ කටයුතු සාර්ථකව සිදු කරන ලදි. මෙය ආයතනය ලැබූ විශාල ජයග්‍රහණයකි. පසුගිය දශකය පුරා ආයතනය මුහුණ දී තිබූ ගෙවිය යුතු ණය ශේෂයන්, බාහිර පාර්ශවයන්ට තිබූ බැදීම් හා නඩු කටයුතු විශාල ප්‍රමාණයක් නිදහස් හා නිරවුල් කිරීමට මෙමගින් හැකියාව ලැබිණි.එමෙන්ම අඩු පිරිවැයක් යටතේ විභාග ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කර බෙදා හැරීම මගින් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුමේ මුදල් ප්‍රතිපාදන විශාල වශයෙන් ඉතිරි කර දීමට ද හැකි විය.

මුල් ළමාවිය සංවර්ධන අධිකාරියේ මාසිකව ප්‍රකාශයට පත්වන ටික්කි ටිකිරි පුවත්පත මේ වර්ෂය පුරාම ද මුද්‍රණ කටයුතු සිදු කරන ලදි. එය පළාතේ පෙරපාසල් දරුවන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනයට ප්‍රබල පිටුවහලක් විය.

උතුරු මැද පළාත් සභා ආරක්ෂක ඒකකය ද වර්ෂ 2018 පුරා තම මෙහෙයුම් කටයුතු පුළුල් පරාසයක් තුල විහිදුවමින් කටයුතු කරන ලදි. ඒ අනුව රාජ්‍ය ආයතන 22 ක් සමග සහ සම්බන්ධ වී අනුරාධපුර හා පොළොන්නරුව යන දිස්ත්‍රික්ක ආවරණයවන පරිදි සේවා කටයුතු ව්‍යාප්ත කරන ලදි. එමගින් තරුණ තරුණියන් 100කට ආසන්න ප්‍රමාණයකගේ ආර්ථික ක්‍රියාවලියට දායකවීමට හැකි වී තිබේ. එමෙන්ම ආයතනයට විශාල ආදායමක් ලබාගැනීමට හැකි වී තිබේ. පළාත් සභා ආරක්ෂක ඒකකය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශයේ ලියාපදිංචි ආරක්ෂක ඒකකයක් නොවන නිසා එය ලියාපදිංචි කිරීමේ අවශ්‍ය මූලික කටයුතු 2018 වසරේදී ආරම්භ කරන ලදි. එහිදී නව ආරක්ෂක කළමණාකරුවකු ඇතුළු කාර්යමණ්ඩලයක් සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා මූලික අදියරේ කටයුතු සිදුවිය.

නව පරිපාලන ගොඩනැගිල්ලේ තෙවන හා අවසාන අදියරේ ඉදිකිරීම් කටයුතු 2018 වර්ෂය පුරා ක්‍රියාත්මක විය. එය පළාත් සාභා නිශ්චිත ප්‍රධාන යටතේ ක්‍රියාත්මකවන ව්‍යාපෘතියකි. මෙය අවසන් කිරීමේ කටයුතු 2019 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂිතය. 2018 වනවිට එහි භෞතික ප්‍රගතිය 60% - 70% අතර ප්‍රමාණයක් විය.

2018 වර්ෂයේදී මූල්‍ය සමාලෝචනය පිළිබඳ අර්ථ දැක්වීමේදී 2017 වර්ශයට සාපේක්ෂව ඉතා ඉහළ මූල්‍ය කාර්ය සාධනයක් ළඟා කරගෙන ඇති බව පෙනෙන්නට විය. ඒ අනුව 2018 වර්ශයේ සමස්ත මෙහෙයුම් ආදායම ආසන්න වශයෙන් රු.මි. 127 ප්‍රමාණයක් විය.එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 20.95% ක වර්ධනයකි. මෑත ඉතිහාසයේ ආයතනය විසින් ලබා ගත් ඉහළම ආදායම 2018 වර්ෂයේදී ලබාගන්නා ලදි. එය පළාත් සභාවට අරමුදල් සපයන මූලාශ්‍රයක් බවට පත්වීමේ ආයතන දැක්ම සම්පූර්ණ කර ගැනීම සඳහා වූ පෙර සූදානමක් ලෙස හැඳින්විය හැකිය.

# 6.5.මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය

**මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳව සැකෙවින්...**

ළමා අවධිය,මානව සම්පත පසු කරනු ලබන සොඳුරුතම සන්ධිස්ථානයයි. ඒ සොඳුරු කඩයිම පසු කරන කිසිවෙකුත් එම කඩයිම නිදහසේ භුක්ති වින්දේද /භුක්ති විඳින්නට ඉඩ සලසා දෙන්නේ ද යන්න මහත් ගැටළුවකි.

ළමා පරපුරට, වර්තමානය වනවිට අතීතයට වඩා සංකීර්ණ වුත්, හුදකලා වුත්, ජීවිතයක් ගත කිරීමට සිදු වී තිබේ. මීට දශක 5කට පෙර දෙමාපිය වැඩිහිටි ආදරය, කරුණාව, පිළිගැනීම සුරක්ෂිතතාව, ඇගයීම, ප්‍රශංසාව ඇතිව තම නිවසේ හා අවට පරිසරයේ වැඩෙමින් සුන්දර ජීවිතයක් ගත කළ දරුවාගේ සමස්ත සංවර්ධනය සඳහා සුවදායි පරිසරයක් ගොඩනැගුණේ නිතැතිනි.

වැඩිහිටි ජීවන රටාව අවිවේකි වන වර්තමානයේදී දරුවා තම සියළු අයිතිවාසිකම් අහිමි වූ හුදකලාවේ අවධිය වන අ.වු 03-05 කාලයේදී හුදකලා පවුල් පරිසරයෙන් මිදී පෙර පාසල වෙත පිවිස, සම වයස් කණ්ඩායම් සමග සමාජානුයෝජනය වී තම ජීවිතයට අලුත් අත්දැකීම් එක්කර ගනි. මෙම ජීවන රටාවට අවතීර්ණවත්ම දරුවා පෙර පාසල් ගුරුවරිය සමග සමීප වී දරුවා සොයන ආදරය, කරුණාව, පිළිගැනීම, ප්‍රශංසාව ඇයගෙන් ලබා ගැනීමට උනන්දු වේ.

දරුවාගේ කායික හා මානසික ක්‍රියාකාරීත්වය වර්ධනය සඳහා පෙර පාසල් ගුරුවරුන්ගේ ආකල්ප හා ධාරිතා සංවර්ධනය සඳහාත්, දෙමාපිය ආකල්ප වැඩි දියුණු කිරීම සඳහාත් දරුවාගේ ඉගෙනුම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට භෞතික සම්පත් සංවර්ධනය සඳහාත්, මෙවන විට ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ 13 වන සංශෝධනය 09 වැනි උපලේඛනයේ 01 වන ලැයිස්තුවේ 03 වන වගන්තිය ප්‍රකාරව පළාත් සභාවට බලතල පැවරීමේ විධිවිධාන වලට අනුකූලව උතුරු මැද පළාත තුළ විධිමත් හා යහපත් මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධනය කිරීම පිණිස පෙර පාසල් පිහිටුවීම හා අනුසාංගික කාරණා සඳහා විධිවිධාන සැලසීම පිණිස ප්‍රඥප්තියක් පිහිටුවා ඇත. එය අංක 04 දරණ උතුරු මැද පළාත් මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වන ලදී.

එය උතුරු මැද පළාත් සභාව විසින් සම්මත කර 2004 පෙබරවාරි මස 19 වන දින උතුරු මැද පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇත.

ඒ අනුව උතුරු මැද පළාතේ ස්ථාපිත කර ඇත් මුල් ළමාවිය ප්‍රඥප්තියට අනුව පෙර පාසල් පද්ධතිය ගොඩනැගීම සඳහා මේවන විට උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ලබා දුන් ප්‍රතිපාදන වලින් ගුරු පුහුණු වැඩසටහන් සඳහා ද වැය කර ඇත.සෑම දරුවෙකුම සුවිශේෂී වන අතර, සමාන වටිනාකමකින් යුක්ත වේ. දරුවාට ආවේනික වේගයකින් සංවර්ධනය වන අතර, හැකියාවන්ගෙන් හා දක්ෂතාවයන්ගෙන් යුක්ත වේ.





උතුරු මැද පළාත් මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය පෙර පාසල් සමඟ එක්ව ළමා සංවර්ධනයට බලපාන පවුල, ප්‍රජාව හා සංස්කෘතිය යන සාධක හා බැඳුනු සන්දර්භයක් තුල පෙර පාසල් දරුවන්ගේ සංවර්ධනය උදෙසා සමෝධානිත ඉගෙනුමක් ලබා දෙනු ලැබේ. දරුවන්ගේ සංවර්ධනය උදෙසා දරුවන්ට සැලසෙන රැකවරණය ප්‍රමුඛ කොට සලකන අතර, දෙමාපියන්, පෙර පාසල් ගුරුවරුන් හා ප්‍රජාව මේ පිළිබඳව වඩා සැලකිලිමත් විය යුතු ය.

පෙර පාසල් දරුවන්ගේ සෞඛ්‍ය හා කායික සංවර්ධනය, සමාජීය හා චිත්තවේග සංවර්ධනය, ප්‍රජානන හැකියා සංවර්ධනය හා භාෂාව හා මුල් කාලීන සාක්ෂරතාවය ප්‍රමුඛ කොට ගත් ඉගෙනුම් ඵල වලට අදාල නිපුනතාවයන් හෙබි පුංචි දරුවන් තම දැනුම, ආකල්ප, කුසලතා, දියුණු කර ගනිමින් අනාගතය කරා පියනඟනු දැකිම අපගේ අභිප්‍රායයි.

## දැක්ම

"සතුටින් පිරි නිපුණතාවයන්ගෙන් හෙබි සදාචාර සම්පන්න පෙර පාසල් දරුවන් උතුරු මැද පළාත තුළ බිහි කිරීම".

## මෙහෙවර

"උතුරු මැද පළාත තුළ විවිධත්වයෙන් යුතු, මනා ක්‍රියාකාරීත්වයෙන් හෙබි, නිසඟ කුසලතාවයෙන් යුත්, සෞන්දර්යාත්මක හැඟීමෙන් පිරිපුන්, සාරධර්ම සපිරි, පෙර පාසල් දරු පරපුරක් බිහි කිරීම සඳහා මධ්‍යම රජයේ හා පළාත් සභාවේ මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ද සම්බන්ධ කරගනිමින් 2003 අංක 04 දරණ ප්‍රඥප්තියට අනුකූලව වැඩසටහන් සම්පාදනය, සම්බන්ධීකරණය හා ඵලදායි ලෙස මෙහෙයවීම පිළිබඳව පළාතේ කේන්ද්‍රීය ආයතනයක් ලෙස කැපවීමෙන් කටයුතු කිරීම".

## දිගුකාලීන අරමුණු

- ❖ ගුණාත්මක සේවා සපයන පෙර පාසල් ගුරු පද්ධතියක් ඇති කිරීම.
- ❖ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳව මනා දැනුමක් සහිත සමාජයක් ඇති කිරීම.
- ❖ ගුණාත්මක සේවාවක් සපයන ආයතනයක් බවට ආයතනය පත් කිරීම.
- ❖ සංහිඳියාවෙන් යුත් ආයතනයක් (යහපාලනයෙන් යුත්) බවට පත් කිරීම.

## කෙටිකාලීන අරමුණු

- ❖ පෙර පාසල් ගුරුවරුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම.
- ❖ වර්තමාන ළමා ආරක්ෂණයට ගැලපෙන පරිදි දෙමාපියන් දැනුවත් කිරීම.
- ❖ ළමා සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- ❖ පෙර පාසල් ගුරුවරුන්ගේ කුසලතා සංවර්ධනය.
- ❖ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳව ප්‍රජාව බල ගැන්වීම.
- ❖ ආයතනික ධාරිතා සංවර්ධනය.
- ❖ යහපාලන කටයුතු සංවර්ධනය.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ❖ ආයෝජන ධාරිතා පුළුල් කිරීම.
- ❖ මානව සම්පත් සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම.
- ❖ අධිකාරියේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා අදාල ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම.

## මුල්ළමාවිය සංවර්ධන අධිකාරියේ අරමුණු


- ❖ උතුරු මැද පළාත තුළ පෙර පාසල් පිහිටුවීම.
- ❖ කළමනාකරණය,අධීක්ෂණය, ලියාපදිංචිය, ශිෂ්‍යයින් ඇතුළත් කර ගැනීම, ගුරුවරුන් බඳවා ගැනීම සඳහා
- ❖ නිර්ණායක සැකසීම පෙර පාසල් පිහිටුවීම හා ඒවායේ ව්‍යාපෘති පිළිබඳව කටයුතු කිරිම.
- ❖ ඉහත අරමුණු සියල්ල හෝ ඉන් කිසිවක් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ හිතකර විය හැකි වෙනත් සියළු ක්‍රියා කිරීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු හා ක්‍රියාකාරකම්.

| | තිරසර සංවසංවර්ධන | ක්‍රියාකාරකම |
|---|---|---|
| 3 GOOD HEALTH AND WELL-BEING | නිරෝගී ජීවිත සහතික කර සැම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරිම | පෝෂණය පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරිම<br>ස්වස්ථතාවය පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරිම |
| 4 QUALITY EDUCATION | පරිපූර්ණ සාධාරන ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරිම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනිමේ අවස්ථා සැලසීම | පෙර පාසල් පාලිකාවන් සඳහා විවිධ පුහුණු<br>යටිතල පහසුකම් සංවර්ධනය කිරීම |

## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අ.අ | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 40 |
| 2 | සේවයේ නියුතු | 36 |
| 3 | පුරප්පාඩු | 08 |
| 4 | අනියම් | 01 |
| 5 | කොන්ත්‍රාත් | 03 |
| 6 | අනුයුක්තව සිටින නිලධාරීන් | 01 |



## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | 2018 වර්ෂයේ වියදම (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|
| පුද්ගල පඩිනඩි | 16.99 | 100 |
| ගමන් වියදම් | 0.70 | 100 |
| සැපයීම් | 067 | 100 |
| නඩත්තු වියදම් | 1.05 | 100 |
| ගිවිසුම්ගත සේවා | 2.94 | 100 |
| මාරු කිරීම් | 0.33 | 100 |
| **එකතුව** | **22.68** | **100** |

## දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධ ව්‍යාපෘති

| අ.අං | අරමුණ | ව්‍යාපෘතිය/ව්‍යාපෘති | ප්‍රධාන ක්‍රියාකාරකම් | වෙන් කළ මුදල (රු.මි) | වැය කළ මුදල (රු.මි) | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | භෞතික | මූල්‍ය |
| 01 | වෙනස් වන ලෝකයට ගැළපෙන පරිදි ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම | පෙර පාසැල් ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම | ගුරුවරු පුහුණු කිරීම, ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලාවන් පැවැත්වීම | 7.5 | 2.5 | 100 | 33 |

| අ. අං | අරමුණ | ව්‍යාපෘතිය/ ව්‍යාපෘති | ප්‍රධාන ක්‍රියාකාරකම් | වෙන් කළ මුදල (රු.මි) | වැය කළ මුදල (රු.මි) | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | භෞතික | මූල්‍ය |
| 02 | මුල් ළමාවිය අධ්‍යාපනය සම්බන්ධව දැනුවත් කිරීම | දෙමාපිය දැනුවත් කිරීම | දරුවන් හා දෙමාපිය සබැඳියාව | 1.2 | 0.5 | 100 | 42. |
| | | | දරුවන් රැක බලා ගැනීම | | | | |
| | | | දරුවන්ගේ පෝෂණය | | | | |
| | | | පෞද්ගලික ස්වස්ථතාවය | | | | |
| | | | නිර්මාණාත්මක හා සෞන්දර්යාත්මක කුසලතා වැඩිදියුණු කිරීම | | | | |

## 01. උතුරු මැද පළාතේ දරුවන්ගේ මුල් ළමාවිය සංවර්ධනය උදෙසා ක්‍රමෝපායික සංවර්ධන ගමන් මග

පළාතේ පෙර පාසල් අධ්‍යාපනය වඩාත් ඵලදායී මෙන්ම ක්‍රමානුකූල කිරීම සඳහා මෙන්ම මුල් ළමාවිය සංවර්ධනය පළාතේ අනාගත සංවර්ධනය ශක්තිමත් කිරීම උදෙසා භාවිතා කළ හැකිවන අයුරින් මනා ක්‍රියාකාරීත්වයෙන් හෙබි, කුසලතාවයෙන් යුත් සෞන්දර්යාත්මක මෙන්ම සාරධර්ම වලින් සපිරි අනාගත දරු පරපුරක් නිර්මාණය කිරීම සඳහා 2018 වර්ෂයේදී ශීර්ෂ 04ක් ඔස්සේ සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවන ලදී.

**01.**පෙර පාසල්
භෞතික පරිසරය සංවර්ධනය කිරීම

**02.**පෙර පාසල්
ගුරුවරියන්ගේ සමස්ත සංවර්ධනය
හා
දැනුම යාවත්කාලීන කිරීම

03.මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ
දෙමාපිය ආකල්ප
වර්ධනය කිරීම

04.මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ
ප්‍රජාව බල ගැන්වීම

ඒ සඳහා ප්‍රධාන අංශ හතරක් ඔස්සේ 2018 වර්ෂයේදී පළාත් සභා ප්‍රතිපාදන මත මෙන්ම රාජ්‍ය නොවන සංවිධානවල හා පෞද්ගලික ආයතනවල සහයෝගය මත විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

එහිදී පෙර පාසල් භෞතික පරිසරය සංවර්ධනය කිරීම, පෙර පාසල් ගුරුවරියන්ගේ සමස්ත සංවර්ධනය හා දැනුම යාවත්කාලීන කිරීම, මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ දෙමාපිය ආකල්ප වර්ධනය කිරීම හා මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ප්‍රජාව බල ගැන්වීම යන අංශ ශක්තිමත් කිරීම උදෙසා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

**පළාතේ දරුවන්ගේ මුල් ළමාවිය සංවර්ධනය උදෙසා පෙර පාසල් වල ඉගෙනුම් පරිසරය හා භෞතික පරිසරය සංවර්ධනය කිරීම.**


එහිදී අනුරාධපුර හා පොළොන්නරුව යන දිස්ත්‍රික්ක දෙකම ආවරණය වන පරිදි පෙර පාසල්වල පැවති අත්‍යාවශ්‍යයෙන්ම සංවර්ධනය කළ යුතු පෙර පාසල් ගොඩනැගිලි ඉදිකිරීම හා අළුත්වැඩියා කිරීම, සනීපාරක්ෂක පහසුකම් පද්ධතිවල පැවති අළුත්වැඩියා කිරීම් මෙන්ම නව සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම් සිදුකර භාවිතයට ගත හැකි පරිදි ලබා දීමට කටයුතු කරන ලදී.





ඒ යටතේ 2018 වර්ෂයේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රමුඛතාවය අනුව තෝරා ගන්නා ලද පෙර පාසල් 20ක ද පොළොනන්රුව දිස්ත්‍රික්කයේ පෙර පාසල් 10ක ද වශයෙන් පළාතේ පෙර පාසැල් 30ක පමණ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කරමින් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු පහසු කිරීම සඳහා දායකත්වය සපයන ලදී. එසේම පෙර පාසල්වල ජල පහසුකම් ලබා දීම ද මේ යටතේ සිදු වු අතර ඒ සඳහා රු.මි.3ක ප්‍රතිපාදන යොදවන ලදී.

## II. පෙර පාසල් ගුරුවරියන්ගේ සමස්ත සංවර්ධනය හා දැනුම යාවත්කාලීන කිරීම සඳහා 2018 වර්ෂයේ දායකත්වය සැපයීම.




පළාතේ පෙර පාසල් අධ්‍යාපනය ගුණාත්මක බවෙන් ඉහළ මට්ටමකට ගෙන ඒම අරමුණු කරගනිමින් පෙර පාසල් ගුරුවරියන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම සඳහා තෙදින ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමට ද 2018 වර්ෂය තුළදී කටයුතු කරන ලදී.

එසේම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා සම්බන්ධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම පිළිබඳව වන වෘත්තීමය මට්ටම ඉහළ නැංවීම සඳහා සහතික පත්‍ර පාඨමාලා අනුරාධපුර හා පොළොන්නරුව යන දිස්ත්‍රික්ක දෙක තුළම ක්‍රියාත්මක කරන ලදී.

එමෙන්ම මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ සිංහල මාධ්‍යය මෙන්ම දෙමළ මාධ්‍යය ඩිප්ලෝමා පාඨමාලා අනුරාධපුර හා පොළොන්නරුව යන දිස්ත්‍රික්ක දෙක තුළ දී පවත්වන ලදී. එය අදියර දෙකක් යටතේ ක්‍රියාත්මක වේ. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ දෙමළ මාධ්‍යය මුල් ළමාවිය සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලා ක්‍රියාත්මක කරන එකම පළාත ද උතුරු මැද පළාතය. ඒ යටතේ එක් අවුරුදු පාඨමාලාවක් ලෙස ඩිප්ලෝමා පාඨමාලාවක් ක්‍රියාත්මක වන අතර එය අදියර දෙකකින් සමන්විත වන අතර එහි පළමු අදියර 2018 වර්සයේදී අවසන් වූ අතර දෙවන අදියර 2019 වසරේදී අවසන් කිරීමට නියමිතය.



| වැඩසටහන | කාලය | ක්‍රියාත්මක ප්‍රදේශය | මාධ්‍යය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ගුරු පුහුණු ධාරිතා සංවර්ධන (තෙදින) | දින 03 | ප්‍රා.ලේ.කො 29 | සිංහල | 2200 |
| සහතික පත්‍ර | මාස 06 | අනුරාධපුර | සිංහල | 75 |
| | | පොළොන්නරුව | සිංහල | 50 |
| ඩිප්ලෝමා පාඨමාලාව | අ.වු 01 | අනුරාධපුර | සිංහල | 130 |
| | | පොළොන්නරුව | සිංහල | 60 |
| | | අනුරාධපුර | දෙමල | 50 |

## III. දෙමාපිය ආකල්ප වර්ධනය කිරීම හා ප්‍රජාව බල ගැන්වීම



මුල් ළමාවිය සංවර්ධන අවධියේ පසුවන දරුවාගේ කායික හා මානසික සංවර්ධනය උදෙසා දෙමාපියන්ගේ හා වැඩිහිටියන්ගේ කාර්යභාරය ඉතා වැදගත්කමකින් යුතු වේ.එහිදී දරුවා හා දෙමාපියන් අතර මනා සබඳතාවයක් නිර්මාණය කිරීම මගින් දරුවාගේ ආරක්ෂාව තහවුරු කිරීම අපේක්ෂා කරයි. එසේම මුල් ළමාවිය මනා ලෙස සංවර්ධනය කිරීම සඳහා පෝෂණය හා සෞඛ්‍ය මෙන්ම ස්වස්ථතාවය වැඩිදියුණු කිරීම කළ යුතු වේ. ඒ සඳහා සුදුසු වැඩසටහන් පළාත තුළ ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ දෙමාපියන් අවම වශයෙන් 4000ක් පමණ දැනුවත් කරන ලදී.

**දෙමාපිය ආකල්ප වර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක කළ වැඩසටහන් - 2018**

| අ.අ | වැඩසටහන | ප්‍රා.ලේ.කො. සංඛ්‍යාව |
|---|---|---|
| 01 | දරුවන් හා දෙමාපිය සබැඳියාව | 29 |
| 02 | දරුවන් රැක ගැනීම | 29 |
| 03 | දරුවන්ගේ පෝෂණය | 29 |
| 04 | පෞද්ගලික ස්වස්ථතාවය | 29 |
| 05 | නිර්මාණාත්මක හා සෞන්දර්යාත්මක කුසලතා වැඩිදියුණු කිරීම | 29 |

## 02.පෙර පාසල් පාලිකාවන්ගේ වලදායිතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක කරන ලද ක්‍රමෝපායික වැඩසටහන

පෙර පාසල් පාලිකාවන්ගේ ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය ඉහල නැංවීම සඳහා ක්‍රියාත්මක කරන ලද ක්‍රමෝපායික වැඩසටහන යටතේ ගුරුවරුන් සඳහා දිරි දීමනා සැපයීම හා රක්ෂණාවරණ සැපයීම සිදු විය.

පෙර පාසල් සඳහා දිරි දීමනා ගෙවීම 2018 වර්ෂයේදීද ක්‍රියාත්මක විය. ඒ යටතේ රු.2000/=ක දිරි දීමනාවක් මාසික පදනමින් ගෙවන ලදී.පෙර පාසල් ගුරුවරුන් 1950 ක් සඳහා රු.මි.50.42ක් වර්ෂය තුළදී ගෙවන ලදී.එසේම ගුරුවරුන් සඳහා රක්ෂණාවරණ සැපයීම ද සිදු විය.ඒ යටතේ ගුරුවරුන් 2155කට රක්ෂණාවරණය ලබා දෙන ලදී.

## 03. පළාතේ මුල් ළමාවිය අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා වෙනත් රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධානවල හා පෞද්ගලික ආයතනවල දායකත්වය.

පළාතේ පෙර පාසල් පද්ධතියේ යටිතල පහසුකම් සංවර්ධනය හා පෙර පාසල් සංවර්ධන නිලධාරීන්ගේ මෙන්ම ගුරුවරියන්ගේ සංවර්ධනය වෙනුවෙන් තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක වැඩසටහන් පවත්වන ලදී. එහිදී පළමු අදියර ලෙස ම.නු.ප,විලච්චිය,කහටගස්දිගිලිය හා පදවිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඉහත කී වැඩසටහන් ක්‍රියාත්මක විය.තවද හේමාස් අවුට්රිච් පදනම මගින් යුධ හමුදාවේ සහයෝගය ඇතිව රඹෑව දිවියාඋඩබැන්දෑව පෙර පාසල රු.මි. 03ක වියදමින් ඉදිකරන ලදී.

**කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස**

**2017 වර්ෂයේදී අවසන් කරන ලද අනුරාධපුර හා පොළොන්නරුව ආදර්ශ පෙර පාසල් දෙකෙහි කටයුතු ආරම්භ කරන ලදී. ඒ යටතේ ආදර්ශ පෙර පාසල් දෙකම 2018 වර්ෂයේ පළාතේ දූ දරුවන්ට සාර්ථකව මුල් ළමා විය සංවර්ධනය සඳහාවන කටයුතු ක්‍රියාත්මක වේ.**

- 2018 වර්ෂය තුළ පෙර පාසල් ගුරුවරියන් 1950 ක් සඳහා උතුරු මැද පළාතේ කොට්ඨාස 29ක ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. එසේම ධාරිතා පුහුණු වැඩසටහන් සඳහා 2200කට ලබා දුන් අතර ඩිප්ලෝමා හා සහතික පත් පාඨමාලා සඳහා පුහුණුව ලබන පිරිස 365කි.
- දරුවන්ගේ දෙමාපියන් හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් කොට්ඨාස 29 තුළ ක්‍රියාත්මක කිරීම.
- එක් එක් කොට්ඨාසවල සංවර්ධන නිලධාරීන් මඟින් සෞඛ්‍ය, අත්කම්, චිත්‍ර ආදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- නවක සංවර්ධන නිලධාරීන් මඟින් සිදු කරන පෙර පාසල් නියාමනය.
- බාහිර ආයතන සමඟ ක්‍රියාත්මක වැඩසටහන්

ප්ලෑන් ශ්‍රී ලංකා ආයතනය හා හේමාස් අවුට්රිච් පදනම සහයෝගය සහිතව විලච්චිය, කහටගස්දිගිලිය, පදවිය, මනුප ආදී කොට්ඨාසවල දරුවන්ගේ සනීපාරක්ෂාව පිළිබඳ වැඩසටහන්, සෞඛ්‍ය හා පෝෂණය, සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් ආදිය පෙර පාසල් ගුරුවරුන් සඳහා ක්‍රියාකාරකම් කිරීම හා පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක වූ අතර අපේක්ෂිත ඉලක්ක කරා ළඟා විය හැකි වූ වසරකි.

# 6.6. පුස්තකාල සේවා මණ්ඩලය

North Central Province
Library Service Board

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

උතුරු මැද පළාත තුළ විධිමත් හා යහපත් පුස්තකාල සේවාවක් ඇති කරලීමත්, එමඟින් ජන කොටස් ජන කොටස් සඳහා දැනුම හා තොරතුරු ලබාදීමට සහය දීමත් උතුරු මැද පළාතේ සංවර්ධන කටයුතු වලට තොරතුරු සේවාව ලෙස ක්‍රියාත්මක වශයෙන් සහභාගී වීම සඳහා විධිවිධාන සැලැස්වීමට යන කාර්යයන් ඉටු කර ගැනීම පිණිස 2002 අංක 04 දරණ ප්‍රඥප්තිය, 2004 සහ 2009 වර්ෂ දෙකේ දී කරන ලද සංශෝධන දෙකකට පසුව 2011 වර්ෂයේ අගෝස්තු මාසයේදී එවකට ප්‍රධාන අමාත්‍ය ධූරය දැරූ ගරු බර්ටි ප්‍රේමලාල් දිසානායක මහතාගේ මූලිකත්වයෙන් පළමු වරට උතුරු මැද පළාත් පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවන ලදී.

## දැක්ම

"උතුරු මැද පළාත තුළ යහපත් පුස්තකාල සහ තොරතුරු සේවාවක් පවත්වා ගෙන යෑම".

## මෙහෙවර

"යහපත් පුස්තකාල සහ තොරතුරු සේවාවක් පවත්වාගෙන යාම තුළින් පොතපත කියවීමෙන් දැනුම, ආකල්ප, කුසලතා වලින් පිරිපුන් සංවේදී බුද්ධිමත් ජන සමාජයක් ගොඩනැගීම".

## දිගුකාලීන අරමුණු

උතුරු මැද පළාතේ පාසල්, පිරිවෙන් හා මහජන පුස්තකාල නූතන තාක්ෂණ සම්පත් ද සහිතව දියුණු පුස්තකාල සේවාවක් ලබා දෙන ආයතන ලෙස ගොඩනැගීම.

## කෙටිකාලීන අරමුණු

පොතපත කියවීමෙන් බැහැරවන ජන සමාජයේ බාල පරපුර ඉලක්ක කර ගනිමින් ඔවුන් පොතපත කියවීමට හුරු පුරුදු කිරීම.

## ප්‍රධාන කාර්යයන්


- උතුරු මැද පළාතේ පුස්තකාල සහ තොරතුරු සේවා කටයුතු සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම හා සම්බන්ධීකරණය.
- පුස්තකාල සංවර්ධනයට අවශ්‍ය කටයුතු සැලසුම් කිරීම.
- පළාත්වාසී පාඨකයන් සඳහා පුස්තකාල සහ තොරතුරු සේවා සැපයීම.
- පුස්තකාල සේවා ව්‍යාපෘතියකට අවශ්‍ය වන්නා වූ සාමූහික ප්‍රතිග්‍රහණය, මධ්‍යගත සැලසුම්කරණය, ඒකාබද්ධ සුචීන් සම්පාදනය, ප්‍රාදේශීය එකතුන් සංවර්ධනය කරලීම, අන්තර් පුස්තකාල පිරූළු සේවා, ජංගම පුස්තකාල සේවා, විඥාපන ජාල පිහිටුවීම සහ අදාළ අනෙකුත් කටයුතු සිදු කිරීම.

- පොත් පත්, වාර සඟරා ඇතුළු මුද්‍රිත මාධ්‍ය, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය සහ පරිගණකගත තොරතුරු සේවාවන් යොදා ගනිමින් පළාත තුළ උසස් මට්ටමේ තොරතුරු සේවාවක් පවත්වාගෙන යෑම.
- පොත්පත් හා ලේඛණ උතුරු මැද පළාතට විශේෂිත වූ දුර්ලභ ලිපි ලේඛණ හා ග්‍රන්ථයන්හි අත්පිටපත්, පුස්කොළ පොත් ආදිය රැස් කිරීම හා සංරක්ෂණය.
- ජාතික, ජාත්‍යන්තර හා කලාපීය තොරතුරු ජාල හා සේවාව සම්බන්ධ වීම.
- පළාත් සභාව ක්‍රියාත්මක කරනු ලබන විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය තොරතුරු සහ දත්ත සැපයීම මගින් සහය වීම.
- පුස්තකාල කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා උසස් කිරීම් පටිපාටි, විභාග පටිපාටි සකස් කිරීම.
- දැනට පවත්වාගෙන යන පුස්තකාල පිළිබඳ අධ්‍යයනය කිරීම තුළින් අදාළ පුස්තකාල සංවර්ධනය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- පළාතේ පුස්තකාල හා තොරතුරු සේවා සංවර්ධනය සඳහා සුදුසු වෙනත් පියවර ගැනීම.

**ප්‍රධාන උපාය මාර්ගයන්**


- පාසල් හා මහජන පුස්තකාල සඳහා පොත් හා පුස්තකාල කබඩ් ලබා දීම.
- පාසල්, පිරිවෙන් හා මහජන පුස්තකාලයන්හි සේවය කරන කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.
- පාඨක සමාජ හා කියවීම් කඳවුරු පැවැත්වීම.
- නිර්මාණ තරඟ පැවැත්වීම.
- ස්වයං නිර්මාණ දිරිගැන්වීම සඳහා විවිධ වැඩසටහන් සංවිධානය

**අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු හා ක්‍රියාකාරකම්.**



## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 09 |
| 2 | සේවයේ නියුතු | 07 |
| 3 | පුරප්පාඩු | 02 |




## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2018 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| 1. පුද්ගල පඩිනඩි<br>2. ගමන් වියදම්<br>3. සැපයීම්<br>4. නඩත්තු වියදම්<br>5. ගිවිසුම්ගත සේවා<br>6. මාරු කිරීම්<br>7. සහනාධාර | 4.85 | 4.64 | 0.21 | 96 |
| එකතුව | **4.85** | **4.64** | **0.21** | **96** |

## පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම

| අ. අං | ව්‍යාපෘතිය/ වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභී සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම | මහජන සහ පාසල් පුස්තකාල කාර්ය මණ්ඩලය පුහුණු කිරීම | පාඨකයින්ට කාර්යක්ෂම තෘප්තිමත් තොරතුරු සේවාවක් ලබාදීමට හැකි පුස්තකාල කාර්ය මණ්ඩලයක් බිහිකිරීම | 450 |
| 02 | පුස්තකාල ප්‍රමිතිකරණය කිරීම | මහජන පුස්තකාල පොත් වර්ගීකරණය හා සුචිකරණය කිරීම | පාඨකයින්ට කාර්යක්ෂම තොරතුරු ගවේෂණය කළ හැකි ආකාරයේ පුස්තකාල සේවාවාක් ක්‍රියාත්මක කිරීම | 1200 |
| 03 | කර්තෘ ප්‍රකාශන මිලදී ගැනීම | පළාතේ සහා පිට පළාත් ලේඛකයින්ගේ කෘතින් මිලදී ගැනීම | නිර්මාණකරණයේ නියැලෙන නව ලේඛකයින් මෙන්ම ප්‍රවීණ ලේඛකයින්ද නිර්මාණකරණය සඳහා දිරි ගැන්වීම | 38 |
| 04 | මුද්‍රණ ආධාර ලබාදීම | කෘතින් මුද්‍රණය කිරීම සඳහා මුද්‍රණ වියදමෙන් 3/1ක් ලබාදීම. | නිර්මාණකරණයේ නියැලෙන පළාතේ ලේඛකයින් දිරිගැන්වීම | 01 |
| 05 | නිර්මාණ තරඟ පැවැත්වීම | පද්‍ය, කෙටිකතා, නවකතා යනාදී අංශ වලින් හොඳම නිර්මාණය තෝරා ජයග්‍රාහකයින්ට ත්‍යාග පදක්කම් ලබාදීම | නිර්මාණකරණයේ නියැලෙන පළාතේ නව ලේඛකයින් දිරි ගැන්වීම. | 200 |
| 06 | කියවීම් කඳවුරු පැවැත්වීම | පාසල් දරුවන් සම්බන්ධ කර ගනිමින් කියවීම් කඳවුරු පැවැත්වීම | පාසල් දරුවන් ගේ කියවීම් රුචිකත්වය වර්ධනය කිරීම | 50 |

## මූලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 50.03 | 9.65 | 40.38 | 19.28 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම හාඋපකරණ | 5.00 | 4.21 | 0.79 | 84.20 |
| **එකතුව** | **55.03** | **13.86** | **41.17** | **25.18** |

## කාර්ය සාධන ඉලක්ක - 2018

| අනු අංකය | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 |
| 01. | උතුරු මැද පළාත තුල අංග සම්පූර්ණ පුස්තකාල පද්ධතියක් බිහිකිරීම | 1. ඉදි කරනු ලැබූ පුස්තකාල සංඛ්‍යාව | 1 | 1 | - |
| | | 2. පොත් සහ කබඩ් ලබා දුන් පාසල් පුස්තකාල සංඛ්‍යාව | 110 | | 100 |
| | | 3. ප්‍රමිතියානුකූලව සකස් කරන ලද මහජන පුස්තකාල සංඛ්‍යාව | 5 | 8 | 10 |
| 02. | පළාතේ මහජනතාවගේ කියවීම් රුචිකත්වය සහ ලේඛන කුසලතාව වැඩි දියුණු කිරීම | 1. පවත්වනු ලබන කියවීම් කඳවුරු සංඛ්‍යාව | 35 | 50 | 70 |
| | | 2. පවත්වනු ලබන පාඨක සමාජ තරඟ සංඛ්‍යාව | - | 01 | 02 |
| | | 3. මුද්‍රණ ආධාර ලබාදෙන කෘති සංඛ්‍යාව | 06 | 01 | 10 |
| | | 4. මිලදී ගනු ලබන කර්තෘ ප්‍රකාශන සංඛ්‍යාව | 28 | 38 | 50 |
| | | 5. නිර්මාණ තරඟාවලිය සඳහා සාර්ථක නිර්මාණ ඉදිරිපත් කරනු ලබන ලේඛකයින් ගණන | 120 | 200 | 250 |

| අ.අ | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශකය | ඉලක්ක | | |
|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 |
| 03. | මහජනතාවට ගුණාත්මක තොරතුරු සේවාවක් ලබා දීම සඳහා කාර්යක්ෂම පුස්තකාල නිලධාරීන් පිරිසක් බිහි කිරීම. | පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 8 | 6 | 10 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

| ප්‍රධාන අරමුණු | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| **ප්‍රධාන අරමුණු 01** උතුරු මැද පළාත තුළ අංග සම්පූර්ණ පුස්තකාල පද්ධතියක් බිහි කිරීම | පුස්තකාල ප්‍රමිතිකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | පවතින පුස්තකාල ප්‍රමිතියානුකූලව සකස් කිරීම | 0.16 | 0.11 | 90 |
| **ප්‍රධාන අරමුණු 02** පළාතේ මහජනතාවගේ කියවීම් රුචිකත්වය සහ ලේඛන කුසලතාව වැඩි දියුණු කිරීම | 1. කියවීම් කඳවුරු පැවැත්වීම. | පාසල් දරුවන් තුළ කියවීම් රුචිකත්වය ඇති කිරීම. | 0.16 | 0.16 | 100 |
| | 2. පාඨක සමාජ අතර තරඟ පැවැත්වීම. | පාසල් දරුවන් පාසල් පුස්තකාල පරිශීලනය කෙරෙහි යොමු කිරීම | 0.35 | 0.35 | 100 |

| ප්‍රධාන අරමුණු | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| **ප්‍රධාන අරමුණු 02** පළාතේ මහජනතාවගේ කියවීම් රුචිකත්වය සහ ලේඛන කුසලතාව | 3.මුද්‍රණ ආධාර ලබාදීම. | උතුරු මැද පළාතේ නව ලේඛකයින් දිරි ගැන්වීම. | 0.05 | 0.05 | 100 |
| | 4.ස්වයං නිර්මාණ මිලදී ගැනීම. | උතුරු මැද පළාතේ මෙන්ම පිට පළාත් වලද ලේඛකයින්ගේ නිර්මාණ මිලදී ගැනීම තුලින් ඔවුන්ව දිරි ගැන්වීම. | 0.6 | 0.6 | 100 |
| | 5.නිර්මාණ තරඟ පැවැත්වීම. | නිර්මාණකරණය කෙරෙහි යොමු වන නව ලේඛකයින් දිරි ගැන්වීම. | 0.2 | 0.2 | 100 |
| **ප්‍රධාන අරමුණු 03** මහජනතාවට ගුණාත්මක තොරතුරු සේවාවක් ලබාදීම සඳහා කාර්යක්ෂම පුස්තකාල නිළධාරීන් පිරිසක් බිහි කිරීම. | 1.පුස්තකාල කාර්යය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | ඵලදායි පුස්තකාල සේවාවක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කාර්යය මණ්ඩලය බිහිකිරීම. | 0.4 | 0.4 | 100 |

## ආයතනයේ හා අදාළ අංශයේ සංවර්ධනය උදෙසා
## අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| අරමුණු | ඉලක්ක | | අපේක්ෂිත ප්‍රතිඵල | |
|---|---|---|---|---|
| | 2020 | 2021 | කෙටිකාලීන | දිගුකාලීන |
| උතුරු මැද පළාතේ පුස්තකාල දියුණු පුස්තකාල සේවාවක් ලබා දෙන ආයතන ලෙස ගොඩනැගීම. | මහජන පුස්තකාල 05 ක් ස්වයංක්‍රීයකරණය කිරීම | මහජන පුස්තකාල 10 ක් ස්වයංක්‍රීයකරණය කිරීම | පාසල් සිසුන් මෙන්ම පොදු මහජනතාව පුස්තකාල පරිශීලනයට යොමු කිරීම. | මහජනතාවට තෘප්තිමත් තොරතුරු සේවාවක් ලබාදීම. |
| උතුරු මැද පළාතේ ලේඛන කලාවේ නියැලෙන පිරිස් දිරි ගැන්වීම | ලේඛකයින්ගේ නිර්මාණ 50ක් මිලදී ගැනීම | නව ලේඛකයින්ගේ නිර්මාණ 05ක් සඳහා ආධාර ලබාදීම | පළාතේ නව ලේඛකයින් නිර්මාණකරණය සඳහා දිරි ගැන්වීම. | පළාතේ ලේඛකයින් විසින් ශාස්ත්‍රීය නිර්මාණ බිහි කිරීම වැඩි කිරීම. |
| පළාතේ මහජනතාවගේ කියවීම් රුචිකත්වය වැඩි දියුණු කිරීම | උතුරු මැද පළාතේ පාසල් 70ක පමණ කියවීම් කඳවුරු පැවැත්වීම | උතුරු මැද පළාතේ පාසල් 80ක පමණ කියවීම් කඳවුරු පැවැත්වීම | පළාතේ පාසල් දරුවන් පාසල් පුස්තකාල පරිශීලනයට යොමු කිරීම | පුස්තකාල පරිශිලනය තුලින් දැනුමෙන් බුද්ධියෙන් සපිරි පාසල් දරුවන් පිරිසක් බිහිකිරීම. |

**උතුරු මැද පළාත් සභා ප්‍රධාන යටතේ 2018 වර්ෂය සඳහා රු. මිලියන 15.59ක මුදලක් වෙන් වී තිබූ අතර එම මුදලින් පළාතේ පුස්තකාල වෙනුවෙන් ක්‍රියාත්මක කළ වැඩසටහන්**

| ව්‍යාපෘතිය | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|
| **අනුරාධපුර** | | |
| තඹුත්තේගම නගරයේ අංග සම්පූර්ණ පුස්තකාලයක් ඉදිකිරීම. (3 වන අදියර) | 5.59 | 5.59 |
| තඹුත්තේගම නගරයේ අංග සම්පූර්ණ පුස්තකාලයක් ඉදිකිරීම. (3 වන අදියර) | 4.35 | 1.05 |
| පුස්තකාල පාඨක සමාජ තරඟාවලියක් පැවැත්වීම. | 0.22 | 0.22 |
| කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 0.21 | 0.20 |
| කියවීම් කඳවුරු 30ක් පැවැත්වීම | 0.10 | 0.10 |
| පුස්තකාල ප්‍රමිතිකරණය අනුරාධපුර | 0.07 | 0.07 |
| එකතුව | **10.54** | **7.23** |
| **පොළොන්නරුව** | | |
| දිඹුලාගල නගරයේ අංග සම්පූර්ණ පුස්තකාලයක් ඉදිකිරීම. (3 වන අදියර) | 3.02 | 3.02 |
| පුස්තකාල පාඨක සමාජ තරඟාවලියක් පැවැත්වීම. | 0.14 | 0.13 |
| කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 0.21 | 0.21 |
| කියවීම් කඳවුරු 20ක් පැවැත්වීම | 0.06 | 0.06 |
| පුස්තකාල ප්‍රමිතිකරණය පොළොන්නරුව | 0.04 | 0.03 |
| එකතුව | **3.47** | **3.45** |
| **පොදුවේ ක්‍රියාත්මක කළ වැඩසටහන් - 2018** | | |
| නිර්මාණ තරඟ පැවැත්වීම | 0.21 | 0.19 |
| මුද්‍රණ ආධාර ලබාදීම | 0.05 | 0.05 |
| ස්වයං නිර්මාණ මිලදී ගැනිම | 0.60 | 0.59 |
| පුස්තකාල සේවා මණ්ඩලයේ පුස්තකාලය සඳහා පොත් මිලදී ගැනීම | 0.74 | 0.73 |
| එකතුව | **1.60** | **1.56** |
| මුළු එකතුව | **15.61** | **12.24** |

**උතුරු මැද පළාත් සභා ප්‍රධාන යටතේ 2018 වර්ෂය සඳහා රු. මිලියන 15.59ක මුදලක් වෙන් වී තිබූ අතර එම මුදලින් පළාතේ පුස්තකාල වෙනුවෙන් ක්‍රියාත්මක කළ වැඩසටහන් හා එහි ප්‍රගතිය**

| අ.අ | වැඩසටහන | සංඛ්‍යාව | තත්ත්වය |
|---|---|---|---|
| 01 | තඹුත්තේගම නගරයේ අංග සම්පූර්ණ පුස්තකාලයක් ඉදිකිරීම -3 වන අදියර- තඹුත්තේගම කලාප කාර්යාලයට යාබදව ඉදිවන දෙමහල් පුස්තකාල ගොඩනැගිල්ලකි | 01 |  |
| 02 | පුස්තකාල පාඨක සමාජ තරඟාවලියක් පැවැත්වීම- අනුරාධපුර දිස්ත්‍රික්කය-කලාප මට්ටමින් පාසල් ශිෂ්‍යයින් සම්බන්ධ කරගෙන පාඨක සමාජ දැනුම මිනුම තරඟාවලියක් පවත්වනු ලැබීය. | 38 |  |
| 03 | පුස්තකාල පාඨක සමාජ තරඟාවලියක් පැවැත්වීම.- පොළොන්නරුව දිස්ත්‍රික්කය- කලාප මට්ටමින් පාසල් ශිෂ්‍යයින් සම්බන්ධ කරගෙන පාඨක සමාජ දැනුම මිනුම තරඟාවලියක් පවත්වනු ලැබීය. | 27 |  |


**උතුරු මැද පළාත් සභා ප්‍රධාන යටතේ 2018 වර්ෂය සඳහා රු. මිලියන 15.59ක මුදලක් වෙන් වී තිබූ අතර එම මුදලින් පළාතේ පුස්තකාල වෙනුවෙන් ක්‍රියාත්මක කළ වැඩසටහන් හා එහි ප්‍රගතිය**

**ඉතිරි කොටස...**

| අ.අ | වැඩසටහන | සංඛ්‍යාව | තත්ත්වය |
|---|---|---|---|
| 04 | කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම.- අනුරාධපුර දිස්ත්‍රික්කය - මහජන පුස්තකාලයාධිපතිවරු පුහුණු කිරීමේ වැඩමුළු 01,පාසල් පුස්තකාලයාධිපතිවරුන් පුහුණු කිරීමේ වැඩමුළු 02 | 03 |  |
| 05 | කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම.- පොළොනන්රුව දිස්ත්‍රික්කය- මහජන පුස්තකාලයාධිපතිවරු පුහුණු කිරීමේ වැඩමුළු 01,පාසල් පුස්තකාලයාධිපතිවරුන් පුහුණු කිරීමේ වැඩමුළු 03 | 04 |  |
| 06 | කියවීම් කඳවුරු පැවැත්වීම- අනුරාධපුර දිස්ත්‍රික්කය-පාසල් දරුවන් අතර කියවීමේ කුසලතාවය හා රුචිකත්වය වර්ධනය කිරීමේ අරමුණින් කියවීම් කඳවුරු සංවිධානය කරන ලදී | 30 |   |
| 07 | කියවීම් කඳවුරු පැවැත්වීම- පොළොන්නරුව දිස්ත්‍රික්කය- පාසල් දරුවන් අතර කියවීමේ කුසලතාවය හා රුචිකත්වය වර්ධනය කිරීමේ අරමුණින් කියවීම් කඳවුරු සංවිධානය කරන ලදී | 20 |  |
| 08 | පුස්තකාල ප්‍රමිතිකරණය- පළාතේ මයජන පුස්තකාල එකම ප්‍රමිතියකට ගෙන ඒමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී | මහජන පුස්තකාල 08 | |

**උතුරු මැද පළාත් සභා ප්‍රධාන යටතේ 2018 වර්ෂය සඳහා රු. මිලියන 15.59ක මුදලක් වෙන් වී තිබූ අතර එම මුදලින් පළාතේ පුස්තකාල වෙනුවෙන් ක්‍රියාත්මක කළ වැඩසටහන් හා එහි ප්‍රගතිය**

**ඉතිරි කොටස...**

| අ.අ | වැඩසටහන | සංඛ්‍යාව | තත්ත්වය |
|---|---|---|---|
| 09 | පොළොන්නරුව නගරයේ අංග සම්පූර්ණ පුස්තකාලයක් ඉදිකිරීම තෙවන අදියර-දිඹුලාගල ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකර ඇති ඉඩමේ දෙමහල් පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකර ඇත | 01 |  |
| 10 | නිර්මාණ තරඟ පැවැත්වීම - උතුරු මැද පළාත තුළ ලේඛන කලාව සඳහා උනන්දුවක් ඇති ලේඛකයින් ඇගයීම හා දිරිමත් කිරීම මෙහි අරමුණ විය | ජයග්‍රාහකයින් 51 | හොඳම පද්‍ය සංග්‍රහය<br>හොඳම කෙටිකථා සංග්‍රහය<br>හොඳම නවකථා සංග්‍රහය |
| 11 | මුද්‍රණ ආධාර ලබා දීම -උතුරු මැද පළාතේ අඩු මූල්‍ය පහසුකම් සහිත ලේඛකයින් දිරිමත් කිරීම අරමුණ විය | 01 |  |
| 12 | ස්වයං නිර්මාණ මිලදී ගැනීම උතුරු මැද පළාතේ හා පිට පළාත්වල ලේඛකයින් දිරිමත් කිරීමේ අරමුණින් ඔවුන්ගේ ග්‍රන්ථ සහා 30% ක වට්ටමක් යටතේ මිලදී ගන්නා ලදී | ස්වයං නිර්මාණ ග්‍රන්ථ 36ක පිටපත් 2404 |  |

උතුරු මැද පළාත් සභා ප්‍රධාන යටතේ 2018 වර්ෂය සඳහා රු. මිලියන 15.59ක මුදලක් වෙන් වී තිබූ අතර එම මුදලින් පළාතේ පුස්තකාල වෙනුවෙන් ක්‍රියාත්මක කළ වැඩසටහන් හා එහි ප්‍රගතිය

ඉතිරි කොටස...

| අ.අ | වැඩසටහන | සංඛ්‍යාව | තත්ත්වය |
|---|---|---|---|
| 13 | ස්වයං නිර්මාණ මිලදී ගැනීම උතුරු මැද පළාතේ හා පිට පළාත්වල ලේඛකයින් දිරිමත් කිරීමේ අරමුණින් ඔවුන්ගේ ග්‍රන්ථ සඳහා 30% ක වට්ටමක් යටතේ මිලදී ගන්නා ලදී | ස්වයං නිර්මාණ ග්‍රන්ථ 36ක පිටපත් 2404ක් මිලදී ගැනිම |   |
| 14 | පුස්තකාල සේවා මණ්ඩලයේ පුස්තකාලය සඳහා පොත් මිලදී ගැනීම | |   |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2018 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති යටතේ නව ව්‍යාපෘති සියල්ල වර්ෂ අවසානයේ නිම කරන ලදී. ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ සාහිත්‍ය දේශන පැවැත්වීමේ ව්‍යාපෘතිය තෙවන පාසල් වාරයේ පාසල් ළමුන් වෙනත් වැඩසටහන් සඳහා ලබා දීමට පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් එකඟ නොවීම හේතුවෙන් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

තවද සමස්ත ව්‍යාපෘතිවල ඉතිරි මුදල් සහ අවලංගු කරන ලද ව්‍යාපෘති වල මුදල්, නව ව්‍යාපෘතියක් ලෙස අනුමත කරගන්නා ලද පුස්තකාල සේවා මණ්ඩලයේ පුස්තකාලයට පොත් මිලදී ගැනීමට යොදවන ලදී.

උතුරු මැද පළාත තුළ ඵලදායි පුස්තකාල සේවාවක් ක්‍රියාත්මක කිරීමට ආයතනයේ මූලික අරමුණු පෙරදැරිව භෞතික සහ මානව සම්පත් ද මෙම වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන් කළ මූල්‍ය සම්පත් ද ඵලදායිව යොදවමින් 2018 වර්ෂයේ කාර්ය සාධනය ළගා කර ගැනීමට හැකි විය.

කාර්ය සාධනය කරා ළඟාවීමේදී මුහුණ දුන් අභියෝග හා ගැටළු අතර කාර්ය මණ්ඩලය හිඟ වීම, ආයතනයේ ඉඩ පහසුකම් අඩු වීම තිබුනද පුස්තකාල සේවා මණ්ඩලය සතු භෞතික, මානව,මූල්‍ය සම්පත් කාර්යක්ෂමතාවයෙන් යුතුව භාවිතා කරමින් 2018 වර්ෂය තුළ අපේක්ෂිත කාර්ය සාධනය කරා ළඟා වීමට හැකි විය.


# 07. පළාත් කෘෂිකර්ම, නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන , සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

## පළාත් කෘෂිකර්ම, නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය පිළිබඳ මූලික විග්‍රහය

**මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය (මෙ.ටො)**

| දිස්ත්‍රික්කය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| අනුරාධපුර | 16,325 | 9,650 | 12,990 | 15,760 | 12,940 |
| පොළොන්නරුව | 7,558 | 7,160 | 3,525 | 8,310 | 11,600 |
| **එකතුව** | **23,883** | **16,810** | **16,515** | **24,070** | **24,540** |

මූලාශ්‍රය:- පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය



මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයේ උතුරුමැද පළාතේ දායකත්වය

| | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| ජාතික නිෂ්පදනය (මිරිදිය මත්ස්‍ය) | 75,750 | 67,300 | 73,930 | 82,540 | 88,100 |
| උතුරුමැද පළාතේ දායකත්වය(%) | 31.53 | 25.00 | 22.34 | 29.16 | 27 |

මූලාශ්‍රය:- පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය

ශීතාගාර පහසුකම්

| දිස්ත්‍රික්කය | ශීතාගාර පහසුකම් | ධාරිතාවය (මෙ.ටො දිනකට) |
|---|---|---|
| අනුරාධපුර | 1 | 15 |

මූලාශ්‍රය:- පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය

මිරිදිය ධීවර යාත්‍රා

| දිස්ත්‍රික්කය | 2013 | 2014 | 2015 |
|---|---|---|---|
| අනුරාධපුර | 1103 | 1103 | 1153 |
| පොළොන්නරුව | 1048 | 1048 | 1073 |
| **එකතුව** | **2151** | **2151** | **2226** |

මූලාශ්‍රය:- පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය

ග්‍රාමීය කෘෂි නිෂ්පාදන අලෙවි සමිති පිළිබද තොරතුරු

| දිස්ත්‍රික්කය | සමිති සංඛ්‍යාව | සාමාජික සංඛ්‍යාව | මූල්‍ය තත්වය (රු) |
|---|---|---|---|
| අනුරාධපුර | 207 | 6,259 | 4,405,431 |
| පොළොන්නරුව | 70 | 2,419 | 2,281,337 |
| **එකතුව** | **277** | **8,678** | **6,686,768** |

මූලාශ්‍රය:- පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය

## දැක්ම

" ඉසුරුමත් භූමියක්, අසිරිමත් ගොවි කැළක් "

## මෙහෙවර

"කෘෂිකර්ම, කෘෂි හා සත්ත්ව නිෂ්පාදන ප්‍රවර්ධන හා අලෙවි, සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය, ධීවර සහ නිවාස කටයුතු, සියලු පාර්ශ්වකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිද භාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම"

## දිගු කාලීන අරමුණු

**01**
ජාතික ප්‍රතිපත්තීන්ට අනුගතව කෘෂිකාර්මික සම්ප්‍රදායන් රැක ගනිමින් නවීන තාක්ෂණයට අනුව කෘෂිකාර්මාන්තයේ ඵලදායිතාවය සහ නිෂ්පාදනය ඉහළ නැංවීම.

**02**
පළාතේ 80 % ක් වු ගොවි ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම.

**03**
තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගත හැකි පරිදි කෘෂි කාර්මික වැඩසටහන් සකස් කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය.

**04.**
තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගත හැකි පරිදි කෘෂි කාර්මික වැඩසටහන් සකස් කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය

**05.**
ධිවර කර්මාන්ත තුළ ධීවර පවුල්වල සමාජ ආර්ථික පසුබිම සංවර්ධනය කිරීම

*කෙටිකාලීන අරමුණු*

කෙටිකාලීන අරමුණු

01අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු දෙක මගින් සිදු කරනු ලබන සංවර්ධන වැඩ සටහන් කාර්යක්ෂම හා ඵලදායි අයුරින් වර්ෂය තුළ නිම කිරීම.

02. නව කෘෂි නිෂ්පාදන ක්‍රමවේද / තාක්ෂණය පිළිබඳව දැනුමෙන් පිරි ගොවි ජනතාවක් බිහිකර ගැනීම.

03. වස විස නැති ආහාර පරිභෝජනයට යොමු වන පිරිස වර්ධනය කිරීම.

04 සුළු පරිමාණ ව්‍යාවසායකයින්ට අවශ්‍ය සානුබල සැපයීම තුලින් ඔවුන්ගේ ආර්ථිකමය හැකියාව ශක්තිමත් කිරීම.

05. මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහල නැංවීම මගින් ජාතික නිෂ්පාදනයට පළාතේ දායකත්වය වර්ධනය කිරීම.

06.මත්ස්‍ය පරිභෝජනය වැඩි කිරීම මගින් පළාතේ ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම.

07.ධීවර කාර්මිකයින්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම.

08. විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලි ව්‍යාවසායකයන්ගේ දැනුම කුසලතා ආකල්ප වර්ධනය කිරීම.

## ප්‍රධාන කාර්යයන් හා ප්‍රධාන උපාය මාර්ගයන්

| අංකය | ප්‍රධාන කාර්යයන් | උපාය මාර්ග (ය) |
|---|---|---|
| 01 | අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු නියාමනය | • අධීක්ෂණය,පසුවිපරම හා ප්‍රගති සමාලෝචනය<br>• ආයතනයේ චක්‍රලේඛ නිකුත් කිරීම |
| 02 | වස විසෙන් තොර ඵලදායි නිෂ්පාදනය දිරිමත් කිරීම | • නොමිලේ බීජ කට්ටල ලබා දීම<br>• ආරක්ෂිත ගෘහ තුළ එළවළු වගාව පුහුණු කිරීම |
| 03 | ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | • දැනුවත් කිරීම හා වැඩමුළු<br>• මල් වගාකරුවන්ට ආරක්ෂිත ගෘහ ලබා දීම<br>• සුළු පරිමාණ ව්‍යවසායකයින් සංවිධානගත කිරීම |
| 04 | ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම | • මත්ස්‍ය බීජ නිෂ්පාදනය<br>• මත්ස්‍ය බීජ තැන්පත් කිරීම<br>• ධීවර ආම්පන්න හා ආධාර ලබා දීම<br>• ජල ජීවී පොකුණු සංවර්ධනය කිරීම<br>• විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය<br>• මත්ස්‍ය ආයෝජන මධ්‍යස්ථාන සංවර්ධනය<br>• පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |
| 05 | ආයතනික ධාරිතා සංවර්ධනය | • පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>• ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සංවිධානය කිරීම<br>• කාර්යාල උපකරණ මිලදී ගැනීම |

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන් ද ඇතුළත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවදානමට ලක්වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී , පොෂණයෙන් යුත් , ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම මෙන්ම අමාත්‍යාංශය යටතේ පවතින කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා සහසම්බන්ධව ඒකාබද්ධ ප්‍රවේශයක් තුල අදාල ඉලක්ක සාධනය කර ගැනිම සඳහා 2018 වර්ෂය තුළදී ක්‍රියාත්මක විය.



## කාර්යය මණ්ඩල සංයුතිය - 2018

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 73 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 58 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 15 |
| අනියම් | 01 |

## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු. මි.) | 2018 වර්ෂයේ වියදම (රු. මි.) | ඉතිරිය (රු. මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 40.38 | 28.05 | 12.33 | 69.50 |
| ගමන් වියදම් | 6.25 | 4.49 | 1.76 | 72.00 |
| සැපයීම් | 4.28 | 1.94 | 2.34 | 45.2 |
| නඩත්තු වියදම් | 1.68 | 1.01 | 0.67 | 60.00 |
| ගිවිසුම්ගත සේවා | 4.34 | 1.12 | 3.22 | 26.00 |
| මාරුකිරීම් | 0.33 | 0.29 | 0.04 | 87.87 |
| **එකතුව** | **57.26** | **36.90** | **20.36** | **64.44** |

## මුලධන වියදම් - 2018

| වියදමේ ස්වාභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0.10 | 0.00 | 0.10 | 0 |
| යන්ත්‍ර සූත්‍ර සවිකිරීම් හා උපකරණ | 0.10 | 0.00 | 0.10 | 0 |
| වාහන | 0.70 | 0.24 | 0.46 | 33.4 |
| යන්ත්‍ර හා යන් ත්‍රෝපකරණ මිලදී ගැනීම | 0.20 | 0.00 | 0.20 | 0. |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනිම | 0.80 | 0.56 | 0.24 | 70 |
| වෙනත් මූලධන වත්කම් වැඩිදියුණු කිරීම | 0.10 | 0.00 | 0.10 | 0 |
| **එකතුව** | **2.00** | **0.80** | **1.20** | **40** |

## කාර්ය සාධන ඉලක්ක කරා ළඟාවීම - 2018

| අ. අං | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 |
| 1. | මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම | වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදිත මෙට්‍රික් ටොන් ප්‍රමාණය | 5400 | 6060 | 3,000 |
| | | ස්ථාපිත කරන ලද මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන සංඛ්‍යාව. | | 1 | 2 |
| 2 | විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම | විසිතුරු මත්ස්‍ය නිෂ්පාදකයින්ට සපයන ලද උපකරණ සංඛ්‍යාව<br>- වට දැල්<br>- සෙවන දැල්<br>- වට ආවරණ දැල්<br>- උඩු ආවරණ දැල් | 55<br>05<br>-<br>- | -<br>84<br>676<br>165 | -<br>-<br>-<br>- |
| 3 | විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලි ව්‍යවසායකයින්ගේ දැනුම කුසලතා ආකල්ප වර්ධනය කිරීම | පුහුණුව සාර්ථකව සම්පූර්ණ කරන ලද විසිතුරු මත්ස්‍ය පුහුණුලාභීන් සංඛ්‍යාව | 80 | 80 | 80 |
| 4 | මිරිදිය ධීවර කාර්මිකයින්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම | මිරිදිය ධීවර කාර්මිකයින්ට සපයන ලද ධීවර ආම්පන්න සංඛ්‍යාව.<br>දැල් කුඩු<br>ඔරු<br>කරමල් දැල් | 5<br>17<br>700 | 80<br>22<br>2470 | - |
| 5 | කෘෂි ව්‍යවසායකයින්ගේ ජීවනෝපය සංවර්ධනය | ලබා දෙන ලද කෘෂි අලෙවි කුටි සංඛ්‍යාව | - | 5 | - |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය - 2018

| ප්‍රධාන අරමුණු | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ (රු.) | වැය කළ (රු.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| 1. වගා කටයුතු සඳහා අඛණ්ඩව ජල සම්පාදනය කර ගැනීමේ පහසුකම් වර්ධනය කිරීම. | අනාරක්ෂිත වගා ළිං පුනරුත්ථාපන වැඩසටහන | 2017 වර්ෂයේ පළමු වාරික ලබා ගත් ප්‍රතිලාභීන්ගේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 48 දෙනෙකු සඳහා ද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 8 දෙනෙකු සඳහා ද වගා ළිං ආධාර ලබා දෙන ලදී. | 1.00 | 0.98 | 100 |
| 2. කෘෂි ව්‍යාවසායක -යින්ගේ ජීවනෝපාය සංවර්ධනය | කෘෂි අලෙවි මධ්‍යස්ථාන සංවර්ධනය | රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 3 දෙනෙකු සඳහා අලෙවි කුටි 3 ක් ද ,රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ධීවර සංගම් දෙකක් සඳහා මිරිදිය මාළු අලෙවි කිරීමට අලෙවි කුටි 2 ක් ද ලබා දෙන ලදී. | 0.40 | 0.16 | 100 |
| | කෘෂි නිෂ්පාදන ආශ්‍රිත ස්වයංරැකියා ප්‍රවර්ධන වැඩසටහන | කෘෂි ව්‍යවසායකයින් 50 දෙනෙකු සඳහා අවශ්‍ය පහසුකම් සපයන ලදී. | 2.60 | 1.61 | 80 |

| ප්‍රධාන අරමුණු | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ (රු.) | වැය කළ (රු.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| 3.ධීවර කාර්මිකයින් සඳහා පහසුකම් සැපයීම. | ධීවර ආම්පන්න ලබා දීම | ඔරු 22 ක් සහ කරමල් දැල් 2470 ක් මිලදී ගන්නා ලදී. | 6.80 | 0.13 | 100 |
| | ජලාශ සඳහා දැල් කූඩු ලබා දීම | දැල් කූඩු 80 ක් මිළ දී ගැනීමට ගන්නා ලදී. | 10.00 | 10.00 | 100 |
| | මිරිදිය ධීවර කාර්මිකයින් පුහුණු කිරීමේ ව්‍යාපෘතිය. | උතුරු මැද පළාතේ ධීවර කාර්මිකයින් 225 දෙනෙකු සඳහා අම්පාර ජයන්ති වැව සඳහා ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් සහභාගි කරවීම සහ එය ආදර්ශිතයක් කර ගනිමින් එහි කළමණාකාරීත්වය පිළිබඳ පුහුණුවක් ලබා දීම . එමෙන්ම ධීවර කාර්මිකයින් 100 ක් සඳහා මහඉලුප්පල්ලම පුහුණු මධ්‍යස්ථානයේදී ධීවර ගිණුම් පිළිබඳ සහ මානසික සංවර්ධනය පිළිබඳ වැඩමුළු දෙකක් පැවැත්වීම | 1.00 | 1.00 | 100 |
| 4.පළාතේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහල නැංවීම. | ජලාශ සඳහා මත්ස්‍ය ඇසිත්තන් හා ඇඟිල්ලන් බහා ලීම. | මත්ස්‍ය පැටවු 4,128,811 ක් ජලාශ වල තැම්පත් කරන ලද අතර මත්ස්‍ය ඇසිත්තන් 4,860,000 ක් දැල් කූඩු තුල තැම්පත් කර ජලාශවලට මුදා හරින ලදී. | 10.10 | 1.09 | 100 |

| ප්‍රධාන අරමුණු | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ (රු.) | වැය කළ (රු.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| **5. විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනයට අවශ්‍ය දැනුම ලබා දීම.** | විසිතුරු මත්ස්‍ය වගාකරුවන් පුහුණු කිරිමේ ව්‍යාපෘතිය | විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලෙන ප්‍රතිලාභීන් 80 ක් සඳහා රම්බඩගල්ල පුහුණු මධ්‍යස්ථානයේදි දින 3 බැගින් වූ පුහුණු වැඩසටහන් 2 ක් පවත්වන ලදී. | 0.44 | 0.39 | 100 |
| **5. විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා සහයෝගයන් ලබා දිම** | විසිතුරු මත්ස්‍ය වගාව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 2018 වර්ෂයේදි 40 % ප්‍රතිලාභී දායකත්වය මත විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලෙන්නන්හට වට ආවරණ දැල් 676 ක්ද , උඩු ආවරණ දැල් 165 ක්ද , සෙවන දැල් 84 ක් ද , ජී.අයි බට 947 ක්ද , විදුලි වතුර මෝටර් 38 (අගල් 2) ක්ද,ජලගිල්වුම් මෝටර්(අඟල් 2 ) 15 ක් ද මිලදී ගන්නා ලදී. | 8.03 | 5.37 | 100 |

**සමස්ත සම්පත් උපයෝජනය හා අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීම.**

2018 වර්ෂය සඳහා උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ප්‍රධාන විෂය ක්ෂේත්‍ර 2 හි නව වැඩ යටතේ කෘෂි කටයුතු සඳහා රු. මි. 7 ක් හා ධීවර කටයුතු සඳහා රු. මි. 40 ක් ද වශයෙන් රු.මි.47ක් ප්‍රතිපාදන වෙන් කර තිබුණි. කෘෂි කටයුතු සඳහා වෙන් කරන ලද රු. මි. 4 ක ප්‍රතිපාදනයෙන් කෘෂි අලෙවි සමිති සාමාජිකයන්ගේ ස්වයංරැකියා ප්‍රවර්ධනයට වෙන් කරන ලද රු. මි. 2.6 ක මුදලින් රු. මි. 0.6 ක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සඳහා ද රු. මි. 1.5 ක් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට කෘෂි කර්මාන්තය ආශ්‍රිත ස්වයංරැකියා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන මුදා හරින ලදී.

කෘෂි හා ධීවර කටයුතු ප්‍රවර්ධනය සඳහා 2018 වර්ෂයේ
රු.මි.47

ඉතිරි රු. මි .0.5 සඳහා පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් කෘෂි කර්මාන්තය ආශ්‍රිත ස්වයංරැකියා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. තවද ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන සඳහා වෙන් කරන ලද රු. මි. 3 ක මුදලින් , කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සඳහා රු. මි. 1.5 ක් බැගින් ප්‍රතිපාදන මුදා හරින ලදී . ඉතිරි රු. මි. 1.4 ක ප්‍රතිපාදන යටතේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

| ව්‍යාපෘතිය | මුදල (රු.මි) | ක්‍රියාකාරකම් ඇතුළත් විස්තරය |
|---|---|---|
| කෘෂි අලෙවි මධ්‍යස්ථාන සංවර්ධනය | රු. මි. 0.4 | කෘෂිකර්මය ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම සඳහා රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 3 දෙනෙකු වෙනුවෙන් අලෙවි කුටි 3 ක් ලබා දෙන ලදී. තවද රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ධීවර සංගම් දෙකක් සඳහා මිරිදිය මාළු අලෙවි කිරීම සඳහා අලෙවි කුටි 2 ක් ද ලබා දෙන ලදී. |
| අනාරක්ෂිත වගා ළිං පුනරුත්ථාපනය  | රු.මි. 1. | 2018 වර්ෂයේ වගා ළිං ආධාර ලබා දීම යටතේ රුපියල් මිලියන 1 ක් වෙන් කරගනු ලබන්නේ 2017 වර්ෂයේ පළමු වාරික ලබා ගත් ප්‍රතිලාභීන්ගේ වගා ළිං අනාරක්ෂිත තත්වයෙන් මුදවා ගැනීම උදෙසා දෙවන වාරික ලබා දීම සඳහාය. ඒ අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 48 දෙනෙකු සඳහා ද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 8 දෙනෙකු සඳහා ද වගා ළිං ආධාර ලබා දෙන ලදී. |
| මත්ස්‍ය ඇඟිල්ලන් සහ ඇසිත්තන් මුදා හැරීම  | රු.මි. 10.1 | පළාතම ආවරණය වන පරිදි අතර 2018 වර්ෂයේදී මත්ස්‍ය පැටවු 4,128,811 ක් ජලාශ වල තැම්පත් කරන ලදි (2017 වර්ෂය තුල මත්ස්‍ය පැටවු 2,255,680 ක් ද ජලාශ වල තැම්පත් කරන ලදී) |

| | | |
|---|---|---|
| මත්ස්‍ය ඇසිත්තන් ඇල් කූඩු තුල තැම්පත් කර ජලාශවලට මුදා හැරීම | රු.මි. 4.86 | මත්ස්‍ය ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා අදාල ජලාශ තුලම ඇති කර එම ජලාශයට ම මුදා හැරීමට කටයුතු කරන ලදී. ඒ අනුව දැල් කූඩු සහිත ජලාශ සඳහා 2017 වර්ෂය තුල මත්ස්‍ය ඇසිත්තන් 2,330,000 ක් දැල් කූඩු තුල තැම්පත් කර ජලාශවලට මුදා හරින ලදී. එමෙන්ම 2018 වර්ෂය තුලදී මත්ස්‍ය ඇසිත්තන් 4,860,000 ක් දැල් කූඩු තුල තැම්පත් කර ජලාශවලට මුදා හරින ලදී. |
| ප්‍රජා සහභාගීත්ව මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන ඉදි කිරීම .<br><br> | රු.මි. 3.9 | උතුරු මැද පළාතේ ජලාශ සඳහා මුදා හැරිමට අවශ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය කරනු ලබන්නේ ජලජීවී අධිකාරියට අයත් මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන වලිනි .පළාතට අවශ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් අවශ්‍ය කාලය තුලදී ලබා දීමට ජලජීවී අධිකාරිය ප්‍රායෝගික අපහසුතාවක් පවතී. එයට පිළියමක් ලෙස ප්‍රජා සහභාගීත්වය මත මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමට 2018 වර්ෂයේ වෙන් වූ රුපියල් මිලියන 3.9 ක් වෙනුවෙන් පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හා ගල්කුලම මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන සංවර්ධන කටයුතු සිදු කරන ලදී. |

| | | |
|---|---|---|
| ධීවර ආම්පන්න ලබා දීම.  | රු.මි. 7.0 | ධීවර ඔරු සහ දැල් සඳහා විශාල ඉල්ලුමක් තිබුණද එම සම්පූර්ණ ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොතිබුනද 2018 වර්ෂයේ වෙන් වූ ප්‍රතිපාදන යටතේ ඔරු 22 ක් සහ කරමල් දැල් 2470 ක් ධීවර කාර්මිකයන් අතර බෙදා දීම සඳහා මිලදී ගන්නා ලදී. |
| මත්ස්‍ය ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා වර්ධනය කර ගැනීම සඳහා ජලාශවලට දැල් කූඩු ලබා දීම | රු.මි. 10 | මත්ස්‍ය ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා වර්ධනය කර ගැනීම සඳහා ජලාශවලට දැල් කූඩු ලබා දීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද අතර ඒ යටතේ දැල් කූඩු සඳහා විශාල ඉල්ලුමක් පවති. නමුත් 2017 වර්ෂයේ ප්‍රමාණවත් තරම් ප්‍රතිපාදන නොතිබූ බැවින් පැවති ප්‍රතිපාදන යටතේ ජලාශ සඳහා දැල් කූඩු 5 ක් ලබා දුන් අතර එම දැල් කූඩු වල මේ වන විට මත්ස්‍ය ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා වර්ධනය කර ජලාශ තුලට මුදා හැරීමේ කටයුතු සිදු කරනු ලැබේ. ඒ අනුව 2018 වර්ෂයේදි දැල් කූඩු 80 ක් මිලදී ගැනිමට කටයුතු කර ඇත. |
| විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය  | රු.මි. 8.025 | 2018 වර්ෂයේදි 40 % ප්‍රතිලාභී දායකත්වය මත වට ආවරණ දැල් 676 ක්ද , උඩු ආවරණ දැල් 165 ක්ද , සෙවන දැල් 84 ක් ද , ජී.අයි බට 947 ක්ද , විදුලි වතුර මෝටර් 38 (අගල් 2) ක්ද , ජලගිල්වුම් මෝටර් (අඟල් 2 ) 15 ක් ද මිලදී ගන්නා ලදී. |


| | | |
|---|---|---|
| විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ ආශ්‍රිත පුහුණු වැඩසටහන් පැවැත්වීම  | රු.මි. 0.435 | මෙම ව්‍යාපෘතිය යටතේ විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලෙන ප්‍රතිලාභීන් 80 ක් සඳහා රම්බඩගල්ල පුහුණු මධ්‍යස්ථානයේදී දින 3 බැගින් වූ පුහුණු වැඩසටහන් 2 ක් පවත්වන ලදී. ඒ සඳහා ප්‍රතිලාභීන් 70 ක් සහ නිලධාරීන් 10 ක් වන සේ 80 ක් පුහුණුව සඳහා සහභාගී විය. |
| මිරිදිය ධීවර කාර්මිකයින් පුහුණු කිරීමේ ව්‍යාපෘතිය  | රු.මි. 1 | මෙම ව්‍යාපෘතිය යටතේ 2018 වර්ෂයේදී අනුරාධපුර හා පොළොන්නරුව යන දිස්ත්‍රික්ක දෙකම ආවරණය වන පරිදි තෝරා ගත් ධීවර කාර්මිකයින් 225 දෙනෙකු සඳහා අම්පාර ජයන්ති වැව සඳහා ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවකට සහභාගී කරන ලද අතර , එහිදී එය ආදර්ශිතයක් කර ගනිමින් එහි කළමණාකාරිත්වය පිළිබඳ පුහුණුවක් ලබා දෙන ලදී. එමෙන්ම ධීවර කාර්මිකයින් 100 දෙනෙකු සඳහා මහඉලුප්පල්ලම පුහුණු මධ්‍යස්ථානයේදී ධීවර ගිණුම් පිළිබඳ හා මානසික සංවර්ධනය පිළිබඳ වැඩමුළු දෙකක් පවත්වන ලදී. |

## උතුරු මැද පළාතේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය 2014-2018

| දිස්ත්‍රික්කය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| අනුරාධපුර | 16,325 | 9,650 | 12,990 | 15,760 | 12,940 |
| පොළොන්නරුව | 7,558 | 7,160 | 3,525 | 8,310 | 11,600 |
| එකතුව | **23,883** | **16,810** | **16,515** | **24,070** | **24,540** |

මූලාශ්‍රය: පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ

අමාත්‍යාංශය යටතේ පවතින ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම යන ප්‍රධාන කාර්යය යටතේ 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො 15,760 සිට 12,940 දක්වා පසුබෑමක් පෙන්නුම් කළ ද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ නිෂ්පාදනය මෙ.ටො. 8,310 සිට 11,600 දක්වා වර්ධනයක් පෙන්නුම් කරයි. එසේ වුවද සමස්ත නිෂ්පාදනය ගත් විට 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ මත්ස්‍ය නිෂ්පාදනය වර්ධනයක් පෙන්වයි. එය මෙ.ටො. 470ක වැඩි වීමකි.




## ධීවර අංශයේ සංවර්ධනය උදෙසා
## අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය 2020 – 2021

| අරමුණු | ඉලක්ක | | අපේක්ෂිත ප්‍රතිඵල | |
|---|---|---|---|---|
| | 2020 | 2021 | කෙටිකාලීන | දිගුකාලීන |
| 1. ජාතික නිෂ්පාදනයට ධීවර අංශයෙන් පළාතෙන් දක්වන දායකත්වය වැඩිවීම | මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 3000 | මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 3000 | මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය අඩු වෙනත් ප්‍රදේශ වල ජනතාවට පරිභෝජනය සඳහා අතිරික්ත මත්ස්‍ය නිෂ්පාදනය අලෙවි කිරීමට හැකි වීම . | පළාතේ මත්ස්‍ය අස්වැන්න ඉහළ යාම. |

| | | | | |
|---|---|---|---|---|
| 2. මිරිදිය ධීවර කාර්මිකයින් සවිබල ගැන්වීම | මිරිදිය ධීවර කාර්මිකයින් 100 | මිරිදිය ධීවර කාර්මිකයින් 100 | ධීවර කාර්මිකයන්ගේ ආදායම් මට්ටම ඉහළ යාම තුලින් එම පවුල් වල ආර්ථික මට්ටම වැඩි දියුණු වීම. | මිරිදිය ධිවර කාර්මිකයින්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම |
| 4.විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලි ව්‍යවසායකයින්ගේ දැනුම කුසලතා ආකල්ප වර්ධනය කිරීම | ප්‍රතිලාභීන් 80 | ප්‍රතිලාභීන් 80 | අපනයන වෙළඳපොලට සුදුසු ආකාරයේ විසිතුරු මසුන් නිෂ්පාදනය වීම.<br>විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලෙන ව්‍යවසායකයින්ගේ දැනුම , කුසලතා සහ ආකල්ප සංවර්ධනය වීම | ඵලදායිතාවය හා කාර්යක්ෂමතාව ය වර්ධනය වීම.<br>2.නව ස්වයංරැකියා අවස්ථා නිර්මාණය වීම. |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

උතුරු මැද පළාත් ධීවර විෂයේ සංවර්ධනය උදෙසා 2018 වර්ෂයේදී අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට හැකි වූ අතර ඒ යටතේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහල නැංවීම, විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම, විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලි ව්‍යවසායකයින්ගේ දැනුම වර්ධනය කිරීම හා ධීවර කර්මාන්තය නගා සිටුවීම සඳහා අවශ්‍ය තාක්ෂණික මෙන්ම උපකරණ සැපයීම විශේෂයෙන් කැපී පෙනේ. ඉහත කාරණා වෙනුවෙන් 2018 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සියළු සංවර්ධන ව්‍යාපෘතීන් සාර්ථකව සතුටුදායක අන්දමින් නිම කිරීමට හැකි විය.

# 7.1. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

| | අනුරාධපුර | පොළොන්නරුව |
|---|---|---|
| පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය | 01 | - |
| නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම (ව්‍යාප්ති) කාර්යාලය | 01 | - |
| සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය - මහඉලුප්පල්ලම | 01 | - |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කලාප) කාර්යාල | 04 | 01 |
| කෘෂිකර්ම උපදේශක කාර්යාල | 32 | 05 |
| පළාත්බද පර්යේෂණ ආයතනය | 01 | - |
| පාංශු පරීක්ෂණාගාරය | 01 | - |

මූලාශ්‍රය:-පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

## දැක්ම

"තෘප්තිමත් හා සෞභාග්‍යමත් ගොවි ප්‍රජාවක් සහිත සමෘද්ධිමත් පළාතක් බිහි කිරීම".

## මෙහෙවර

"නව යෝග්‍ය කෘෂිකාර්මික තාක්ෂණය හා කෘෂිකාර්මික යටිතල පහසුකම් භාවිතයෙන් ආහාර සුරක්ෂිතතාව හා පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය, වාණිජ කෘෂිකර්මාන්තය හා කෘෂි ව්‍යාපාර සියළුම පාර්ශවකරුවන්ගේ මනා සහයෝගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම".

## දිගුකාලීන අරමුණු

- ❖ වී, අතිරේක බෝග,අල බෝග,එළවළු හා වෙනත් ආහාර බෝග සඳහා ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්ති හා පළාත් කෘෂිකර්ම අවශ්‍යතාවයන් හා ප්‍රමුඛතාවයන් මත පිහිටා විශිෂ්ට පළාත් කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන් ඉහළ කාර්යක්ෂමතාවයකින් හා ඵලදායිතාවයකින් සාක්ෂාත් කර ගැනීම.
- ❖ පළාත් කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන් තුළින් ගොවීන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීම, දිළිඳුකම පිටු දැකීම හා ජාතික ආහාර සුරක්ෂිතතාව හා යහපත් කෘෂි පිළිවෙත් අනුගමනය මගින් ගුණාත්මක හා ආරක්ෂාකාරී ආහාර නිෂ්පාදනය, පරිසර හිතකාමී කෘෂිකර්මාන්තයක් ළඟාකර ගැනීම.
- ❖ ජලය හා පස සංරක්ෂණය කර ගනිමින්, වෙනස් වන සමාජ, ආර්ථික හා කාලගුණික ප්‍රවණතාවයකට අනුකූලවන සේ සැකසූ වැඩසටහන් තුළින් තිරසාර කෘෂිකාර්මික ක්‍රමෝපායන් ළඟාකර ගැනීම.

❖ උසස් ගුණත්වයෙන් යුතු බීජ හා රෝපණ ද්‍රව්‍ය පළාත තුළ සුලභ කිරීම.

❖ දේශීය හා විදේශීය වෙළඳපොළ ඉලක්ක කර ගත් කෘෂිකර්මාන්තයට අවශ්‍ය සංවර්ධන වැඩසටහන් දියත් කිරීම තුළින් පළාතේ ගොවි ජනතාවගේ කෘෂි ව්‍යවසාය හැකියාවන් වර්ධනය කිරීම තුළින් තෘප්තිමත් ගොවි ජනතාවක් බිහි කිරීම.

## කෙටිකාලීන අරමුණු

❖ නව හා යෝග්‍ය කෘෂි තාක්ෂණය උතුරු මැද පළාත තුළ ප්‍රචලිත කිරීම

❖ ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

❖ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම.

❖ පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය.

❖ වාණිජ කෘෂිකර්මාන්තය හා කෘෂි ව්‍යාපාර ප්‍රවර්ධනය.

❖ කෘෂිකාර්මික යටිතල පහසුකම් සංවර්ධනය.

## ප්‍රධාන කාර්යයන්

✓ යහපත් ව්‍යාප්ති සේවාවක් සැපයීම සඳහා ගොවිජනතාවට නව තාක්ෂණය හඳුන්වා දීම තුළින් ඔවුන්ගේ දැනුම , ආකල්ප, කුසලතාවයන් වර්ධනය කිරීම.

✓ ගුණාත්මක බීජ හා රෝපන ද්‍රව්‍ය නිෂ්පාදනය හා සුලභතාවය ඇතිකිරීම.

✓ පැළෑටි සංරක්ෂණ පනත, පාංශු සංරක්ෂණ පනත, පළිබෝධනාශක පාලන පනත, බීජ පනත වැනි පනත් ක්‍රියාත්මක කිරීම.

✓ මහඉළුප්පල්ලම සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයෙන් ක්ෂේත්‍ර පුහුණු හා ප්‍රායෝගික සේවාස්ථ පුහුණු ගොවීන් හා නිලධාරීන් වෙත ලබා දීම.

✓ පළාත තුළ පරිසර හිතකාමී යහපත් කෘෂි පිළිවෙත් අනුගමනය කරන කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රමවේදයන් ප්‍රචලිත කිරීම.

✓ රටේ ආහාර සුරක්ෂිතතාවය ඇතිකිරීම මගින් ආහාර ද්‍රව්‍ය ආනයනය අඩු කිරීම.

✓ පළාත තුළ කෘෂිකර්මය මත පදනම් වූ කර්මාන්ත හා ව්‍යවසායකයින් හඳුනාගෙන වැඩි දියුණු කිරීම.

✓ ගොවීන්ගේ කෘෂි තාක්ෂණික ගැටළු හඳුනාගෙන පර්යේෂණ ආයතනයන් වෙත යොමු කිරීම.

✓ කෘෂිකර්මයට අදාල දත්ත හා තොරතුරු ජාලයක් හා තොරතුරු කේන්ද්‍රයක් පවත්වා ගැනීම තුළින් ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව සහ වෙනත් රාජ්‍ය ආයතනයන් මෙන්ම තොරතුරු දැන ගැනීමේ අදාල අය වෙත තොරතුරු ලබා දීම.

✓ කෘෂිකර්ම අමාත්‍යාංශය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය දායකත්වය ලබා දීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

01.වී සහ අතිරේක බෝග සඳහා නව තාක්ෂණය හඳුන්වා දීමට බෝග ආදර්ශණ සහ ක්‍රම, ආදර්ශණ ක්‍රියාත්මක කිරිම.

02.පරිසර හිතකාමී කෘෂිකර්මය සඳහා ඒකාබද්ධ පාලන ක්‍රම හා යහපත් කෘෂි පිළිවෙත් අනුගමනය කරන වැඩසටහන් කිරිම.

03.අස්වනු වැඩි කිරිම සඳහා බෝගවලට ඒකාබද්ධ පැළෑටි පෝෂණ ආදර්ශණ ක්‍රියාත්මක කිරිම හා වී සඳහා පැරිෂුට් තාක්ෂණය හඳුන්වා දීම වැනි නව උචිත තාක්ෂණයන් හඳුන්වා දිම.

04.වී සහ අතිරේක බෝගවල ගුණාත්මක බීජ සුලභ කිරිම සඳහා බීජ නිෂ්පාදන යාය පිහිටුවීම හා බීජ පනත ක්‍රියාත්මක කිරිම.

05.වී සහ අතිරේක බෝග සඳහා නව තාක්ෂණය හඳුන්වා දීමට බෝග ආදර්ශණ සහ ක්‍රම, ආදර්ශණ ක්‍රියාත්මක කිරිම.

06.නව කෘෂි ව්‍යවසායකයින් බිහි කිරිම සඳහා ගොවි කාන්තා හා තරුණ ගොවි සමාජ පිහිටු විම හා කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.

07.පාංශු සංරක්ෂණය දිරිමත් කිරිම සඳහා පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරිම.

08.පළිබෝධ පාලන නියාමනය සඳහා පළිබෝධ පාලන පනත ක්‍රියාත්මක කිරිම.

09.කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ යාන්ත්‍රීකරණය හඳුන්වා දිම තුළින් ඵලදායිතාව ඉහළ නැංවිම.

අංශය නියෝජනය කරන
තිරසර සංවර්ධන අරමුණු හා ක්‍රියාකාරකම් පෙළ ගැස්ම.




| අරමුණු අංකය | තිරසර සංවර්ධන අරමුණ | ක්‍රියාකාරකම් |
|---|---|---|
| 01 | **සියළු තන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරීම** | සඳහා කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධනය හා අලෙවිකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |
| 02 | **සාගින්න නැති කර ආහාර සුරක්ෂිතතාවය සහ පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම** | ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය සුලභ කිරීම |
| | | තිරසර ගොවිපල් ප්‍රවර්ධනය |
| | | නව තාක්ෂණය ප්‍රචලිත කිරීම |
| | | බෝග සායන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |
| | | ගෙවත්ත තිරසර ඒකකයක් ලෙස සංවර්ධනය කිරීම තුලින් පවුලේ පෝෂණය හා ආර්ථිකය ඉහළ නැංවීම |
| | | කාළගුණික විපර්යාසයන්ට අනුව හුරුවීම සඳහා පාංශු හා ජල සංරක්ෂණ ක්‍රම ප්‍රචලිත කිරීම |
| | | ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය සුලභ කිරීම |
| | | තිරසර ගොවිපල් ප්‍රවර්ධනය |
| 12 | **තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම** | 12.1.තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය සම්බන්ධයෙන් වන දස අවුරුදු වැඩ සැලැස්ම සංවර්ධනය වූ රටවල ප්‍රධානත්වයෙන් සියළුම රටවල් විසින් ක්‍රියාත්මක කිරීම |
| | | 12.2.2030 වන විට ස්වභාවික සම්පත් තිරසර අන්දමින් කළමනාකරණය කිරීම හා කාර්යක්ෂමව භාවිත කිරීම වෙත ළඟාවීම |

| | | |
|---|---|---|
| 12 | තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම | 12.3.2030 වන විට සිල්ලර හා පරිභෝජන මට්ටම්වල ඒක පුද්ගල ආහාර අපතේ යාම අවම කිරීම සහ පශ්චාත් අස්වනු හානි ඇතුළුව නිෂ්පාදන හා සැලසුම් දාමයන්හි සිදු වන්නා වූ අපතේ යාම අවම කිරීම |
| | | 12.4.2030 වන විට පරිසර හිතකාමී අන්දමට රසායනික ද්‍රව්‍ය හා සියළුම අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම ක්‍රියාවට නැංවීම |
| | | 12.5.2030 වන විට සියළුම ප්‍රදේශවල සිටින සියළුම දෙනාට තිරසාර සංවර්ධනය හා ස්වභාව ධර්මය සමඟ සුසංයෝගයෙන් යුත් ජීවන රටාවන් ගත කිරීම පිළිබඳව දැනුවත්භාවය තහවුරු කිරීම |
| 13 | **දේශගුණික විපර්යාස බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම.** | ජාතික මට්ටමේ ප්‍රතිපත්ති ක්‍රමෝපායන් හා සැලසුම්වලට කාලගුණ වෙනස්කම් අවම කිරීමට ක්‍රියාමාර්ග ගැනීම. |

## කාර්යය මණ්ඩල සංයුතිය - 2018

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 389 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 215 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 174 |
| අනියම් සංඛ්‍යාව | 11 |



## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 120.15 | 109.07 | 11.08 | 91 |
| ගමන් වියදම් | 3.75 | 3.74 | 0.01 | 99 |
| සැපයීම් | 7.42 | 6.79 | 0.63 | 92 |
| නඩත්තු වියදම | 5.65 | 5.27 | 0.38 | 93 |
| ගිවිසුම්ගත සේවා | 7.63 | 6.09 | 1.54 | 80 |
| මාරු කිරීම | 0.47 | 0.41 | 0.06 | 87 |
| **එකතුව** | **145.07** | **131.37** | **13.70** | **91** |

## මූලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 85.00 | 18.16 | 66.84 | 21.36 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම් හා උපකරණ | 1.00 | 0.09 | 0.91 | 9 |
| වාහන | 8.00 | 6.32 | 1.68 | 79 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 79.27 | 51.52 | 27.75 | 64.99 |
| **එකතුව** | **173.27** | **76.09** | **97.18** | **43.91** |

## කාර්ය සාධන ඉලක්ක 2017 - 2019

| අනු අංකය | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 |
| **01.** | නව හා යෝග්‍ය කෘෂි තාක්ෂණය උතුරු මැද පළාත තුල ගොවි ජනතාව අතර ප්‍රචලිත කිරීම | නව හා යෝග්‍ය කෘෂි තාක්ෂණය භාවිතය සඳහා යොමු වූ ගොවීන් ගණන | 20,000 | 40,000 | 50,000 |
| **02.** | ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය ප්‍රවර්ධනය | - ගුණාත්මක බිත්තර වී නිෂ්පාදිත ප්‍රමාණය (බුසල්) | 40,000 | 50,000 | 70,000 |
| | | - නිෂ්පාදිත ගුණාත්මක අතිරේක ආහාර බෝග බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.) | 50,000 | 80,000 | 120,000 |
| **03.** | පරිසර හිතකාමී කෘෂි කර්මාන්තය ප්‍රවර්ධනය | අඩු කෘෂි රසායන භාවිතා කර යහපත් කෘෂිකාර්මික පිළිවෙත් යටතේ බෝග වගාව සඳහා යොමු කල වගා වපසරිය (ha) | 50 | 400 | 600 |
| **04.** | වාණිජ කෘෂි කර්මාන්තය හා කෘෂි ව්‍යාපාර ප්‍රවර්ධනය | වාණිජ කෘෂි කර්මාන්තය හා කෘෂි ව්‍යාපාර සඳහා යොමු වූ ගොවීන් සංඛ්‍යාව | 20 | 100 | 150 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින්හි ප්‍රගතිය

| අ. අ | ප්‍රධාන අරමුණු | ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කල (රු.මි) | වැය කල (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|
| 01 | ගුණාත්මක බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය | බීජ හා රෝපණ ද්‍රව්‍ය ගුණාත්වය ඉහළ නැංවීම | ගුණාත්මක බිත්තර වී,අතිරේක ආහාර බෝග බීජ හා ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය | 10.00 | 9.5 | 100 |
| 02 | නව කෘෂි තාක්ෂණය ප්‍රචලිත කිරීම | නව තාක්ෂණය හා යහපත් කළමනාකරණ ක්‍රමවේද ප්‍රචලිත කිරීම | නව හා යෝග්‍ය කෘෂි තාක්ෂණය ගොවීන් අතරට රැගෙන යාම මඟින් නිෂ්පාදනය හා ඵලදායිතාවය ඉහළ නැංවීම (Climate smart techniques) භාවිතයට ගොවීන් හුරු කරවීම කෘෂි රසායන භාවිතය අවම කිරීම | 3.5 | 3.4 | 100 |
| | | බෝග සායන වැඩසටහන | ගොවි ක්ෂේත්‍රයන්හි රෝග හා පළිබෝධ ආශ්‍රිත ගැටළු හඳුනාගෙන ක්ෂේත්‍රයන්හි දිම විසඳුම් ලබා දීම, ඒ සම්බන්ධ දැනුම ලබා දීම අනිසි හා අවිධිමත් ලෙස කෘෂි රසායන භාවිතය අඩු කිරීම | | | |
| 03 | බෝග විවිධාංගීකරණය | තිරසර ගොවිපළ ප්‍රවර්ධනය | ගොවීන්ගේ ආදායම විවිධාංගීකරණය වීම. අනිසි කෘෂි යෙදවුම් භාවිතය අවම කිරීම මගින් නිෂ්පාදන වියදම අවම වීම | 5.05 | 4.35 | 85 |
| 04 | බෝ නොවන රෝග නිවාරණය | බෝ නොවන රෝග නිවාරණය සඳහා ආදර්ශ ගම්මාන පිහිටුවීම යටතේ ගෙවතු වගා ස්ථාපනය | පවුලේ පෝෂණය හා ආර්ථිකය ශක්තිමත් වීම සෞඛ්‍යාරක්ෂිත ආහාර පරිභෝජනය හේතුවෙන් නීරෝගී ප්‍රජාවක් බිහිවීම | 2.9 | 2.4 | 85 |

| අනු අංකය | ප්‍රධාන අරමුණු | ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කල (රු.මි) | වැය කල (රු.මි) | ප්‍රග තිය (%) |
|---|---|---|---|---|---|---|
| **05** | කාළගුණික විපර්යාසයන්ට අනුහුරුවීම | කාළගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා පාංශු හා ජල සංරක්ෂණ ක්‍රම ප්‍රචලිත කිරීම | පාංශ ඛාදනය වැලැක්වීම, රසායනික පොහොර භාවිතය අඩුවීම | 0.8 | 0.72 | 95 |
| **06** | කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධනය හා අලෙවිකරණය | කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධනය හා අලෙවිකරණය | සෞඛ්‍යාරක්ෂිත හා ගුණාත්මක ආහාර ද්‍රව්‍ය පාරිභෝගිකයන්ට ලබා ගැනීමේ අවස්ථා සුලභවීම කාබනික පොහොර සුලබවීම ගොවිපල නිෂ්පාදන අලෙවිකරණය ක්‍රමවත්වීම ගොවි කාන්තාවන් ස්වයං රැකියා සඳහා යොමු වීම තුලින් පවුලේ ආර්ථිකය ශක්තිමත්වීම කෘෂි ව්‍යවසායකයින් සංවර්ධනය තුලින් රැකියා උත්පාදනය හා ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත්වීම | 14.75 | 12.7 | 90 |
| **07** | කෘෂිකාර්මික තොරතුරු සැපයීම | උතුරු මැද පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුල තොරතුරු කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම | අරමුණු කර ඇති ඉලක්ක ළඟා කර ගෙන ඇත්ද? යන්න නිශ්චය කර ගැනීම ගොවීන් සඳහා සකස් කරනු ලබන දත්ත පද්ධතියෙන් කෘෂිකාර්මික කටයුතුවල දියුණුවක් ඇති වී තිබේද යන්න දැන ගැනීම ගොවීන් ගොවි සංවිධාන ලියාපදිංචිය තුලින් ඔවුන්ගේ නිෂ්පාදන සඳහා ගැනුම්කරුවන් සම්බන්ධ කිරීමේ හැකියාව උදාවීම | 0.5 | 0.495 | 95 |

| අ.අ | ප්‍රධාන අරමුණු | ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කල (රු.මි) | වැය කල (රු.මි) | ප්‍රග තිය (%) |
|---|---|---|---|---|---|---|
| 08 | කෘෂි පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය | උතුරු මැද පළාත් ගොවි ජනතාවගේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා කෘෂි පර්යේෂණ මධ්‍යස්ථානයක් ඉදි කිරීම | පාංශු පරීක්ෂණාගාරයක් ස්ථාපනය වීම (ගොවීන්ගේ වගා බිම්වල පාංශු පරීක්ෂාවෙන් පොහොර නිර්දේශ කිරීමේ ක්‍රමවේදය මගින් අනිසි පොහොර භාවිතය අවම කිරීම හා නිෂ්පාදනය/ ඵලදායිතාවය ඉහළ නැංවීම) බිම්මල් බීජ නිෂ්පාදනාගාරයක් ස්ථාපනයවීම(බිම්මල් නිෂ්පාදකයින්හට බීජ මිල දී ගැනීමේ අවස්ථා උදාවීම) | 19.00 | 14.64 | 95 |
| 09 | ආයතනික ධාරිතා සංවර්ධනය | විවිධ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් | වගා කාර්යක්ෂමතාවය හා ඒකක ඵලදායිතාවය ඉහල නැංවීම | 70.5 | 32.73 | 46 |
| | මුළු එකතුව | | | **127.0** | **80.93** | |

## සමස්ත සම්පත් උපයෝජනය

2018 වර්ෂය ආරම්භ වූයේ උතුරු මැද පළාතට විශේෂයෙන්ම අනුරාධපුර දිස්ත්‍රික්කයට නිසි පරිදි වර්ෂාව නොලැබීම නිසා කෘෂි කාර්මික නිෂ්පාදනය ඉතාමත් අඩු මහ කන්නයක් සමඟිනි. මේ නිසා 2018 යල කන්නයේ වී මෙන්ම අතිරේක ආහාර බෝගවල ද වගා වපසරිය ඉතාමත් අඩු මට්ටමක පැවතුනි. නමුත් 2018/19 මහ කන්නය සඳහා වර්ෂාපතනය නිසි පරිදි ලැබුණු බැවින් 2017/18 මහ කන්නයට වඩා වගා වපසරින්ගේ විශාල වැඩිවීමක් දක්නට ලැබුණි.

| 2018 වර්ෂයේ යල කන්නය හා 2018/19 මහ කන්නයේ වී සහ අනෙකුත් ආහාර බෝගවල නිෂ්පාදනය | | | | | | |
|---|---|---|---|---|---|---|
| බෝගය | 2018 යල කන්නය | | අපේක්ෂා කළ නිෂ්පාදනය (මෙ.ටො.) | 2018/19 මහ කන්නය | | අපේක්ෂා කළ නිෂ්පාදනය (මෙ.ටො.) |
| | ඉලක්කය (හෙක්) | ප්‍රගතිය (හෙක්) | | ඉලක්කය (හෙක්) | ප්‍රගතිය (හෙක්) | |
| වී | 21693 | 5445 | 26136 | 70788 | 58899 | 282715 |
| බඩඉරිඟු | 606 | 187 | 935 | 26194 | 16967 | 84835 |
| මිරිස් | 539 | 233 | 280 | 2635 | 1084 | 1300 |
| උඳු | 125 | 22 | 44 | 4216 | 2353 | 4706 |
| මුං | 127 | 41 | 49 | 379 | 130 | 156 |
| කව්පි | 165 | 50 | 60 | 547 | 335 | 402 |
| තල | 10695 | 4371 | 3497 | 79 | 3 | 2.4 |
| කුරක්කන් | 52 | 7 | 14 | 747 | 564 | 1128 |
| රටකජු | 98 | 42 | 84 | 303 | 211 | 422 |
| එළවළු | 2405 | 1087 | 16305 | 4347 | 1946 | 29190 |

2018 වර්ෂය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.මි. 127 ක ප්‍රතිපාදනයක් වෙන් වී තිබූ අතර එමඟින් තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක කර ගනිමින් කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන් සංරචක 04 ක් යටතේ ක්‍රියාත්මක කරන ලදි.

පළමු සංරචකය වන නිෂ්පාදනය හා ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා රු.මි. 10 ක් වෙන් කොට බීජ හා රෝපණ ද්‍රව්‍යවල ගුණත්වය ඉහළ නැංවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. ඒ යටතේ බිත්තර වී නිෂ්පාදනය, අතිරේක ආහාර බෝග බීජ නිෂ්පාදනය සියළුම කෘෂි උපදේශක කොට්ඨාශ ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරන ලදි.


## ගුණාත්මක බිත්තර වී නිෂ්පාදන වැඩසටහන

| ක්‍රියාකාරකම | වැඩසටහන් ගණන | | වපසරිය (අක්) | | ප්‍රතිලාභීන් ගණන | | අපේක්ෂිත නිෂ්පාදනය (බුසල්) | නිෂ්පාදනයේ අවම වටිනාකම (රු.මි.) |
|---|---|---|---|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | | |
| 1 Ac බිත්තර වී නිෂ්පාදන වැඩසටහන | 150 | 144 | 150 | 144 | 150 | 144 | 8640 | 8.64 |
| 5 Ac බිත්තර වී නිෂ්පාදන වැඩසටහන | 40 | 37 | 200 | 185 | 150 | 162 | 11100 | 11.10 |
| ස්වයං බිත්තර වී නිෂ්පාදනය | 1560 | 1490 | 52 | 49 | 1560 | 1490 | 2940 | 2.94 |
| 1 Ac පැෂුව් වගා වැඩසටහන | 25 | 25 | 25 | 25 | 25 | 25 | 2000 | 2.00 |
| ඒකාබද්ධ පළිබෝධ පාලන වැඩසටහන | 10 | 10 | 100 | 100 | 150 | 145 | 6000 | 6.00 |
| **එකතුව** | | | **527** | **503** | **2035** | **1966** | **30680** | **30.68** |

ගුණාත්මක බිත්තර වී නිෂ්පාදන වැඩසටහන ගොවීන් අතර ප්‍රචලිත වගාවක් වන අතර ඒ යටතේ 2018 යල කන්නයේ දී නිපදවන ලද බීජ ප්‍රමාණයක් 2018/19 මහ කන්නයට බිත්තර වී ලෙස අලෙවි කිරීමට ගොවීන් සමත් විය.බිත්තර වී නිෂ්පාදන වැඩසටහන යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පැළවීම පරීක්ෂා කල බීජ ලෙස අලෙවි කිරීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක කරන ලදි.








මෙම වැඩසටහන යටතේ 1 Ac බිත්තර වී නිෂ්පාදන වැඩසටහන, 5 Ac බිත්තර වී නිෂ්පාදන වැඩසටහන, ස්වයං බිත්තර වී නිෂ්පාදනය, 1 Ac පැරශුට් වගා වැඩසටහන, ඒකාබද්ධ පළිබෝධ පාලන වැඩසටහන් ක්‍රියාත්මක විය.

## සියළුම කෘෂි උපදේශක කොට්ඨාශ ආවරණය වන ලෙස ක්‍රියාත්මක කළ ගුණාත්මක අතිරේක ආහාර බෝග බීජ නිෂ්පාදන වැඩසටහන්

| බෝගය | වපසරිය (අක්) | | ප්‍රතිලාභීන් ගණන | | අපේක්ෂිත නිෂ්පාදනය (kg) | නිෂ්පාදන යේ අවම වටිනාකම (රු.මි.) |
|---|---|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | | |
| කව්පි | 100 | 95 | 75 | 86 | 47500 | 8.5 |
| රටකජු | 51 | 61.5 | 40 | 47 | 49200 | 12.3 |
| මුං | 100 | 91 | 75 | 102 | 45500 | 10.2 |
| උඳු | 200 | 161 | 150 | 142 | 80500 | 17.71 |
| ලොකු ළූණු සත්‍ය බීජ | බල්බ 1000 kg | බල්බ 3500 kg | 400 | 140 | 35 | 0.525 |
| එකතුව | | | 740 | 517 | 222735 | 49.235 |

ඉහත වැඩසටහන්වලට අමතරව ලොකු ළූණු සත්‍ය බීජ නිෂ්පාදනය සඳහා ගොවීන්ගේ මව් බල්බ 3950 kg ක් යල කන්නයේ දී වසන්තීකරණය සිදු කර ලබා දෙන ලදි. ලොකු ළූණු සත්‍ය බීජ නිෂ්පාදනය සඳහා සකස්කර ඇති වගාවක්
- ආඩියාගල කෘෂිකර්ම උපදේශක කොට්ඨාසයේ නිදර්ශනයකි.



මීට අමතරව දෙපාර්තමේන්තුවට අයත් පැල තවාන් ක්‍රමවත් කරමින් නිෂ්පාදනය ඉහළ නැංවීමටද කටයුතු කරන ලදි. එහි පළමු පියවර ලෙස දෙපාර්තමේන්තුවට අයත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ තැන තැන ස්ථාපනය කර තිබූ කුඩා පරිමාණයේ පැල තවාන් සියල්ල ඉවත් කර මහඉලුප්පල්ලම සේවා සංස්කරණ අභ්‍යාස භූමියේ ක්‍රමවත් ලෙස පැල තවානක් ආරම්භ කරන ලදි.

අතිරේක ආහාර බෝග බීජ නිෂ්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ලියාපදිංචි බීජ සපයා ගැනීම ප්‍රධාන අභියෝගයක් විය. ඒ නිසා අතිරේක අතිරේක ආහාර බෝග බීජ නිෂ්පාදන වැඩසටහන්වලට අමතරව අතිරේක ආහාර බෝග අස්වනු වැඩි කිරීමේ යාය වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලදි.

## ක්‍රියාත්මක කරන ලද ආහාර බෝග අස්වනු වැඩි කිරීමේ යාය වැඩසටහන්




| බෝගය | වපසරිය (අක්) | | ප්‍රතිලාභීන් ගණන | | අපේක්ෂිත නිෂ්පාදනය (kg) | නිෂ්පාදනයේ අවම වටිනාකම (රු.මි.) |
|---|---|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | | |
| කුරක්කන් | 200 | 251.5 | 20 | 338 | 88025 | 10.50 |
| සෝයා | 25 | 10 | 20 | 20 | 8000 | 0.72 |
| **එකතුව** | **225** | **261.5** | **40** | **358** | **96025** | **11.22** |

පළමු සංරචකය යටතේ දෙවන උප සංරචකය වන නව තාක්ෂණය සහ යහපත් කළමනාකරණ ක්‍රමවේද හඳුන්වාදීමට 2018 වර්ෂය සඳහා රු.මි. 3.8 ක ප්‍රතිපාදනයක් වෙන් කරන ලදි.

එහි දී දෙපාර්තමේන්තුවේ තාක්ෂණ නිලධාරීන්ගේ හා ගොවි ප්‍රජාවගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය වන පරිදි පුහුණු, දැනුවත් කිරීමේ වැඩසටහන්, ක්ෂේත්‍ර දින ක්‍රියාත්මක විය. ගොවීන්ගේ වගා ක්ෂේත්‍රවල ඇතිවන රෝග, පළිබෝධ හා අනෙකුත් හානි නිවැරිදි ලෙස හඳුනාගෙන ඒ සඳහා නිවැරදි පාලන ක්‍රම පිළිබඳ දැනුවත් වීම හරහා අනිසි කෘෂි රසායන භාවිතය වැළැක්වීම සඳහා විශේෂ වැඩසටහනක් ලෙස බෝග සායන ක්‍රියාත්මක කරන ලදි. මෙහි දී ශාක වෛද්‍යවරුන් ලෙස පුහුණු කර ඇති සියළුම කෘෂි උපදේශකවරු තම කාර්යාලය තුළ ස්ථිරව බෝග සායන ක්‍රියාත්මක කරන ලද අතර ක්ෂේත්‍රයේ අවශ්‍යතාවය අනුව ස්ථාන තෝරාගෙන බෝග සායන ක්‍රියාත්මක කරන ලදි.





2018 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ දී බඩඉරිඟු වගාවේ ආක්‍රමණශීලී සේනා දළඹුවා (Fall Army Warm) වාර්තාවීමත් සමඟ ඒ සඳහා කෘෂි කර්මාන්තයේ නියුතු සියළුම පාර්ශවයන් දැනුවත් කිරිමේ වැඩසටහන් හා එම පළිබෝධ හානිය මර්ධනය කිරිමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.





වර්තමානය වනවිට මෙරට තුළ කෘෂි කර්මාන්තය සැලකීමේ දී කෘෂි රසායන අනිසි ලෙස භාවිතය කැපී පෙනේ. මෙම තත්ත්ව නිසා නිෂ්පාදනයන් සඳහා දායකත්වය ගොවියා මෙන්ම පාරිභෝගිකයා ද විවිධ රෝගාබාධවලට ලක්වීමේ අවදානමක් ඇත.

මේ හේතුවෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) වැඩසටහනක් ක්‍රියාත්මක කරයි. මෙහි දී බිම සකස් කිරීමේ සිට අස්වනු අලෙවි කිරීම දක්වා සියලු අවස්ථාවන් නියාමනය සිදු කරයි. මෙම වැඩසටහන තුළ දී විශේෂයෙන්ම රෝග හා පළිබෝධවලට වගාවන් පාත්‍රවීම වැලැක්වීම සඳහා විවිධ උපක්‍රම භාවිතා කරමින්, වගාකරුවන්ගේ සනීපාරක්ෂාව හා සෞඛ්‍යාරක්ෂිත බව සුරක්ෂිත කරමින් පාරිභෝගියාටත් සෞඛ්‍යාරක්ෂිත එළවළු හා පළතුරු නිෂ්පාදනය සිදු කරයි.

ආම්භයේ දී මෙම වැඩසටහන තුළින් ගොවිපල් බිහි කරන ලද්දේ විදේශ වෙළඳපල ඉලක්ක කරගෙනය. 2018 වර්ෂයේ උතුරු මැද පළාත තුළ ගොවිපල් 174 ක් GAP වැඩසටහන යටතේ ලියාපදිංචිය සිදු කළ අතර මේ වන විට GAP සහතිකලාභී ගොවිපල් 24 ක් ඇත.

## 2018 වර්ෂයේ GAP වැඩසටහනේ ක්‍රියාකාරකම්



(GAP වැඩසටහන යටතේ ඇති පතෝල වගාවක්)



(ආඬියාගල කෘෂි උපදේශක කොට්ඨාශයේ GAP වැඩසටහන යටතේ Tom EJC අඹ වගාව සිදු කරන නිමල් දිසානායක මහතා අඹ අස්වනු නෙළන අවස්ථාවක්)

මීට අමතරව අනුරාධපුර නගරය තුළ සෞඛ්‍යාරක්ෂිත එළවළු හා පළතුරු අලෙවිසැලක් ස්ථාපනය කරමින් යහපත් කෘෂිකාර්මික පිළිවෙත් වැඩසටහන යටතේ ක්‍රියාත්මක ගොවිපල් නිෂ්පාදන දේශීය පාරිභෝගිකයාට ලබා ගැනීමට අවස්ථාවක් ද උදා කර ඇත.

පළමු සංරචකයේ තුන්වන උප සංරචකය වන බෝග විවිධාංගීකරණය හා බෝග කළාපීකරණය සඳහා 2018 වර්ෂය තුළ රු.මි. 5.05 ක ප්‍රතිපාදනයක් වෙන් කරන ලදි. මෙම වැඩසටහන වඩාත් ඵලදායීව ඉටු කිරීම සඳහා ගොවිපල් 500 ක් තෝරාගෙන ඒවා වර්ෂ තුනක දී තිරසර ගොවිපල් ලෙස සංවර්ධනය සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි. මෙහි ආරම්භක වර්ෂය ලෙස 2018 වර්ෂයේ දී ගොවිපල් තෝරාගෙන, පුහුණු වැඩසටහන් පවත්වා, ගොවිපල් සංවර්ධන සැලසුම් සකස් කරන ලදි.

එම වැඩසටහන තුළ බෝග විවිධාංගීකරණය ඇති කිරීමට සුදුසු පරිදි මිරිස් අක්කර 100 ක්, රතු ළූණු අක්කර 15 ක්, කව්පි අක්කර 40 ක්, කුරක්කන් අක්කර 50 ක් හා පළතුරු වගාවන් ඇති කිරීම සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබා දිම සිදු කරන ලදි.

පළමු සංරචකයේ හතරවන උප සංරචකය වන ගෙවතු ඒකක සංවර්ධනය සඳහා රු.මි. 2.9 ක ප්‍රතිපාදනයක් වෙන් කරන ලදි. මේ යටතේ උතුරු මැද පළාත තුළ ප්‍රධාන ලේකම්තුමන්ගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක බෝ නොවන රෝග ආදර්ශ ගම්මාන පිහිටුවීම යටතේ තෝරාගෙන ඇති ගෙවතු ඒකක 6000 ක් සඳහා ගෙවතු බීජ කට්ටල ලබා දීම හා ගෙවතු ඒකක 3000 ක් රෝපණ ද්‍රව්‍ය ලෙස කතුරු මුරුංගා, කොස් හා මිටි මුරුංගා ලබා දීම සිදු කරන ලදි. මීට අමතරව එම ගෙවතු සංවර්ධනයට අදාළව පුහුණු වැඩසටහන්වලදී අවශ්‍ය තාක්ෂණ දායකත්වය ලබා දීම ද සිදු කරමින් පවතී.

පාංශු හා ජල සංරක්ෂණ උප සංරචකය යටතේ 2017 වර්ෂයේ දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයෙන් ලැබුණු ප්‍රතිපාදන මත ඉදි කරන ලද අක්කර 160 ක පාංශු වැටි සංරක්ෂණය සඳහා මිටි මුරුංගා පැළ ලබා දීම සිදු කරන ලදි. එළවළු වගාව සඳහා රසායනික පොහොර භාවිතය අවම කිරීමට ගොවීන් යොමු කරවීමට ඒකාබද්ධ පැළෑටි පෝෂක කළමනාකරණ වැඩසටහන් (IPNS) අක්කර ¼ ආදර්ශණ ලෙස අක්කර 27 ක ක්‍රියාත්මක කරන ලදි.

## අලෙවිකරණය සහ තාක්ෂණ සංවර්ධනය යටතේ

1.2016 වර්ෂයේ දී ඉදි කිරීම් ආරම්භ කරන ලද මිහින්තලේ හෙළ බොජුන් අලෙවි සැලේ ඉදි කිරීම් කටයුතු අවසන් කිරීම.

මේ සඳහා රු.මි. 3 ක ප්‍රතිපාදනයක් වෙන් කෙරුණ අතර එහි ඉදි කිරීම් කටයුතු අවසන් කර ඇත.
හෙළ බොජුන් හල ආරම්භ කිරීම සඳහා ගොවි කාන්තාවන්ට මූලික දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් පවත්වන ලදි. එම අලෙවි සැල සඳහා අවශ්‍ය උපකරණ මිල දී ගැනීම ද සිදු කරන ලදි.

2. අනුරාධපුර නගර සභාව සමඟ ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කරන ලද මිහිඳුපුර හෙළ බොජුන් හල ඉදි කිරීම.

මෙහි ඉදි කිරීම් කටයුතු 2018 වර්ෂය අවසාන වන විට අවසන් කිරීමට නොහැකි විය.
පෙර හා පසු අස්වනු තාක්ෂණය හඳුන්වා දීම යටතේ පෙර අස්වනු හානිය අවම කිරීම සඳහා කරවිල, අඹ හා පේර සඳහා එලාවරණ 134,500 ක් ගොවීන් වෙත ලබා දෙන ලදි.

යහපත් කෘෂි කාර්මික පිළිවෙත් යටතේ සංවර්ධනය කරන ගොවිපල්වල ගොවීන් අස්වනු නෙළීමට හා ප්‍රවාහනය සඳහා ප්ලාස්ටික් කූඩා භාවිතයට හුරු කර ගැනීම සඳහා එම වැඩසටහන යටතේ ලියාපදිංචි ගොවිපල් සඳහා ප්ලාස්ටික් කූඩා 1500 ක් ලබා දෙන ලදි.

අතිරේක ආහාර බෝග බීජ ඊළඟ කන්නයේ වගාව සඳහා යොදා ගැනීමට ප්‍රරෝහණය අඩු නොවී ගබඩා කිරීම සඳහා ගොවීන්ට ත්‍රිත්ව ස්ථර මළු 3375 ක් ලබා දෙන ලදී. මෙහි දී මාස 06 කට ආසන්න ප්‍රමාණයක් ප්‍රරෝහණය අඩු නොවී තබා ගත හැකි අතර ධාන්‍ය ගුල්ලන්ගෙන් සිදු වන හානිය ද වැළකේ.

කෘෂි ව්‍යාපාර සඳහා තාක්ෂණික සහාය ලබා දීම යටතේ කොම්පෝස්ට් නිෂ්පාදකයින් වාණිජ මට්ටමට වැඩි දියුණු කිරීම සඳහා ද, පෙර වර්ෂවල අරඹන කරන ලද මී මැසි ගම්මාන තවදුරටත් සංවර්ධනය කිරීමට පුහුණු ලබා දීමද, මල් /විසිතුරු පත්‍ර ආදිය අපනයනය සඳහා මල් වගාකරුවන්ට අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීමට වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය ප්‍රවර්ධනය සඳහා සහභාගිත්ව සහතික කරන ක්‍රමවේදයක් (Participatory Guarantor System) සකස් කිරීමට සැලසුම් කර තිබුණත් 2018 වර්ෂය තුල එය සිදු කිරීමට නොහැකි විය. නමුත් කෘෂි උපදේශකවරුන්ගේ මැදිහත්වීම මත කීල්ස් ආයතනයට හා අපනයනය සඳහා ගොවීන්ගේ නිෂ්පාදන අලෙවි කිරීමේ කටයුතු සිදු කරන ලදී.

කෘෂි ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ රු.මි. 2.15 ක ප්‍රතිපාදනයක් වෙන් කරන ලදී.එහිදී ගොවි කාන්තාවන් ස්වයං රැකියා සඳහා යොමු කරමින් ඔවුන් සවිබල ගැන්වීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. කොහිල, පොළොස් වැනි අමුද්‍රව්‍ය භාවිතා කර නිර්මාංශ සොසේජස් නිෂ්පාදනයට ගොවි කාන්තාවන් දෙදෙනකු යොමු කිරීම සඳහා යන්ත්‍ර 02 ක් ලබා දීමද, සහල්/කුරක්කන් පිටි ආශ්‍රිත නිෂ්පාදන නිපදවීමට අවශ්‍ය උපකරණ කාන්තාවන් 08 දෙනකුට ලබා දීමද, කාන්තාවන් 05 දෙනකුට ධාන්‍ය ඇඹරුම් යන්ත්‍ර ලබා දීමද, පොල් ලෙලි කපන යන්ත්‍ර 02ක්, හාල් උර මහන මැෂින්, පරිප්පු අඹරන යන්ත්‍ර, පොලිතීන් සීලර්, පෙළ බොජුන් අලෙවි සැල් සඳහා බෝතල් ශීතකරණ, වතුර පෙරන යන්ත්‍රයක්, පළතුරු ඇඹරුම් යන්ත්‍රයක් හා ගෑස් සිලින්ඩර්,ගෑස් ලිප් ලබාදීම සිදු කරන ලදී. පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ලැබුණු ප්‍රතිපාදනවලින් ජංගම අලෙවි කුටි (පොළොන්නරුව, හිඟුරක්ගොඩ, තලාව, මිහින්තලේ) ලබා දෙන ලදී.

දේශීය අමුද්‍රව්‍ය යොදාගෙන විවිධ ආහාර නිෂ්පාදනය සඳහා කාන්තාවන් යොමු කිරීමට ආහාර නිෂ්පාදන පුහුණු වැඩසටහන් 14ක් සිදු කරන ලදී.බිම්මල් වගාව ආශ්‍රිතව ස්වයං රැකියා ආරම්භ කිරීමට අවස්ථා උදා කිරීම සඳහා මහඉලුප්පල්ලම සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ බිම්මල් පැකට් බීජ ඖෂණ කුටියක් ඉදි කරන ලදී. මෙහි දී බිම්මල් පැකට් පිරවීම බිම්මල් වගා මළු පුරවන යන්ත්‍රයෙන් සිදු කර, එම වගා මළුවල දිලීර වර්ධනය වූ පසු ගොවි කාන්තාවන් වෙත අලෙවි කිරීමත් එමඟින් ගෘහාශ්‍රිත බිම්මල් නිෂ්පාදනය සිදු කර අලෙවි කිරීමටත් සැලසුම් කර ඇත. බිම්මල් වගාව තවදුරටත් වැඩි දියුණු කිරීමට බිම්මල් ගෘහ 18 ක් ඉදි කිරීම සඳහා ද ප්‍රතිපාදන ගොවීන්ට ලබා දෙන ලදී.

## කාර්ය සාධනය කරා ළඟා වීමේ දී මුහුණ දුන් අභියෝග හා ගැටළු

- දේශගුණික විපර්යාසයන් හා වෙනස් වූ කාළගුණික තත්ත්වයන් නිසා සිදු වූ පාරිසරික බලපෑම්
- වර්ෂයේ මුල් කාලයේ පැවති නියං තත්ත්වය හා වර්ෂාවසානයේ දී අධික වර්ෂාපතනයක් ලැබීම හේතුවෙන් වගා වපසරිය අඩුවීම හා වගා කරන ලද බෝගයන්ද විනාශවීම
- ගොවීන් වැඩි දෙනෙකු වී නිෂ්පාදනය කරා යොමු වීම (පසුගිය වර්ෂ කිහිපයක් තිස්සේ වී නිෂ්පාදනය අඩාල වී තිබීම නිසා) හේතුවෙන් අතිරේක බෝග වගා වපසරිය අඩුවීම
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී පාර්ශවකරුවන්ගේ සහයෝගය ප්‍රමාණවත්ව නොලැබීම
- ආයතනයේ කාර්යමණ්ඩලය හිඟවීම - විශේෂයෙන් සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් හා කෘෂි උපදේශකවරුන්ගේ ඌනතාවය
- කෘෂි ව්‍යවසායකත්වයන් කරා යාමට බොහෝ ගොවීන්ට ප්‍රාග්ධන හැකියාවක් හා සමාජීය පසුබිමක් නොමැති වීම.

## විදේශ ආධාර මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති තුලින් ජනිත කළ ප්‍රතිලාභ පිළිබඳ විශ්ලේෂණය

| අංකය | ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල රු.මි | | ලැබුණු කෙටිකාලීන/දිගු කාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|
| | | | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | |
| 1. | වැව් ගම් පුබුදුව (CRIWMP) | වැව් පද්ධති වැඩි දියුණු කිරීම, විමධ්‍යගත ජල සම්පාදන හා කළමනාකරණ විසඳුම් වැඩි දියුණු කිරීම, ගංවතුර හා නියඟ තත්ත්වයන් සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති ශක්තිමත් කිරීම | 10.24 | 1.82 | 1.පරිසර හිතකාමී ගෙවතු වගා ස්ථාපනයවීම<br>2. කුඹුරු ඉඩම්වල ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා නියර වගාවන් ස්ථාපනයවීම |
| 2. | පාරිසරික සංවේදී කලාප පිහිටුවීම (ESA) | ප්‍රධාන පාරිසරික සංවේදී ප්‍රදේශවලට ආසන්නයේ පවතින ප්‍රදේශ සංරක්ෂණය කිරීම | 4.12 | 2.58 | 1.පරිසර හිතකාමී ගෙවතු වගා ස්ථාපනයවීම<br>2. පරිසර හිතකාමී ක්‍රමවේද ලෙද පැරඹුට් වගාවන් සඳහා ගොවීන් යොමුවීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3. | මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම්වලට අනුහුරු කරවීම | අමතර ආදායම් මාර්ග ඇති කිරීම, පවුලේ එළවළු හා පළතුරු පරිභෝජනය ඉහළ දැමීම සඳහා ගෙවතු වගා ඇති කිරීම, පාංශු සංරක්ෂණ ක්‍රම ඇති කිරීම, අවම ජල පරිභෝජනයට හුරු වීම, ක්ෂුද්‍ර ජල පරිභෝජනයට හුරුවීම, කාන්තා ගොවි සංවිධාන බල ගැන්වීම, නව තාක්ෂණික උපකරණ හා දැනුම ලබාදීම | 5.52 | 3.01 | ගෘහාශ්‍රිත ආහාර සුරක්ෂිතතාව දියුණු කිරීම හා වර්ෂා ජලයෙන් වගා කරන ගොවි පවුල් සඳහා නම්‍යශීලී ජීවනෝපාය ක්‍රම හඳුන්වාදීම, වැසි දියෙන් ගොවිතැන් කරන ගොවි ජනතාවට දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දිය හැකි විකල්ප ආදායම් මාර්ග හඳුන්වා දීම හා ප්‍රවර්ධනය කිරීම. |

## වෙනත් රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අංකය | ව්‍යාපෘතිය | විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | | ලැබුණු කෙටිකාලීන දිගු කාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන් කළ (රු.මි) | වැය කළ(රු.මි) | භෞතික (%) | මූල්‍ය (%) | |
| 1. | දේශීය ලොකු එළු නිෂ්පාදනය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය | ආනයනය අවම කිරීම, වාණිජ බෝගයක් ලෙස ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම | 3.48 | 3.46 | 100 | 100 | ලොකු එළු නිෂ්පාදනය ඉහළ යාම, ගොවීන්ගේ ආදායම ඉහළ යාම |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 2. | ජනාධිපති ලේකම් කාර්යාලයේ කඩිනම් ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන | අනිසි කෘෂි යෙදවුම් භාවිතය අවම කිරීම මඟින් නිෂ්පාදන වියදම අවම කිරීම, උතුරු මැද පළාත තුල පරිභෝජනය සඳහා ගුණාත්මක හා සෞඛ්‍යාරක්ෂිත එළවළු සුලබ කිරීම මඟින් ගොවියාගේ හා පාරිභෝගිකයාගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම, රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර භාවිතයට දිරි ගැන්වීම | 15.01 | 14.79 | 95 | 99 | අනිසි ලෙස කෘෂි යෙදවුම් භාවිතය අවම කිරීමේ නව තාක්ෂණික ක්‍රමවේද සඳහා ගොවීන් යොමු කර ගැනීම |
| 3. | කෘෂිකර්ම අමාත්‍යාංශයේ අපි වවලා අපි කන්නේ | ගොවියාට ඇති සමාජීය තත්ත්වය හා පිළිගැනීම වඩා යහපත් කිරීම,තරුණ පරපුර කෘෂිකර්මාන්තය වෙත ආකර්ශණය කර ගැනීම, රටපුරා ආදර්ශමත් ගොවීන් හා ගොවිපළවල් බිහි කිරීම | 3.51 | 3.51 | 60 | 100 | දේශීය ආහාර බෝග නිෂ්පාදනය වැඩිවීම, වාණිජ ගොවීන් බිහිවීම |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **4.** | ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන | ආහාර නිෂ්පාදනය හා ඵලදායිතාවය ඉහළ නැංවීම | 0.65 | 0.65 | 95 | 100 | නිෂ්පාදනය ඉහළ යාම, නව තාක්ෂණික ක්‍රමවේද සඳහා හා අඩු රසායන භාවිත වගා ක්‍රම සඳහා ගොවීන් යොමුවීම |
| **5.** | ඵලදායිතා ප්‍රවර්ධන හා වාරිමාර්ග පද්ධති කාර්යක්ෂම තා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | තෝරා ගන්නා ලද වාරිමාර්ග පද්ධතිවල නිෂ්පාදනය හා ඵලදායිතාවය ඉහළ නැංවීම | 2.93 | 1.53 | 60 | 52 | ගුණාත්මක බිත්තර වී නිෂ්පාදනය, පැරඹුට් වගාව ප්‍රචලිතවීම |
| 6. | කෘෂිකර්ම අමාත්‍යාංශයේ අපි වවලයි අපි කන්නේ - සරුපිරි ගෙවත්ත | ගෙවත්ත සරු පිරි ඒකකයක් ලෙස සංවර්ධනය | 1.99 | 1.71 | 60 | 86 | ගෙවතු වගා ගුල පළතුරු බෝග ස්ථාපනයවීම |
| 7. | සේනා දළඹුවා පාලනය කිරීමේ වැඩසටහන | දළඹුවා මර්දනය කිරීම මඟින් හානිය අවම කිරීම | 4.00 | 4.00 | 40 | 100 | දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, පෝස්ටර්, බැනර් ප්‍රදර්ශනය කිරීම හා අත්පත්‍රිකා බෙදා හැරීම තුලින් ක්ෂේත්‍රය දැනුවත් වීම |

## කෘෂිකාර්මික අංශයේ

## සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් 2020 – 2030

**අරමුණ : සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම**

| ඉලක්කය | පාදක වර්ෂය - 2015 | සංධිස්ථාන 01 - 2020 | සංධිස්ථාන 02 - 2025 | සංධිස්ථාන 03 - 2030 |
|---|---|---|---|---|
| 1. 2030 වන විට වී වගාවේ ඵලදයීතාවය 5.0 mt/Ha දක්වා ඉහළ නැංවීම | 4. 0 mt/Ha | 4.2 mt/Ha | 4.5 mt/Ha | 5.0 mt/Ha |
| 2. 2030 වන විට මුං වගාවේ ඵලදයීතාවය 2.0 mt/Ha දක්වා ඉහළ නැංවීම | 1. 0 mt/Ha | 1.2 mt/Ha | 1.6 mt/Ha | 2.0 mt/Ha |
| 3. 2030 වන විට මුං වගා වපසරිය 2000 Ha දක්වා ඉහළ නැංවීම | 507 Ha | 750 Ha | 1250 Ha | 2000 Ha |
| 4. 2030 වන විට උඳු වගාවේ ඵලදයීතාවය 2.0 mt/Ha දක්වා ඉහළ නැංවීම | 1. 1 mt/Ha | 1.3 mt/Ha | 1.6 mt/Ha | 2.0 mt/Ha |
| 5. 2030 වන විට කව්පි වගාවේ ඵලදයීතාවය 1.5 mt/Ha දක්වා ඉහළ නැංවීම | 1. 0 mt/Ha | 1.1 mt/Ha | 1.3 mt/Ha | 1.5 mt/Ha |
| 6. 2030 වන විට කව්පි වගා වපසරිය 1500 Ha දක්වා ඉහළ නැංවීම | 542 Ha | 750 Ha | 1000 Ha | 1500 Ha |
| 7. 2030 වන විට සෝයා වගාවේ ඵලදයීතාවය 2.0 mt/Ha දක්වා ඉහළ නැංවීම | 1. 5 mt/Ha | 1.6 mt/Ha | 1.8 mt/Ha | 2.0 mt/Ha |
| 8. 2030 වන විට සෝයා වගා වපසරිය 1500 Ha දක්වා ඉහළ නැංවීම | 109.5 Ha | 500 Ha | 1000 Ha | 1500 Ha |

| ඉලක්කය | පාදක වර්ෂය - 2015 | සංධිස්ථාන 01 - 2020 | සංධිස්ථාන 02 - 2025 | සංධිස්ථාන 03 - 2030 |
|---|---|---|---|---|
| 9. 2030 වන විට කුරක්කන් වගාවේ ඵලදයීතාවය 1.8 mt/Ha දක්වා ඉහළ නැංවීම | 0.8 mt/Ha | 1.0 mt/Ha | 1.4 mt/Ha | 1.8mt/Ha |
| 10. 2030 වන විට රටකජු වගා වපසරිය 1000 Ha දක්වා ඉහළ නැංවීම | 227 Ha | 400 Ha | 700 Ha | 1000 Ha |
| 11. 2030 වන විට ලොකු එ ැණු වගාවේ ඵලදයීතාවය 25 mt/Ha දක්වා ඉහළ නැංවීම | 16 mt/Ha | 18 mt/Ha | 20 mt/Ha | 25 mt/Ha |
| 12. 2030 වන විට ලොකු ළූණු වගාව 1500 Ha දක්වා ඉහළ නැංවීම | 1061 Ha (231 Ha / 2017) | 1000 Ha | 1250 Ha | 1500 Ha |
| 13. 2030 වන විට ඵලවළු හා පලතුරු වල පසු අස්වනු හානිය 30% දක්වා පහළ දැමීම | 40% | 38% | 35% | 30% |
| 14. මිල උච්චාවචනය පාලනය සඳහා 2030 වන විට 1000 Ha අඹ වගාවන් අවාරයේ ඵල උත්තේජනයට යොමුකිරීම | 10 Ha | 200 Ha | 500 Ha | 1000 Ha |
| 15. 2030 වන විට ඵල දරණ අඹ වගාවන්හි ඵලදායීතාවය නැංවීම සඳහා ගස් කප්පාදුව100% අවසන් කිරීම | 10% | 30% | 60% | 100% |
| 16. සෞඛ්‍ය ආරක්ෂිත කෘෂි නිෂ්පාදන සුලභ කිරීම සඳහා කෘෂිරසායන භාවිතය අවම කරමින් යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කරමින් වගාකරන වගාවපසරිය 2030 වන විට 1200 Ha දක්වා ඉහළ නැංවීම | 20 Ha | 200 Ha | 700 Ha | 1200 Ha |

| | | | | |
|---|---|---|---|---|
| 17. කාලගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා භූගත ජලමට්ටම ඉහළ නැංවීමට හා මතුපිට පස ආරක්ෂාකර ගැනීම සඳහා පාංශු සංරක්ෂණ ක්‍රම අනුගමනය කරන වගා ඉඩම් ප්‍රමාණය 2030 වන විට 6000 Ha දක්වා ඉහළ නැංවීම | 60 Ha | 2000 Ha | 4000 Ha | 6000Ha |
| 18. උතුරු මැද පළාත තුල පාරිභෝජනය සඳහා ගුණාත්මක හා සෞඛ්‍ය ආරක්ෂක ආහාර සුලබ කිරීම සඳහා දේශීය ආහාර අලෙවිසැල් හා GAP අලෙවිසැල් 40 ක් 2030 වන විට ස්ථාපනය කිරීම | 0 | 20 | 30 | 40 |
| 19. පවුලේ පෝෂණය හා ආර්ථිකය ඉහළ නැංවීම සඳහා 2030 වන විට ගෙවතු ඒකක 25000 ක් තිරසාර ඒකකයක් ලෙස සංවර්ධනය කිරීම | - | 6000 | 16000 | 25000 |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

කාර්ය මණ්ඩලයේ ඌනතාවය මධ්‍යයේ වුවද 2018 ක්‍රියාකාරී සැලැස්ම යටතේ සැලසුම් කරන ලද ව්‍යාපෘතිවලින් බොහෝ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හැකිවිය.

කාළගුණික විපර්යාසයන් වර්ෂය තුළ පැවති වෙනත් විවිධ දුෂ්කරතා හමුවේ ඒවාට සාර්ථකව මුහුණ දීමෙන් අපේක්ෂිත ඉලක්ක කරා යොමුවීම තුලින් කාර්ය සාධනය මට්ටමකින් ළඟාකර ගැනීමට හැකිවූ වර්ෂයකි.

- මෙය හිස්ව තබන ලද පිටුවකි-

# 7.2. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**සත්ත්ව ගහනය හා ගොවිපල් පිළිබඳ තොරතුරු - අනුරාධපුර දිස්ත්‍රික්කය 2015 – 2018**

| වර්ගය | අනුරාධපුර දිස්ත්‍රික්කය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ගොවිපල් සංඛ්‍යාව | | | | සතුන් සංඛ්‍යාව | | | |
| | **2015** | **2016** | **2017** | **2018** | **2015** | **2016** | **2017** | **2018** |
| එළ ගව | 27,023 | 28,598 | 27,225 | 28,602 | 113,900 | 119,287 | 126,118 | 130,530 |
| මී ගව | 1,620 | 1,599 | 1,581 | 1,275 | 32,610 | 31,267 | 32,783 | 36,517 |
| එළු | 2,299 | 1,941 | 1,700 | 1,734 | 29,878 | 29,604 | 29,168 | 35,266 |
| සූකර | 449 | 383 | 253 | 288 | 8,870 | 10,274 | 11,351 | 11,377 |
| කුකුළු | 11,200 | 11,870 | 14,599 | 14,171 | 405,401 | 613,716 | 3,047,614 | 1,454,472 |
| එකතුව | **42,591** | **44,391** | **45,358** | **46,070** | **590,659** | **804,148** | **3,247,034** | **1,668,162** |

මූලාශ්‍රය: පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**සත්ත්ව ගහනය හා ගොවිපල් පිළිබඳ තොරතුරු - පොළොන්නරුව දිස්ත්‍රික්කය 2015 – 2018**


| වර්ගය | පොළොන්නරුව | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ගොවිපල් සංඛ්‍යාව | | | | සතුන් සංඛ්‍යාව | | | |
| | **2015** | **2016** | **2017** | **2018** | **2015** | **2016** | **2017** | **2018** |
| එළ ගව | 10,185 | 12,406 | 13,445 | 12,642 | 63,100 | 72,591 | 71,390 | 81,093 |
| මී ගව | 682 | 740 | 938 | 796 | 22,110 | 25,406 | 21,603 | 25,428 |
| එළු | 857 | 916 | 1,129 | 953 | 8,220 | 9,175 | 13,813 | 17,273 |
| සූකර | 640 | 175 | 90 | 90 | 4,550 | 5,529 | 4,931 | 5,016 |
| කුකුළු | 8,750 | 9,124 | 6,953 | 5,033 | 642,000 | 438,358 | 3,469,278 | 3,306,281 |
| එකතුව | **21,114** | **23,361** | **22,555** | **19,514** | **739,980** | **551,059** | **3,581,015** | **3,435,091** |

මූලාශ්‍රය: පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

## උතුරු මැද පළාතේ සත්ත්ව ගොවිපළ සංඛ්‍යාව 2015-2018

| වර්ගය | සත්ව ගොවිපල සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | **2015** | **2016** | **2017** | **2018** |
| එළ ගව | 37,208 | 41,004 | 40,670 | 41,244 |
| මී ගව | 2,302 | 2,339 | 2,519 | 2,071 |
| එළු | 1,714 | 2,857 | 2,829 | 2,687 |
| සූකර | 1,089 | 558 | 343 | 378 |
| කුකුළු | 19,950 | 20,994 | 21,552 | 19,204 |
| **එකතුව** | 64,278 | 69,768 | 69,930 | 67,602 |


මූලාශ්‍රය: පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව




## උතුරු මැද පළාතේ සත්ත්ව සංඛ්‍යාව 2015-2018

| වර්ගය | සත්ත්ව සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 |
| එළ ගව | 177,000 | 145,182 | 197,508 | 211,623 |
| මී ගව | 54,720 | 56,673 | 54,386 | 61,945 |
| එළු | 38,098 | 38,779 | 42,981 | 52,539 |
| සූකර | 13,420 | 15,803 | 16,282 | 16,393 |
| කුකුළු | 1,047,401 | 1,052,074 | 6,516,892 | 4,760,753 |
| **එකතුව** | 1332654 | 1310527 | 6830066 | 5105271 |

මූලාශ්‍රය: පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව



## වාර්ෂික කිරි නිෂ්පාදනය 2015-2018

| දිස්ත්‍රික්කය | කිරි ලීටර් (මිලියන) | | | | සුළු පරිමාණ සැකසුම්කරුවන් | | | | අගය එකතු කළ කිරි ප්‍රමාණය (ලීටර් මිලියන) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 | 2015 | 2016 | 2017 | 2018 | 2015 | 2016 | 2017 | 2018 |
| අනුරාධපුර | 23.38 | 24.67 | 34.6 | 34.18 | 81 | 81 | 80 | 128 | 2.0 | 2.0 | 1.9 | 2.44 |
| පො/නරුව | 13.27 | 10.90 | 14.6 | 9.96 | 17 | 17 | 20 | 39 | 0.9 | 0.9 | 1.6 | 1.96 |
| **එකතුව** | **36.65** | **35.57** | **49.2** | **44.14** | **98** | **98** | **100** | **167** | **2.9** | **2.9** | **3.5** | **4.4** |

මූලාශ්‍රය:- පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

## මස් සහ බිත්තර නිෂ්පාදනය 2015 - 2018

| විස්තරය | අනුරාධපුර (මෙ.ටො) | | | | පොළොන්නරුව (මෙ.ටො) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 | 2015 | 2016 | 2017 | 2018 |
| ගව මස් | 2,570.50 | 1,143.94 | 1486.44 | 1,796.35 | 777.80 | 415.40 | 333.00 | 334.00 |
| එළු මස් | 41.40 | 41.78 | 17.54 | 22.94 | 24.00 | - | 0.00 | 0.00 |
| ඌරු මස් | 25.7 | 79.39 | 199.26 | 76.40 | 19.00 | - | 0.00 | 0.00 |
| කුකුළු මස් | 3,078.10 | 2,493.00 | 4,241.81 | 1,302.30 | 2,578.00 | 3,600.00 | 5,889.00 | 6,623.60 |
| එකතුව | **5,715.70** | **3,758.11** | **5,945.05** | **3,179.99** | **3,398.80** | **4,015.40** | **6,222.00** | **6,957.60** |
| බිත්තර (මිලියන) | 23.41 | 23.67 | 25.53 | 23.98 | 11.82 | 14.15 | 16.04 | 16.62 |

මූලාශ්‍රය:- පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

## පළාතේ පශු වෛද්‍ය කාර්යාලය (29) අනුරාධපුර දිසුත්‍රික්කය (22) පොළොන්නරුව දිස්ත්‍රික්කය (07)

| | |
|---|---|
| නැගෙනහිර නුවරගම් පළාත | නාච්චාදූව |
| රඹෑව | තලාව |
| මැදවච්චිය | තඹුත්තේගම |
| කැබිතිගොල්ලෑව | නොච්චියාගම |
| පදවිය | රාජාංගනය |
| මිහින්තලේ | ඉපලෝගම |
| කහටගස්දිගිලිය | පලාගල |
| හොරොව්පොතාන | ගල්නෑව |
| තිරප්පනේ | මධ්‍යම නුවරගම් පළාත |
| කැකිරාව | විලච්චිය |
| ගලෙන්බිඳුණුවැව | පලුගස්වැව |

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

| | |
|---|---|
| පොළොන්නරුව | ලංකාපුර |
| මින්නේරිය | මැදිරිගිරිය |
| බකමූණ | වැලිකන්ද |
| අරංගල | |

## දැක්ම

" නිරෝගී හා ඵලදායී පශු සම්පතක්, ඉසුරුමත් ප්‍රජාවක් "

## මෙහෙවර

" පශු සම්පත්, සත්ත්ව නිෂ්පාදන හා එහි ඵලදායිතාවය, වෙළඳපොළ සහ ඒ ආශ්‍රිත පරිසර ආරක්ෂාව සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම ".

## දිගු කාලීන අරමුණු

දේශීය කිරි නිෂ්පාදනයට උතුරු මැද පළාතේ 2016 වසරෙහි පැවති දායකත්වය වන 10% 2020 වසර වනවිට 30% දක්වා ඉහළ නැංවීම.

## කෙටි කාලීන අරමුණු

- ගොවිපළ සතුන්ගේ සෞඛ්‍ය සතුටුදායක මට්ටමක පවත්වා ගැනීම.
- සතුන්ගේ නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම.
- සත්ව පාලනය ප්‍රචලිත කිරීම.

## ප්‍රධාන කාර්යයන්




## ප්‍රධාන උපාය මාර්ගයන්

ප්‍රශස්ත සත්ත්ව සෞඛ්‍ය සේවාවක් ලබා දීම තුළින් සත්ත්ව සෞඛ්‍ය සතුටුදායක මට්ටමක පවත්වා ගැනීමත්, ආරය උසස් කිරීම මගින් නිෂ්පාදන ධාරිතා වර්ධනය කර ගැනීමත් සහ තාක්ෂණ ප්‍රචාරණය මගින් උචිත නිෂ්පාදන ක්‍රමවේද ප්‍රචලිත කිරීම.

## අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු

**අරමුණු අංක -02**

**සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයක් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.**

2.1. 2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන්ද ඇතුළත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවදානමට ලක් වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී,පෝෂණයෙන් යුත් ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි වීම.

2.3. 2030 වන විට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම තහවරු කිරීම සහ ජෛව පද්ධති පැවතීම තහවරු කිරීම.

2.4. 2020 වන විට බිජවල,වගා කරන ලද ශාකවල සහ ගොවිපළ සහ ගෘහාශ්‍රිත සතුන්ගේ ජානමය විවධත්වය පවත්වාගෙන යාම.

2.a. කෘෂිකාර්මික නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම සඳහා ග්‍රාමීය යටිතල පහසුකම්,කෘෂිකාර්මික පර්යේෂණ සහ ව්‍යාප්ති සේවාවන් තාක්ෂණ සංවර්ධනය සහ ශාක සහ පශු සම්පත් ජාන බැංකු සඳහා සිදු කරන ආයෝජනය වැඩි කිරීම.

**අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 12**

**තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම.**

12.1. තිරසර පරිබෝජනය හා නිෂ්පාදනය සම්බන්ධයෙන් වන දස අවුරුදු වැඩ සැලැස්ම සංවර්ධනය වු රටවල ප්‍රධානත්වයෙන් සියළුම රටවල් විසින් ක්‍රියාත්මක කිරීම.

12.2. 2030 වන විට ස්වභාවික සම්පත් තිරසර අන්දමින් කළමනාකරණය කිරීම හා කාර්යක්ෂමව භාවිතා කිරීම වෙත ළඟා වීම.

12.3 2030 වන විට සිල්ලර හා පරිභෝජන මට්ටම්වල ඒක පුද්ගල ආහාර අපතේ යාම අවම කිරීම සහ පශ්චාත් අස්වනු හානි ඇතුළුව නිෂ්පාදන හා සැලයුම් දාමයන්හී සිදුවන්නා වු අපතේ යාම අවම කිරීම.

12.4. 2020 වන විට පරිසර හිතකාමී අන්දමට රසායනික ද්‍රව්‍ය හා සියළුම අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම ක්‍රියාවට නැංවීම.

12.8. 2030 වන විට සියළුම ප්‍රදේශවල සිටින සියළුම දෙනාට තිරසාර සංවර්ධනය හා ස්වභාධර්මය සමග සුසංයෝගයෙන් යුත් ජිවන රටාවන් ගත කිරීම පිළිබඳව දැනුවත්භාවය තහවරු කිරීම.

## කාර්යය මණ්ඩල සංයුතිය - 2018

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 325 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 245 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 108 |

## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2018 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 132.30 | 131.93 | 0.37 | 99.7 |
| ගමන් වියදම් | 4.68 | 4.67 | 0.003 | 99.7 |
| සැපයීම් | 5.30 | 5.26 | 0.038 | 99 |
| නඩත්තු වියදම් | 6.30 | 6.29 | 0.010 | 99.8 |
| ගිවිසුම්ගත සේවා | 3.32 | 3.30 | 0.020 | 99 |
| මාරු කිරිම් | 1.20 | 1.15 | 0.050 | 96 |
| **එකතුව** | **153.10** | **152.6** | **0.491** | **99.7** |


## මුලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2018 වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1.50 | - | 1.50 | 1.50 |
| වාහන | 2.06 | 1.79 | 0.27 | 87 |
| ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 1.00 | 0.86 | 0.14 | 86 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් (පශු වෛද්‍ය කාර්යාල ඉදිකිරිම්) | 8.00 | 3.56 | 4.44 | 45 |

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2018 වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 2.50 | 2.22 | 0.28 | 89 |
| ආයෝජන - (i) සත්ව සංවර්ධනය | 29.20 | 21.53 | 7.67 | 74 |
| (ii) මහජන සෞඛ්‍ය හා පශු වෛද්‍ය සේවා | 19.80 | 14.66 | 5.13 | 74 |
| (iii) කුඩා හා මධ්‍යම පරිමාණ වානිජ ගොවිපල් ප්‍රවර්ධනය | 28.00 | 22.30 | 5.70 | 80 |
| **එකතුව** | **92.06** | **66.92** | **25.13** | **73** |

## පසුගිය වර්ෂ කිහිපයක සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය - පසුගිය වසර 03ක ප්‍රාග්ධන වැය විම

| වර්ෂය | PSDG (රු.මි) | PCDG (රු.මි) | වෙනත් ප්‍රතිපාදන (රු.මි) | මුදල (රු.මි) |
|---|---|---|---|---|
| 2015 | 29.20 | 2.28 | 12.63 | 44.11 |
| 2016 | 50.46 | - | 15.38 | 65.84 |
| 2017 | 44.77 | 0.29 | 18.13 | 63.19 |
| 2018 | 79.65 | 4.34 | 31.30 | 115.29 |



## දිගුකාලින හා කෙටිකාලින අරමුණු ඉටුකර ගැනිම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධ ව්‍යාපෘති පිළිබඳ තොරතුරු

**පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ නව වැඩ ව්‍යාපෘති හා එහි ප්‍රගතිය - 2018.12.31 දිනට**

| අංකය | අරමුණ | ව්‍යාපෘතිය/ ව්‍යාපෘති | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | වෙන් කළ මුදල රු.මි. | 2018.12.31 භෞතික ප්‍රගතිය (%) | 2018.12.31 මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | සත්ත්ව පාලනය ප්‍රචලිත කිරිම | ගොවි පුහුණුව | නවින තාක්ෂණික දැනුම ලබා දිම | 3230 | 29 | 1.30 | 100 | 84 |
| 2 | සත්ත්ව පාලනය ප්‍රචලිත කිරිම | නිලධාරි ධාරිතා සංවර්ධනය | නවින තාක්ෂණික දැනුම ලබා දිම | සියළු ම නිල ධාරි න් | 29 | 0.50 | 100 | 98 |
| 3 | සත්ත්ව පාලනය ප්‍රචලිත කිරිම | නිදැලි කුකුළු පාලනය ප්‍රවර්ධනය කිරිම | මාසයක් වයසැති කිකිළි පැටවුන් ලබා දිම, පුහුණු කිරිම | 1000 | 29 | 4.00 | 100 | 100 |
| 4 | i.ගොවිපල සතුන්ගේ සෞඛ්‍ය සතුටුදායක මට්ටමින් පවත්වාගැ නිම ii.සතුන් ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවිම | කාර්යක්ෂම පශු වෛද්‍ය සේවාවක් ලබා දිමට ජංගම සායන පැවැත්වීම කාර්යක්ෂම පශු වෛද්‍ය සේවාවක් ලබා දිමට ජංගම සායන පැවැත්වීම | රෝග පරික්ෂාව, අභිජනන ගැටළු විසදිම, ගොවිපල් කලමණාකරණය පිළිබඳ දැනුවත් කිරිම, ගොවිපල් ලියාපදිංචිය, කණ් සළකුණු කිරිම, ණය යෝජනා වැඩසටහන් හඳුන්වා දිම, ව්‍යාපෘති පසුවිපරම | සාය න 553 | 29 | 1.50 | 92 | 78 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 5 | සතුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවීම | ස්වභාවික අභිජනනය ප්‍රවර්ධනය | අභිජනන ගැටළු විසදීම, ගොවිපල් කලමණාකරණය පිළිබද දැනුවත් කිරිම, පට්ටි වස්සන් මිලදිගැනිම | 140 | 20 | 5.00 | 93 | 77 |
| 6 | සතුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවීම | එළු ගොවිපල සංවරධනය | එළුවන් සැපයිම,එළුගාල් ඉදිකිරිම | 91 | 29 | 3.00 | 91 | 91 |
| 7 | ජලභිතිකා රෝග මර්දනය | අයාලයේ යන සුනඛ ගහනය පාලනය සහ ජලභිතිකා එන්නත් ලබාදිම | එන්නත් ලබාදිම,සුනඛ වන්දිකරණය | පොදු | 29 | 19.2 | 100 | 81 |
| 8 | සතුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවීම | බුරුළු ප්‍රදාහයට අවශ්‍ය තාක් ෂණික සහයෝගය ලබාදිම | නවින තාක්ෂණික දැනුම ලබා දිම උපකරණ ලබාදිම | පොදු | 29 | 1.5 | 100 | 90 |

| අනු අංකය | අරමුණ | ව්‍යාපෘතිය/ ව්‍යාපෘති | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | වෙන් කළ මුදල රු.මි. | 2018.12.31 භෞතික ප්‍රගතිය (%) | 2018.12.31 මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|---|
| 9 | වැඩ කිරිම සඳහා යහපත් පරිසරයක් ඇතිකිරිම | කාර්යාල උපකරණ හා ගෘහභාණ්ඩ ලබාදිමහා ගෘහභාණ්ඩ ලබාදිම | උපකරණ හා ගෘහභාණ්ඩ ලබාදිම | පොදු | 14 | 1.00 | 100 | 94 |
| 10 | සතුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවිම | කෘතිම සිංචනය මඟින් දෙමහුන් සතුන් බිහි කිරිම | ගැබ් පරික්ෂාව, කෘතිම සිංචනය දියර නයිට්‍රජන් කෑන් මිලදිගැනිම | සියළුම සත්ත්ව පාලි ගොවීන් | 29 | 1.00 | 100 | 95 |
| 11 | සතුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවිම | සත්ත්ව පෝෂණ සම්පත් ඉහල නැංවීම | තෘණ වගාව, සයිලේජ් නිෂ්පාදනයට ගොවීන් යොමු කිරිම, උපකරණ ලබාදිම | 281 | 29 | 2.70 | 97 | 86 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 12 | කිරි ආශ්‍රිත නිෂ්පාදන වල ප්‍රමිතිය ඉහල නැංවිමඅ | කිරි ආශ්‍රිත නිෂ්පාදන වල ගුණාත්මක භාවය ඉහල නැංවිම | සෞඛ්‍ය ආරක්ෂිත කිරි නිෂ්පාදනය පිළිබඳ දැනුවත් කිරිම, කිරි සාම්පල් ප්‍රමිතිය පරික්ෂාව, කිරි නිෂ්පාදනාගාර වැඩිදියුනු කිරිම, උපකරණ ලබාදිම | 42 | 20 | 4.00 | 70 | 64 |
| 13 | i.ගොවිපල සතුන්ගේ සෞඛ්‍ය සතුටුදායක මට්ටමින් පවත්වා ගැනිම ii.සතුන්ගේ නිෂ්පාදන ධාරිතාව ඉහල නැංවිම | කිරි ගොවිපල වල යටිතල පහසුකම් සංවර්ධනය | ගවගාල් ඉදිකිරිම තෘණ කැබිළිකිරිමේ යන්ත්‍ර,කිරි දෙවිමේ යන්ත්‍ර, කිරි ගවයින් මිළදි ගැනිම සයිලේජ් නිෂ්පාදනය ,සයිලේජ් බැරල්මිලදි ගැනිම | 505 | 29 | 25.0 | 100 | 99 |
| 14 | සත්ත්ව පාලනය ප්‍රචලිත කිරිම | පශු වෛද්‍ය කාර්යාල අළුත්වැඩියාවකහට ගස් දිහිළිය | පශු වෛද්‍ය කාර්යාල අළුත්වැඩියාව න් | සියළුම සත්ත්ව පාලන ගොවීන් | 01 | 1.25 | 100 | 100 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 15 | i.ගොවිපල සතුන්ගේ සෞඛ්‍ය සතුටුදායක මට්ටමින් පවත්වා ගැනිම ii.සතුන්ගේ නිෂ්පාදන ධාරිතාව ඉහල නැංවිම | තෝරාගත් ගොවිපල වල යහපත් කළමණාකරණ ක්‍රම වේද ප්‍රවර්ධනය | ගවගාල්ඉදිකිරි ම තෘණ කැබිළිකිරිමේ යන්ත්‍ර,කිරි දෙවිමේ යන්ත්‍ර, කිරි ගවයින් මිළදි ගැනිම සයිලේජ් නිෂ්පාදනය ,තෘණ වගා ස්ථාපනය,සයි ලේජ් බැරල්මිලදි ගැනිම | 100 | 29 | 5.5 | 88 | 88 |
| 16 | තාක්ෂණික දැනුම ලබාදිම,ප්‍රති ලාභ ලබා දිමේ විනිවද භාවය ඇතිවිම | ගොවින් බල ගැන්විම | සත්ත්ව නිෂ්පාදන සමිති පිහිටවිම | එම | 1 | 0.70 | 100 | 90 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 17 | පුහුණු ඒකකයක් ලෙස සංවර්ධනය කිරිම | තිරප්පනේ සත්ව ගොවිපලේ යටිතල පහසුකම් සංවර්ධනය | යටිතල පහසුකම් සංවර්ධනය | එම | පොදු | 4.00 | 51 | 50 |
| 18. | සතුන්ගේ නිෂ්පාදන ධාරිතාව ඉහල නැංවිම | කෘෂි කාර්මික ප්‍රජාව දේශගුණික විපර්යාස වලට අනුහුරු කරවිමේ ව්‍යාපෘතිය | ගවගාල් ඉදිකිරිම තෘණ කැබිළිකිරිමේ යන්ත්‍ර,කිරි දෙවිමේ යන්ත්‍ර, කිරි ගවයින් මිළදි ගැනිම | | ලංකාපුරා | 4.10 | 100 | 100 |
| එකතුව | | | | | | **85.2** | | |

**කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ**

**සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති - 2018**

| අනු අංකය | අරමුණ | ව්‍යාපෘතිය/ ව්‍යාපෘති | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | වෙන් කළ මුදල රු.මි. | 2018.12.31 [%] භෞතික ප්‍රගතිය | 2018.12.31 [%] මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | ස්වයං රැකියා ප්‍රවර්ධන,නිෂ් පාදන වල ප්‍රමිතිය ඉහල නැංවිම | කෘෂි නිෂ්පාදන ආශ්‍රිත ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩ සටහන | උපකරණ මිලදි ගැනිම,කිරි අලෙවි සැල් ඉදිකිරිම, නිෂ්පාදනාගාර වැඩිදියුණුකිරිම | 10 | 05 | 1.5 | 79 | 62 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 2 | ස්වයං රැකියා ප්‍රවර්ධන, වෙළඳ පොළ තරඟකාරිත්වයට මුහුන දීමේ හැකියාව | ව්‍යවසායකත්ව සංවර්ධන වැඩ සටහන | උපකරණ මිලදී ගැනිම,කිරි අලෙවි සැල් ඉදිකිරිම, නිෂ්පාදනාගාර වැඩිදියුණුකිරිම | 11 | 07 | 1.50 | 86 | 100 |
| එකතුව | | | | **21** | | **3.0** | | |

## සංවර්ධන කාර්ය පිළිබද කාර්ය සාධනය - 2018

## 1. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන අවිච්ඡේද ව්‍යාපෘති

### 1.1.අවිච්ඡේද ව්‍යාපෘති - අනුරාධපුර දිස්ත්‍රික්කය

ව්‍යාපෘති අංක 18/622/2104/24/C/A/01 මිහින්තලේ පශු වෛද්‍ය කාර්යාලය ඉදිකිරිම අවසන්කර ඇත.

### 1.2.අවිච්ඡේද ව්‍යාපෘති - පොළොන්නරුව දිස්ත්‍රික්කය

ව්‍යාපෘති අංක 18/622/2001/24(iii )/C/P/01 යටතේ මින්නේරිය පශු වෛද්‍ය කාර්යාල අළුත්වැඩියාව නිමකර ඇත.

## 2. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන නව වැඩ

### 2.1. කිරි ගොවිපලවල යටිතල පහසුකම් සංවර්ධනය - අනුරාධපුර දිස්ත්‍රික්කය

මෙම ව්‍යාපෘතිය යටතේ උතුරු මැද පළාතෙහි කිරි ගොවිපල 500 ක් සවර්ධනය කිරිම සඳහා මුල්‍ය ප්‍රතිපාදන වෙන්වු අතර එමඟින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිපල් 354 ක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවිපල් 150 ක් සඳහා පහසුකම් සපයා ඇත.

කිරි ගොවිපලවල් සංවර්ධනය යටතේ ඒ සඳහා ලබාදුන් පහසුකම් වල විස්තරය වගුවෙහි දැක්වේ.

| ඉටු කල කාර්යය | ගොවිපල ප්‍රමාණය |
|---|---|
| ගවගාල් ඉදිකිරිම | 121 |
| කිරිගවයින් ලබාදිම | 150 |
| තෘණ කැබිළි යන්ත්‍ර ලබාදිම | 40 |
| කිරි දොවන යන්ත්‍ර ලබාදිම | 43 |
| එකතුව | **354** |

## කිරි ගොවිපලවල යටිතල පහසුකම් සංවර්ධනය - පොළොන්නරුව දිස්ත්‍රික්කය

| ක්‍රියාකාරකම | ප්‍රතිලාභින් සංඛ්‍යාව |
|---|---|
| ගවගාල් ඉදිකිරිම | 52 |
| කිරිගවයින් මිළදි ගැනිම සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබාදිම | 52 |
| තෘණ කැබිළි යන්ත්‍ර ලබාදිම | 31 |
| කිරි දොවන යන්ත්‍ර ලබාදිම | 07 |
| සයිලේජ් බැරල් මිළදි ගැනිම | 07 |
| තෘණවගාව හා ජල සම්පාදන පද්ධති වැඩි දියුණු කිරිම | 01 |
| **එකතුව** | **150** |

### 2.2. සේවා සැපයිම ඉහල නැංවිමට ජංගම සායන පැවැත්විම

මෙ යටතේ සියළුම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි ජංගම සායන 600ක් ඉලක්ක කර තිබු අතර, ජංගම සායන 433ක් පවත්වා තිබේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජංගම සායන 406 ක්ද, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජංගම සායන 147 ක්ද පවත්වා ඇත. මෙ යටතේ සත්ත්ව ප්‍රතිකාර හා රෝග මර්ධන කටයුතු මෙන්ම සතුන් හඳුනා ගැනිමේ කණ් සළකුණු කිරිමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම, ව්‍යාපෘති පසු විපරම් කටයුතු සිදුකිරිම, හඳුනාගත් ගොවිපළ ගැටළුවලට විසඳුම් ලබාදිම, ගොවින්ට තාක්ෂණික සේවා ලබා ගැනිමේ දුෂ්කරතාවයන්ට යම් විසඳුමක් ලබාදිම සිදුකරන ලද සේවාවන් වේ.

### 2.3.කිරි ගව පෝෂණය ඉහළ නැංවිම

කිරි ගව පාලනයේදි සත්ත්ව පෝෂණය ප්‍රධාන අවශ්‍යතාවයක් වේ. වසර පුරා කිරිදෙනුන්හට නිසි ආකාරයට අහාර ලබා නොදිම උතුරු මැද පළාතේ කිරි නිෂ්පාදනය ඉහළ නැංවිමට ප්‍රධාන බාධාවක් වි ඇත. එබැවින් පළාතේ කිරි ගව පෝෂණය ඉහළ නැංවිමට ගොවිපල 220ක් ඉලක්කකර ගත් අතර, ගොවිපල 281 ක් සංවර්ධනය කරන ලදි. ඒ යටතේ ඉටුකළ කාර්යයන් වගුවේ දැක්වේ.

| ඉටු කල කාර්යය | ගොවිපල ප්‍රමාණය | |
|---|---|---|
| | අනුරාධපුර දිස්ත්‍රික්කය | පොළොන්නරුව දිස්ත්‍රික්කය |
| තෘණ කැපිමේ යන්ත්‍ර ලබාදිම | 136 | 15 |
| ජල සම්පාදන පද්ධති සහ වැට සකස්කිරිම | | 02 |
| සයිලේජ් සැකසිමේ බැරල් ලබාදිම | 17 | 06 |
| තෘණ වගාව ස්ථාපනය කිරිම (අවම පර්.20) | 75 | 41 |
| **එකතුව** | **220** | **64** |

## 2.4.බුරුළු ප්‍රදාහය වැලැක්වීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබාදීම

පිරිසිදු කිරි නිෂ්පාදනය ඉහල නැංවීම අරමුණින් සියළුම පශු වෛද්‍ය කොට්ඨාශ තුල මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද අතර,පශු වෛද්‍ය කොට්ඨාශ මට්ටමින් පුහුණු වැඩ සටහන් පැවැත්වීම, පරික්ෂණ උපකරණ කට්ටල හා ප්‍රතිජීවක කිරි ගොවින් වෙත ලබාදීම හා කිරි සාම්පල පරික්ෂාව මේ යටතේ සිදුකරන ලදි.

## 2.5.ස්වභාවික අභිජනන ප්‍රවර්ධනය

මෙම ව්‍යාපෘතිය යටතේ උතුරු මැද පළාතෙහි කිරි ගොවිපල 150ක් සවර්ධනය කිරීම සඳහා මුල්‍ය ප්‍රතිපාදන වෙන්වූ අතර එමඟින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ පශු වෛද්‍ය කොට්ඨාශ 20 ක ගොවිපල් 84 ක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පශු වෛද්‍ය කොට්ඨාශ 05 ක ගොවිපල් 56 ක් සඳහා පට්ටි වස්සන්140 ක් සපයා ඇත.

## 2.6.තෝරාගත් ගොවිපලවල යහපත් කළමණාකරණ ක්‍රමවේද ප්‍රවර්ධනය

මේ යටතේ උතුරු මැද පළාතෙහි කිරි ගොවිපළ 110 ක් සවර්ධනය කිරීම සඳහා මුල්‍ය ප්‍රතිපාදන වෙන්වූ අතර එමඟින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිපල් 76 ක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවිපල් 24 ක් සංවර්ධනය කර ඇත. ඒ යටතේ කිරිගවයින් මිළදී ගැනීම, ගවගාල් ඉදිකිරීම, තෘණ කැබිළි යන්ත්‍ර ලබාදීම, කිරි දොවන යන්ත්‍ර ලබාදීම, තෘණ වගාව ස්ථාපණය කිරීම, සයිලේජ් සැකසීමේ බැරල් ලබාදීම යන පහසුකම් ගොවිපල 100 ක් සඳහා සපයා ඇත.

## 2.7. කෘතිම සිංචනය මඟින් දෙමුහුන් සතුන් බිහි කිරීම

කෘතිම සිංචනය කිරි ගවයින්ගේ ආරය උසස් කිරීමට යොදා ගැනෙන ප්‍රමුඛ තාක්ෂණය වන බැවින්, සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් සඳහා ක්ෂේත්‍ර කටයුතුවල යොදා ගන්නා දියර නයිට්‍රජන් බඳුන් මිලදී ගෙන ඇත.

## 2.8. අයාලයේ යන සුනඛ ගහනය පාලනය සහ ජලභීතිකා එන්නත් ලබාදීම

ජලභීතිකා රෝග මර්ධන ව්‍යාපෘතිය අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක ආවරණය පරිදි ක්‍රියාත්මක කරන ලද අතර, ජලභීතිකා රෝග මර්ධනය සඳහා එන්නත් කිරීම,ප්‍රජාව දැනුවත් කිරීම සහ සුනඛ ගහනය පාලනය සඳහා වන්ද්‍යාකරණ සැත්කම් සිදුකිරීම කරන ලද අතර, එන්නත් කරන ලද සතුන් සංඛ්‍යාව වගුවේ සඳහන් කර ඇත.

| කාරණය | අනුරාධපුර | පොං/නරුව |
|---|---|---|
| එන්නත් කිරීම | 95,229 | 58.540 |
| වන්ද්‍යාකරණ සැත්කම් සිදුකිරීම | 5,618 | 4,883 |

## 2.9. එළු ගොවිපල සංවර්ධනය

උතුරු මැද පළාතේ එළු ගොවිපල සංවර්ධනය 100ක් සංවර්ධනය සඳහා මුලාා ප්‍රතිපාදන වෙන්වූ අතර, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිපල් 63ක් සංවර්ධනය කර ඇත. ඒ සඳහා එළුවන් සහ එළිච්චියන් 31ක් සපයා ඇති අතර, එළු ගාල් 32ක් ඉදිකර ඇත. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවිපල් 28ක් සංවර්ධනය කර ඇත. ඒ සඳහා එළුවන් සහ එළිච්චියන් 13ක් සපයා ඇති අතර,එළු ගාල් 09ක් ඉදිකර ඇත.

## 2.10 කිරිවලට අගය එකතු කිරිම ප්‍රවර්ධනය

කිරිවලට අගය එකතු කිරිම ප්‍රවර්ධනය කිරිම තුළින් නිෂ්පාදනවලට වැඩි මිළක් ලබා ගැනිමට ගොවින් යොමු කිරිම හා නිෂ්පාදනවල ගුණත්වය වැඩි දියුණුකිරිමට අවශා තාක්ෂණ දැනුම ලබා දිම හා අවශා යෙදවුම් ලබා දිම සිදුවිය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පශු වෛද්‍ය නිලධාරි කොට්ඨාශ 15ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය.ප්‍රතිලාභින් 20 දෙනෙකු ව්‍යාපෘතිය සඳහා සම්බන්ධ කර ගත් අතර ඉන් ප්‍රතිලාභින් 09ක් සඳහා බෝතල් ශිතකරණ, ඉන්කියුබේටර්, සහ ක්‍රිම් සෙපරේටර් වැනි උපකරණ ලබා දිම මඟින් නිෂ්පාදනාගාරවල තත්ත්වය ඉහළ නැංවිම සිදුකරන ලදි. ප්‍රතිලාභින් 12 සඳහා කිරි නිෂ්පාදන සැකසුම් ඒකකය නවිකරණය සඳහා පහසුකම් සලසා ඇත. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මින්නේරිය, පොළොන්නරුව, බකමුණ, ලංකාපුර, අරලගංවිල, වැලිකන්ද පශු වෛද්‍ය කොට්ඨාශ තුළ කිරි සැකසුම්කරුවන් 20ක් සඳහා අවශා තාක්ෂණික දැනුම හා උපකරණ ලබා දිම කිරි නිෂ්පාදන සැකසුම් ඒකකය නවිකරණය,කටයුතු සිදු කරන ලදි. ඒ යටතේ ශිතකරණ, ක්‍රිම් සෙපරේටර්, අධිශිකරණ වැනි උපකරණ ලබාදුන් අතර අවශා ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණුව ලබාදිම සිදුකරන ලදි.

## 2.11.නිදැළි කුකුල් පාලනය ප්‍රවර්ධනය

උතුරු මැද පළාත තුල නිදැළි කුකුළු පාලන ප්‍රවර්ධන වැඩ සටහන යටතේ මාසයක් වයසැති කිකිළි පැටවුන් 10,000 ප්‍රතිලාභින් 1,000ක් සඳහා සපයා ඇත. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පශු වෛද්‍ය කොට්ඨාශ 22 ක ප්‍රතිලාභින් 752 ක් සඳහා මසක් වයසැති කිකිළි පැටවුන් 7,520 ක් සපයා ඇත. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභින් 248 ක් සඳහා මසක් වයසැති කිකිළි පැටවුන් 2,480 ක් සපයා ඇත.

## 2.12.තිරප්පනේ සත්ව ගොවිපලේ යටිතල පහසුකම් සංවර්ධනය

මේ යටතේ ජලසම්පාදන මණ්ඩලය මඟින් නල ජලය ලබා ගැනිමට කටයුතු කිරිම,සහ කුකුල් පැටව් ප්‍රවාහනය සඳහා පෙට්ටි 50ක් මිළදි ගැනිමට කටයුතු කර ඇති අතර,කුකුල් නිවාසය ඉදිකිරිම 60% ක් පමණ නිමකර ඇත.

## 2.13. පශු වෛද්‍ය කාර්යාලවල යටිතල පහසුකම් සංවර්ධනය.

කහටගස්දිගිළිය පශු වෛද්‍ය කාර්යාල අළුත්වැඩියා කටයුතු නිමකරන ලදි.

## 2.14. ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ ලබා දීම.

යහපත් වැඩකිරීමේ වටපිටාවක් සැළසීමේ අරමුණින් පශු වෛද්‍ය කාර්යාල සඳහා ගෘහ භාණ්ඩ ලබා දීම ව්‍යාපෘතිය යටතේ සිදු කර තිබේ.

## 2.15. පුහුණු වැඩසටහන්

### ගොවි පුහුණුව

සෑම පශු වෛද්‍ය කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි ගොවින් 3,250 ක් පුහුණු කිරීම ඉලක්ක කර තිබූ අතර, අනුරාධපුර දිස්ත්‍රික්කයේ සත්ත්ව පාලන ගොවින් සඳහා පුහුණු සැසිවාර 64 ක් ගොවින් 2,230 ක සහභාගිත්වයෙන් පවත්වා තිබේ. පොළොන්නරුව දිස්ත්‍රික්කය ආවරනය වන පරිදි පුහුණු වැඩ සටහන් 35 ක් පවත්වා ඇත. මෙම පුහුණු වැඩ සටහන් සඳහා ගොවින් 1,077 ක් සහභාගි වී තිබේ. මේ යටතේ සත්ත්ව පාලනයේ නියැලෙන ගොවින්ට අවශ්‍ය වන දැනුම ලබා දීම සඳහා පුහුණු වැඩ සටහන් හා ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කරන ලදි.

### නිලධාරි පුහුණුව

අප දෙපාර්තමේන්තුවේ සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් සඳහා පුහුණු සැසි 02 ක් පවත්වා ඇති අතර, කනිෂ්ඨ සේවකයින් සඳහා පුහුණු සැසි 02 ක් පවත්වා ඇත. ක්ෂේත්‍ර චාරිකා 02 සඳහා පශු වෛද්‍ය නිලධාරින් ඇතුළු සියළුම නිලධාරින් සහභාගි වී ඇත. මේ යටතේ පැලවත්ත කිරි නිෂ්පාදනාගාරය නැරඹීම සිදුකර ඇත.

### ගොවින් බලගැන්විම

සියළුම පශු වෛද්‍ය කොට්ඨාශ ආවරණය වන පරිදි සත්ත්ව නිෂ්පාදන ශාඛා සමිති පිහිටුවිම සහ ශාඛා සමිති එකතුකර ප්‍රාදේශීය සමිති පිහිටුවීම සිදුකර ඇත. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ශාඛා සමිති 66 ක් සහ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ශාඛා සමිති 198 ක් පිහිටුවා ඇත.

**2018**

**අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවින් 3,250 පුහුණු සැසිවාර 64 ක්**

**පොළොන්නරුව දිස්ත්‍රික්කය පුහුණු වැඩ සටහන් 35 ගොවින් 1,077**

**සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් සඳහා පුහුණු සැසි 02 ක්**

**කනිෂ්ඨ සේවකයින් සඳහා පුහුණු සැසි 02 ක්**

**ක්ෂේත්‍ර චාරිකා 02ක්**

**ශාඛා සමිති 264ක්**

## 2.16.කෘෂි කාර්මික ප්‍රජාව දේශගුණික විපර්යාසවලට අනුහුරු කරවීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය පොළොන්නරුව පශු වෛද්‍ය කොට්ඨාශයේ ලංකාපුර පශු වෛද්‍ය කොට්ඨාශයේ ක්‍රියාත්මක විය. ඒ යටතේ ප්‍රතිලාභින් සඳහා සත්ව පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන් 03ක් පවත්වා ඇත. ක්ෂේත්‍ර චාරිකාවක් සහ කිරිවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ පුහුණු වැඩසටහන් පවත්වා ඇත.එයට අමතරව ලබාදුන් ප්‍රතිලාභ පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

| ක්‍රියාකාරකම | ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| කිරි දොවන යන්ත්‍ර මිලදී ගැනීම | 04 |
| තෘණ කැබිලි කපන යන්ත්‍ර මිලදී ගැනීම | 04 |
| එළු ගාල් ඉදිකිරිම | 05 |
| කුකුළු කූඩු ඉදිකිරිම | 11 |
| තෘණ කැපීමේ යන්ත්‍ර මිලදී ගැනීම | 51 |
| ගව ගාල් ඉදිකිරිම | 19 |
| කිරි ගවයන් මිලදී ගැනීම | 07 |
| කුකුළු පැටව් 550 ක් බෙදාදීම | 22 |
| **එකතුව** | **123** |





## 2.17.කෘෂි නිෂ්පාදන ආශ්‍රිත ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන

අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභින් 10 දෙනෙකු සඳහා උපකරණ ලබාදිම, කිරි අලෙවිසැල් ඉදිකිරිම, ජංගම කිරි අලෙවිසැල් සඳහා ත්‍රී රෝද රථ, යතුරුපැදි ලබාදිම,කිරි නිෂ්පාදනාගාර ඉදිකිරිම යන පහසුකම් ප්‍රතිලාභින් වෙත ලබා දෙන ලදි.

## 2.18. ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභින් 11දෙනෙකු සඳහා උපකරණ ලබාදිම, කිරි අලෙවිසැල් ඉදිකිරිම, යන පහසුකම් ලබා දෙන ලදි.

## 3. උපමාන පාදක ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති

උතුරු මැද පළාතේ සියළුම පශු වෛද්‍ය කාර්යාලවලට ප්‍රවාහන පහසුකම් ලබා දීමේ අරමුණින් වාහන අළුත්වැඩියා කරගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබුණි. තඹුත්තේගම, මිහින්තලේ, රඹෑව හා මධ්‍යම නුවරගම් පළාත් හා අරලගංවිල පශු වෛද්‍ය කාර්යාලවලට අයත් වාහන අළුත්වැඩියා කිරීම මෙන්ම ගොවින්ට අවශ්‍ය උපදෙස් හා සේවාවන් ලබාදීමට ක්ෂේත්‍රයට යෑම සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීමට යතුරු පැදි මිලදී ගැනීම සිදු විය. ඒ යටතේ සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් සඳහා කාන්තා යතුරුපැදි 04ක් සහ පිරිමි යතුරුපැදි 06ක් මිලදී ගෙන ඇත.

## 4. පශු සම්පත් සංවර්ධන අමාත්‍යංශයේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති

### 4.1. ගව අභිජනන ගොවිපල් ස්ථාපිත කිරිමේ ව්‍යාපෘතිය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගව අභිජනන ගොවිපල් 10 ක් සංවර්ධනය කිරිම සඳහා රු.මි. 1.00 ක් වැය කර ගව ගාල් 08 ක් ඉදිකිරිම, කිරිගවයින් 02ක් මිළදී ගැනිම මේ යටතේ සිදුකර ඇත. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවිපල් 02 ක් සංවර්ධනය කර ඇත. ගව ගාල් 02ක් ඉදිකිරිම, මේ යටතේ සිදුකරන ලදි. ඒ සඳහා රු.මි.0.09 ක් වැය කර ඇත.

### 4.2. පරිසර හිතකාමි සුකර ගොවිපල සංවර්ධන ව්‍යාපෘතිය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පශු වෛද්‍ය කොට්ඨාශ 03ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වු අතර, ගොවිපල 03ක් සංවර්ධනය කරන ලදි. මෙහිදි අපවහන පද්ධතිය කළමණාකරණය කිරිම සහ සුකර නිවාස 01ක් ස්ථාපණය කිරිම, ජීව වායු ජනකයක් ඉදිකිරිම සිදුකරන ලද ක්‍රියාකාරකම්ය. මේ සඳහා රු.මි. 0.10 ක් වැයවිය. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පොළොන්නරුව පශු වෛද්‍ය කොට්ඨාශයේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වු අතර, ජීව වායු ජනකයක් ඉදිකර ඇත. රු.මි.0.05ක් වැය විය.

### 4.3. කුඩා හා මධ්‍යම පරිමාණ කුකුළු ගොවිපල සංවර්ධනය

රු.මි.1.4 ක් වැයකර මාසයක් වයසැති කිකිළි පැටවි 4,200ක් ප්‍රතිලාභින් 420ක් සඳහා ලබාදි ඇත. මෙම වැඩ සටහන අනුරාධපුර දිස්ත්‍රික්කයේ පශු වෛද්‍ය කොට්ඨාශ 06ක ක්‍රියාත්මක විය.

| පශු වෛද්‍ය කොට්ඨාශය | ප්‍රතිලාභින් සංඛ්‍යාව | කිකිළි පැටවි සංඛ්‍යාව |
|---|---|---|
| තිරප්පනේ | 74 | 740 |
| තඹුත්තේගම | 70 | 700 |
| ගල්නෑව | 66 | 660 |
| ඉපලෝගම | 70 | 700 |
| රඹෑව | 70 | 700 |
| තලාව | 70 | 700 |
| එකතුව | **420** | **4,200** |

### 4.4. කුකුළු මස් සැකසුම් මධ්‍යස්ථානය හා ශිතාගාර පහසුකම් සපයාදිම

ගල්නෑව, කහටගස්දිගිලිය සහ තිරප්පනය පශු වෛද්‍ය කොට්ඨාශවල මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. ප්‍රතිලාභින් විසින් කුකුළු මස් අලෙවිසැළ ඉදිකරණ ලද අතර අධිශිතකරණ 05ක් රජයේ දායකත්වය මත සපයා ඇත. මේ සඳහා රු.මි.0.52ක් වැයවිය.

## 4.5.දිළිදුබව තුරන් කිරිම උදෙසා කාන්තා මූලික පවුල් සඳහා එළ ගවයින් බෙදා දීම.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මෙම ව්‍යාපෘතිය සඳහා කාන්තා ප්‍රතිලාභින් 17 දෙනෙක් සඳහා කිරිගවයින් 17 ක් සපයා ඇත. වැයවූ මුදල රු.මි.0.20කි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 06 සඳහා කිරි ගවයන් 06ක් සපයා ඇත. වැය වූ මුදල රු:මි.0.36 කි.

## 4.6. දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරිම

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාසල් සිසුන් හා තරුණ ප්‍රජාව අතර දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය පශු වෛද්‍ය කොට්ඨාශ 20ක ක්‍රියාත්මක වූ අතර මේ සඳහා වැය වූ මුදල රු. 1.28කි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මෙම ව්‍යාපෘතිය පශු වෛද්‍ය කොට්ඨාශ 07ක ක්‍රියාත්මක වූ අතර මේ සඳහා වැය වූ මුදල රු. 0.22කි.

## 4.7. තෘණ වගා සංවර්ධනය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ තෘණ සංවර්ධන ව්‍යාපෘතියට අදාලව පශු වෛද්‍ය කොට්ඨාශ 09ක ගොවිපල් 10ක් සංවර්ධනය කිරිම සඳහා රු.මි.0.45ක් වැය කර, ඇත. ඒ යටතේ

- තෘණ කැබලි කිරිමේ යන්ත්‍ර - 08
- තෘණ වගාවට අවශ්‍ය උපකරණ - 02 සපයා ඇත.



පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මින්නේරිය පශු වෛද්‍ය කොට්ඨාශයේ ගොවිපලවල් 02ක සයිලේජ් සෑදීමේ ඒකක සැකසීම සඳහා රු.මි.1.08 වැයකර ඇත.

## 4.8.සෞඛ්‍යාරක්ෂිත කිරි නිෂ්පාදනය - ගව නිවාස වැඩි දියුණු කිරිම

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පශු වෛද්‍ය කොට්ඨාශ 17ක සෞඛ්‍යාරක්ෂිත ගවගාල් 38ක් ඉදි කිරිම සිදු කරන ලදි. ඒ සඳහා වියදම රු.මි.1.08කි.පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පශු වෛද්‍ය කොට්ඨාශ 07ක සෞඛ්‍යාරක්ෂිත ගවගාල් 14ක් ඉදි කිරීම හා වැඩිදියුණු කිරිම සිදු කරන ලදි. වියදම රු.මි.0.42කි.



## 4.9.කුඩා පරිමාණ සත්ත්ව ආහාර නිෂ්පාදනාගාර ස්ථාපනය

ගල්නෑව පශු වෛද්‍ය කොට්ඨාශයේ කුකුළු සාන්ද්‍ර ආහාර නිෂ්පාදනය කිරිමේ නිෂ්පාදනාගාරයක් රු.මි.0.2ක් වැය කර ස්ථාපනය කර ඇත.

## 5. ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන - 2018

### 5.1. කුඩා පරිමාණ එළු ගොවිපල දිරි ගැන්වීමේ ව්‍යාපෘතිය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පශු වෛද්‍ය කොට්ඨාශ 07ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වු අතර ගොවිපල් 12 ක් සංවර්ධනය කරන ලදි. ඒ යටතේ එළිච්චියන් 48ක් හා පට්ටි එළුවන් 12ක් සපයා ඇත. වැයවු මුදල රු. මි. 0.72 කි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පශු වෛද්‍ය කොට්ඨාශ 05 ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වු අතර ගොවිපල් 08ක් සංවර්ධනය කර ඇත. ඒ යටතේ එළිච්චියන් 20ක් හා පට්ටි එළුවන් 05ක් සපයා ඇත. රු.මි.0.48ක් වැයකර ඇත.

### 5.2. කුඩා පරිමාණ කිරි ගොවිපළවල සංවර්ධනය කිරිමේ ව්‍යාපෘතිය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මෙම ව්‍යාපෘතිය යටතේ ගොවිපල් 55ක් සංවර්ධනය කරන ලද අතර, පශු වෛද්‍ය කොට්ඨාශ 22 ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. වැයවු මුදල රු. මි. 3.30කි.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මෙම ව්‍යාපෘතිය යටතේ ගොවිපල් 20ක් සංවර්ධනය කරන ලද අතර, පශු වෛද්‍ය කොට්ඨාශ 07ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. ඒ යටතේ තෘණ කැබළි යන්ත්‍ර ලබාදිම, කිරි දොවන යන්ත්‍රය ලබාදිම සිදු කර ඇත. වැයවු මුදල රු. මි.1.20කි. . ඒ යටතේ පහත සඳහන් පහසුකම් සහ ක්‍රියකාරකම් සිදු කර ඇත.

| ක්‍රියාකාරකම | ප්‍රතිලාභින් සංඛ්‍යාව | |
|---|---|---|
| | අනුරාධපුර | පො/නරුව |
| ගවගාල් ඉදිකිරිම | 25 | 05 |
| කිරිගවයින් මිළදි ගැනිම | 22 | 02 |
| තෘණ කැබිළි යන්ත්‍ර ලබාදිම | 02 | 02 |
| කිරි දොවන යන්ත්‍ර ලබාදිම | 06 | 07 |
| ජීව වායු ජනකයක් ඉදිකිරිම ගැනිම සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබාදිම | - | 04 |
| **එකතුව** | **55** | **20** |

### 5.3. සුළු හා මධ්‍යම පරිමාණ කුකුල් සංවර්ධන ව්‍යාපෘතිය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පශු වෛද්‍ය කොට්ඨාශ 12 ක මෙම සුළු හා මධ්‍යම පරිමාණ කුකුල් සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වු අතර, මාසයක් වයසැති කිකිළි පැටව් 7,520 ක් ප්‍රතිලාභින් 750 ක් සඳහා සපයා ඇත.සියළුම ප්‍රතිලාභින් කුකුළු පාලනය සම්බන්ධව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දී ඇත.

| පශු වෛද්‍ය කොට්ඨාශය | ප්‍රතිලාභින් සංඛ්‍යාව | කිකිළි පැටව් සංඛ්‍යාව |
|---|---|---|
| කැබිතිගොල්ලැව | 63 | 630 |
| රාජාංගනය | 58 | 580 |
| නැ.නු.ප | 60 | 597 |
| ගලෙන්බිඳුණුවැව | 64 | 640 |
| හොරොව්පොතාන | 63 | 630 |
| මැදවච්චිය | 63 | 630 |
| මිහින්තලය | 63 | 630 |
| තලාව | 64 | 640 |
| පදවිය | 63 | 653 |
| තඹුත්තේගම | 63 | 630 |
| පලාගල | 63 | 630 |
| පළුගස්වැව | **63** | 630 |
| **එකතුව** | **750** | **7,520** |

| පශු වෛද්‍ය කොට්ඨාශය | ප්‍රතිලාභින් සංඛ්‍යාව | කිකිළි පැටව් සංඛ්‍යාව |
|---|---|---|
| ලංකාපුර | 62 | 620 |
| මින්නේරිය | 63 | 630 |
| මැදිරිගිරිය | 62 | 620 |
| පොළොන්නරුව | 62 | 620 |
| **එකතුව** | **249** | **2,490** |

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පශු වෛද්‍ය කොට්ඨාශ 04ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ අතර, මාසයක් වයසැති කිකිළි පැටව් 2,490 ක් ප්‍රතිලාභින් සඳහා 249 ක් සඳහා සපයා ඇත.

## 6. දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වැඩසටහන්

### 6.1. සතුන් සඳහා ප්‍රතිකාර කිරිම

උතුරු මැද පළාත තුළ 2018 වර්ෂය තුළ සිදුකරන ලද සත්ත්ව ප්‍රතිකාර සේවාව වැදගත් වේ.

| දිස්ත්‍රික්කය | කාර්යාලිය ප්‍රතිකාර සිදුකරන ලද සතුන් සංඛ්‍යාව | ක්ෂේත්‍ර ප්‍රතිකාර සිදුකරන ලද සතුන් සංඛ්‍යාව |
|---|---|---|
| අනුරාධපුර | 49,921 | 30,146 |
| පොළොන්නරුව | 5,563 | 6,843 |
| **එකතුව** | **55,484** | **36,989** |

### 6.2. වසංගත රෝග මර්ධන වැඩසටහන

| දිස්ත්‍රික්කය | FMD | BQ |
|---|---|---|
| අනුරාධපුර | 79,381 | 13,511 |
| පොළොන්නරුව | 44,850, | 273 |
| **එකතුව** | **106,573** | **13,784** |

උතුරු මැද පළාත තුළ ගවයින්ගේ වසංගත රෝග මර්ධනය සඳහා එන්නත් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක තුළ එන්නත් කරන ලද සතුන් ප්‍රමාණය 120,357ක් පමණ විය.

## 6.3. වැස්සි පැටවුන් ඇතිදැඩි කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ කෘතිම සිංචනයෙන් බිහිවූ වැස්සි පැටවුන් ලියාපදිංචිකර, පැටවි, නැම්බියන්, කිරිදෙනුන් පාලනය සම්බන්ධව ගොවීන් දැනුවත් කරනු ලබයි. ඒ යටතේ ලියාපදිංචි සතුන් සංඛ්‍යාව 1654ක් විය.

| දිස්ත්‍රික්කය | ලියාපදිංචි සතුන් සංඛ්‍යාව |
|---|---|
| අනුරාධපුර | 1301 |
| පොළොන්නරුව | 353 |
| **එකතුව** | **1,654** |

## 6.4.සත්ත්ව අභිජනන වැඩ සටහන

| දිස්ත්‍රික්කය | කෘතිම සිංචන සංඛ්‍යාව | ගැබ් පරීක්ෂා සංඛ්‍යාව | පැටවු උපත් සංඛ්‍යාව |
|---|---|---|---|
| අනුරාධපුර | 12,556 | 2,576 | 3,081 |
| පොළොන්නරුව | 6,083 | 1,170 | 1,121 |
| **එකතුව** | **18,639** | **3,746** | **4,202** |

## 6.5. මානව සම්පත් කළමණාකරණය

මේ යටතේ ගොවිමහතුන් සඳහා නවීන තාක්ෂණික දැනුම ලබා දීම සඳහා ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණු වැඩසටහන් ක්ෂේත්‍රයේ සහ ආයතන තුළ පවත්වන ලදි. එහිදී ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් 366ක් සඳහා ගොවීන් 10682ක් සහභාගී වූ අතර ආයතනගත පුහුණු වැඩසටහන් 44ක් සඳහා ගොවීන් 1452ක් සහභාගී විය. ඒ අනුව 2018 වර්ෂය තුළ වැඩසටහන් 410ක් සඳහා ගොවීන් 12134 දෙනෙක් පුහුණුව ලබා ඇත.

| දිස්ත්‍රික්කය | ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ ගොවීන් සංඛ්‍යාව | ආයතන පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| අනුරාධපුර | 294 | 8510 | 37 | 1229 |
| පොළොන්නරුව | 72 | 2172 | 7 | 223 |
| **එකතුව** | **366** | **10,682** | **44** | **1,452** |

## සංවර්ධන ව්‍යාපෘති මඟින් කෙටිකාලින අපේක්ෂා කරන ප්‍රතිලාභ

| අනු අංකය | ව්‍යාපෘතිය | කෙටිකාලින බලපෑම් (outcome) |
|---|---|---|
| 01. | සුළු හා මධ්‍යම පරිමාණ වාණිජ සත්ත්ව ගොවිපල සඳහා පහසුකම් සැපයීම | පවුලේ මාසික ආදායමඉහල යෑම,නවින තාක්ෂණයට යොමුවිම |
| 02. | කිරි නිෂ්පාදන ප්‍රවර්ධනය | විවෘත වෙළපොලේ තරඟකාරීත්වයට මුහුණ දිමට හැකිවිම |
| 03. | නිදැළි කුකුල් පාලනය ප්‍රවර්ධනය | ස්වයං රැකියා ජනිත විම,පවුලේ ප්‍රෝටින අවශ්‍යතාවය සපුරාගත හැකිවිම |
| 04. | ගොවිපුහුණුව | නවින තාක්ෂණයට ගොවින් හුරු කිරිම |
| 05. | නිලධාරි පුහුණුව | දැණුම යාවත් කාලින කිරිම |
| 06. | ජංගම සායන පැවැත්විම | සත්ත්ව රෝග වසංගත අවම විම, හදුනාගත් ගොවිපල ගැටළු වලට වහා විසඳුම් ලබා දිමට හැකිවිම |
| 07. | කිරි ගව පෝෂණය ඉහල නැංවිම | අනපේක්ෂිත ස්වභාවික උවදුරුවලට ,(නියඟය) මුහුණදිමට හැකි විම |
| 08. | ගෘහ භාණ්ඩ හා කාර්යාලිය උපකරණ ලබා දිම/පශු වෛද්‍ය කාර්යාල ඉදිකිරිම | යහපත් වැඩකිරිමේ වටපිටාවක් සැළසිම |

## රේඛීය අමාත්‍යාංශවලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති - 2018

| ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | කෙටිකාලින / දිගු කාලින ප්‍රතිඵල | වෙන් කළ මුදල (රු.මි) | වැයකළ මුදල (රු.මි) | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගති ය (%) |
|---|---|---|---|---|---|---|
| ගව අභිජනන ගොවිපල ස්ථාපිත කිරිමේ ව්‍යාපෘතිය | සතුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවිම | කිරි නිෂ්පාදනය වැඩි විම | 1.20 | 0.67 | 100 | 56 |

| ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | කෙටිකාලින / දිගු කාලින ප්‍රතිඵල | වෙන් කළ මුදල (රු.මි) | වැයකළ මුදල (රු.මි) | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| පරිසර හිතකාමී සූකර ගොවිපල සංවර්ධනය | සතුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවීම | පරසර දූෂණය වැලක්වීමට කටයුතු කිරිම. බලශක්තිය ලබා ගැනිම | 0.15 | - | 100 | - |
| පරිසර හිතකාමී සූකර ගොවිපල සංවර්ධනය | සතුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවීම | පවුලේ ප්‍රෝටින අවශ්‍යතාවය සපුරාගැනිම.ස්ව යං රැකියා සඳහා යොමු විම | 1.40 | 1.40 | 100 | 100 |
| කුකුළු මස් සැකසුම් මධ්‍යස්ථාණය හා ශිතාගාර පහසුකම් සපයාදිම | සත්ත්ව පාලනය ප්‍රචලිත කිරිම | මස් නිෂ්පාදනය වැඩිවිම/ ආර්ථිකය ශක්තිමත් විම | 0.52 | 0.26 | 100 | 50 |
| දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරිම | කිරි පරිභෝජනය ප්‍රචලිත කිරිම | ස්වයං රැකියා සඳහා යොමු විම | 1.50 | 0.99 | 100 | 66 |
| කාන්තා මුලික පවුල් සඳහා එළ ගවයින් බෙදා දීමේ ව්‍යාපෘතිය | සත්ත්ව පාලනය ප්‍රචලිත කිරිම | පවුලේ ආර්ථිකය ශක්තිමත් විම.ස්වයං රැකියා සඳහා යොමු විම | 1.38 | 0.25 | 100 | 18 |
| සෞඛ්‍ය ආරක්ෂිත කිරි නිෂ්පාදනය - ගවගාලේ බිම ඉදිකිරිම | ගොවිපල සතුන්ගේ සෞඛ්‍ය සතුටුදායක මට්ටමින් පවත්වාගැනිම/ සතුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවිම | කිරි නිෂ්පාදනය වැඩිවිම | 1.50 | - | 100 | - |

| ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | කෙටිකාලීන / දිගු කාලීන ප්‍රතිඵල | වෙන් කළ මුදල (රු.මි) | වැයකළ මුදල (රු.මි) | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| කුඩා පරිමාණ සත්ත්ව ආහාර නිෂ්පාදනාගාර ස්ථාපනය | ගොවිපල සතුන්ගේ සෞඛ්‍ය සතුටුදායක මට්ටමින් පවත්වාගැනිම/සතුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවිම | කිරි නිෂ්පාදනය වැඩිවිම | 0.20 | - | 100 | - |
| තෘණ සංවර්ධන ව්‍යාපෘතිය | සතුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවිම | කිරි නිෂ්පාදනය වැඩිවිම | 0.55 | 0.28 | 100 | 51 |


## ආහාර නිෂ්පාදන ජාතික වැඩ සටහන - 2018

| ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | කෙටිකාලීන / දිගු කාලීන ප්‍රතිඵල | වෙන් කළ මුදල (රු.මි) | වැයකළ මුදල (රු.මි) | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| මාසයක් වයසැති කුඩා හා මධ්‍යම පරිමාණ කුකුළු ගොවිපල සංවර්ධනය කිළි පැටවුන් ලබා දිම | සත්ත්ව පාලනය ප්‍රචලිත කිරිම | පවුලේ ප්‍රෝටින අවශ්‍යතාවය සපුරාගැනිම.ස් වයං රැකියා සඳහා යොමු විම | 6.00 | 6.00 | 100 | 100 |
| කුඩා පරිමාණ කිරි ගොවිපළවල සංවර්ධනය කිරිමේ ව්‍යාපෘතිය | සතුන්ගේ සෞඛ්‍ය සතුටුදායක මට්ටමින් පවත්වාගැනිම හා සතුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවීම | ගොවිපල් යාන්ත්‍රිකරණය වීම හා කිරි නිෂ්පාදනය වැඩි වීම | 4.50 | 0.86 | 100 | 19 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කුඩා පරිමාණ එළු ගොවිපළල සංවර්ධනය කිරිමේ ව්‍යාපෘතිය | ගොවිපල සතුන්ගේ සෞඛ්‍ය සතුටුදායක මට්ටමින් පවත්වාගැනිම/සතුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවිම | ස්වයං රැකියා සඳහා යොමු විම වැඩිවිම | 1.20 | 0.85 | 100 | 72 |

## කිරි නිෂ්පාදනය 2018

2016 වසරෙහි අනුරාධපුර දිස්ත්‍රික්කයේ වාර්ෂික කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 24.66ක් පමණ වූ අතර පොළොන්නරුව දිස්ත්‍රික්කයේ නිෂ්පාදනය ලීටර් මිලියන 10.89 විය. 2017 වසරෙහි උතුරු මැද පළාතේ කිරි නිෂ්පාදනය කිරි ලීටර් මිලියන 49.5 ක් විය. 2018 වසරෙහි උතුරු මැද පළාතේ කිරි නිෂ්පාදනය කිරි ලීටර් මිලියන 44.14 ක් විය.




## කාර්ය සාධනය පිළිබඳව සමස්ත අදහස

කාර්ය මණ්ඩලය පුරප්පාඩු පැවතුනද පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කෙරුණු සංවර්ධන ව්‍යාපෘති ඇතුළු සියළු සේවාවන් සඳහා ප්‍රමාණවත් දායකත්වයක් ලබාදුනි. ගොවින් මෙම දෙපාර්තමේන්තුවෙන් ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වන්නේ සත්ත්ව රෝග ප්‍රතිකාර සහ පාලනයත් , සතුන්ගේ ආරය උසස්කර ගැනිමේ සේවාවන් ලබා ගැනිමයි. එසේම රජයේ ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන පශු සම්පත් ව්‍යාපෘතින් සඳහා දෙපාර්තමේන්තුවේ සහාය අපේක්ෂා කළ ද වර්තමානයේ දෙපාර්තමේන්තුව මුහුන පා සිටින සත්ත්ව සංවර්ධන උපදේශකයින්ගේ හිඟය නිසා එම අපේක්ෂාවන් සඳහා සාධාරණයක් ඉටුකිරිම දුෂ්කර කටයුත්තක්ව ඇත. සත්ත්ව සංවර්ධන උපදේශකයින්ගේ හිඟය යම් තරමකින් හෝ මේ වන විට අවම කර ගැනිමට කටයුතු සංවිධානය කර ඇත. ප්‍රමාණවත් තෘණ බිම් නොමැතිකම, කිරි අලෙවි කරගැනීමේ දුෂ්කරතාවය අවිධිමත් සතුන් ප්‍රවාහනය නිසා වසංගත රෝග පැතිරීම සත්ව නිෂ්පාදන ක්ෂේත්‍රයේ උන්නතියට බාධාවක්ව ඇත.කෙසේ වුවද 2018 වර්ෂය තුළ 2017ට සාපේක්ෂව ඉහළ කාර්ය සාධනයක් ළඟාකර ගත හැකි විය.

# 08. සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය.

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

**අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා පැවරී ඇති ප්‍රධාන විෂයයන්**

- පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය
- පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව
- පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව,
- පළාත් පරිවාස දෙපාර්තමේන්තුව
- පරිසර විෂය හා සම්බන්ධ සංවර්ධන කටයුතු
- පළාත් සභා කටයුතු

## දැක්ම

"සුව සම්පන්න හා සුරක්ෂිත ප්‍රජාවක්, සමෘද්ධිමත් පළාතක්".

## මෙහෙවර

"සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර හා පළාත් සභා කටයුතු සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම".

## අරමුණු

- ගුණාත්මකභාවයෙන් ඉහළ කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් සඳහා යහපත් ආයතනික පද්ධතියක් ඇති කිරීම.
- දෙපාර්තමේන්තු කාර්යයන් අධීක්ෂණය මෙහෙයවීම හා සම්බන්ධීකරණය.
- අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තුවල සියළු සංවර්ධන වැඩසටහන් අධීක්ෂණය, මෙහෙයවීම සහ සම්බන්ධීකරණය.
- පරිසර විෂය යටතේ නිරෝගී දිවියක් උදෙසා යහපත් පරිසරයක් ඇති කිරීම පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම.
- පරිසර දූෂණය අවම කිරීම හා පරිසර සංරක්ෂණයට දායක වෙමින් අනාගත පරපුර සඳහා සුවදායි පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- සෞඛ්‍ය කටයුතු
- දේශීය වෛද්‍ය කටයුතු
- සමාජ සුබසාධන කටයුතු
- පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු
- පරිසර කටයුතු සංවර්ධනය

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ගුණාත්මක සෞඛ්‍ය සේවයක් ඇති කිරීම.
- දේශීය වෛද්‍ය ක්‍රමය වඩාත් ප්‍රචලිත කිරීම.
- පළාතට අවශ්‍ය දේශීය නිමි ඖෂධ පළාත තුළම නිපදවීම.
- ළමා අපචාරවලට ලක්වුවන් රැකගැනීම හා පුනරුත්ථාපනය කිරීම.
- ළමා අපචාර පිළිබඳ ප්‍රජාව සහ පාසල් දරුවන් දැනුවත් කිරීම.
- ආබාධ සහිත වුවන් නගාසිටුවීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අසරණ පවුල් නඟා සිටුවීමට කටයුතු කිරීම.
- මානසික හා කායික වශයෙන් නිරෝගී ශක්ති සම්පන්න ප්‍රජාවක් බිහි කිරීම.
- නගර හා උප නගරවල පරිසර සංරක්ෂණය හා අලංකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ස්වභා උයන් මහජන පරිහරණයට සුදුසු පරිදි වැඩිදියුණු කිරීම.
- පිරිසිදු පානීය ජලය මහජනතාවට ලබා දීම හා උල්පත් සංරක්ෂණය.
- පාසල් හා විශ්ව විද්‍යාල සිසුන් පරිසරය ආරක්ෂා කිරීමට නැඹුරු කිරීම.
- සියළු සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය කිරීම.
- සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචනය .

## සෞඛ්‍ය සේවා අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

6 CLEAN WATER AND SANITATION

සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම.

13 CLIMATE ACTION


දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම.

15 LIFE ON LAND

පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය හා කළමණාකරණ

## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1. | අනුමත | 52 |
| 2. | සේවයේ නියුතු | 39 |
| 3. | පුරප්පාඩු | 13 |
| 4. | අනුයුක්ත | 01 |




## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 25.99 | 21.15 | 4.84 | 81.38 |
| ගමන් වියදම් | 5.90 | 1.84 | 4.06 | 31.19 |
| සැපයිම් | 3.30 | 2.52 | 0.78 | 76.36 |
| නඩත්තු වියදම් | 2.17 | 1.66 | 0.51 | 76.49 |
| ගිවිසුම්ගත සේවා | 1.54 | 0.56 | 0.98 | 36.36 |
| මාරු කිරීම් | 0.34 | 0.29 | 0.05 | 85.29 |
| **එකතුව** | **39.24** | **28.02** | **11.21** | **71.41** |

## මූලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම(රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0.5 | - | 0.5 | - |
| වාහන (අමාත්‍ය කාර්යාලය) | 0.2 | - | 0.2 | - |
| වාහන | 0.6 | - | 0.6 | - |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ | 0.6 | 0.59 | 0.01 | 98 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 0.2 | 0.19 | 0.04 | 98 |
| දැනුම වර්ධනය හා ධාරිතා සංවර්ධනය | 0.4 | 0.39 | 0.08 | 98 |
| වෙනත් මූලධන වත්කම් (ආයෝජන) | 7.5 | 2.15 | 5.35 | 28 |
| **එකතුව** | **10.00** | **3.32** | **6.78** | **33.20** |

## කාර්ය සාධන ඉලක්ක 2017-2019

| ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|---|
| | | 2017 | 2018 | 2019 |
| ගුණාත්මක භාවයෙන් ඉහළ කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් සැපයීම සඳහා ප්‍රශස්ත ආයතනික පද්ධතියක් ඇති කිරීම තුලින් ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් ඇති කිරීම, සේවාලාභීන් තුල ප්‍රචලිත දේශීය වෛද්‍ය ක්‍රමයක් තිබීම,සමාජ සුබසාධනය සවිබල ගැන්වීම තුලින් රැකවරණය ලැබිය යුත්තන් සවිබල ගැන්වීම හා ළමා රක්ෂක සේවා විධිමත් කිරීම තුළින් ළමුන්ගේ රැකවරණය ශක්තිමත් කිරීම. | පවත්වනලද ප්‍රගති සමාලෝචන රැස්වීම් ගණන | 20 | 30 | 20 |
| | පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් ගණන | 04 | 04 | 04 |
| | පවත්වන ලද ධාරිතා සංවර්ධන වැඩසටහන් ගණන | - | 4 | 4 |
| පරිසර විෂය යටතේ නිරෝගි දිවියක් උදෙසා යහපත් ස්වභාවික පරිසරයක් ඇතිකිරිම පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම. | පවත්වන දැනුවත් කිරිමේ වැඩසටහන් ගණන | - | 10 | 100 |
| පරිසර දූෂණය අවම කිරීම හා පරිසර සංරක්ෂණයට දායක වෙමින් අනාගත පරපුර සඳහා සුවදායි පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම. | ආදර්ශ වන වගා ඇති කරන ලද වැව් ගණන | - | 3 | - |
| | ආදර්ශ වන වගා ඇති කරන ලද පාසල් ගණන | - | 30 | 50 |
| | බෙදාදෙන ලද කාබනික පොහොර බඳුන් ගණන | - | 125 | 125 |
| | සංරක්ෂණය කරන ලද උල්පත් ගණන | - | 1 | 0 |

## ප්‍රධාන අංශයන්හී කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින්හී ප්‍රගතිය

| ප්‍රධාන අරමුණු | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන්කළ ප්‍රතිපාදන රු | සමුච්චිත වියදම රු | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| ගුණාත්මක භාවයෙන් ඉහළ කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් සැපයීම සඳහා ප්‍රශස්ත ආයතනික පද්ධතියක් ඇති කිරීම තුළින් ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් ඇති කිරීම, සේවාලාභීන් තුල ප්‍රචලිත දේශීය වෛද්‍ය ක්‍රමයක් තිබීම,සමාජ සුබසාධනය සවිබල ගැන්වීම තුලින් රැකවරණය ලැබිය යුත්තන් සවිබල ගැන්වීම හා ළමා රක්ෂක සේවා විධිමත් කිරීම තුළින් ළමුන්ගේ රැකවරණය ශක්තිමත් කිරීම | ප්‍රගති සමාලෝචන රැස්වීම,ක්ෂේත්‍ර කටයුතු, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් හා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. | ඵලදායී ආයතන පද්ධතියක් | - | - | - |
| | කාර්යාල උපකරණ මිලදී ගැනීම | ඵලදායී සේවාවක් | 0.60 | 0.59 | 98 |
| | යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | ඵලදායී සේවාවක් | 0.20 | 0.19 | 95 |
| | දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය උදෙසා නිළධාරීන්ට පුහුණු වැඩසටහන් | ඵලදායී සේවාවක් | 0.40 | 0.39 | 98 |
| පරිසර දූෂණය අවම කිරීම හා පරිසර සංරක්ෂණයට දායක වෙමින් අනාගත පරපුර සඳහා සුවදායි පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම. | තෝරා ගත් වැව් 03 ක් මැණ රක්ෂිතය ලකුණු කර මීටර් 50 ක් තුළ මල් හා ඵල දරණ ගස්වැල් පමණක් සිටුවීම(අනුරාධපුර) | අනාගත පරපුර සඳහා දූෂණයෙන් තොර පරිසර පද්ධතියක්. | 1.50 | 0.07 | 5 |
| | තෝරා ගත් වැව් 03 ක් මැණ රක්ෂිතය ලකුණු කර මී. 50 ක් තුළ මල් හා ඵල දරණ ගස්වැල් පමණක් සිටුවීම(පොළොන්නරුව) | අනාගත පරපුර සඳහා දූෂණයෙන් තොර පරිසර පද්ධතියක්. | 0.50 | - | - |

| ප්‍රධාන අරමුණු | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන්කළ ප්‍රතිපාදන (රු.මි) | සමුච්චිත වියදම (රු.මි) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| පරිසර දූෂණය අවම කිරීම හා පරිසර සංරක්ෂණයට දායක වෙමින් අනාගත පරපුර සඳහා සුවදායි පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම | තෝරා ගත් පාසල් 30 ක අක්කර 1/4 ක් තුල මල් හා ඵල දරණ ගස්වැල් පමණක් සිටුවීම(අනුරාධපුර) | අනාගත පරපුර සඳහා දූෂණයෙන් තොර පරිසර පද්ධතියක්. | 1.50 | 1.05 | 70 |
| | තෝරා ගත් පාසල් 30 ක අක්කර 1/4 ක් තුල මල් හා ඵල දරණ ගස්වැල් පමණක් සිටුවීම(පොළොන්නරුව) | අනාගත පරපුර සඳහා දූෂණයෙන් තොර පරිසර පද්ධතියක්. | 0.50 | - | - |
| | නාගරික කසළ කළමනාකරණය හා කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (අනුරාධපුර) | නිකසල නගරයක්. | 0.70 | 0.70 | 100 |
| | නාගරික කසළ කළමනාකරණය හා කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (පොළොන්නරුව) | නිකසල නගරයක්. | 0.30 | 0.70 | 110 |
| | ස්වභාවික ජල උල්පත් සංරක්ෂණය කිරීම | අනාගත පරපුර සඳහා පිරිසිදු පානිය ජලය. | 2.50 | 1.17 | 47 |

**සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන,පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය.**

| අරමුණු | ඉලක්ක | | | අපේක්ෂිත ප්‍රතිඵල | |
|---|---|---|---|---|---|
| | දර්ශකය | 2020 | 2021 | කෙටිකාලීන | දිගුකාලීන |
| 1.ඵලදායි සේවාවක් සැපයීම සඳහා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන නියාමනය සිදු කිරීම සඳහා, ප්‍රතිපත්ති, උපදෙස්, හා ප්‍රගති සමාලෝචනයන් සිදු කිරීම. | ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම<br>දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම<br>ක්ෂේත්‍ර පරික්ෂා සිදු කිරීම<br>අත්දැකීම් හුවමාරු කරගැනීමේ වැඩසටහන් පැවැත්වීම.<br>ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. | 6<br>20<br>30<br>2<br>2 | 6<br>20<br>40<br>3<br>2 | කාර්යක්ෂම මහජන සේවාවක් සපයන ආයතන පද්ධතියක් | ආයතන පද්ධතිය ක්‍රමානුකූලව පවත්වා ගැනිම තුළින් මහජන අවශ්‍යතාවය න් ඉටු වූ තෘප්තිමත් ප්‍රජාවක් |
| 2. පරිසර දූෂණය අවම කිරීම හා පරිසර සංරක්ෂණයට දායක වෙමින් අනාගත පරපුර සඳහා සුවදායි පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම. | පාසල් ආශ්‍රිත වනවගා වැඩසටහන් පැවැත්වීම .<br>රෝහල් පාසල් ආශ්‍රිත වනවගා වැඩසටහන් පැවැත්වීම<br>විහාරස්ථාන ආශ්‍රිත වනවගා වැඩසටහන් පැවැත්වීම | 50<br>25<br>25 | 50<br>30<br>25 | අක්කර 25කින් යුත් නව හරිත වන වගාවක්. | අනාගත පරපුර සඳහා දූෂණයෙන් තොර පරිසර පද්ධතියක්. |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

මෙම අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර හා මූලික අරමුණුවලට අනුව අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු මෙහෙයවීමේ කාර්යයේදී අදාළවන වැය දැරීම සඳහා පුනරාවර්තන ප්‍රතිපාදන ලෙස රු.මි.39.23ක් ලැබී තිබූ අතර එහි සත්‍ය වියදම රු.මි.28.02වේ. එය ප්‍රතිශතයක් ලෙස72% ක අගයක් ගන්නා අතර සංවර්ධන කාර්යයන් ඉටු කිරීම සඳහා මූලධන ප්‍රතිපාදන ලෙස රු.මි.10 ක් ලැබී ඇත. එහි වැය රු .මි.3.32ක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 33.24% කි.

ඒ අනුව අමාත්‍යාංශය සහ අමාත්‍යාංශයට අයත් සියලු දෙපාර්තමේන්තුවල කාර්යයන් නියාමනය, ප්‍රතිපත්ති සම්පාදනය, අධීක්ෂණය, ප්‍රගති සමාලෝචනය, මෙහෙයවීම හා සම්බන්ධීකරණය යන කාර්යයන් ඉටු කිරීමේදී ඉහළ කාර්ය සාධනයක් අත්පත් කරගෙන ඇති අතර දෙපාර්තමේන්තුවල කාර්ය සාධන ඉලක්ක සාධනීය ලෙස ඉටු කර තිබීම මගින් එය තව දුරටත් තහවුරු වේ.

ලෝක බැංකු හා ආසියානු සංවර්ධන බැංකුව යන ආයතනවල මූල්‍ය ප්‍රතිපාදන මත 2018 වර්ෂයේදී ක්‍රියාත්මක වූ සහ 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇති සෞඛ්‍ය ආංශික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී හා සැලසුම්කරණයේදී අමාත්‍යාංශය මගින් ප්‍රමාණවත් දායකත්වයක් සපයන ලදී. එම හේතුන් නිසාම එම වැඩසටහන් 2018 වර්ෂය තුළදී සාර්ථකව නිම කිරීමට අදාළ දෙපාර්තමේන්තුවලට හැකියාවක් ලැබිණි.

පළාත් ආයුර්වේද, සමාජසේවා හා පරිවාස යන දෙපාර්තමේන්තුවල ඵලදායීතාවය ඉහළ නංවාලීම සඳහාද මෙම අමාත්‍යාංශයේ දායකත්වය ලබාදුන් අතර එම දෙපාර්තමේන්තුවල ද කාර්යසාධනය ඉහළ නංවාලමින් ප්‍රශස්ත මහජන සේවාවක් 2018 වර්ෂයේදී ලබා දීමට ඔවුන් හට හැකියාවක් ලැබී ඇති බව එම දෙපාර්තමේන්තුවල සංවර්ධන ඉලක්ක පරික්ෂා කර බැලීමේදී පැහැදිලි වේ. ඒ අනුව 2018 වර්ෂයේදී ලබාගත් අත්දැකීම් උපයෝගී කරගෙන 2019 වර්ෂය සඳහා ඉදිරි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. කාර්ය මණ්ඩලවල පවතින ඌනතාවයන්, ක්ෂේත්‍ර කටයුතු සඳහා අවශ්‍ය වාහන පහසුකම් හිඟතාවය, බාහිර ආයතන හා නිලධාරීන් කළමනාකරණය කරගැනීමේදී මතුවන ගැටළුවලට මුහුණ දීමට සිදු වුව ද අමාත්‍යාංශයේ අරමුණු ඵලදායීව ඉටුකරගැනීම සඳහා 2018 වර්ෂයේදී අමාත්‍යාංශය සතු මානව, භෞතික හා මූල්‍ය සම්පත් උපරිම කාර්යක්ෂමතාවයකින් යුක්තව උපයෝගී කරගනිමින් 2018 වර්ෂයේ අපේක්ෂිත කාර්ය සාධනය කරා ළඟා විය .

# 8.1.පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන පද්ධතිය

| ආයතනය | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල | 01 | - | 01 |
| ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | 01 | 01 | 02 |
| සෞඛ්‍ය නිලධාරී කාර්යාලය | 20 | 07 | 26 |
| මූලික රෝහල් | 03 | 02 | 05 |
| ප්‍රාදේශීය රෝහල් (ඒ ශ්‍රේණිය) | 04 | 01 | 05 |
| ප්‍රාදේශීය රෝහල් (බී ශ්‍රේණිය) | 13 | 11 | 24 |
| ප්‍රාදේශීය රෝහල් (සී ශ්‍රේණිය) | 20 | - | 20 |
| ප්‍රාථමික වෛද්‍ය සත්කාරක ඒකක | 21 | 13 | 34 |
| ක්ෂය රෝග මර්ධන සායන මධ්‍යස්ථාන | 01 | 01 | 02 |
| ලිංගාශ්‍රිත බෝවන රෝග නිවාරණ ඒකක | 01 | 01 | 02 |
| වාහන සේවා මධ්‍යස්ථාන | 01 | - | 01 |
| **එකතුව** | **85** | **37** | **122** |

ඒ ශ්‍රේණිය - ඇඳන් 100ට අඩු
බී ශ්‍රේණිය - ඇඳන් 50-100
සී ශ්‍රේණිය - ඇඳන් 50ට අඩු

මහජන සෞඛ්‍ය සේවා නිළධාරී කොට්ඨාස - 104
පවුල් සෞඛ්‍ය සේවා නිළධාරි කොට්ඨාස - 430

අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා
පලුගස්වැව, නාච්චාදූව
සහ
පොළොන්නරුව දිස්ත්‍රික්කය සඳහා සිරිපුර ද
නව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශය ලෙස ඇතුළත් කිරීමට
කටයුතු සිදුකරමින් පවතී.

## උතුරු මැද පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් වාහන පිළිබඳ තොරතුරු -2018

| අංකය | වාහන වර්ගය | පළාත් කාර්යාලය | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | | එකතුව |
|---|---|---|---|---|---|
| | | | අනුරාධපුර | පොළොන්නරුව | |
| 01 | මෝටර් කාර් | 01 | - | - | 01 |
| 02 | ගිලන් රථ | - | 61 | 25 | 86 |
| 03 | කැබ් රථ | 06 | 44 | 28 | 78 |
| 04 | වෑන් | 04 | 13 | 14 | 31 |
| 05 | ජීප් රථ | - | 06 | 03 | 09 |
| 06 | ලොරි රථ | - | 05 | - | 05 |
| 07 | බවුසර් රථ | - | 02 | - | 02 |
| 08 | ත්‍රීවීල් රථ | 01 | 04 | 03 | 08 |
| 09 | මෝපෙඩ් මෝටර් සයිකල් | 01 | 02 | - | 03 |
| 10 | බස් රථ(ජංගම දන්ත සායන) | - | 02 | 0 | 02 |
| 11 | මෝටර් බයිසිකල් | - | 01 | 02 | 03 |

### පළාතේ මහජනතාව සඳහා සපයනු ලබන සේවාවන්

| විස්තරය | දිස්ත්‍රික්කය | 2014 | 2015 | 2016 | 2018 |
|---|---|---|---|---|---|
| බාහිර රෝගීන් | අනුරාධපුර | 2,645,417 | 2,635,718 | 2,224,028 | 2,213,126 |
| | පොළොන්නරුව | 856,179 | 880,498 | 854,620 | 893,141 |
| | **එකතුව** | **3,501,596** | **3,516,216** | **3,078,648** | **3,106,267** |
| නේවාසික රෝගීන් සංඛ්‍යාව | අනුරාධපුර | 183,981 | 180,066 | 172,567 | 186,322 |
| | පොළොන්නරුව | 64,373 | 61,995 | 59,372 | 62,361 |
| | **එකතුව** | **248,354** | **242,061** | **231,939** | **248,683** |
| සායනික ප්‍රතිකාර සේවා රෝගීන් සංඛ්‍යාව | අනුරාධපුර | 474,629 | 534,822 | 473,558 | 2,399,448 |
| | පොළොන්නරුව | 179,101 | 227,110 | 227,032 | 955,502 |
| **එකතුව** | | **653,730** | **761,932** | **700,590** | **3,354,950** |

## නිවාරණ සෞඛ්‍ය සේවාවන් සැපයීම

| | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශ | 68 | 36 | 104 |
| මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් | 294 | 136 | 430 |
| පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාශ | 334 | 155 | 489 |
| පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් | 143 | 70 | 213 |
| ග්‍රාමීය සෞඛ්‍ය සායන මධ්‍යස්ථාන | 294 | 136 | 430 |

## පළාතේ සෞඛ්‍ය දර්ශක 2014 - 2018

| විස්තරය | දිස්ත්‍රික්කය | 2014 | 2015 | 2016 | 2018 |
|---|---|---|---|---|---|
| ළදරු මරණ අනුපාතය | අනුරාධපුර | 10.9 | 16.7 | 16.7 | 16.7 |
| (සජීවී උපත්1000 ට) | පොළොන්නරුව | 9.2 | 11.6 | 7.5 | 7.5 |
| මාතෘ මරණ අනුපාතය | අනුරාධපුර | 28.4 | 47.7 | 32.0 | 32 |
| (සජීවී උපත්1000 ට) | පොළොන්නරුව | 27.4 | 28.4 | 28.0 | 28 |
| දළ උපත් අනුපාතය | අනුරාධපුර | 17.8 | 17.3 | * | |
| (පුද්ගලයින් 1000 ට) | පොළොන්නරුව | 17.7 | 16.9 | * | |
| දළ මරණ අනුපාතය | අනුරාධපුර | 5.5 | 5.8 | * | |
| ( පුද්ගලයින් 1000 ට) | පොළොන්නරුව | 5.5 | 5.2 | * | |

## තෝරා ගත් රෝග කිහිපයක වාර්තා වූ රෝගීන් ව්‍යාප්තිය

| විස්තරය | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|
| වකුගඩු රෝගීන් | 3,515 | 4,122 | 16,464 | 19,377 |
| ඩෙංගු රෝගීන් | 809 | 637 | 953 | 1,373 |
| ක්ෂය රෝගීන් | 381 | 393 | 399 | 364 |
| පිළිකා රෝගීන් | 1,596 | 1,768 | 1,619 | 1,562 |
| ලාදුරු රෝගීන් | 140 | 176 | 137 | 131 |

## දැක්ම

“සුව සම්පන්න හා සුරක්ෂිත ප්‍රජාවක්, සමෘද්ධිමත් පළාතක්.

## මෙහෙවර

“සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම”.

## දිගුකාලීන අරමුණු

- උතුරු මැද පළාතේ සෞඛ්‍ය ආයතනයන්හී යටිතල පහසුකම් සංවර්ධනය කිරිම.
- උතුරු මැද පළාතට සුවිශේෂි වු සෞඛ්‍ය ගැටළුවන වකුගඩු රෝගය,වස විෂ ශරිරගත වීම් සහ පිළිකා රෝග තත්වයන් අවම කිරීම.
- ප්‍රාදේශීය රෝහල් මගින් ගුණාත්මක ප්‍රතිකාර සේවාවක් ලබා දීම සහ පළාතේ මුලික රෝහල් අංග සම්පූර්ණ පහසුකම් සහිත රෝහල් ලෙස වැඩිදියුණු කිරීම.
- සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ප්‍රජා දායකත්වය සහ අන්තර් පාර්ශවිය සම්බන්ධතා වැඩිදියුණු කිරිම.

## කෙටි කාලීන අරමුණු

- වාර්ෂිකව වෙන්වන ප්‍රතිපාදනයන් කාර්යක්ෂම ලෙස ආයෝජනය කිරිම.
- ප්‍රමුඛතාවය මත හඳුනාගත් ඉලක්කගත වැඩසටහන් කාලානුරූපව ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය.
- වකුගඩු රෝග කළමනාකරණයේදී හඳුනාගත් රෝහල් සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම.
- වසවිෂ ශරීරගත වීම් සහ පිළිකා තත්වයන් කළමනාකරණය ඉලක්ක සහගත ලෙස ක්‍රියාත්මක කිරීම.
- සුනඛ වන්ධ්‍යාකරණ වැඩසටහන් ඉලක්ක සහගත ලෙස නියාමනය කිරීම.
- හදිසි ප්‍රතිකාර ඒකක වැඩිදියුණු කිරිම.
- තොරතුරු තාක්ෂණය යොදා ගනිමින් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කළමනාකරණය කාර්යක්ෂම කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- ප්‍රතිකාරක සෞඛ්‍ය සේවා සැපයීම.
- රෝග නිවාරණ සෞඛ්‍ය සේවා සැපයීම.
- පර්යේෂණ, සමීක්ෂණ හා ධාරිතා සංවර්ධනය.
- අන්තර් ආංශික සම්බන්ධතා ශක්තිමත් කිරීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ප්‍රම්පාදන ක්‍රියාවලිය විධිමත්ව අධීක්ෂණය කිරීම.
- පුහුණු වැඩසටහන් දත්ත පද්ධතියක් මගින් යාවත්කාලීන කිරීම.
- කාර්ය මණ්ඩල තොරතුරු හා පෞද්ගලික ලිපිගොනු, වැටුප් වර්ධක, පත්වීම් සම්බන්ධයෙන් ඉලක්ක සහගත ලෙස කළමනාකරණය සිදු කිරීම.
- පුහුණුකරුවන් පුහුණු කිරීම්, දැනුවත් කිරීම් සහ දැනුවත් කිරීම් වැඩසටහන් ගුණාත්මක ලෙස සිදු කිරීම.
- සෞඛ්‍ය ආයතන ආයෝජනයේදී ප්‍රතිකාර සේවා සඳහා ප්‍රමුඛතාවය ලබා දීම.
- ප්‍රදේශයේ ඇති සෞඛ්‍ය ආයතන අදාල ශ්‍රේණියට අනුව සියළු පහසුකම් ලබා දිය හැකි සෞඛ්‍ය ආයතන ලෙස ක්‍රියාත්මක කිරීම.
- පළාත තුළ ක්‍රියාත්මකවන පර්යේෂණ හා සමීක්ෂණ, පළාත් පර්යේෂණ හා සමාලෝචන කමිටුව මගින් නියාමනය කිරීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු යටතේ සිදු කරන ලද ක්‍රියාකාරකම්

**03**


**නීරෝගී ජීවිත සහතිකකර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම**

3 GOOD HEALTH AND WELL-BEING

- මාතෘ හා ළමා මරණ අවම කිරීම
- සරම්ප ප්‍රතිශක්තීකරණ ආවරණය වැඩිකිරීම
- දිළිඳුකම හේතුකරගෙන ළමා වියේදී ඇතිවන අයහපත් සංකූලතා අවම කිරීම
- එච්.අයි.වී සහ මැලේරියා රෝගීන්ගේ ව්‍යාප්තිය අවමකිරීම
- වකුගඩු රෝග ව්‍යාප්තිය අවම කිරීම සහ රෝගීන් කල්තබා හඳුනාගෙන ප්‍රතිකාර සිදුකිරීම,
- සියදිවි නසාගැනීම් සහ ස්වයංහානි කරගැනීමට තැත් කිරීම් අවම කිරීම
- මාතෘ හා ළමා මන්ද පෝෂණ තත්ත්වය අවම කිරීම


## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 5152 |
| 2 | සේවයේ නියුතු | 3921 |
| 3 | පුරප්පාඩු | 1231 |
| 4 | ආදේශක | 26 |
| 5 | කොන්ත්‍රාත් පදනම මත | 59 |




## පුනරාවර්තන වියදම් - 2018

| වියදම් ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම් ( රු.මි.) | ඉතිරිය ( රු.මි. ) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 3453.78 | 3450.85 | 2.93 | 100 |
| ගමන් වියදම් | 62.00 | 61.98 | 0.02 | 100 |
| සැපයීම් | 205.71 | 201.02 | 4.69 | 98 |
| නඩත්තු | 75.81 | 69.79 | 6.02 | 92 |
| ගිවිසුම්ගත සේවා | 181.63 | 174.24 | 7.39 | 96 |
| මාරු කිරීම් | 12.95 | 11.51 | 1.44 | 89 |
| **එකතුව** | **3991.85** | **3969.39** | **22.49** | **99** |




වගුව

## මුලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2018 වර්ෂයේ වියදම් ( රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 217.11 | 181.89 | 35.21 | 84 |
| යන්ත්‍ර සූත්‍ර සවිකිරීම් හා උපකරණ | 175.95 | 129.69 | 46.27 | 74 |
| වාහන | 70.50 | 69.42 | 1.08 | 98 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 439.75 | 330.59 | 109.16 | 75 |
| **එකතුව** | **903.31** | **711.59** | **191.72** | **79** |

## කාර්යය සාධන ඉලක්ක 2017-2019

පළාත් සෞඛ්‍ය අංශයේ දර්ශකයන්ගේ සාධනීය මට්ටමක් ළඟාකර ගැනීම සඳහා අරමුණු ( අංක 1- 7 දක්වා), දර්ශක හා ඉලක්ක පිළිබඳ විග්‍රහය (2017-2019)

**අරමුණු**

1.නේවාසික පහසුකම් වැඩිදියුණු කිරීම
2.ගුණාත්මක හා ඵලදායි පහසුකම් සහිතව රෝහල් වැඩිදියුණු කිරීම
3.ආයතන කළමනාකරණ සංවර්ධන හා සේවාව ප්‍රශස්ත මට්ටමේ පවත්වාගෙන යාම
4.හදිසි ප්‍රතිකාර සේවාව වැඩිදියුණු කිරීම
5.ගුණාත්මක හා ඵලදායි බාහිර රෝගී සත්කාර සේවාව වැඩිදියුණු කිරීම
6.මාතෘ හා ළමා සෞඛ්‍ය පෝෂණය ප්‍රවර්ධනය කිරීම
7ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම.

| දර්ශක | ඉලක්ක(2017-2019) | | |
|---|---|---|---|
| මාතෘ මරණ අනුපාතිකය අඩු කිරීම | 26% | 22% | 21% |
| ළදරු මරණ අනුපාතිකය අඩු කිරීම | 6.5% | 6.0% | 5.5% |
| රෝගීන්ගේ සේවා කාලය අඩු කිරීම | 25% | 40% | 60% |
| බෝ නොවන රෝග පරීක්ෂා කිරීම | 42% | 52% | 62% |
| රැඳවුම් කාලය අඩු වීම | 25% | 50% | 75% |
| රෝගීන්ගේ සේවා කාලය අඩු කිරීම | 25% | 40% | 60% |

**පළාත් සෞඛ්‍ය අංශයේ දර්ශකයන්ගේ සාධනීය මට්ටමක් ළඟාකර ගැනීම සඳහා අරමුණු ( අංක 8-10 දක්වා), දර්ශක හා ඉලක්ක පිළිබඳ විග්‍රහය (2017-2019)**

| ආයතනයේ අරමුණ | කාර්ය සාධන දර්ශකය | ඉලක්ක | | |
|---|---|---|---|---|
| | | 2017 | 2018 | 2019 |
| 08.දිස්ත්‍රික්කය තුල සෞඛ්‍ය සම්පන්න නිරෝගිමත් ප්‍රජාවක් බිහි කිරිම | මාතෘ මරණ සංඛ්‍යාව අඩු කිරීම | 1% | 1% | 0% |
| | ළදරු මරණ අනුපාතිකය අඩු කිරීම | 8.3% | 7.8% | 7.0% |
| | අඩු බර උපත් අඩු කිරිම | 10% | 9% | 7% |
| 09.දිස්ත්‍රික්කය තුල බෝවන රෝග ව්‍යාප්තිය අවම කිරිම සහ ඩෙංගු ව්‍යාප්තිය මැඩලීම | ලීෂ්මනයිසීස් රෝග ව්‍යාප්තිය අඩු කිරිම (රෝගීන් සංඛ්‍යාව) | 142 | 246 | 180 |
| | ලාදුරු රෝග ව්‍යාප්තිය අවම කිරිම (රෝගීන් සංඛ්‍යාව) | 57 | 45 | 35 |
| | ඩෙංගු රෝග ව්‍යාප්තිය අවම කිරිම (රෝගීන් සංඛ්‍යාව) | 1086 | 247 | 200 |
| 10. ජනතාව තුල දන්ත රෝග අවම කිරිම මෙන්ම මුඛ පිළිකා වැලැක්වීම | දත් දිරායාම අවම කිරිම | 60% | 58% | 55% |
| | විදුරුමස් රෝගය අවම කිරිම | 75% | 72% | 69% |
| | පූර්ව මුඛ පිළිකා හඳුනා ගැනීම | 0 | 2% | 3% |

ඉහතින් දක්වා ඇති පළාත් සෞඛ්‍ය අංශයේ දර්ශකයන්ගේ සාධනීය මට්ටමක් ළඟාකර ගැනීම සඳහා ඉලක්කගත අරමුණු ඔස්සේ අපේක්ෂා කරයි. එහිදී නේවාසික පහසුකම් වැඩිදියුණු කිරීම, ගුණාත්මක හා ඵලදායි පහසුකම් සහිතව රෝහල් වැඩිදියුණු කිරීම, ආයතන කළමනාකරණ සංවර්ධන හා සේවාව ප්‍රශස්ත මට්ටමේ පවත්වාගෙන යාම, ගුණාත්මක හා ඵලදායි බාහිර රෝගී සත්කාර සේවාව වැඩිදියුණු කිරීම, මාතෘ හා ළමා සෞඛ්‍ය පෝෂණය ප්‍රවර්ධනය කිරීම, ආයතනික ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පළාත තුල සෞඛ්‍ය සම්පන්න නිරෝගිමත් ප්‍රජාවක් බිහි කිරිම, බෝවන රෝග ව්‍යාප්තිය අවම කිරිම සහ ඩෙංගු ව්‍යාප්තිය මැඩලීම මෙන්ම පළාතේ ජනතාව තුළ දන්ත රෝග අවම කිරිම හා මුඛ පිළිකා වැලැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම ඉලක්ක කෙරේ.

පළාතේ තෝරා ගත් දර්ශකයන්ගේ සැලකිය යුතු කාර්ය සාධනයක් ලබා ගැනීමට2017-2019 තුන් අවුරුදු ඉලක්ක තුළ අපේක්ෂා කරයි. එහිදී මාතෘ මරණ අනුපාතිකය, ළදරු මරණ අනුපාතිකය යන දර්ශකවල සැලකිය යුතු ප්‍රගතියක් අපේක්ෂා කරන අතර මනා කාර්යක්ෂම සේවාවක් සැපයීම තුළින් රෝගීන්ගේ ප්‍රතිකාර සේවා ලබා ගැනීම සඳහා ගතවන කාලය අඩුකිරීම මෙන්ම සමස්තයක් ලෙස මුළු රට තුළම ඉහළ යාමේ ප්‍රවණතාවයක් පවතින බෝ නොවන රෝග පරීක්ෂා කිරීම හා බෝ නොවන රෝග වලින් වැළකී සිටීමට ජනතාව නැඹුරු කිරීමත්, බාහිර රෝගී ප්‍රතිකාර ලබා ගැනීම සඳහා රැඳවුම් කාලය අඩුකිරීමත්, උපතේදී අඩු බර උපත් අඩු කිරිමත් කැපී පෙනෙන ලෙස ඉලක්ක සාධනය කර ගැනීමත් අපේක්ෂා කරයි. එමෙන්ම ලීෂ්මනයිසීස් රෝග ව්‍යාප්තිය අඩු කිරිම, ලාදුරු රෝග ව්‍යාප්තිය අවම කිරිම, ඩෙංගු රෝග ව්‍යාප්තිය අවම කිරිමත් මුඛ සෞඛ්‍ය හා සම්බන්ධ දත් දිරායාම අවම කිරිම, විදුරුමස් රෝගය අවම කිරිම, පූර්ව මුඛ පිළිකා හඳුනා ගැනීම යන අංශයන්ගේ දර්ශකයන්හී ඉලක්ක සාධනය කරගැනීමත් අපේක්ෂා කරයි.

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟාකරගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය - 2018

| ප්‍රධාන අරමුණු | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මකකළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන්කළ (රු.මි.) | වැයකළ (රු.මි.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| නව යොවුන්වියේ දරුවන් අතර යහපත මානසික සුවතාවයක් ඇතිකර අධ්‍යයනය නිසි පරිදිකරගෙන යා හැකි පරිසරයක් ගොඩනැගීම | නව යොවුන්වියේ දරුවන්ට බලපාන මානසික ගැටළු සහ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් දරුවන් සහ දෙමාපියන් දැනුවත්කිරීම | නව යොවුන්වියේ දරුවන්ගේ මානසික ගැටළු අවමකර අධ්‍යාපනය නිසි පරිදිකරගෙන යා හැකි පරිසරයක් ගොඩ නැගීම | 0.1 | 0.1 | 100 |
| විශේෂ අවශ්‍යතා සහිත දරුවන් හඳුනාගැනීම සම්බන්ධයෙන් දෙමාපියන් සහ පාසල් ගුරුවරුන් දැනුවත් කිරීම | පෙර පාසල් ගුරුවරු හා දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන | විශේෂ අවශ්‍යතා සහිත දරුවන් කුඩා කලම හඳුනාගෙන ඔවුන් අධ්‍යාපන කටයුතු සඳහා යොමු කිරීම | 0 | 0 | 100 |
| පුනරුත්ථාපනය ලබන මානසික රෝගීන්ගේ පවුල්වල මානසික සුවතාවය වර්ධනය කිරීම | මානසික සුවතා වැඩසටහන් (භාවනා වැඩසටහන සහ අවුරුදු උත්සවය) | පුනරුත්තාපනය ලබන මානසික රෝගීන්ට පවුල්වල මානසික සුවතාවය වර්ධනය කිරීම | .034 | 0.034 | 100 |
| මානසික සෞඛ්‍ය සම්බන්ධයෙන් දිස්ත්‍රික් වැඩසටහන්වල ප්‍රගතිය සමාලෝචනය | ප්‍රගති සමාලෝචන රැස්වීම් | ප්‍රගතිය සමාලෝචන රැස්වීම් | 0.05 | 0.016 | 32 |
| තේමාවට අනුව යොවුන්වියේ දරුවන්ට බලපාන මානසික රෝග, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් දැනුවත් කිරීම හා පුහුණුව ලබාදීම | මානසික සෞඛ්‍ය දින වැඩසටහන් පැවැත්වීම | නව යොවුන්වියේ දරුවන් මානසික ගැටළුවලින් තොර යහපත් මානසික වටපිටාවක් ගොඩනගාදීම | 0.12 | 0.12 | 100 |

| ප්‍රධාන අරමුණු | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මකකළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ (රු.මි.) | වැයකළ (රු.මි.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| බෝවන රෝග සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | දිස්ත්‍රික්කයේ රෝගීන් 50%කින් අඩුකිරීම | 0.05 | 0.4 | 86 |
| ඩෙංගු පිළිබඳ වැඩසටහන් සඳහා සති නාමකරණය | සතියෙහි ශ්‍රමදාන වැනි වැඩසටහන් පැවැත්වීම | ඩෙංගු රෝගීන් අඩුකිරීම සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මරණ සංඛ්‍යාව අඩුකිරීම | 0.07 | 0.11 | 100 |
| මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සමග බෝනොවන රෝග සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | බෝ නොවන රෝග සම්බන්ධයෙන් අවශ්‍යතා මිලදී ගැනීම සහ වැඩසටහන් සංවිධානය කිරීම | 0.17 | 0.16 | 95 |
| නේවාසික පහසුකම් වැඩිදියුණු කිරීම | රෝහල් ගොඩනැගිලි සහ කාර්යය මණ්ඩලය සඳහා ලබාදී ඇති නිල නිවාස ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම සහ උපකරණ දීම | නව රෝහල් ගොඩනැගිලි ඉදිකිරීම මගින් ප්‍රතිකාර සේවාවන්ගේ ගුණාත්මකභාවය සහ ආවරණ වපසරිය වැඩිකිරීම | 14.0 | 16.7 | 100 |
| ගුණාත්මක හා ඵලදායී පහසුකම් සහිතව රෝහල් වැඩිදියුණු කිරීම | රෝහල් ගොඩනැගිලි සහ කාර්යය මණ්ඩලය සඳහා ලබාදී ඇති නිල නිවාස ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම සහ උපකරණ ලබාදීම | රෝහල් ගොඩනැගිලි වැඩිදියුණු කිරීම මගින් වඩාත් ගුණාත්මක ප්‍රතිකාර සේවාවක් ලබාදීම | 7.0 | 11.4 | 100 |



| ප්‍රධාන අරමුණු | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මකකළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ (රු.මි.) | වැයකළ (රු.මි.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| ගුණාත්මක හා ඵලදායී පහසුකම් සහිතව බාහිර රෝගී සත්කාර සේවාව වැඩිදියුණු කිරීම | බාහිර රෝගී අංශ ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම සහ උපකරණ ලබාදීම | බාහිර රෝගී සත්කාර සේවාව වැඩිකිරීම මගින් රැඳවුම් කාලය අඩුකිරීම හා ගුණාත්මක හා ඵලදායී සත්කාර සේවාව සිදුකිරීම | 1.8 | 2.2 | 100 |
| හදිසි ප්‍රතිකාර සේවාව වැඩිදියුණු කිරීම | හදිසි ගොඩනැගිලි ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම සහ උපකරණ ලබාදීම | අසාධ්‍ය රෝගීන්ට ප්‍රතිකාර කිරීම ක්‍රමවත් කිරීම සහ වෙනත් ආයතනවලට රෝගීන් මාරුකරන ප්‍රමාණය අවම කිරීම | 1.0 | 1.5 | 100 |
| මාතෘ හා ළමා සෞඛ්‍ය පෝෂණය ප්‍රවර්ධනය කිරීම | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම සහ උපකරණ ලබාදීම | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල වැඩිදියුණු කිරීම මගින් නිවාරණ සෞඛ්‍ය සේවාවන්හි ගුණාත්මකභාවය වැඩිකිරීම | 14.7 | 15.4 | 100 |
| ආයතන කළමනාකරණ, සංවර්ධන හා සේවාව ප්‍රශස්ත මට්ටමේ පවත්වාගෙන යාම | ආයතනයෙන් සපයනු ලබන සේවාවන් පිළිබඳව සැලකිලිමත්වීම | ආයතන කළමනාකරණ, සංවර්ධන හා සේවාව ප්‍රශස්ථ මට්ටමේ පවත්වාගෙන යාම තුළින් ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් ලබාදීම | 64.6 | 54.9 | 95 |

නව යොවුන්වියේ දරුවන්ට බලපාන මානසික ගැටළු සහ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් දරුවන් සහ දෙමාපියන් දැනුවත් කිරීම, පෙර පාසල් ගුරුවරු හා දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන, මානසික සුවතා වැඩසටහන්, ප්‍රගති සමාලෝචන රැස්වීම්, මානසික සෞඛ්‍ය දින වැඩසටහන් පැවැත්වීම, සතියෙහි ශ්‍රමදාන වැඩසටහන් පැවැත්වීම, රෝහල් ගොඩනැගිලි සහ කාර්යය මණ්ඩලය සඳහා ලබාදී ඇති නිල නිවාස ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම සහ උපකරණ දීම, බාහිර රෝගී අංශ ඉදිකිරීම, හදිසි ගොඩනැගිලි ඉදිකිරීම, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල ඉදි කිරීම වර්ෂය තුළදී ක්‍රියාත්මක කළ අතර ඒ සඳහා රු.මි.112.69ක් වෙන් වු අතර එයින් රු.මි 103.04ක් වැය විය.

## උතුරු මැද පළාත් තුළ සෞඛ්‍ය සේවාවේ ප්‍රවර්ධනය උදෙසා ක්‍රියාත්මක කරන ලද සංවර්ධන කාර්යයන් - 2018

| අ.අ | ආයතනය | සංවර්ධන කාර්යය | |
|---|---|---|---|
| 01 | අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය වකුගඩු රෝග නිවාරණ ඒකකයේ අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කිරීම | මැදවච්චිය වකුගඩු රෝග නිවාරණ ඒකකය ඉදිකිරීම |  |
| 02 | අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහඉලුප්පල්ලම ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකයේ සංවර්ධන කටයුතු සිදු කිරීම | මහඉලුප්පල්ලම ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය ඉදිකිරීම |  |
| 03 | අනුරාධපුර දිස්ත්‍රික්කයේ මධ්‍යම නුවරගම් පළාත් ග්‍රාමෝදය සෞඛ්‍ය සායන මධ්‍යස්ථානය ඉදිකිරීම | ග්‍රාමෝදය සෞඛ්‍ය සායන මධ්‍යස්ථානය ඉදිකිරීම |  |
| 04 | අනුරාධපුර දිස්ත්‍රික්කයේ තඹුත්තේගම මූලික රෝහලේ සංවර්ධන කටයුතු | තඹුත්තේගම මූලික රෝහලේ විශේෂඥ වෛද්‍ය නිලධාරි නිල නිවාසය ඉදිකිරීම |  |

| අ.අ | ආයතනය | සංවර්ධන කාර්යය | |
|---|---|---|---|
| 05 | අනුරාධපුර දිස්ත්‍රික්කයේ තඹුත්තේගම මූලික රෝහලේ සංවර්ධන කටයුතු | තඹුත්තේගම මූලික රෝහලේ වෛද්‍ය නිලධාරි නිල නිවාසය ඉදිකිරීම |  |
| 06 | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය රෝහලේ සංවර්ධන කටයුතු | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය රෝහලේ විදුලිජනක යන්ත්‍රය සවිකරන කාමරය ඉදිකිරීම |  |
| **07** | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය රෝහලේ සංවර්ධන කටයුතු | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය රෝහලේ කොරිඩෝව ඉදි කිරීම |  |
| 08 | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මනම්පිටිය ප්‍රාදේශීය රෝහලේ සංවර්ධන කටයුතු | මනම්පිටිය ප්‍රාදේශීය රෝහලේ විදුලි පද්ධතිය සවි කිරීම |  |

| අ.අ | ආයතනය | සංවර්ධන කාර්යය | |
|---|---|---|---|
| 09 | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය මූලික රෝහලේ සංවර්ධන කටයුතු | මැදිරිගිරිය මූලික රෝහලේ ළමා වාට්ටුව අළුත්වැඩියා කිරීම |  |
| 10 | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගල්අමුණ ප්‍රාදේශීය රෝහලේ සංවර්ධන කටයුතු | ගල්අමුණ ප්‍රාදේශීය රෝහලේ ට්‍රාන්ස්ෆෝමර් කාමරය ඉදිකිරීම |  |
| 11 | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පුලස්තිගම ප්‍රාදේශීය රෝහලේ සංවර්ධන කටයුතු | පුලස්තිගම ප්‍රාදේශීය රෝහලේ ඖෂධ ගබඩාව ඉදිකිරීම |  |
| 12 | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඕනෑගම ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය සංවර්ධන කටයුතු | ඕනෑගම ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය අළුත්වැඩියා කිරීම |  |

| අ.අ | ආයතනය | සංවර්ධන කාර්යය | |
|---|---|---|---|
| 13 | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දිවුලන්කඩවල ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකයේ මාතෘ හා ළමා සෞඛ්‍ය ඒකකයේ සංවර්ධන කටයුතු | දිවුලන්කඩවල ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකයේ මාතෘ හා ළමා සෞඛ්‍ය ඒකකය අළුත්වැඩියාකිරීම |  |
| 14 | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ පළමු අදියර ඉදිකිරීම |   |


## විදේශ ආධාර මත ක්‍රියාත්මක කරනලද සංවර්ධන ව්‍යාපෘති තුළින් ජනිත කළ ප්‍රතිලාභ විශ්ලේෂණය කිරීම

| අනු අංකය | ව්‍යාපෘතිය | ප්‍රගතිය | | | | ලැබුණු කෙටිකාලීන/ දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|
| | | වෙන්කළ (රු.මි.) | වැයකළ (රු.මි.) | භෞතික (%) | මූල්‍ය (%) | |
| 01 | සිවිල් ඉදිකිරීම් හා අළුත්වැඩියා | 141.91 | 91.86 | 64.72 | 90 | 1.බෝවන රෝග හා බෝ නොවන රෝග ව්‍යාප්තිය අවම කිරීම |
| | | 25.96 | 17.34 | 66 | 100 | |
| | | 20.12 | 1.56 | 0.81 | 65 | |
| | | 37.5 | 3.68 | 38.93 | 75 | |
| 02 | මිලදී ගැනීම් | 1.47 | 1.47 | 100 | 100 | 2.මාතෘ හා ළදරු මරණ අවම කිරීම |
| | | 13.34 | 6.31 | 50 | 50 | |
| | | 5.54 | | | 80 | |
| | | 76.34 | 3.46 | 0.45 | 60 | 3.සෞඛ්‍යමත් ප්‍රජාවක් බිහිකිරීම |
| 03 | ප්‍රජා පාදක වැඩසටහන් | 4 | 4 | 100 | 100 | |
| | | 10.95 | 3.83 | 35.15 | 70 | |
| එකතුව | | 337.13 | 133.51 | 39.60 | | |

2018 වර්ෂයේ උතුරු මැද පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ පළාත් සෞඛ්‍ය අංශය සංවර්ධනය උදෙසා රු.මි. 337.13ක් වෙන් කර තිබූ අතර ඉන් රු.මි. 133.51ක් පමණ වැය වූ අතර මූල්‍ය ප්‍රගතිය 39.60කි. ඒ අනුව සෞඛ්‍ය අංශයේ සංවර්ධනය උදෙසා හඳුනාගත් අත්‍යාවශ්‍ය සෞඛ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා දායක වීමත්, උසස් රෝගී ප්‍රතිකාර හා සත්කාරක සේවාවක් ලබාදීම සඳහා හඳුනාගත් ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීමත් ,කාර්ය මණ්ඩලය දැනුම කුසලතා හා ආකල්ප සංවර්ධනය සඳහා උසස් පුහුණුවක් ලබාදීමත් සිදු විය.ඒ තුළින් බෝවන රෝග හා බෝ නොවන රෝග ව්‍යාප්තිය අවම කිරීම , මාතෘ හා ළදරු මරණ අවම කිරීම හා සෞඛ්‍යමත් ප්‍රජාවක් බිහි කිරීමටත් අපේක්ෂා කරන ලදී.

## වෙනත් රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තුවලින්ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති - 2018

සෞඛ්‍ය අංශයේ ප්‍රවර්ධනය උදෙසා අත්‍යාවශ්‍යයෙන්ම ඉටු කළ යුතු යටිතල පහසුකම් දියුණු කිරීම හා පළාතේ වකුගඩු රෝගීන්ගේ රෝග පරීක්ෂාව කඩිනම් කිරීම සඳහා හා ක්ෂය රෝගීන් හඳුනා ගැනීම කඩිනම් කිරීම සඳහාත් ක්ෂය රෝගය පැතිර යාම අවම කිරීම සඳහාත් රුධිර පරීක්ෂාවන් කඩිනම් කිරීම සඳහාත් අත්‍යාවශ්‍ය වන්නා වූ රසායනාගාර පහසුකම් වැඩිදුයුණු කිරීමත් අත්‍යාවශ්‍ය උපකරණ මිල දී ගැනීමත් මෙ යටතේ සිදු විය. එසේම පළාතේ මානසික රෝගීන්ගේ ප්‍රතිකාර සේවාව හා උපදේශන සේවා ඉහළ නැංවීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත් සිදු විය. ඒ යටතේ කැකිරාව රෝහලේ මානසික සෞඛ්‍ය ඒකකය වැඩිදියුණු කිරීම සිදු විය. එසේම පදවිය කැබිතිගොල්ලෑව හා කැකිරාව යන රෝහල්වල දත්ත ක්‍රමවත්ව ගබඩා කර ගැනීම සඳහා අවශ්‍ය පහසුකම්ද සපයන ලදී.



## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

උතුරු මැද පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සඳහා 2018 වර්ෂයෙහි සිදුකරන ලද ආයෝජනයන් මගින් භෞතික සම්පත් මෙන්ම මානව සම්පත්හි ධාරිතා සංවර්ධනය ද සිදුකෙරුණි. එමෙන්ම ප්‍රජා මූලික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් වඩාත් සමීප වූ සමාන හා සමානුපාතික ලෙස පළාත් ප්‍රජාව වෙත සෞඛ්‍ය සේවාවන් ලබාදීමට හැකියාව ලැබුණි.තවද දුෂ්කර වූ අංශයන්හි මේවනවිට සිදුවෙමින් පවතින ශීඝ්‍ර භෞතික සංවර්ධනයන් සමගාමීව පළාත් සභාවේ මෙන්ම මධ්‍යම රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අරමුදල්ද යොදා ගනිමින් පළාත් ප්‍රජාවෙහි නීරෝගීභාවය තහවුරු කිරීම තුළින් සමස්ත දළ දේශීය නිෂ්පාදිතය ද උතුරු මැද පළාත මගින් ලබාදෙන දායකත්වය වැඩි කිරීමට හැකිවන ශ්‍රම බලකායක් සමාජගත කිරීම අරමුණු කරගෙන ඇත.

2018 වර්ෂයේ සමස්ත කාර්ය සාධනය ඇගයීමේදී මූලධන ප්‍රතිපාදනයන්ගේ උපයෝජනය 82%ක් වන අතර මෙය පිළිවෙළින් දේශීය අරමුදල් යොදාගැනීමේදී 66%ක් සහ විදේශ ණය ආධාර ව්‍යාපෘතීන්ට 95%ක් ලෙස දැක්විය හැක.

මාතෘ හා ළමා සෞඛ්‍ය අංශයන්ගේ ප්‍රවර්ධනයක් නිරීක්ෂණය වූ අතර ප්‍රජාව වෙත වඩාත් සමීප වූ සෞඛ්‍ය සේවාවන් ලබාදීමේදී ග්‍රාමීය සෞඛ්‍ය මධස්ථාන ස්ථාපිත කිරීම සමස්ත සෞඛ්‍ය ප්‍රවර්ධනයේ මූලික ගුණාංගයක් විය.

එමෙන්ම හදිසි ප්‍රතිකාර ඒකක ස්ථාපිත කිරීම සඳහා රෝහල් රසායනාගාර ස්ථාපිත කිරීම, තොරතුරු තාක්ෂණය සෞඛ්‍ය අංශයන්ගේ ප්‍රවර්ධනය සඳහා යොදාගැනීම කැපී පෙනෙන වර්ධනයක් සිදුවූ අංශයක් ලෙස හැඳින්විය හැක.

වාර්ෂිකව වෙන්වන ප්‍රතිපාදනයන් තුළ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී සමස්තයක් ලෙස ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීමේදී තාක්ෂණ මණ්ඩල සඳහා ගතවන කාලය ඉතා අසාමාන්‍ය ලෙස දීර්ඝ බවත් මීට ප්‍රධාන හේතුව ලෙස ප්‍රමාණවත් තාක්ෂණ මණ්ඩල ප්‍රමාණයක් නොතිබීමත් ආදි අභියෝග පැවතියද 2018 වර්ෂයේ කාර්ය සාධනය කරා ළඟා වීමට හැකි විය.

# 8.2.පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව

| අනුරාධපුර දිස්ත්‍රික්කය<br>ආයුර්වේද රෝහල් - 04 | පොළොන්නරුව දිස්ත්‍රික්කය<br>ආයුර්වේද රෝහල් - 05 |
|---|---|
| අනුරාධපුර | මින්නේරිය |
| තඹුත්තේගම | වැලිකන්ද |
| ගාලදිවුල්වැව | මනම්පිටිය |
| පදවිය | සිරිපුර |
| | ඇලහැර |

මධ්‍යම බෙහෙත් ශාලා - 30

| අනුරාධපුර දිස්ත්‍රික්කය - 21 | පොළොන්නරුව දිස්ත්‍රික්කය - 09 |
|---|---|
| නොච්චියාගම | තමන්කඩුව |
| පලුගස්වැව | දියසෙන්පුර |
| ගල්නෑව | මැදිරිගිරිය |
| තලාව | අරලගංවිල |
| මිහින්තලය | අත්තනකඩවල |
| කැකිරාව | ගල් අමුණ |
| රාජාංගනය | ලංකාපුර |
| රඹෑව | නවසේනපුර |
| මැදවච්චිය | ජයසිරිපුර |
| ඉපලෝගම | |
| ඇඳගල | |
| තිරප්පනේ | |
| කැබිතිගොල්ලෑව | |
| තන්තිරිමලේ | |
| හොරොව්පොතාන | |
| ගලෙන්බිඳුණුවැව | |
| කහටගස්දිගිලිය | |
| නාච්චාදූව | |
| පලාගල | |
| විලච්චිය | |

ආයුර්වේද ආයතන ජාලය

- පාරම්පරික වෙදහල -01
  පුලතිසි වෙද මැදුර
- පංචකර්ම මධ්‍යස්ථාන - 01
  මින්නේරිය පංචකර්ම මධ්‍යස්ථානය
- ඖෂධ නිෂ්පාදනාගාර 01
  තෙල්හිරියාව -තඹුත්තේගම
- ආයුර්වේද මධ්‍යස්ථාන 04
  1.බන්ධනාගාරය අනුරාධපුර
  2.ක්‍රීඩා වෛද්‍ය ඒකකය
  3.රජරට විශ්වවිද්‍යාලය
  4.සාලියපුර වැඩිහිටි නිවාසය

ආයුර්වේද රෝහල්

| වර්ගය | අ/පුර | පො/ නරුව | එකතුව |
|---|---|---|---|
| පළාත් රෝහල් | 01 | - | 01 |
| මූලික රෝහල් | - | 01 | 01 |
| ග්‍රාමීය රෝහල් | 03 | 04 | 07 |
| මධ්‍යම බෙහෙත් ශාලා | 21 | 09 | 30 |
| ආයුර්වේද මධ්‍යස්ථාන | 05 | - | 05 |
| ඖෂධ නිෂ්පාදනාගාර | 01 | - | 01 |
| **එකතුව** | **31** | **14** | **45** |

## ප්‍රතිකාර සේවා සැපයීම 2014-2016

| ප්‍රතිකාර ලබාගත් රෝගීන් | අනුරාධපුර | | | පොළොන්නරුව | | | පළාත | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2016 | 2017 | 2018 | 2016 | 2017 | 2018 | 2016 | 2017 | 2018 |
| බාහිර රෝගීන් | ‘ | 126960 | 138954 | 133409 | 72734 | 103507 | 445366 | 199694 | 242461 |
| නේවාසික රෝගීන් | 2277 | 2013 | 1992 | 1741 | 1862 | 2391 | 4018 | 3875 | 4383 |
| සායන සඳහා පැමිණීම | - | 57988 | 61751 | - | 36945 | 50487 | - | 94933 | 112233 |
| ගෙවන වාට්ටුවේ නේවාසික රෝගීන් | - | 150 | 134 | - | - | - | - | 150 | 134 |
| එකතුව | **314234** | **187111** | **202831** | **135150** | **111541** | **156385** | **449384** | **298652** | **359211** |

### දැක්ම

“සෞඛ්‍යාදහමට අනුකූල වු නිරෝගිමත් ජනතාවක්, සමෘද්ධිමත් පළාතක් “

### මෙහෙවර

“ ආයුර්වේද දර්ශනය අර්ථවත් ලෙස උපයෝගී කර ගනිමින් රෝග නිවාරණ හා ප්‍රතිකාර හා පර්යේෂණ සේවා වැඩිදියුණු කිරීම, පාරම්පරික වෛද්‍ය ක්‍රමය හා ඖෂධීය ශාක වගාව සංරක්ෂණය, ප්‍රවර්ධනය සහ ඖෂධ නිෂ්පාදනය ඉහළ නැංවීම, විනිවිදභාවයෙන් හා ආයුර්වේද සේවාවේ හා අනෙකුත් පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් යුතුව ක්‍රියාවට නැංවීම.

### දිගුකාලීන අරමුණු

- ❖ ආයුර්වේද දර්ශනය තුළින් පළාත තුළ නිරෝගීමත් ජනතාවක් බිහි කිරීම.
- ❖ ආයුර්වේද ප්‍රතිකාර භාවිතයෙන් රෝග සුව කිරිම.
- ❖ ස්වභාවධර්මයට අනුකූලව අතුරු ආබාධවලින් තොර ප්‍රතිකාර පද්ධතියක් ඇති කිරීම.
- ❖ පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය කිරීම මඟින් නිරෝගීමත් ජනතාවක් බිහි කිරීම.
- ❖ ඖෂධ වගාව කිරීම තුළින් ඖෂධ හිඟය මගහරවා ප්‍රමිතියෙන් යුත්

ගුණාත්මක ඖෂධ රෝගීන් වෙත ලබා දීම.

- ❖ ස්වභාවධර්මය සුරැකීම.

## කෙටි කාලීන අරමුණු

- ❖ ආයුර්වේද දර්ශනය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.
- ❖ ආයුර්වේද ජීවන දර්ශනයට ජනතාව හුරු පුරුදු කිරීම.
- ❖ අතුරු ආබාධවලින් තොරව නිට්ටාවටම රෝග සුව කිරීම.
- ❖ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම මධ්‍යම බෙහෙත් ශාලාවක් ඇති කිරීම.
- ❖ පාරම්පරික වෛද්‍යවරුන් සංරක්ෂණ සභාව වෙත යොමු කර ඔවුන්ගේ දත්ත ලේඛණගත කිරීම.
- ❖ ඔසු උයන් දහයක් පළාත තුළ ඇති කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- ❖ රෝග නිවාරණ සත්කාර සංවර්ධනය.
- ❖ රෝගී ප්‍රතිකාර සේවාව සංවර්ධනය.
- ❖ පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය සහ ප්‍රවර්ධනය.
- ❖ ඖෂධීය ශාක වගාව සහ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සංවර්ධනය.
- ❖ ආයතනික ධාරිතා සංවර්ධනය.
- ❖ යහපාලන කටයුතු සංවර්ධනය.

## ප්‍රධාන උපාය මාර්ගයන්

### 01.රෝග නිවාරණ

ආදර්ශ ගම්මාන ඇති කිරිම, ප්‍රවර්ධන සමාජ ඇති කිරිම, පාසල් සෞඛ්‍යදාන ඒකක ඇති කිරිම, පෙර පාසල් පෝෂණ වැඩ සටහන් ඇති කිරිම, රාජ්‍ය ආයතන දැනුවත් කිරිම, ජංගම සායන පැවැත්විම.

### 02. රෝග ප්‍රතිකාර

සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකටම ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවක්, සෑම රෝහලකම ආයුර්වේද විවිධ සායන ආරම්භ කිරිම. සෑම රෝහලක්ම හා මධ්‍යම බෙහෙත් ශාලවකම බෝ නොවන රෝග සායන පැවැත්විම.

### 03. ඖෂධ

ඔසු ගොවින් ඇති කිරිම, පළාත් ඖෂධ නිශ්පාදනාගාරය වැඩි දියුණු කිරිම, රෝහල් ආශ්‍රිතව ඔසු උයන් 7 ක් අරම්භ කිරිම.

## තිරසර සංවර්ධන අරමුණු අංක 03
## යටතේ දක්වා ඇති නීරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සඳහා පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීම සඳහා භාවිතා කළ ප්‍රධාන කාර්යයන්.

පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය තුලින් එම වෛද්‍ය ක්‍රමය රැක ගැනිම.

3 GOOD HEALTH AND WELL-BEING

රෝග නිවාරණය සම්බන්ධයෙන් මැදිහත් වී උතුරු මැද පළාත තුල නිරෝගි ජනතාවක් ඇති කිරිම සඳහා ඉහළම දායකත්වය සැපයීම

රෝගී සත්කාර සේවය සංවර්ධනයෙන් ප්‍රතිකාර වල සාර්ථකත්වය ඉහල දමමින් සෞඛ්‍ය ක්ශේත්‍රය නගා සිටුවීම

ඖෂධ වගාව හා නිශ්පාදනය තුලින් ඖෂධ හිඟය අවම කර ප්‍රමිතියෙන් යුත් ඖෂධ රෝගීන්ට ලබාදිම

### කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අ.අ | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 647 |
| 2 | සේවයේ නියුතු | 482 |
| 3 | පුරප්පාඩු | 165 |
| 4 | අනියම් | 21 |

### පුනරාවර්තන වියදම් - 2018

| වියදම් ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි) | 2018 වියදම් ( රු.මි.) | ඉතිරිය ( රු.මි. ) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 270.00 | 266.00 | 4.00 | 98 |
| ගමන් වියදම් | 3.00 | 3.00 | 0.00 | 100 |
| සැපයිම් | 81.00 | 80.00 | 1.00 | 98 |
| නඩත්තු | 15.00 | 15.00 | 0.00 | 100 |
| ගිවිසුම්ගත සේවා | 25.00 | 25.00 | 0.00 | 100 |
| මාරු කිරිම් | 1.00 | 1.00 | 0.00 | 100 |
| **එකතුව** | 395.00 | 390.00 | 5.00 | 99 |

## පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම.

| අ.අ | ව්‍යාපෘතිය /වැඩ සටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපෙක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභින් ගණන |
|---|---|---|---|---|
| 01 | අංක 03 වෛද්‍ය නිල නිවසේ මුළුතැන්ගෙය හා ඇතුළත වැසිකිළි අළුත්වැඩියා කිරිම | ඉදිකිරිම | සනිපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම | 5 |
| 02 | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පළමු මහලේ කොටසක් බෙදා වෙන් කිරිම | ඉදිකිරිම | පහසුකම් වැඩිදියුණු කිරීම | 55 |
| 03 | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්යාල ගොඩනැගිල්ලේ විදුලි පරිපතය සකස් කිරිම | අළුත්වැඩියා කිරීම | ආරක්ෂාව වැඩිකිරිම | 100 |
| 04 | ගාලදිවුල්වැව ග්‍රාමීය ආයුර්වේද රෝහලේ ගේට්ටුව සවිකිරීම | සවි කිරීම | රෝහලේ ආරක්ෂාව | 15480 |
| 05 | ගාලදිවුල්වැව ග්‍රාමීය ආයුර්වේද රෝහලේ ජලනල පද්ධතිය නවිකරණය | අළුත්වැඩියා කිරීම | රෝගීන්ට පහසුකම් වැඩිකිරිම | 15480 |
| 06 | ගලෙන්බිදුනුවැව ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ වැට ඉදිකිරීම | ඉදිකිරිම | මධ්‍යම බෙහෙත් ශාලාවේ ආරක්ෂාව | 10467 |
| 07 | මිහින්තලය ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ වැට ඉදිකිරීම | ඉදිකිරිම | මධ්‍යම බෙහෙත් ශාලාවේ ආරක්ෂාව | 6879 |
| 08 | පළාත් ආයුර්වේද රෝහලේ රශායනාගාරය නවිකරණය | අළුත්වැඩියා කිරීම | පරික්ෂනාගාර පහසුකම් වැඩිදියුණු කිරිම | 116473 |

ඉතිරි කොටස...

| අනු අංකය | ව්‍යාපෘතිය /වැඩ සටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපෙක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 09 | C.C.T.V.කැමරා පද්ධතිය ස්ථාපිත කිරිම | සවි කිරීම | ආරක්ෂාව වැඩිකිරිම | 83052 |
| 10 | ඉපලෝගම ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව වටා වැටක් ඉදිකිරීම | ඉදිකිරිම | මධ්‍යම බෙහෙත් ශාලාවේ ආරක්ෂාව | 8781 |
| 11 | පදවිය ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ වැසිකිළි පද්ධතිය අළුත් වැඩියා කිරිම | අළුත්වැඩියා කිරීම | සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම | 34483 |
| 12 | විලච්චිය ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ නිමි ඖෂධ ගබඩාවේ රාක්ක සකස් කිරිම | සවි කිරීම | පහසුකම් වැඩිදියුණු කිරීම | 7578 |
| 13 | ඇලයාපත්තුව ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ නිමි ඖෂධ ගබඩාවේ රාක්ක සකස් කිරිම | සවි කිරීම | පහසුකම් වැඩිදියුණු කිරීම | 5975 |
| 14 | නොච්චියාගම ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ නිමි ඖෂධ ගබඩාවේ රාක්ක සකස් කිරිම | සවි කිරීම | පහසුකම් වැඩිදියුණු කිරීම | 7430 |
| 15 | නාච්චාදූව ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ නිමි ඖෂධ ගබඩාවේ රාක්ක සකස් කිරිම | සවි කිරීම | පහසුකම් වැඩිදියුණු කිරීම | 6478 |
| 16 | රාජාංගනය ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ නිමි ඖෂධ ගබඩාවේ රාක්ක සකස් කිරිම | සවි කිරීම | පහසුකම් වැඩිදියුණු කිරීම | 9400 |

| අනු අංකය | ව්‍යාපෘතිය /වැඩ සටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපෙක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභින් ගණන |
|---|---|---|---|---|
| 17 | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන ඒකකයේ ජංගම සායන කාමරයේ රාක්ක සකස් කිරිම | සවි කිරීම | පහසුකම් වැඩිදියුණු කිරීම | 112238 |
| 18 | මැදවච්චිය ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ නිමි ඖෂධ ගබඩාවේ රාක්ක සකස් කිරිම | සවි කිරීම | පහසුකම් වැඩිදියුණු කිරීම | 11885 |
| 19 | කැබිතිගොල්ලෑව ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ නිමි ඖෂධ ගබඩාවේ රාක්ක සකස් කිරිම | සවි කිරීම | පහසුකම් වැඩිදියුණු කිරීම | 13154 |
| 20 | හොරොව්පොතාන ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ නිමි ඖෂධ ගබඩාවේ රාක්ක සකස් කිරිම | සවි කිරීම | පහසුකම් වැඩිදියුණු කිරීම | 11502 |
| 21 | රඹෑව ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ නිමි ඖෂධ ගබඩාවේ රාක්ක සකස් කිරිම | සවි කිරීම | පහසුකම් වැඩිදියුණු කිරීම | 11189 |
| 22 | අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහලේ ලේඛනාගාරයේ රාක්ක සකස් කිරිම | සවි කිරීම | පහසුකම් වැඩිදියුණු කිරීම | 116473 |
| 23 | මිහින්තලය ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ නිමි ඖෂධ ගබඩාවේ රාක්ක සකස් කිරිම | සවි කිරීම | පහසුකම් වැඩිදියුණු කිරීම | 6879 |

## මුලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 72.20 | 66.80 | 5.40 | 93 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 9.40 | 9.40 | 0.00 | 100 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම හා උපකරණ | 4.10 | 4.10 | 0.00 | 100 |
| වෙනත් මුලධන වත්කම් පුනුරුත්ථපනය හා වැඩිදියුණු කිරීම | 31.80 | 29.00 | 2.80 | 91 |
| **එකතුව** | **117.50** | **109.30** | **8.20** | **93** |

## කාර්ය සාධන ඉලක්ක - 2018

| අ.අ | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 |
| 01 | ප්‍රතිකාර සේවාව සංවර්ධනය | ප්‍රතිකාර කිරීම (රෝගීන් ගණන) | 671,205 | 715,924 | 1,000,000 |
| 02 | රෝග නිවාරණ සේවාව සංවර්ධනය | දැනුවත් කිරීමේ වැඩ සටහන් පවැත්වීම (වැඩ සටහන් ගණන) | 58 | 117 | 250 |
| 03 | පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය සහ සංවර්ධනය | දිරි ගැන්වීම සඳහා ප්‍රතිලාභ ලබා දීම (වෛද්‍යවරුන් සංඛ්‍යාව) | 355 | 355 | 375 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනිම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යපෘතින්හි ප්‍රගතිය - 2018

| ප්‍රධාන අරමුණ | ඉටුකර ගැනිම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ (රු.මි.) | වැය කළ (රු.මි.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| 1.ප්‍රතිකාර සේවාව සංවර්ධනය | රෝහල්,ඖෂධ නිෂ්පාදනාගාර,නිල නිවාස සංවර්ධනය | ආයුර්වේද දර්ශනය තුලින් නිරෝගිමත් ජනතාවක් | 118 | 109 | 93 |
| 2.රෝග නිවාරණ සේවාව සංවර්ධනය | දැනුවත් කිරිමේ වැඩ සටහන් | බෝ නොවන රෝග පිටු දැකිම, දේශිය ආහාරයෙන් සුව ජිවයට අත්වැලක් | 3.4 | 3.3 | 97 |
| 3.පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය සහ ප්‍රවර්ධනය | පාරම්පරික සංරක්ෂණ ගොඩනැගිල්ලේ දේශිය ආහාර හා ඖෂධ අලෙවිසැල් ඉදිකිරිම | පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය කිරිම මගින් නිරෝගිමත් ජනතාවක් බිහිකිරිම | 10 | 8.8 | 88 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනිම සඳහා අධ්‍යාපන ඒකකය මගින් ක්‍රියාත්මක කරන ලද ප්‍රජා සෞඛ්‍ය වැඩසටහන් - 2018

***ආයුර්වේදයේ*** ප්‍රමුඛ පරමාර්ථය වන නිරෝගී පුද්ගලයන්ගේ නිරෝගී භාවය ආරක්ෂා කරගැනීම හෙවත් රෝග නිවාරණ සේවා ප්‍රචලිත කිරීමේ අරමුණෙන් ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය සේවය පිහිටුවා ඇත. උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 29 ම ආවරණය කරමින් වෛද්‍යවරුන් 62 දෙනෙක් 2018 වර්ෂයේ රාජකාරි ඉටු කරන ලදී.

පළාතට සුවිශේෂී වැදගත්කමක් සහිත සෞඛ්‍ය ගැටළු වලින් ජනතාව මුදවා ගැනීමේ මෙහෙයුමක් ලෙස මෙම ප්‍රජා සත්කාරක සේවා හැඳින්විය හැකිවේ.

## 01.ආදර්ශ ගම්මාන වැඩසටහන

රෝග නිවාරණ උපදෙස්, ආයුර්වේදීය ජීවන දර්ශනය පදනම් කරගත් දිවි පැවැත්ම සහ නිරෝගී බව පදනම් කරගත් සාම්ප්‍රදායික ජීවන රටාවෙන් සමන්විත ගම්මානයක් ප්‍රති නිර්මාණය කිරීම මෙහි අරමුණයි.

මෙම වැඩසටහන 2018 වර්ෂයේ සිට උතුරු මැද පළාත් සැළසුම් දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන අතර, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව ඇතුළු රාජ්‍ය ආයතන ගණනාවක් මීට බද්ධ වී ඇත.

## 02ආයුර්වේද ප්‍රවර්ධන වැඩසටහන

### ප්‍රවර්ධන සමාජ වැඩසටහන

සියළු ප්‍රජා සෞඛ්‍ය වෛද්‍යවරුන් ගේ අධීක්ෂණය යටතේ අදාල බල ප්‍රදේශ වල ආයුර්වේද හිතකාමී ජනතාව ඒකරාශී කරගත් සමාජ පිහිටුවා, ඔවුන් මගින් සියළු සමාජ ස්තර ආවරණය වන පරිදි රෝග නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කරයි. ඒ අනුව ප්‍රවර්ධන සමාජ හරහා

- ජංගම සායන
- බෝවන/නොවන රෝග නිවාරණ දැනුම්වත් කිරීම්
- ආයුර්වේද ජීවන දර්ශනය තුළ ජීවත් වීමට ජනතාව පෙළඹවීම්
- රෝහල් හා මධ්‍යම බෙහෙත් ශාලා වල ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහන්

ක්‍රියාත්මක විය.

### පාසැල් වැඩසටහන්

අනාගත පරපුරේ සෞඛ්‍ය සංරක්ෂණය උදෙසා පාසැල් දරුවන් පෙළගැස්වීම මෙහි අරමුණයි.

මේ යටතේ

- සෞඛ්‍යදාන ඒකක පිහිටුවීම හා පුහුණු කිරිම.
- රාජ්‍ය ආයතන ඒකාබද්ධ පාසැල් වැඩසටහන්.
- හෙට දිනන යෞවනය පාසැල් වැඩසටහන්

ක්‍රියාත්මක විය.

## 03. බෝ නොවන රෝග සායන

සෑම ප්‍රජා සෞඛ්‍ය වෛද්‍යවරයෙකුම බදාදා දින වකුගඩු රෝග, මධුමේහය, මේදෝවෘද්ධි (කොලෙස්ටරෝල්), අධි රුධිර පීඩනය හා මානසික රෝග පිළිබඳ උපදේශන හා ප්‍රතිකාර සායන ආයුර්වේද රෝහල් හා මධ්‍යම බෙහෙත් ශාලා තුළ පවත්වා ඇත.

## 04. පාරම්පරික වෛද්‍යවරුන් සංරක්ෂණය කිරීම

උතුරු මැද පළාතේ පාරම්පරික වෛද්‍යවරුන් සංරක්ෂණ සභා 28 කට අයත් වේ.


ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය වරුන් විසින් ද්වි මාසිකව ඔවුන්ගේ රැස්වීම් කැඳවා පාරම්පරික වෛද්‍යවරුන් සංරක්ෂණය කිරීම පිළිබඳව ඉදිරි කටයුතු සොයා බලා අවශ්‍යතාවයන් අනුව කටයුතු කර ඇත.

.

## 05.ප්‍රදර්ශන

වකුගඩු රෝගය ඇතුළු බෝ නොවන රෝග පාලන උපදෙස් සහිත ජාත්‍යන්තර, ජාතික, පළාත් හා ප්‍රාදේශීය ප්‍රදර්ශන ගණනාවක් ප්‍රජා සෞඛ්‍ය වෛද්‍යවරුන්ගේ මූලිකත්වයෙන් 2018 වසර තුළ පැවැත්විණ.

**ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනිම සඳහා දෙපාර්තමේන්තුවේ ඍජු මෙහෙයවීම මගින් ක්‍රියාත්මක අධ්‍යාපන වැඩසටහන්වලට සමගාමීව කරන ලද ප්‍රජා සෞඛ්‍ය වැඩසටහන් - 2018**




## 01.සුබායු ප්‍රජා සත්කාරක වැඩසටහන්

ප්‍රවර්ධන සමාජ සහභාගීකරගෙන සුවිශේෂී ප්‍රජා සත්කාරක සේවයක් ලෙස සුබායු වැඩසටහන 2018 වර්ෂයේදී අරඹන ලදී. මෙය පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් සංවිධානය කරයි.

මෙම එක්දින වැඩසටහන තුළ

- දැනුවත් කිරීම් දේශන
- ජංගම සායන
- ප්‍රදර්ශන කුටි
- උපදේශන සේවා ආදිය අන්තර්ගත විය.
- ජ්‍යොතිෂ්‍ය, රූපලාවන්‍ය සායන
- වෙනත්

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 29 තුළ වැඩසටහන් 29ක් ක්‍රියාත්මක කිරීමට සැළසුම් කළ අතර, 2018 වර්ෂය තුළ ඉන් 13ක් පැවැත්වීමට හැකි විය.

**සුබායු වැඩසටහන ප්‍රගතිය - 2018**

| වැඩසටහන | ප්‍රා.ලේ.කො. | ගම | සහභාගීත්වය |
|---|---|---|---|
| 1 | නැ.නු.ප. | වේලුවනගම | 202 |
| 2 | කැකිරාව | ශාස්ත්‍රවේල්ලිය | 265 |
| 3 | නොච්චියාගම | හොරුවිල | 298 |
| 4 | රඹෑව | අඹගහවැව | 195 |
| 5 | ගලෙන්බිඳුනුවැව | හුරුළුනිකවැව | 255 |
| 6 | තිරප්පනේ | කුට්ටිකුලම | 245 |
| 7 | හොරොව්පතාන | පරංගියාවාඩිය | 225 |
| 8 | තඹුත්තේගම | මකුලෑව | 210 |
| 9 | තලාව | හිරිගොල්ලේගම | 191 |
| 10 | රාජාංගනය | යාය - 07 | 277 |
| 11 | මහවිලච්චිය | යාය - 03 | 180 |
| 12 | මිහින්තලේ | මහකනදරාව | 171 |
| 13 | කැබිතිගොල්ලෑව | වාහල්කඩ | 211 |

## 02.හෙට දිනන යෞවනය වැඩසටහන

හෙට දිනන යෞවනය පාසැල් වැඩසටහන 2017 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර එම වර්සයේදී වැඩසටහන් 06ක් පවත්වන ලදී. 2018 වර්ෂයේදී මෙම වැඩසටහන යටතේ මත්ද්‍රව්‍ය පිටුදැකීමේ අවශ්‍යතාවය, විධිමත් ලිංගික අධ්‍යාපනය, සමාජ රෝග වැළැක්වීම, අඩු වයස් විවාහ පිටුදැකීම වැනි මාතෘකාවන් අරමුණුකර ගනිමින් රඹෑව මහ විදුහල, නාච්චාදූව සිංහල මහ විදුහල, නොච්චියාගම විද්‍යාර්ථ විදුහල, මහවිලච්චිය සිද්ධාර්ථ මහ විදුහල, පදවිය අලිවංගුව මහ විදුහල, අනුරාධපුර මධ්‍ය විද්‍යාලය, නොච්චියාගම විද්‍යාදර්ශ මහ විදුහල හා අරලගංවිල විලයාය මහ විදුහල ඇතුළත්ව පාසල් 08කදී වැඩසටහන් පවත්වන ලදී.

මත්ද්‍රව්‍ය මගින් සිදුවන කායික, මානසික, සමාජයීය හා අධ්‍යාත්මික බලපෑම්, පවුලේ ආර්ථිකයට, රටක සංවර්ධනයට හා අධ්‍යාපනයට සිදුවන අහිතකර බලපෑම්, මත්ද්‍රව්‍ය භාවිතයට එරෙහි වීමේ කුසලතා වර්ධනය පිළිබඳ සාකච්ඡා කරන ලදී.

ප්‍රජනන පද්ධතිය හා ක්‍රියාකාරීත්වය හා නව යොවුන් වියේ හෝර්මෝන වෙනස්වීම් මගින් පහළවන අවදානම් හැඟීම්, ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග , නව යොවුන් වියේ ගැබ් ගැනීම් නිසා ඇතිවන අවදානම් තත්ව වන ජීවිත අවදානම, විකෘති දරු උපත්, ගබ්සා කිරීම්වල රුදුරු බව , සියළුම පවුල් සැලසුම් ක්‍රමවල පවතින අසාර්ථක බව, අකාලයේ මවක වීම නිසා ඇතිවන මානසික පීඩනය හා සමාජයෙන් කොන් වීම පිළිබඳ සාකච්ඡා කෙරේ.

## 03.ප්‍රවර්ධන සමාජ වැඩසටහන්

ප්‍රජා සෞඛ්‍ය වෛද්‍යවරුන් 51 දෙනෙකුගේ ප්‍රවර්ධන සමාජ අලුතින් ප්‍රතිසංවිධානය කරමින් ඒවායේ නිලවරණ පැවැත්වීමට 2018 වසරේදී හැකිවිය.අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22ක් හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 07ක් ආවරණය වන පරිදි පුද්ගලයින් 3660 දෙනෙකුගේ සහභාගීත්වයෙන් වාර්ෂික නිලවරණ බල ගැන්වීම සිදු කරන ලදී.

තවද ආයුර්වේද ප්‍රවර්ධන සමාජ දායක කරගෙන පළාත තුළ වූ කොට්ඨාශ 29 තුළ විවිධ ප්‍රජා සත්කාරක වැඩසටහන් 2000කට ආසන්න ප්‍රමාණයක් ප්‍රජා සෞඛ්‍ය වෛද්‍යවරුන් විසින් 2018 වසර තුළ පවත්වා තිබේ.

| මාතෘකාව | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභී සංඛ්‍යාව |
|---|---|---|
| පොදු | 660 | 11095 |
| NCD | 520 | 13671 |
| CD | 18 | 271 |
| ආහාර හා පෝෂණ | 148 | 3508 |
| දින චර්යා | 23 | 543 |
| ජීවන දර්ශනය | 31 | 844 |
| කෘතිම රසකාරක | 65 | 3752 |
| දේශීය ආහාර | 125 | 3340 |
| තිරසර කෘෂිකර්මය | 7 | 122 |
| ජලය | 45 | 1498 |
| අත් බෙහෙත් | 11 | 171 |
| ඔසුපැළ | 32 | 406 |
| ප්‍රථමාධාර | 7 | 230 |
| පූර්ව ළමාවිය පෝෂණය | 35 | 1170 |
| ගර්භණී පර්චර්යා | 13 | 312 |
| මානසික සුවතා | 85 | 1921 |
| ආකල්ප සංවර්ධනය | 14 | 484 |
| මත්ද්‍රව්‍ය නිවාරණය | 15 | 396 |
| යෝග | 1 | 10 |
| ජංගම සායන | 124 | 8365 |
| **එකතුව** | **1979** | **52109** |







## 04.දේශීය ආහාර වැඩසටහන

මෙම වැඩසටහන ආදර්ශ ගම්මාන වැඩසටහනට සමගාමීව දෙපාර්තමේන්තුවේ මෙහෙයවීමෙන් සිදු කෙරෙන ප්‍රජා සත්කාරක වැඩසටහනකි. මෙමගින් පාරම්පරික ආහාර රටාවේ වැදගත්කම, වැළලීගිය පෝෂ්‍යදායී ආහාර පාන හා ඒවායේ වැදගත්කම පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ද ඇතුළත්ව දැනුම් සම්භාරයක් ආදර්ශ ගම්මානවල ජනතාව වෙත ලබා දීම සිදු කරන ලදී.

2018 වසර තුළ මිහින්තලේ,තඹුත්තේගම,කහටගස්දිගිලිය,නැ.නු.ප.,ම.නු.ප.,රඹෑව,තලාව,මැදවච්චිය හා රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කරමින් මහකනදරාව - යාය 1, මුදුන්ගොඩ, අඹගහවැව,තම්මැන්නාකුලම,මහපාලාඩිකුලම,වන්නියම්කුලම,පහලගම,මහවැව,කුඹුක්වැව,ඉහළ හල්මිල්ලෑව,අගුනොච්චිය,ලේනදිවුල්වැව ,අංගමුව - යාය 8 හා යාය 13,14 යන ආදර්ශ ගම්මාන 14 තුළ මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය. | ආදර්ශ ගම්මානයේ නම |
|---|---|
| මිහින්තලේ | මහකනදරාව - යාය 1 |
| තඹුත්තේගම | මුදුන්ගොඩ |
| කහටගස්දිගිලිය | අඹගහවැව |
| නැ.නු.ප. | තම්මැන්නාකුලම |
| | මහපාලාඩිකුලම |
| | වන්නියම්කුලම |
| ම.නු.ප. | පහලගම |
| රඹෑව | මහවැව |
| තලාව | කුඹුක්වැව |
| | ඉහළ හල්මිල්ලෑව |
| මැදවච්චිය | අගුනොච්චිය |
| | ලේනදිවුල්වැව |
| රාජාංගනය | අංගමුව - යාය 8 |
| | යාය 13,14 |







## පළාත් සැළසුම් දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව ආදර්ශ ගම්මාන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම - 2018

පළාත් සැලසුම් දෙපාර්තමේන්තුව සමග සිදුකළ සාකච්ඡා වට ගණනාවකින් අනතුරුව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වැඩසටහන් 2018 මැයි මස සිට අරඹන ලදී. ගම්මාන 56ක් 2018 වසරේ ආරම්භ කිරීමට හැකිවිය.

## ඒකාබද්ධව ආදර්ශ ගම්මාන වැඩසටහනේ ක්‍රියාකාරකම් - 2018

මෙම වැඩසටහන යටතේ දින චර්යාව, NCD, කුළු බඩු, ගෙවතු වගා, අත් බෙහෙත්, පෝෂණය, මානසික සුවතා, සායන හා වෙනත් වැඩසටහන් 503ක් පවත්වන ලදී. මේ සඳහා 8085ක් සහභාගී වී ඇත.

| වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගීත්වය |
|---|---|---|
| දින චර්යාව | 116 | 1581 |
| NCD | 53 | 924 |
| කුළු බඩු | 9 | 146 |
| ගෙවතු වගා | 82 | 1425 |
| අත් බෙහෙත් | 25 | 431 |
| පෝෂණය | 31 | 672 |
| මානසික සුවතා | 2 | 37 |
| සායන | 3 | 185 |
| වෙනත් | 182 | 2684 |
| **එකතුව** | **503** | **8085** |



මීට අමතරව බෝ නොවන රෝග සායන වැඩසටහන යටතේ ප්‍රජා සෞඛ්‍ය වෛද්‍යවරුන් විසින් 2018 වර්ෂය තුළ උතුරු මැද පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණයවන පරිදි ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථාන තුළදී රෝගීන් 1600කට අධික ප්‍රමාණයක් සහභාගී කරගෙන සායන පවත්වා ඇත. මේ සඳහා යෝග,කටු චිකිත්සාව, සංගීත චිකිත්සාව ආදි නිරෞෂධ ප්‍රතිකාර ක්‍රමද අනුගමනය කරන ලදී.

පාසැල් "ආයුර්වේද සෞඛ්‍යදාන ඒකක" පිහිටුවීම පාසැල් වැඩසටහන යටතේ සිදු කරන ලදී. උතුරු මැද පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි ආයුර්වේද සෞඛ්‍යදාන ඒකක 234ක් පිහිටුවන ලද අතර එම ඒකක මගින් වැඩසටහන් 872ක් සිදු කරන ලදී.

ආයුර්වේද සෞඛ්‍යදාන ඒකක" පිහිටුවීමේ මූලික අරමුණ වූයේ ආයුර්වේද ජීවන දර්ශනය හා සංකල්ප භාවිතා කරමින් කායික, මානසික, සමාජයීය හා අධ්‍යාත්මික නිරෝගී දරු පරපුරක ආදර්ශයක් නිර්මාණය කරමින් සෙසු ශිෂ්‍ය ප්‍රජාව වෙත එම ආකල්ප සම්ප්‍රේෂණය කිරීමයි.

මෙහිදී ආයුර්වේද දින චර්යාව,බෝ නොවන රෝග පිළිබඳ දැනුම හා නිවාරණ උපදෙස්,නිවැරදි ආහාර පාන රටාව ,අහිතකර ආහාර පරිභෝජනයෙන් මිදීම, අත් බෙහෙත්, ඖෂධ පැළ හා ප්‍රථමාධාර පිළිබඳ දැනුම, යෝග අභ්‍යාස , නිවැරදි ඉරියව් පවත්වා ගැනීම, මත්ද්‍රව්‍ය නිවාරණයේ වැදගත්කම හා අධ්‍යාපනයට සුදුසු මානසික සෞඛ්‍ය තත්වයන් ගොඩනැගීම වැනි පුහුණු වීම් සිදු කරන ලදී.

උතුරු මැද පළාත් ආයුර්වේද ක්ෂේත්‍රයේ අනන්‍යතාවය හා කාලීන සෞඛ්‍ය ගැටළු පිළිබඳ දැනුම ප්‍රචලිත කිරීම පිණිස 2018 වර්ෂයේ අවස්ථා කිහිපයකදී ජාතික / ජාත්‍යන්තර ප්‍රදර්ශන කුටි නිර්මාණය කොට ඉදිරිපත් කිරීම ප්‍රජා සෞඛ්‍ය වෛද්‍යවරුන් විසින් සිදු කෙරිණ. ආයුර්වේද එක්ස්පෝ ජාත්‍යන්තර ප්‍රදර්ශනය (BMICH), රජරට විස්කම් - උතුරු මැද පළාත් ප්‍රදර්ශනය, නැගෙනහිර, පළාත් ICEIM ජාත්‍යන්තර ප්‍රදර්ශනය - ත්‍රිකුණාමලය, මධ්‍යම පළාත්,ජාත්‍යන්තර ප්‍රදර්ශනය - මහනුවර KCC, දකුණු පළාත් ජාත්‍යන්තර ප්‍රදර්ශනය - Ayurway Southern වැනි ප්‍රදර්ශන ප්‍රදර්ශන කුටි නිර්මාණය කොට ඉදිරිපත් කිරීම මෙහිදී සිදු විය.

## වෙනත් රේඛීය අමාත්‍යාංශ දෙපාර්තමේන්තු වලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අ. අ | ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | | ලැබුණු කෙටිකාලීන/ දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | භෞතික (%) | මූල්‍ය (%) | |
| 1 | ගෙවන වාට්ටු | පහසුකම් සහිතව නේවාසික ප්‍රතිකාර සේවාව ඇති කිරිම ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරිම. | 21.7 | 18.4 | 100 | 88 | විදේශිකයින්ට හා දේශිය මුදල් වැය කිරිමට හැකි අයට ප්‍රතිකාර කර එම මුදල් රජයට ලබා දිම. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය දෙස් විදෙස් වල ප්‍රචලිත කිරිම |
| 2 | නල ලිං | වියලි කාලයේදි ඖෂධ විනාශ නොවි පළාත තුල අඛණ්ඩව ඖෂධ උයන් පවත්වාගෙන යාමට හැකිවිම | 2.8 | 2.8 | 100 | 100 | ඖෂධ හිඟය අඩුවිම හා ඖෂධ හිඟය අඩුවිම. ස්වභාධර්මය සංරක්ෂණය. |

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය.

| අරමුණු | ඉලක්ක | | අපේක්ෂිත ප්‍රතිඵල | |
|---|---|---|---|---|
| | 2020 | 2021 | කෙටිකාලීන | දිගුකාලීන |
| ආයුර්වේද ප්‍රතිකාර ක්‍රම ප්‍රවර්ධනය | ග්‍රාමීය රෝහල් 10 දක්වා වැඩි කිරීම | ග්‍රාමීය රෝහල් 12 දක්වා වැඩි කිරීම | ග්‍රාමීය ජනතාවට නේවාසික පහසුකම් වැඩි කිරීම | ජනතාව ආයුර්වේද ප්‍රතිකාර කෙරෙහි නැඹුරුවීම |
| රෝග නිවාරණය ප්‍රවර්ධනය | බෝනොවන රෝග අවම කිරීම | බහුතර ජනතාව නිරෝගී සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බවට පත්කිරීම | ජනතාව නිරෝගී වීම | ජනතාවගේ ආර්ථිකය ඉහල නැවීම |
| ඖෂධ වගාව හා නිෂ්පාදනය වැඩි දියුණු කිරීම | ඖෂධ උයන් 15 වැඩි දියුණු කිරීම. පළාතට අවශ්‍ය ඖෂධ පළාත තුලම නිශ්පාදනය කර ගැනීම | ඖෂධ උයන් 20 ස්ථාපිත කිරීම. අතිරික්ත ඖෂධ අලෙවි කිරීම. | ඖෂධ හිඟයක් නොමතිවීම | ස්වභාධර්මය සුරකිම, ඖෂධ ගොවින්ට ස්වයං රැකියා බිහිවම |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

ලැබුණු ප්‍රතිපාදන වලට අනුව ඉහළ ඵලදායිතාවයක් ලබා ඇති බවට සහතික කළ හැක. එනම් පළාත තුළ මධ්‍යම බෙහෙත් ශාලා 30 න් 27 ක් අංග සම්පූර්ණ කර ඇත. එයින් 20 කට වැඩි සංඛ්‍යාවක් ඉඩම් ආරක්ෂිත වැටවල් ඉදි කර ඇත.

එමෙන්ම මධ්‍යම බෙහෙත් ශාලාවලට අවශ්‍ය සියළු ගෘහ උපකරණ ලබාදී ඇත. අනුරාධපුර රෝහලේ රාසායනාගාරයක් ඉදිකර එයට අවශ්‍ය සියළු උපකරණ, රසායනික ද්‍රව්‍ය ලබා දී ඇත. පළාත් නිෂ්පාදනාගායේ ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය ගොඩනැගිල්ල ඉදි කර ඇත. ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිළධාරින් සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ කට්ටල 5 ක් ලබා දී ඇත. මානව සම්පතෙහි දැනුම ඉහළ දැමීම සඳහා වෛද්‍යවරුන්ට පුහුණු වැඩසටහන් 6 ක්ද ඇතුළුව අනෙකුත් සෑම කාර්ය මණ්ඩල සමාජිකයින් සඳහා පුහුණු වැඩ සටහන් පවත්වා ඇත. පාරම්පරික වෛද්‍යවරුන් ඇඟයීම සඳහා පරිත්‍යාග උපකරණ මිලදී ගෙන ඇත. අනුරාධපුර පළාත් රෝහලේ සියළු පහසුකම් සහිතව ගෙවන කාමර සංකීර්ණය නිම කර ඇත. අනුරාධපුර පළාත් රෝහල ජාතික ඵලදායිතා තරගයෙන් 3 වන ස්ථානයත්, තඹුත්තේගම ග්‍රාමීය රෝහල සහ මැදවච්චිය මධ්‍යම බෙහෙත් ශාලාව කුසලතා සම්මානය ලබාගෙන ඇත. මේ අනුව 2018 ලැබූ මුදල් නිසි පරිදි කළමනාකරණය කර ආයුර්වේද සේවාව ඵලදායිතා ඉලක්ක සපුරාගෙන ඇති බව පෙන්වා දිය හැක.

-මෙය හිස්ව තබන ලද පිටුවකි-

# 8.3. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

## පරිපාලන ආයතන

| | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| පරිවාස කාර්යාල | 04 | 02 | 06 |
| උපදේශන මධ්‍යස්ථාන | 01 | - | 01 |
| ළමා රැඳවුම් මධ්‍යස්ථාන | 02 | - | 02 |
| සහතික කළ පාසල්(ගැහැණු) | 01 | - | 01 |
| භාර ගැනීමේ නිවාස | 01 | - | 01 |
| ළමා නිවාස | 06 | 04 | 10 |
| දිවා සුරැකුම් මධ්‍යස්ථාන | 04 | 02 | 06 |

**ළමා නිවාස - 15 (ළමුන් 495)**

## දෙපාර්තමේන්තු කළමණාකාරිත්වය යටතේ ක්‍රියාත්මක වන ළමා නිවාස

අනුරාධපුර

01. අභය ළමා නිවාසය
02. යෙහෙළිය උපදේශන මධ්‍යස්ථානය
03. මඩාටුගම සහතික කළ පාසල
04. කාන්තා ළමා රැඳවුම
05. පිරිමි ළමා රැඳවුම

## ස්වේච්ඡා සංවිධානවල කළමණාකාරිත්වය යටතේ ක්‍රියාත්මක වන ළමා නිවාස

| අනුරාධපුර | පොළොන්නරුව |
|---|---|
| අවන්ති දේවි ළමා නිවාසය | පැරකුම් බාලිකා ළමා නිවාසය |
| ප්‍රීති ළමා නිවාසය | බෝසත් බාලක ළමා නිවාසය |
| අශෝක බාලක ළමා නිවාසය | බෝසත් බාලිකා ළමා නිවාසය |
| සරණ සෙවණ ළමා නිවාසය | ශාන්ත ජෝශප් බාලිකා ළමා නිවාසය |
| මිත්‍ර ළමා නිවාසය | |
| SOS ගම්මානය | |

## දැක්ම

“නීතිගරුක ප්‍රජාවක්, සුරක්ෂිත ළමා පරපුරක්”.

## මෙහෙවර

“සමාජ විරෝධී ක්‍රියාවල යෙදෙන්නවුන්, විශෝධනය සහ ළමුන්ගේ සමස්ත අයිතීන් සුරකමින් සියලු පාර්ශවයන්ගේ මනා සහභාගීත්වයෙන් විනිවිදභාවයෙන් යුක්තව ක්‍රියාවට නැංවීම”.

## දිගුකාලීන අරමුණු

- යහපත් පුරවැසියන්ගෙන් සපිරි සමාජයක්.
- ඉහළ ගුණාත්මක ළමා සුභසාධනයක්.
- ගුණාත්මක සේවාවන් සපයන ආයතනයක්.
- සංහිදියාවෙන් යුත් කාර්යාලයක්.

## කෙටිකාලීන අරමුණු

- ළමා රැකවරණය හා සුභසාධනය ඉහළ යාම.
- වරදකරුවන් පුනරුත්ථාපනය (ළමා, වැඩිහිටි) ඉහළ යාම.
- ළමුන්ගේ සමස්ත අයිතීන් සුරැකීම වර්ධනය වීම.
- ළමා අපයෝජන හා අපචාර අවම වීම.
- ආයතනයේ සියලු කටයුතු හා කාර්ය සාධනය ඉහළ යාම.
- සේවක අභිප්‍රේරණය ඉහළ යාම.

## ප්‍රධාන කාර්යයන්

- සමාජ විරෝධී ක්‍රියාවල යෙදෙන්නවුන් විශෝධනය.
- ළමුන්ගේ සමස්ත අයිතීන් සුරැකීම.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහ පාලනය.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ආඥා පනත් ක්‍රියාවට නැංවීම.
- අණපනත් මඟින් ලබා දී ඇති බලාධිකාරය ක්‍රියාත්මක කිරීම.
- චක්‍රලේඛ හා වෙනත් නිවේදන ක්‍රියාවට නැංවීම.
- ප්‍රඥප්තිය හා අරමුදල් මඟින් ලබා දී ඇති බලාධිකාරිය ක්‍රියාත්මක කිරීම.
- මනා මහජන සම්බන්ධීකරණය.
- වෙනත් ආයතන සමඟ සුහදව හා මිත්‍රශීලීව කටයුතු කිරීම.
- ආචාර ධර්මයන් භාවිතා කිරීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු




3 නිරෝගී ජීවිත සහතික කර සැම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම

- ඉහළ ගුණාත්මක ළමා සුභසාධනයක්
- ළමා රැකවරණය හා සුභසාධනය ඉහළ යාම




4 පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමට අවස්ථාව සැලසීම

- සමාජ විරෝධී ක්‍රියාවල යෙදෙන්නවුන් විශෝධනය
- පරිවාසගත ළමුන් අධ්‍යාපනයට යොමු කිරීම
- පරිවාසගත ළමුන් වෘත්තීය අධ්‍යාපනයට යොමු කිරීම





5 ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියළු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම

- ළමුන්ගේ සමස්ත අයිතීන් සුරැකීම
- ළමා අපයෝජන හා අපචාර අවම කිරීම

## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 171 |
| 2 | සේවයේ නියුතු | 110 |
| 3 | පුරප්පාඩු | 59 |
| 4 | අනියම් | 02 |




## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| 1.පුද්ගල පඩිනඩි | 34.64 | 34.61 | 0.03 | 99 |
| 2.ගමන් වියදම් | 1.99 | 1.98 | 0.01 | 99 |
| 3.සැපයීම් | 10.70 | 10.67 | 0.03 | 99 |
| 4.නඩත්තු වියදම් | 1.93 | 1.91 | 0.02 | 99 |
| 5.ගිවිසුම්ගත සේවා | 5.88 | 5.67 | 0.21 | 96 |
| 6.මාරු කිරීම් | 15.82 | 15.19 | 0.63 | 96 |
| **එකතුව** | **70.96** | **70.04** | **0.93** | **98** |

## මූලධන වියදම් (පාළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන) - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම(රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 5.60 | 5.22 | 0.38 | 93 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 2.50 | 2.47 | 0.03 | 98 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම (ගොඩනැගිලි සහ ඉදිකිරීම) | 46.80 | 1.24 | 45.56 | 2.65 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම (වෙනත්) | 4.10 | 2.28 | 1.82 | 55.68 |
| ප්‍රාග්ධන මාරු කිරීම් | 3.00 | 1.64 | 1.36 | 54.5 |
| ආයෝජන | 6.50 | 5.82 | 0.68 | 89 |
| **එකතුව** | **68.50** | **18.67** | **49.83** | **27** |

## මූලධන (පළාත් සභා සංවර්ධන ප්‍රදාන) - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| වෙනත් මූලධන වියදම් (ආයෝජන) | 1.00 | 0.97 | 0.03 | 97 |

## පරිවාස අංශයේ කාර්ය සාධන ඉලක්ක සාධනයකර ගැනීම - 2018

| අ.අ | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක ළඟා වීම | | |
|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 |
| 01 | නීති ගරුක ප්‍රජාවක් නිර්මාණය කිරීම හා සුරක්ෂිත ළමා පරපුරක් බිහි කිරීම | දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණය | 40 | 45 | 50 |
| | | වෘත්තීය කුසලතා සංවර්ධන වැඩසටහන් ගණන | 10 | 10 | 10 |
| | | පරිවාසිකයින් සඳහා ලබා දුන් ස්වයං රැකියා ආධාර ප්‍රමාණය | 20 | 20 | 30 |
| | | සමාජගත කිරීම් ගණන ප්‍රමාණය | 10 | 15 | 20 |
| | | ළමා නිවාස සංවර්ධනය කිරීම් ප්‍රමාණය | 03 | 03 | 05 |
| | | සංවර්ධනය කරන ලද ළඳරු උයන් ගණන | - | 05 | 01 |
| | | නිවාස ආධාර ලබා දීම් ප්‍රමාණය | 10 | 15 | 20 |
| | | දරුවන්ගේ යහපත් ආකල්ප වර්ධනය කිරීම සඳහා කරන ලද වැඩ සටහන් ප්‍රමාණය | 10 | 10 | 12 |

## ප්‍රධාන අංශයන්හී කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින්හී ප්‍රගතිය

### 01.ළමා නිවාස සංවර්ධනය කිරීම.

පළාත් පරිවාසගත ළමුන්ගේ සමස්ත අයිතීන් සුරැකීම  වෙනුවෙන් හා ධාරිතා සංවර්ධන කටයුතු වෙනුවෙන් නව ඉදි කිරීම් , අලුත් වැඩියා කිරීම, දැනුවත් කිරීම්, ආධාර ලබා දීම්, පුහුණු කිරීම්,ආධාර ලබා දීම, දැනුවත් කිරීම හා අමතර ඉගැන්වීම්, සමාජ ගත කිරීම, මිලදී ගැනීම් යන අංශයන් සඳහා කරන ලද ආයෝජනය

| ව්‍යාපෘතිය | ප්‍රධාන ක්‍රියාකාරකම | වෙන් කළ මුදල (රු.මි) | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| අභය ළමා නිවාසය අලුත්වැඩියා කිරීම | අලුත්වැඩියා කිරීම | 2.8 | 100 | 100 |
| පිරිමි ළමා රැඳවුම අලුත්වැඩියා කිරීම | | 0.5 | 100 | 100 |
| කාන්තා ළමා රැඳවුම් නිවාසය අලුත්වැඩියා කිරීම | | 0.3 | 100 | 100 |
| අවන්ති දේවි ළමා නිවාසය අළුත්වැඩියා කිරීම | | 1.5 | 100 | 100 |
| මිත්‍ර ළමා නිවාසය අලුත්වැඩියා කිරීම | | 0.5 | 100 | 100 |
| ළදරු උයන් 05ක් සංවර්ධනය කිරීම | | 3.0 | 100 | 100 |
| කිරි කෙටුවැව සහතික කළ පාසල අලුත්වැඩියා කිරීම | | 1.6 | 100 | 75 |
| උප එකතුව | | 10.2 | | |
| අභය ළමා නිවාසයේ පල්දෝරු පද්ධතිය ඉදිකිරීම | නව ඉදි කිරීම | 0.2 | 100 | 100 |
| අනුරාධපුර පරිවාස කාර්යාලය ඉදිකිරීම | | 6.00 | 100 | 100 |
| කොමසාරිස් නිල නිවාසය ඉදිකිරීම | | 2.7 | 100 | 100 |
| පොළොන්නරුව පරිවාස කාර්යාලයේ වැට ඉදිකිරීම | | 1.5 | 100 | 100 |
| උප එකතුව | | 10.4 | | |
| පරිවාසකයින් පුනරුත්ථාපනය හා ස්වයං රැකියා ආධාර | දැනුවත් කිරීම්,ආධාර ලබා දීම්,පුහුණු කිරීම ආධාර ලබා දීම දැනුවත් කිරීම හා අමතර ඉගැන්වීම | 1.5 | 100 | 100 |
| නිවාසගත වීම අවම කිරීම සඳහා ස්වයං රැකියා ආධාර | | 1.0 | 100 | 100 |
| පාසල් ළමුන් දැනුවත් කිරීම | | 0.5 | 100 | 100 |
| නිවාසගත දරුවන්ගේ විෂයානුබද්ධ දැනුම වැඩි දියුණු කිරීම | | 1.5 | 100 | 100 |
| නිවාසගත දරුවන්ගේ වෘත්තීය කුසලතා සංවර්ධනය | | 2.0 | 100 | 100 |
| උප එකතුව | | 6.5 | | |

| ව්‍යාපෘතිය | ප්‍රධාන ක්‍රියාකාරකම | වෙන් කළ මුදල (රු.මි) | භෞතික ප්‍රගතිය (%) | ව්‍යාපෘතිය |
|---|---|---|---|---|
| ළමුන් සමාජගත කිරීම | සමාජගත කිරීම | 1.0 | 100 | 100 |
| | උප එකතුව | 1.0 | | |
| ළමා නිවාස සඳහා උපකරණ මිලට ගැනීම | මිලදී ගැනීම් | 4.4 | 100 | 100 |
| කාර්යාල උපකරණ මිලට ගැනීම | මිලදී ගැනීම් | 1.0 | 100 | 100 |
| පරිවාස නිළධාරින් සඳහා ලැප්ටොප් ලබා දීම | මිලදී ගැනීම් | 1.0 | 100 | 100 |
| ශ්‍රවණාගාරය සඳහා පුටු හා තිරරෙදි මිලට ගැනීම | මිලදී ගැනීම් | 0.5 | 100 | 100 |
| | උප එකතුව | 6.9 | | |
| | මුළු එකතුව | **35.00** | | |

## 02. දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

2018 වර්ෂය තුළ උතුරු මැද පළාතේ අධීක්ෂණභාරයේ පසුවූ දරුවන් නිසි මගට ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මේ තුළින් දරුවන්ගේ යහපත් ආකල්ප වර්ධනය කිරීම අපේක්ෂා කරන ලදී. ඒ යටතේ අධීක්ෂණ භාරයේ පසුවූ දරුවන් සඳහා පරිවාස කලාප ආවරණය වන පරිදි වැඩසටහන් නවයක් (09) පවත්වන ලදී.

තවද පාසල් දරුවන් ළමා අපචාරවලට පෙළඹීම අවම කිරීමටත් පළාත තුළ ළමා අපචාර අවම කිරීමත් අරමුණුකරගත් පාසල් දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. එසේම පාසැල් දරුවන් මත්ද්‍රව්‍ය භාවිතයට පෙළඹීම අවම කිරීම සඳහාත් මත් උවදුරෙන් දරුවන් ආරක්ෂාකර ගැනීම සඳහාත් පළාතේ පරිවාස කලාප ආවරණය වන පරිදි වැඩසටහන් විසි පහ (25)ක් පමණ ක්‍රියාත්මක කරන ලදී.

## 03.වෘත්තීය කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.

නිවාසගත දරුවන්ගේ වෘත්තීය දැනුම වැඩි කිරිම සඳහාවන වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ යටතේ පාවහන්, බෑග්, මැහුම්, රූපලාවන්‍ය, පරිගණක පාඨමාලා, අත්යන්ත්‍ර පේෂකර්ම පාඨමාලාවන් පවත්වන ලදී.

## 04. පරිවාසිකයින් සඳහා ස්වයං රැකියා ආධාර හා නිවාස ආධාර සැපයීම.

අනාථ මෙන්ම අත්හල, අසරණ, අනාරක්ෂිත හේතුන් පදනම් කරගෙන දරුවන් නිවාසගත කරන ලෙස දෙමව්පියන් ඉල්ලා සිටින අවස්ථාවලදී ළමා නිවාසයන්හී රැඳවිය හැකි දරුවන් ප්‍රමාණය ඉක්ම වී ඇති අවස්ථාවලදී මෙන්ම දරුවන් දෙමාපිය සහෝදර ආරක්ෂාව හා ආදරය සමග ජීවත්වීමට හා හැදී වැඩෙන්නට අවස්ථාව ලබා දීමේ අරමුණ ඇතිව මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවයි. මේ තුළින් ආර්ථික අපහසුතා ඇති අයට ස්වයං රැකියා ආධාර ලබා දෙන ලදී.

## 05. පරිවාසගත දරුවන් සමාජගත කිරීම.

නිවාසගත දරුවන් ඔවුන්ගේ ද්වීතීයික අධ්‍යාපනය අවසන්කර මෙන්ම වයස අවුරුදු දහඅට (18 ) සම්පූර්ණ වූ දරුවන් මහ සමාජය සමග සමාජගත කිරිම දෙපාර්තමේන්තුව සතු ප්‍රමුඛ වගකීමකි. එහිදි ඔවුන් නිසි වයස සම්පූර්ණ කිරීමෙන් පසු සුදුසු සහකරුවකු සමග විවාහ පත්කර දීම මේ යටතේ සිදු වේ. එසේම නිවාසගත ගැහුණු දරුවන් වැඩිවියට පත් වූ පසු අදාල චාරිත්‍ර වාරිත්‍ර ඉටු කිරීම ද මේ යටතේ සිදු වේ. ඒ අනුව අභය, යෙහෙළි, මඩාටුගම, අවන්ති, අශෝක, සරණ, මිත්‍ර, ප්‍රිති, බෝසත් බාලිකා, බෝසත් බාලක, පැරකුම් හා ශාන්ත ජෝසප් යන ළමා නිවාසවල දරුවන් 89 දෙනෙකු සමාජගත කරන ලදී.

## වෙනත් රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | | ලැබුණු කෙටිකාලීන/ දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|
| | | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | භෞතික (%) | මූල්‍ය (%) | |
| දරුවන් සුරකිමු ජතික වැඩ සටහන (ජනාධිපති ලේකම් කාර්යාලය ) අශෝක ළමා නිවාසය අලුත්වැඩියා කිරීම | ළමුන්ගේ සමස්ත අයිතීන් සුරැකීම | 4.18 | 3.13 | 100 | 74 | සුරක්ෂිත ළමා නිවාසයක් බිහිවීම |

දරුවන් සුරකිමු ජතික වැඩසටහන ජනාධිපති ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘතියක් වන අතර ඒ යටතේ උතුරු මැද පළාත් පරිවාස දෙපාර්තමේන්තුව යටතේ පවතින අනුරාධපුර අශෝක ළමා නිවාසයේ අත්‍යාවශ්‍යව පැවති වහලය ඉදිකිරීම සඳහා යොදවන ලදී.

## සමස්ත කාර්ය සාධනය පිළිබඳ අදහස

2018 වසරේ දෙපාර්තමේන්තුව පුනරාවර්තන වැය වෙනුවෙන් රු.මි. 70.96ක් වෙන් වූ අතර ඉන් රු.මි.90.04ක් වැය විය.ඉතිරි වූ ප්‍රතිපාදන රු.මි.0.93ක් වන අතර සමස්ත උපයෝජනය 98%ක් විය.

2018 වසරේ දෙපාර්තමේන්තුව වෙනුවෙන් ප්‍රාග්ධන වැය සඳහා වෙන් කළ ප්‍රතිපාදන රු.මි. 69.50ක් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වෙන් වී තිබූ අතර වර්ෂය තුළදී ඉන් රු.මි. 27.84ක් වැය කරන ලදී. එසේ වුවද රු.මි. 41.66ක් වර්ෂය තුළදී වැය නොවීය. එයට ප්‍රධාන හේතුව වූයේ වර්ෂය තුළදී සැලසුම් කළ මෙන්ම ඉලක්කගත කළ යෙහෙළි උපදේශන මධ්‍යස්ථානය හා මඩාටුගම සහතික කළ පාසල යන ව්‍යාපෘති දෙකෙහි ඉදි කිරීම් වඩාත් ඵලදායිව සිදු කිරීම සඳහා ඉදිරි වර්ෂයේදී නෙල්ලිකුලම ප්‍රදේශයේ තෝරාගත් ඉඩමක ළමා නිවාස සියල්ල එකම ඉඩමකට ගෙන යාමට සැලැස්මක් පවතින අතර ඒ සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත දැනුම්දී ඇති නිසාවෙන් ඒ සඳහා වෙන් කළ රු.මි.45.30ක ප්‍රතිපාදන ඉතිරි විය.

එසේ වුවද පරිවාසකයින් සඳහා විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමද ඔවුන්ගේ වෘත්තීය කුසලතා සංවර්ධනය උදෙසා වූ වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලදී. එසේම පරිවාසිකයින් සඳහා ලබා දුන් ස්වයං රැකියා සඳහා ආධාර ලබා දීම තුළින් ඔවුන් දිරි ගැන්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

තවද පරිවාසිකයින් සමාජගත කිරීම ද ළමා නිවාස සංවර්ධනය කිරීම, ළදරු උයන් සංවර්ධනය කිරීම, නිවාස ආධාර ලබා දීම, නිවාසගත දරුවන්ගේ වෘත්තීය කුසලතා ඉහළ නැංවීමේ වැඩසටහන් සිදු කිරීම, දරුවන්ගේ යහපත් ආකල්ප වර්ධනය කිරීම සඳහා කරන ලද වැඩසටහන් සඳහා 2018 වසරේ භෞතික, මානව හා මූල්‍ය සම්පත් ඉතා ඉහළ මට්ටමකින් උපයෝජනය වී ඇත. ඒ අනුව 2018 වර්ෂය සඳහා පරිවාස දෙපාර්තමේන්තුවට වෙන් වූ සම්පත් කාර්යක්ෂමව හා ඵලදායිව යොදා ගනිමින් උතුරු මැද පළාතේ පරිවාසික දරුවන් වෙනුවෙන් ඵලදායි ක්‍රියාමාර්ග ගැනීමට හැකි විය.

# 8.4. පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව

**ආයතනය පිළිබඳ මූලික තොරතුරු**

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ ප්‍රතිපාදනයන්ට අනුව 1988.05.12 වන දින උතුරු මැද පළාත් සභාව ස්ථාපිත කිරීමෙන් අනතුරුව 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ පැවරුණු විධි විධානයන්ට යටත්ව පළාත් සභාවට පැවරුණු සමාජ සේවා විෂයට අදාළ රාජකාරී ඉටු කිරීම සඳහා පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව ආරම්භ කර ඇත. මුලිකවම සාලියපුර රජයේ වැඩිහිටි නිවාසයේ කටයුතු මෙන්ම මහජනාධාර ගෙවීමෙන් ආරම්භ වන මෙම ආයතනයේ කටයුතු වර්තමානය වනවිට ඉතා පුළුල් පරාසයක් දක්වා ව්‍යාප්ත වී ඇත. උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යාලය අනුරාධපුරයේ පිහිටා ඇති අතර, ඒ යටතේ සෘජුව පාලනය වන ආයතන 05කි.

එනම් :-

I. සාලියපුර ශාන්ති සෙවන වැඩිහිටි නිවාසය.
II. බුල්නෑව සුපසන් විශ්‍රාමික වැඩිහිටි නිවාසය.
III. රුධිර කාණ්දුකරන වකුගඩු රෝගීන්ට නවාතැන් ලබාදීම සඳහා වූ සුවෝදය මධ්‍යස්ථානය.
IV. ගිරිතලේ අත්වැළ පුහුණු මධ්‍යස්ථානය.
V. ඔළුකරඳ ආබාධිතයන් සඳහා වූ රුකවරණ මධ්‍යස්ථානය

එසේම ප්‍රාදේශීයව කටයුතු කිරීම සඳහා සංවර්ධන සහකාර (සමාජ සේවා) නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 29 ම ආවරණය වන පරිදි යොදවා ඇත. තවද අන්තර් ආයතන අතර මනා සම්බන්ධීකරණයකින් කටයුතු කරන මෙම ආයතනය මධ්‍යම රජයේ සමාජ සේවා දෙපාර්තමේන්තුව, ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය, ආබාධ සහිත තැනැත්තන්ගේ මහ ලේකම් කාර්යාලය, සමාජ සේවා අමාත්‍යාංශය යන ආයතන සමඟ සමීපව කටයුතු කරනු ලබයි. එසේම දෙපාර්තමේන්තුවට අයත් නමුත් රාජ්‍ය නොවන ආයතන මඟින් පහත සඳහන් ආයතන පවත්වාගෙන යන අතර, එම ආයතන සඳහා යථායෝග්‍යාධාර හා වෙනත් මූල්‍ය හා මූල්‍ය නොවන ආධාර ලබාදීම සහ අධීක්ෂණය දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරේ.

I. සාලියපුර සතුටු ළමා නිවාසය
II. නොච්චියාගම බුද්ධි ඌණතා සහිත ළමුන්ගේ විශේෂ පුහුණු පාසල
III. ඇලගමුව ආබාධ සහිත ළමුන් සඳහා වෘත්තීය පුහුණු ආයතනය.
IV. සේවාගම විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ වෘත්තීය පුහුණු ආයතනය.
V. තලාව අක්ෂි ආබාධ සහිත කාන්තාවන්ගේ ආයතනය.

තවද රාජ්‍ය නොවන ආයතන හෝ පාලක මණ්ඩලයකින් පාලනය වන පහත ආයතනද දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක් කරන අතර, යථායෝග්‍යාධාරද ගෙවනු ලැබේ.

I. හිඟුරක්ගොඩ මිණිහිරි කාන්තා සුරැකුම් මධ්‍යස්ථානය.

II. අනුරාධපුර රියෙන්සි අලගියවන්න අඳ බිහිරි විදුහල.

III. පොළොන්නරුව පැරකුම් වැඩිහිටි නිවාසය.

**දෙපාර්තමේන්තුව සතු ආයතන**

| ආයතනය | අනුරධපුර | පොළොන්නරුව | උ.මැ.ප |
|---|---|---|---|
| වැඩිහිටි නිවාස | 01 | 01 | 02 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ පුහුණු පාසැල් | 03 | 01 | 04 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ රැකවරණ මධ්‍යස්ථාන | 01 | - | 01 |
| සංවර්ධන පුහුණු මධ්‍යස්ථාන | - | 01 | 01 |

**නේවාසික පහසුකම් ලබාදිය හැකි සංඛ්‍යාව පිළිබඳ තොරතුරු**

| ආයතනය | නේවාසික පහසුකම් දිය හැකි සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| **වැඩිහිඩි නිවාස** | | ගැහැණු | පිරිමි | එකතුව |
| ශාන්ති සෙවන වැඩිහිටි නිවාසය - සාලියපුර | 302 | 151 | 151 | 302 |
| සැදෑ සෙවන විශ්‍රාමික වැඩිහිටි නිවාසය - බුල්නෑව | 05 | 02 | 12 | 04 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ පුහුණු පාසැල් | | | | |
| සතුට ළමා නිවාසය - සාලියපුර | 30 | 28 | - | 28 |
| ඇලගමුව වෘත්තීය පුහුණු ආයතනය | 30 | 11 | 11 | 22 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ආයතනය - සේවාගම | 50 | - | 38 | 38 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ආයතනය - නොච්චියාගම | 25 | - | 13 | 13 |
| **අනෙකුත් ආයතන** | | | | |
| ඔළුකරඳ රැකවරණ මධ්‍යස්ථානය | - | - | - | - |
| අත්වැල සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය | 12 | - | - | - |

## ආධාර ගෙවීම් පිළිබඳ විස්තර

| විස්තරය | අනුරාධපුර | | පොළොන්නරුව | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2015 | 2016 | 2015 | 2016 |
| මහජන ආධාරලාභීන් | 23,750 | 23,338 | 4,876 | 28,626 | 28,626 | 27,958 |
| විශේෂ මහජනාධාර | 2,767 | 3,116 | 335 | 3,059 | 3,059 | 3,451 |
| රෝගාධාර | 1,688 | 419 | 113 | 2,306 | 2,306 | 532 |
| නිවුන්දරු ආධාර | 151 | 332 | 60 | 218 | 218 | 392 |
| විවිධ රෝග ආධාර | 3,322 | 2,949 | 168 | 3,520 | 3,520 | 3,117 |
| පූර්ණ ආබාධ ආධාර | 630 | 743 | 162 | 770 | 770 | 905 |
| පාසැල් ශිෂ්‍යාධාර | 3,507 | 4,286 | 1,172 | 4,598 | 4,598 | 5,458 |
| එකතුව | **35,815** | **35,183** | **6,630** | **43,086** | **43,086** | **41,813** |

## වැඩිහිටි ජනගහනය

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය | - | 2,650,000 |
| උතුරුමැද පළාතේ වැඩිහිටි ජනගහනය | - | 124,685 (4.7%) |
| අනුරාධපුර දිස්ත්‍රික්කය | - | 82,889 (3.13%) |
| පොළොන්නරුව දිස්ත්‍රික්කය | - | 41,796 (1.58%) |

## දැක්ම

"සමාජ රැකවරණය අවශ්‍ය වූවන්ට සුරක්ෂිත ජීවිතයක්"

## මෙහෙවර

"පළාතේ ජීවත්වන දිළිඳු, ආබාධ සහිත, වැන්දඹු භාවයට පත් සහ ව්‍යසනයන්ට ලක්වූ අසරණ ජනතාවට සාධාරණ ක්‍රමවේදයක් සමගින් ආධාර හා මග පෙන්වීම්, අවශ්‍ය සහන සහ රැකවරණය සලසමින් ,ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සහ සමාජයේ පිළිගත් පිරිසක් බවට පත් කිරීම.."

## දිගුකාලීන අරමුණු

- රෝගීබව, මහළුබව, ආබාධිතබව හෝ අනාථභාවය නිසා සමාජයීය වරප්‍රසාද අහිමි වූ පුද්ගලයින්ගේ සුභසාධනය තහවුරු කිරීම.
- වැඩිහිටි නිවාස හා රැකවරණය අහිමි විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා නිවාස පවත්වාගෙන යෑම හා නඩත්තු කිරීම.

❖ වැඩිහිටියන් වැඩිහිටි නිවාසවලට යොමු කිරීම අවමවන පරිදි ඔවුන් රැකබලා ගැනීමේ වගකීම අදාල පවුල්වලට සහ ප්‍රජාවට පැවරෙන අයුරින් ක්‍රියාමාර්ග හා ක්‍රමවේද හඳුනා ගැනීම.

❖ සමාජයීය වශයෙන් අවාසි සහගත පුද්ගලයින් සඳහා සාමාජයීය වටිනාකමක් ගොඩනැගීම.

❖ ආධ්‍යාත්මීය වශයෙන් සංවර්ධනය වූ සාරධර්ම සුරකින , රටේ සංවර්ධනාත්මක කටයුතු සඳහා දායක වන තරුණ ප්‍රජාවක් ගොඩනැගීම.

❖ යහආකල්ප සංවර්ධනය වූ ගුණාත්මක මහජන සම්බන්ධතාවයන් පවත්වාගනිමින් ඵලදායී හා කාර්යක්ෂම සේවා සපයන සේවකයින් බිහිකිරීම.

## කෙටි කාලීන අරමුණු

❖ දිළිඳු බවින් පීඩාවට පත් පුද්ගලයින් සඳහා ආධාර ලබා දීම තුළින් ජීවත් වීමට රුකුලක් වීම.

❖ ශාරීරික හා මානසික වශයෙන් ආබාධ සහිත වූවන්ගේ ආර්ථික තත්ත්වය නගා සිටුවීමට කටයුතු කිරීම හා රැකවරණය සැලසීම.

❖ රෝගී වීම මගින් අසරණ වූ පුද්ගලයින් සඳහා සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට උපකාර කිරීම.

❖ අසරණ වූ වැඩිහිටියන් සුරක්ෂිත කිරීම හා වැඩිහිටි සුභසාධනය ඉහළ නැංවීම.

❖ වැන්දඹු කාන්තා පවුල්වල සුභසාධනය හා ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීම.

❖ හදිසි ආපදාවන්ට ලක්වූවන්ට සහන සැලසීම.

❖ පළාත තුළ මත්ද්‍රව්‍ය නිවාරණය.

❖ අන්ත දුගී පවුල්වල දක්ෂ දරුවන්ගේ අධ්‍යාපන සංවර්ධනය.

## ප්‍රධාන කාර්යයන්

❖ රෝගීබව, මහළුබව, ආබාධිතබව හෝ අනාථභාවය නිසා සමාජයීය වරප්‍රසාද අහිමි වූ පුද්ගලයින්ගේ සුභසාධනය තහවුරු කිරීම.

❖ වැඩිහිටි නිවාස හා රැකවරණය අහිමි විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා නිවාස පවත්වාගෙන යෑම හා නඩත්තු කිරීම.

❖ වැඩිහිටියන් වැඩිහිටි නිවාසවලට යොමුකිරීම අවමවන පරිදි ඔවුන් රැකබලා ගැනීමේ වගකීම, අදාල පවුල්වලට සහ ප්‍රජාවට පැවරෙන අයුරින් ක්‍රියාමාර්ග හා ක්‍රමවේද හඳුනා ගැනීම.

❖ සමාජයීය වශයෙන් අවාසි සහගත පුද්ගලයින් සඳහා සමාජයීය වටිනාකමක් ගොඩනැගීම සඳහා සුදුසු ව්‍යාපෘති හඳුනා ගනිමින් ක්‍රියාත්මක කිරීම.

❖ විවිධ සමාජ විරෝධී ඇබ්බැහිවීම් නිසා පුද්ගලයාට,පවුලට සහ සමාජයට තර්ජනයක්ව සිටින පුද්ගලයින් තුළ ආධ්‍යාත්මික සංවර්ධනයක් ගොඩනැංවීම සඳහා ක්‍රියා කිරීම .

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආශ්‍රිත සියළුම ග්‍රාම නිලධාරි තුලාන්වල ජීවත්වන අඩු ආදායම්ලාභී, අන්ත අසරණ බවට පත්ව සිටින රෝගී පුද්ගලයින් සහ එම පවුල්, ආර්ථික හා වෙනත් හේතූන් මත විවිධ තර්ජනයන්ට, මානසික, කායික රැකවරණය අහිමිව සිටින වැඩිහිටි තැනැත්තන් පිළිබඳව, ආබාධ සහිත තත්ත්වය මත සාමාජයීය වරප්‍රසාද අහිමි වී සිටින පුද්ගලයින් පිළිබඳව දත්ත රැස් කරමින් එම පුද්ගල අවශ්‍යතාවයන් ඉටුකරලීම සඳහා සෘජු මැදිහත්වීම, අවශ්‍ය පරිදි මාසික සහනයන් සැලසීම සිදුකෙරේ.

- රැකවරණය අහිමිව විවිධ ස්ථානයන්වල අනාරක්ෂිතව සිටින සහ නිවෙස් තුළ අසරණව අනාරක්ෂිතව සිටින වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත තැනැත්තන් සඳහා රැකවරණය සපයමින් නිවාසගත කිරීමට හෝ පවුල තුළ මානසික, කායික ආරක්ෂාව සහිතව ජීවත්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ලබාදීමට මැදිහත් වේ.
- සමාජයීය වශයෙන් අවාසි සහගත පුද්ගලයින් සඳහා සාමාජයීය වටිනාකමක් ලබාදීම අරමුණු කරගනිමින් ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකරගැනීම සඳහා අවශ්‍ය කරන ආධාරක, උපකරණ ලබා දීම සිදු කෙරේ.
- එම පුද්ගලයින්ගේ සහ එම පවුල්වල ආර්ථික ගැටළු අවම කරමින් ජීවන උත්පාදනයන් සඳහා අවශ්‍ය දැනුම ලබාදීම සඳහා අවශ්‍ය පුහුණු සමඟ ස්වයං රැකියා අවස්ථා වෙත යොමු කරමින් එමගින් ආර්ථික වාසි ලබා ගැනීමට අවශ්‍ය මග පෙන්වීම සිදු කරනු ලැබේ.
- ස්වාමියා අහිමිවීම නිසා වැන්දඹුභාවයට හා අසරණභාවයට පත්වෙමින් තම දූ දරුවන් සමග ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධව වෙහෙසෙමින් ඔවුන්ගේ අධ්‍යාපනයන් සඳහා වෙහෙස වෙමින්, තම ආර්ථිකය ද ශක්තිමත් කරගැනීමට වෙර වීරිය දරන කාන්තාවන්ගේ අනාරක්ෂිත නිවාස සහ ආබාධිත, වැඩිහිටි තැනැත්තන්ගේ අනාරක්ෂිත නිවාස සකස් කරගැනීමට සුවසේ ජීවත්වීම සඳහා නිවාස ආධාර ලබාදීම ද උපාය මාර්ගයකි.


- ඉහතින් සඳහන් කරන ලද රෝගී පවුල්, වැන්දඹු සහ ආබාධ සහිත තත්ත්වයට පත්ව සිටින පවුල්වල මහත් දුෂ්කරතාවයෙන් යුතුව අධ්‍යාපනය ලබා දීමට වෙහෙසෙන මෙන්ම මහත් උනන්දුවෙන් අධ්‍යාපනය ලැබීමට වෙහෙසෙන දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සඳහා මාසිකව ශිෂ්‍යාධාර ලබාදෙමින් රටට ඵලදායී දරු පිරිසක් නිර්මාණය කිරීමට මැදිහත්වීම ද උපාය මාර්ගයකි.
- විවිධ ඇබ්බැහිවීම් සහ සමාජ විරෝධී පුද්ගලයින් කොට්ඨාශ මට්ටමින් හඳුනා ගනිමින් ඔවුන් සඳහා කඳවුරුගත නේවාසික වැඩසටහන් පවත්වා පසුවිපරම් කරමින් ඔවුන් යහමාර්ගයට ගැනීම සඳහා.

## අංශය සෘජුව හා වක්‍රව නියෝජනය කරන තිරසාර සංවර්ධන අරමුණු හා ක්‍රියාකාරකම්

| අංකය | තිරසර සංවර්ධන අරමුණ | අංකය | තිරසර සංවර්ධන අරමුණ |
|---|---|---|---|
| 1 NO POVERTY | සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම (1.1,1.3,1.4,1.5,1 අ) | 2 ZERO HUNGER | සාගින්න නැති කර,ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම(2.2.) |
| 4 QUALITY EDUCATION | පරිපූර්ණ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගනීමේ අවස්ථාව සැලසීම.(4.5,4 අ) | 6 CLEAN WATER AND SANITATION | සැමට ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනකරණය සහතික කිරීම(6.2) |
| 8 DECENT WORK AND ECONOMIC GROWTH | සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසාර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම(8.5,8.6) | 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE | සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසාර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම(9.අ) |

## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 173 |
| 2 | සේවයේ නියුතු | 117 |
| 3 | පුරප්පාඩු | 56 |
| 4 | කොන්ත්‍රාත් | 01 |




## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම් (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | 63.28 | 59.55 | 3.73 | 94 |
| ගමන් වියදම් | 3.10 | 2.85 | 0.26 | 91 |
| සැපයීම් | 3.65 | 3.16 | 0.49 | 87 |
| නඩත්තු වියදම් | 5.23 | 4.62 | 0.61 | 88 |
| ගිවිසුම්ගත සේවා | 10.13 | 8.65 | 1.47 | 85 |
| මාරු කිරීම් | 410.58 | 375.78 | 34.18 | 92 |
| **එකතුව** | 495.96 | 454.60 | 41.36 | 92 |

## පුනරාවර්තන වියදම් දරමින් සිදු කළ සංවර්ධන කටයුතු හා ක්‍රියාකාරකම්

| අ.අ | ව්‍යාපෘතිය/වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | අපේක්ෂිත ප්‍රතිඵලය | වැයකළ මුදල (රු.මි) |
|---|---|---|---|---|---|
| 01 | ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තුව | සාලියපුර වැඩිහිටි නිවාසයේ සුළු වෙනත් අලුත්වැඩියා කිරීම් | 370 | නේවාසිකයන්ගේ හා කාර්ය මණ්ඩලයේ පහසුකම් වැඩිදියුණු කිරීම | 1.07 |
| 02 | ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තුව | සාලියපුර වැඩිහිටි නිවාසයේ විදුලි අලුත් වැඩියා කිරීම් | 370 | නේවාසිකයන්ගේ හා කාර්ය මණ්ඩලයේ පහසුකම් වැඩිදියුණු කිරීම | 0.92 |
| 03 | ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තුව | නොච්චියාගම ආබාධිත වෘත්තීය පුහුණු ආයතනය නවීකරණය කිරීම | 14 | නේවාසිකයන්ගේ පහසුකම් වැඩිදියුණු කිරීම | 0.95 |
| | | **එකතුව** | **754** | | **2.94** |

## මූලධන වියදම් (පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන) - 2018

| වියදමේ ස්වභාවය | උප ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|---|
| සාලියපුර වැඩිහිටි නිවාසයේ නවීකරණය | සාලියපුර වැඩිහිටි නිවාසයේ වතුර ටැංකිය නවීකරණය | 1.39 | 1.39 | - | 100 |
| | සාලියපුර වැඩිහිටි නිවාසයේ කොරිඩෝව නවීකරණය | 1.97 | 1.97 | - | 100 |
| | සාලියපුර වැඩිහිටි නිවාසයේ වැසිකිළි පද්ධතිය නවීකරණය | 1.82 | 0.67 | 1.15 | 37 |
| | සාලියපුර වැඩිහිටි නිවාසයේ ගබඩා සංකීර්ණය නවීකරණය | 1.72 | 1.72 | - | 100 |
| බුල්නෑව වැඩිහිටි නිවාසයේ නවීකරණය | බුල්නෑව වැඩිහිටි නිවාසයේ නවීකරණය | 2.00 | 1.72 | 0.28 | 100 |
| වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන නවීකරණය | වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන නවීකරණය | 0.17 | 0.17 | - | 100 |
| ආබාධිත රැඳවුම් නිවාස හා වෘත්තීය පුහුණු නිවාස නවීකරණය | ආබාධිත රැඳවුම් නිවාස හා වෘත්තීය පුහුණු නිවාස නවීකරණය | 0.96 | 0.95 | - | 100 |
| කාර්යාල ගොඩනැගිල්ල හා නිල නිවාස අලුත්වැඩියාව | නිල නිවාස නවීකරණය | 4.85 | 2.96 | 1.88 | 69 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | 3.50 | 3.50 | - | 100 |

| වියදමේ ස්වභාවය | උප ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|---|
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | 1.00 | 0.65 | 0.35 | 65 |
| වැඩිහිටි නිවාස ගොඩනැගිලි ඉදිකිරීම් | සාලියපුර වැඩිහිටි නිවාසයේ වාට්ටුවක් ඉදිකිරීම | 8.00 | 4.44 | 3.55 | 56 |
| | සාලියපුර වැඩිහිටි නිවාසයේ මෘත දේහාගාරය ඉදිකිරීම | 2.00 | 1.91 | 0.09 | 82 |
| | සාලියපුර වැඩිහිටි නිවාසයේ ජල ටැංකිය වටා තාප්පයක් ඉදිකිරීම | 1.17 | 0.95 | 0.22 | 100 |
| | සාලියපුර වැඩිහිටි නිවාසයේ නිළ නිවාස වෙන් කරන දැල් ආවරණ සහිත වැටක් ඉදිකිරීම | 1.32 | 1.26 | 0.60 | 100 |
| කාර්යාල ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම | කාන්තා වැසිකිලිය ඉදිකිරීම | 1.25 | 1.19 | 0.06 | 100 |
| | බුදු මැදුරක් ඉදිකිරීම | 0.69 | 0.66 | 0.03 | 100 |
| | කාර්යාලයේ ඉදිරිපස භූමිය සකස් කිරීම | 0.97 | 0.58 | 0.39 | 60 |
| මිතුරු සෙවන අඩු ආදායම් ලාභී නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | මිතුරු සෙවන අඩු ආදායම් ලාභී නිවාස ඉදිකිරීම | 0.50 | 0.50 | - | 100 |
| ආබාධිත වෘත්තීය පුහුණු මධස්ථාන ගොඩනැගිලි ඉදිකිරීම් | සාලියපුර ආබාධිත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ වැට ඉදිකිරීම | 1.1 | 1.05 | 0.05 | 100 |
| ගිරිතලේ අත්වැල පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිලි ඉදිකිරීම | ගිරිතලේ පුහුණු මධ්‍යස්ථානයේ කෑම ශාලාව ඉදිකිරීම | 1.5 | 1.46 | 0.04 | 100 |

| වියදමේ ස්වභාවය | උප ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|---|
| වැට මායිම් නිරවුල් කිරීම | වැට මායිම් නිරවුල් කිරීම | 1.98 | 1.89 | 0.09 | 100 |
| වෙනත් | මාසික මහජනාධාර ජාලගත කිරීම | 0.3 | 0.29 | 0.01 | 100 |
| දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 0.4 | 0.35 | 0.05 | 100 |
| එකතුව | | 2.68 | 2.53 | 1.15 | - |

## පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG)- අවිච්ඡේද ව්‍යාපෘති


| වියදමේ ස්වභාවය | උප ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|---|
| වැඩිහිටි නිවාස නවීකරණය | වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන නවීකරණය | 0.93 | 0.93 | - | 100 |
| ආබාධිත රැඳවුම් නිවාස හා වෘත්තීය පුහුණු නිවාස නවීකරණය | ආබාධිත රැඳවුම් නිවාස හා වෘත්තීය පුහුණු නිවාස නවීකරණය | 3.04 | 3.04 | - | 100 |
| කාර්යාල ගොඩනැගිල්ල හා නිල නිවාස අලුත්වැඩියාව | කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියාව | 0.15 | 0.15 | - | 100 |
| කාර්යාල ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම | ආබාධ සහිත පුද්ගලයන් සඳහා වැසිකිළියක් ඉදිකිරීම | 0.58 | 0.58 | - | 100 |
| එකතුව | | 4.7 | 4.7 | - | - |

## පළාත් සභා සංවර්ධන ප්‍රදාන (PCDG) - අවිච්ඡේද ව්‍යාපෘති

| වියදමේ ස්වභාවය | උප ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|---|
| වැට මායිම් නිරවුල් කිරීම | වැට මායිම් නිරවුල් කිරීම | 0.72 | 0.72 | - | 100 |

## සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය - ප්‍රාග්ධන වැයවීම 2016 - 2018

| වර්ෂය | PSDG (රු.මි) | PCDG (රු.මි) | මුළු මුදල (රු.මි) |
|---|---|---|---|
| 2016 | 12.71 | 14.19 | 26.90 |
| 2017 | 13.43 | 0.5 | 13.93 |
| 2018 | 31.9 | 5.78 | 37.68 |



## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කරගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය - 2018 -

### 1.මාසික මහජනාධාර ගෙවීම

**මාසික මහජනාධාර ගෙවීම**

දිළිඳු බවින් පීඩාවට පත් පුද්ගලයින් සඳහා ආධාර ලබා දීම තුළින් ජීවත් වීමට රුකුලක් වීම, ශාරීරික හා මානසික වශයෙන් ආබාධ සහිත වූවන්ගේ ආර්ථික තත්ත්වය නගා සිටුවීමට කටයුතු කිරීම හා රැකවරණය සැලසීම, අන්ත දුගී පවුල්වල අධ්‍යාපනයට දක්ෂ දරුවන්ගේ අධ්‍යාපන සංවර්ධනය හා අන්ත දුගී වකුගඩු රෝගය නිසා මව/පියා අහිමි වූ පවුල්වල අධ්‍යාපනයට දක්ෂ දරුවන්ගේ අධ්‍යාපනය සංවර්ධනය අරමුණු කර ගනිමින් ප්‍රධාන ව්‍යාපෘති හත (07)ක් ක්‍රියාත්මක කරන ලදී. එම ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100%ක් කරා ළඟා විය හැකි විය.

**මාසික මහජනාධාර ගෙවීම - 2018**

| ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | වැයකළ මුදල (රු.මි) |
|---|---|---|
| මහජනාධාර ගෙවීම් | 31258 | 117.28 |
| විශේෂ මහජනාධාර ගෙවීම් | 4134 | 32.7 |
| නිවුන් දරු ආධාර | 231 | 4.57 |
| විශ්ව විද්‍යාල ශිෂ්‍යාධාර | 01 | 0.01 |
| පූර්ණ ආබාධිත ආධාර | 1624 | 29.13 |
| ශිෂ්‍යාධාර | 5905 | 44.58 |
| "සිසු දිරිය" | 124 | 3.47 |
| **එකතුව** | **43277** | **231.74** |



## මාසික රෝගාධාර ගෙවීම් හා වෙනත් ආධාර

රෝගීවීම මගින් අසරණ වූ පුද්ගලයින් සඳහා සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට උපකාර කිරීම, ශාරීරික හා මානසික වශයෙන් ආබාධ සහිත වූවන්ගේ ආර්ථික තත්ත්වය නගා සිටුවීමට කටයුතු කිරීම හා රැකවරණය සැලසීම යන අරමුණු ඉටුකර ගැනීම සඳහා රෝගාධාර ගෙවීම, විවිධ ශල්‍යකර්ම ආධාර ගෙවීම, වකුගඩු රෝගය නිසා රුධිරය මාරුකරනු ලබන රෝගී පුද්ගලයින්ගේ සුබ සාධන කටයුතු , ප්‍රා.ලේ නිර්දේශ අනුව ලැබෙන අයදුම්පත්‍ර ගෙවීම් මේ යටතේ සිදු කළ අතර එහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100%කි.

### මාසික රෝගාධාර ගෙවීම් හා වෙනත් ආධාර - 2018

| ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | වැයකළ මුදල (රු.මි) |
|---|---|---|
| පිළිකා ආධාර ගෙවීම | 2534 | 41.91 |
| තැලසීමියා ආධාර | 427 | 14.00 |
| ක්ෂය රෝග ආධාර | 111 | 3.00 |
| බරවා | 17 | 0.55 |
| ලාදුරු | 73 | 1.40 |
| ඇටමිදුළු බද්ධ කිරීම | 04 | 2.00 |
| වකුගඩු බද්ධ කිරීම | 09 | 0.42 |
| ශල්‍ය කර්ම | 15 | 0.75 |
| සුවෝදය වියදම් | 350 | 0.13 |
| ආහාර මුද්දර | 256 | 3.80 |
| ගමන් වියදම් | 157 | 4.30 |
| නිවාස ආධාර | 418 | 10.37 |
| ස්වයං රැකියා ආධාර | 911 | 10.94 |
| විස්තීරණ ආපදා | 04 | 0.07 |
| එකතුව | **5286** | **93.64** |





## 3.වැඩිහිටි තැනැත්තන් සඳහා සියළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි පවත්වන ලද විවිධ වැඩසටහන් - 2018

### වැඩිහිටි තැනැත්තන් සඳහා පවත්වන ලද විවිධ වැඩසටහන්

අසරණ වූ වැඩිහිටියන් , සුරක්ෂිත කිරීම හා වැඩිහිටි සුභ සාධනය ඉහළ නැංවීම මෙන්ම විවිධ පුහුණු වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. එසේම වැඩිහිටයන්ගේ විනෝදාත්මක වැඩසටහන්, සෞන්දර්යාත්මක හා සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු විය.





### වැඩිහිටි තැනැත්තන් සඳහා සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි පවත්වන ලද විවිධ වැඩසටහන් - 2018

| ප්‍රධන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | වැඩසටහන් ගණන | වැයකළ මුදල (රු.මි) |
|---|---|---|---|
| ශාන්ති සෙවන වැඩිහිටි නිවාසයේ නඩත්තු | 300 | 01 | 22.30 |
| බුල්නෑව වැඩිහිටි නිවාසයේ නඩත්තු | 12 | 01 | 0.57 |
| වැඩිහිටි නිවාස සඳහා වූ වැඩසටහන් (චාරිකා,උත්සව, අත්දැකීම් හුවමාරු,) | 360 | 06 | 0.23 |
| ජාත්‍යන්තර වැඩිහිටි දින සැමරුම් උත්සව | 15,000 | 65 | 1.21 |
| දැය නැගුපරපුරක නර්තන පෙළහර උත්සවය | 3000 | 01 | 3.04 |
| වැඩිහිටියන් සඳහා දැනුම හා ආකල්ප සංවර්ධන වැඩසටහන් | 413 | 04 | 0.09 |
| වැඩිහිටි සංවිධාන සඳහා බස්රථ වෙන්කිරීම් | 2745 | 61 | 0.82 |
| බලමණ්ඩල චාරිකා, සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම් | 5813 | 19 | 1.90 |
| වැඩිහිටි ආශිර්වාද පූජාව | 1500 | 01 | 1.00 |
| වැඩිහිටියන් සඳහා සංස්කෘතික වැඩසටහන් | 14610 | 30 | 1.17 |
| වැඩිහිටියන් සඳහා ආර්ථික සංවර්ධන වැඩසටහන් | 12 | 01 | 0.02 |
| වෙනත් විශේෂ ව්‍යාපෘති-වියැකෙන ගුණදම් පුබුදමු නැණසින් | 6089 | 11 | 0.24 |
| **එකතුව** | **49854** | **201** | **32.59** |

## 4.විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා පවත්වන ලද විවිධ වැඩසටහන් - 2018

විශේෂ අවශ්‍යතා සහිත

පුද්ගලයින් සඳහා පවත්වන

ලද විවිධ වැඩසටහන්

ශාරීරික හා මානසික වශයෙන් ආබාධ සහිත වූවන්ගේ කායික,මානසික, ආධ්‍යාත්මික සුවතාවය ආරක්ෂා කරමින් ආර්ථික තත්ත්වය නගා සිටුවීමට කටයුතු කිරීම හා රැකවරණය සැලසීම.

පුහුණු වැඩසටහන්, දැනුවත් කිරීමේ වැඩසටහන් ,විනෝදාත්මක වැඩසටහන්, සෞන්දර්යාත්මක හා සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

එම අරමුණු ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100% මට්ටම කරා 2018 වර්ෂයේදී ළඟා විය හැකි විය.

### විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා පවත්වන ලද විවිධ වැඩසටහන් - 2018

| ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | වැඩසටහන් ගණන | වැයකළ මුදල (රු.මි) |
|---|---|---|---|
| ඔළුකරද ආබාධිත රැඳවුම් මධ්‍යස්ථානය නඩත්තු වියදම් | - | 01 | 0.06 |
| නිවාසගත කිරීම් | 12 | 01 | - |
| ජාත්‍යන්තර ආබාධ සහිත දින සැමරුම් වැඩසටහන් | 1500 | 29 | 1.17 |
| වන්දනා චාරිකා | 600 | 13 | 0.62 |
| යථායෝග්‍යාධාර ලබාදීම් | 183 | 01 | 3.14 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා සංවිධාන කළ වැඩසටහන් වැඩසටහන් (සිහින ප්‍රභාෂ්වර) | 2000 | 01 | 3.31 |
| දිස්ත්‍රික් ආබාධිත සංවිධානය - අනුරාධපුර | 32 | 01 | 0.03 |
| දිස්ත්‍රික් ආබාධිත සංවිධානය- පොළොන්නරුව | 23 | 01 | 0.02 |
| **එකතුව** | **4350** | **48** | **8.35** |

## 5.ගෘහ මූලික කාන්තාවන් සඳහා පවත්වන ලද විවිධ වැඩසටහන් - 2018

### ගෘහ මූලික කාන්තාවන් සඳහා පවත්වන ලද විවිධ වැඩසටහන්

ස්වාමියා අහිමිවී විවිධ ආර්ථික හා සාමාජයීය අභියෝග හමුවේ ජීවන අර්බුදවලට ලක්වී සිටින කාන්තා පවුල්වල සුභසාධනය හා ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීම.
පුහුණු වැඩසටහන්,දැනුවත් කිරීමේවැඩසටහන්, විනෝදාත්මකවැඩසටහන්, සෞන්දර්යාත්මක හා සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
එම ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100%ක් කරා ළඟා විය හැකි විය.

### ගෘහ මූලික කාන්තාවන් සඳහා පවත්වන ලද විවිධ වැඩසටහන් - 2018

| ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | වැඩසටහන් ගණන | වැයකළ මුදල (රු.මි) |
|---|---|---|---|
| වන්දනා චාරිකා | 495 | 09 | 0.27 |
| දිස්ත්‍රික් ගෘහ මූලික කාන්තා සංවිධාන ආරම්භ කිරීම- අ/පුර | 120 | 01 | 0.03 |
| දිස්ත්‍රික් ගෘහ මූලික කාන්තා සංවිධාන ආරම්භ කිරීම- පොළොන්නරුව | 50 | 01 | 0.01 |
| **එකතුව** | **665** | **11** | **0.31** |

## 6.දුම්වැටි සහ මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා වූ වැඩසටහන් සහ වෙනත් විශේෂ වැඩසටහන් - 2018

### දුම්වැටි සහ මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා වූ වැඩසටහන් සහ වෙනත් විශේෂ වැඩසටහන්

උපතේ සිට හෝ අතර මගදී විවිධ ආබාධ සහිත තත්ත්වයනට පත්ව සිටින පුද්ගලයින් තුළ ගොඩනැගෙන්නා වූ අවාසි සහගත සිතුවිලි සහිත ප්‍රජාව සහ ස්වාමියා අහිමිවීම නිසා ජීවිතයේ අවාසනාව ගැන සිතමින් පසුතැවිලි වන්නා වූ කාන්තා ප්‍රජාව ඇතුළු සැමගේ කායික,මානසික,ආධ්‍යාත්මික ,සාමාජයීය වශයෙන් සුවතාවය ආරක්ෂා කිරීම
දුම්වැටි,මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම,පුනරුත්ථාපනය කිරීම සහ විවිධ සමාජ විරෝධී ක්‍රියාවන් අවම කරමින් සමාජ සාරධර්ම සුරකින ,පෞර්ෂ සංවර්ධනයෙන් යුක්ත තරුණ ප්‍රජාවක් ගොඩනැගීම,පුහුණු,දැනුවත් කිරීමේ වැඩසටහන් ,විනෝදාත්මක,සෞන්දර්යාත්මක හා සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.කඳවුරු ගත වැඩසටහන්,දැනුවත් කිරීමේ වැඩසටහන්,පාගමන් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම.

### දුම්වැටි සහ මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා වූ වැඩසටහන් සහ වෙනත් විශේෂ වැඩසටහන් - 2018

| ප්‍රධන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | වැඩසටහන් ගණන | වැයකළ මුදල (රු.මි) |
|---|---|---|---|
| දන මන පොබයන නැණස සහ වෙනත් වැඩසටහන් | 3290 | 18 | 1.06 |
| දිරියට අත්වැලක් සමග සමාජ සවිබල ගැන්වීමේ නේවාසික කඳවුර - අනුරාධපුර සහ පොළොන්නරුව | 285 | 02 | 0.92 |
| දිරියට අත්වැලක් සමග සමාජ සවිබල ගැන්වීමේ නේවාසික කඳවුරු පිළිබඳ පසුවිපරම් වැඩසටහන් - අනුරාධපුර සහ පොළොන්නරුව | 220 | 02 | 0.08 |
| **එකතුව** | **3795** | **22** | **2.06** |

## 7. ගුණාත්මක හා ඵලදායී රාජ්‍ය සේවාවක් මහජනයා වෙත ලබාදීම සඳහා නිලධාරි ධාරිතා සංවර්ධනය - 2018

### ගුණාත්මක හා ඵලදායී රාජ්‍ය සේවාවක් මහජනයා වෙත ලබාදීම සඳහා නිලධාරි ධාරිතා සංවර්ධනය

සාර්ථක, ඵලදායී, ගුණාත්මක හා කඩිනම් සේවාවක් ලබාදීම සඳහා ආකල්ප සංවර්ධනය,ධාරිතා සංවර්ධනය හා නිලධාරීන් තුළ තීරණ ගැනීමේ හැකියාව පෝෂණය කිරීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.
එම ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100%ක් කරා ළඟා විය හැකි විය.

ගුණාත්මක හා ඵලදායී රාජ්‍ය සේවාවක් මහජනයා වෙත ලබාදීමසඳහා නිලධාරි ධාරිතා සංවර්ධනය - 2018

| ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | වැඩසටහන් ගණන | වැයකළ මුදල (රු.මි) |
|---|---|---|---|
| සාලියපුර ශාන්ති සෙවන හා බුල්නෑව සැඳෑ සෙවන විශ්‍රාමික වැඩිහිටි නිවාස කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා සංවර්ධනය පුහුණු වැඩසටහන | 53 | 02 | 0.29 |
| සාලියපුර ශාන්ති සෙවන වැඩිහිටි නිවාසයේ පුස්තකාලය සඳහා පොත් මිලදී ගැනීම | 370 | 01 | 0.05 |
| ගිරිතලේ "අත්වැල" සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය හා අදාල වියදම් | 1000 | 01 | 0.23 |
| එකතුව | **1423** | **04** | **0.57** |

## 8. ආබාධිත උපකරණ ලබාදීම - 201

### ආබාධිත උපකරණ ලබාදීම - 2018

රෝගී බව, මහළු බව, ආබාධිත බව නිසා සමාජයීය වරප්‍රසාද අහිමි වූ පුද්ගලයින්ගේ සුභසාධනය තහවුරු කිරීම සහ සමාජානුයෝජනය කිරීම.
එම ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100%ක් කරා ළඟා විය හැකි විය.

ආබාධිත උපකරණ ලබාදීම - 2018

| ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | වැඩසටහන් ගණන | වැයකළමුදල (රු.මි) |
|---|---|---|---|
| රෝදපුටු | 288 | 01 | 3.38 |
| කොමඩ් රෝද පුටු | 202 | | 2.30 |
| වතුර මෙට්ට | 194 | | 1.40 |
| අත්වාරු | 264 | | 0.32 |
| අක්ෂිකාච | 464 | | 4.96 |
| වෝකර් | 154 | | 0.60 |
| කිහිලිකරු | 181 | | 0.31 |
| ශ්‍රවණ උපකරණ | 189 | | 4.13 |
| සුදු සැරයටි | 16 | | 0.01 |
| හැරමිටි | 68 | | 0.06 |
| ඇස් කන්නාඩි | 1732 | | 3.55 |
| වායු මෙට්ට | 65 | | 0.46 |
| ජංගම සේවා වැඩසටහන් | 2044 | 09 | 0.23 |
| එකතුව | **5861** | **10** | **21.71** |

## වෙනත් රේඛීය අමාත්‍යාංශ දෙපාර්තමේන්තුවලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති - 2018

**2018** සංවර්ධන වැඩසටහන තුළ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන රුපියල් මිලියන 40 ක් සහ පළාත් සභා සංවර්ධන ප්‍රදාන රුපියල් මිලියන 6 ක් ලෙස වෙන්වී තිබුණි. වෙන් වූ ප්‍රතිපාදන තුළින් 2017 වර්ෂයේ අවිච්ඡේද හා අතැති බිල් ලෙස ඉතිරි වී තිබූ ආබාධිත රැඳවූම් නිවාස හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන නවීකරණය සඳහා රුපියල් 3,040,000ක් ද, අතැති බිල් ලෙස, දිවා සුරකුම් මධ්‍යස්ථාන නවීකරණය සඳහා රුපියල් 927,183 ක් ද කාර්යාල ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම සඳහා රුපියල් 584,085.46, කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියාව වෙනුවෙන් රුපියල් 150,355.68 වැට මායිම් නිරවුල් කිරීම සඳහා රුපියල් 723,821.33 ක්ද බැගින් ද ලබා ගෙන 2017 වර්ෂයේ වැඩ නිම කරන ලදී. එමෙන්ම රුපියල් 495,957,000.00ක පුනරාවර්තන මුදල් මෙම දෙපාර්තමේන්තුව වෙනුවෙන් වෙන්ව තිබූ අතර එමගින් සංවර්ධන ව්‍යාපෘති රැසක් මෙම වර්ෂයේදී ඵලදායීව නිම කිරීමට හැකියාව ලැබුණි.

ඒ අතරින් විශේෂයෙන්ම මෙම වර්ෂයේ වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සහ ගෘහ මූලික කාන්තාවන් යන දෙපාර්තමේන්තුවේ සුවිශේෂී කණ්ඩායම් අන්තර්කරණය කරමින් අවුරුදු උත්සව ,දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි.ඒ තුළින් ඒ සෑම ප්‍රජා කණ්ඩායමකම සාමාජිකයින් සඳහා ගෞරවණීය බවක් අභිමානයක් සහ ජීවිතය ජීවත් කරවීමට සවියක් ලබා දෙන්නට මහඟු දායකත්වයක් ලබා දීමට හැකියාව ලැබුණි.

| ව්‍යාපෘතිය | මුදල (රු .මි) | ප්‍රගතිය(%) | |
|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය |
| වියපත්වීම පිළිබඳව බන්ධනාගාර රැඳවියන් සඳහා මනෝ උපදේශනය | 0.03 | 100 | 100 |
| දෙටු පුරවැසි ස්වං රැකියා නිෂ්පාදන ප්‍රදර්ශනය හා අලවිය | 0.02 | 100 | 100 |
| *හොඳම ප්‍රාදේශීය වැඩිහිටි බල මණ්ඩලය තේරීම, හොඳම වැඩිහිටි නිවාසය තේරීම,හොඳම වැඩිහිටි ව්‍යවසායකයා තේරීම,ජාතික වැඩිහිටි උත්සවයට වැඩිහිටියන් සහභාගී කරවීම | 0.05 | 100 | 100 |
| අත්දැකීම් හුවමාරු වැඩසටහන හා සංගීත චිකිත්සාමය වැඩසටහන | 0.02 | 100 | 100 |
| වැඩිහිටි දින සැමරුම | 0.03 | 100 | 100 |
| **එකතුව** | 0.15 | - | |

අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර ඉටුකරමින් අවුරුදු උත්සව පවත්වන්නට, වන්දනා චාරිකා සඳහා සහභාගී වන්නට ඔවුන් සැමට හැකියාව ලැබුණි. විශේෂයෙන්ම වැඩිහිටි චාරිකා සඳහා රේඛීය අමාත්‍යාංශයේ වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් ලබා දෙන ලද බස්රථය ද සුවිශේෂී වූ බව සඳහන් කරන්නේ මහත් වූ ගෞරවයෙනි.

මෙම වර්ෂයේ දෙපාර්තමේන්තු අරමුණු සාර්ථක කරමින් ඉහත සඳහන් කරන ලද අන්තර්කරණ සංකල්පය ද පෙරදැරි කරගනිමින් වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත සංවිධාන සහ ගෘහමූලික කාන්තා සංවිධාන යාවත්කාලීන කරන්නට ඔවුන්ගේ ආකල්ප සංවර්ධනය කරන්නට මූල්‍ය කළමණාකාරීත්වයකින් සංවිධාන ඉදිරියට පවත්වාගෙන යන්නට ආධ්‍යාත්මික වශයෙන් ජීවිතයේ වටිනාකම අවබෝධ කරලන්නට සහ සෞන්දර්යාත්මක රසාස්වාදනය තුළින් ජීවිතය විඳීමට, කුසලතා ප්‍රදර්ශනය කරමින් ජීවිතයේ සතුට අත්විඳින්නට අවස්ථා ගොඩනගමින් "දන මන පොබයන නැණස" වැඩසටහන් කොට්ඨාශ 18 ක් ද ,වැඩිහිටි ප්‍රජාව පිළිබඳ පාසැල් දරුවන්ගේ ආකල්ප සංවර්ධනය අරමුණු කරගනිමින් "වියැකෙන ගුණදම් පුබුදමු නැණසින්"වැඩසටහන් 11ක් කොට්ඨාශ 11ක ද ක්‍රියාත්මක කරන්නට හැකි විය.

මෙම වැඩසටහන් ඉතා සාර්ථක බවට ඇගයීමට ලක්වූ අතර, ඉදිරි වර්ෂවලදීත් එම වැඩසටහන් ග්‍රාමීය සංවිධාන වෙත රැගෙන එන ලෙස ඉල්ලීම් ද සිදුකර ඇත. තවද වැඩිහිටියන් කායික මෙන්ම මානසිකව සුවපත් කිරිම අරමුණු කරමින් දෙවු පුරවැසි ආශිර්වාද පූජා වැඩසටහන පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29යේම වැඩිහිටි බලමණ්ඩල සාමාජිකයන් 1500කගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී. ඒ තුළින් ඔවුන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනය මෙන්ම වැඩිහිටි බලමණ්ඩල සංවිධාන ශක්තිමත් වීමත් අපේක්ෂා කෙරේ.

අතිගරු ජනාධිපති තුමන්ගේ "මතට තිත "සංකල්පය ක්‍රියාත්මක කරමින් මත්ද්‍රව්‍ය හා දුම්වැටි සඳහා යොමුවූ පුද්ගලයින් උදෙසා පවත්වනු ලබන" දිරියට අත්වැලක් සමග සමාජ සවි බල ගැන්වීම වැඩසටහනෙහි පළමු කණ්ඩායම සඳහා වූ වැඩසටහන අනුරාධපුර දිස්ත්‍රික්කයේ ද , දෙවන කණ්ඩායම ලෙස පොළොන්නරුව දිස්ත්‍රික්කයේද, නේවාසික වැඩසටහන් 02 ක් ද, පළමු වැඩසටහනින් අනතුරුව පසුවිපරම් වැඩසටහන් ද පවත්වන ලදී.

මෙම වැඩසටහන් මගින් ජීවිතයේ විවිධ ඇබ්බැහිවීම් නිසා විනාශයට යමින් සිටින පවුල් රාශියක් සංවර්ධනය කරන්නට හැකියාව ලැබුණි. ඉදිරි වර්ෂවලදීත් මෙම වැඩසටහන් නව මුහුණුවරයන් ලබා දෙමින් දීර්ඝකාලීනව පවත්වාගෙන යාමට බලාපොරොත්තු වේ.

දෙපාර්තමේන්තුවෙහි මාසික ආධාර ලබමින් පෝෂණය වන කණ්ඩායම් අතර, විවිධ රෝගී පවුල් හඳුනාගත හැකිව ඇත. ඒ අතුරින් ඉතා සීඝ්‍ර ලෙස උතුරු මැද පළාත තුළ ව්‍යාප්තව යන වකුගඩු රෝගී පවුල් , පිළිකා රෝගී පවුල් පවුල්වල අසරණ ජනතාව හා වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජාව සහ ගෘහමූලික කාන්තාවන් ඒකරාශී වෙමින්" දිළිඳුකම පිටුදැකීමේ" තිරසාර ඉලක්ක අරමුණු මූලික කරමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29 ම ක්‍රියාත්මක කරන ලද ස්වයං රැකියා ව්‍යපෘතිය මෙම වසරේ ආරම්භකර පවත්වාගෙන යනු ලැබූ ඉතාමත්ම ඵලදායී ව්‍යාපෘතියක් වේ. 2018 වසර තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සියල්ලක්ම නියෝජනය වන පරිදි ස්වයං රැකියා 911 ක්‍රියාත්මක කිරීමට හැකි විය. ඒ තුළින් පවුල් 1000 කට ආසන්න සංඛ්‍යාවකට සහන සැළසෙනු ඇත. ඉඟුරු, බුලත්, ගම්මිරිස්, කිරි අල වගාවන් හා  ගඩොල් නිෂ්පාදනය, නිදැළි කුකුළු බිත්තර නිෂ්පාදනය හා ඉදල් කොසු නිෂ්පාදනය  ආදී ප්‍රධාන ව්‍යාපෘතිවලට අමතරව, විවිධ ස්වයං රැකියාවන් රැසක්ද ක්‍රියාත්මක  කළ හැකි විය. අදාල  ව්‍යාපෘති සඳහා ඊට සමගාමීව පුහුණු වැඩසටහන් රාශියක්ද ක්‍රියාත්මක කරන ලදී. දිගුකාලීන අරමුණු ඔස්සේ ගමන් කරන මෙම ව්‍යාපෘතිය මඟින් අසරණ ජනතාවගේ ආදායම් තත්ත්වය වැඩිදියුණු වීම සිදුවන අතර, ඒ තුළින් ඔවුන්ගේ පෝෂණ තත්වයද ඉහළ යනු ඇත. ඉදිරි වර්ෂයේද ස්වයං රැකියා උත්පාදනය තුළින් හොඳ වෙළඳපළ අවස්ථාද ලබා දෙමින් ඔවුන් නගා සිටුවීමට අපේක්ෂා කෙරේ.

තව දුරටත් වැඩිහිටි සහ විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජාව වෙනුවෙන් ඔවුන්ගේ ගායන කුසලතා කරළියට ගෙන එමින් ජාත්‍යන්තර වැඩිහිටි සහ ආබාධිත දිනයන්ට සමගාමීව "දැය නැගූ පරපුරක නර්තන පෙළහරෙහි" සිව්වන දැක්ම ද "සිහින ප්‍රභාෂ්වර" දෙවන අදියර ද ඉතා උත්කර්ශවත් ලෙසට පවත්වන්නට හැකියාව ලද්දේය.එකම දිනයකදී උදෑසන සිට රාත්‍රිය දක්වා විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජාවන් සහ වැඩිහිටි ප්‍රජාවන් 2000 ක් බැගින් පමණ සහභාගී වූ මෙම වැඩසටහන දුටු සැමගේ නෙත් සිත් ආකර්ශනය කරනු ලැබූ විචිත්‍රවත් වැඩසටහනක් වූයේය.

විවිධ කායික , මානසික පීඩාවන් හමුවේ අසරණ වෙමින් මෙම දෙපාර්තමේන්තුව කරා දෛනිකව ඇදෙන මහජනයා හා සෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකම බඳාදා දිනට සමාජ සේවා සංවර්ධන නිලධාරියා වටා එක් රොක්වන මහජනයා අතිවිශාලය. ඔවුන් සඳහා  ප්‍රජා සත්කාරක ජංගම සේවා වැඩසටහන් රැසක් 2018  වර්ෂය තුළ ක්‍රියාත්මක කරන්නට හැකියාව ලැබුණි.
එමගින් එකම දිනයකදී එකම ස්ථානයකදී මහජන අවශ්‍යතා රැසක් සඳහා දායකත්වය ලබා දෙන්නට හැකියාව ලැබුණි.

- ඇස් කණ්නාඩි,
- අක්ෂි කාච,
- රෝදපුටු ආදී ආබාධිත උපකරණ
- පාසල් උපකරණ

ඇලහැර, මැදිරිගිරිය, පලාගල, තඹුත්තේගම,පලුගස්වැව,රඹෑව,වැළිකන්ද ,මිහින්තලේ යන කොට්ඨාශවල ජනතාව අතරේ බෙදා දීමට හැකියාව ලැබුණි.

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අරමුණු හා පරමාර්ථ සාර්ථක කරගැනීම සඳහා විවිධ උපාය මාර්ග අනුගමනය කරනු ලැබේ. විශේෂයෙන්ම මෙම දෙපාර්තමේන්තුව මහජනයා සමග ඍජු හා ඉතා යහපත් මහජන සම්බන්ධතාවයන් පවත්වාගෙන යනු ලැබේ. මහජනයා සමග ගනුදෙනු කිරීමේදී යහපත් ප්‍රතිචාර ලැබෙන බව ඔවුන් සමග පිළිසඳරේ දී දැනගැනීමට ලැබේ. මෙම ආයතනය සතු ශක්තීන් හා දුර්වලතා හඳුනා ගනිමින් උපාය මාර්ගික සැලසුම් ඔස්සේ සාර්ථක ඉදිරි ගමනක් යාමට අවශ්‍යවන පසු විපරම් හා අධීක්ෂණ කටයුතු මාසිකව පවත්වන කාර්ය මණ්ඩල රැස්වීම්වලදී හඳුනාගනු ලැබේ. ආයතනයේ යහ පාලනය පවත්වා ගැනීමට බාධා, ගැටළු, දුෂ්කරතා හඳුනා ගැනීම හා සියළු දෙනාගේ අදහස්වලට සවන් දෙමින් අරමුණ කරා ළඟා වීමට, සැමවිටම නිවැරදි තීරණ ගනු ලැබේ. එසේම අන්‍යෝන්‍ය සුහදතාවය වර්ධනය කරගත හැකි විවිධ වැඩසටහන් සංවිධානය කිරීම, සැලසුම් සකස් කිරීමේදී දේශපාලන අධිකාරියේ සහභාගීත්වය ලබා ගැනීම, පරිඝණක භාවිතයට අවස්ථාව ලබා දීම, තුළින් නිලධාරින් සඳහා නවීන තාක්ෂණික දැනුම ලබා දීම තුළ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම , නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගනිමින් ඔවුන් ඒ සඳහා යොමු කිරීම යනාදී කටයුතු සිදු කරනු ලැබේ.

කාර්ය සාධනය කරා ළඟා වීමේදී විවිධ අභියෝග හා ගැටළුවලට මුහුණදීමට සිදු වුවද 2018 වර්ෂයේදී "සමාජ රැකවරණය අවශ්‍ය වූවන්ට සුරක්ෂිත ජීවිතයක් ලබාදීමේ" දැක්ම කරා ඵලදායීවත්, ගුණාත්මකවත් ගමන් කිරීමට උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවට හැකි විය.

-මෙය හිස්ව තබන ලද පිටුවකි-

# 09. ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපාකාර, වෙළෙඳ හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය

## ආදායම් බලපත්‍ර නිකුත් කරන ලද වාහන සංඛ්‍යාව

| වාහන | 2015 | 2016 | 2018 |
|---|---|---|---|
| යතුරු පැදි | 193,774 | 211,301 | 221618 |
| ත්‍රීවීල් | 56,413 | 58,961 | 55096 |
| බස් | 924 | 878 | 722 |
| ලොරි | 120,610 | 11,941 | 11343 |
| ද්වි කාර්ය වාහන | 21,174 | 23,602 | 23335 |
| විශේෂ කාර්ය වාහන | 18 | 62 | 02 |
| අවමංගල / ගිලන් රථ | 17 | 12 | 10 |
| කාර් | 16,181 | 18,454 | 19450 |
| මෝටර් කෝච් | 809 | 915 | 1030 |
| ඉඩම් වාහන | 9,443 | 10,871 | 8450 |
| ටේලර් | - | 329 | 2189 |
| **එකතුව** | **419,363** | **337,326** | **343245** |

## ප්‍රවාහන තොරතුරු

අනුරාධපුර දිස්ත්‍රික්කය

| ප්‍රධාන බස් නැවතුම්පොලවල් (14) | සංසරණය වන බස් රථ ප්‍රමාණය (දිනකට) | සංසරණය වන මගීන් ප්‍රමාණය (දිනකට) |
|---|---|---|
| අනුරාධපුර (පැරණි) | 90 | 2,700 |
| අනුරාධපුර (නව) | 65 | 1,950 |
| අනුරාධපුර (දුර සේවා) | 175 | 5,250 |
| කැකිරාව | 50 | 1,500 |
| තඹුත්තේගම | 50 | 1,500 |
| ගල්නෑව | 30 | 900 |
| ගල්කිරියාගම | 9 | 200 |
| හොරොව්පොතාන | 30 | 900 |
| කහටගස්දිගිලිය | 19 | 570 |
| මිහින්තලේ | 70 | 1300 |
| මැදවච්චිය | 12 | 360 |
| කැබිතිගොල්ලැව | 50 | 1,000 |
| නොච්චියාගම | 35 | 1,050 |
| ගලෙන්බිඳුණුවැව | 35 | 1,050 |
| **එකතුව** | **720** | **20,230** |

උප බස් නැවතුම්පොළවල් - 13

පොළොන්නරුව දිස්ත්‍රික්කය

| ප්‍රධාන බස් නැවතුම්පොළවල් (8) | සංසරණයවන බස් රථ ප්‍රමාණය (දිනකට) | සංසරණය වන මගීන් ප්‍රමාණය (දිනකට) |
|---|---|---|
| හිඟුරක්ගොඩ | 69 | 2,700 |
| කදුරුවෙල | 220 | 6,600 |
| මැදිරිගිරිය | 16 | 480 |
| බකමූණ | 18 | 540 |
| වැලිකන්ද | 09 | 270 |
| සිරිපුර | 40 | 500 |
| මින්නේරිය | 105 | 950 |
| **එකතුව** | **477** | **12,040** |

උප බස් නැවතුම්පොළවල් - 09

## ලියාපදිංචි ප්‍රවාහන සේවා පිළිබඳ තොරතුරු

| | | |
|---|---|---|
| 1 | මගී ප්‍රවාහන බස් රථ | 770 |
| 2 | පාසැල් ප්‍රවාහන බස් රථ | 14 |
| 3 | සිසු සැරිය බස් රථ | 98 |
| 4 | භාණ්ඩ ප්‍රවාහන රථ | 56 |
| 5 | ත්‍රී රෝද රථ | 1800 |
| 6 | කාර්යාල සේවා බස් රථ | 02 |

## දැක්ම

"අභිමානවත් සමාජයක්, ඉසුරුමත් පළාතක්."

## මෙහෙවර

"ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපකාර වෙළෙඳ හා ආහාර සහ කර්මාන්ත අංශ සඳහා සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීමේ ආයතන නිසි පරිදි නියාමනය කිරීම".

## දිගුකාලීන අරමුණු

- කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමේ ආයතන පද්ධතියක් ඇති කිරීම.
- තෘප්තිමත් පාරිභෝගික හා වෙළඳ ප්‍රජාවක් ඇති කිරීම.
- උසස් ආහාර පරිභෝජන සංස්කෘතියක් හා පළාතේ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම.
- දේශීය ආහාර නිෂ්පාදකයින් හඳුනා ගැනීම හා ඔවුන්ගේ ආදායම් වර්ධනය කිරීම.
- පළාතේ තරුණ තරුණියන් සඳහා වෘත්තීමය රැකියා අවස්ථා ළඟාකර දීම හා ඔවුන්ගේ යහගුණ ආකල්ප සංවර්ධනය කිරීම.
- පළාතේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය තුළින් කර්මාන්තකරුවන් සවිබල ගැන්වීම.

## කෙටිකාලීන අරමුණු

- දේශීය ආහාර භාවිතයේ වැදගත්කම පිළිබඳ ජනතාව තුළ නිවැරදි මතයක් නිර්මාණය කිරීම.
- පළාතේ තරුණ ප්‍රජාව තුළ ආකල්පමය පරිවර්තනයක් ඇති කිරීම.

- රැකියා විරහිතව සිටින තරුණයන් ඉදිකිරීම් යන්ත්‍ර හා බරවාහන ක්ෂේත්‍රයේ රැකියා සඳහා යොමු කිරිම.
- දේශීය ආහාර නිෂ්පාදකයින් හඳුනා ගැනීම හා අභිප්‍රේරණය කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීමේ ආයතන නියාමනය
- වෙළඳ හා ආහාර සහ යෞවන කටයුතු විෂය යටතේ සංවර්ධනය
- ආයතනික ධාරිතා සංවර්ධනය
- යහපාලනයට දායක වීම

## උපාය මාර්ගයන්

ආයතනික සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවලට අනුකූලව ආයතනික කටයුතු මෙහෙය වීමෙන් සංවර්ධන ව්‍යාපෘතිවල අපේක්ෂිත අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීම මඟින් පළාතේ සංවර්ධන ක්‍රියාවලියට දායක වීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

| | | | |
|---|---|---|---|
| දරිද්‍රතාවයෙන් තොරවීම | නීරෝගි බව සහ යහපැවැත්ම | ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය | වගකීමෙන් යුතු පාරිභෝජනය සහ නිෂ්පාදනය |




## කාර්යය මණ්ඩල සංයුතිය - 2018

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 38 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 34 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 04 |
| අනියම් | 01 |

## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2018 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | 29.73 | 22.44 | 7.28 | 75.51 |
| ගමන් වියදම් | 5.85 | 0.49 | 5.35 | 8.43 |
| සැපයිම් | 6.71 | 4.13 | 2.57 | 61.60 |
| නඩත්තු වියදම් | 3.53 | 1.39 | 2.13 | 39.59 |
| ගිවිසුම්ගත සේවා | 3.74 | 0.82 | 2.90 | 22.13 |
| මාරු කිරීම් | 43.40 | 43.3 | 0.075 | 99.82 |
| **එකතුව** | **92.95** | **72.62** | **20.33** | **78.12** |

## මූලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2018 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0.50 | 0.41 | 0.09 | 82.32 |
| යන්ත්‍රසූත්‍ර සවි කිරීම් සහ උපකරණ | 1.30 | 0.58 | 0.71 | 45.18 |
| වාහන | 0.25 | 0.00 | 0.25 | 0.00 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම | 0.25 | 0.00 | 0.25 | 0.00 |
| **එකතුව** | **2.30** | **0.99** | **1.30** | **43.04** |

## ආදායම් ඉපයීම - 2018

| ශීර්ෂය | ඉලක්කය (රු.මි) | සත්‍ය ආදායම (රු.මි) | එකතුකිරීමේ ප්‍රගතිය |
|---|---|---|---|
| 10.03.01.01 මෝටර් වාහන ආදායම් බලපත්‍ර ගාස්තු | 600.00 | 604.00 | 100.66 |
| 20.03.03.04 මෝටර් වාහනය මත දඩ | 2.95 | 2.58 | 87.62 |
| 20.03.02.29 ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ගාස්තු | 45 | 45.22 | 100.48 |

## කාර්ය සාධන ඉලක්ක - 2018

| ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|---|
| | | 2017 | 2018 | 2019 |
| අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා මනා සම්බන්ධිකරණයක් පැවැත්වීම | දැනුවත් කිරිම් රැස්වීම් ගනන | 02 | 02 | 03 |
| තෘප්තිමත් පාරිභෝගික හා වෙළඳ ප්‍රජාවක් ඇති කිරිම | ආහාර තාක්ෂණය පිළිබඳ පුහුණු පැවැත්වූවැඩ සටහන් ගනන හා ආහාර සුරක්ෂිතතාව පිළිබඳ නව දැනුම ලබා දීම සඳහා පැවැත්වූ වැඩසටහන් ගනන | 02 | 05 | 05 |
| තරුණ තරුණියන්ගේ යහගුණ ආකල්ප සංවර්ධනය | පැවැත්වූතරුණ කඳවුරු ගනන | 07 | 07 | 05 |
| පළාතේ තරුණ පිරිස සඳහා වෘත්තිමය ක්ෂේත්‍රයන් වෙත යොමු කිරිම | ඉදිකිරිම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී පාඨමාලාව හා බරවාහන රියදුරු පුහුණු ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | පිරිස 17 19 | පිරිස 33 54 | පිරිස 50 80 |

## කාර්ය සාධන ඉලක්ක ළගාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය - 2018

### 01. ආහාර නිෂ්පාදකයින් හඳුනා ගැනීම, ආහාර නිෂ්පාදකයින්ට නව තාක්ෂණය අත්කර දීම

ආහාර නිෂ්පාදකයින් හඳුනා ගැනීම,ආහාර නිෂ්පාදකයින්ට නව තාක්ෂණය අත්කර දීම, ව්‍යාපාරික කටයුතු ප්‍රවර්ධනය හා ආදායම් උත්පාදනයේ ප්‍රවර්ධනය කිරීම යන ප්‍රතිඵල ළඟාකර ගැනීම සඳහාත් අහාර නිෂ්පාදකයින් හඳුනා ගැනිම සහ සිටින නිෂ්පාදකයන්ගේ තාක්ෂණික දැනුම වර්ධනය හා නිෂ්පාදන ප්‍රවර්ධනය තුලින් ආදායම් උත්පාදනය වර්ධනය කිරිම යන අරමුණ සාක්ෂාත්කර ගැනීම වෙනුවෙන් ආහාර නිෂ්පාදන පුහුණු පාඨමාලා පැවැත්වීම 2018 වර්ෂයේ දී සිදු කළ අතර ඒ වෙනුවෙන් රු.මි.01ක් වෙන් වු අතර ඉන් රු.මි.0.97ක් වැය විය.

### 02.මැටි ආශ්‍රිත නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ප්‍රවර්ධනය ......

පළාතේ මැටි ආශ්‍රිත නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ප්‍රවර්ධනය තුළින් ආදායම් වර්ධනය කිරීමටත් මැටි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය ප්‍රවර්ධනය කිරිම සඳහා මැටි කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන දිරි ගැන්වීම සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදී. ඒ වෙනුවෙන් රු.මි.1.39ක් වෙන් වු අතර ඉන් රු.මි.0.083ක් කර්මාන්තයේ ප්‍රවර්ධනය උදෙසා වැය කරන ලදී.

සාම්ප්‍රදායික මැටි නිෂ්පාදන කර්මාන්තයේ නියැලි ප්‍රජාවගේ නිෂ්පාදන ඉහළ නැංවීමට අවශ්‍ය තාක්ෂණික මෙවලම් ප්‍රතිලාභියාගේ 50% ක දායකත්වයෙන් ලබාදීම තුළින් නිෂ්පාදකයා දිරිමත් කිරිම හා නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීම තුළින් මැටි භාණ්ඩ භාවිතය යළිත් සමාජය තුළ ප්‍රචලිත කිරිමේ අපේක්ෂාවෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගම්මාන තුනක් හා පොළොන්නරුව එක් ගම්මානයක් තෝරා ගෙන ක්‍රියාත්මක කිරිමට අදාළ මූලික කටයුතු සිදු කරන ලදි. මෙම කාල වකවානුව තුළ ඇති වී තිබූ ආර්ථික අපහසුතා හේතුවෙන් 50% ක ගාස්තුව ගෙවිමට ප්‍රතිලාභියාට අපහසු බව දැන්විම මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමට නොහැකි විය.

මැටි කර්මාන්තය හා ආශ්‍රිත නිෂ්පාදන සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම තුළින් නව තාක්ෂණ දැනුම සහ නව නිෂ්පාදන ප්‍රවණතා හඳුන්වාදීම තුළින් නිෂ්පාදන ධාරිතාවය සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම අපේක්ෂාවෙන් ඉහත මැටි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහනට අදාළ ගම්මානවල කර්මාන්තකරුවන් ඉලක්කකර ගනිමින් ලූල්නෑව ,ගලෙන්බිඳුනුවැව, පණ්ඩිත රඹෑව යන ගම්මාන සම්බන්ධකර ගනිමින් වැඩසටහන් 02 ක් පවත්වන ලද අතර , ප්‍රතිලාභින් 200 ආසන්න ප්‍රමාණයක් සඳහා පුහුණු වීම් ලබා දෙන ලදි.

## 03. මගී ජනතාවගේ පහසුව උදෙසා.....

බස්නැවතුම්පල සංවර්ධනය යටතේ තඹුත්තේගම බස්නැවතුම්පල භූමිය කාපට් කිරිමට රු.මි.3.81ක් වෙන් කළ අතර ඉන් රු.මි.3.8ක් වර්ෂය තුළදී වැය කරමින් මගී ජනතාවගේ පහසුව සඳහා කටයුතු කරන ලදී.

## 04. වෘත්තීය පුහුණු අවස්ථා ජනිත කිරීම හා රැකියා අවස්ථා නිර්මාණය කිරීම.

i. වෘත්තීය හැකියාවන් සහිත තරුණ ප්‍රජාවක් නිර්මාණය කිරිමේ අරමුණින් ඉදි කිරීම් යන්ත්‍ර මෙහෙයුම් පුහුණු පාඨමාලා පැවැත්වීම සිදු විය. ඒ නිසාවෙන් වෘත්තීය හැකියාවන් සහිත තරුණයින් 33 දෙනෙකු පළාත් තුළින් බිහි විය.විරැකියාවෙන් පෙළෙන අවම අධ්‍යාපන සුදුසුකම් සහිත තරුණයින් තෝරාගෙන එක්ස්කැවේටර්,ලෝඩර්,බැකෝ,මෝටර් ග්‍රේඩර් ඇතුලු වාහන 10ක් සඳහා පුහුණුව ලබා දීම සිදු කෙරේ.




☞ පාඨමාලා ලාභියෙකුගෙන් 50% ක් අයකර ඉතිරිය අමාත්‍යංශය මඟින් ගෙවීමටත් කටයුතු කර ඇත.

☞ ඉදිකිරීම් යන්ත්‍ර පුහුණු ක්ෂේත්‍රයේ රාජ්‍ය අංශයේ ප්‍රමුඛයා වන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යංශයට අයත් ගල්කුලම ඉදිකිරීම් යන්ත්‍ර පුහුණු විදුහලේ සම්පත්දායකත්වයෙන් පුහුණුව ලබා දී ඇත.

☞ ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ ඇතිව තිබෙන සීඝ්‍ර වර්ධනය හා පුහුණු ශ්‍රමය හිඟකම නිසා රැකියා අවස්ථා රැසක් නිර්මාණය කරගත හැකි අතරම NVQ3 හා 4 මට්ටම් සඳහා ලබාදෙන සහතිකය ජාත්‍යන්තරව පවතින රැකියා අවස්ථා ලබාගැනීමට ද හැක.

එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි 01ක් වෙන් වූ අතර ඉන් 0.67ක් වර්ෂය තුළදී වැය විය.

## ii.එසේම බර වාහන රියදුරු පාඨමාලා පවත්වමින් බර වාහන රියදුරන් බිහි කිරිම.

පළාතේ තරුණයින්ගේ විරැකියාව අවම කිරීමත්, වෘත්තීය මාර්ග වෙත යොමුකිරීමේ අදහස ඇතිව 2018 වර්ෂයේ දී අනුරාධපුර ලංකා ගමනා ගමන මණ්ඩලයේ සම්පත් දායකත්වයෙන්, සැහැල්ලු වාහන බලපත්‍ර ලබාගෙන වසර දෙකක් ගත වී ඇති පළාතේ පදිංචි තරුණයන්ගෙන් 50%ක ගාස්තුවක් අය කර ගෙන රියදුරු පුහුණුව ලබා දී ඇත.

රාජ්‍ය අංශයේ රියදුරු බලපත්‍ර ලබාදීමේ ප්‍රමුඛ ආයතනයක් මෙන්ම විනය ගරුක රියදුරන් බිහිකිරීමේ ජාතික මෙහෙරක යෙදී සිටින ලංකා ගමනා ගමන මණ්ඩලයේ සම්පත්දායකත්වය ලබාගැනීමට හැකි වීමත් සුවිශේෂී කාරණයකි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත්කර එම කොට්ඨාශ මඟින් අප වෙත යොමුකරන ලද අයදුම් පත්‍ර 219ක් අතරින් සම්මුඛ පරික්ෂණය සඳහා 83 දෙනෙකු ඉදිරිපත් වූ අතර ඉන් 54 ක් පාඨමාලාව හදාරන ලදි. ඒ සඳහා රු.මි.0.5ක් වෙන් වු අතර ඒ සඳහා රු.මි.0.03ක් වැය විය.



## 05. තරුණ කඳවුරු තුළින් නිර්මාණශීලි තරුණ ප්‍රජාවක් .....

යහපත් ආකල්ප සහිත නිර්මාණශීලි තරුණ ප්‍රජාවක් බිහිකිරීම වෙනුවෙන් පළාත තුළ තරුණ කඳවුරු වැඩසටහන් 07ක් පවත්වන ලදි.



පළාතේ තරුණ තරුණියන්ගේ දැනුම, ආකල්ප, කුසලතා සහ නායකත්ව ගුණාංග සංවර්ධනය තුළින් නිර්මාණශීලී හා විනයගරුක තරුණ තරුණියන් ජාතියට බිහිකිරීමේ අරමුණින් තරුණ කඳවුරු වැඩසටහන 2016 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. පළාතේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් මෙම වැඩසටහන් 16ක් 2016 වර්ෂයේ දී පවත්වන ලදී.

2017 වර්ෂයේ දී මැදවච්චිය, නොච්චියාගම, වැලිකන්ද, විලච්චිය, තඹුත්තේගම, මැදිරිගිරිය, නාච්චාදූව, පලාගල සහ කැබිතිගොල්ලෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් මෙම වැඩසටහන් පවත්වා ඇත.

එසේම 2018 වර්ෂයේ යෞවන කටයුතු අමාත්‍යාංශය හා තරුණ කඳවුරු පවත්වන ලද පොලිස් ස්ථානයේ ප්‍රජා පොලිස් අංශයේ සහභාගිත්වය හා සහයෝගය ලබා ගන්නා ලදී.

ඒ අනුව පදවිය, මිහින්තලේ, හිගුරක්ගොඩ, තමන්කඩුව, හබරණ, තඹුත්තේගම, නොච්චියාගම යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල පවත්වන ලදි. පුද්ගල පෞරුෂත්වය වර්ධනය සඳහා ක්‍රියාකාරකම් සහ දේශන මඟින් ද මත්ද්‍රව්‍ය සහ සමාජ අපචාර පිලිබඳවත් ලිංගිකත්වය හා නව යොවුන් වියේ සෞඛ්‍යමය ගැටළු සහ වෘත්තීයමය අවස්ථාවන් ඇතුළු ක්ෂේත්‍රයන්ට අදාළ ප්‍රවීණතාව ලද සම්පත්දායකයින් සම්බන්ධ කරන ලදි. කලාව, සාහිත්‍ය, වින්දනයක් සහිත මානව හිතවාදී තරුණ ප්‍රජාවක් බිහි කිරීමේ අදහස ඇතිව දින දෙකක වැඩසටහනක් ලෙස මෙම වැඩසටහන පවත්වා ඇත. අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙකේම තරුණ තරුණියන් 800ක් පමණ වැඩසටහන් සඳහා සහභාගි වී ඇත.ඒ සඳහා රු.මි.01ක් වෙන් වූ අතර රු.මි.0.97ක් වැය විය.

## තෝරාගත් ආහාර කර්මාන්තකරුවන් සඳහා තාක්ෂණ පුහුණුව ලබාදීම - (රු.මි. 1.0)

ස්වයං රැකියාව ලෙස ආහාර ආශ්‍රිත කර්මාන්ත පවත්වාගෙන යන ව්‍යවසායකයන් පළාතේ ආර්ථිකයට දක්වන ලද දායකත්වය විශාලය. එමෙන්ම, පළාතේ මහජනතාව සඳහා ගුණාත්මක සෞඛ්‍ය සම්පන්න ආහාරපාන ලබාදීමෙන් පළාතේ ප්‍රජාවගේ සෞඛ්‍යය හා පෝෂණීය තත්වය ඉහළ නැංවීමට දක්වන ලද දායකත්වය විශාලය. ඒ අමාත්‍යාංශය විසින් පළාතේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල සම්බන්ධිකරණය තුළින් විද්‍යා තාක්ෂණ ආයතනයේ සම්පත්දායකත්වය ලබා ගනිමින් සහල් පිටි ආශ්‍රිත,දේශීය පළතුරු (සියඹලා / දෙහි), සහල්පිටි ආශ්‍රිත සොසේජස් / අයිස්ක්‍රීම්, කුරහන් / මුං / උඳු ඇතුළු ධාන්‍ය භාවිතා කර කේක් විලි ජේස්ට්, සොස් වැනි ආහාර නිෂ්පාදනයන් පිළිබඳ ව්‍යවසායකයන්හට නවීන තාක්ෂණය හා පුහුණුව ලබා දී ඇත.





## පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන්හි ප්‍රගතිය - 2018

පළාතේ ආදායම් උත්පාදන ප්‍රභවයක් ලෙස පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වැදගත් වන අතර 2018 වර්ෂය තුළදි වාහන ආදායම් බලපත්‍ර නිකුත් කිරීම මගින් රු.මි.612.03ක් ද , යෝග්‍යතා සහතික පොත් නිකුත් කිරීම මගින් රු.මි.1.63ක්ද , වෙළෙඳ ආදායම් බලපත්‍ර නිකුත් කිරීම මගින් රු.මි.0.029ක් ද ඇතුළුව පළාතට රු.මි. 613.72 ක මුදලක් පළාත් ආදායමට එකතු කරන ලදී.

වාහන ආදායම් බලපත්‍ර නිකුත් කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් මෙන්ම මාර්ගගත ක්‍රමය **(Online)** මගින්ද සිදු කරන ලදී. ඒ අනුව වර්ෂය තුළදි බලපත්‍ර නිකුත් කරන ලද වාහන සංඛ්‍යාව 343,245 ක් පමණ විය.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස - 2018.

***වෙළඳ හා ආහාර*** විෂය යටතේ 2018 වර්ෂයේ දී වෙළඳ හා ආහාර විෂය යටතේ ආහාර නිෂ්පාදන පුහුණු පාඨමාලා පැවැත්වීමේ වැඩසටහන යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ, තමන්කඩුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල පුහුණු වැඩසටහන් දෙකක් ද අනුරාධපුර දිස්ත්‍රික්කයේ පලාගල, පලුගස්වැව, කහටගස්දිගිලිය යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල ව්‍යවසායකයන් සඳහා පුහුණු වැඩසටහන් තුනක් ද පවත්වන ලදි. මෙම වැඩසටහන තුළින් සහල් ආශ්‍රිත නිෂ්පාදන /අච්චාරු වර්ග/බීම වර්ග/ දේශිය කුළුබඩු/ සෝස්/විලි පේස්ට්/ බයිට් වර්ග/වැනි ආහාර ආශ්‍රිත කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන දැනුම වර්ධනයත් නව තාක්ෂණය ළඟාකර දීමත් මගින් ආහාර ආශ්‍රිත කර්මාන්ත තුළ වර්ධනයක් අපේක්ෂාවෙන් මෙම ව්‍යාපෘතිය සිදු කරන ලදි. මැටි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරිමේ ව්‍යාපෘතිය යටතේ මැටි කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන කටයුතු සිදුකරන කර්මාන්තකරුවන් සඳහා තාක්ෂණික පුහුණුව ලබාදීම මගින් ඔවුන්ගේ නිෂ්පාදන කටයුතු සඳහා සහාය වීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය සිදු කළ අතර මේ යටතේ දූල්නැව, පණ්ඩිත රඹෑව, කුඩාකළෑගම ගම්මානවල කර්මාන්තකරුවන් සඳහා පුහුණු පවත්වන ලදි.

***යෞවන කටයුතු*** විෂය යටතේ 2018 වර්ෂයේදී පළාතේ පදිංචි තරුණ ප්‍රජාව විසින් කරන ලද ඉල්ලීම් 94 දෙනෙක් තුළින් 50 සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වූ අතර ඉන් 33 දෙනෙකු පාඨමාලාව සඳහා යොමු කරන ලදි. අමාත්‍යාංශය විසින් 50%ක වැය දරමින් ඉතිරි 50% ප්‍රතිලාභින්ගේ දායකත්වයෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි.

වෘත්තිය මාර්ග වෙත පළාතේ තරුණ පිරිස යොමු කිරීමේ අරමුණින් 2017 වර්ෂයේදී මෙන්ම 2018 වර්ෂයේදීත් ලංකා ගමනා ගමනා මණ්ඩලයේ සම්පත්දායකත්වයෙන් ප්‍රතිලාභින්ගේ 50%ක දායකත්වය හා 50%ක අමාත්‍යාංශයේ දායකත්වය මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි . පසුගිය වර්ෂයේ පාඨමාලාව නිම කළ සංඛ්‍යාව 19 කි. මෙම වසරේ 54 කි. පසුගිය වසරට වඩා මෙම වසරේ ප්‍රතිඵලදායක තත්ත්වයක් අත් කර ගෙන ඇත.

***තරුණ කඳවුරු*** වැඩසටහන 2016 වර්ෂයේ ආරම්භ කළ අතර 2017 හා 2018 වර්ෂවලදීත් පවත්වන ලදි. 2018 වර්ෂයේදී තෝරා ගත්නා ලද ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල පොලිස් ස්ථානයේ ප්‍රජා පොලිස් ඒකක හා පොලිසියේ සහයෝගය හා සහභාගිත්වයෙන් පදවිය, මිහින්තලේ, තඹුත්තේගම, නොච්චියාගම, හිඟුරක්ගොඩ, තමන්කඩුව , හබරණ යන ප්‍රදේශවල දෙදින වැඩසටහන් පවත්වන ලදි. ජාතික සංවර්ධනයට තරුණ පිරිස් යොමු කිරිමේ අරමුණින් යුතුව පළාතේ තරුණ පිරිස් 800 කට පමණ මෙම වැඩ සටහන පවත්වන ලදි.

වෙළඳ හා ආහාර සහ යෞවන කටයුතු විෂය යටතේ සිදු කරන ලද වැඩසටහන් හා ව්‍යාපෘති සමස්තයක් ලෙස 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී කාර්ය සාධනයේ වර්ධනයක් අත්කර ගෙන ඇත.

# 9.1. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

## උතුරු මැද පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සතු සේවා ජාලය

| විස්තරය | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| විවිධ සේවා | 17 | 09 | 26 |
| පාරිභෝගික සමිති | 02 | - | 02 |
| සමුපකාර බැංකු | 3 | - | 3 |
| කෘෂිකාර්මික | 1 | - | 1 |
| සත්ව නිෂ්පාදන - කිරි | 3 | 1 | 4 |
| ධීවර | 2 | 4 | 6 |
| කර්මාන්ත | 1 | 1 | 2 |
| කම්කරු | - | 1 | 1 |
| තරුණ සේවා | - | 1 | 1 |
| සුභසාධන | - | 1 | 1 |
| වෙනත් ප්‍රාථමික | - | 1 | 1 |
| සේවක සංඛ්‍යාව | 711 | 606 | 1,317 |
| සාමාජික සංඛ්‍යාව | 166,706 | 130,773 | 297,479 |
| ඉන්ධනහල් | 7 | 11 | 18 |
| කෝප් සිටි | 14 | 13 | 27 |
| මිනි කෝප් සිටි | 49 | 38 | 87 |
| මෙගා කෝප් සිටි | 03 | 01 | 04 |
| ග්‍රාමීය බැංකු | 106 | 40 | 146 |
| සණස සංගම් | 70 | 43 | 113 |
| ඉතිරි කිරීමේ ගිණුම් | 129,653 | 174,023 | 303,676 |
| ස්ථාවර තැම්පතු | 8,853 | 5,132 | 13,985 |

## දැක්ම

"තිරසාර සමුපකාර ව්‍යවසායත්, සෞභාග්‍යමත් සමාජයක්"

## මෙහෙවර

"සමුපකාර ක්‍රමය හා එම ජාලය ශක්තිමත් කිරීම. සියළු පාර්ශවකරුවන් මනා සහභාගීත්වයෙන්, විනිවිද භාවයෙන් යුක්තව සහ සමුපකාර සංකල්පවලට, ප්‍රතිපත්තිවලට මුල්තැන දෙමින් සංවර්ධනය කිරීම."

## දිගුකාලීන අරමුණු


දිගුකාලීන අරමුණු

උතුරු මැද පළාත් සමුපකාර ව්‍යාපාර තුලින් පොදු මහජනතාවට ඵලදායීතාවයක් සපයමින් තිරසාර සංවර්ධනයට දායකත්වය සැපයීම.

## කෙටිකාලීන අරමුණු

සමුපකාර ව්‍යාපාර තුළින් තාක්ෂණික උපකාර හා ක්‍රමෝපායන් සැකසීම.

## ප්‍රධාන කාර්යයන්




### ප්‍රධාන උපාය මාර්ගයන්

01. පළාතේ පාරිභෝගික ජනතාවට සහන මිලට ද්‍රව්‍ය සැපයීම.

02. පළාතේ නිෂ්පාදන සඳහා වෙළඳපොළක් ඇති කිරීම මඟින් ගොවීන්ට සහන සැලසීම.

03. පළාතේ ජනතාවට සහනදායී මූල්‍ය පහසුකම් සැපයීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

1 උතුරු මැද පළාතේ දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා අත්වැලක් වීම.




2 කුසගින්න තුරන් කිරීම.





3 කර්මාන්ත නවෝත්පාදන හා යටිතල පහසුකම් සැපයීම




## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 178 |
| 2 | සේවයේ නියුතු | 118 |
| 3 | පුරප්පාඩු | 60 |



## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදන (රු.මි.) | 2018 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 62.76 | 62.72 | -0.04 | 99.93 |
| ගමන් වියදම් | 3.25 | 3.24 | 0.01 | 99.69 |
| සැපයීම් | 3.34 | 2.40 | 0.94 | 71.74 |
| නඩත්තු වියදම් | 1.80 | 1.31 | 0.49 | 72.88 |
| ගිවිසුම්ගත සේවා | 0.32 | 0.26 | 0.06 | 80.31 |
| මාරු කිරීම් | 5.32 | 5.26 | 0.06 | 98.81 |
| **එකතුව** | **76.79** | **75.16** | **1.60** | **97.91** |

## මූලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදන (රු.මි.) | 2018 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2.00 | 0.96 | 1.04 | 48 |
| යන්ත්‍රසූත්‍ර සවි කිරීම් හා උපකරණ | 0.70 | 0.69 | 0.01 | 98.57 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩි දියුණු කිරීම | 6.73 | 6.68 | 0.05 | 99.25 |
| **එකතුව** | **9.43** | **8.33** | **1.10** | **88.33** |

## කාර්ය සාධන ඉලක්ක - 2018

| ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|---|
| | | 2017 | 2018 | 2019 |
| සමූපකාර ක්‍රමය ප්‍රවර්ධනය කිරිම. | ආරම්භ කරන ලද නව ව්‍යාපාර සංඛ්‍යාව | 10 | 12 | 20 |
| | ලාභ ලබන සමිති සංඛ්‍යාව | 24 | 18 | 27 |
| සමූපකාර ජාලය ශක්තිමත් කිරිම. | පරිගණක ගත කර ඇති ග්‍රාමිය බැංකු ශාඛා ප්‍රමාණය | 107 | 120 | 123 |
| | පළාත තුල සිටින සමූපකාර සමාජිකයින් සංඛ්‍යාව. | 269981 | 295479 | 325000 |
| මානව සම්පත්වල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරිම. | පවත්වන ලද පුහුණු වැඩ සටහන් සංඛ්‍යාව. | 03 | 03 | 06 |
| | පුහුණු ලාභීන්ගේ සංඛ්‍යාව | 210 | 225 | 500 |


**ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියන්හි ප්‍රගතිය - 2018**

| ප්‍රධාන අරමුණු | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන්කළ (රු.මි) | වැය කළ (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| 01. මානව සම්පත්වල කාර්යක්ෂම-තාවය වැඩි දියුණු කිරිම. | • අනුරාධපුර/පොළොන්නරුව නවක සමූපකාර නිලධාරීන්ගේ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව. | යාවත්කාලින දැනුමෙන් සමන්විත දෙපාර්ත-මේන්තු හා සමිති සේවක පිරිසක් බිහිවිම. | 0.10 | 0.087 | 100 |
| | • සමූපකාර ග්‍රාමීය නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම අනුරාධපුර/පොළොන්නරුව | | 0.10 | 0.074 | 100 |
| | • අනුරාධපුර/පොළොන්නරුව සණස සමිති නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම. | | 0.10 | 0.056 | 100 |
| 02. ග්‍රාමීය බැංකු පද්ධතිය නවිකරණය | • අනුරාධපුර දිස්ත්‍රික්කයේ සමූපකාර ග්‍රාමීය බැංකු පරිගණකගත කිරිම. | කාර්යක්ෂම බැංකු සේවාවක් සැපයීම | 3.0 | 3.0 | 100 |
| 03.දෙපාර්ත-මේන්තුවේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරිම. | • අනුරාධපුර සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල හා කාණු පද්ධතිය අළුත්වැඩියාව. | *දෙපාර්ත-මේන්තු පරිශ්‍රය ක්‍රමවත් විම.<br>*සේවක අභිප්‍රේරණ වර්ධනය විම. | 2.0 | 0.93 | 70 |
| | • සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය සඳහා පරිගණක යන්ත්‍ර ලබා ගැනිම. | | 0.7 | 0.69 | 100 |
| | • ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ සැපයීම. | | 0.096 | 0.96 | 100 |


සමූපකාර ව්‍යාපාරය ජාතික වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද ක්‍රියාත්මක ව්‍යාපාරයකි. උතුරු මැද පළාතේ ක්‍රියාත්මක සමූපකාර සමිතිවල ද ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා නව තාක්ෂණය භාවිතා කිරීම හා දැනුම යාවත්කාලින කිරීම නිරන්තරයෙන්ම කළ යුතු බවට හඳුනාගෙන ඇති අතර සමූපකාර ක්ෂේත්‍රයේ දැනට පවතින තත්වය යාවත්කාලින කිරිම අරමුණු කර ගනිමින් 2018 වර්ෂයේදී රු. මිලියන 0.3 ක ප්‍රතිපාදන යටතේ ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

## නව තාක්ෂණය භාවිතය සඳහා ග්‍රාමීය බැංකු පරිගණක ගත කිරීම.

උතුරු මැද පළාතේ ඇති ග්‍රාමීය බැංකු ශාඛා අතරින් මේ වන විට පොළොන්නරුව දිස්ත්‍රික්යේ පවතින සියලුම ග්‍රාමීය බැංකු පද්ධතිය පරිගණකගත කර අවසන්කර ඇති අතර අනුරාධපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය බැංකු ශාඛා 113 ක පවතින අතර 2018 වර්ෂය වනවිට ඉන් ශාඛා 81 ක් පරිගණකගත කර අවසන්ව පැවතුණි.



2018 වසරේ පළාත් සභා සංවර්ධන ප්‍රදාන යටතේ ලබා දුන් රු.3,000,000 ( රුපියල් මිලියන තුන)ක මුදල යොදවා තවත් ග්‍රාමීය බැංකු පද්ධති 10 ක් පරිගණක ගත කරන ලදී.



ඒ අනුව මේ වන විට අනුරාධපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය බැංකු 91 ක් පරිගණක ගතකර ගණුදෙණු කරුවන් සඳහා මුද්‍රිත පාස්පොත් භාවිතයට හඳුන්වා දී ඇත.

## සමූපකාර දෙපාර්තමේන්තු නියාමනය යටතේ සමූපකාර සමිති විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති.

## ග්‍රාමීය බැංකු අංශයේ තැන්පත් ප්‍රවර්ධනය

උතුරු මැද පළාත තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමූපකාර සමිති 19 ක ග්‍රාමීය බැංකු ශාඛා 117 ද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමූපකාර සමිති 09 ක ග්‍රාමීය බැංකු ශාඛා 40 ද පවත්වා ගෙන යනු ලබයි. සියලුම ශාඛා මඟින් ජනවාරි 01 දින හා සිංහල අලුත් අවුරුදු සමඟ ඉලක්ක කර ගනිමින් තැන්පත් ප්‍රවර්ධනය කර ගැනීමේ වැඩසටහන් පවත්වන ලදී.

**අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගිණුම් 11424ක් අළුත්කළ අතර තැන්පත්වල මුල්‍යමය වටිනාකම රු.මි.430.42කි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගිණුම්11640ක් වු අතර මුල්‍යමය වටිනාකම රු.මි 487.26ක් විය. ඒ අනුව පළාතේ යාවත්කාලීන කළ ගිණුම් ගණන 23064ක් වු අතර මුල්‍ය වටිනාකම රු.මි.917.69ක් විය.**

## ග්‍රාමීය බැංකු නවීකරණය මගින් බැංකු කටයුතු පුළුල් කිරිම .

වර්තමානයේ බැංකු ක්ෂේත්‍රය තුළ රාජ්‍ය හා වාණිජ බැංකු හා තරඟකාරි ලෙස කටයුතු කිරිමේ දි ගනුදෙනුකරුවන්ගේ ආකර්ශණය දිනා ගැනිමට හා බැංකු කටයුතු පුළුල් කිරිම අරමුණුකර ගනිමින් ග්‍රාමීය බැංකු ශාඛා 04ක නවිකරණ කටයුතු සිදු කරනු ලැබීය. මේ සඳහා වැය වු මුදල රු.මි 0.83කි.

## සමූපකාර අලෙවිසැල් සඳහා නව මුහුණුවරක් ලබා දෙමින් කෝප් සිටි සහ මිනි කෝප් සිටි ලෙස සුපර් මාර්කට් ප්‍රචලිත කිරීම.

සමූපකාර ව්‍යාපාරය ප්‍රචලිත කිරිම උදෙසා සමූපකාර අලෙවි සැල් සඳහා නව මුහුණුවරක් ලබා දෙමින් කෝප් සිටි සහ මිනි කෝප් සිටි ලෙස සුපර් මාර්කට් ඇති කිරිම සමූපකාර දෙපාර්තමේන්තු නියාමනය යටතේ සමිති විසින් ක්‍රියාත්මක කරනු ලැබු තවත් ව්‍යාපෘතියකි.

| සමිතිය | නවිකරණය කරන ලද සමූපකාර අලෙවි සැල් |
|---|---|
| 01. රඹෑව විවිධ සේවා සමූපකාර සමිතිය. | • තඹලගොල්ලෑව මිනිකෝප් සිටිය.<br>• කෝප් සුපර් වෙළඳසැල - රඹෑව නගරය |
| 02. කවුඩුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය. | • මල්ෆාම් ප්‍රාදේශිකය<br>• කිරිමැටියාව ප්‍රාදේශිකය. |
| 03. විලච්චිය විවිධ සේවා සමූපකාර සමිතිය. | • වන්නිහැලඹවැව මිනි කෝප්සිටිය. |
| 04. කැබිතිගොල්ලෑව විවිධ සේවා සමූපකාර සමිතිය. | • කැබිතිගොල්ලෑව නගරය<br>• කිරිමැටියාව මිනිකෝප් සිටිය. |
| 05. පදවිය විවිධ සේවා සමූපකාර සමිතිය. | • වෙහෙරතැන්න මිනි කෝප්සිටිය. |

මෙලෙස නවිකරණ කිරීම හේතුවෙන් මෙම වෙළඳසැල්වල ආදායම වර්ධනය වි ඇති අතර ජනතා ආකර්ශනය ද වර්ධනය වි ඇති බව නිරීක්ෂණය විය.

## ධාරිතා සංවර්ධන වැඩසටහන් හා ප්‍රජා සත්කාරක වැඩසටහන්

සමිති සේවකයින්ගේ ධාරිතා සංවර්ධන අවශ්‍යතාවයන් සපුරා ගැනිම සඳහා සමිති විසින් ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කරනු ලබයි. ඒ සඳහා සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සම්බන්ධිකරණය හා සම්පත්දායකත්වය මෙන් ම බාහිර සම්පත් දායකයින්ගේ ද සහභාගිත්වය යටතේ සිදු කරනු ලැබිය. එලෙස 2018 වසරේ සිදු කරන ලද වැඩසටහන් කිහිපයක සාරාංශය පහත පරිදි දැක්විය හැකිය. ඒ යටතේ වැඩසටහන් 13ක් සිදු කළ අතර ඒ සඳහා නිලධාරීන් 510 දෙනෙකු සහභාගී විය.

**2018** වර්ෂයේ දී ද සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මෙන්ම සමිති විසින් ද සේවක සුභ සාධක වැඩසටහන් මෙන්ම ප්‍රජා සත්කාරක වැඩසටහන් ද පවත්වනු ලැබිය. සේවක අභිප්‍රේරණය වර්ධනය කිරිම මෙන්ම සමුපකාර ක්‍රමය ප්‍රචලිත කිරිම ද මින් අපේක්ෂා කෙරිණ. ඒ අනුව උතුරු මැද පළාත තුළ,

- ❖ පහ වසර ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ වැඩසටහන්.
- ❖ වියළි ආහාර ද්‍රව්‍ය බෙදා දීමේ වැඩසටහන.
- ❖ සෞඛ්‍ය දැනුවත් කිරිම වැඩසටහන් හා සෞඛ්‍ය සායන පැවැත්විම.
- ❖ ලේ දන් දිමේ වැඩසටහන පැවැත්විම.
- ❖ සේවක සුභසාධන චාරිකා / කාර්ය මණ්ඩල සඳහා නිල ඇඳුම් ප්‍රදානය කිරිම.
- ❖ දන්සල් පැවැත්විම.
- ❖ සමුපකාර හරසර බක්මහ උළෙල - සමිතිවල සිංහල අලුත් අවුරුදු උත්සව පැවැත්විම.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු හා එහි නිගමනය යටතේ පවතින සමිති මඟින් සමුපකාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය ඉටු කිරිම සඳහා විවිධ ව්‍යාපෘති හා වැඩ සටහන් 2018 වසරේ දි ක්‍රියාත්මක කරනු ලැබිය. ඒ අනුව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුව ළඟා කර ගත් භෞතික ප්‍රගතිය 100% ලෙස සැලකිය හැකිය. එසේම රාජ්‍ය අරමුදල් යටතේ මෙන්ම සමිති අරමුදල් හා බාහිර ආයතනවල මූල්‍ය දායකත්වයෙන් ද වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. එහි දි උපරිම මූල්‍ය කාර්යක්ෂමතාවය ඇති වන පරිදි කටයුතු කරන ලදි.

දෙපාර්තමේන්තුවට වෙන් වු පුනරාවර්තන ප්‍රතිපාදන අනුව අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීමට හැකි වු අතර 2018.12.31 දින වනවිට මූලධන ව්‍යාපෘති සියල්ලේ වැඩ අවසන්කර තිබුන අතර අත්තිකාරම් බී ගිණුම අනුමත සීමාවන් තුළ ප්‍රගතියක් අත්කර ගෙන ඇති අතර ලැබුණු අක් මුදල් 100% ප්‍රගතියක් අත් කර ගෙන ඇත.

දෙපාර්තමේන්තුවේ අරමුණ හා ප්‍රධාන කාර්යන් ඉටුකර ගැනීමේ දී අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු යම් ප්‍රමාණයක් පැවතීම ප්‍රධාන ගැටළු වශයෙන් පැවතුන ද සේවයේ නියුක්ත කාර්ය මණ්ඩල මනා කාර්ය සාධනයෙන් යුක්තව, සමුපකාර සේවකයින්ගේ හා පළාතේ පාරිභෝගික ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා කැප වීමෙන් කටයුතු කළ අතර ආයතනික විනය හා මූල්‍ය විනය විධිමත්ව පවත්වා ගනිමින් 2018 වර්ෂය තුළදී මහජන ප්‍රසාදය ලබා ගැනීමටත් ඉහළ කාර්ය සාධනයක් කරා ළඟා විමටත් හැකි විය.

- මෙය හිස්ව තබන ලද පිටුවකි -

# 9.2. පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

## කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ පසුබිම.

උතුරු මැද පළාතේ කර්මාන්ත ක්ෂේත්‍රයට දායකත්වය සැපයීමට උතුරු මැද පළාත සතුව 2003 වර්ෂයට පෙර පේෂකර්ම දෙපාර්තමේන්තුව හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව යනුවෙන් ආයතන 02ක් පැවති අතර 2003 වර්ෂයේදී උතුරු මැද පළාත් සභාව විසින් ගත් තීරණයක ප්‍රතිඵලයක් වශයෙන් ඉහත සඳහන් දෙපාර්තමේන්තු 02 ඒකාබද්ධ කොට පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් නව දෙපාර්තමේන්තුවක් පිහිටුවනු ලැබී ය. ඉන් පසු එකී එක් එක් දෙපාර්තමේන්තු යටතේ පාලනය වූ සියලුම අංශයන්හී පාලනය, අධීක්ෂණය සහ විවිධ අංශයන් සඳහා පහසුකම් සැපයීම යනාදි කාර්යයන් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරන ලදි. නව ආයතනයේ ප්‍රධාන පරමාර්ථයන් කිහිපයකි.

එක් එක් ආයතනයේ නිෂ්පාදන අංශ කළමනාකරණය කිරීම මගින් උතුරු මැද පළාත් සභාවට සැලකිය යුතු ආදායමක් එකතු කිරීම හා එම ආයතනවල එක් එක් අංශ මගින් උතුරු මැද පළාතේ වෙසෙන තරුණ තරුණියන්හට වෘත්තීය පුහුණුව ලබාදීම ඒ අතර ප්‍රමුඛ පරමාර්ථයක් බවට පත්ව ඇත.

උතුරු මැද පළාත තුළ අපතේ යන ශ්‍රමය ඵලදායීව යොදවා ගනිමින් නිර්මාණශීලීව ඔවුන්ගේ වෘත්තීය හැකියාවන් සංවර්ධනය කරලීම ස්වයං රැකියා අවස්ථා උදා කරලීම දැනට ක්ෂත්‍රයේ සිටින කණ්ඩායම් වල

- ❖ ව්‍යාපාරිකයින්ට සිය නිෂ්පාදන කාර්යන් සඳහා අවශ්‍ය වන වඩු නිෂ්පාදන ලබා දීම, සහ වෘත්තීය පුහුණුවක් සහිත වඩු කාර්මිකයින් තම ව්‍යාපාර කටයුතු සඳහා නිෂ්පාදකයින් ලෙස යොදා ගැනීමට හැකි වන අවස්ථා විවර කරදීම.

තාක්ෂණික සහ ව්‍යවසායකත්ව හැකියාවන් ප්‍රවර්ධනය කිරිම නව ස්වයං රැකියා අවස්ථා සඳහා ඔවුන්ව යොමු කිරිමට අවශ්‍ය මූලික පදනම සැකසීම සහ සමාජීය සංවර්ධනය ඇතිකරලීම සහ ඊට අවශ්‍ය සේවා සපයන්නෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ. එමගින් හස්ත කර්මාන්ත, පේෂ කර්මාන්ත වඩු කර්මාන්ත යන ප්‍රධාන අංශ 03ක් යටතේ දේශීය දළ ජාතික නිෂ්පාදන කාර්යට උර දෙමින් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරලීම සඳහා විවිධ කාර්යයන් රැසක් මෙම දෙපාර්තමේන්තුව මගින් ඉටු කරනු ලබයි.

මෙකී අරමුණු ඉටු කර ගැනීම සඳහා ග්‍රාමීය මට්ටමින් පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන 43ක් සහ වඩු කර්මාන්ත මධ්‍යස්ථාන 10ක් පළාත පුරා ස්ථාපනය කර ඇත. මීට අමතරව ග්‍රාමීය මට්ටමේ කර්මාන්ත සහ හස්ත කර්මාන්ත අංශය නගා සිටුවීම සඳහා විවිධ පුහුණු වැඩසටහන් සහ නිෂ්පාදනයේ ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණ කුසලතා හා ප්‍රාග්ධන උපකරණ ලබා දීමෙන් ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීමට කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව මහගු කාර්ය භාරයක් ඉටු කරයි.

මෙම දෙපාර්තමේන්තුව විසින් ග්‍රාමීය පුරවැසියන්ට අමතරව රාජ්‍ය ආයතන හා ව්‍යාපාරික ප්‍රජාව සඳහාද පහත සඳහන් සේවාවන් සපයමින් සිය කාර්යභාරය තව දුරටත් පුළුල් කර ඇත.

- ❖ නව නිෂ්පාදන සඳහා පාරිභෝගික ආකර්ෂණය වර්ධනය කිරිමෙහිලා වාර්ෂිකව පවත්වනු ලබන ප්‍රදර්ශනවලදි ව්‍යාපාරික ප්‍රජාවට සහභාගි වීමේ අවස්ථා ලබා දීම.

| දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මකවන ආයතන |
|---|

අනුරාධපුර පේෂකර්ම මධ්‍යස්ථාන - 27
පොළොන්නරුව පේෂකර්ම මධ්‍යස්ථාන- 15
අනුරාධපුර අලෙවි මධ්‍යස්ථාන - 03
පොළොන්නරුව අලෙවි මධ්‍යස්ථාන- 01

### අනුරාධපුර පේෂකර්ම මධ්‍යස්ථාන - 27

| | |
|---|---|
| නොච්චියාගම | පල්ලේකාගම |
| මුදිතාගම | වලච්චේගම |
| රළපනාව | මානෑව |
| පණ්ඩුලගම | කලාකරඹෑව |
| පෙරිමියන්කුලම | හිරිපිටියාගම |
| කටුකැලියාව | නෙළුඹෑව |
| රුවන්ගම | කල්පේ |
| පුබ්බෝගම | 21 ජනපදය |
| මානේරුව | ගෝමරන්කල්ල |
| නෙළුම්පත්ගම | හුරුළු නිකවැව |
| රාජාංගනය | තිරප්පනේ |
| රඹෑව | මාමිනියාව |
| දෙමටගල | හුරිගස්වැව |
| නාමල්පුර | |

### පොළොන්නරුව පේෂකර්ම මධ්‍යස්ථාන - 15

| | |
|---|---|
| පත්තිනි පෙදෙසගම | බුද්ධයාය |
| නෙළුම්විල | අතරගල්ලෑව |
| කඩලවැව | අත්තනකඩවල |
| බෝ අත්ත | අරලගන්විල |
| කුමාරගම | පැරකුම් |
| රජඇලගම | බැදිවැව |
| පුලතිසිගම | තල්පොත |
| හිඟුරක්දමන | |

### අලෙවි මධ්‍යස්ථාන - 04

කඩ පනහ - අනුරාධපුර
කච්චේරිය - අනුරාධපුර
තිරප්පනේ
පොළොන්නරුව - රජ ඇලගම

### පේෂකර්ම ගම්මාන - අනුරාධපුර - 10

- කුරටියාව
- කවරක්කුලම
- බුලංකුලම
- පූනෑව
- කාශ්‍යපගම
- සාලියපුර
- උට්ටිමඩුව
- කිරිගල්වැව
- රුවන්පුර (පදවිය)
- සඳරුස්ගම

### පේෂකර්ම ගම්මාන - පොළොන්නරුව - 04

- බිසෝ බණ්ඩාරගම
- සිංහ උදාගම
- පුලතිසිගම
- ගිරිතලේ

### අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙකේ පිහිටි වඩු පාසල්

| අ.අ | වඩු පාසල | |
|---|---|---|
| 1 | සෙලෙස්තිමඩුව යාන්ත්‍රික වඩු පාසල | නාච්චාදූව |
| 2 | කලාවැව යාන්ත්‍රික වඩු පාසල | ඉපලෝගම |
| 3 | නොච්චියාගම යාන්ත්‍රික වඩු පාසල | නොච්චියාගම |
| 4 | කැකිරාව යාන්ත්‍රික වඩු පාසල | කැකිරාව |
| 5 | ගලෙන්බිඳුණුවැව යාන්ත්‍රික වඩු පාසල | ගලෙන්බිඳුණුවැව |
| 6 | මානිංගමුව යාන්ත්‍රික වඩු පාසල | මානිංගමුව |
| 7 | ඔරුබැඳිසියඹලාව යාන්ත්‍රික වඩු පාසල | ඇලහැර |
| 8 | ගිරිපොකුණ යාන්ත්‍රික වඩු පාසල | දිඹුලාගල |
| 9 | මැදිරිගිරිය යාන්ත්‍රික වඩු පාසල | මැදිරිගිරිය |
| 10 | ඒරියාගම දැව තාක්ෂණ උසස් පුහුණු ආයතනය | තලාව |

## දැක්ම

"නිර්මාණශීලි කර්මාන්ත ප්‍රජාවක්, අභිමානවත් පළාතක්".

## මෙහෙවර

"කර්මාන්ත ක්ෂේත්‍රයේ මානව සම්පත්, ආයෝජන, නිෂ්පාදන හා වෙළඳපළ අවස්ථා, පර්යේෂණ හා සංවර්ධන, සියළු පාර්ශ්වකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව ප්‍රවර්ධනය කිරීම".

## දිගුකාලීන අරමුණු

උතුරු මැද පළාතේ හස්ත කර්මාන්ත, පේෂකර්මාන්ත හා කුඩා කර්මාන්ත ක්ෂේත්‍රයන්හි නිෂ්පාදනය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඉහළ නැංවීම තුළින් ජාතික නිෂ්පාදනයට කරනු ලබන්නා වූ දායකත්වය ඉහළ නංවාලීම හා ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවාලීම.

## කෙටිකාලීන අරමුණු

උතුරු මැද පළාතේ හස්ත කර්මාන්ත, පේෂකර්මාන්ත හා කුඩා කර්මාන්ත ක්ෂේත්‍රයන්හි ශිල්පීන්හට රැකියා අවස්ථා සලසා දීම හා ඔවුන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය ජාතික ප්‍රමිති තත්ත්වයට නංවාලීම හා පවත්නා නිෂ්පාදන අලෙවි ආදායම් මට්ටම ඉහළ නැංවීම හා වැඩිකිරීම.

## ප්‍රධාන කාර්යයන්


- කර්මාන්ත ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය.
- කර්මාන්ත අංශයේ ආයෝජන ප්‍රවර්ධනය.
- නිෂ්පාදන හා වෙළඳපළ අවස්ථා සංවර්ධනය.
- පර්යේෂණ හා සංවර්ධනය.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහපාලනය.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- හස්ත කර්මාන්තය, පේෂ කර්මාන්ත, හා වඩු කර්මාන්ත යන අංශවල කර්මාන්තකරුවන් හා ශිල්පීන් සඳහා නව තාක්ෂණය පිළිබඳ පුහුණුව ලබා දීමෙන් ගුණාත්මක නිර්මාණ හා නිෂ්පාදන එළිදැක්වීමට කටයුතු කිරීම.
- ස්වයං රැකියාවන්ට යොමු කිරීමට අවශ්‍ය ප්‍රාග්ධන ආධාර ලබා දී අලෙවි පහසුකම් ද සලසා දීමෙන් ඔවුන්ගේ ජීවන තත්වය වැඩි දියුණු කිරීම.

## කාර්ය මණ්ඩල තොරතුරු - 2018

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 157 |
| 2 | සේවයේ නියුතු | 127 |
| 3 | පුරප්පාඩු | 32 |




## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | 59.51 | 56.81 | 2.70 | 95.46 |
| ගමන් වියදම් | 2.00 | 1.84 | 0.16 | 91.91 |
| සැපයීම් | 4.26 | 3.79 | 0.47 | 88.88 |
| නඩත්තු වියදම | 2.98 | 2.82 | 0.16 | 94.73 |
| ගිවිසුම්ගත සේවා | 24.14 | 14.86 | 9.27 | 61.56 |
| මාරු කිරීම් | 0.34 | 0.32 | 0.02 | 94.79 |
| **එකතුව** | **93.23** | **80.44** | **12.78** | **86.28** |

## මූලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2018 වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි හා ඉදි කිරීම් (PSDG/PCDG) | 21.57 | 10.73 | 10.84 | 49.75 |
| යන්ත්‍රසූත්‍ර සවිකිරීම් හා උපකරණ | 2.50 | 2.47 | 0.03 | 99 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 5.43 | 2.14 | 3.32 | 38.86 |
| **එකතුව** | **29.50** | **15.34** | **14.19** | **52** |

## කාර්ය සාධන ඉලක්ක - 2018

| අනු අංකය | ආයතනයේ අරමුණු | කාර්ය සාධක දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 |
| 01 | ආධුනික පුහුණුලාභීන් සංඛ්‍යාව වර්ධනය කිරීම | පුහුණුලාභීන් සංඛ්‍යාව | 196 | 200 | 250 |
| 02. | පුහුණුව හා තාක්ෂණික දැනුම ලබාදීම | පුහුණු වැඩ සටහන් සංඛ්‍යාව | 10 | 12 | 15 |
| 03. | 50% ප්‍රාග්ධන භාණ්ඩ ලබාදීම | ප්‍රතිලාභී සංඛ්‍යාව | 23 | 09 | - |
| 04. | පේෂකර්ම හා වඩුකර්මාන්ත අංශයේ නිෂ්පාදනය වැඩිදියුණු කිරීම | නිෂ්පාදන වටිනාකම රු.මි. | 24 | 25 | 26 |
| 05. | පේෂකර්ම හා වඩුකර්මාන්ත අංශයේ විකුණුම් ආදායම වැඩිකර ගැනීම | විකුණුම් වටිනාකම රු.මි. | 23 | 24 | 24 |
| 06. | කර්මාන්ත ප්‍රදර්ශනය හා අලෙවි වැඩ සටහන් පැවැත්වීම | පැවැත්වූ වැඩ සටහන් සංඛ්‍යාව | 01 | 02 | 05 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය.

| ප්‍රධාන අරමුණ | ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කල ව්‍යාපෘතිය | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | ප්‍රගතිය ( %) |
|---|---|---|---|---|
| වඩු හා පේෂකර්ම මධ්‍යස්ථාන වෙත පුහුණුව සඳහා යොමුවන ආධුනිකයින්ගේ සංඛ්‍යාව වර්ධනය කරගැනීම | විඩියෝ දර්ශන නිළ ඇඳුම් ලබාදීම පුහුණුව අවසන් කරන අයවළුන් සඳහා වඩු උපකරණ ලබාදීම | 1.00 | 0.99 | 99 |
| පුහුණුව හා තාක්ෂණික දැනුම ලබාදීම තුළින් එම ක්ෂේත්‍රයේ නිෂ්පාදන පරිමාව, ප්‍රමිතිය හා ගුණාත්මක බව වැඩිදියුණු කිරීම | 50% ප්‍රජාදායකත්වය යටතේ ප්‍රාග්ධන භාණ්ඩ සැපයීම | 0.50 | 0.26 | 53 |
| පේෂකර්ම අංශයේ සහ වඩු පාසැල් අංශයේ නිෂ්පාදනය වැඩිදියුණු කර විකුණුම් තුළින් ආදායම් උත්පාදනය කර පළාත් රාජ්‍ය ආදායමට යම් දායකත්වයක් සැපයීම | පුහුණු වැඩ සටහන් පැවැත්වීම | 1.00 | 0.67 | 67 |
| අලෙවි වැඩ සටහන් පැවැත්වීම හා තෝරාගත් කර්මාන්ත කරුවන් වෙත සහනදායී පදනමට අලෙවි කුටි ලබාදීම මගින්කර්මාන්ත කරුවන්ගේ ආදායම් ඉහළ නැංවීම. | පුහුණුව හා නිෂ්පාදන සිදුකරනු ලබන අළුත්වැඩියා සහ යටිතල පහසුකම් සංවර්ධනය සහ නව යන්ත්‍රෝපකරණ හා ගෘහභාණ්ඩ සැපයීම. | 0.50 | 0.33 | 65 |

## දිගුකාලින හා කෙටිකාලින අරමුණු ඉටුකර ගැනිම සදහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති - 2018

| ව්‍යාපෘතිය | ව්‍යාපෘති ගණන | මුදල (රු.මි) |
|---|---|---|
| ඉදි කිරීම් හා අළුත්වැඩියා කටයුතු | 23 | 19.50 |
| මිල දී ගැනීම් | 09 | 6.99 |
| පුහුණු හා දැනුවත් කිරීම් | 15 | 13.51 |
| **එකතුව** | **47** | **40.00** |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2018 වර්ෂයට ලැබුණු ප්‍රතිපාදනවලට අනුව සකස්කර දුන් පහසුකම් අනුව පේෂකර්ම මධ්‍යස්ථාන 14ක්ද, වඩු මධ්‍යස්ථාන 07 ක් ද, නවීකරණය කිරිම හා යටිතල පහසුකම් සැපයීම කරන ලදී. වැඩකිරිමට සුදුසු වාතාවරණයක් සකස් කරදීම හේතුවෙන් හා හස්ත කර්මාන්ත ශිල්පීන් සඳහා ප්‍රාග්ධන උපකරණ සැපයීම හේතුවෙන් විවිධ සම්මාන හා කුසලතා හිමිකර ගැනීමට හැකිවිය. මේ අතරද පේෂකර්ම උපදේශිකාවන් හා පේෂකාර්මිකාවන්ගේ, වඩු උපදේශකයින්ගේ හා වඩු පුහුණු ලාභීන්ද, උතුරු මැද පළාත තුළ විසිරි සිටින හස්ත කර්මාන්ත ශිල්පීන්හා කුඩා කර්මාන්ත කරුවන්ද විය.

පේෂකර්මාන්ත අංශයෙන් පළාත් අතරින් පිරිමි නිමි ඇඳුම් නිෂ්පාදනය කිරිමේ තරඟයෙන් පළමු ස්ථානය ලැබී ඇත. ස්වභාවික වර්ණ ගන්වා සකස් කරන ලද සාරි වෙනුවෙන් 3 වන ස්ථානය ලබාගැනීමටත්, විවිධ සාරි මෝස්තර නිර්මාණ සඳහා කුසලතා සම්මානයක් ලැබී ඇත.

2018 වර්ෂයේ පළාත් කර්මාන්ත ප්‍රදර්ශනයේදී වඩු පාසැල් අතර තරඟයෙන් හොඳම නිර්මාණය අල්මාරියක් අකුලා ඇඳක් සකස් කිරිම වෙනුවෙන් මානින්ගමුව වඩු පුහුණු පාසැලට ද, දෙවන ස්ථානය අකුලා තැබිය හැකි මේසයක් හා පුටු වෙනුවෙන් කළාවැව වඩු පුහුණු පාසැලටද, නිර්මාණාත්මක ඇඳක් සකස් කිරිම වෙනුවෙන් මැදිරිගිරිය වඩු පුහුණු පාසැලටද හිමිවිය.

හස්ත කර්මාන්ත හා කුඩා කර්මාන්ත වෙනුවෙන් පළාත් කුසලතා පළමු, දෙවන හා තෙවන ස්ථාන මෙන්ම කුසලතා සම්මාන 124 ක් ද, ජනාධිපති සම්මාන ජාතික ප්‍රදර්ශනයේදී ප්‍රථම ස්ථාන 03ක් ද, දෙවන ස්ථාන 03ක් ද, තෙවන ස්ථාන 04 ක්ද, කුසලතා සම්මාන 13 ක් ද හිමිකරගෙන ඇත.

කාර්ය සාධනය කරා ළගා වීමේදි විවිධ ගැටළු හා අභියෝගවලට මුහුණ දුන්න ද පළාත් නිශ්චිත හා පළාත් සභා සංවර්ධන ප්‍රදාන යටතේ සමස්ත සම්පත් උපයෝජනය පිළිබඳව ප්‍රගතිය පිළිබඳව සැලකීමේදී ලබාදුන් ප්‍රතිපාදන මත ව්‍යාපෘති 48 ක් ක්‍රියාත්මක කරන ලද අතර සමස්ත මූල්‍ය ප්‍රගතිය 60% ක් හා භෞතික ප්‍රගතිය 99% කට ආසන්න විය.

# 9.3. කර්මාන්ත සංවර්ධන අධිකාරිය

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

2003 අංක 2 දරණ උතුරු මැද පළාත් ප්‍රඥප්ති ප්‍රකාරව මෙම ආයතනය ආරම්භකර ඇත.

## දැක්ම

“උතුරු මැද පළාතේ හොඳම කර්මාන්ත ප්‍රවර්ධකයා වෙමින් තිරසාර සංවර්ධනයේ ප්‍රධානතම පහසුකම් සළසන්නා වීම”.

## මෙහෙවර

“උතුරු මැද පළාතේ සම්පත් ඵලදායි ලෙස යොදා ගනිමින් වෙළඳපොළ අභිමුඛ කාර්මීකරණයක් තුළින් අදාළ පාර්ශවකරුවන් සමඟ උතුරු මැද පළාතේ නව ව්‍යවසායකත්ව සංස්කෘතියක් බිහි කිරීම”.

## දිගුකාලීන අරමුණු

- පළාතේ කර්මාන්ත ප්‍රවර්ධනය හා සංවර්ධනය කිරීම.
- පළාතේ කර්මාන්ත ව්‍යාප්තිය හා නවීකරණය කිරීම.
- පළාතේ කර්මාන්ත විවිධාංගීකරණය හා දිරි ගැන්වීම.
- කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවිකර ගැනීම සඳහා වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම හා ඔවුන්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපොළක් සොයා දීමට මැදිහත්වීම.

## කෙටිකාලීන අරමුණු

- පළාතේ නව කර්මාන්ත බිහි කිරීම සහ පවත්නා කර්මාන්තවල ප්‍රවර්ධනයක් ඇති කිරීම.
- පළාතේ නව සහ දැනට පවත්වාගෙන යනු ලබන කර්මාන්ත අධිකාරිය යටතේ ගාස්තු ප්‍රමාණයක් යටතේ ලියාපදිංචි කිරීම.
- පවතින සහ නව කර්මාන්ත සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන හා තාක්ෂණික පුහුණු පාඨමාලා පැවැත්වීම.
- පළාතේ කර්මාන්තකරුවන් සවිබල ගැන්වීම සඳහා සහන මිලකට උපකරණ ලබා දීම.
- පුහුණු කිරීම හා උපදේශන සේවා මගින් පළාතේ කර්මාන්ත ඒකකවල කළමනාකරණය වැඩි දියුණු කිරීම.
- තාක්ෂණික පැවරීම්, තාක්ෂණික තොරතුරු ලබා ගැනීම සහ බෙදා හැරීම යාවත්කාලීන කරන ලද තාක්ෂණය සහ නව තාක්ෂණය යනාදි සේවාවන් ව්‍යවසායකයින් වෙත ලබා දීම.

- කර්මාන්ත නිෂ්පාදනවල අළෙවිය පහසු කරනුවස්, සම්මන්ත්‍රණ වැඩමුළු, දේශිය හා විදේශිය අළෙවි පොළවල් හා ප්‍රදර්ශන පැවැත්වීම.
- කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අළෙවිකර ගැනීම සඳහා වෙළඳපොළ අවස්ථා හඳුන්වා දීම.

## ප්‍රධාන කාර්යයන්


- ව්‍යවසායකයින් සඳහා තාක්ෂණික, ව්‍යවසායක පුහුණු හා මූල්‍ය පහසුකම්, තාක්ෂණික උපකරණ ලබාදීම.
- ව්‍යවසායක සංගම් යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම.
- පළාතේ කර්මාන්තකරුවන් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිකර ගැනීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- යටිතල පහසුකම් සැලසීම.
- මූල්‍ය පහසුකම් සලසා දීම.
- ආකල්ප වර්ධනයට හා කුසලතා වර්ධනයට සුදුසු දේශකයන් යොදා ගැනීම.
- වෙළෙඳපොල අවස්ථා සලසා දීම.

### කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 01. | අනුමත | 12 |
| 02. | සේවයේ නියුතු | 04 |
| 03. | පුරප්පාඩු | 08 |
| 04. | අනියම් | 03 |
| 05. | තාවකාලික | 02 |
| 06. | කොන්ත්‍රාත් | 01 |
| 07 | පුහුණු | 01 |




## පුනරාවර්තන වියදම් - 2018

| වියදම් ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම් (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය ( %) |
|---|---|---|---|---|
| පුද්ගලික පඩිනඩි | 4.44 | 4.05 | 0.35 | 91 |
| ගමන් වියදම් | 0.08 | 0.7 | 0.01 | 97 |
| සැපයීම් | 0.36 | 0.35 | 0.01 | 99 |
| නඩත්තු වියදම් | 0.50 | 0.49 | 0.01 | 98 |
| **එකතුව** | **5.38** | **4.96** | **0.38** | **-** |

## පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම - 2018

| අනු අංකය | ව්‍යාපෘතිය වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම් | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 01 | ව්‍යවසායකත්ව සංවර්ධන ණය ලබා දිම | පළාතේ ව්‍යවසායකයින් තිස්නම දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව ණය ලබා දීම | සුළු පරිමාණ ව්‍යවසායකයින් නගා සිටුවමින් ඔවුන්ගේ ව්‍යාපාර දියුණුකර ගැනීමට දිරි දීම | 39 |
| 02 | ව්‍යවසායකයින් සඳහා තාක්ෂණික පුහුණු ලබා දිම | පළාතේ ව්‍යවසායකයින් සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීම | නිවැරදි තාක්ෂණය ලබා දිම තුලින් තත්ත්වයෙන් උසස් නිෂ්පාදන කරා යොමු කිරිම | 95 |

## මූලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය | 2018 වර්ෂයේ වියදම් (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| වාහන | ආයතනයේ වියදමින් | 381,193.65 | - | 100 |
| **එකතුව** | | **381,193.65** | **-** | **-** |

## කාර්ය සාධන ඉලක්ක 2017-2019

| අනු අංකය | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශකය | ඉලක්ක(%) | | |
|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 |
| 01. | ව්‍යවසායකයින්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම සඳහා තාක්ෂණ පුහුණුව ලබාදීම. | හැකියා වර්ධනය | 10 | 15 | 25 |
| 02. | ව්‍යවසායකයින් සවිබල ගැන්වීම සඳහා ණය පහසුකම් ලබාදීම. | ධාරිතා වර්ධනය | 10 | 15 | 25 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ලගා කරගැනිම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින්හි ප්‍රගතිය

| ප්‍රධාන අරමුණු | ඉටුකර ගැනිම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | වෙන්කළ (රු.මි) | වැය කළ (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| ව්‍යවසායකයින්ගේ තාක්ෂණික හැකියාව වර්ධනය කිරිම. | තාක්ෂණික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරිම. | 0.02 | 0.0154 | 77 |

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු | ඉලක්ක (%) | |
|---|---|---|
| | 2020 | 2021 |
| ක්ෂුද්‍ර, කුඩා හා අත්කම් කර්මාන්ත සංවර්ධනය කිරීම | 15 | 20 |
| හැකියා හා වෘත්තිමය කුසලතා සංවර්ධනය | 15 | 25 |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

ආයතනික වශයෙන් පවතින සේවක පුරප්පාඩු හා සසඳන විට මෙම අරමුණු ඉටුකර ගැනීමේදී කාර්යය මණ්ඩලය ප්‍රශස්ත සහයක් ලබා දුන් අතර, මූල්‍යනය ආයතනය තුළින්ම සිදුකර ගත යුතු නිසා කාර්යය පරිමාණයේ ප්‍රමාණාත්මක අඩුවක් පෙනෙන්නට ඇත. කෙසේ වුවද ආයතනික කාර්යය මණ්ඩලය සහ සතුව ඇති සම්පත් අනුව මෙහි ප්‍රගතිය සතුටුදායක මට්ටමක වේ.

කාර්ය සාධනය කරා ළගාවිමේදි උතුරු මැද පළාත තුළ කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අරමුණු හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී එම පෘථුල කාර්යය භාරය ඉටුකිරීමට සමපාත ප්‍රශ්ධන සම්පාදනයක් හා කාර්යය මණ්ඩලයක් අධිකාරිය සතු නොවීම , ගතවු කාල පරිච්ඡේදය තුළ බඳවා ගැනීමේ පරිපාටි අනුමත කරවා ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් අනුමත කාර්යය මණ්ඩලය හෝ බඳවා ගැනීමට නොහැකි වීම හා 2017 වසර තුළ ඉහළ කළමණාකාරිත්වය තුන්වරක් වෙනස් වීම තුළ වසර පුරාම පරිපාලන හා මෙහෙයුම් කාර්යයන් විධිමත්ව ගලා නොයෑම ආදි අභියෝග හා ගැටළුවලට මුහුණදුන් අතර ආයතනය සතු මුල්‍ය, භෞතික හා මානව සම්පත් සමඟ සසඳන විට ලබාගත් කාර්ය සාධනය ප්‍රමාණවත් වේ.

# 9.4. මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභා ක්‍රමය ආරම්භ වීමෙන් පසු මධ්‍යම රජය යටතේ ක්‍රියාත්මක කරන ලද පොදු ප්‍රවාහන සේවාවන් පළාත් සභා විෂයපථය යටතට ඇතුළත් කොට ඇත. ඒ අනුව ඒ ඒ පළාත් සභා විසින් ප්‍රඥප්ති අනුමත කරවා " පළාත ඇතුළත මෝටර් වාහන මඟින් පාරවල් ඔස්සේ මගීන් ගෙන යෑමේ සේවා සහ භාණ්ඩ ගෙනයාම විධිමත් කිරීම සහ පළාත් අතර මාර්ග ඔස්සේ ප්‍රවාහන සේවා සැලසීම" යන ව්‍යවස්ථාමය බලතල ක්‍රියාත්මක කරනුවස් 1994 අංක 08 දරණ ප්‍රඥප්තිය මගින් උතුරු මැද පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය පිහිටුවන ලදී. වර්තමානය වනවිට උතුරු මැද පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය විසින් මහඟු කාර්යභාරයක් ඉටු කරයි. බස් රථ ඇතුළු මඟී ප්‍රවාහනය හා භාණ්ඩ ප්‍රවාහන රථ නියාමනය, ආරක්ෂිත හා ගුණාත්මක මඟී ප්‍රවාහන සේවාවක් ස්ථාපිත කිරීම, බස්නැවතුම්පළ කළමනාකරණය හා යටිතල පහසුකම් සංවර්ධනය ආදී කරුණු ප්‍රධාන වන අතර එමඟින් ජාතික ආර්ථිකයට සපයන දායකත්වය සුළුපටු නොවේ. නිදසුනක් ලෙස 2018 වර්ෂය අවසන් වන විට උතුරු මැද පළාත් මර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය විසින් පමණක් බස් රථ 750ක් ද, ත්‍රී රෝද රථ 6,544 ක් ද භාණ්ඩ ප්‍රවාහන රථ 150 ක් පමණ ද, පාසැල් ප්‍රවාහන රථ 11 ක් ද, සිසු සැරි බස් රථ 100 ක් ද අධිකාරියේ ලියාපදිංචිකොට පළාත් ප්‍රවාහන පද්ධතියට එකතුකොට ඇත. උතුරු මැද පළත තුළ සංසරණයවන බස් රථ නියාමනය කිරීම සඳහා දිස්ත්‍රික්ක දෙකෙහි කාර්යාල දෙකක් පිහිටුවා ඇත. උතුරු මැද පළාතේ මාර්ග 215ක් පිහිටා ඇත. පළාත තුළ ප්‍රධාන බස් නැවතුම්පළ 28 ක් ස්ථාපිතකර ඇති අතර එහි නියුක්ත සේවක සංඛ්‍යාව 75 කි.

දෛනිකව ධාවනය වන ගමන් වාර සංඛ්‍යාව 6,980ක් පමණ වන අතර මෙම පළාත තුළ ධාවනය වන බස් රථවල සේවයේ නියුක්ත සේවක සංඛ්‍යාව 2800 ක් පමණ වේ.

## දැක්ම

"කාර්යක්ෂම ජනතාවාදී ප්‍රවාහන සේවාවක්".

## මෙහෙවර

"මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවා හා යටිතල පහසුකම් සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම".

## දිගුකාලීන අරමුණු

ජාතික ප්‍රතිපත්තීන්ට අනුගත වෙමින් පළාත් සභාව විසින් පළාතේ ජනතාවගේ ආර්ථික සමාජීය හා සංස්කෘතික පරිපාලනමය හා සමාජ සුභසාධනමය කටයුතු අරමුණු කරගෙන සැලසුම් කරනු ලබන ප්‍රතිපත්තීන්ට අනුව පළාත් ප්‍රවාහන සේවා පද්ධතිය කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබා දීමත් හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

## කෙටිකාලීන අරමුණු

- අධිකාරිය විසින් නියාමනය කරනු ලබන බස්රථ, මාර්ගස්ථ ප්‍රවාහන බස්රථ, පාසල් ළමුන් ප්‍රවාහන වෑන්රථ, ත්‍රීරෝද රථ, භාණ්ඩ ප්‍රවාහනය කරනු ලබන ට්‍රක් රථ සඳහා නව තාක්ෂණ දැනුම ලබාදීම.
- කාර්යාලයේ සහ ක්ෂේත්‍රයේ නියැලී සිටින කාර්ය මණ්ඩලවල සමාජ සදාචාරය හා දේශීය අනන්‍යතාවය ආරක්ෂා කිරීම හා සංස්කෘතික වටිනාකම ආරක්ෂාකර ගැනීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මෙහෙයුම් හා නියාමන කටයුතු විධිමත් කරනුවස් නවීන තාක්ෂණය හඳුන්වා දීම.

## ප්‍රධාන කාර්යයන් හා උපාය මාර්ග

**01.ඒකාබද්ධ කාලසටහන් අනුව ධාවනයවන බස්රථවල කාර්යක්ෂමතාවය ගුණාත්මක අගය වැඩි කිරීම හා ආයතනගත කිරීම.**

♣ මහජනතාවගේ සේවා අවශ්‍යතාවයට උචිත පරිදි මාර්ග සාකච්ඡා පවත්වා ධාවන ගැටළු අවම කිරීමට උත්සාහ කිරීම.

♣ ශ්‍රී ලංගම බස්රථ 40%ක් ධාවනයට එක් කිරීම. නියාමනය ආයතනය 60%ක් ධාවනයට යෙදවීම.

♣ කාලසටහන් අනුව ධාවනය කිරීම සඳහා බස්නැවතුම්පළ සේවකයින් යෙදවීම හා ලොග් සටහන් පත්‍ර අත්සන් කිරීම තුළින් දෛනිකව බස්රථ ධාවනය අධීක්ෂණය කිරීම.

♣ කොන්දොස්තර, රියදුරු මහතුන් හා බස් හිමියන්ගේ දැනුම හා ආකල්ප වර්ධනය තුලින් ගුණාත්මක බව වැඩිදියුණු කිරීම.

**02.සිසු ප්‍රවාහන බස්රථ සහ වෑන් රථ නියාමනය කාර්යක්ෂම කිරීම විධිමත් කිරීම සහ ගුණත්වය ඉහළ දැමීම.**

♣ සිසු ඉල්ලුමට සරිලන පරිදි මාර්ග හඳුනා ගැනීම හා ප්‍රමාණවත් බස්රථ යෙදවීම.

♣ විධිමත් ආරක්ෂිත ගුණාත්මක සේවාවක් ඇති කිරීම සඳහා බස් රථ හා වෑන් රථ , සේවක මඩුලු, දෙමව්පියන් හා පාසැල් දරුවන් දැනුවත් කිරීම.

♣ විදුහල්පතිවරුන් දැනුවත් කිරීම, මාර්ග සමීක්ෂණ කිරීම, සිසුන්ගෙන් හා දෙමාපියන්ගෙන් අදහස් ලබා ගැනීම,පරීක්ෂා කිරීම.

**03.ත්‍රිරෝද රථ නියාමනය කාර්යක්ෂම කිරීම විධිමත් කිරීම සහ සේවා ගුණත්වය ඉහළ දැමීම.**

♣ පනතේ බලතල ප්‍රකාරව ත්‍රීරෝද රථ අධිකාරියේ ලියාපදිංචි කිරීම.

♣ පුහුණු වැඩසටහන් පවත්වා ත්‍රීරෝද රථ රියදුරන්ගේ ආකල්ප වර්ධනය කිරීම.

♣ත්‍රීරෝද රථ ගාල් ස්ථාපිත කිරීම හා කණ්ඩායම් ගත කිරීම.

♣ ත්‍රීරෝද රථ සේවා තුළ සිදුවන මගී අපහසුතා, විවිධ අපචාර ක්‍රියා අවම කරනුවස් පොලීසිය සමග එක්ව විවිධ වැඩසටහන් සංවිධානය කිරීම.

♣ ගාස්තු විෂමතා අවම කිරීම සඳහා තාක්ෂණය හඳුන්වාදීම.

♣ නියාමනය පහසුවීම සඳහා තාක්ෂණය හඳුන්වා දීම.

♣ පරීක්ෂා කිරීම.

**04.භාණ්ඩ ප්‍රවාහන රථ නියාමනය කාර්යක්ෂම කිරීම, විධිමත් කිරීම සහ ගුණාත්වය ඉහළ දැමීම.**

♣ පනතේ බලතල ප්‍රකාරව අධිකාරියේ ලියාපදිංචි කරවීම.

♣ විධිමත් රථගාල් ස්ථාපිත කරදීම.

♣ පොලීසිය හා එක්ව ආරක්ෂක වැඩසටහන් සංවිධානය කිරීම.

♣මගී ආරක්ෂාව සම්බන්ධයෙන් රියදුරන් හා සහායකයින් දැනුවත් කිරීම.

♣ සමීක්ෂණ කිරීම.

**05. කර්මාන්ත/කාර්යාල සේවක ප්‍රවාහන රථ නියාමනය කාර්යක්ෂම කිරීම විධිමත් කිරීම සහ ගුණාත්වය ඉහළ දැමීම.**

♣පනතේ බලතල ප්‍රකාරව අධිකාරියේ ලියාපදිංචි කරවීම.

♣රියදුරන් හා සහායකයින් දැනුවත් කිරීම.

♣නියාමනය තුළින් අකටයුතුකම් අවම කිරීම.

♣ප්‍රවාහන පහසුකම් ලබා ගන්නා අයගෙන් අදහස් ලබාගෙන සේවා සපයන අයහට නිර්දේශ හා නියෝග නිකුත් කිරීම.

**06. බස්නැවතුම්පල ඉදිකිරීම , නවීකරණය සහ අලුත්වැඩියා කිරීම**

♣නිශ්චිත බස්නැවතුම්පළවල් නොමැති නගරවල බස්නැවතුම්පළවල් ඉදිකිරීම තුළින් මගී ජනතාවගේ ආරක්ෂාව සලසාදීම.

♣යටිතල පහසුකම් නොමැති හා ප්‍රමාණවත් පරිදි නොමැති බස්නැවතුම්පළවල්හි යටිතල පහසුකම් සංවර්ධනය.

♣අබලන්වූ බස්නැවතුම්පළවල් නවීකරණය කිරීම.

♣විවිධ ක්‍රියාකාරකම් ඔස්සේ අපවිත්‍ර වූ බස්නැවතුම්පළවල් අළුත්වැඩියා කිරීම.

♣භූමිය අබලන්වූ බස්නැවතුම්ළවල්හි භූමිය කාපට් කිරීම හා කාණු පද්ධති විධිමත් කිරීම.

♣බස්නැවතුම්පළවල්හි නිරීක්ෂණ මැදිරි විධිමත් කිරීම.

♣බස්නැවතුම්පළවල්හි පරිසරය පිරිසිදුව හා විධිමත්ව පවත්වාගෙ යාමට විවිධ ක්‍රියාකාරකම් හඳුන්වා දීම.

**07. මගී ආවරණ ඉදිකිරීම සහ අබලන්වූ ස්ථාන ප්‍රතිසංස්කරණය**

♣ මගී ආරක්ෂාව සඳහා පළාතේ හඳුනාගත් ස්ථානවල මගී ආවරණ ඉදිකිරීම, ඒ සඳහා පොලීසිය ,මාර්ග සංවර්ධන අධිකාරිය සහ පළාත් පාලන ආයතන සම්බන්ධ කරගැනීම.

♣ අබලන් වූ ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම

♣මගී ආවරණ ඉදිකිරීමට ඉදිරිපත්වන ස්වේච්ඡා සංවිධාන වලට අවස්ථාව ලබාදීම.

♣මගී ආවරණ සඳහා ප්‍රමිති ආකෘති හඳුන්වා දීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු




01.මගී ප්‍රවාහන සේවා සපයන්නන් ලෙස කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වර්ධනය කිරීම.

02.මගී ප්‍රවාහන සේවාවට අදාළව යටිතල පහසුකම් වර්ධනය කිරීම.


03.ආදායම් උත්පාදනය වර්ධනය කිරීම හා ආයතනික ස්ථාවරත්වය ගොඩ නැගීම.

**04.මගී ජනතාවගේ ආරක්ෂාව ඉහළ නැංවීම උදෙසා මහජන හිතෛෂී තොරතුරු සන්නිවේදන ක්‍රම ඇති කිරීම.**

**05.ශ්‍රී ලංකාව තුල පළාත් ප්‍රවාහන අධිකාරී අතරින් ආදර්ශ අධිකාරිය බවට පත්කිරීම.**

## කාර්යය මණ්ඩල සංයුතිය - 2018

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 121 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 127 |
| පුරප්පාඩු | 3 |
| අනියම් | 2 |
| අතිරික්ත | 9 |




## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | 70.39 | 61.23 | 9.16 | 86.99 |
| ගමන් වියදම් | 1.30 | 0.86 | 0.44 | 65.78 |
| සැපයීම් | 4.41 | 3.12 | 1.29 | 70.72 |
| නඩත්තු වියදම් | 1.60 | 1.07 | 0.53 | 67 |
| ගිවිසුම්ගත සේවා | 4.00 | 3.69 | 0.31 | 24.61 |
| මාරු කිරීම් | 1.65 | 0.38 | 1.27 | 23.27 |
| සහනාධාර | 0.20 | 0.04 | 0.16 | 17.50 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 1.30 | 0.49 | 1.31 | 92.34 |
| **එකතුව** | **85.35** | **70.88** | **14.47** | |

## පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම


| ව්‍යාපෘතිය/වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම |
|---|---|
| බස්නැවතුම්පල නඩත්තුව හා සංවර්ධනය | තඹුත්තේගම බස්නැවතුම්පළ භූමිය කාපට් කිරීම, ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිමකිරීම සහ පැරණි මගී පර්යන්තය කඩා ඉවත් කිරීම. |
| බස්නැවතුම්පළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | දූරසේවා බස්නැවතුම්පළ භූමිය කාපට් ඇතිරීම, බස් පර්යන්තයේ මාර්ග දැන්වීම් පුවරු සවිකිරීම. සනීපාරක්ෂක පහසුකම් අළුත්වැඩියා කිරීම, හා කාර්යාල කාමරය අළුත්වැඩියා කිරීම. |
| හඳුනාගත් බස්නැවතුම්පළ කීපයක පොදු දැන්වීම් පුවරු ඉදිකිරීම. | බස්නැවතුම්පළ 03ක් සඳහා (අනුරාධපුර දූරසේවා, තලාව, නව බස්නැවතුම්පළවල් සඳහා) |
| අබලන් මගී ආවරණ අළුත්වැඩියාව. | නගර සීමාව තුළ ඇති අබලන් තත්ත්වයේ මගී ආවරණ 27ක් අළුත්වැඩියා කිරීම. |

## මූලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 31.00 | 0.63 | 30.37 | 2.03 |
| යන්ත්‍ර සූත්‍ර සවිකිරීම හා උපකරණ | 2.00 | 2.93 | (0.93) | - |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම | 14.00 | 0.34 | 13.66 | 2.43 |
| **එකතුව** | **47.00** | **3.90** | **43.10** | **-** |

## ආදායම් ඉපයීම - 2018

| ශීර්ෂය | ඉලක්කය (රු.මි.) | සත්‍ය ආදායම (රු.මි.) | එකතු කිරීමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| 1. මාර්ග බලපත්‍ර | 5.50 | 5.61 | 102 |
| 2. නව බලපත්‍ර | 0.80 | 1.18 | 147 |
| 3. හිමිකාරීත්වය පැවරීම | 4.50 | 4.53 | 101 |
| 4. ලොග් පත්‍ර | 11.50 | 10.71 | 93 |
| 5. සිසු සැරිය ලොග්පත්‍ර | 0.45 | 0.74 | 165 |
| 6. පිවිසුම් පත්‍ර | 5.10 | 3.85 | 75 |
| 7. කොන්දොස්තර බලපත්‍ර | 1.00 | 0.69 | 69 |
| 8. විශේෂ චාරිකා බලපත්‍ර | 0.70 | 0.96 | 137 |
| 9. මගී ප්‍ර376වේශ පත්‍ර | 0.55 | 0.54 | 97 |
| 10. අතුරු ගමන්වාර බලපත්‍ර | 2.08 | 2.14 | 103 |
| 11. තාවකාලික මගී සේවා බලපත්‍ර | 0.27 | 0.24 | 89 |
| 12. කඩ කාමර හා කිරිහල් කුලී | 6.69 | 1.54 | 23 |
| 13. දඩ මුදල්- ජංගම පරීක්ෂක | 0.70 | 3.14 | 449 |
| 14. වැසිකිළි බදු මුදල් | 1.61 | 0.98 | 61 |
| 15. ත්‍රී රෝද රථ ආදායම | 1.00 | 1.34 | 134 |
| 16. ඇහලුම් හා වෙනත් මගී සේවා | 0.20 | 0.21 | - |
| 17. පාසල් ප්‍රවාහන සේවා | - | 0.17 | - |
| 18. භාණ්ඩ ප්‍රවාහන සේවා | - | 0.03 | |
| 19. විවිධ ආදායම් -වෙනත් | 0.40 | 0.09 | 22 |
| 20. රියදුරු බලපත්‍ර | - | 0.14 | - |
| 21. වෙළඳ ප්‍රචාරය | 0.50 | 0.65 | 130 |
| 22. පොලී / ආපදා ණය | 0.08 | 0.09 | 109 |
| 23. පොලී / රුඳවුම් ගිණුම INTEREST | 0.30 | 0.06 | - |
| 24. පොලී / පාරිතෝෂිත ගිණුම INTEREST | - | 0.18 | - |
| 25. පොලී /NSB ගිණුම් අංකය 1000505 | - | 0.00 | - |
| **එකතුව** | **43.93** | **39.81** | **90.58** |



## කාර්ය සාධන ඉලක්ක 2017-2019

| කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|
| | 2017 | 2018 | 2019 |
| උප නගරවල සහ ප්‍රධාන නගරවල සියලු පහසුකම්වලින් සමන්විත බස්නැවතුම්පලවල් ඉදි කිරීම සහ නවීකරණය කිරීම. | 03 | 05 | 07 |
| බස්නැවතුම්පල භූමි කාපට් කිරීම. | 01 | 03 | 08 |
| මගී ඉල්ලුම අනුව හඳුනාගත් ස්ථානවල නව මගී ආවරණ ඉදිකිරීම සහ අලුත්වැඩියා කිරීම . | 11 | 32 | 40 |
| දුර ගමන්සේවා බස්නැවතුම්පළවල් හි ආරක්ෂිත මගී විවේකාගාර සහ සියලු යටිතල පහසුකම්වලින් සමන්විත ආපනශාලා ඉදි කිරීම. | - | - | 01 |
| විධිමත් ත්‍රි රෝද රථගාල් හා භාණ්ඩ ප්‍රවාහන රථගාල් ස්ථාපිත කිරීම. | - | - | 25 |
| වැසිකිළි පහසුකම් රහිත බස්නැවතුම්පලවල්හි වැසිකිළි පද්ධති ස්ථාපිත කිරීම සහ ප්‍රධාන බස්නැවතුම්පලවල්හි ඇති වැසිකිළි පද්ධති නූතන උපකරණ සහිතව වැඩිදියුණු කිරීම | 02 | 07 | 08 |
| ප්‍රධාන බස්නැවතුම්පලවල් හි CCTV කැමරා පද්ධති සවි කිරීම. | - | - | 05 |
| බස්රථවල CCTV කැමරා සහ GPS යන්ත්‍ර සවි කිරීම. | - | - | 100 |
| බස්රථ නිරීක්ෂණ කටයුතු සඳහා තාක්ෂණික මෙහෙයුම් මැදිරි ස්ථාපිත කිරීම සහ තාක්ෂණික උපකරණ හඳුන්වා දීම. | - | - | 03 |
| අධික මගී ඉල්ලුමක් පවතින තෝරාගත් මාර්ගවල සුඛෝපභෝගී බස්රථ සේවා ආරම්භ කිරීම. | - | - | 04 |
| ප්‍රධාන බස්නැවතුම්පලවල් හි ඩිජිටල් කාලසටහන් පුවරු සවි කිරීම. | - | 02 | 02 |
| බස්නැවතුම්පලවල් හි මහජන ඇමතුම් පද්ධති ස්ථාපිත කිරීම. | - | - | 03 |
| වේලා සටහන් කුටි සඳහා තාක්ෂණික උපකරණ හඳුන්වා දීම. | - | - | 06 |
| මාර්ග සමීක්ෂණ පැවැත්වීම. | - | - | 30 |
| ටිකට් මැෂින් ක්‍රමය හඳුන්වා දීම. | - | - | 40% |
| මගී ආරක්ෂාව උදෙසා වන දැන්වීම් ප්‍රචාරක පුවරු ස්ථාපිත කිරීම. | - | - | 05 |
| මගී අයිතිවාසිකම් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ අත් පත්‍රිකා හා ස්ටිකර් ප්‍රචාරක වැඩසටහන් පැවැත්වීම. | - | - | 100 % |
| සිසුසැරිය බස්රථ සේවාව පුළුල් කිරීම. | - | 30 | 30 |
| සිසු ප්‍රවාහන සේවා රථ සේවාව පුළුල් කිරීම. | - | 15 | 50 |
| මගී ප්‍රවාහන ත්‍රි රෝද රථ සේවාව පුළුල් කිරීම. | - | 1000 | 5000 |
| කාර්යාලීය සේවක ප්‍රවාහන රථ සේවාව පුළුල් කිරීම. | - | 10 | 20 |
| භාණ්ඩ ප්‍රවාහන රථ සේවාව පුළුල් කිරීම. | 60 | 100 | 1000 |
| මගී පැමිණිලි. | | 550 | 400 |
| බස්නැවතුම්පලවල් හි හඳුනාගත් අනවසර ඉදිකිරීම් සහිත වෙළඳුන් ඉවත් කිරීම. | - | 10% | 35% |
| වාර්ෂික ජංගම පරීක්ෂක වාර පුළුල් කිරීම. | 250 | 275 | 300 |
| ප්‍රධාන බස්නැවතුම්පලවල්හි බස්රථ කාර්ය මණ්ඩල සඳහා විවේකාගාර පහසුකම් ස්ථාපිත කිරීම. | - | - | 02 |
| පළාත පුරා බස්නැවතුම් ස්ථාන පුවරු ස්ථාපිත කිරීම. | 100 | 100 | 100 |

| කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|
| | 2017 | 2018 | 2019 |
| ටිකට් බුකින් ක්‍රමය හඳුන්වා දීමට අදාල තාක්ෂණික උපකරණ මිලදී ගැනීම. | - | - | 02 |
| කොන්දොස්තර/රියදුරු/බස්රථ හිමියන් / කාර්යාල/ ඇඟලුම්/භාණ්ඩ ප්‍රවාහන සේවාවේ යෙදෙන්නන්/ ත්‍රීරෝද රථ හිමියන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම. | 02 | 02 | 02 |
| හොඳම රියදුරුවරයා, හොඳම කොන්දොස්තරවරයා, හොඳම බස්රථ හිමියා තේරීම සඳහා වාර්ෂික සම්මාන උළෙලක් පැවැත්වීම. | - | - | 01 |
| පුහුණු රියදුරු/කොන්දොස්තරවරු සංචිතයක් පිහිටුවීම. | - | 100 | 100 |
| ප්‍රඥප්තියේ අඩුපාඩු සකස් කිරීම. | - | - | 100 % |
| ගැසට් නිවේදන විධිමත් කිරීම. | 10% | 25% | 75% |
| නීති බලාත්මක කිරීම ප්‍රඥප්ති විධිමත් කිරීම. | - | - | 50% |
| මගී ඉල්ලුම අනුව නව බස්රථ යෙදවිය හැකි ග්‍රාමීය මාර්ග හඳුන්වා දීම. | 05 | 05 | 05 |
| පාසල් ප්‍රවාහන රථ යෙදවිය හැකි මාර්ග හඳුන්වා දීම මගින් සිසුසැරිය සේවාව පුළුල් කිරීම. | 90 | 30 | 30 |
| සේවකයින්ගේ ආකල්ප වර්ධනය සඳහා දේශන හා වැඩසුළු පැවැත්වීම. | 01 | - | 02 |
| පළාත් අධිකාරිවල සේවකයින් සමග අත්දැකීම් හුවමාරු කර ගැනීමේ වැඩසටහන් පැවැත්වීම. | - | - | 01 |
| කාර්ය මණ්ඩලයට සේවස්ථ පුහුණු ලබාදීම. | - | - | 01 |
| 5S,SLIM හෝ වෙනත් ආකාරයේ ඵලදායිතා වැඩසටහන් පැවැත් වීම. | - | - | 01 |
| සේවක ප්‍රණාම උළෙල පැවැත්වීම. | - | - | 01 |
| සේවකයින් අධ්‍යාපනයට යොමු කරනුවස් අර්ධ/පූර්ණ ශිෂ්‍යත්ව පිරිනැමීම. | - | - | 05 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

| ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘති | වෙන් කළ (රු.මි.) | වැය කළ (රු.මි.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|
| අනුරාධපුර දුරසේවා බස්නැවතුම්පල භූමිය කාපට් කිරීම. | 13 | 0.59 | 100 |
| අනුරාධපුර දුරසේවා බස්නැවතුම්පල ගොඩනැගිල්ලේ තීන්ත ආලේපකර අළුත්වැඩියා කිරීම සහ බස් පර්යන්තයේ මාර්ග දැන්වීම් පුවරු සවි කිරීම. | | 1.44 | 90 |
| අනුරාධපුර දුරසේවා බස්නැවතුම්පල පොදු වැසිකිළිය අළුත්වැඩියා කිරීම. | | 0.35 | 90 |
| අනුරාධපුර දුරසේවා බස්නැවතුම්පලෙහි ප්‍රධාන ගේට්ටුව සකස් කිරීම සහ කාර්යාල කාමරය අළුත්වැඩියා කිරීම. | | 0.88 | 100 |
| අනුරාධපුර පැරණි බස්නැවතුම්පළ වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීම. | | 3.12 | 95 |
| අනුරාධපුර පැරණි බස්නැවතුම්පළ ගොඩනැගිල්ලේ කාර්යාල කාමරය අළුත්වැඩියා කිරීම සහ කුරුණෑගල බස් පර්යන්තය දිගේ ගල් පේළියක් ඇතිරීම. | | 0.79 | 85 |
| මැදවච්චිය බස්නැවතුම්පළ වේලා සටහන් කුටියේ වහලය සකස් කිරීම. | | 0.71 | 10 |
| අනුරාධපුර නව බස්නැවතුම්පළ වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීම. | | 0.21 | - |
| හඳුනාගත් බස්නැවතුම්පළ කිහිපයක පොදු දැන්වීම්පුවරු සවි කිරීම. | 1 | 1.73 | 95 |
| අබලන් මගී ආවරණ අලුත්වැඩියාව. | 2 | 2.35 | 100 |
| තඹුත්තේගම බස්නැවතුම්පළ 1 අදියර අවසන් කිරීම සහ භූමිය සකස් කිරීම. | 13 | - | - |
| තඹුත්තේගම බස්නැවතුම්පළ පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම. | | 0.18 | |

භෞතික සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන ප්‍රතිපාදන වශයෙන් රුපියල් මිලියන 29ක් වෙන්වූ අතර ඉන් රුපියල් මිලියන 6ක වටිනාකමකින් යුතු ව්‍යාපෘති මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ අතර ඉතිරි මුදල් රේඛීය අමාත්‍යාංශය විසින් අපගේ සැලසුම්ගත ව්‍යාපෘති ඉටුකරගන්නා ලදී. එකී කටයුතු සඳහා මානව සම්පත් යොදාගනු ලැබුවේ බාහිර පාර්ශ්වයන්ගෙන් වන අතර මෙහෙයුම් හා කාර්යාල කටයුතු සඳහා වන මානව සම්පත් අධිකාරියේ සේවක මඩුල්ල තුළින් පමණක් යොදා ගන්නා ලදී.

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| අරමුණු | ඉලක්ක | |
|---|---|---|
| | 2020 | 2021 |
| **මගී පහසුකම් සංවර්ධනය කිරීම.** | | |
| උප නගරවල සහ ප්‍රධාන නගරවල සියලු පහසුකම්වලින් සමන්විත බස්නැවතුම්පලවල් ඉදි කිරීම සහ නවීකරණය කිරීම. | 07 | 07 |
| බස්නැවතුම්පල භූමි කාපට් කිරීම. | 08 | 08 |
| මගී ඉල්ලුම අනුව හඳුනාගත් ස්ථානවල නව මගී ආවරණ ඉදිකිරීම සහ අලුත්වැඩියා කිරීම . | 45 | 60 |
| දුර ගමන්සේවා බස්නැවතුම්පළවල්හි ආරක්ෂිත මගී විවේකාගාර සහ සියලු යටිතල පහසුකම්වලින් සමන්විත ආපනශාලා ඉදි කිරීම. | 01 | 02 |
| විධිමත් ත්‍රී රෝද රථගාල් හා භාණ්ඩ ප්‍රවාහන රථගාල් ස්ථාපිත කිරීම. | 40 | 65 |
| **මගී ආරක්ෂාව හා සුවපහසුව ඉහළ නැංවීම** | | |
| වැසිකිළි පහසුකම් රහිත බස්නැවතුම්පලවල්හි වැසිකිළි පද්ධති ස්ථාපිත කිරීම සහ ප්‍රධාන බස්නැවතුම්පලවල්හි ඇති වැසිකිළි පද්ධති නූතන උපකරණ සහිතව වැඩිදියුණු කිරීම | 08 | 07 |
| ප්‍රධාන බස්නැවතුම්පලවල්හි CCTV කැමරා පද්ධති සවි කිරීම. | 04 | 04 |
| බස්රථවල CCTV කැමරා සහ GPS යන්ත්‍ර සවි කිරීම. | 200 | 300 |
| බස්රථ නිරීක්ෂණ කටයුතු සඳහා තාක්ෂණික මෙහෙයුම් මැදිරි ස්ථාපිත කිරීම සහ තාක්ෂණික උපකරණ හඳුන්වා දීම. | 02 | 02 |
| අධික මගී ඉල්ලුමක් පවතින තෝරාගත් මාර්ගවල සුඛෝපභෝගී බස්රථ සේවා ආරම්භ කිරීම. | 02 | 02 |
| ප්‍රධාන බස්නැවතුම්පලවල්හි ඩිජිටල් කාලසටහන් පුවරු සවි කිරීම. | 02 | 02 |
| බස්නැවතුම්පලවල්හි මහජන ඇමතුම් පද්ධති ස්ථාපිත කිරීම. | 02 | 01 |
| වේලා සටහන් කුටි සඳහා තාක්ෂණික උපකරණ හඳුන්වා දීම. | 02 | 02 |
| මාර්ග සමීක්ෂණ පැවැත්වීම. | 40 | 30 |
| ටිකට් මැෂින් ක්‍රමය හඳුන්වා දීම. | 30% | 30% |
| මගී ආරක්ෂාව උදෙසා වන දැන්වීම් ප්‍රචාරක පුවරු ස්ථාපිත කිරීම. | 10 | 10 |
| මගී අයිතිවාසිකම් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ අත් පත්‍රිකා හා ස්ටිකර් ප්‍රචාරක වැඩසටහන් පැවැත්වීම. | 100% | - |
| සිසුසැරිය බස්රථ සේවාව පුළුල් කිරීම. | 10 | 10 |
| සිසු ප්‍රවාහන සේවා රථ සේවාව පුළුල් කිරීම. | 50 | 50 |
| මගී ප්‍රවාහන ත්‍රිරෝද රථ සේවාව පුළුල් කිරීම. | 5000 | 4000 |
| කාර්යාලීය සේවක ප්‍රවාහන රථ සේවාව පුළුල් කිරීම. | 20 | 10 |
| භාණ්ඩ ප්‍රවාහන රථ සේවාව පුළුල් කිරීම. | 1000 | 1000 |
| මගී පැමිණිලි. | 300 | 100 |
| බස්නැවතුම්පලවල්හි හඳුනාගත් අනවසර ඉදිකිරීම් සහිත වෙළඳුන් ඉවත් කිරීම. | 30% | 10% |
| වාර්ෂික ජංගම පරීක්ෂක වාර පුළුල් කිරීම. | 325 | 350 |
| ප්‍රධාන බස්නැවතුම්පලවල්හි බස්රථ කාර්ය මණ්ඩල සඳහා විවේකාගාර පහසුකම් ස්ථාපිත කිරීම. | 02 | 02 |
| පළාත පුරා බස්නැවතුම් ස්ථාන පුවරු ස්ථාපිත කිරීම. | 75 | 75 |
| ටිකට් බුකින් ක්‍රමය හඳුන්වා දීමට අදාල තාක්ෂණික උපකරණ මිලදී ගැනීම. | - | 02 |

| අරමුණු | ඉලක්ක | |
|---|---|---|
| | 2020 | 2021 |
| **බස්රථ සහ අතර මගී හිතෛෂී ආකල්ප වර්ධනය කිරීම.** | | |
| කොන්දොස්තර/රියදුරු/බස්රථ හිමියන් / කාර්යාල/ ඇහලුම්/භාණ්ඩ ප්‍රවාහන සේවාවේ යෙදෙන්නන්/ ත්‍රිරෝද රථ හිමියන් දැනුවත් කිරීමේ වැඩමුලු පැවැත්වීම. | 05 | 05 |
| හොඳම රියදුරු, වරයා, හොඳම කොන්දොස්තර වරයා, හොඳම බස්රථ හිමියා තේරීම සඳහා වාර්ෂික සම්මාන උළෙලක් පැවැත්වීම. | 01 | 01 |
| පුහුණු රියදුරු/කොන්දොස්තරවරු සංචිතයක් පිහිටුවීම. | 100 | 100 |
| නීති බලාත්මක කිරීම. | 100% | - |
| ප්‍රඥප්තියේ අඩුපාඩු සකස් කිරීම. | 100% | - |
| ගැසට් නිවේදන විධිමත් කිරීම. | 25% | 25% |
| නීති බලාත්මක කිරීමේ ප්‍රඥප්ති විධිමත් කිරීම. | | |
| **නව මාර්ග හඳුන්වා දීම.** | | |
| මගී ඉල්ලුම අනුව නව බස්රථ යෙදවිය හැකි ග්‍රාමීය මාර්ග හඳුන්වා දීම. | 05 | 05 |
| පාසල් ප්‍රවාහන රථ යෙදවිය හැකි මාර්ග හඳුන්වා දීම මගින් සිසුසැරිය සේවාව පුළුල් කිරීම. | 10 | 10 |
| **රාජ්‍ය ආයතනවල ධාරිතා සංවර්ධනය.** | | |
| සේවකයින්ගේ ආකල්ප වර්ධනය සඳහා දේශන හා වැඩමුළු පැවැත්වීම.. | 03 | 03 |
| පළාත් අධිකාරිවල සේවකයින් සමග අත්දැකීම් හුවමාරුකර ගැනීමේ වැඩසටහන් පැවැත්වීම. | 01 | 01 |
| කාර්ය මණ්ඩලයට සේවස්ථ පුහුණු ලබාදීම. | 01 | 01 |
| 5S,SLIM හෝ වෙනත් ආකාරයේ ඵලදායිතා වැඩසටහන් පැවැත්වීම. | 02 | 02 |
| සේවක ප්‍රණාම උළෙලවල් පැවැත්වීම. | 01 | 01 |
| පළාත් අධිකාරිවල සේවකයින් සමග අත්දැකීම් හුවමාරු කර ගැනීමේ වැඩසටහන් පැවැත්වීම. | 07 | 10 |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2017 වර්ෂයට සාපේක්ෂව ගත්කල 2018 වර්ෂයේදී ඉහළ සාපේක්ෂ ඵලදායිතාවයක් ළඟා කරගෙන ඇත. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා පළාත් සභා ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන් අපේක්ෂිත ඉලක්ක ළඟා කරගෙන ඇත.

ක්‍රියාත්මක කළ වැඩසටහන් අතුරින් ප්‍රවාහන අධිකාරියේ නව පරිපාලන ගොඩනැගිල්ලේ රාජකාරී කටයුතු ආරම්භ කිරීම තුළින් මානව සම්පත් අභිප්‍රේරණය මෙන්ම අධිකාරියේ ඉදිරි සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා නවීන තාක්ෂණ මෙවලම් භාවිතයට ගත හැකි වීම තුළින් සියලු රාජකාරී කටයුතු සාර්ථකව ඉටුකල හැකි වීම,අබලන් මගී ආවරණ අලුත්වැඩියා කිරීම, බස්නැවතුම්පළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුළින් අනුරාධපුර නව බස්නැවතුම්පල නව ගොඩනැගිල්ල සහ වැසිකිළි පද්ධතිය සඳහා විදුලිය ලබාදීම, හඳුනාගත් බස්නැවතුම්පල කිහිපයක පොදු දැන්වීම් පුවරු ඉදිකිරීම, අනුරාධපුර දුරසේවා බස්නැවතුම්පළ ආදර්ශ බස්නැවතුම්පලක් ලෙස සියලු පහසුකම් සහිතව හඳුන්වා දීමට හැකි වීම, මැදවච්චිය බස්නැවතුම්පළ සහ අනුරාධපුර පැරණි බස්නැවතුම්පළ වේලාසටහන් කුටි සකස් කිරීම සහ තඹුත්තේගම බස්නැවතුම්පළ ඉදිකිරීම් කටයුතු සාර්ථකව ඉටු කළ හැකි වීම මගින් සමස්ත මගී ජනතාවට ඉටුවන සේවය අතිවිශාලය. ප්‍රධාන මාර්ග පුළුල් කිරීමට සාපේක්ෂව අතුරු මාර්ග සංවර්ධනය කිරීම නිසා අතුරු මාර්ගවල බස්රථ ධාවනය කිරීම මගින් ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා බොහෝමයක් ඉටුකර ගැනීමට හැකි විය.

- මෙය හිස්ව තබන ලද පිටුවකි -

# 9.5. පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව

## පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ඉතිහාසය හා මූලික තොරතුරු

උතුරු මැද පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව අනුරාධපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක 02න් සමන්විත වේ. මෙම දෙපාර්තමේන්තුව 1987 අංක 13වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරමින් අංක 42 පළාත් සභා ලැයිස්තුවේ 29.2 වගන්තිය යටතේ ක්‍රීඩා දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. කෘෂිකර්ම හා සත්ව පාලන අමාත්‍යාංශය වෙනම ඒකකයක් වශයෙන් පිහිටුවා තිබුණි.

මෙම දෙපාර්තමේන්තුව 1987 වර්ෂයේ සිට අනුරාධපුර කච්චේරි භූමිය සහ පොළොන්නරුව දිස්ත්‍රික් කච්චේරි භූමිය තුළ ආරම්භ වී අනුරාධපුර පළාත් කාර්යාලය වශයෙන් ද පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයක් වශයෙන් ද පිහිටු විය.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29ක් ආවරණය වන පරිදි බල ප්‍රදේශය විශාල වීමත්, කාර්යය බහුල වීමත් නිසා 1989 ජුනි 01 වන දින වෙනම දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත විය. පළාතේ ක්‍රීඩා පරිපාලනය හා සංවර්ධන කටයුතුවලට ශක්තිමත් දායකත්වයක් ලබා දීමේ අරමුණින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ සල්ගාදු ක්‍රීඩාංගන භූමියේ 2004 අප්‍රේල් 27 වන දින සිට නව පරිපාලන ගොඩනැගිල්ලක් ස්ථාපිත කරන ලදී. එතැන් සිට අද දක්වා පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව එම භූමියේ පිහිටා තිබේ.

## පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව සතු භෞතික සහ අනෙකුත් සම්පත්

- දැනට පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තු කාර්යාලය පවත්වාගෙන යන දෙමහල් කාර්යාල ගොඩනැගිල්ල.
- උතුරු මැද පළාත් ක්‍රීඩා සංකීර්ණය- අනුරාධපුර.
- අනුරාධපුර පිහිණුම් තටාකය.
- අනුරාධපුර ගෘහස්ත ක්‍රීඩාගාරය.
- අනුරාධපුර බර ඉසිලීමේ පුහුණු මධ්‍යස්ථානය.
- පොළොන්නරුව දිස්ත්‍රික් ක්‍රීඩා දෙපාර්තමේන්තු කාර්යාලය.
- කැබ් රථ 02.
- වෑන් රථ 01.

## ක්‍රීඩකයන්ට පුහුණු පහසුකම් සැපයෙන ක්‍රීඩාංගන

- ❖ අනුරාධපුර ජාතික ක්‍රීඩා සංකීර්ණය
- ❖ අනුරාධපුර පිහිනුම් සංකීර්ණය
- ❖ පොළොන්නරුව ජාතික ක්‍රීඩා සංකීර්ණය
- ❖ පොළොන්නරුව ගෘහස්ථ ක්‍රීඩා සංකීර්ණය

## ක්‍රීඩා පුහුණු සංචිත

| | | |
|---|---|---|
| ජිම්නාස්ටික් | වොලිබෝල් | කරාතේ දෝ |
| බැඩ්මින්ටන් | මල්ලව පොර | පාපන්දු |
| ජූඩෝ | බර ඉසිලීම | පිහිනුම් |
| මලල ක්‍රීඩා | කායවර්ධන | |

## දැක්ම

"ජාතික හා ජාත්‍යන්තර කෙළිබිම ජයගන්නා නීරෝගීමත් හා ක්‍රියාශීලී ජනතාවක්, සංවර්ධිත පළාතක්".

## මෙහෙවර

"උතුරු මැද පළාතේ ජනතාව නීරෝගීමත් හා ක්‍රියාශීලී කිරීම සඳහාත් ක්‍රීඩකයින් ජාතික හා ජාත්‍යන්තර ජයග්‍රහණ වෙත යොමු කිරීම සඳහාත් ක්‍රීඩා පුහුණු කටයුතු, හඳුනා ගන්නා ලද ක්‍රීඩකයින්ට පහසුකම් සැලසීම, යටිතල පහසුකම් හා ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම."

## දිගුකාලීන අරමුණු

- උතුරු මැද පළාත තුළ සිටින සැඟවුණු කුසලතාවලින් හෙබි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මනා ක්‍රීඩා පුහුණුවක් ලබා දී ජාතික හා ජාත්‍යන්තර තලයට ගෙන ඒම.
- උතුරු මැද පළාත තුළ අභිමානවත් ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම.
- ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රීඩා කෞශල්‍යයෙන් පිරි ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනා ගැනීම.
- පළාත තුළ සිටින සියළුම ප්‍රජාව ආවරණය වන පරිදි ක්‍රීඩා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පළාතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩා සහ පුහුණු කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය.
- විධිමත් හා කාර්යක්ෂම සේවා සපයන ආයතනික පද්ධතියක් සකස් කිරීම


## කෙටිකාලීන අරමුණු

- ජාතික ක්‍රීඩා උළලේ පදක්කම් වැඩිපුර ලබා ගැනීම.
- ජාතික ක්‍රීඩා උළලේදී පළාත ඉහළ මට්ටමේ තැබීම.
- ග්‍රාමීය මට්ටමේ දක්ෂතා ඇති අය ඉදිරියට ගෙන ඒම.
- පුහුණු මධ්‍යස්ථාන, තරඟ ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබා දීම.

## ප්‍රධාන කාර්යයන්




## ප්‍රධාන උපාය මාර්ගයන්



## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 92 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 81 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 20 |

## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වියදම් (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය ( %) |
|---|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | 37.20 | 37.20 | - | 100 |
| ගමන් වියදම් | 2.00 | 1.90 | 0.10 | 95 |
| සැපයීම් | 10.00 | 9.0 | 1.00 | 90 |
| නඩත්තු වියදම් | 1.40 | 1.2 | 0.20 | 86 |
| සේවා | 28.40 | 27.00 | 1.40 | 95 |
| මාරු කිරීම් | 0.40 | 0.40 | - | 100 |
| **එකතුව** | **79.40** | **76.70** | **2.70** | |

## මූලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 0.30 | 0.3 | - | 98 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 0.60 | 0.4 | 0.2 | 75 |
| දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 0.10 | 0.1 | - | 100 |
| ක්‍රිඩා සමාජ සඳහා ක්‍රිඩා උපකරණ සැපයීම | 5.00 | 5.0 | - | 100 |
| **එකතුව** | **6.00** | **5.8** | **0.2** | |

## මූලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ක්‍රිඩා සංකීර්ණය නඩත්තුව | 4.90 | 4.70 | 0.20 | 96 |
| පුහුණු වැඩසටහන් පැවැත්වීම | 0.70 | 0.60 | 0.10 | 89 |
| පුහුණු කඳවුරු පැවැත්වීම | 1.00 | 0.90 | 0.10 | 95 |
| ජගත් කෙළිබිමට රන් අරුණැල්ල,කුසලතා ඇගයීම | 5.80 | 5.80 | - | 100 |
| රජරට රන් කුසලාන වොලිබෝල් තරඟ | 0.90 | 0.80 | 0.10 | 92 |
| ශාරීරික පුහුණු මධ්‍යස්ථානයට උපකරණ ලබා ගැනීම | 1.50 | 1.40 | 0.10 | 92 |
| හඳුනාගත් ක්‍රිඩා ඉසව් සංවර්ධනය | 1.00 | 0.90 | 0.10 | 88 |
| **එකතුව** | **15.80** | **15.10** | **0.70** | |

## මූලධන වියදම් - 2018 අවිච්ඡේද වැඩ

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ක්‍රිඩා පිටි සංවර්ධනය | 0.90 | 0.90 | 0 | 100 |
| ක්‍රිඩාංගන නඩත්තුව | 1.30 | 1.30 | 0 | 100 |
| ක්‍රිඩා උපකරණ මිලදී ගැනීම | 1.50 | 1.50 | 0 | 100 |
| ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ කුසලතා ඇගයීම | 0.50 | 0.50 | 0 | 100 |
| **එකතුව** | **4.20** | **4.20** | **0** | |

## වර්ෂය තුළදී ක්‍රිඩා ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති - 2018

### 01.ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා උපකරණ සැපයීම

**වෙන් කළ ප්‍රතිපාදන :- රු.මි. 5.0 මූල්‍ය ප්‍රගතිය :- රු.මි. 5.0 ප්‍රතිශතය :- 100%**

ක්‍රීඩා කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම තුළින් උතුරු මැද පළාතේ ක්‍රීඩා කටයුතු නංවාලීම වෙනුවෙන් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 29යෙහි 2018 වර්ෂයේ හඳුනා ගන්නා ලද ලියාපදිංචි ක්‍රීඩා සමාජ 750ක් සඳහා ක්‍රිකට්, වොලිබෝල් තරඟ සඳහා අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම මෙම ව්‍යාපෘති මඟින් සිදු කර ඇත.

## ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා උපකරණ සැපයීම - 2018

| ක්‍රීඩා උපකරණයේ නම | ලබාගත් සංඛ්‍යාව |
|---|---|
| ස්ටම්ප් සෙට් | 200 |
| ක්‍රිකට් පිති | 780 |
| වොලිබෝල් දැල් | 401 |
| වොලිබෝල් | 401 |
| හෙල්ල 600g<br>හෙල්ල 800g | 26<br>26 |
| පාපන්දු | 100 |
| යගුලිය 4Kg<br>යගුලිය 5Kg | 25<br>25 |
| කවපෙත්ත 1Kg<br>2Kg<br>1.5Kg | 20<br>20<br>20 |
| Weight Lifting Sets | 04 |
| Adjustable Weight Benches | 05 |
| Three (03) Station integrated training machine | 01 |






## 02. ක්‍රීඩා සංකීර්ණය නඩත්තුව

වෙන් කළ ප්‍රතිපාදන :- රු.මි. 4.9 මූල්‍ය ප්‍රගතිය :- රු.මි. 4.7 ප්‍රතිශතය :- 96%

**01**. අනුරාධපුර ශෘහස්ථ

ක්‍රීඩාංගනය වහලය ප්‍රතිසංස්කරණය කිරීම සිදු කළ අතර ව්‍යාපෘතිය සඳහා රු. ලක්ෂ 706,857.00 මුදලක් වැය කොට ප්‍රතිසංස්කරණය සිදු කළේය.



**02**.ක්‍රීඩා සංකීර්ණයට හා දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා සඳහා ජලය ලබා ගැනීම වෙනුවෙන් ජලය රැස්කර තබා ගැනිම සඳහා ජල ටැංකිය (මි.ලි.1000) තැබීම සඳහා ජල කුළුණක් ඉදිකිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු වූ උප ව්‍යාපෘතියකි. මේ වෙනුවෙන් රු. ලක්ෂ 567,890.00 මුදලක් වැය කොට ඉදිකරන ලදී.



**03**.ශෘහස්ථ ක්‍රීඩාගාරයේ බිම ඔපමට්ටම් කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු වූ තවත් උප ව්‍යාපෘතියක් වන අතර මේ සඳහා රු. මිලියන 3,255,139.00 වැය කර ප්‍රතිසංස්කරණය කරන ලදී.

## 03. පුහුණු වැඩසටහන් පැවැත්වීම

**වෙන් කළ ප්‍රතිපාදන :- රු.මි. 0.7 මූල්‍ය ප්‍රගතිය :- රු.මි. 0.6 ප්‍රතිශතය :- 89%**

උතුරු මැද පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ක්‍රීඩා නිළධාරි, ක්‍රීඩා පුහුණුකරුවන් හා ක්‍රීඩා නිළධාරින් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම ව්‍යාපෘතියේ මඟින් සිදු විය. මෙමඟින් ධාරිතා සංවර්ධනය හා දැනුම ආකල්ප වැඩිදියුණු කිරීම මඟින් උතුරු මැද පළාතේ ක්‍රීඩා ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු විය. ඒ අනුව ක්‍රීඩා නිළධාරින් හා පුහුණුකරුවන් සඳහා ප්‍රථමාධාර පිළිබඳ දින 02ක පුහුණු වැඩසටහනක් පැවැත්වීම,දෙපාර්තමේන්තුවේ නිළධාරි වෙනුවෙන් දින 03ක CIGS Program එක හා බැංකු සැසඳුම පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම, පුහුණුකරු, ක්‍රීඩා නිළධාරින්ට හා කාර්යාල නිළධාරින්ගේ ක්‍රීඩා කෞෂල්‍ය ඔප්නැංවීමේ අරමුණින් සෑම වසරකම පවත්වනු ලබන තරු ක්‍රීඩා උළෙල මෙම වසරේ පොළොන්නරුව ජාතික ක්‍රීඩාංගනයෙදී පැවැත්විම ද සිදු විය.

## 04. පුහුණු කඳවුරු පැවැත්වීම

**වෙන් කළ ප්‍රතිපාදන :- රු.මි. 1.0 මූල්‍ය ප්‍රගතිය :- රු.මි. 1.0 ප්‍රතිශතය :- 95%**

ජාතික මහා ක්‍රීඩා උළෙල නියෝජනය කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කුසලතා වර්ධනය උදෙසා අවශ්‍ය අඛණ්ඩ පුහුණුව ලබා දීම මෙහි අරමුණ විය.



ජාතික මහා ක්‍රීඩා උළලෙ කාණ්ඩායම් තරඟ සඳහා සහභාගිවන ක්‍රීඩකයින් සඳහා නිසි පුහුණුව ලබා දීම මඟින් 44 වන ජාතික මහා ක්‍රීඩා උළෙල නියෝජනය කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කුසලතා වර්ධනය හා පළාතට ලබා ගන්නා ජයග්‍රහණ ප්‍රමාණය වැඩිකර ගැනීම අපේක්ෂා කළ අතර අනෙකුත් පළාත් සමඟ හොඳ තරඟයක් ලබා දීමෙන් ශ්‍රී ලංකාවේ පළාත් අතරින් උතුරු මැද පළාත ඉහළ මට්ටමට ගෙන එම සඳහා පුහුණු කඳවුරු පැවැත්වීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු විය.



මේ යටතේ ප්‍රධාන වශයෙන්ම වොලිබෝල් හා එල්ලේ යන කණ්ඩායම් තරඟ සඳහා පුහුණු කඳවුරු පවත්වන ලදී.



## 05.ජගත් කෙලිබිමට රන් අරුණැල්ල, කුසලතා ඇගයීම

**වෙන් කළ ප්‍රතිපාදන :- රු.මි. 5.8 මූල්‍ය ප්‍රගතිය :- රු.මි. 5.8 ප්‍රතිශතය :- 100%**

ජාතික මහා ක්‍රීඩා උළෙලෙන් ජයග්‍රහණ ලබා ගන්නා ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා ඊට උරදුන් පුහුණුකරුවන් සඳහා කුසලතා ඇගයීම මේ මගින් සිදු කළ අතර ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 117ක් සඳහා ද ජාත්‍යන්තර ක්‍රීඩක ක්‍රීඩිකාවන් 17 ක් සඳහා මුදල් ත්‍යාග සමඟ උපහාර ලබා දුන් අතර, පුහුණුකරුවන් 57ක් සඳහා ඇගයීම් සිදු කළ අතර ක්‍රීඩක ක්‍රීඩිකාවන් 144 දෙනෙකු වෙනුවෙන් පෝෂණ දීමනා ලබා දීම ද සිදු විය. ක්‍රීඩක ක්‍රීඩිකාවන් 30 දෙනෙකු සඳහා දිරි දිමනා ලබා දීමද සිදු විය.

| අ.අ. | ක්‍රීඩාව | රන් | රිදී | ලෝකඩ |
|---|---|---|---|---|
| 1 | වෙරළ කබඩි (කාන්තා) | | | 6 |
| 2 | වෙරළ වොලිබෝල් (කාන්තා) | | 2 | |
| 3 | කායවර්ධන | | 1 | |
| 4 | බොක්ෂිං (පිරිමි) | 1 | 2 | 1 |
| 5 | බොක්ෂිං (කාන්තා) | | 1 | 1 |
| 6 | පාපැදි ස්ටැන්ඩඩ් (පිරිමි) | | | 1 |
| 7 | පාපැදි ස්ටැන්ඩඩ් (කාන්තා) | 1 | | 1 |
| 8 | ජිම්නාස්ටික් (පිරිමි) | 1 | 6 | 2 |
| 9 | හැන්ඩ්බෝල් (පිරිමි) | 14 | | |
| 10 | ජූඩෝ (පිරිමි) | | 2 | 3 |
| 11 | ජූඩෝ (කාන්තා) | | 2 | 2 |
| 12 | කබඩි (කාන්තා) | | | 12 |
| 13 | කරාතේ දෝ (පිරිමි) | 2 | | 1 |
| 14 | කරාතේ දෝ (කාන්තා) | | 1 | 3 |
| 15 | මැරතන් (පිරිමි) | 1 | | |
| 16 | තරඟ ඇවිීම (පිරිමි) | | 1 | |
| 17 | කඹ ඇදීම (පිරිමි) | 10 | | |
| 18 | කඹ ඇදීම (කාන්තා) | | 10 | |
| 19 | තයිකොන්ඩෝ (පිරිමි) | 3 | | 3 |
| 20 | තයිකොන්ඩෝ (කාන්තා) | | 2 | |
| 21 | තුන්ප්‍රයාම | | | 1 |
| 22 | බරඉසිලීම (පිරිමි) | 3 | 1 | 1 |
| 23 | බරඉසිලීම (කාන්තා) | 2 | 5 | 1 |
| 24 | මල්ලවපොර (පිරිමි) | | | 6 |
| 25 | මල්ලවපොර (කාන්තා) | 1 | | 2 |
| 26 | වුෂු (පිරිමි) | | | 3 |
| 27 | වුෂු (කාන්තා) | 1 | | 1 |
| 28 | මිටිය විසිකිරීම (පිරිමි) | 1 | | |
| 29 | කවපෙත්ත විසිකිරීම (කාන්තා) | | 1 | |
| | **පදක්කම් සටහන** | **41** | **37** | **51** |

**41**



**37**



**51**



## 06. රජරට රන් කුසලාන වොලිබෝල් තරඟ

වෙන් කළ ප්‍රතිපාදන :- රු.මි. 0.9 මූල්‍ය ප්‍රගතිය :- රු.මි. 0.8 ප්‍රතිශතය :- 92%

රජරට රන් කුසලාන වොලිබෝල් තරඟාවලියේ ජයග්‍රාහක කණ්ඩායම් අතර පිරිමි කණ්ඩායම් අතරින් ශූරතාවය මැදවච්චිය ප්‍රා.ලේ.කොට්ඨාසය ද අනුශූරතාවය රාජාංගනය ප්‍රා.ලේ.කොට්ඨාසය ද තුන්වන ස්ථානය ගලෙන්බිඳුණුවැව ප්‍රා.ලේ.කොට්ඨාසය ද සිව්වන ස්ථානය තලාව ප්‍රා.ලේ.කොට්ඨාසය ද දිනා ගත්තා ලද අතර කාන්තා කාණ්ඩායම් අතරින් ශූරතාවය තලාව ප්‍රා.ලේ.කොට්ඨාසය ද අනුශූරතාවය කහටගස්දිගිලිය ප්‍රා.ලේ.කොට්ඨාසය ද තුන්වන ස්ථානය නැ.නු.ප. ප්‍රා.ලේ.කොට්ඨාසය ද සිව්වන ස්ථානය ම.නු.ප. ප්‍රා.ලේ.කොට්ඨාසය දිනා ගත්තා ලදී.

## 07. හඳුනාගත් ක්‍රීඩා ඉසව් සංවර්ධනය

වෙන් කළ ප්‍රතිපාදන :- රු.මි. 1.0 මූල්‍ය ප්‍රගතිය :- රු.මි. 0.9 ප්‍රතිශතය :- 88%

උතුරු මැද පළාත තුළ පාසල් මට්ටමේන් කබඩි ක්‍රීඩාව ඉහළට ගැනීම හා නව ක්‍රීඩක ක්‍රීඩිකාවන් පිරිසක් හඳුනා ගැනීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු විය. සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ අතර දක්ෂතා ඇති පාසල් ක්‍රීඩකයින් තෝරා ගන්නා ලදි. මෙහිදි පසුපෙළ ක්‍රීඩක ක්‍රීඩිකාවන් පිරිසක් බිහි කිරීම හා පළාත කබඩි ක්‍රීඩාවෙන් ඉදිරියට ගෙන ඒම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කලේය.

## 08.දෙවනපෙළ ක්‍රීඩක, ක්‍රීඩිකාවන් හඳුනා ගැනීමේ පුහුණු කඳවුර

උතුරු මැද පළාත ක්‍රීඩා දෙපාර්තමේන්තුව හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව එක්ව උතුරු මැද පළාතේ පාසල් මට්ටමේ සිටින දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනා ගැනීමේ අරමුණින් 2018.12.05 දින අනුරාධපුර මහජන ක්‍රීඩාංගනයේ හා ගෘහස්ථ ක්‍රීඩාගාරයේ පැවැති පසුපෙළ හඳුනා ගැනීමේ පුහුණු කඳවුර සඳහා පාසල් ළමුන් 450කට අධික ප්‍රමාණයක් සහභාගි වූ අතර ඒ අතරින් විවිධ තරඟ සඳහා දක්ෂ ක්‍රීඩකයින් හඳුනා ගැනිම සිදු විය.

## 09.ක්‍රීඩා තරඟ

වෙන් කළ ප්‍රතිපාදන :- රු.මි. 16 මූල්‍ය ප්‍රගතිය :- රු.මි. 16 ප්‍රතිශතය :- 100%

## 10.පළාත් තරඟ

29 වන පළාත් මලල ක්‍රීඩා තරඟාවලිය මෙවර අනුරාධපුර මහජන ක්‍රීඩාංගනයෙදී පැවැත් විය. පළාත් දෙක තුලින් ජයගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 44 වන ජාතික මහා ක්‍රීඩා උළෙල නියෝජනය කළේය.

## 11.ජාතික මහා ක්‍රීඩා උළෙල

| 44 වැනි ජාතික මහ ක්‍රීඩා උළෙලේ සමස්ත පදක්කම් සටහන | | | | |
|---|---|---|---|---|
| පළාත | රන් | රිදී | ලෝකඩ | පදක්කම් එකතුව |
| බස්නාහිර | 113 | 74 | 67 | 254 |
| දකුණ | 33 | 29 | 43 | 105 |
| මධ්‍යම | 28 | 38 | 41 | 107 |
| වයඹ | 23 | 38 | 38 | 99 |
| සබරගමුව | 16 | 24 | 44 | 84 |
| උතුරු මැද | 14 | 25 | 40 | 79 |
| ඌව | 12 | 15 | 34 | 61 |
| නැගෙනහිර | 7 | 12 | 11 | 30 |
| උතුර | 2 | 5 | 5 | 12 |

පොළොන්නරුව ගල්ලැල්ල ක්‍රීඩාංගනයේ 44 වන ජාතික මහා ක්‍රීඩා උළෙල පැවති අතර උතුරු මැද පළාත රන් පදක්කම්14ක් ද රිදී පදක්කම් 25ක් ද ලෝකඩ පදක්කම් 40ක් ද එකතුව පදක්කම් 79ක් ලබා ගනිමින් පළාත් මට්ටමෙන් හයවන (6) ස්ථානය හිමිකර ගනු ලැබිය.තවද කාණ්ඩායම් තරඟ මගින් විශිෂ්ට ජයග්‍රහණ හිමිකර ගත් අතර පළාත වෙනුවෙන් පදක්කම් රැසක් හිමි කර ගත්තේය.

## ක්‍රීඩා දෙපාර්තමේන්තුව මගින් 2018 වර්ෂයේ සිදු කළ විශේෂ වැඩසටහන්

### ශරීර සුවතා සතිය

උතුරු මැද පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව එක්ව 2018 වර්ෂයට අදාළව ශාරීර සුවතා සතිය පළාත් ක්‍රීඩා සංකීර්ණය අසලින් ආරම්භ වී අනුරාධපුර නගරය වටා ගොස් ජනතාව දැනුවත් කිරීම සිදු විය.

## කාර්ය සාධන ඉලක්ක 2018 – 2019

| ආයතනයේ අරමුණු | ප්‍රධාන කාර්ය සාධන දර්ශක(KPIs) | ඉලක්ක | |
|---|---|---|---|
| | | 2018 | 2019 |
| 01.කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩා සහ පුහුණු කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය. | 1. ජාතික වශයෙන් ලැබූ ජයග්‍රහණ සංඛ්‍යාව | 80 | 90 |
| | 2.ක්‍රීඩාංගනය භාවිතා කරන බාහිර පාර්ශවයන් විසින් පවත්වන ලද ක්‍රීඩා තරඟ සංඛ්‍යාව | 50 | 60 |
| | 3. ක්‍රීඩාංගනය තුළ පුහුණුව ලබන සංඛ්‍යාව | 800 | 900 |
| | 4. ක්‍රීඩාංගනය භාවිතයෙන් ලැබූ ආදයම (රු.මි.) | 1.85 | 1.99 |
| | 5. ප්‍රතිසංස්කරණය කළ ක්‍රීඩාංගන සංඛ්‍යාව | - | 20 |
| 02.විධිමත් හා කාර්යක්ෂම සේවා සපයන ආයතනික පද්ධතියක් සකස් කිරීම. | 1. වර්ෂික මූල්‍ය හා භෞතික ප්‍රගතිය | - | 100 |
| | 2. විගණන පරීක්ෂණ පැවැති සංඛ්‍යාව | 4 | - |

| | | | |
|---|---|---|---|
| 03.උතුරු මැද පළාත තුළ සිටින සැඟවුණු කුසලතාවලින් හෙබි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මනා ක්‍රීඩා පුහුණුවක් ලබා දී ජාතික හා ජාත්‍යන්තර තලයට ගෙන ඒම. | 1. ජාතික වශයෙන් ලැබූ ජයග්‍රහණ සංඛ්‍යාව | 80 | 90 |
| | 2. ජාත්‍යන්තර මට්ටමට ගිය ක්‍රීඩකයින් ප්‍රමාණය | 45 | 55 |
| | 3. තාක්ෂණයෙන් පිරි නිළධාරින් සංඛ්‍යාව | 85 | 85 |
| | 4. තාක්ෂණික දැනුම ලබා දෙන ලද නිළධාරින් සංඛ්‍යාව | 85 | 85 |
| | 5. පවත්වන ලද පුහුණු කඳවුරු සංඛ්‍යාව | 5 | 6 |
| | 6. පුහුණු කඳවුරු සඳහා සහභාගී වන නිළධාරින් සංඛ්‍යාව | 85 | 85 |
| 04.ජාතික ක්‍රීඩා උළෙලේ පදක්කම් වැඩිපුර ලබා ගැනිම.<br>ජාතික ක්‍රීඩා උළෙලේදී පළාත ඉහළ මට්ටමේ තැබිම | 1. ජාතික වශයෙන් ලැබූ ජයග්‍රහණ සංඛ්‍යාව | 80 | 90 |
| | 2. ජාත්‍යන්තර මට්ටමට ගිය ක්‍රීඩකයින් ප්‍රමාණය | 45 | 55 |
| | 3. පුහුණු කරන ලද කාණ්ඩායම් ක්‍රීඩා සංඛ්‍යාව | 34 | 34 |
| | 4. ඵලදායී ලෙස පවත්වන ලද පුහුණු කඳවුරු සංඛ්‍යාව | 34 | 34 |
| | 5. පුහුණු කඳවුරු වෙත පුහුණුව සඳහා සහභාගී වූ ක්‍රීඩකයින් සංඛ්‍යාව | 225 | 235 |
| | 6. පිට පළාත් වල පැවති පුහුණු වැඩ සටහන් සඳහා සහභාගී වූ ක්‍රීඩකයින් සංඛ්‍යාව | 60 | 70 |
| 05.උතුරු මැද පළාත තුළ අභිමානවත් ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම. | 1. ජාතික වශයෙන් ලැබූ ජයග්‍රහණ සංඛ්‍යාව | 80 | 90 |
| | 2. ඇගයූ ක්‍රීඩකයින්/නිළධාරින් සංඛ්‍යාව | 250 | 290 |
| | 3. දිරි දීමනා ලබා දුන් ක්‍රීඩකයින් සංඛ්‍යාව | 40 | 50 |
| | 4. පෝෂණ දීමනා ලබා දුන් ක්‍රීඩකයින් සංඛ්‍යාව | 165 | 175 |
| | 1. හඳුනා ගන්නා ලද වොලිබෝල් කාණ්ඩායම් සංඛ්‍යාව | 300 | 350 |
| | 2. හඳුනා ගන්නා ලද වොලිබෝල් ක්‍රීඩකයින් සංඛ්‍යාව | 3600 | 4200 |
| 06.පුහුණු මධ්‍යස්ථාන, තරග ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබාදිම. | 1. ජාතික වශයෙන් ලැබූ ජයග්‍රහණ සංඛ්‍යාව | 80 | 90 |
| | 2. ලබා ගැනීමට බලාපොරොත්තුවන උපකරණ සංඛ්‍යාව | 15 | 25 |
| | 3. උපකරණ ලබා දෙන ලද පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව | 4 | 6 |
| | 4. පුහුණු වන ක්‍රීඩකයින් සංඛ්‍යාව | 250 | 350 |
| | 5. පවත්වන ලද ක්‍රීඩා තරඟ සංඛ්‍යාව | 40 | 50 |
| | 6. ක්‍රීඩා කරන ක්‍රීඩකයින් සංඛ්‍යාව | 560 | 685 |
| | 7. ලබාගන්නා ලද උපකරණ භාවිතා කරන නිළධාරින් සංඛ්‍යාව | 76 | 76 |
| | 8. ආරම්භ කරන ලද ක්‍රීඩා සමාජ සංඛ්‍යාව | 900 | 900 |
| | 9. ක්‍රියාකාරී සමාජික සංඛ්‍යාව | 40000 | 4250<br>0 |
| | 10. පහසුකම් සපයන ලද ක්‍රීඩා සමාජ සංඛ්‍යාව | 900 | 900 |
| 07.ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩා කෞෂල්‍ය යෙන් පිරි ක්‍රිඩක ක්‍රිඩිකාවන් හඳුනා ගැනීම | 1. ජාතික වශයෙන් ලැබූ ජයග්‍රහණ සංඛ්‍යාව | 80 | 90 |
| | 2. ජාත්‍යන්තර මට්ටමට ගිය ක්‍රීඩකයින් ප්‍රමාණය | 45 | 55 |
| | 3.හඳුනා ගන්නා ලද ක්‍රීඩාවන් සංඛ්‍යාව | 10 | 12 |
| | 4. හඳුනා ගන්නා ලද පසුපෙළ ක්‍රීඩකයින් සංඛ්‍යාව | 250 | 300 |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2018 වර්ෂයේදී ලද ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයෙන් භාවිතා කරමින් උතුරු මැද පළාත් ක්‍රීඩා අංශය නංවාලීම සඳහා කටයුතු කරන ලදී. එහිදී ක්‍රීඩාංගන සංවර්ධනය, ක්‍රීඩා උපකරණ ලබා දීම, පුහුණු වැඩසටහන් හා පුහුණු කඳවුරු පැවැත්වීම සිදු වු අතර ජාතික මහා ක්‍රීඩා උළලේදී හය (6) වන ස්ථානයට පත් වෙමින් රන්,රිදී, ලෝකඩ පදක්කම් හැත්තෑ නවයක්(79) ලබා ගැනීමට ද සමත් විය.

# 10.පළාත් ඉඩම්,වාරිමාර්ග,මාර්ග සංවර්ධන,ග්‍රාම සංවර්ධන, නිවාස සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය

## උතුරු මැද පළාතේ මාර්ග සංයුතිය

| විධායක ඉංජිනේරු කාර්යාලය | සී ශ්‍රේණියේ මාර්ග (කි.මී.) | ඩී ශ්‍රේණියේ මාර්ග (කි.මී.) | එකතුව (කි.මී.) |
|---|---|---|---|
| මරදන්කඩවල | 184.55 | 190.40 | 374.95 |
| හොරොව්පොතාන | 146.66 | 226.58 | 373.24 |
| නොච්චියාගම | 212.03 | 107.45 | 319.48 |
| අනුරාධපුර | 197.35 | 173.17 | 370.52 |
| එකතුව | **740.59** | **697.60** | **1438.19** |

| පොළොන්නරුව දිස්ත්‍රික්කය | සී ශ්‍රේණියේ මාර්ග (කි.මී.) | ඩී ශ්‍රේණියේ මාර්ග (කි.මී.) | එකතුව (කි.මී.) |
|---|---|---|---|
| මින්නේරිය | 153.45 | - | 153.45 |
| මනම්පිටිය | 225.62 | 12.56 | 238.18 |
| සේවාගම | 116.65 | 0.85 | 117.50 |
| එකතුව | **495.72** | **13.41** | **509.19** |

## දැක්ම

"තෘප්තිමත් ජනතාවක් ඉසුරුමත් පළාතක්."

## මෙහෙවර

"ඉඩම්, වාරිමාර්ග, මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස සහ කාන්තා කටයුතු සම්බන්ධ සියළුම පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව නියාමනය කිරීම මඟින් සංවර්ධනය කිරීම."

## දිගුකාලීන අරමුණු

- ජාතික සාර්ව ප්‍රතිපත්තිවලට අනුකූලව ඉඩම්, වාරිමාර්ග, මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස කටයුතු හා කාන්තා කටයුතු පිළිබඳ උතුරු මැද පළාතේ ප්‍රතිපත්ති සකස් කිරීම හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු නියාමනය , අධීක්ෂණය හා මෙහෙයවීම මෙන්ම නිවාස හා කාන්තා කටයුතු සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම මඟින් පළාතේ ජනතාවගේ ජීවන තත්වය වර්ධනය කිරීමට දායක වීම.
- ආයතනික සංවර්ධනය සහ යහපාලනය.

## කෙටිකාලීන අරමුණු

- පළාත් ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් හා ආයතනික කටයුතු, නියාමනය , අධීක්ෂණය හා මෙහෙයවීම.
- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් හා ආයතනික කටයුතු, නියාමනය , අධීක්ෂණය හා මෙහෙයවීම.
- පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩ සටහන් හා ආයතනික කටයුතු, නියාමනය , අධීක්ෂණය හා මෙහෙයවීම.
- පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩ සටහන් හා ආයතනික කටයුතු, නියාමනය , අධීක්ෂණය හා මෙහෙයවීම.
- තෝරාගත් අඩු ආදායම්ලාභීන් වෙත නිවාස ආධාර ලබා දීම.
- තෝරාගත් වැන්දඹු කාන්තාවන් සඳහා නිවාස ආධර ලබා දීම.
- තෝරාගත් කාන්තාවන් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් (සජීවීකරණ) පැවැත්වීම.
- තෝරාගත් ස්වයං රැකියාලාභී කාන්තාවන් සවිබල ගැන්වීම.

## ප්‍රධාන කාර්යයන්

- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කටයුතු නියාමනය හා අධීක්ෂණය.
- පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවේ කටයුතු නියාමනය හා අධීක්ෂණය.
- පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු නියාමනය හා අධීක්ෂණය.
- පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ කටයුතු නියාමනය හා අධීක්ෂණය.
- යහපාලන කටයුතු සංවර්ධනය.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම.
- ක්ෂේත්‍ර අධීක්ෂණය.
- දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම.
- පුහුණු වැඩ සටහන් පැවැත්වීම.
- නිවාස ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කාන්තා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.



## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 65 |
| 2 | සේවයේ නියුතු | 31 |
| එකතුව | | 96 |

## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදන (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | 18.75 | 18.05 | 0.70 | 96 |
| ගමන් වියදම් | 5.75 | 4.06 | 1.69 | 71 |
| සැපයීම් | 2.37 | 2.35 | 0.02 | 99 |
| නඩත්තු වියදම් | 1.70 | 1.41 | 0.29 | 83 |
| ගිවිසුම් ගත සේවා | 0.74 | 0.54 | 0.20 | 73 |
| මාරු කිරීම් | 0.05 | 0.03 | 0.02 | 67 |
| **එකතුව** | **29.36** | **26.44** | **2.92** | |

## මූලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදන (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0.30 | 0.10 | 0.20 | 33 |
| යන්ත්‍ර සූත්‍ර සවිකිරීම් හා උපකරණ | 0.30 | 0.20 | 0.10 | 67 |
| වාහන | 0.50 | - | 0.50 | - |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 0.20 | 0.16 | 0.04 | 80 |
| දැණුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 1.00 | 0.60 | 0.40 | 60 |
| **එකතුව** | **2.30** | **1.06** | **1.24** | |

## කාර්ය සාධන ඉලක්ක - 2018

| අනු අංකය | ආයතනයේ අරමුණ | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 |
| 1 | දෙපාර්තමේන්තු අධීක්ෂණය | අධීක්ෂණය කල වාර ගණන | 12 | 12 | 12 |
| 2 | ප්‍රගති සමාලෝචනය | ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව | 12 | 12 | 12 |
| 3 | ධාරිතා සංවර්ධන වැඩසටහන් | වැඩසටහන් සංඛ්‍යාව | 04 | 01 | 03 |
| 4 | ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීම | ක්ෂේත්‍ර පරීක්ෂණ සංඛ්‍යාව | 30 | 50 | 75 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය - 2018

| ප්‍රධාන අරමුණු | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම | ජාත්‍යන්තර කාන්තා දින සැමරීම් වැඩසටහන | කාන්තාවන් දැනුමින් සන්නද්ධ කිරීම | 0.30 | 0.30 | 100 |
| කාන්තාවන් ගේ දැනුම කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම | කාන්තා සවිබල ගැන්වීම (තෝරා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස) | සවිබල ගන්වන ලද කාන්තාවන් | 1.00 | 0.93 | 100 |
| ස්වං රැකියා උත්පාදනය | දිරිය කාන්තා වැඩ සටහන | ආදායම් උත්පාදනය, ජීවන තත්වය නඟා සිටුවීම | 2.85 | 2.85 | 100 |
| අඩු ආදායම්ලාභී වැන්දඹු කාන්තාවන්ගේ නිවාස ගැටළුව විසඳීමට දායක වීම | වැන්දඹු හෝ කාන්තා මූලික අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ඉදිකිරීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා මුල්‍යාධාර ලබා දිම | පළාතේ තෝරාගත් අඩු ආදායම් ලාභී වැන්දඹු කාන්තාවන්ගේ පවුල්වල නිවාස ගැටළුව විසඳීමට සහාය වීම | 3.50 | 3.50 | 100 |
| අඩු ආදායම්ලාභි පවුල් වල නිවාස ගැටළුව විසඳීමට දායක වීම | අඩු ආදායම්ලාභි නිවාස ඉදි කිරීම හෝ අලුත් වැඩියා කර ගැනීම සඳහා ද්‍රව්‍ය ආධාර ලබා දීම | පළාතේ තෝරාගත් අඩු ආදායම් ලාභී වැන්දඹු කාන්තාවන්ගේ පවුල්වල නිවාස ගැටළුව විසඳීමට සහාය වීම | 5.00 | 4.90 | 100 |
| නිවාස ගැටළුව විසඳීමට දායක වීම | අඩු ආදායම්ලාභි නිවාස ඉදි කිරීම හෝ අලුත් වැඩියා කර ගැනීම සඳහා මුල්‍යාධාර ලබා දීම | පළාතේ අඩු ආදායම් ලාභී පවුල්වල නිවාස ගැටළුව විසඳීමට සහාය වීම | 10 | 10 | 100 |
| **එකතුව** | | | **22.7** | **22.6** | **99.57** |

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය.

| අරමුණු | ඉලක්ක | | අපේක්ෂිත ප්‍රතිඵල | |
|---|---|---|---|---|
| | 2020 | 2021 | කෙටිකාලීන | දිගුකාලින |
| තෝරාගත් අඩු ආදායම්ලාභීන් වෙත නිවාස ආධාර ලබා දීම | 1500 | 1750 | අළුත්වැඩියා වූ නිවාස | ජීවන තත්වය ඉහල නැංවීම, යටිතල පහසුකම් සංවර්ධනය |
| තෝරාගත් වැන්දඹු කාන්තාවන් සඳහා නිවාස ආධර ලබා දීම. | 200 | 250 | අළුත්වැඩියා වූ නිවාස | |
| තෝරාගත් කාන්තාවන් සඳහා දැනුවත් කිරිමේ වැඩසටහන් (සජීවීකරණ) පැවත්වීම | 15 | 20 | දැනුවත් වූ කාන්තාවන් | කාන්තාවන් සවිබල ගැන්වීම |
| තෝරාගත් ස්වයං රැකියාලාභී කාන්තාවන් සවිබල ගැන්වීම. | 200 | 250 | අළුතින් බිහිවූ ස්වයං රැකියාවන් | ආදායම් උත්පාදනය හා ජීවන තත්වය |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

අමාත්‍යාංශය වෙත පැවරි ඇති ප්‍රධාන කාර්යයන් වනුයේ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව සහ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය යන ආයතනවල අධීක්ෂණය, නියාමනය හා සම්බන්ධීකරණය පවත්වාගෙන යාම වේ. අමාත්‍යාංශය වෙත පැවරී ඇති ඍජු විෂයක් වනුයේ කාන්තා සංවර්ධන කටයුතු හා නිවාස සංවර්ධන කටයුතු වේ.

අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා අධිකාරිය සමඟ මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් හා කාර්ය මණ්ඩල රැස්වීම් මඟින් හා ක්ෂේත්‍ර පරික්ෂණ මඟින් නිරන්තර අධීක්ෂණයට ලක් කරන ලදි. එම හේතුවෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය 99%කි. පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය 100% කි. ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන ඉදි කිරිම හැර අනෙකුත් සියළුම වැඩ සටහන් වල ප්‍රගතිය 100%කි.

අමාත්‍යාංශය වෙත පැවරි ඇති ඍජු විෂයන් අතරින් ප්‍රධානතම විෂය වනුයේ නිවාස සංවර්ධනයයි. තිරසර සංවර්ධන අරමුණු යටතේ අංක 01 හි සඳහන් “ සෑම දෙසකට සෑම ආකාරයකින්ම පවතින දිළිඳු බව නිම කිරිම” සහ තිරසර සංවර්ධන අරමුණු අංක 11 හි සඳහන් නගර සහ ජනාවාස පරිපූර්ණ , ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම යන තේමාවන් යටතේ අඩු ආදායම්ලාභි පවුල් සඳහා නිවාස ආධාර ලබා දීම සිදු කරන ලදි. මේ යටතේ මූල්‍යාධාර සහ ද්‍රව්‍ය ආධාර ලබා දෙන ලදි ද්‍රව්‍ය ආධාර 633 දෙනෙකු වෙත ලබා දෙන ලදි. මෙම වැඩ සටහනේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100%කි.

කාන්තා සංවර්ධන විෂය යටතේ කාන්තා සජීවිකරණ හා බල ගැන්වීමේ වැඩසටහන් 10ක් තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10ක සාර්ථකව පවත්වන ලදි.

**2018** වර්ෂයේදී මෙම අමාත්‍යාංශය වෙත ප්‍රාග්ධන අරමුදල් ලෙස රු.මි 39.36ක ප්‍රතිපාදනයක් වෙන්කර තිබුණ අතර පුනරාවර්තන වියදම් ලෙස රු.මි 29.36ක ප්‍රතිපාදනයක් වෙන් කර තිබුණි. ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් සමස්ත මූල්‍ය උපයෝජනය 99.57% ක ඉතා ඉහළ ප්‍රතිශතයක් අත්පත් කර ගෙන ඇත.



පුනරාවර්තන වැය ප්‍රතිපාදන යටතේ එම උපයෝජනයෙන් 90 % ක ප්‍රතිශතයකි.

ස්වකීය අරමුණු ඉටුකර ගැනීම සඳහා අමාත්‍යාංශය සතු භෞතික සම්පත් යොදවන ලදි. අමාත්‍යාංශය වෙත වෙන් කර ඇති වාහන, කාර්යාල උපකරණ ඇතුළු සියළුම භෞතික සම්පත් වලින් ඉතා ඉහළ පිටුවහලක් ලැබුණු බව ප්‍රකාශ කළ හැක.

2018 වර්ෂයේදී අමාත්‍යාංශය සතුව මානව සම්පත්වල හිඟයක් නොතිබුණි. සමස්ත කාර්ය මණ්ඩලය කැපවීම මත අමාත්‍යාංශය සතු ඉහත අරමුණු ඉටුකර ගැනීම සඳහා ඍජු දායකත්වය ලබා දීම මත කාර්ය සාධනයේ අපේක්ෂිත මට්ටම කරා ළඟා විය හැකි විය.

# 10.1. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

උතුරු මැද පළාත තුළ පවතින කෘෂිකාර්මික ජීවන රටාව ගොඩනැගීම සඳහා හා කුඩා වාරිමාර්ග පද්ධතියේ සංවර්ධනය සඳහා පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව ප්‍රධාන මෙහෙයක් සිදු කරමින් පවතී. එහිදී ප්‍රධාන වශයෙන් උතුරු මැද පළාත තුළ පවතින සුළු වාරිමාර්ග තුන්දහස් දෙසිය විසි හයක (3226) ගොවි බිම් අක්කර එක්ලක්ෂ තිස්නව දහසකට (139,000) ආසන්න ප්‍රමාණයක් පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්යය හා බැඳේ. එම වැව් පද්ධතිය තව දුරටත් සංවර්ධනය කරමින් හා ප්‍රශස්ත මට්ටමකින් නඩත්තුකර පවත්වාගෙන යමින් පළාතේ ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය හා ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම සඳහා පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව කටයුතු කරමින් පවතී.

එහිලා ප්‍රධාන උප කාර්යාලය (කලාප අංක 01) කහටගස්දිගිලිය කැකිරාව හන්දිය අසල පිහිටුවන ලදී. වාරිමාර්ග ඉංජිනේරුවරයෙකු යටතේ පාලනයවන උප කාර්යාලය යටතේ හොරොව්පොතන,කහටගස්දිගිලිය,කැබිතිගො ල්ලෑව, මැදවච්චිය, මිහින්තලේ, පදවිය හා රඹෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි වාරි කටයුතු සඳහා වැඩ කටයුතු සිදු කරනු ලැබේ.

පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය තුළ දැනට පිහිටුවා ඇති කලාප අංක 2 යටතේ ගල්නෑව, ඉපලෝගම, මහ විලච්චිය, නොච්චියාගම, පලාගල, ම.නු.ප., රාජාංගනය, තලාව ,නැ.නු.ප හා තඹුත්තේගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි වාරි කටයුතු සඳහා වැඩ කටයුතු සිදු කරන ලැබේ.

එසේම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය තුළ දැනට පිහිටුවා ඇති කලාප අංක 3 මගින් කැකිරාව, ගලෙන්බිඳුණුවැව, පලුගස්වැව, තිරප්පනේ, දිඹුලාගල, ඇලහැර, හිඟුරක්ගොඩ, ලංකාපුර, මැදිරිගිරිය, තමන්කඩුව හා වැලිකන්ද යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි වාරි කටයුතු සඳහා වැඩ කටයුතු සිදු කරනු ලැබේ.

මීට අමතරව දෙපාර්තමේන්තුව සතුව පවතින තත්ත්ව පාලන ඒකකය මගින් මුළු පළාතම ආවරණය වන පරිදි සියලුම වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතුවල තත්ත්ව පාලන කටයුතු සිදු කරනු ලැබේ. ආයතන අංශය ,සැලසුම් අංශය හා ගිණුම් අංශයද දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය තුළ පිහිටුවා ඇත.

## පළාත් වාරිමාර්ග පද්ධති

| විස්තරය | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| වාරිමාර්ග වැව් ප්‍රමාණය | 2991 | 235 | 3,226 |
| වැව් මගින් වගා කරන ලද කුඹුරු අක්කර ප්‍රමාණය (අක්කර) | 128,608 | 19,881 | 138,877 |
| ගොවි පවුල් සංඛ්‍යාව | 83,885 | 5,779 | 89,664 |

## ප්‍රධාන කෘෂිකාර්මික ජලාශ

| අනුරාධපුර දිස්ත්‍රික්කය | | | |
|---|---|---|---|
| වැවේ නම | ජල ධාරිතාවය (අක්කර අඩි) | ධාරා ප්‍රදේශය (අක්කර) | මතුපිට විශාලත්වය (අක්කර) |
| පදවිය | 85,000 | 83,200 | 6,000 |
| වාහල්කඩ | 43,000 | 12,600 | 2,500 |
| නාච්චාදූව | 45,150 | 94,400 | 3,000 |
| තුරුවිල වැව | 5,190 | 12,200 | 500 |
| නුවර වැව | 36,050 | 13,000 | 2,500 |
| මහකනදරා වැව | 36,250 | 50,400 | 3,200 |
| මහවිලච්චිය වැව | 31,500 | 56,560 | 2,500 |
| තිසා වැව | 3,500 | 800 | 350 |
| බසවක්කුලම වැව | 1,910 | 1,440 | 200 |
| රාජාංගනය වැව | 81,603 | 1,188,000 | 4,000 |
| අංගමුව වැව | 14,400 | 5,000 | 1,200 |
| හුරුළු වැව | 55,000 | 308,000 | 3,500 |
| මානන්කට්ටිය වැව | 7,600 | 9,520 | 750 |

| පොළොන්නරුව දිස්ත්‍රික්කය | | | |
|---|---|---|---|
| වැවේ නම | ජල ධාරිතාවය (අක්කර අඩි) | ධාරා ප්‍රදේශය (අක්කර) | මතුපිට විශාලත්වය (අක්කර) |
| පරාක්‍රම සමුද්‍රය | 110,000 | 17,920 | 6,275 |
| මින්නේරි වැව | 110,000 | 59,264 | 6,300 |
| ගිරිතලේ වැව | 18,800 | 6,016 | 775 |
| රොට වැව | 1,028 | 4,800 | - |
| කවුඩුළු වැව | 104,000 | 22,400 | 6,400 |
| බේබියා වැට | 938 | 1,856 | 261 |
| අඹගස් වැව | 4,000 | 12,512 | 318 |
| මහහල්මිල්ල වැව | 900 | 1,575 | 260 |
| ඇල්ලේ වැව | 1,100 | 330 | - |
| ජේස්කුලම වැව | 1,750 | 439 | 535 |

**අස්වද්දා ඇති බිම් ප්‍රමාණය අක්කර 200ට වැඩි (විශාල වාරි මාර්ග) කෘෂි කාර්මික කටයුතු සඳහා ජලය ලබාගන්නා ජලාශ**

## දැක්ම

"ප්‍රශස්ත වාරි කළමනාකරණයක්, සෞභාග්‍යමත් ගොවි ප්‍රජාවක්."

## මෙහෙවර

"අතීත උරුමයන් ආරක්ෂාකර ගනිමින්, තාක්ෂණික හා උපදේශන සේවා සැපයීමෙන් සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුතුව සුළු හා මධ්‍ය වාරි කර්මාන්තයන්හී ගුණාත්මක සංවර්ධනය, නඩත්තුව, පරිසර ආරක්ෂණය සහ ජල සම්පත ප්‍රශස්ථ ලෙස උපයෝජනය කිරීම මගින් පළාතේ තිරසාර සංවර්ධනයේ ප්‍රමුඛ හවුල්කරු වීම."

## දිගුකාලීන අරමුණු

- සංවර්ධිත හා මනා නඩත්තුවෙන් යුතු සුළු හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහි කිරීම.
- ජල කළමනාකරණය පිළිබඳ ප්‍රශස්ත දැනුමක් සහ අවබෝධයක් ලබා දීම.
- සංරක්ෂිත හා ආරක්ෂිත පාරිසරික පද්ධතියක් ඇති කිරීම.
- වර්ධනය වූ ආයතනික ධාරිතාවයක් ඇති කිරීම.
- යහපාලනය.

## කෙටිකාලීන අරමුණු

- ඇළ මාර්ග පද්ධතීන් මනා ලෙස සංවර්ධනය කරමින් නිසි පරිදි නඩත්තු වැඩ පිළිවෙළක් පවත්වාගෙන යාම.
- ගංවතුර උවදුර අවම මට්ටමකට පත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- අවදානම් තත්වයේ පවතින වැව් සංවර්ධනය කිරීම.
- වාරිමාර්ග රක්ෂිත සලකුණු කිරීම මගින් අනවසර ක්‍රියා අවම කිරීම.
- රොන්මඩ හා ජලජ ශාක ඉවත් කිරීම තුළින් ජල ධාරිතාවය සංවර්ධනය.
- දැනුමෙන් හා හැකියාවෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යාම.
- පසු අස්වනු හානිය අවම කිරීම, යාන්ත්‍රික කෘෂි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- වාරි පද්ධති පුනරුත්ථාපනය කිරීම.
- වාරි පද්ධති නඩත්තු කිරීම.
- වාරි පද්ධතිවල අවශ්‍ය අංග අලුතින් ඉදි කිරීම.
- ජල කළමනාකරණ භාවිතයන් සංවර්ධනය කිරීම.
- කාර්යාල පද්ධති ධාරිතාවය ඉහළ නැංවීම
- ජල ගැලීම් හා හානි කළමනාකරණය කිරීම.
- පෝෂක ප්‍රදේශ සංවර්ධනය කිරීම.
- අංග සම්පූර්ණ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.
- තත්ත්ව පාලන ඒකකය පවත්වාගෙන යාම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

| අ.අ | කාර්යය | උපායමාර්ග (ය) |
|---|---|---|
| 01 | වාරි පද්ධති පුනරුත්ථාපනය කිරීම | ● මුලස්ථායි වැඩ කොටස් පුනරුත්ථාපනය |
| | | ● ඇල වේලි පුනරුත්ථාපනය |
| | | ● කෘෂි මාර්ග පුනරුතථාපනය |
| | | ● පෝෂක ඇල මාර්ග පුනරුත්ථාපනය |
| | | ● පෝෂක ප්‍රදේශ පුනරුත්ථාපනය |
| | | ● අපවහන ඇල මාර්ග පුනරුත්ථාපනය |
| | | ● එල්ලංගා පද්ධති පුනරුත්ථාපනය |
| 02 | වාරි පද්ධති නඩත්තු කිරිම | ● මුලස්ථායි වැඩ කොටස් නඩත්තු කිරිම |
| | | ● ඇල වේලි නඩත්තු කිරිම |
| | | ● කෘෂි මාර්ග නඩත්තු කිරිම |
| | | ● පෝෂක ඇල නඩත්තු කිරිම |
| | | ● අපවහන ඇල නඩත්තු කිරිම |
| | | ● පෝෂක ප්‍රදේශ නඩත්තු කිරිම |
| | | ● එල්ලංගා පද්ධති නඩත්තු කිරිම |
| 03 | වාරි පද්ධතිවල අවශ්‍ය අංග අළුතින් ඉදි කිරීම | ● අමුණු ඉදිකිරීම |
| | | ● ඇල වේලි ඉදිකිරිම |
| | | ● කෘෂි මාර්ග ඉදිකිරිම |
| | | ● පෝෂක ඇල ඉදිකිරිම |
| | | ● මුලස්ථායි වැඩ කොටස් ඉදිකිරිම |
| | | ● අපවහන ඇල මාර්ග ඉදිකිරීම |
| | | ● පවතින ඇල මාර්ග කොන්ක්‍රීට් කිරීම |
| 04 | ජල කළමනාකරණ භාවිතයන් සංවර්ධනය කිරිම | ● ජල කළමනාකරණටය අදාල නිර්මිත ඉදිකිරීම |
| | | ● ගොවි සංවිධාන (වාරි කළමණාකරණ කමිටු) බල ගැන්විම |
| | | ● දැනුවත් කිරීමේ වැඩසටහන් |
| | | ● තාක්ෂණික පුහුණුව |
| | | ● ගොවි උපකරණ ලබා දිම |
| 05 | ජල ගැලීම සහ හානි කළමනාකරණය කිරිම | ● දත්ත රැස් කිරිම හා ගවේෂණය |
| | | ● ආපදා හඳුනා ගැනීම හා පිළියම් යෙදීම |
| | | ● දෙපාර්තමේන්තුවේ ආපදා කළමනාකරණ කමිටුව සක්‍රියව පවත්වාගෙන යාම හා ධාරිතා ixවර්ධනය |
| 06 | පෝෂක ප්‍රදේශ සංවර්ධනය කිරිම | ● සුදුසු ගස් වර්ග සිටුවීම හා නඩත්තුව |
| | | ● ප්‍රදේශ නිර්ණය කිරිම හා මැනුම් කිරිම |
| | | ● ගොවීන් දැනුවත් කිරිමේ වැඩසටහන් |
| | | ● සීමා මායිම් ලකුණු කිරිම |


| | | |
|---|---|---|
| | | • නෛතික රාමුව බලාත්මක කිරීම |
| 07 | අංග සම්පූර්ණ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම | • දත්ත පද්ධතිය ස්ථාපනය කිරීම |
| | | • දත්ත පද්ධතිය වාර්ෂිකව යාවත්කාලීන කිරීම |
| | | • තොරතුරු කළමනාකරණ ඒකකයේ ධාරිතාවය ඉහළ නැංවීම |
| 08 | තත්ත්ව පාලන ඒකකය පවත්වාගෙන යාම | • මානව හා භෞතික සම්පත් ඉහළ නැංවීම |
| 09 | කාර්යාල ධාරිතාවය ඉහළ නැංවීම | • මානව හා භෞතික සම්පත් වැඩිදියුණු කිරීම |

## අංශය නියෝජනය කරන තිරසාර සංවර්ධන අරමුණු

| | SDG NO |
|---|---|
| දරිද්‍රතාවයෙන් තොර වීම. | 01 |
| කුසගින්න තුරන් කිරීම. | 02 |
| නිරෝගී බව සහ යහ පැවැත්ම. | 03 |
| සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනය | 08 |
| කර්මාන්ත, නවෝත්පාදන හා යටිතල පහසුකම් | 09 |
| වගකීමෙන් යුතු පාරිභෝජනය සහ නිෂ්පාදනය. | 12 |
| දේශගුණික ක්‍රියාකරකම්. | 13 |

## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 104 |
| 2 | සේවයේ නියුතු | 81 |
| 3 | පුරප්පාඩු | 32 |
| 4 | අනියම් | 05 |




## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | 41.9 | 41.1 | 0.8 | 98 |
| ගමන් වියදම් | 1.4 | 1.4 | - | 100 |
| සැපයීම් | 4.6 | 4.6 | - | 100 |
| නඩත්තු වියදම් | 112 | 98 | 14 | 87 |
| ගිවිසුම්ගත සේවා | 6.7 | 6.5 | 0.2 | 97 |
| මාරු කිරීම් | 0.17 | 0.15 | 0.02 | 90 |
| **එකතුව** | **166.77** | **151.75** | **15.02** | **91** |

## පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම.

| අ.අ | ව්‍යාපෘතිය | ප්‍රධාන ක්‍රියාකාරකම | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 1 | පළාත් වාරිමාර්ග වැඩිදියුණු කිරීම | වැවෙහි ප්‍රධාන අංග අලුත්වැඩියා කිරීම ,ඇළමාර්ග ප්‍රතිසංස්කරණය | අවදානම තත්වය අඩුවීම ,ජල පරිමාව වැඩි කිරීම, වගා තිව්‍රතාව ඉහළ දැමීම ,කුඹුරු ඉඩම් පරිභෝජන හානිය අවම කිරීම | 2,120 |
| 2 | දෙපාර්තමේන්තු හා කලාප කාර්යාල ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම | ගොඩනැගිල්ල අලුත්වැඩියාව | වඩා හොඳ කාර්යාල පසුබිමක් ඇති කිරීම අවදානම අඩුවීම | 81 (සේවක) |

## මූලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 0.3 | 0.299 | - | 100 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම් හා උපකරණ | 0.918 | 0.918 | - | 100 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම | 114.239 | 106.655 | 7.584 | 93 |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (වාරිමාර්ග සංවර්ධන) | 105.400 | 101.508 | 3.891 | 96 |
| පළාත් සභා සංවර්ධන ප්‍රදාන (වාරිමාර්ග සංවර්ධන) | 5.439 | 4.729 | 0.710 | 87 |
| **එකතුව** | **226.30** | **214.11** | **12.19** | **95** |

## කාර්ය සාධන ඉලක්ක - 2018

| අනු අංකය | ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2019 |
| 01 | සංවර්ධිත හා මනා නඩත්තුවන් යුතු සුළු හා මාධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහිකිරීම | පුනරුත්ථාපනය හා නඩත්තු කටයුතු සිදු කරන ලද වැව් හා අමුණු ප්‍රමාණය | 80 | 43 | 50 |
| 02 | ජල කළමනාකරණය පිළිබද ප්‍රසස්ථ දැනුමක් සහ අවබෝධයක් ලබා දීම | පවත්වනලද පුහුණු වැඩ සටහන් හා රැස්වීම් ගණන | 80 | 43 | 50 |
| 03 | සංරක්ෂිත හා ආරක්ෂිත පාරසරික පද්ධතියක් ඇති කිරීම | පරිසර ආරක්ෂණය සඳහා සිදුකරන ලද ව්‍යාපෘති ගණන | 14 | - | 10 |
| 04 | වර්ධනය වූ ආයතනික ධාරිතාවක් ඇති කිරීම | ආයතනික සංවර්ධනය හා පුහුණු වැඩසටහන් ගණන | 3 | 2 | 3 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය.

| ප්‍රධන අරමුණු | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිඵල | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| මනා නඩත්තුවන් යුතු සුළු හා මාධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහිකිරීම | පළාත් වාරිමාර්ග පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම | අවදානම තත්වය අඩුවීම ,ජල පරිමාව වැඩි කිරීම, වගා තිවුරතාව ඉහල දැමීම ,කුඹුරු ඉඩම් පරිභෝජන හානිය අවම කිරීම, ගංවතුර උවදුර අවම මට්ටමකට පත් කිරිම. | 220.83 | 201.50 | 91 |
| ජල කළමනාකරණය පිළිබඳ දැනුම ලබා දීම | දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | දැනුවත් කිරීමේ හා පැහැදිලි කිරීමේ වැඩසටහන් පැවැත්වීම ,ගොවි සංවිධාන සාකච්චා පැවැත්වීම | - | - | |
| සංරක්ෂිත හා ආරක්ෂිත පාරසරික පද්ධතියක් ඇති කිරීම් | වැව් රක්ෂිත වෙන් කිරීම | වැව් රක්ෂිතය වෙන් කිරීම,පිඹුරු පත් සැකසීම ,පැල සිටුවීම ,අනවසර අල්ලා ගැනීම සම්බන්ධව ග්‍රාම සේවක හා ගොවි සංවිධාන දැනුවත් කිරීම | 3.0 | 0.01 | 1 |
| වර්ධනය වූ ආයතනික ධාරිතාවක් ඇති කිරීම | ආයතනික ධාරිතා සංවර්ධනය | පුහුණු වැඩමුළු පැවැත්වීම ,කාර්යාල උපකරණ මිලදී ගැනීම, ආයතනික ගොඩනැගිලි අලුත්වැඩියාව . | 1.61 | 1.61 | 100 |
| **එකතුව** | | | **225.45** | **203.12** | **90.10** |

* ජල කළමනාකරණය සඳහා සෑම ව්‍යාපෘතික් ආරම්භයේදී ගොවි සංවිධාන හා ප්‍රජාව දැනුවත් කිරීමේ රැස්වීම් පැවැත්වීම සිදුකර තිබේ.

## විදේශ ආධාර මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති තුළින් ජනිත කළ ප්‍රතිලාභ විශ්ලේෂණය කිරීම.

පාරිසරික සංවේදී කලාප සංරක්ෂණය කිරීම ව්‍යාපෘතිය හා වැව් ගම් පුබුදුව ව්‍යාපෘතිය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් ආධාර යටතේ ද කෘෂිකර්ම නව්‍යකරණ ව්‍යාපෘතිය (ASMP) ලෝක බැංකු ආධාර යටතේ ද පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහයෝගය යටතේ ක්‍රියාත්මක විය.

| ව්‍යාපෘතිය | තමන්ගේ විෂයපථයට අසුවන අරමුණ | මුදල(රු .මි) | | ප්‍රගතිය(%) | |
|---|---|---|---|---|---|
| | | වෙන් කළ | වැය කළ | භෞතික | මූල්‍ය |
| පාරසරික සංවේදී කලාප සංරක්ෂණය කිරීම,ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තුව UNDP | සංවර්ධිත හා මනා නඩත්තුවන් යුතු සුළු හා මාධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහිකිරීම,ජල කළමනාකරණය පිළිබඳ ප්‍රසස්ථ දැනුමක් සහ අවබෝධයක් ලබා දීම ,සංරක්ෂිත හා ආරක්ෂිත පාරසරික පද්ධතියක් ඇති කිරීම් | 41 | 36.5 | 100 | 100 |
| වැව් ගම් පුබුදුව ව්‍යාපෘතිය UNDP | සංවර්ධිත හා මනා නඩත්තුවෙන් යුතු සුළු හා මාධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහිකිරීම,ජල කළමනාකරණය පිළිබඳ ප්‍රශස්ත දැනුමක් සහ අවබෝධයක් ලබා දීම ,සංරක්ෂිත හා ආරක්ෂිත පාරිසරික පද්ධතියක් ඇති කිරීම. | 402 | - | 50 | - |
| කෘෂිකර්ම නව්‍යකරණ ව්‍යාපෘතිය - WB (ASMP) | දියුණු වූ හා මනා නඩත්තුවන් යුතු සුළු හා මාධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහිකිරීම,ජල කළමනාකරණය හා කෘෂි කර්මාන්තය දියුණු කිරීම. | 177.4 | - | 30 | - |

## විදේශ ආධාර මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මැදිහත් වීම - 2018

- පාරිසරික සංවේදී කලාප සංරක්ෂණය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තුව ව්‍යාපෘතිය යටතේ  අධීක්ෂණය , බිල්පත් පරික්ෂාව , තත්ව පාලන කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරිණ .
- වැව්  ගම් පුබුදුව ව්‍යාපෘතිය යටතේ  සියලු ව්‍යාපෘතීන්හි නිර්මාණ පරික්ෂාව රැස්වීම් සඳහා සහභාගි වීම , ඉදිකිරීම්හි තත්වය අධික්ෂණය හා අවසාන වූ ව්‍යාපෘති බාර ගැනීම දෙපාර්තමේන්තුව මගින් සිදු කරමින් පවතී. මෙම  ව්‍යාපෘතිය 2018 වර්ෂය ආරම්භ වූ අතර 2024 වර්ෂයදී අවසන් වීමට නියමිතය.
- කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය (ASMP) යටතේ සියලු ව්‍යාපෘති හඳුනා ගැනීම හා මූලික විමර්ශන වාර්තා සකස් කිරීම ,මැනුම් කරණය,නිර්මාණ සකස් කිරීම හා ඇස්තමේන්තු සකස් කිරීම,අධික්ෂණය ,තත්ත්ව පාලන කටයුතු , බිල්පත් පරික්ෂාව යන සියලුම කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදු කරමින් පවතින  අතර 2018 වසර සඳහා රු.මි. 177.4  ඇස්තමේන්තු කටයුතු සිදු කෙරුණ අතර ව්‍යාපෘති අධීක්‍ෂණ හා  2019 වර්ෂයට ව්‍යාපෘති හඳුනා ගැනීම් කටයුතුද සිදු කරමින් පවතී.මෙම  ව්‍යාපෘතියද  2018 වර්ෂය ආරම්භ වූ අතර 2023 වර්ෂයදී අවසන් වීමට නියමිතය.

## වෙනත් රේඛිය අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුවලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘති | විෂයපථයට අසුවන අරමුණ | මුදල(රු .මි) | | ප්‍රගතිය(%) | |
|---|---|---|---|---|---|
| | | වෙන් කළ | වැය කළ | භෞතික | මූල්‍ය |
| යුද්ධයෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීමේ ව්‍යාපෘතිය | සංවර්ධිත හා මනා නඩත්තුවන් යුතු සුළු හා මාධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහි කිරීම, ජල කළමනාකරණය හා කෘෂි කර්මාන්තය දියුණු කිරීම | 22.75 | - | 100 | |

| ව්‍යාපෘති | විෂයපථයට අසුවන අරමුණ | මුදල(රු .මි) | | ප්‍රගතිය(%) | |
|---|---|---|---|---|---|
| | | වෙන් කළ | වැය කළ | භෞතික | මූල්‍ය |
| ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය (ග්‍රාම ශක්ති වැඩසටහන ) | සංවර්ධිත හා මනා නඩත්තුවන් යුතු සුළු හා මාධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහිකිරීම,ජල කළමනාකරණය හා කෘෂි කර්මාන්තය දියුණු කිරීම | 69.4 | - | - | - |
| පිබිදෙමු පොළොන්නරුව දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන | සංවර්ධිත හා මනා නඩත්තුවන් යුතු සුළු හා මාධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහිකිරීම,ජල කළමනාකරණය හා කෘෂි කර්මාන්තය දියුණු කිරීම | 34.9 | - | 100 | 20.9 |
| ලෝක අහාර වැඩසටහන | සංවර්ධිත හා මනා නඩත්තුවෙන් යුතු සුළු හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහිකිරීම, ජල කළමනාකරණය හා කෘෂි කර්මාන්තය දියුණු කිරීම | 8.07 | - | 100 | - |

- යුද්ධයෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීමේ ව්‍යාපෘතිය යටතේ මැනුම් කරණය, නිර්මාණ සකස් කිරීම හා ඇස්තමේන්තු සකස් කිරීම, අධික්ෂණය , තත්ත්ව පාලන කටයුතු ,බිල්පත් පරික්ෂාව වැනි කටයුතු මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරුණ අතර ව්‍යාපෘති 15 න් ව්‍යාපෘති 9ක් සම්පූර්ණයෙන්ම නිමකර අවසන් බිල්පත් පරික්ෂාකර ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා දෙන ලදී. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් සිදු කෙරිණ.

- ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය ව්‍යාපෘති යටතේ අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ජනාධිපති කාර්යාලය සමග එක්ව මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය නබදගස්දිගිලිය එල්ලංගා පද්ධතියේ ව්‍යාපෘති 8ක මූලික විමර්ශන කටයුතු කිරීම,ඇස්තමේන්තු සකස් කිරීම හා අධීක්ෂණ, තත්ත්ව පාලන කටයුතු හා බිල්පත් පරික්ෂාව කටයුතු දෙපර්තමේන්තුව මගින් සිදු කරමින් පවතී. මෙහි ඉදිකිරීම් කටයුතු යුධ හමුදාව මගින් සිදු වන අතර ව්‍යාපෘතිය ආරම්භය 2018 වර්ෂය අවසාන කාලයදී සිදුවිය.2019 වර්ෂයට ව්‍යාපෘති හඳුනා ගැනීමද සිදු කර ඇත.
- පිබිදෙමු පොළොන්නරුව දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා එක්ව සිදු කරන ලදී .එම ව්‍යාපෘති ද
  - ✓ ඇස්තමේන්තු සකස් කිරීම
  - ✓ අධීක්ෂණ කටයුතු,
  - ✓ තත්ත්ව පාලන කටයුතු
  - ✓ බිල්පත් පරික්ෂාව යන කාර්යයන් සඳහා දෙපාර්තමේන්තුව මගින්

  තාක්ෂණික සහාය ලබා දෙන ලදී.
- ලෝක ආහාර වැඩසටහන අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා එක්ව සිදු කරන ලද අතර එහිදී මැදවච්චිය කොට්ඨාශයේ ව්‍යාපෘති 3ක ඇස්තමේන්තු සකස් කිරීම හා අධීක්ෂණ කටයුතු හා බිල්පත් පරික්ෂාව දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරිණ .

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

2019 වර්ෂයේ ලැබේ යැයි අපේක්ෂිත ප්‍රතිපාදන සඳහා මේ වන විට (2018 නොවැම්බර් මස සිට ) ව්‍යාපෘති හඳුනා ගැනීමේ කටයුතු කරමින් පවතී. ව්‍යාපෘති හඳුනා ගැනීම 2019 මුල් මාසය තුළ සිදුකිරීමට සැලසුම් කර ඇත. එමෙන්ම පෙබරවාරි මාසය ඇතුළත එම ව්‍යාපෘතිවල මූලික විමර්ශන වාර්තා ද ,මාර්තු මස අවසානයට පෙර ඇස්තමේන්තු කටයුතු ද නිම කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව අප්‍රේල් මස මුල් සතිය ඇතුළත ප්‍රසම්පාදන කටයුතු අවසන් කිරීමටත් මැයි මාසයේදී ව්‍යාපෘති ආරම්භ කිරීමටත් බලාපොරොත්තු වේ. එමගින් 2019 වර්ෂයේ අපේක්ෂිත කාර්යය සාධනය ළඟාකර ගැනීමටත් අදහස් කර ඇත.

මිලදී ගැනීම් හා පුහුණු වැඩසටහන් මේ වනවිට හඳුනාගෙන ඇති අතර ඒවා නිශ්චිත කිරීමේ කටයුතු මුල් මාස 2 ,3 අතර සිදුකර වර්ෂය මැද භාගයේදී නිම කිරීමට සැලසුම් කර ඇත. එමෙන්ම දැනට ක්‍රියාත්මක වෙමින් පවතින කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය (ASMP) ව්‍යාපෘතිය 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ක්‍රියාත්මක කිරීමට නියමිත අතර ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දෙමින් ව්‍යාපෘති කාර්යාලය හා එක්ව ඉදිරි ව්‍යාපෘති සැලසුම් සකස්කර ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

එමෙන්ම UNDP ව්‍යාපෘතිය 2018 වර්ෂයේ සිට අවුරුදු 6 ක් ක්‍රියාත්මක වීමට නියමිත අතර ඒ සඳහාද අවශ්‍ය තාක්‍ෂණික හා මග පෙන්වීම ලබා දෙමින් ලබා දෙමින්ද ,ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වීමට නියමිත ව්‍යාපෘතිය සඳහාද අවශ්‍ය සහාය ලබා දෙමින් අනාගත අපේක්‍ෂාවන් ළඟා කර ගැනීමට සැලසුම් කරමින් ඇත.

දැනට දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය තුළ පිහිටුවා ඇති කලාප 03 කාර්යාලය කැකිරාව ප්‍රදේශයේ පිහිටුවීමට සැලසුම්කර ඇති අතර එය 2019 වර්ෂයේදී ස්ථාපනයකර ගොවි ජනතාවට වඩාත් සමීප සේවාවක් සැපයීමට අපේක්ෂා කෙරේ. තවද තත්ත්ව පාලන ඒකකය සඳහා අවශ්‍ය නවීන තාක්ෂණික උපකරණ ලබා ගැනීමට බලාපොරොත්තුවන අතර එමගින් තත්ත්ව පාලන ගුණාත්මක බව හා කාර්යක්‍ෂමතාව වැඩිදියුණු කිරීමට අදහස් කෙරේ.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2018 වර්ෂය තුළ මුදල් වියදම් කිරීමේදී වාරිමාර්ග ව්‍යාපෘති 89 ක් ක්‍රියාත්මක කළ අතර ඉන් ව්‍යාපෘති 86 ක් සම්පූර්ණයෙන්ම අවසන් කිරීමට හැකි වූ අතර ව්‍යාපෘති 03 ක වැඩ අවසන් අදියර දක්වා ගෙන ඒමට හැකිවිය. මූලධන වත්කම් අත්පත් කර ගැනීම හා වැඩි දියුණු කිරීම යටතේ සිදු කරන ලද ගොඩනැගිලි ඉදිකිරීම් හා පුනරුත්ථාපන ව්‍යාපෘතියක් ද අවසන් කරන ලදී.

එමෙන්ම පසුගිය වර්ෂය තුළ අවිච්ඡේද ව්‍යාපෘති 45 ක් සිදු කළ අතර එම සියලුම ව්‍යාපෘති සාර්ථකව අවසන් කරන ලදී. ඒ අනුව සමස්ත දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රගතිය 91% ළඟාකර ගැනීමට හැකි විය. ඊට අමතරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල , දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා විදේශ ව්‍යාපෘති ආයතන සමග එක්ව රු.මි 749ක පමණ වටිනාකමින් යුත් ව්‍යාපෘති 108 ක් සඳහා ඇස්තමේන්තු සකස් කිරීම ,අධීක්ෂණය කිරීම හා බිල්පත් සකස් කිරීම හෝ පරික්ෂා කිරීම කටයුතු ද අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම ද සිදු විය.

දෙපාර්තමේන්තුව සතුව පවතින අනුමත හා දැනට පවතින කාර්යය මණ්ඩලය අදාල අරමුණු ඉටු කරගැනීම සඳහා කාර්යය මණ්ඩල සැලැස්මට අනුව සුදුසු පරිදි අනුගත කර ඇත. තවද දෙපාර්තමේන්තුව මගින් පිළියෙළ කරන සංවර්ධන සැලැස්ම අනුව අදාල අංශයන්ට අරමුණු ළඟා කරගැනීම සඳහා ඉලක්කගත රාජකාරි පැවරීම, ඒවා නිරන්තරයෙන් අධික්ෂණ කරමින් සෑම සතියකම මාණ්ඩලික නිලධාරී රැස්වීම් පැවැත්වීම හා සෑම මසකම ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වමින් ඉලක්කගත අරමුණු ඉටු කරගැනීම සඳහා මානව සම්පත ඒ සඳහා යොමු කිරීම සාර්ථකව පසුගිය වසර තුළ සිදු කරන ලදී .

ව්‍යාපෘති අධීක්‍ෂණ කිරීමේ දී ප්‍රවාහන පහසුකම් පිළිබඳ ගැටළු තිබුන ද පැවති වාහන සංචිතය ක්ෂේත්‍ර ගත රාජකාරි සඳහා ප්‍රශස්ත ලෙස කලාප කාර්යාල වෙත ඒවා ලබා දෙමින් සාර්ථක ප්‍රගතියක් ළඟා කර ගන්න ලදී.

කහටගස්දිගිලිය උප කාර්යාලය පිහිටුවීම මගින් එම ප්‍රදේශයේ මහජන ප්‍රජාවට ගැටළු නිරාකරණ කිරීම සඳහා අනුරාධපුරයට පැමිණීමේ දුෂ්කරතාවය මගහරවා ගැනීමට හැකිවීම හා මහජන සේවාවන් සමීප කරලීමට හැකි විය.

දෙපාර්තමේන්තුව සතුව පවතින තත්ත්ව පාලන ඒකකය මගින් සියලුම ව්‍යාපෘතීන්හි තත්ත්ව පාලන කටයුතු සිදු කිරීම හා වඩා ගුණාත්මක ප්‍රතිඵලයක් ළගා කරගැනීමට හැකි විය. දෙපාර්තමේන්තුව සතුව ස්ථිර ගොඩනැගිල්ලක් පැවතීම හා සියලුම තාක්ෂණික උපකරණ , අදාළ නිලධාරියාටම නම් කර වගකීම ලබා දීම මගින් වඩා හොඳ ප්‍රතිඵලයක් ලබා ගැනීමට හැකි විය.

එසේ වුවද කාර්ය සාධනය ළගාකර ගැනීමේ දී ගැටළු හා අභියෝගවලට මුහුණ දීමට ද සිදුවිය. විශේෂයෙන්ම වාරිමාර්ග ව්‍යාපෘති මූලික වශයෙන් ඉදිකිරීමට සුදුසු අමුද්‍රව්‍ය ඒ සඳහා සුදුසු කාලගුණික තත්වයක් පැවතිය යුතුය. අධික නියං තත්වයත් හා වර්ෂාවත් ඉදිකිරීම් කටයුතු සඳහා බාධාවක් ඇති කරයි. තවද කුඹුරු අස්වනු නෙලන කාලයදී ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට නොහැකි වේ. ඒ අනුව ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම මැයි මාසයේදිවත් සිදු කර යුතු අතර අවසන් කිරීම ඔක්තෝම්බර් මසයදී සිදු විය යුතුය.ඒ අනුව ව්‍යාපෘති හඳුනා ගැනීම ඇස්තමේන්තු සකස් කිරීම හා ප්‍රසම්පාදන කටයුතු මැයි මාසය වන විට අවසන් කිරීම දෙපාර්තමේන්තුව සතුව පවතින අභියෝගක් වේ. එය පසුගිය වසර තුළදී සාර්ථකව සැලැස්මට අනුකූලව සිදුකිරීමට හැකි විය.

තව ද ඉදිකිරීම් කටයුතු කොන්ත්‍රාත් ආයතනයක් සමග ගිවිසුම් ගතව එම ආයතනය මගින් සිදුකර ගැනිමක් කරන අතර ව්‍යාපෘතිහි ප්‍රගතිය සඳහා කොන්ත්‍රාත් ආයතනයේ කාර්යක්ෂමතාව බලපානු ඇත. ඒ අනුව පසුගිය වසර තුළ සිදුකරනු ලැබූ ව්‍යාපෘති 89කින් ව්‍යාපෘති 3ක් කාලගුණික හා කොන්ත්‍රාත් ආයතනයේ කාර්යක්ෂමතාව දුර්වලතාවය අනුව අවසන්කර ගැනීමට නොහැකි විය .එම ව්‍යාපෘති 3න් 2 ක් 95 % භෞතික ප්‍රගතියකට ළඟාකර ගැනීමට හැකි විය.

කෙසේ වුව ද 2018 වර්ෂයේ දි දෙපාර්තමේන්තුව ලබා දෙන මූල්‍ය ප්‍රතිපාදන ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රශස්ත ලෙස වෙන් කිරීම මගින් මහජනතාවට හා සේවකයන්ගේ අභිවෘද්ධිය සඳහා උපරිම ආකාරයෙන් උපයෝජනය කිරීමට හැකි විය.

# 10.2. පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

13 වන ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ යටතේ ස්ථාපිත පළාත් සභා නම් නෛතික සංවිධාන ව්‍යුහයේ තවත් එක් විෂයයක් ලෙස ඉඩම් විෂයය හඳුන්වා දිය හැකිය. ඒ අනුව යමින් 1989 වර්ෂයේ ප්‍රධාන අමාත්‍යාංශය යටතේ පළාත් ඉඩම් කාර්යාලය නමින් මෙම දෙපාර්තමේන්තුව ආරම්භ විය. ආරම්භයේදී ඉඩම් අධ්‍යක්ෂක යන තනතුර යටතේ ආරම්භ වී වසරක් ඇවෑමෙන් එනම් 1990 වර්ෂයේදී දෙපාර්තමේන්තුවක් බවට පත් කරන ලදී. ඒ අනුව ඉඩම් කොමසාරිස්වරයෙකුගෙන් සමන්විතව උතුරු මැද පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව ලෙස මෙම දෙපාර්තමේන්තුව ස්ථාපිත විය. මේ වන විට නිළධාරින් සහ සෙසු කාර්ය මණ්ඩලය 92 දෙනෙකුගෙන් සමන්විත වේ. පළාත් සභාවේ ආදායම් රැස් කරන්නන් අතර ප්‍රමුඛ ස්ථානයෙහි ලා සිටින මෙම දෙපාර්තමේන්තුව ජනතාවගේ මූලික අවශ්‍යතාවයක් වන ඉඩමක හිමිකම ලබාදීමේ කාර්යය සඳහා නිරන්තර කැපවී සිටී.

**ඉඩම් පරිහරණය**

| | අනුරාධපුර (හෙක්ටයාර) | පොළොන්නරුව (හෙක්ටයාර) | උතුරු මැද පළාත (හෙක්ටයාර) |
|---|---|---|---|
| ගෙවතු | 96,424 | 48,926.14 | 145,350.14 |
| කුඹුරු | 131,222 | 83,453.56 | 214,675.56 |
| පොල් | 1,865 | 873.24 | 2,738.24 |
| වෙනත් වගාවන් | 8,577 | 3374.99 | 11,951.99 |
| වනාන්තර | | | |
| • ඝණ | 199,428 | 163163.05 | 362,591.05 |
| • විවෘත | 15,922 | 4445.64 | 20,367.64 |
| • වගා කළ | 5,477 | 1718.68 | 7,195. 68 |
| • ලඳු කැලෑ | 191,100 | 11473.13 | 202,573.13 |
| වගුරු බිම් | 2,542 | 4156.45 | 6,698.45 |
| ජලාශ | 55,241 | 16240.86 | 71,481.86 |
| ඉදිකිරීම් | 1,585 | 1229.44 | 2,814.44 |
| ගල්පර | 2,949 | 5576.66 | 8,525.66 |
| මුඩු බිම් | 82 | 2006.03 | 2088.03 |
| වෙනත්/සුසාන භූමි/මාර්ග | 5,486 | 0 | 5,486 |
| **එකතුව** | **717,900** | **346,637.86** | **1,064,537.87** |

## දැක්ම

"නීත්‍යානුකූල ඉඩමක් - සංවර්ධිත ප්‍රජාවක්"

## මෙහෙවර

"නෛතික රාමුවට අනුකූලව යෝග්‍ය රජයේ ඉඩම් සුදුසුකම් සහිත ප්‍රජාවට විධිමත්ව ලබාදීම, ඉඩම් සංවර්ධනය හා සංරක්ෂණය, රජයේ ඉඩම්වල සුරක්ෂිතභාවය සංර්ධනය, සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙවන් හා විනිවිදභාවයෙන් යුක්තව ක්‍රියාවට නැංවීම."

## දිගුකාලීන අරමුණු

- සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබා දීම.
- ඉඩම්වල වටිනාකම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා හඳුනාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල යටිතල පහසුකම් සංවර්ධනය.
- අනාගත සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් ඉඩම් සම්පත සුරක්ෂිත කිරීම.
- ගුණාත්මක සේවාවක් සැපයිම සඳහා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය.
- ගුණාත්මක සහ කාර්යක්ෂම සේවාව ලබාදෙන ආයතනයක් ඇති කිරීම.
- පළාත් සභා ආදායම් ඉහළ නැංවීම.

## කෙටිකාලීන අරමුණු

- වර්ෂයකදී දළ වශයෙන් හිමිකම් පත්‍ර 15000කට ආසන්න සංඛ්‍යාවක් ලබා දීම.
- සෑම වර්ෂයකමදීම එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් ආවරණය වන පරිදි දැනුවත් කිරීමේ වැඩ සටහනක් පැවැත්වීම.
- දිස්ත්‍රික්ක දෙකම ආවරණය වන පරිදි එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක හෝ සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියා කිරීම.
- අනවසර අල්ලා ගැනීම් පෙර වර්ෂයට සාපේක්ෂව අවම කිරීම.
- වසරින් වසර විවිධාංගිකරණය කරන ලද පුහුණු වැඩසටහන් සැලසුම් කර විවිධ අංශයන්ගෙන් දැනුම ලබා දීම.
- ඵලදායිතා සංකල්ප හඳුන්වා දෙමින් ආයතනයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.
- පෙර වසරට වඩා ඉහළ හා හිඟ අවම වූ බදු ආදායමක් එකතු කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- යෝග්‍ය රජයේ ඉඩම් සුදුසුකම සහිත ප්‍රජාවට විධිමත්ව ලබා දීම සංවර්ධනය.
- ඉඩම් සංවර්ධනය හා සංරක්ෂණය.
- රජයේ ඉඩම්වල සුරක්ෂිතතාව සංවර්ධනය.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහපාලන කටයුතු සංවර්ධනය.
- රජයට ලැබිය යුතු බදු මුදල් විධිමත්ව හා කාර්යක්ෂමව ලබා ගැනීම හා ඒ වෙනුවෙන් ක්‍රියා කිරීම.
- නව සංවර්ධන ව්‍යාපෘතින් හඳුනා ගැනීම හා ඒ සඳහා සුදුසු ආයෝජකයින් යෙදවීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ✓ 2008/04 චක්‍රලේඛයේ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත අවශ්‍ය මානව, භෞතික, මූල්‍ය සම්පත් ලබා දීම.
- ✓ අනවසර අල්ලා ගැනීම් සම්බන්ධයෙන් විධිමත් වාර්තාකරණය සඳහා වැඩසටහන් සකස් කිරීම.
- ✓ විවිධ අංශයන්ගෙන් පිරිපුන් දැනුමක් සහිත පුද්ගලයින් බිහි වීම තුළින් ආයතනයේ කාර්යක්ෂමතාවය ඉහළ නංවා ගැනීම.
- ✓ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් බදු කරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු




1.4.විශේෂයෙන්ම දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවධානමට ලක්විය හැකි අය ඇතුළුව සියළුම පිරිමින්ට සහ කාන්තාවන්ට 2030 වසර වනවිට ආර්ථික සම්පත්, මූලික සේවාවන්, ඉඩම් හිමිකාරිත්වය හා පාලනය කිරීම සහ වෙනත් ආකාරයේ දේපළ උරුමයන් ස්වාභාවික සම්පත්, සුදුසු නව තාක්ෂණය සහ ක්ෂුද්‍ර මූල්‍ය ඇතුළුව මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශවීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම.




9.1.ආර්ථික සංවර්ධනය සහ මානව යහ පැවැත්ම වෙනුවෙන් සියළු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශ සීමාවන් අතර සිදුකරන යටිතල පහසුකම්ද ඇතුලත්ව ගුණාත්මක වශයෙන් ඉහල විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.




15.1 2020 වන විට භූමියේ සහ ගොඩබිම අභ්‍යන්තරයේ පවත්නා මිරිදිය පරිසර පද්ධති සහ ඒවායින් ලැබෙන්නාවූ සේවාවන් ,විශේෂ වනාන්තර ,කඳු සහ වියලි බිම් අන්තර්ජාතික ගිවිසුම් වලට අනුකූල වන පරිදි සංරක්ෂණය, නැවත නගා සිටුවීම,සහ තිරසර අන්දමින් භාවිතා කිරීම තහවුරු කිරීම.




17.1 බදු හා වෙනත් ආදායම් එක් රැස් කිරීම වර්ධනය කිරීම සඳහා සංවර්ධනය වෙමින් පවත්නා රටවලට අන්තර් ජාතික සහයෝගය ලබාදීම ඇතුළුව දේශීය සම්පත් සජීවීකරණය

## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 112 |
| 2 | සේවයේ නියුතු | 89 |
| 3 | පුරප්පාඩු | 23 |

## මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම් -2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 54.4 | 53.5 | 0.9 | 98 |
| ගමන් වියදම් | 1.9 | 1.9 | - | 100 |
| සැපයීම් | 2.1 | 2.1 | - | 100 |
| නඩත්තු වියදම් | 1.3 | 1.3 | - | 100 |
| ගිවිසුම්ගත සේවා | 4.8 | 4.6 | 0.2 | 95 |
| මාරු කිරීම් | 0.5 | 0.5 | - | 100 |
| **එකතුව** | **65.2** | **63.9** | **1.1** | **98** |

## පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරිම.

| ව්‍යාපෘතිය/වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ කඳවුරු පැවැත්වීම | 1.මහජනතාව වෙත ගොස් ඔවුන්ගේ ඉඩම් ගැටලු හඳුනා ගැනීම/උපදෙස් ලබාදීම/ පැවරීම් / මැනුම් නිරවුල් කිරීම්/ දීමනා පත්‍ර පසු කටයුතු හා දීමනාපත්‍ර බෙදාදීම් ආදිය<br>2.රජයේ ඉඩම් ආඥා පනත හා ඉඩම් සංවර්ධන ආඥා පනත පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම<br>3. ඉඩම් හිමිකම ලබාදීම සඳහා මූලික සමීක්ෂණ හා ඉඩම් කච්චේරි පැවැත්වීම | 1.මහජනතාවගේ ඉඩම් ගැටලු විසඳීම.<br>2.ප්‍රදාන පත්‍රයක් හෝ අවසරපත්‍රයක් මඟින් තම ඉඩම් කොටසට නීත්‍යානුකූල හිමිකම සහිත ප්‍රජාවක් | 1171<br>822<br>22855 |

## මුලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0.7 | 0.24 | 0.45 | 34 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම් හා උපකරණ | 5.6 | 4.7 | 0.8 | 84 |
| වාහන | 0.3 | 0.3 | - | 100 |
| වෙනත් මුලධන වත්කම් පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම | 2.4 | 2 | 0.4 | 83 |
| **එකතුව** | **9** | **7.24** | **1.76** | **80** |

## ආදායම් ඉපයීම - 2018

| ශීර්ෂය | ඉලක්කය (රු.මි) | සත්‍ය ආදායම (රු.මි) | එකතු කිරීමේ ප්‍රගතිය (%) |
|---|---|---|---|
| වෙනත් ඉපයීම් | 129 | 186.95 | 144% |

## කාර්ය සාධන ඉලක්ක 2017 -2021

| ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|---|
| සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබා දීම. | නිකුත් කල බලපත්‍ර හා දීමනා පත්‍ර සංඛ්‍යාව | 12 000 | 8000 | 9000 | 10000 | 12000 |
| | පවත්වන ලද මූලික සමීක්ෂණ හා ඉඩම් කච්චේරි ගණන | 850 | 125 | 150 | 150 | 150 |
| ඉඩම් වල වටිනාකම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා හඳුනා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල යටිතල පහසුකම් සංවර්ධනය. | ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග ගණන හා දුර ප්‍රමාණය | 3km | 4 (මාර්ග ගණන) දුර 3.5km | 6 (මාර්ග ගණන) දුර 5km | මාර්ග ගණන 15 දුර 15 km | මාර්ග ගණන 20දුර 1515 km |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| අනාගත සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් ඉඩම් සම්පත සුරක්ෂිත කිරීම . | මායිම්කර වෙන්කරන ලද රක්ෂිත සංඛ්‍යාව | - | 5 | 8 | 10 | 15 |
| ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය. | පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන හා පුහුණු කල නිලධාරීන් ගණන | 20(වැඩසටහන්) / 70 (නිලධාරීන්) | 10(වැඩසටහන්)/ 92 (නිලධාරීන්) | 15 (වැඩසටහන්)/ 112 (නිලධාරීන්) | 15 | 15 |
| ගුණාත්මක සහ කාර්යක්ෂම සේවාවක් ලබාදෙන ආයතනයක් ඇති කිරීම. | නවීකරණය කරන ලද ගොඩනැගිලි ගණන | 3 | 2 | 4 | 5 | 5 |
| | අංග සම්පූර්ණව ස්ථාපිත වූ ඉඩම් අංශ ගණන | 3 | 2 | 4 | - | - |
| | නිරවුල් කරන ලද ඉඩම් ගැටළු ගණන | 500 | 400 | 300 | - | - |
| පළාත් සභා ආදායම ඉහළ නැංවීම. | රජයේ ඉඩම් වලින් වාර්ෂිකව උපයන ලද බදු ආදායම | රු.මි. 96 | රු.මි. 129 | රු.මි. 132 | රු.මි. 136 | රු.මි. 141 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය - 2018

| අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | 2018.12.31 (%) | |
|---|---|---|---|---|
| | | | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය |
| 1.ප්‍රා.ලේ.කො. මට්ටමින් ඉඩම් නිරවුල් කිරීමේ කඳවුරු පැවැත්වීම.<br>2.ඉඩම් හිමිකම් නොමැති පුද්ගලයන් ලියාපදිංචි කිරීම සඳහා මූලික සමීක්ෂණ පැවැත්වීම හා ඉඩම් කච්චේරි පැවැත්වීම<br>3.රජයේ ඉඩම් කාර්ය සංග්‍රහය සහ නීතිරීති පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල නිලධාරීන් දැනුවත් කිරීම | 3.3 | 3.184 | 95 | 96 |
| 4.සංවර්ධන බලපත්‍ර ලබාදුන් ඉඩම් සඳහා ප්‍රවේශ මාර්ග සකස් කිරීම. | 1 | 0.690 | 57 | 69 |
| 5.රජයේ ඉඩම් ආරක්ෂා කිරීම සඳහා ගල්පර/කඳු ප්‍රදේශ හා ජල මූලාශ්‍ර සහිත ප්‍රදේශ මායිම් කොට වෙන් කිරීම. | 0.5 | 0.495 | 100 | 99 |
| 6.ආයතනයේ නිලධාරීන්ගේ දැනුම වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම. | 1 | 0.719 | 71 | 72 |
| 7.අඩු පහසුකම් සහිත ප්‍රා.ලේ.කාර්යාලවල ඉඩම් අංශයට අවශ්‍ය ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ ලබාදීම. | 5.4 | 4.567 | 100 | 84 |
| 8.අඩු පහසුකම් සහිත ප්‍රා.ලේ.කාර්යාලවල ඉඩම් අංශයට අවශ්‍ය යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ලබාදීම. | 0.2 | 0.15 | 100 | 75 |
| 9.පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය වැඩිදියුණු කිරීම . | 0.7 | 0.246 | 100 | 35 |
| 10.පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ වාහන අළුත්වැඩියාව. | 0.3 | 0.296 | 100 | 98 |
| 11.ප්‍රා.ලේ.කොට්ඨාස 2ක කාර්යාල අළුත්වැඩියා කිරීම. | 1 | 0.947 | 100 | 95 |
| 12.ඉඩම්වලින් බදු ආදායම් ඉපැයීම සඳහා වාණිජ ඉඩම්, නේවාසික කටයුතු සඳහා ලබාදෙන ඉඩම් හා කෘෂිකාර්මික ඉඩම් මැනුම් කිරීම. | 0.9 | 0.821 | 100 | 91 |
| **එකතුව** | **14.30** | **12.12** | | |

## ප්‍රධාන අංශයන්හී කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හී ප්‍රගතිය විස්තරාත්මකව - 2018

### 01 - ඉඩම් නිරවුල් කිරිමේ කඳවුරු පැවැත්වීම



සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබාදීම කඩිනම් කිරීම මෙමගින් සිදු විය.මේ සඳහා වැය කරන ලද මුදල රු. 3,184,895.00 කි.

මෙම වැඩසටහන යටතේ මහජනතාව වෙත ගොස් ඔවුන්ගේ ඉඩම් ගැටලු හඳුනා ගැනීම/උපදෙස් ලබාදීම/ පැවරීම් / මැනුම් නිරවුල් කිරීම්/ දීමනා පත්‍ර පසු කටයුතු හා දීමනාපත්‍ර බෙදාදීම (ජංගම සේවාව), රජයේ ඉඩම් ආඥා පනත හා ඉඩම් සංවර්ධන ආඥා පනත පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම හා ඉඩම් හිමිකම ලබාදීම සඳහා මූලික සමීක්ෂණ හා ඉඩම් කච්චේරි පැවැත්වීම යන ව්‍යාපෘතීන් 3 ක්‍රියාත්මක කර ඇත.

### 02 - ජංගම සේවාවන් පැවැත්වීම



අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගලෙන්බිඳුණුවැව , තලාව හා මහ විලච්චිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ජංගම සේවාවන් පවත්වා ඇත.

ඒ සඳහා එම ප්‍රදේශවල මහජනතාව 1171ක් සහභාගි වී ඇත. ඒ තුළින් ඉඩම් ගැටළු 436ක් සඳහා විසඳුම් ලබාදීමට හැකි වි ඇති අතර ඒ තුළින් ග්‍රාම නිලධාරී තුලාන් 106 ක් පමණ ආවරණය විය.

### 03 - රජයේ ඉඩම් කාර්ය සංග්‍රහය සහ නීතීරීති පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නිලධාරීන් දැනුවත් කිරීම


ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පුහුණු වැඩසටහන් දහතුනක් (13)ක් පවත්වා ඇත. නැ.නු.ප,රඹෑව, ගලෙන්බිඳුණුවැව, මැදවච්චිය, තිරප්පනේ,නොච්චියාගම,තලාව, පලාගල, මිහින්තලේ, හිඟුරක්ගොඩ, තමන්කඩුව, මැදිරිගිරිය, කැකිරාව යන ප්‍රාදේශිය ලේකම් කාර්යාල ආවරණය කරන ලදී. පුහුණු කරන ලද නිලධාරීන් ගණන 822 කි.

## 04 - ඉඩම් හිමිකම් නොමැති පුද්ගලයන් ලියාපදිංචි කිරීම සඳහා මූලික සමීක්ෂණ පැවැත්වීම හා ඉඩම් කච්චේරි පැවැත්වීම

| පවත්වන ලද ප්‍රා.ලේ.කො ගණන | පවත්වන ලද මූලික ඉඩම් සමීක්ෂණ ගණන | පවත්වන ලද ඉඩම් කච්චේරි ගණන | ලියාපදිංචි පුද්ගලයන් ගණන | ආවරණය කරන ලද ග්‍රා.නි වසම් ගණන |
|---|---|---|---|---|
| 24 | 298 | 236 | 22855 | 418 |


## 05.ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (2) වන වගන්තිය යටතේ නිකුත් කළ අවසර පත්‍ර සංඛ්‍යාව (144-A) 2016-2018

ඉඩම් කච්චේරි මගින් සුදුසුකම් ලද ප්‍රතිලාභීන් සඳහා මෙම අවසර පත්‍රය ලබාදීම මගින් ඉඩම් හිමිකම ලැබේ.





2016 වර්ෂයේ දී අවසර පත්‍ර 2691 ක් ද 2017 වසරේදි 3079 ක් වු අතර 2018 වර්ෂයේදි එය 5486 ක් දක්වා වර්ධනය විය. එය 2016 වර්ෂය හා සසඳා බලන විට දිමනා පත්‍ර 2795 ක ප්‍රමාණයක වැඩිවිමකි.

## 06.බලපත්‍ර ලබාදීම සඳහා හඳුනාගත් ඉඩම් කට්ටි ගණන 2014-2018




## 07.මූලික සමීක්ෂණ හා ඉඩම් කච්චේරි පැවැත්වීම - 2017/2018




2018 ඉලක්කයට වඩා 238 % ක වැඩිවීමකි.

2018 ඉලක්කයට වඩා 189 % ක වැඩිවීමකි.

### දීර්ඝකාලීන බදු බලපත්‍රවලින් එකතු කරන ලද බදු ආදායම - රු.මිලි. 2014 - 2018




**සංවර්ධන බලපත්‍ර ලබාදුන් ඉඩම් සඳහා ප්‍රවේශ මාර්ග සකස් කිරීම**

ව්‍යාපෘතියේ අරමුණ ඉඩම්වල වටිනාකම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා පළාතේ හඳුනාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල යටිතල පහසුකම් සංවර්ධනය සිදුවිය. ඒ යටතේ මාර්ග 04ක් සකස් කළ අතර ඒ සඳහා වැය කළ මුළු මුදල - රු 690,263.80 කි.

## 08. රජයේ ඉඩම් ආරක්ෂා කිරීම සඳහා ගල්පර/කඳු ප්‍රදේශ හා ජල මූලාශ්‍ර සහිත ප්‍රදේශ මායිම් කොට වෙන් කිරීම.


අනාගත සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් ඉඩම් සම්පත සුරක්ෂිත කිරීම අරමුණු කොට රක්ෂිත මැනීම සිදු විය. ඒ යටතේ මැනුම් කළ රක්ෂිත ගණන 2 කි. ඉපලෝගම හේන් කට්ටිය වැව වැව් රක්ෂිතය හා කහටගස්දිගිලිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ රක්ෂිතයට අයත් ඉඩම්වල පැරණි මායිම් විවෘත කරගැනීමට අදාලව ඉඩම් මැනුම් කිරීම.

## 09.ආයතනයේ නිලධාරීන්ගේ දැනුම වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

ක්‍රියාත්මක කළ පුහුණු වැඩසටහන් ගණන - 5

| පුහුණු වැඩසටහන | ඉලක්කගත කණ්ඩායම | පුහුණු ලාභීන් |
|---|---|---|
| මැනුම් හා සිතියම් සම්බන්ධ පුහුණුව | ඉඩම් නිලධාරි | 41 |
| දීර්ඝකාලීන බදු බලපත්‍ර සැකසීම,බදු පවත්වා ගෙන යාම,ගිණුම් ගත කිරීම සම්බන්ධ පුහුණුව | සංවර්ධන නිලධාරි / ඉඩම් නිලධාරි/ කළමණාකරන සහකාර | 59 |
| ශ.දු.අ.ත.විශ්ලේශනය හා සේවක අභිප්‍රේරණය | මාණ්ඩලික නිලධාරීන් සංවර්ධන නිලධාරි / ඉඩම් නිලධාරි/ කළමණාකරන සහකාර/මැනුම් සහයක/කා.ක.ස/රියදුරු | 80 |
| ව්‍යාපෘති වාර්තා සැකසීම | සංවර්ධන නිලධාරි | 32 |
| ආකල්ප සංවර්ධනය හා උපදේශනය | ඉඩම් නිලධාරි සංවර්ධන නිලධාරි කළමණාකරන සහකාර | 85 |

මහජනතාව දැනුවත් කිරීම සඳහා සකස් කරන ලද පොත් පිංච




## 10.රජයේ ඉඩම් සඳහා කඩිනම් දීමනාපත්‍ර ලබාදීමේ ජාතික වැඩසටහන මිලියන 1.1 ඉඩම් මැනීම

ව්‍යාපෘතියේ අරමුණු අතර ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර නිකුත් කර ඇති ඉඩම් මැන දීමනා පත්‍ර නිකුත් කිරීම, ජයභූමි දීමනා පත්‍ර ඉඩම් මැන පිඹුර සම්බන්ධකර සංශෝධිත දීමනා පත්‍ර නිකුත් කිරීම,ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර නිකුත් කලහැකි එහෙත් බලපත්‍ර නිකුත් කර නැති ඉඩම් මැන දීමනා පත්‍ර නිකුත් කිරීමට ද ව්‍යාපෘති කාලයවන 2018-2020 අතර අපේක්ෂා කරයි.

## 11.රජයේ ඉඩම් තොරතුරු කළමණාකරන පද්ධතිය - e-Slim

නව තාක්ෂණය භාවිතාකර සියළුම ඉඩම් රාජකාරී වඩා කාර්යක්ෂම සහ ඵලදායී කිරීම සහ රජයේ ඉඩම් පිළිබඳ දත්ත පද්ධතියක් නිර්මාණය කඩිනම් කිරීම අරමුණ සහිතව රජයේ ඉඩම් තොරතුරු කළමණාකරන පද්ධතිය හා නව දීමනාපත්‍ර සකස්කිරීම පිළිබඳ ජාතික වැඩසටහන ක්‍රියාත්මක වන අතර මේ සඳහා ආරම්භයක් ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් නිලධාරීන් 150 දෙනෙකු පුහුණු කර ඇත.

## වෙනත් රේඛීය අමාත්‍යාංශ මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති - 2018

| ව්‍යාපෘතිය | ප්‍රගතිය |
| --- | --- |
| **රජයේ ඉඩම් සඳහා කඩිනම් දීමනාපත්‍ර ලබාදීමේ ජාතික වැඩසටහන - 1.1 MN ඉඩම් මැනීම** | මෙම ව්‍යාපෘතිය ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් මුදල් වැයකර ක්‍රියාත්මක කරන අතර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණය හා සහය යටතේ සිදුකරයි. මේ වන විට මැන ඇති මුළු ඉඩම් කට්ටි ගණන 9884කි. |
| **රජයේ ඉඩම් තොරතුරු කළමණාකරන පද්ධතිය ( e-Slim )** | ව්‍යාපෘතිය ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් මුදල් වැයකර ක්‍රියාත්මක කරන අතර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණය යටතේ සිදුකරයි. ප්‍රා.ලේ.කො. මට්ටමින් නිලධාරීන් 150ක් පුහුණු කර ඇත. |

## සම්පත් උපයෝජනය හා කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව ඉඩම් කොමසාරිස්වරයෙකු සහකාර කොමසාරිස්වරුන් 2කු, මිනින්දෝරුවරයකු, සංවර්ධන නිලධාරින් 36 දෙනෙකු, ඉඩම් නිලධාරින් 22 දෙනෙකු, සැළසුම් ශිල්පියකු හා අනෙකුත් කාර්යය මණ්ඩලය ඇතුළුව 89 දෙනෙකුගෙන් යුතු කාර්යය මණ්ඩලයකින් සමන්විතය. පළාත් සභා ඉඩම් පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 24ක් ආවරණය වන පරිදි ඉඩම් නිලධාරියෙකු හා සංවර්ධන නිලධාරියෙකු ඉඩම් රාජකාරි කටයුතු සඳහා යොදවා ඇත. සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබා දීම මූලික අරමුණ වන බැවින් එය සාක්ෂාත් කර ගැනීම සඳහා විවිධ අංශයන් යටතේ වියදම් දරා ඇත.මෙම දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 112ක් වුවත් 23කගේ පුරප්පාඩු පවතින බැවින් ඇතැම් රාජකාරී කටයුතු නියමිත පරිදි සිදුකර ගැනීමේ අපහසුතාවයන් ඇතිවී ඇත.

පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධනය ස්වභාවයේ වැඩ ඉටු කිරීම යටතේ 86.6% මූල්‍ය ප්‍රගතියක් හා 100% භෞතික ප්‍රගතියක් පෙන්වා ඇති අතර මේ යටතේ සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබාදීම සඳහා ව්‍යාපෘතීන් 3ක් ක්‍රියාත්මක කර ඇත. පුනරාවර්තන වියදම් යටතේ සමස්ත උපයෝජනය 98% ක ප්‍රශස්ත මට්ටමක ඇත.

මුලධන වියදම යටතේ සෑම වසරකම ඉඩම් රාජකාරි කටයුතු ඉටුකරන කාර්යය මණ්ඩලයට විවිධාංගිකරණය කරන ලද පුහුණු වැඩසටහන් සැලසුම් කර විවිධ අංශයන්ගෙන් දැනුම ලබා දීම සිදුකරයි. ඒ අනුව මෙම වසරේදී පුහුණු වැඩසටහන් 5ක් පවත්වා ආයතනික ධාරිතා සංවර්ධනය සිදුකර නිපුණතාවයෙන් යුත් කාර්ය මණ්ඩලයක් මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ජනතාවට සේවා සැපයිමට අවස්ථාව සළසා ඇත. සෑම වසරකම අවම වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 2ක ඉඩම් අංශය වැඩි දියුණු කිරීමට අවශ්‍ය මුදල් ලබාදෙන අතර මෙම වසරේදීද අලුත්වැඩියා කටයුතු සඳහා ප්‍රා.ලේ.කා 2ක් සඳහා මුදල් ලබාදී ඇති අතර සහ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ඉඩම් අංශයට අවශ්‍ය ගෘහභාණ්ඩ , කාර්යාලයීය උපකරණ , යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ , නිලධාරීන් සඳහා අවශ්‍ය උපකරණ ලබාදීම සිදුකර ඇත. එමගින් ගුණාත්මක සහ කාර්යක්ෂම සේවාවක් ලබාදීමට අවශ්‍ය පහසුකම් සළසා ඇත.

රජයේ ඉඩම් පරිපාලනය හා කළමනාකරණය සම්බන්ධයෙන් පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට විශාල කාර්යභාරයක් පැවරී ඇත. මහජනතාව වෙත කාර්යක්ෂම සේවයක් සැපයීම සඳහා අවශ්‍ය පහසුකම්, උපදෙස් හා මඟපෙන්වීම මෙම දෙපාර්තමේන්තුව මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලබාදෙයි. දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීමට අදාලව විවිධ පළාතේ ඉඩම් සංවර්ධනය හා සංරක්ෂණය සහ රජයේ ඉඩම්වල සුරක්ෂිතභාවය සංවර්ධනය සඳහා රක්ෂිත ප්‍රදේශ 2ක් මායිම් කොට වෙන් කිරීමත් සංවර්ධන බලපත්‍ර ලබාදුන් ඉඩම් සඳහා ප්‍රවේශ මාර්ග 4ක් සකස් කිරීමත් සිදුකර ඇත. තවද පළාත් සභා ආදායම ඉහළ නැංවීම සඳහා වානිජ ඉඩම්, නේවාසික කටයුතු සඳහා ලබාදෙන ඉඩම් හා කෘෂිකාර්මික ඉඩම් මැනුම් කිරීම යටතේ ඉඩම් කට්ටි 13ක් මැනුම් කර රජයට ලැබිය යුතු බදු මුදල් විධිමත්ව හා කාර්යක්ෂමව ලබා ගැනීම සඳහා කටයුතු සිදුකර ඇත.

පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය වැඩිදියුණු කිරීම මගින් මහජන මිත්‍රශීලී කාර්යක්ෂම නිලධාරින්ගෙන් යුත් නවීන සේවා සපයන ආයතනයක් ඇතිකොට යහපාලන කටයුතු සංවර්ධනය සඳහා ප්‍රවේශය ලබාදී ඇත. ඒ අනුව සමස්ත සම්පත් උපයෝජනය එක් ව්‍යාපෘතියක හැර භෞතිකව 75% ඉක්මවා ඇති බැවින් අදාල ක්‍රියාකාරකම් කාර්යක්ෂම හා ඵලදායී අයුරින් ඉටුකර ඇති බැව් පෙන්වා දිය හැකිය. ක්‍රියාකාරකම් 2018 වර්ෂයේ සිදුකළ අතර ඒවා මගින් තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කිරීමට අවශ්‍ය ප්‍රවේශය සපයා ඇත.

සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබාදීමේ අරමුණින් (තිරසර සංවර්ධන අරමුණ - 1.4) පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධනය ස්වභාවයේ වැඩ ඉටු කිරීම මේ යටතේ සිදු කරන ලදී.

ඒ අනුව ප්‍රා.ලේ.කො. මට්ටමින් ඉඩම් නිරවුල් කිරීමේ කඳවුරු පැවැත්වීම, ඉඩම් හිමිකම් නොමැති පුද්ගලයන් ලියාපදිංචි කිරීම සඳහා මූලික සමීක්ෂණ පැවැත්වීම හා ඉඩම් කච්චේරි පැවැත්වීම, රජයේ ඉඩම් කාර්ය සංග්‍රහය සහ නීතිරීති පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල නිලධාරීන් දැනුවත් කිරීම යන ව්‍යාපෘතීන් 3ක් ක්‍රියාත්මකකර ඇති අතර එමගින් මහජනතාව වෙත ගොස් ඔවුන්ගේ ඉඩම් ගැටලු හඳුනා ගැනීම/උපදෙස් ලබාදීම/ පැවරීම් / මැනුම් නිරවුල් කිරීම්/ දීමනා පත්‍ර පසු කටයුතු / දීමනාපත්‍ර බෙදාදීම් ආදිය/අණ පනත් හා චක්‍රලේඛ පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීම /ඉඩම් හිමිකම ලබාදීම සඳහා මූලික සමීක්ෂණ හා ඉඩම් කච්චේරි පැවැත්වීම යන ක්‍රියාකාරකම් සිදුකර ඇත.

ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබා දීම සඳහා ඉඩම් සමීක්ෂණ හා ඉඩම් කච්චේරි පෙර වසර වලට වඩා වැඩියෙන් සිදුකර ඇති අතර එය මෙම වසරේ ඉලක්කය විශාල වශයෙන් අභිබවා යාමකි. ( ඉඩම් සමීක්ෂණ 238% ඉඩම් කච්චේරි189%). තවද 2018 වසරේ බලපත්‍ර ලබාදීම සඳහා හඳුනාගත් ඉඩම් කට්ටි ගණන 2017 වසරට වඩා 206% ගුණයකින් වැඩිවී ඇත. ඒ අනුව මෙම වසරේ ඉලක්ක කළ ප්‍රමාණයට මහජනතාව වෙත ඉඩම් හිමිකම්පත් ලබාදීමේ හැකියාව ලැබී ඇත.

පුනරාවර්තන වියදම් යටතේ සිදු කරන ලද පොදු වියදම්වලට අමතරව උපයන ලද බදු ආදායමෙන් 5%ක ප්‍රතිශතයක් එම කාර්යය ඉටු කරනු ලබන කාර්ය මණ්ඩලය වෙත දිරි දීමනා වශයෙන් ගෙවීම් කර ඇත.

මෙම දිරිගැන්වීම තුළින් බදු ආදායම වැඩිකර ගැනීම අපේක්ෂා කෙරේ. එසේම අනුරාධපුර/ හා පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙක ආවරණය වන පරිදි නැ.නු.ප හා මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකෙහි ඉඩම් විෂය සම්බන්ධ කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාව ඉහල නැංවීම සඳහා අභිප්‍රේරණ වැඩසටහන් 2ක් පැවැත්වීම සඳහා වියදම් දරා ඇත.තවද ඉඩම් අයිතිය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා අත්‍යාවශ්‍ය කරුණු කැටිකරගත් “නිරවුල් බිමක හිමිකම ඔබටත්” යන මැයෙන් මහජනතාව දැනුවත් කිරීමේ පොත් පිංචක් නිර්මාණයකර ඉඩම් ජංගම සේවා වැඩසටහන්වලට සමගාමීව හා පළාත් රාජ්‍ය ආයතනවල දැනගැනීම සඳහා බෙදා දී ඇත.

එසේම ඉඩම් කටයුතු සම්බන්ධයෙන් මේ දක්වා නිකුත් කර ඇති චක්‍රලේඛ සඳහන් පොත් දෙකක් මුද්‍රණය කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ඉඩම් සම්බන්ධ කටයුතු කරනු ලබන කාර්යාල වෙත ලබාදී ඇත. අනාගත සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් ඉඩම් සම්පත සුරක්ෂිත කිරීම හා ඉඩම්වල වටිනාකම සහ ආරක්ෂාව සහතික කිරීම යන අරමුණු (තිරසර සංවර්ධන අරමුණ - 15.1) ඉටුකර ගැනීම සඳහා 2018 වසරේදී ව්‍යාපෘති 6ක් ක්‍රියාත්මක කර ඇත. එමගින් ඉඩම් සංවර්ධනය සඳහා පහසුකම් සැලසීමත් විධිමත් ඉඩම් පරිහරණ රටාවක් මඟින් රජයේ ඉඩම්වල ආරක්ෂාව තහවුරුවීමත් සිදුවී ඇති අතර අනවසර අල්ලාගැනීම් ද පාලනය වී ඇත.

පළාත් සහා ආදායම ඉහළ නැංවීමේ අරමුණ යටතේ (තිරසර සංවර්ධන අරමුණ - 17.1) මෙම වසරේදී සංවර්ධන නිලධාරීන් හා ඉඩම් නිලධාරීන් සඳහා දීර්ඝකාලීන බදු බලපත්‍ර සැකසීම, බදු පවත්වා ගෙන යාම, ගිණුම්ගත කිරීම සම්බන්ධ පුහුණුව ලබාදීම සිදුකර නිසි අධීක්ෂණයක් යටතේ බදු අයකර ගැනීමට කටයුතුකර අදාල උපදෙස් ලබාදීම සඳහා සංවර්ධන නිලධාරීන්ගෙන් සමන්විත සංචිතයක් පත් කර ඇති අතර මේ හේතුවෙන් මේ වසරේදී පෙර වසරවලට වඩා ඉහළ හා හිග අවම වූ බදු ආදායමක් එකතුකර ගත හැකි වී ඇත. එය මෙම වසරේ ඉලක්කයට වඩා 144%ක වැඩි වීමකි.

ගුණාත්මක සේවාවක් මහජනතාව වෙත ලබාදීම සඳහා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීමේ අරමුණින් පුහුණු වැඩසටහන් 5ක් ක්‍රියාත්මක කර ඇත. මේ යටතේ පවත්වන ලද ව්‍යාපෘති වාර්තා සකස්කිරීමට අදාලව 2019 වර්ෂයේ ඉඩම් සංවර්ධනය සඳහා වාර්තා වාර්තා 28ක් සකස්කර ඉදිරිපත් කර ඇත.ඉඩම් අංශ සඳහා ගුණාත්මක සහ කාර්යක්ෂම සේවාවක් ලබාදීමට අවශ්‍ය පහසුකම් පසුගිය වසරේදී ලබාදුන් අතර මෙම වසර සඳහාද පළාත් කාර්යාලයට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අත්‍යාවශය පහසුකම් සපයා ඇත. ගුණාත්මක සහ කාර්යක්ෂම සේවාවක් ලබාදෙන ආයතනයක් ඇති කිරීමේ අරමුණින් ප්‍රධාන කාර්යාලයට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් අංශය සඳහා අවශ්‍ය ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ලබාදුන් අතර ඉඩම් අංශ දෙකක්ද නවීකරණය කර මහජන මිත්‍රශීලී කාර්යක්ෂම නිලධාරින්ගෙන් යුත් නවීන සේවා සපයන ආයතනයක් ඇති කිරීමට කටයුතු කර ඇත.

ඉඩම්වල වටිනාකම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා හඳුනා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංවර්ධන බලපත්‍ර ලබාදුන් ඉඩම් සඳහා ප්‍රවේශ මාර්ග 4ක් සකස් කිරීමත් සිදුකර ඇත. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් විශේෂ ව්‍යාපෘති දෙකක් මේ වන විට ක්‍රියාත්මක කරන අතර ඒවා පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණය යටතේ සිදුවේ. ඉඩම් මිලියන එකයි දශම එකක් (මිලියන 1.1) මැන දීමනාපත්‍ර නිකුත් කිරීමේ රජයේ ඉලක්කගත වැඩසටහන යටතේ 2018 වර්ෂයේ ඉලක්කය ඉඩම් කට්ටි 10500ක් මැනුම් කර දීමනාපත්‍ර 4200ක් සකස් කිරීමයි. ඒ අනුව 2018.12.31 වන විට ඉඩම් කට්ටි 9884ක් මැන අවසන් කර ඇත. මෙම මැනුම්වලට අදාල දීමනාපත්‍ර සකස් කිරීම කඩිනම් කිරීම සඳහා අනෙක් විශේෂ ව්‍යාපෘතිය වන රජයේ ඉඩම් තොරතුරු කළමණාකරන පද්ධතිය (e-slim) මගින් සිදුවේ.මේ සඳහා 2018 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් නිලධාරීන් 150 දෙනෙකු පුහුණුකර ඇත.

ඒ අනුව පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සමස්ත අරමුණු ඉටුකර සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විශාල සහයෝගයක් ලබාදී ඇති අතර ඒ හේතුවෙන් 2018 වර්ෂයේ සමස්ත කාර්ය සාධනය ප්‍රශස්ත මට්ටමකට ගෙනයාමට හැකි විය.

-මෙය හිස්ව තබන ලද පිටුවකි-

# 10.3. පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

සාරධර්ම සුරකින පරිසර හිතකාමී විනයගරුක නිරෝගී අභිමානවත් සමාජයක් ගම තුළ නිර්මාණය කිරීමේ ක්‍රියාවලියට දායකත්වය සපයන උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව උතුරු මැද පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 29 තුළ විවිධ වැඩසටහන් පවත්වමින් ප්‍රජාව සමග සෘජුව සම්බන්ධතා පවත්වාගෙන යනු ලැබේ. ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය සාම්ප්‍රදායික තත්වයන්ගෙන් මිදී තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාගත හැකි පරිදි පළාත් සභා ප්‍රතිපාදන යොදා ගනිමින් ප්‍රජා දායකත්වය ප්‍රමුඛ කොටගෙන 2018 වර්ෂයේ විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් සිදු කොට ඇත. ඒ සඳහා බිම් මට්ටමින් අනුරාධපුර සහ පොළොන්නරු දිස්ත්‍රික්කවල පවතින ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය සංගම් සහ දිස්ත්‍රික් සංගම් සඳහා ක්‍රියාත්මක සැලසුම් සකස්කර ඇත.

ග්‍රාම සංවර්ධන, තිරසාර සංවර්ධන දැක්ම සඳහා පුද්ගල සංවර්ධනය, කණ්ඩායම් සංවර්ධනය සහ කාර්ය බද්ධ සංවර්ධනය ඉලක්කකර විවිධ වැඩසටහන් සිදුකර ඇත. 2018 වර්ෂයේ උතුරු මැද පළාත් සභාව මගින් ලබාදුන් ප්‍රතිපාදන යොදා ගනිමින් 2011 අංක 03 දරණ උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය සහ පළාත් සභා මූල්‍ය නීති සංග්‍රහය, භාණ්ඩාගාර චක්‍රලේඛන, රේඛීය අමාත්‍යාංශ චක්‍රලේඛන , පළාත් සභා සැලසුම් අංශයේ චක්‍රලේඛන හා ආකෘතිවලට අනුව විනිවිදභාවයකින් යුක්තව කටයුතු කිරීම සිදුවේ.

උතුරු මැද පළාත් සභාවේ සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම ග්‍රාම සංවර්ධන නිලධාරීන් එක් අයෙක් බැගින් අනුයුක්තකර ඇති අතර සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම පවත්වාගෙන යනු ලබන තිරසර සංවර්ධන ප්‍රජා පුහුණු මධ්‍යස්ථාන (ග්‍රාමීය කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන ) සඳහා මැහුම් උපදේශිකාවන් එක් අයෙකු බැගින් පත්කර ඇත. අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියළුම ක්ෂේත්‍ර රාජකාරී අධීක්ෂණය කිරීමට ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් නිලධාරීන් දෙදෙනෙක් සහ ජේ්‍යෂ්ඨ මැහුම් උපදේශිකාවන් දෙදෙනෙක් පත්කර ඇත.

උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව කාර්යාලගත සහ ක්ෂේත්‍රගත සියළුම නිලධාරීන්ගේ අඛණ්ඩ කැපවීම තුළින් ප්‍රජාවගේ පූර්ණ සහභාගීත්වයෙන් තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා බිම් මට්ටමින් විවිධ වැඩ සටහන් සිදුකර ඇත.

## ග්‍රාමීය කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන -11

| |
|---|
| හොරොව්පතාන |
| මැදවච්චිය |
| රඹෑව |
| පදවිය |
| කැබිතිගොල්ලෑව |
| මිහින්තලේ |
| කැකිරාව |
| ඉපලෝගම |
| නොච්චියාගම |
| නාච්චාදූව |
| පලුගස්දමන |

## ලියසවිය මධ්‍යස්ථානය - 14

| | |
|---|---|
| තිරප්පනේ | වැලිකන්ද |
| හිඟුරක්ගොඩ | මැදිරිගිරිය |
| මධ්‍යම නුවරගම් පළාත | රඹෑව |
| කහටගස්දිගිලිය | කැබිතිගොල්ලෑව |
| ගල්නෑව | තලාව |
| පලුගස්වැව | රාජාංගනය |
| ඉපලෝගම | පදවිය |

## ග්‍රාම සංවර්ධන සමිති පිළිබඳ තොරතුරු

| අංකය | ප්‍රාදේශිය ග්‍රාම සංවර්ධන කාර්යාලය | ග්‍රාම සං. සමිති සංඛ්‍යාව | මූල්‍ය වත්කම (රු) | තුලාන සංඛ්‍යාව | ගම් සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1 | නැ.නු.ප | 54 | 22,632,659 | 29 | 72 | 16,382 |
| 2 | ම.නු.ප | 32 | 2,159,575 | 40 | 181 | 15,721 |
| 3 | මහ විලච්චිය | 21 | 2,300,000 | 17 | 102 | 6,817 |
| 4 | නොච්චියාගම | 36 | 4,618,870 | 36 | 110 | 16,355 |
| 5 | රාජාංගනය | 21 | 870,000 | 21 | 53 | 10,521 |
| 6 | තඹුත්තේගම | 26 | 1,000,000 | 26 | 63 | 13,843 |
| 7 | ගල්නෑව | 35 | 2,425,259 | 30 | 71 | 11,374 |
| 8 | පලාගල | 35 | 907,402 | 35 | 98 | 11,124 |
| 9 | නාච්චාදූව | 37 | 4,389,525 | 19 | 49 | 7,995 |
| 10 | තලාව | 52 | 3,595,376 | 39 | 120 | 19,433 |
| 11 | ඉපලෝගම | 36 | 1,600,000 | 32 | 106 | 10,225 |
| 12 | කැකිරාව | 59 | 1,744,174 | 53 | 118 | 18,873 |
| 13 | මිහින්තලේ | 45 | 3,688,365 | 25 | 82 | 9,890 |
| 14 | තිරප්පනේ | 42 | 1,100,000 | 41 | 81 | 8,031 |
| 15 | පලුගස්වැව | 19 | 1,487,806 | 16 | 38 | 5,419 |
| 16 | හොරොව්පොතාන | 19 | 16,000,000 | 37 | 112 | 11,400 |
| 17 | ගලෙන්බින්දුනුවැව | 38 | 875,000 | 41 | 115 | 15,951 |
| 18 | කහටගස්දිගිලිය | 31 | 815,000 | 40 | 127 | 11,346 |

| අංකය | ප්‍රාදේශිය ග්‍රාම සංවර්ධන කාර්යාලය | ග්‍රාම සං. සමිති සංඛ්‍යාව | මූල්‍ය වත්කම (රු) | තුලාන සංඛ්‍යාව | ගම් සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 19 | කැබිතිගොල්ලෑව | 38 | 1,222,000 | 26 | 103 | 8,118 |
| 20 | පදවිය | 45 | 3,850,000 | 15 | 45 | 6,520 |
| 21 | මැදවච්චිය | 44 | 15,060,101 | 37 | 112 | 16,309 |
| 22 | රඹෑව | 38 | 2,675,000 | 38 | 104 | 11,853 |
| **අනුරාධපුර** | | **803** | **95,016,112** | **693** | **2,062** | **263,500** |
| 23 | තමන්කඩුව | 53 | 6,400,000 | 56 | 117 | 23,259 |
| 24 | හිඟුරක්ගොඩ | 54 | 4,060,998 | 53 | 140 | 19,211 |
| 25 | මැදිරිගිරිය | 87 | 9,064,158 | 45 | 111 | 20,195 |
| 26 | ලංකාපුර | 31 | 10,002,000 | 28 | 51 | 11,381 |
| 27 | වැලිකන්ද | 34 | 4,500,000 | 29 | 48 | 12,120 |
| 28 | දිඹුලාගල | 49්6 | 9,500,000 | 56 | 90 | 24,745 |
| 29 | ඇළහැර | 33 | 9,893,398 | 28 | 89 | 10,797 |
| **පොළොන්නරුව** | | **338** | **53,420,554** | **295** | **646** | **121,708** |
| **මුළු එකතුව** | | **1141** | **148,436,666** | **988** | **2,708** | **385,208** |

## දැක්ම

“උරුමය සුරකින පිරිපුන් ගමක්, සෞභාග්‍යමත් පළාතක්.”

## මෙහෙවර

“උරුමය සුරකින පිරිපුන් ගමක් බිහි කිරීම සඳහා ප්‍රජාව සංවිධානගත කිරීම, ආයතනගත කිරීම හා දැනුම ආකල්ප හා කුසලතාවලින් සන්නද්ධ කිරීම සහ ග්‍රාම සංවර්ධනයට අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සියලු පාර්ශවකරුන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිද භාවයකින් යුක්තව සංවර්ධනය කිරීම”.

## දිගුකාලීන අරමුණු

- සාරධර්ම සුරකින සමාජයක් බිහි කිරීම.
- පාරම්පරික තාක්ෂණ ශිල්පීය දැනුම, දේශීය සම්පත්, සුරැකිව උපයෝගි කොටගෙන ග්‍රාමීය සංවර්ධනය සිදු කිරීම තුළින් යහපත් පරිසරයක් මතු පරපුරට දායාද කිරීම.
- අභිමානවත් සංස්කෘතියක හිමිකරුවන් ලෙස සමාජයට අවබෝධයක් ලබා දෙමින් තිරසාර සංවර්ධනයක් සඳහා සමාජය පෙළ ගැස්වීම.

- ප්‍රජාව තුළ ගුණාත්මක සහ ධනාත්මක ආකල්ප වර්ධනය හා හැකියාවන් වර්ධනය කොට යහපත් ගෘහණියක් බවට පත් කිරිම.
- රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන අතර සම්බන්ධිකරණයක් ගොඩ නගා එහි යහපත් ප්‍රතිඵල ජනතාවට ලැබිමට සැලැස්විම.
- ග්‍රාමිය ප්‍රජාව තුළ සවිමත් ආර්ථිකයක් ඇති කිරිම සඳහා පහසුකම් සැලසිම.

## කෙටිකාලින අරමුණු

- ග්‍රාම සංවර්ධන සමිති, කාන්තා සමිති ශක්තිමත් කිරිම.
- ග්‍රාමිය යටිතල පහසුකම් වැඩි දියුණු කිරිම තුළින් ග්‍රාමිය නිෂ්පාදන ඉහළ නැංවිම.
- පාසැල් හැර ගිය තරුණ තරුණියන්ගේ කුසලතා හා ආකල්ප වර්ධනය කිරිම.
- ග්‍රාමීය ප්‍රජාව තුළ ජිවන වින්දනයක් ඇති කිරිම තුළින් ක්‍රියාශිලි ප්‍රබෝධමත් පවුල් ඒකක ඇති කිරිම.

## ප්‍රධාන කාර්යයන්

- ග්‍රාම සංවර්ධන සමිති පිහිටුවිම හා පවත්වාගෙන යාම .
- ග්‍රාම සංවර්ධන ප්‍රාදේශිය සංගම් හා දිස්ත්‍රික් සංගම් පිහිටුවීම හා පවත්වාගෙන යාම හා සමිති ව්‍යවසායකයන් නඟා සිටුවීම, ග්‍රාමීය නායකයින් දැනුවත් කිරීම, ග්‍රාම සංවර්ධන දින සැමරුම හා සමිති ඇගයීම.
- කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන සහ ලියසවිය මධ්‍යස්ථාන මගින් මැහුම් පාඨමාලා පවත්වාගෙන යාම කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන නිර්මාණ ඇගයීම .
- අඩු රාජ්‍ය මැදිහත් විමෙන් වැඩි ග්‍රාමිය සම්පත් සහ ශ්‍රම දායකත්වයෙන් සංවර්ධන ව්‍යාපෘති නිම කිරිම (ග්‍රාමීය කෘෂි ප්‍රවේශ මාර්ග සඳහා බෝක්කු ඉදිකිරීම/ග්‍රාමීය පුස්තකාල නඟා සිටුවීමේ ව්‍යාපෘතිය)
  - දැහැමි නිවහන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
  - ගම්දොර අභියස වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
  - ශ්‍රමාභිමානී නිවාස ව්‍යාපෘතිය.
  - කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන සඳහා මහන මැෂින් ලබාදීම.
  - කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථානය ඉදිකිරීම.
  - පුහුණු වැඩසටහන.
  - ග්‍රාම සංවර්ධන දත්ත පද්ධතිය

## ප්‍රධාන උපාය මාර්ගයන්

පළාත් සභාව විසින් සපයනු ලබන

- පළාත් සභා සංවර්ධන ප්‍රදාන
- පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන
- ග්‍රාම සංවර්ධන සමිති සතු අරමුදල්

උපයෝගි කරගනිමින් හා ග්‍රාම සංවර්ධන නිලධාරින්ගේ සම්බන්ධීකරණයෙන් ග්‍රාම සංවර්ධන සමිතිවල නිලධාරීන්ගේ සහ සාමාජිකයින්ගේ සහභාගිත්වයෙන් මැහුම් උපදේශිකාවන්ගේ උපදෙස් හා මගපෙන්වීම අනුව කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාවල පුහුණුලාභින්ගේ හැකියාවන් ප්‍රවර්ධනය.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

1 NO POVERTY — 01.සියළු තැන්හී පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම.

9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE — 02.සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය නව්‍යකරණය දිරිගැන්වීම.


3 GOOD HEALTH AND WELL-BEING — 03.නිරෝගීමත් ජීවිතයක් සහතිකකර සෑම වයසකම සිටින සෑම අයෙකුගේම යහජීවනය ප්‍රවර්ධනය කිරීම.

5 GENDER EQUALITY — 04. ස්ත්‍රි පුරුෂ සමානාත්මතාව සාක්ෂාත් කරමින් සියළු කාන්තාවන් සහ ගැහැණු දැරියන් සවිබල ගැන්වීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2018

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අනුමත | 91 |
| 02 | සේවයේ නියුතු | 67 |
| 03 | පුරප්පාඩු | 24 |
| 04 | කොන්ත්‍රාත් | 03 |

කාර්ය මණ්ඩල සංයුතිය - 2018



## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (රු. මි) | 2018 වර්ෂයේ වියදම (රු. මි) | ඉතිරිය (රු. මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | 32.18 | 32.12 | 0.06 | 99.81 |
| ගමන් වියදම් | 1.39 | 1.39 | - | 99.96 |
| සැපයීම් | 1.09 | 1.01 | 0.08 | 92.66 |
| නඩත්තු වියදම් | 0.25 | 0.18 | 0.07 | 72 |
| ගිවිසුම්ගත සේවා | 3.25 | 2.36 | 0.89 | 72.61 |
| මාරු කිරීම් | 0.38 | 0.38 | - | 99.99 |
| එකතුව | 38.54 | 37.44 | 1.10 | |

## මූලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු. මි) | 2018 වර්ෂයේ වියදම (රු. මි) | ඉතිරිය (රු. මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 14.00 | 0.19 | 13.80 | 1.36 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම් හා උපකරණ | 3.00 | - | 3.00 | 0 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම | 3.00 | 0.99 | 2.00 | 33 |
| ආයෝජන | 24.50 | 16.91 | 7.59 | 69.02 |
| සූර්ය බල පද්ධතිය ස්ථාපිත කිරීම | 3.20 | 3.19 | 0.008 | 99.68 |
| දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 6.50 | 0.98 | 5.52 | 15.07 |
| එකතුව | 54.20 | 22.26 | 31.91 | 41.07 |

## කාර්ය සාධන ඉලක්ක 2017 – 2019

| ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|---|
| | | 2017 | 2018 | 2019 |
| පරිසර සුරක්ෂිත ගුණතරුක පරිසර හිතකාමී සමාජයක් බිහි කිරීම | යහපත් පවුල් සංඛ්‍යාව | 725 | 1050 | 2900 |
| හඳුනාගත් ව්‍යාවසායකයින් නගා සිටුවීම | බිහිවූ ස්වයං රැකියා කරුවන් | 74 | 100 | 150 |
| අඩු ආදායම්ලාභී පවුල්වලට නිවාස ආධාර ලබා දීම | නිවාස ගණන | 55 | 87 | 90 |
| තෝරාගත් සාමාජිකයින්ට නායකත්ව පුහුණුව ලබා දීම | පුහුණුලාභීන් | - | 1380 | 1500 |
| ග්‍රාමීය තරුණ පරපුර සවිබල ගැන්වීම | පුහුණුලාභීන් | - | 154 | 200 |
| සමාජ විෂමාචාර වලින් ග්‍රාමීය ප්‍රජාව මුදවා ගැනීම සඳහා පුහුණු වැඩසටහන් | මත්ද්‍රව්‍ය පුහුණුලාභීන් ගණන | - | වැ.ස 10 | වැ.ස 29 |
| පාසල් හැරගිය තරුණ තරුණියන් ප්‍රජා පුහුණු මධ්‍යස්ථානවලට යොමු කිරීම | වාර්ෂිකව මධ්‍යස්ථානවල පුහුණු වන පුහුණුලාභීන් සංඛ්‍යාව | 954 | 877 | 1000 |

## ප්‍රධාන අංශයන්හී කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති -2018

| ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි) | වැය කළ මුදල (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|
| දැහැමි නිවහන | 1.5 | 1.5 | 100 |
| ව්‍යවසායක ප්‍රවර්ධනය | 2.0 | 1.9 | 95 |
| ග්‍රාමීය නායකයින් දැනුවත් කිරිම | 1.5 | 1.3 | 82 |
| ග්‍රාමීය මාර්ග සඳහා බෝක්කු | 1.5 | 1.07 | 71 |
| පුස්තකාල ව්‍යාපෘතිය | 2.00 | 2.00 | 100 |
| ගම්දොර අභියස | 6.50 | 4.31 | 66 |
| ග්‍රාම සංවර්ධන දින සැමරුම හා සමිති ඇගයීම | 1.00 | 0.15 | 15 |
| දිස්ත්‍රික් සංගම් බල ගැන්විම | 2.00 | 2.00 | 100 |
| කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන නිර්මාණ ඇගයිම | 1.00 | 0.13 | 12 |
| ශ්‍රමාභිමානී නිවාස වැඩසටහන | 4.00 | 2.20 | 55 |
| මැහුම් පාඨමාලා ආරම්භ කිරීම | 1.5 | 0.071 | 4 |
| ක්ෂේත්‍ර නිලධාරින් සඳහා කාර්යාලීය උපකරණ ලබා දිම | 2.0 | 1.40 | 70 |
| පුහුණු වැඩසටහන | 2.5 | 0.92 | 37 |
| තරුණ පුහුණුව | 1.5 | 0.13 | 91 |
| ග්‍රාම සංවර්ධන අධ්‍යාපන දැනුම ප්‍රවර්ධන වැඩසටහන | 1.5 | 0.053 | 3 |
| වත්කම් කළමනාකරනය | 0.5 | 0.00 | 75 |
| ග්‍රාම සංවර්ධන ඩිප්ලෝමාව සකස් කිරීම | 0.5 | 0.00 | 75 |
| කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන සඳහා මහන මැෂින් ලබා දීම | 1.5 | 1.48 | 98 |
| දත්ත පද්ධතිය | 1.50 | 1.49 | 99 |
| කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදි කිරිම | 14 | 0.019 | 2 |
| **එකතුව** | **50.00** | **22.123** | |

## සම්පත් උපයෝජනය හා කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

සාරධර්ම සුරකින නිරෝගී පරිසර හිතකාමී සමාජයක් ගම තුළ නිර්මාණය කිරීමේ ක්‍රියාවලියට දායකත්වය සපයන උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව ජනතාව සවිබල ගැන්වීමේ අරමුණින් විවිධ ව්‍යාපෘති ග්‍රාම සංවර්ධන සමිති මූලිකත්වයෙන් පවත්වාගෙන යයි.

දෙපාර්තමේන්තුවක් වශයෙන් අපගේ කාර්යභාරය ගම තුළ ඇති මානව හා භෞතික සම්පත් සංවර්ධනයේ මැදිහත්කරුවන් ලෙස ක්‍රියාකිරීමයි. විවිධ ජීවනෝපාය ක්‍රියාකරකම් මගින් ජන ජීවිතයේ යහපත් වෙනසක් අපේක්ෂා කරන හා ඊට අදාල විවිධ ව්‍යාපෘතින් ග්‍රාම සංවර්ධන සමිති මගින් ක්‍රියාත්මක කරනු ලබයි.

තිරසාර සංවර්ධන දැක්ම සඳහා පුද්ගල සංවර්ධනය කණ්ඩායම් සංවර්ධනය සහ කාර්ය බද්ධ සංවර්ධනය ඉලක්කකර වාර්ෂික පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රතිපාදන මගින් විවිධ ව්‍යාපෘති පළාත පුරා වාර්ෂික අඛණ්ඩව ක්‍රියාවට නංවනු ලබයි. විශේෂයෙන් ග්‍රාමීය ව්‍යවසායකයින් නගා සිටුවීම ව්‍යාපෘතින් ඔවුන්ගේ නිෂ්පාදන හා සේවාවන්වල වර්ධනයක් සිදුවන අතර ගැමි ආර්ථිකය ශක්තිමත් වීම තුළින් ණය බර අවම වීම සිදුවන අතර ස්වශක්තියෙන් නැගී සිටින මනා කළමනාකරණයකින් යුතු පුද්ගලයින් බිහි කිරිම අපේක්ෂාවයි.

2018 වර්ෂය වෙනුවෙන් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා පළාත් සභා සංවර්ධන ප්‍රදාන වෙනුවෙන් රු.මි.56ක මුදලක් මුළු වර්ෂය පුරා උතුරු මැද පළාතේ තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමට සහ ආයතනය පවත්වා ගෙන යාම සඳහා යෙදවීමට හැකියාව ලැබුණු අතර වර්ෂය අවසානයේ සියළු ව්‍යාපෘති සාර්ථකව අවසන් කිරීමට හැකි වූ අතර එසේ වීමට කාර්යාලගත සහ ක්ෂේත්‍රගත සියළුම කාර්ය මණ්ඩලය මනා කාර්යක්ෂමතාවයකින් යුතුව කටයුතු කිරීම අගය කළ යුතුය.

සාරධර්ම සුරකින පරිසර හිතකාමී යහපත් ආර්ථිකයකින් හෙබි සුරක්ෂිත පවුල් ඒකක බිහි කිරීමේ අරමුණින් පැවැත්වූ දැහැමි නිවහන ව්‍යාපෘතිය 2018 වසරේදී ඉතාමත් සාර්ථකව පැවැත්වූ අතර පළාත පුරා ග්‍රාම සංවර්ධන සමිතිවලට සම්බන්ධ ස්වෝත්සාහයෙන් නැගී සිටීමට උත්සාහ දරණ සාමාජිකයන් ප්‍රවර්ධනය කිරීම සඳහා ව්‍යවසායක ප්‍රවර්ධනය ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. එසේම ග්‍රාමීය නායකයින් දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය, ග්‍රාමීය මාර්ග සඳහා බෝක්කු ඉදි කිරිම, ශ්‍රමාභිමානී නිවාස ඉදි කිරීමේ ව්‍යාපෘතිය, ග්‍රාම සංවර්ධන සමිති ඇගයීම, දිස්ත්‍රික් සංගම් බල ගැන්වීම කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන පාඨමාලාව සහ නිර්මාණ ඇගයීමේ ප්‍රදර්ශනය සාර්ථකව සිදු විය. රු.මි.6.5 ක් වියදම්කර 2018 වර්ෂයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 04ක ගම්දොර අභියස සංවර්ධන සහ කලා මංගල්‍ය වැඩි ජනතා සහභාගීත්වයෙන් සහ ප්‍රසාදයෙන් සිදු විය.

එසේම 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ රු.මි.2ක ප්‍රතිපාදන යොදා ගනිමින් ගමට දැනුම ලබා දීමේ අරමුණින් උතුරු මැද පළාතේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 10ක දැනුම් කේන්ද්‍රීය මධ්‍යස්ථාන ආරම්භ කරන ලදී. ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය සාම්ප්‍රදායික තත්වයන්ගෙන් මිදි තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගත හැකිවන පරිදි තරුණ පරපුර ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය ශක්තිමත් කිරීම සඳහා තරුණ නායකත්ව පුහුණු ව්‍යාපෘතිය සාර්ථකව පැවැත්විය.

එසේම උතුරු මැද පළාතේ ජනතාවගේ ආර්ථිකය ඉහළ මට්ටමකට ගෙන ඒම ස්වයං රැකියා නිෂ්පාදන වෙළෙඳපොළක් ආරම්භ කිරීමට සහ ව්‍යවසායකයින්ගේ සංගමය සඳහා කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන ගොඩනැගිල්ල (තිරසර ප්‍රජා පුහුණු මධ්‍යස්ථානය) ඉදි කිරීමට කටයුතු කිරීම සතුටට කරුණකි.

ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය සතු සියළුම තොරතුරු ඒකරාශී කිරීම සහ නවීන තාක්ෂණය ඔස්සේ තොරතුරු හුවමාරු කර දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා නිලධාරීන්ට පරිගණක ලැප්ටොප් ලබා දීමද 2018 වර්ෂයේ සිදු විය. එසේම දෙපාර්තමේන්තුවේ කාර්යාලගත සහ ක්ෂේත්‍රගත සියළුම නිලධාරීන්ට පරිගණක පුහුණුව ලබා දීමද සිදු වූ අතර ග්‍රාම සංවර්ධන සමිති ව්‍යවස්ථාව ප්‍රාදේශිය සංගම් සඳහා ව්‍යවස්ථාව සහ දිස්ත්‍රික් සංගම් සඳහා ව්‍යවස්ථාව සකස් කළ අතර ග්‍රාම සංවර්ධන සමිති පවත්වාගෙන යාමට අදාලව සියළුම මාර්ගෝපදේශනයන් සහ තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමට හැකි අයුරින් ග්‍රාම සංවර්ධන මාර්ගෝපදේශන ග්‍රන්ථය සකස් කිරීම උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයේ තවත් ප්‍රශස්ත පියවරකි.

-මෙය හිස්ව තබන ලද පිටුවකි-

# 10.4. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

## දැක්ම

"ආරක්ෂාකාරී සහ කාර්යක්ෂම ඒකාබද්ධ මාර්ග පද්ධතියක්, සමෘද්ධිමත් ප්‍රජාවක්."

## මෙහෙවර

"මාර්ග සංවර්ධන සැලසුම් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, නඩත්තුව ඇතුළු අධ්‍යයන සහ පර්යේෂණ කටයුතු සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් සහ විනිවිදභාවයකින් යුක්තව ඉටු කිරීම."

## දිගුකාලීන අරමුණු

- ❖. සංවර්ධන ප්‍රදේශයක හෝ පළාත් මහ මාර්ගයක, මාර්ග සංවර්ධන, වැඩිදියුණු කිරීම ඇතුළු වැඩසටහන් සම්පාදනය කිරීම.
- ❖. මාර්ග සැලසුම් කිරීම හා අනුකූල වූ සංවර්ධන වැඩ ක්‍රියාකාරකම් හා සේවාවන් සම්බන්ධිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ❖. ආණ්ඩුවේ නියෝජිත ආයතනවල හෝ වෙනත් ඉල්ලීම මත මාර්ග සංවර්ධන ව්‍යාපෘති හෝ යෝජනා ක්‍රම පිළියෙල කිරීම, ක්‍රියාත්මක කිරීම හා සේවා සැපයීම.

## කෙටිකාලීන අරමුණු

- ❖.දෛනික හා කාලීන නඩත්තු ශක්තිමත්ව හා කාර්යක්ෂමව සිදු කිරීම මගින් මාර්ග බාධා හා අවහිරතා අවම කර ගමනා ගමනය විධිමත්ව පවත්වා ගැනීම.
- ❖. විධිමත් කාණු සහ ජල අපවහන පද්ධතියක් හැකි සෑම විටම පවත්වා ගැනීම සහ මේ සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීම සහ සහයෝගය ලබා ගැනීම.
- ❖. මාර්ග රක්ෂිත අත්පත්කර ගැනීමට අදාල නීතිමය පසුබිමක් ( පළාත් සභා නීති අංශයේ සහයෙන්) සකසා සුදුසු ක්‍රියා මාර්ග ගැනීම.
- ❖. අතවශ්‍ය මාර්ග සංඥා ස්ථාපිත කිරීම සහ පදික මාරු වීම් සලකුණු කිරීමට විධිමත් වැඩ පිළිවෙලක් සැකසීම.
- ❖. පළාත් සභා මාර්ගයන්හි ස්ථාපිත කරනු ලබන නාම පුවරු නියාමනය කිරීමට වැඩ පිළිවෙලක් සැකසීම හා ඒ සඳහා අයකිරීමක් සිදු කිරීම.

## ප්‍රධාන කාර්යයන්

**01. මාර්ග සැලසුම් සහ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම.**

- ❖ මාර්ග පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම.
- ❖ මාර්ග ප්‍රවේශයන්, පරිශ්‍රයන් ඇතුළු යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- ❖ මාර්ගවල යටිතල පහසුකම් සංවර්ධනය (පාලම්, බෝක්කු ඇතුළු නිර්මිතයන්)
- ❖ මාර්ග සංඥා සහ සළකුණු ස්ථාපිත කිරීම.

**02.** **මාර්ග නඩත්තු කිරීම.**

- ❖ දෛනික නඩත්තුව
- ❖ කාලීන නඩත්තුව
- ❖ හදිසි අවස්ථා නඩත්තුව

## අධ්‍යයන සහ පර්යේෂණ සිදු කිරිම

ශක්‍යතා අධ්‍යයනය


- ❖ අධිබර වාහන ගමනාගමනය පිළිබඳ අධ්‍යයනයන්.
- ❖ මාර්ගයන්හි රථවාහන ප්‍රමාණයන් සහ එහි ප්‍රවර්ධනයන් (Traffic Volume) අධ්‍යයනය.
- ❖ අනවසර සහ මාර්ග රක්ෂිතවලට සිදුවී ඇති බලපෑම් පිළිබඳ අධ්‍යයනයන්
- ❖ විශේෂිත මාර්ග අවශ්‍යතා සහ සිද්ධි සහිත මාර්ගයන් හඳුනා ගැනීම.
- ❖ සමාජ සහ පාරිසරික අධ්‍යයනයන්, කාණු සහ ජලප්‍රවාහන පද්ධතීන් පිළිබඳව අධ්‍යයනයන්.
- ❖ කාණු සහ ජලප්‍රවාහන පද්ධතීන් පිළිබඳව අධ්‍යයනයන්
- ❖ නව තාක්ෂණික ඉදි කිරීම් සහ රසායනාගාර පරීක්ෂණයන්.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

- ❖ අරමුණු 09 : සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනයකර නව්‍යකරණය දිරිගැන්වීම.
- ❖ අරමුණු 11 : නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම.

## කාර්ය මණ්ඩල තොරතුරු - 2018

| අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 170 |
| 2 | සේවයේ නියුතු (ස්ථිර) | 158 |
| 3 | පුරප්පාඩු | 9 |
| 4 | අනියම් | 3 |
| 6 | කොන්ත්‍රාත් | 6 |



කාර්ය මණ්ඩල සංයුතිය - 2018

## පුනරාවර්තන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි.) | 2018 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි* | 60.00 | 60.00 | - | 100 |
| මාර්ග නඩත්තු වියදම් | 190.00 | 189.99 | - | 100 |

අධිකාරියේ සමස්ත පුද්ගල පඩිනඩි සඳහා 2018 වර්ෂය වෙනුවෙන් රු.118,620,748.20 මුදලක් වැය වී ඇති අතර, ඉන් ඉහත සඳහන් රු.60,000,000.00 මුදල පළාත් සභා ප්‍රදාන වශයෙන් ලබා දී ඇති අතර, ඉතිරිය රු.58,620,748.20 මුදල ආයතනයේ ඉපයූ මුදලින් දරා ඇත.

## පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම - 2018

| ව්‍යාපෘතිය | විධායක ඉංජිනේරු කාර්යාලය | විස්තරය |
|---|---|---|
| බෝක්කු ඉදිකිරීම | අනුරාධපුර | ඇතාකඩ - ඇටඹගස්කඩ - තෝනිගල මාර්ගයේ බෝක්කුව ඉදිකිරීම (1+114), (2+050) හා (4+020) |
| | අනුරාධපුර | ඇතාකඩ - ඇටඹගස්කඩ - තෝනිගල මාර්ගයේ පෙට්ටි බෝක්කුව ඉදිකිරීම |
| | අනුරාධපුර | ඇතාකඩ - ඇටඹගස්කඩ - තෝනිගල මාර්ගයේ බෝක්කුව ඉදිකිරීම (4+720) |
| | නොච්චියාගම | කොක්කිච්චිය - දිගනේගම මාර්ගයේ බෝක්කුව (2+550) |
| | නොච්චියාගම | නොච්චියාගම - කරඹෑව මාර්ගයේ බෝක්කුව ඉදිකිරිම |
| | නොච්චියාගම | අලුත්ගම - පුවරසන්කුලම මාර්ගයේ බෝක්කුව ඉදිකිරිම (1+550) |
| | හොරොව්පොතාන | ඉකිරිගොල්ලෑව - රත්මල්ගහවැව මාර්ගයේ බෝක්කුව ඉදිකිරිම (18+400) |
| | හොරොව්පොතාන | ඉකිරිගොල්ලෑව - රත්මල්ගහවැව මාර්ගයේ බෝක්කුව ඉදිකිරිම (18+637) |
| පැති බැමි ඉදිකිරීම | සේවාගම | ආර්.බී. - ඩී2 ඇල මාර්ගයේ පැති බැම්ම ඉදිකිරිම |
| | සේවාගම | ඩී1 උතුරු ඇල බැම්ම මාර්ගයේ පැති බැම්ම ඉදිකිරිම |
| කාණු පිළිසකර කිරීම | අනුරාධපුර | අනගාරික ධර්මපාල විහාරස්ථානය ඉදිරිපිට කාණුව සහිත කොටස පිළිසකර කිරිම |

## මූලධන වියදම් - 2018

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2018 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පළාත් මාර්ග පුනරුත්ථාපනය | 400.00 | 238.96 | 161.03 | 60 |
| උතුරු පළාත් සම්බන්ධතා මාර්ග ව්‍යාපෘතිය (ආසියානු සංවර්ධන බැංකුව) | 20.37+30.19 (අතිරේක ප්‍රතිපාදනය) | 48.06 | 2.49 | 95 |

## කාර්ය සාධන ඉලක්ක - 2018

| ආයතනයේ අරමුණු | කාර්ය සාධන දර්ශක | ඉලක්ක | | |
|---|---|---|---|---|
| | | 2017 | 2018 | 2019 |
| සංවර්ධන ප්‍රදේශයක හෝ පළාත් මහා මාර්ගයක, මාර්ග සංවර්ධන, වැඩිදියුණු කිරීම ඇතුළු වැඩසටහන් සම්පාදනය කිරීම | පුනරුත්ථාපනය කරන ලද පාරවල් වල දුර ප්‍රමාණය (කි.මී) | 12.9 | 6.7 | 10 |
| | වැඩිදියුණු කරන ලද පාරවල් වල දුර ප්‍රමාණය (කි.මී) | - | 5.6 | 10 |
| දෛනික හා කාලීන නඩත්තු ශක්තිමත්ව හා කාර්යක්ෂමව සිදු කිරීම මගින් මාර්ග බාධා හා අවහිරතා අවම කර ගමනාගමනය විධිමත්ව පවත්වා ගැනීම | නඩත්තු කරන ලද පාරවල් වල දුර ප්‍රමාණය (කි.මී) | 1239 | 1667 | 1700 |
| අතවශ්‍ය මාර්ග සංඥා ස්ථාපිත කිරීම සහ පදික මාරු වීම් සලකුණු කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සැකසීම. | මාර්ග සළකුණු කිරීම් ප්‍රමාණය (වර්ග මීටර්) | - | 3500 | 1500 |
| | සංඥා පුවරු ස්ථානගත කිරීම ( ගණන) | 0 | 460 | 400 |
| මාර්ග රක්ෂිත අත්පත්කර ගැනීමට අදාල නීතිමය පසුබිමක් ( පළාත් සභා නීති අංශයේ සහයෙන්) සකසා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම | මාර්ග රක්ෂිත ලකුණු කිරීම් (කි.මී) | 0 | 0 | 25 |
| | අනවසර ඉදිකිරීම් ඉවත්කිරීම් (ගණන) | 0 | 0 | 5 |
| විධිමත් කාණු සහ ජල අපවහන පද්ධතියක් හැකි සෑම විටම පවත්වා ගැනීම සහ මේ සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීම සහ සහයෝගය ලබා ගැනීම | ඉදිකළ පාලම් ( ගණන) | 0 | 0 | 2 |
| | ඉදිකළ box culverts ( ගණන) | - | 2 | 5 |
| ආයතනය තුළ ධාරිතා සංවර්ධනය | යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම් (ගණන) | - | 0 | 13 |
| | Asphalt plant ස්ථාපිත කිරීම | 0 | 0 | 1 |
| | Hume pipe නිෂ්පාදනාගාරයක් ආරම්භ කිරීම | 0 | 0 | 1 |
| | බොරළු වලවල් සකස් කිරීම | 0 | 0 | 4 |

## ප්‍රධාන අංශයන්හි කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය සංවර්ධන වැඩසටහන් - 2018

| ප්‍රධාන අරමුණු | ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| ගුණාත්මක ප්‍රාදේශීය මාර්ග පද්ධතියක් ඇති කිරීම | මාර්ග කාපට් අතුරා සංවර්ධනය කිරීම. | 221.53 | 87.72 | 89 |
| සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම | පෙට්ටි බෝක්කු ඉදි කිරීම. | 15.40 | 10.88 | 96 |

## මාර්ග නඩත්තු වැඩ සටහන 2018 - අනුරාධපුර දිස්ත්‍රික්කය

| වි.ඉංජිනේරු කොට්ඨාශය | ආවරණය වන ප්‍රා.ලේ. කොට්ඨාශ | නඩත්තු කරන ලද මාර්ග | | වියදම (රු.මි) |
|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | දුර.කි.මි. | |
| අනුරාධපුර | මිහින්තලය, රඹෑව, මැදවච්චිය, නෑ.නු.ප. | 43 | 365 | 23.92 |
| හොරොව්පොතාන | ගලෙන්බිදුනවැව, කහටගස්දිගිලිය, කැබිතිගොල්ලෑව, හොරොව්පොතාන, පදවිය | 41 | 325 | 35.86 |
| මරදන්කඩවල | ගල්නෑව, ඉපලෝගම,තලාව, කැකිරාව, පලාගල,පලුගස්වැව, තිරප්පනේ | 42 | 300 | 30.87 |
| නොච්චියාගම | තලාව, මනුප, විලච්චිය, නොච්චියාගම, රාජාංගනය | 31 | 280 | 29.97 |
| එකතුව | | | | **120.62** |

## මාර්ග නඩත්තු වැඩ සටහන 2018 - පොළොන්නරුව දිස්ත්‍රික්කය

| වි.ඉංජිනේරු කොට්ඨාශය | ආවරණය වන ප්‍රා.ලේ. කොට්ඨාශ | නඩත්තු කරන ලද මාර්ග | | වියදම (රු.මි) |
|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | දුර (කි.මි.) | |
| සේවාගම | තමන්කඩුව, ලංකාපුර | 23 | 100.34 | 17.65 |
| මින්නේරිය | ඇලහැර, හිගුරක්ගොඩ, මැදිරිගිරිය | 17 | 117.75 | 18.22 |
| මනම්පිටිය | දිඹුලාගල, වැලිකන්ද | 35 | 178.22 | 20.18 |
| ප්‍රාදේ.කාර්යාලය මගින් තාර, පෙරමුසු, නඩත්තු උපකරණ මිළදී ගැනීම, ආයතනයේ යන්ත්‍ර සූත්‍ර සේවාවන් නඩත්තු කටයුතු ඇතුළු ඉන්ධන සඳහා වූ වියදම් | | | | 13.29 |
| එකතුව | | | | 69.34 |

මාර්ග නඩත්තු වැඩසටහන යටතේ උතුරු මැද පළාතේ මාර්ග නඩත්තු කටයුතු සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනය රු. මිලියන 190 ඉහත මාර්ග නඩත්තුව යටතේ පහත ක්‍රියාකාරකම් මූලික වශයෙන් සිදු කර ඇත.

- ❖ මාර්ගය දෙපස කැළය කැපීම.
- ❖ දෙපස උස් සහිත කොටස් යන්ත්‍රානුසාරයෙන් සැකසීම (Clearing High side ).
- ❖ මාර්ගය දෙපස සහ පෘෂ්ඨයේ පවතින කඩතොළු පෙරමුසු යොදා සැකසීම.
- ❖ අවශ්‍ය ස්ථානයන්හි තාර ආලේපනය (Sand Sealing).
- ❖ ක්ෂය වී ඇති උරහිස් (Shoulder) නැවත බොරළු අතුරා තලා සැකසීම.
- ❖ කාණු පවිත්‍රා කිරීම/ කැපීම හා ජල අපවාහන පද්ධති පිළිසකර කිරීම.
- ❖ කැඩී බිඳී ඇති නිර්මිතයන් පිළිසකර කිරීම.
- ❖ මාර්ග සංඥා පුවරු ස්ථාපනය.
- ❖ මාර්ග සලකුණු කිරීම්.

**විදේශ ආධාර මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති තුළින් ජනිත කළ ප්‍රතිලාභ (ආසියානු සංවර්ධන බැංකු ආධාර)**

| ව්‍යාපෘතිය | මුදල (රු.මි) | | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|
| | වෙන්කළ මුදල (රු.මි) | වැයකළ මුදල (රු.මි) | භෞතික | මූල්‍ය |
| කැබිතිගොල්ලෑව - හඳගල මාර්ගය | 308.14 | 289.23 | 94 | 100 |
| තේක්කවත්ත පුල්එලිය මාර්ගය හා දාච්චිදමන -පරණ හල්මිල්ලෑව මාර්ගය | 303.14 | 282.42 | 93 | 100 |
| කිරිකෙටුවැව - බණ්ඩාර උල්පත - කපුගොල්ලෑව මාර්ගය | 559.37 | 509.53 | 91 | 100 |
| යකාවැව - මහකෝන්ගස්කඩ මාර්ගය | 395.06 | 391.44 | 99 | 100 |
| කිරිගල්ලෑව - හීරලුගම මාර්ගය හා ඇතාකඩ ඇටඹගස්වැව තෝනිගල මාර්ගය | 406.65 | 367.65 | 90 | 100 |

## වෙනත් රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තුවලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති - 2018

| ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | වෙන් කළ (රු.මි) | ප්‍රගතිය(%) | |
|---|---|---|---|---|
| | | | භෞතික | මූල්‍ය |
| කහටගොල්ලෑව-ගල්කඩවල -වාහල්කඩ D2 මාර්ගය. (0+000-4+000 km) | සංවර්ධන ප්‍රදේශයක හෝ පළාත් මහා මාර්ගයක, මාර්ග සංවර්ධන, වැඩිදියුණු කිරීම ඇතුළු වැඩසටහන් සම්පාදනය කිරීම | 92.48 | 50 | - |
| අනුරාධපුර මුස්ලිම් පල්ලිය සළුසල මාර්ගය (0.362 km) | ගුණාත්මක ග්‍රාමීය මාර්ග පද්ධතියක් ඇති කිරීම | 9.91 | 98 | - |
| කැකිරාව ඩිපෝ පාර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (0+000-0+800) | සංවර්ධන ප්‍රදේශයක හෝ පළාත් මහා මාර්ගයක, මාර්ග සංවර්ධන, වැඩිදියුණු කිරීම ඇතුළු වැඩසටහන් සම්පාදනය කිරීම | 5.50 | 75 | - |
| ආනකටාව හබරත්තාවල ගම්මානයේ මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | ගුණාත්මක ග්‍රාමීය මාර්ග පද්ධතියක් ඇති කිරීම | 4.92 | 100 | - |
| දිවුලන්කඩවල හංදියේ සිට දේවාල කොළනිය හරහා කවුඩුළු වැව දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | සංවර්ධන ප්‍රදේශයක හෝ පළාත් මහා මාර්ගයක, මාර්ග සංවර්ධන,වැඩිදියුණු කිරීම ඇතුළු වැඩසටහන් සම්පාදනය කිරීම | 4.98 | 100 | 100 |
| අනුරාධපුර දූර සේවා බස්නැවතුම්පොල භූමිය කාපට් ඇතිරීම. | සංවර්ධන ප්‍රදේශයක හෝ පළාත් මහා මාර්ගයක, මාර්ග සංවර්ධන, වැඩිදියුණු කිරීම ඇතුළු වැඩසටහන් සම්පාදනය කිරීම | 5.90 | 100 | - |
| තඹුත්තේගම බස්නැවතුම්පොල භූමිය කාපට් ඇතිරීම. | සංවර්ධන ප්‍රදේශයක හෝ පළාත් මහා මාර්ගයක, මාර්ග සංවර්ධන, වැඩිදියුණු කිරීම ඇතුළු වැඩසටහන් සම්පාදනය කිරීම | 12.68 | 60 | - |
| නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පාලම් 09 ක අත්වැටවල් ඉදිකිරීම | සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම | 3.29 | 100 | 100 |

## ආයතනයේ හා අදාල අංශයේ සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් පිළිබඳ විග්‍රහය

| අරමුණ | 2019 ඉලක්ක |
|---|---|
| ආයතනය තුළ ධාරිතා සංවර්ධනය කර කාර්ය සාධනය ඉහළ නංවා ගැනීම | ඇස්ෆෝල්ට් බලාගාරයක් (Asphalt plant) ඉදිකිරීම. |
| | හියුම් පයිප්ප නල (Hume pipe) නිෂ්පාදනාගාරයක් ඉදිකිරීම. |
| | කොට්ඨාශ මට්ටමින් බොරළු නිධි හඳුනාගැනිම සහ සේවා සලසා ගැනීම |

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

### 2018 වර්ෂයේදී සංවර්ධනය කරන ලද මාර්ග හා එහි ප්‍රගතිය

සමස්ත සම්පත් උපයෝජනය පිළිබඳව ප්‍රගතිය (භෞතික, මානව හා මූල්‍ය සම්පත්)

2018 සංවර්ධන වැඩසටහන යටතේ මාර්ග සංවර්ධන, මාර්ග සම්බන්ධ යටිතල පහසුකම් සංවර්ධනයට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. ආරක්ෂාකාරී හා කාර්යක්ෂම ඒකාබද්ධ මාර්ග පද්ධතියක් හා සමෘද්මත් ප්‍රජාවක් යන දැක්ම කරා යන අධිකාරියේ ගමන්මගේ අමාත්‍යංශ ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘතීන්ට අමතරව බාහිර ආයතනවල ප්‍රතිපාදන යොදවා කෙරෙන ව්‍යාපෘතීන්ද, මහජන ඉල්ලීම් හා දේශපාලනාධිකාරිය විසින් කරන ලද ඉල්ලීම් වලට අනුව සිදුකරන ව්‍යාපෘතීන්ද වේ.




මැණිකේ ඇල බෝගස්වැව මාර්ගය

එසේම අධිකාරියේ දැනට පවතින බඳවා ගැනීම් පටිපාටියට අනුව සැලසුම් ශිල්පීන් දෙදෙනෙක් පමණක් බඳවාගෙන ඇත. නමුත් නව තාක්ෂණ ක්‍රමවේදයන් යටතේ level සහිත මිනුම් ගෙන ඒවා පරිගණකය ආධාරයෙන් නිර්මාණය කර (plotting) මිනුම් ගැනීම සිදු කළ යුතුවේ. එමනිසා නිත්‍ය වැඩ හා බාහිර වැඩ සියල්ල සිදුකර ගැනීම අපහසු කාර්යයක් බැවින් ගුණාත්මක කාර්ය සාධනයක් ළඟාකර ගැනීමට මෙම තනතුරු සංඛ්‍යාවල සංශෝධන සිදුවිය යුතුයි.

පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් පළාත් මාර්ග කි.මී. 12කට ආසන්න ප්‍රමාණයක් මෙම වර්ෂය තුළදී පුනරුත්ථාපනය කරන ලද අතර, මාර්ග නඩත්තු යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මාර්ග 1270 ක් පමණද, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මාර්ග 400ක් පමණද නඩත්තු කරන ලදි. මීට අමතරව මාර්ග හා සම්බන්ධ යටිතල පහසුකම් පුනරුත්ථාපනය සහ වෙනත් අදාල නවීකරණයන් සහිතව අඛණ්ඩව මාර්ග නඩත්තු කිරිම සිදු විය.

අධිකාරියේ මෙහෙවර සමාජයට දායාද කරනු පිණිස ඉටු කළ යුතු ප්‍රධාන කාර්යයන් ගුණාත්මක ලෙස සිදු කිරීමට හා තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට ආයතනයේ භෞතික, මූල්‍ය හා මානව සම්පත් උපරිම අයුරින් උපයෝගී කර ගන්නා ලදි.



සලුසල මාර්ගය

ප්‍රදේශයේ මාර්ග සංවර්ධන හා අදාල තාක්ෂණික සේවාවන් අවශ්‍ය වේලාවන්වලදී අවශ්‍ය ආයතනවලට ලබාදීම මෙම අධිකාරියෙන් සිදු වූ සුවිශාල සේවාවකි. තවද තිරසර සංවර්ධනයක් අරමුණු කරගෙන ආයතනය විසින් සංවිධානය කරන ලද මාර්ග දෙපස රුක් රෝපණ වැඩසටහනේ පළමු අදියර සාර්ථකව නිම කරන ලදි.



වැලිඔය තම්මැන්නාව පෙට්ටි බෝක්කුව

එසේ වුවද කාර්ය සාධනය කරා ළඟාවීමේ අභියෝග හා ගැටළුවලට මුහුණ දීමට ද සිදු විය. ඒ අතර

**01)** ව්‍යාපෘති පිරිනැමීමේදී ඇතිවූ දුෂ්කරතා

සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා වූ අනුමැතිය මාර්තු මස අග භාගයේ ලැබී ඇති අතර ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු යෝජිත කාල වකවානුව තුළ සිදු කිරීමට නොහැකි විය.



රුවන්වැලිසෑය පිවිසුම් මාර්ගය

ඇතැම් ව්‍යාපෘති සඳහා තේරී පත්වී තිබූ කොන්ත්‍රාත්කරුවන් බද්ධ ව්‍යාපාර ගිවිසුම් යටතේ ලංසු ඉදිරිපත් කර තිබූ අතර නිසි පරිදි ප්‍රමුඛ පාර්ශවකරුවා කවුරුන්ද යන්න ඉදිරිපත්කර නොතිබූ බැවින් එය නිරාකරණය කර ගැනීමට කල් ගතවූ අතර මේ හේතුකොට තාක්ෂණික වාර්තා සකස් කිරීම හා එම ව්‍යාපෘති පිරිනැමීම ප්‍රමාද විය.

**02)** ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඇස්තමේන්තු සකස්කර අනුමැතියද ලබාගත් පසු ප්‍රදේශවාසීන්ගේ හා දේශපාලනාධිකාරියේ දැඩි ඉල්ලීම මත ඇස්තමේන්තු සංශෝධනය කිරීමට සිදුවීම නිසා එම ව්‍යාපෘති පිරිනැමීම ප්‍රමාද විය.

**03)** අමුද්‍රව්‍ය සපයා ගැනිමේ දුෂ්කරතා

මාර්ග සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය මූලික අමුද්‍රව්‍ය වන බොරළු, මිශ්‍රගල් (ඒබීසී) ප්‍රමාණවත්ව ලබා ගැනීම ගැටළුකාරි තත්තවයක් වී ඇති බව ඉදි කිරීම් ආයතන මගින් පෙන්වා දී ඇත. විශේෂයෙන්ම පාරිසරික සහ සාමාජීය වශයෙන් බලපා ඇති යම් යම් හේතු කාරණා මත අමුද්‍රව්‍ය ලබා ගැනීම සහ ප්‍රවාහනයකර සැපයීම්වලට බාධාවන් සිදු වීම යන ගැටළු කැපී පෙනේ.



නාච්චාදුව පාලම් අත්වැටවල් සැකසීමේ ව්‍යාපෘතිය

මේ හේතු කොට ඉලක්කගත සහ අදාල කාල වකවානු තුළ සංවර්ධන කටයුතු අවසන් කිරීම අපහසු කාර්යක් වුවද පළාතේ මාර්ග සංවර්ධන ක්‍රියාවලිය උදෙසා අනෙකුත් ආයතන හා මනා සම්බන්ධිකරණයක් පවත්වා ගනිමින් තිරසර සංවර්ධනය මූලික කරගත් නිසා අපේක්ෂිත ප්‍රතිඵල කරා උපරිම අයුරින් ළඟා වීමටත් ආයතනයේ කාර්යය සාධනය පසුගිය වසරට වඩා ඉහළ නංවා ගැනීමටත් හැකි විය.

# ඇමුණුම්

## පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් අනුමැතිය ලබා දුන් සංවර්ධන ව්‍යාපෘති - 2018

**01.** පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදන, පළාත් පාලන, ග්‍රාමීය යටිතල පහසුකම් හා විශේෂ ව්‍යාපෘති, සංචාරක, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ/නව | 2018 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01.සංස්කෘතික | ප.නි.සං.ප්‍ර.(PSDG) | - | නව | | - |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 35,150,000.00 | නව | 32,350,000.00 | 11 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 10,150,000.00 | අඛණ්ඩ | 10,150,000.00 | 3 |
| 02. පානීය ජල පහසුකම් සැපයීම | ප.නි.සං.ප්‍ර.(PSDG) | 21,758,239.00 | නව | 21,758,239.00 | 11 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | 18,241,731.00 | අඛණ්ඩ | 18,241,731.00 | 3 |
| 03. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය | ප.නි.සං.ප්‍ර.(PSDG) | 20,000,000.00 | නව | 20,000,000.00 | 13 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | - | අඛණ්ඩ | - | - |
| 04. මාර්ග | ප.නි.සං.ප්‍ර.(PSDG) | 45,534,671.17 | නව | 45,534,671.17 | 34 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | 34,461,912.99 | අඛණ්ඩ | 34,461,912.99 | 23 |
| 05. වෙනත් පළාත් පාලන සේවා | ප.නි.සං.ප්‍ර.(PSDG) | 8,624,184.42 | අඛණ්ඩ | 8,624,184.42 | 15 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | 11,380,000.00 | නව | 11,380,000.00 | 12 |
| 06. අධ්‍යාපන | ප.නි.සං.ප්‍ර.(PSDG) | 12,730,000.00 | නව | 12,730,000.00 | |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | 550,000,000.00 | අඛණ්ඩ | 550,000,000.00 | 108 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

**01.පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදන, පළාත් පාලන, ග්‍රාමීය යටිතල පහසුකම් හා විශේෂ ව්‍යාපෘති, සංචාරක, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය ඉතිරි කොටස..**

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ/නව | 2018 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 07. ආයතනික සංවර්ධනය | ප.ස.සං.ප්‍ර.(PCDG) | 16,740,000.00 | අඛණ්ඩ | 16,740,000.00 | 2 |
| 08. ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය | ප.ස.සං.ප්‍ර.(PCDG) | 42,180,000.00 | අඛණ්ඩ | 42,180,000.00 | 13 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | | | | |
| 09. හුදකලා හා පසුගාමී සංවර්ධන ව්‍යාපෘති | ප.ස.සං.ප්‍ර.(PCDG) | 14,000,000.00 | අඛණ්ඩ | 14,000,000.00 | 33 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | | නව | | |
| 10 . අමාත්‍යවරයා හා කාර්ය මණ්ඩලය | ප.ස.සං.ප්‍ර.(PCDG) | 2,000,000.00 | නව | 2,000,000.00 | 2 |
| 11 . අමාත්‍යාංශ හා කාර්ය මණ්ඩලය | ප.ස.සං.ප්‍ර.(PCDG) | 41,000,000.00 | නව | 41,000,000.00 | 41 |
| 12.ග්‍රාමීය යටිතල පහසුකම් | ප.ස.සං.ප්‍ර.(PCDG) | 40,000,000.00 | නව | 26,630,000.00 | 12 |
| 13.ජීවනෝපාය සංවර්ධණය | ප.ස.සං.ප්‍ර.(PCDG) | 20,000,000.00 | නව | 20,000,000.00 | 9 |
| 14.සංචාරක කටයුතු | ප.ස.සං.ප්‍ර.(PCDG) | 128,000,000.00 | නව | 125,000,000.00 | 1 |
| 15.ප්‍රාදේශීය සභා කාර්යාල පරිශ්‍ර ඉදි කිරිම | ප.ස.සං.ප්‍ර.(PCDG) | 27,400,000.00 | නව | 27,360,000.00 | 2 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 29,000,000.00 | නව | 29,000,000.00 | 4 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## 02. පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන, සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

| සංරචකය | මූලාශ්‍ර ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අවිච්ඡේද/නව | 2018 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01.කෘෂිකර්ම | ප.නි.සං.ප්‍ර.(PSDG) | 2,000,000.00 | නව | 2,000,000.00 | 1 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | 2,614,042.32 | අවිච්ඡේද | 2,614,042.32 | 1 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 126,380,000.00 | නව | 126,380,000.00 | 33 |
| 02. සත්ත්ව නිෂ්පාදන | ප.නි.සං.ප්‍ර.(PSDG) | 81,100,000.00 | නව | 81,100,000.00 | 29 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | 8,250,000.00 | අවිච්ඡේද | 8,250,000.00 | 2 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 3,500,000.00 | නව | 3,500,000.00 | 2 |
| 04. කෘෂිකර්ම අමාත්‍යාංශය | ප.ස.සං.ප්‍ර.(PCDG) | 5,000,000.00 | නව | 5,000,000.00 | 11 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | 55,000,000.00 | අවිච්ඡේද | 11,057,275.48 | 4 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | 55,000,000.00 | නව | 43,900,000.00 | 17 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## 03. පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අවිච්ඡේද/නව | 2018 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01.සෞඛ්‍ය | ප.නි.සං.ප්‍ර.(PSDG) | 93,563,613.09 | නව | 93,563,613.09 | 83 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | 289,965,441.00 | අවිච්ඡේද | 289,965,441.00 | 89 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 4,000,000.00 | නව | 4,000,000.00 | 1 |
| | ලෝක බැංකු(WB) | 292,111,522.73 | නව | 292,111,522.73 | 144 |
| | ලෝක බැංකු(WB) | 189,513,144.17 | අවිච්ඡේද | 189,513,144.17 | 47 |
| 02. ආයුර්වේද | ප.නි.සං.ප්‍ර.(PSDG) | 78,112,875.52 | නව | 78,112,875.52 | 13 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 3,000,000.00 | නව | 3,000,000.00 | 1 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | 11,887,124.48 | අවිච්ඡේද | 11,887,124.48 | 6 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | - | අවිච්ඡේද | - | - |
| 03. පරිවාස හා ළමාරක්ෂක | ප.නි.සං.ප්‍ර.(PSDG) | 34,635,164.27 | නව | 34,635,164.27 | 20 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 1,000,000.00 | නව | 1,000,000.00 | 1 |
| | ප.ස.සං.ප්‍ර.(PSDG) | 11,435,164.27 | අවිච්ඡේද | 11,435,164.27 | 5 |
| 04. සමාජසේවා | ප.නි.සං.ප්‍ර.(PSDG) | 35,298,375.47 | නව | 35,298,375.47 | 9 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 5,276,178.67 | නව | 5,276,178.67 | 5 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | 4,701,624.53 | අවිච්ඡේද | 4,701,624.53 | 4 |
| 05. පරිසර | ප.ස.සං.ප්‍ර.(PCDG) | 7,500,000.00 | නව | 7,500,000.00 | 7 |
| 06. අමාත්‍යාංශීය කටයුතු | ප.ස.සං.ප්‍ර.(PCDG) | 2,500,000.00 | නව | 2,500,000.00 | 6 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## 04. පළාත් සමුපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ කර්මාන්ත සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ/නව | 2018 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01. සමුපකාර සංවර්ධනය | ප.නි.සං.ප්‍ර.(PSDG) | 2,000,000.00 | නව | 2,000,000.00 | 1 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 6,000,000.00 | නව | 9,532,350.00 | 7 |
| 02. කර්මාන්ත සංවර්ධනය | ප.නි.සං.ප්‍ර.(PSDG) | 40,000,000.00 | නව | 39,960,000.00 | 46 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 1,000,000.00 | නව | 1,000,000.00 | 2 |
| 03. ක්‍රීඩා | ප.නි.සං.ප්‍ර.(PSDG) | 15,771,610.00 | නව | 15,771,610.00 | 6 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 6,000,000.00 | නව | 6,000,000.00 | 4 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | 4,228,390.00 | අඛණ්ඩ | 4,228,390.00 | 4 |
| 04. ප්‍රවාහන | ප.නි.සං.ප්‍ර.(PSDG) | 29,000,000.00 | නව | 29,000,000.00 | 4 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | 700,000.00 | අඛණ්ඩ | 700,000.00 | 2 |
| 06. වෙළඳ හා ආහාර | ප.ස.සං.ප්‍ර.(PCDG) | 6,200,000.00 | නව | 6,200,000.00 | 5 |
| 07. යෞවන කටයුතු | ප.ස.සං.ප්‍ර.(PCDG) | 2,500,000.00 | නව | 2,500,000.00 | 6 |
| 08. අමාත්‍යාංශිය කටයුතු | ප.ස.සං.ප්‍ර.(PCDG) | 2,300,000.00 | නව | 2,300,000.00 | 8 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## 05. පළාත් ඉඩම්, වාරිමාර්ග, නිවාස, ග්‍රාම සංවර්ධන හා කාන්තා කටයුතු පිලිබඳ අමාත්‍යාංශය

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ/නව | 2018 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01.ඉඩම් | ප.නි.සං.ප්‍ර.(PSDG) | 9,000,000.00 | නව | 9,000,000.00 | 9 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 1,000,000.00 | නව | 1,000,000.00 | 2 |
| 02. වාරිමාර්ග | ප.නි.සං.ප්‍ර.(PSDG) | 110,000,000.00 | නව | 43,621,856.76 | 14 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 1,000,000.00 | නව | 1,000,000.00 | 1 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 4,439,771.78 | අඛණ්ඩ | 4,439,771.78 | 5 |
| | සාමුහික ප්‍රධාන(BG) | 163,310,000.00 | නව | 94,786,019.64 | 33 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | 59,479,425.48 | අඛණ්ඩ | 63,932,281.57 | 30 |
| | ප.ස.සං.ප්‍ර.(BG) | 14,329,878.26 | අඛණ්ඩ | 14,329,878.26 | 10 |
| 03. පළාත් මාර්ග | ප.නි.සං.ප්‍ර.(PSDG) | 415,000,000.00 | නව | 276,191,163.29 | 21 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 10,000,000.00 | නව | 10,000,000.00 | 12 |
| | ප.නි.සං.ප්‍ර.(PSDG) | 138,808,836.72 | අඛණ්ඩ | 138,808,836.72 | 11 |
| | වෙනත් ආදායම්(29) | 92,489,000.00 | නව | 92,489,000.00 | 2 |
| | ආයෝජන (30) | 42,316,091.26 | අඛණ්ඩ | 42,316,091.26 | 167 |
| 04. ග්‍රාම සංවර්ධන | ප.නි.සං.ප්‍ර.(PSDG) | 50,000,000.00 | නව | 50,000,000.00 | 30 |
| | ප.ස.සං.ප්‍ර.(PCDG) | 1,000,000.00 | නව | 1,000,000.00 | 1 |
| 05. කාන්තා කටයුතු | ප.ස.සං.ප්‍ර.(PCDG) | 10,000,000.00 | නව | 10,000,000.00 | 7 |
| 06. නිවාස | ප.නි.සං.ප්‍ර.(PSDG) | 15,000,000.00 | නව | 15,000,000.00 | 4 |
| 07. අමාත්‍යාංශිය කටයුතු | ප.ස.සං.ප්‍ර.(PCDG) | 1,000,000.00 | නව | 1,000,000.00 | 5 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ/නව | 2018 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය | ප.ස.සං.ප්‍ර.(PCDG) | 10,542,703.00 | නව | 10,542,703.00 | 17 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

පළාත් සභා ලේකම් කාර්යාලය

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ/නව | 2018 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් සභා ලේකම් කාර්යාලය | ප.ස.සං.ප්‍ර.(PCDG) | 22,500,000.00 | නව | 19,596,930.00 | 7 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ/නව | 2018 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 2,000,000.00 | නව | 1,795,666.00 | 5 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

ප්‍රධාන ලේකම් කාර්යාලය

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ/නව | 2018 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| ප්‍රධාන ලේකම් කාර්යාලය | ප.ස.සං.ප්‍ර.(PCDG) | 327,000,000.00 | නව | 324,009,258.25 | 17 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ/නව | 2018 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 7,227,000.00 | නව | 7,227,000.00 | 11 |
| පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව | ප.ස.සං.ප්‍ර.(PSDG) | 230,000,000.00 | නව | 228,922,673.33 | 253 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## පළාත් භාණ්ඩාගාරය

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ/නව | 2018 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් භාණ්ඩාගාරය | ප.ස.සං.ප්‍ර.(PCDG) | 130,200,000.00 | නව | 49,700,000.00 | 4 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ/නව | 2018 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් ඉංජිනේරු | ප.ස.සං.ප්‍ර.(PCDG) | 22,000,000.00 | නව | 22,000,000.00 | 10 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

### පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ෂණ දෙපාර්තමේන්තුව

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ/නව | 2018 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ෂණ දෙපාර්තමේන්තුව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 3,000,000.00 | නව | 3,000,000.00 | 3 |
| පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ෂණ දෙපාර්තමේන්තුව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 108,250.00 | අඛණ්ඩ | 108250 | 2 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

### පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

| සංරචකය | මූල්‍ය ප්‍රභවය | වෙන් කළ මුදල (රු.මි.) | අඛණ්ඩ/නව | 2018 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 6,709,134.00 | නව | 6,709,134.00 | 6 |
| පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 1,018,807.65 | අඛණ්ඩ | 1,018,807.65 | 3 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## උතුරු මැද පළාතේ ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘති ප්‍රගති සාරාංශය 2018.12.31 දිනට

| අනු අංකය | ප්‍රධාන ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන ලබා දෙන ආයතනය/රට | ක්‍රියාත්මක කරන ආයතනය | මුළු පිරිවැය (රු.මි.) | ව්‍යාපෘති කාලසීමාව | 2018.12.31 දිනට වියදම(රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් උතුරු මැද පළාත් සභාවේ ආයතන ශක්තිමත් කිරීම(UNDP) | UNDP | පළාත් සැලසුම් දෙපාර්තමේන්තුව, පළාත් ආදායම් දෙපාර්තමේන්තුව හා පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය | 16.80 | 2017-2018 | 10.31 | 61 | 80 |
| 2 | දේශගුණික වෙනස්කම්වලට මුහුන දීම සඳහා වූ වාරිමාර්ග කෘෂිකර්ම ව්‍යාපෘතිය(Cllimate Smarted Irrigated Agriculture Project) | World Bank(ලෝක බැංකුව) | - | - | 2018-2024 | | | |
| 3 | නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය(RIDEP) | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයJICA | පළාත් සභා,පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය | 3,201.00 | 2018-2022 | - | - | - |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

| අනු අංකය | ප්‍රධාන ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන ලබා දෙන ආයතනය/රට | ක්‍රියාත්මක කරන ආයතනය | මුළු පිරිවැය (රු.මි.) | ව්‍යාපෘති කාලසීමාව | 2018.12.31 දිනට වියදම(රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|---|
| 4 | පළාත් පාලන ආයතන ප්‍රවර්ධනය කිරීමේ ආංශික ව්‍යාපෘතිය ( පුරනැගුම) | ආසියානු සංවර්ධන බැංකුව(ADB) | පළාත් පාලන දෙපාර්තමේන්තුව (පුරනැගුම කාර්යාලය) | 2,630.56 | 2017-2020 | 470.93 (අනුරාධපුර 260.47,පොළොන්නරුව 210.46) | | 18.25 |
| 5 | ප්‍රාථමික සෞඛ්‍ය කටයුතු ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය(Primary Healthcare Strengthening In | ආසියානු සංවර්ධන බැංකුව | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 180.00 | - | - | | - |
| 6 | ප්‍රාථමික සෞඛ්‍ය කටයුතු ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය(Primary Healthcare Strengthening In | World Bank | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 202.00 | - | - | | - |
| 7 | දෙවන සෞඛ්‍ය ආංශික සංවර්ධන ව්‍යාපෘතිය | World Bank | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 484.24 | 2013-2018 | 460.1 | - | - |
| 8 | පාරිසරික සංවේදී කලාප සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය(ESA) | UNDP | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 2018 මි. 23.5(මුළු වටිනාකම ම.43කි) | වසර 01 | 12.4 | - | - |
| 9 | ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර මත ක්‍රියාත්මක වන අයි මාර්ග ව්‍යාපෘතිය(i- Roads) | ADB | මාර්ග සංවර්ධන අධිකාරිය | 1,657.00 | 2016.08.01 - 2021.07.31 | 1,243.00 | | 94.50 |
| | | | | 1,825.00 | | 1,351.00 | | 93.84 |
| | | | | 10,501.00 | | 8,095.00 | | 96.54 |
| | | | | 1,635.00 | | 1,290.00 | | 90.00 |
| | | | | 1,158.00 | | 876.00 | | 99.90 |
| | | | | 1,484.00 | | 1,065.00 | | 99.95 |
| | | | | 1,250.00 | | 1,018.00 | | 99.90 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

| අනු අංකය | ප්‍රධාන ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන ලබා දෙන ආයතනය/රට | ක්‍රියාත්මක කරන ආයතනය | මුළු පිරිවැය (රු.මි.) | ව්‍යාපෘති කාලසීමාව | **2018.12.31** දිනට වියදම(රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය **(%)** |
|---|---|---|---|---|---|---|---|---|
| 10 | උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය | ප්‍රංශ අරමුදල් | අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය(AIUDP) | 10,125.00 | | 121.7 | 10 | උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය |
| 11 | වැව්ගම් පුබුදුව(CRIWMP) | UNDP | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 8000 | 2017-2024 | 562.36 | | |
| | | | කෘෂිකර්ම අමාත්‍යාංශය (පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු සමග) | 40.47939<br>14.96784<br>4.36103<br>2.125947<br>69.887 | 2016-2021 | 0.17 | 0.2 | 15 (රු.මි. 61.93ක් වටිනා භාණ්ඩ ලබා ගැනීමට ටෙන්ඩර් පිරි නමා ඇත) |
| | | | කෘෂිකර්ම අමාත්‍යාංශය(පළාත් වාරිමාර්ග සහ වාරිමාර්ග දෙපාර්තමේන්තු සමග) | 162.91 | | 4.05 | 0.02 | 10 (වාරි කර්මාන්ත 18ක පුනරුත්ථාපන කටයුතු සඳහා රු.මි.146.05 ටෙන්ඩර් ප්‍රදානය කර ඇත) |
| | | | | | - | - | - | |

**මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

## පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන [PSDG] යටතේ වාර්ෂික මුදල් වෙන් කිරීම - 2018

| අංකය | අංශය | වෙන් කිරීම කිරීම (රු.මි) |
|---|---|---|
| **1** | **ප්‍රධාන අමාත්‍යාංශය** | **675** |
| 1.1 | අධ්‍යාපනය | 400 |
| 1.2 | පළාත් පාලනය | 160 |
| 1.3 | සංස්කෘතික හා ආගමික | 15 |
| 1.4 | සංචාරක | 70 |
| 1.5 | ග්‍රාමීය විදුලි | 30 |
| **2** | **කෘෂිකර්ම අමාත්‍යාංශය** | **272** |
| 2.1 | කෘෂිකර්ම | 127 |
| 2.2 | සත්ව පාලන | 90 |
| 2.3 | මිරිදිය ධීවර | 40 |
| 2.4 | අමාත්‍යාංශීය කටයුතු | 15 |
| **3** | **සෞඛ්‍ය අමාත්‍යාංශය** | **585** |
| 3.1 | බටහිර වෛද්‍ය | 375 |
| 3.2 | දේශීය වෛද්‍ය | 90 |
| 3.3 | සමාජ සේවා | 40 |
| 3.4 | පරිවාස හා ළමාරක්ෂක | 80 |
| **4** | **සමුපකාර අමාත්‍යාංශය** | **92** |
| 4.1 | සමුපකාර සංවර්ධනය | 02 |
| 4.2 | ප්‍රවාහන | 30 |
| 4.3 | ක්‍රීඩා | 20 |
| 4.4. | කර්මාන්ත සංවර්ධනය | 40 |

| අංකය | අංශය | වෙන් කිරීම කිරීම (රු.මි) |
|---|---|---|
| **5** | **වාරිමාර්ග අමාත්‍යාංශය** | **585** |
| 5.1 | වාරිමාර්ග | 110 |
| 5.2 | ඉඩම් | 10 |
| 5.3 | මහාමාර්ග | 400 |
| 5.4 | නිවාස | 15 |
| 5.5 | ග්‍රාමීය සංවර්ධනය | 50 |
| | **අමාත්‍යාංශ උප එකතුව** | **2209** |
| | නම්‍යශීලි අරමුදල යටතේ ඇති ව්‍යාපෘති | 48.544 |
| | විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන ව්‍යාපෘතිය | 230 |
| | **මුළු එකතුව** | **2487.55** |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## අමාත්‍යාංශ මට්ටමින් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන [PSDG] යටතේ අක් මුදල් නිදහස් කිරීම - 2018

| වැය ශීර්ෂය | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | නිදහස් කළ ප්‍රමාණය (රු) | වියදම (රු) |
|---|---|---|---|
| 610 | ප්‍රධාන අමාත්‍යාංශය | 619,243,588.17 | 596,121,245.62 |
| 611 | පළාත් පාලන දෙපාර්තමේන්තුව | 121,139,462.91 | 72,292,561.04 |
| 612 | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 1,000,000.00 | - |
| 613 | සංස්කෘතික දෙපාර්තමේන්තුව | 15,000,000.00 | 13,197,841.14 |
| 620 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 28,100,000.00 | 28,799,684.96 |
| 621 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 45,000,000.00 | 43,810,897.23 |
| 622 | සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව | 73,900,000.00 | 73,635,124.73 |
| 630 | සෞඛ්‍ය අමාත්‍යාංශය | - | - |
| 631 | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 245,000,000.00 | 247,474,244.66 |
| 632 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 85,100,000.00 | 85,100,020.00 |
| 633 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 34,200,000.00 | 33,917,447.35 |
| 634 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 31,500,000.00 | 31,824,761.75 |
| 640 | සමුපකාර අමාත්‍යාංශය | 10,000,000.00 | 7,678,976.81 |

මූලාශ්‍රය:- පළාත් භාණ්ඩාගාරය

| වැය ශීර්ෂය | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | නිදහස් කළ ප්‍රමාණය (රු) | වියදම (රු) |
|---|---|---|---|
| 641 | සමුපකාර දෙපාර්තමේන්තුව | 3,500,000.00 | 2,000,000.00 |
| 642 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 23,800,000.00 | 23,795,842.44 |
| 643 | ක්‍රීඩා දෙපාර්තමේන්තුව | 20,000,000.00 | 19,315,223.01 |
| 650 | වාරිමාර්ග අමාත්‍යාංශය | 257,000,000.00 | 276,617,334.15 |
| 651 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 97,700,000.00 | 103,144,244.99 |
| 652 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 7,025,000.00 | 7,444,967.23 |
| 653 | ග්‍රාමීය සංවර්ධන දෙපාර්තමේන්තුව | 19,500,000.00 | 19,458,965.69 |
| 660 | ප්‍රධාන ලේකම් කාර්යාලය | - | 897,762.73 |
| 661 | පළාත් භාණ්ඩාගාරය | - | - |
| 662 | සැලසුම් දෙපාර්තමේන්තුව | 120,720,775.25 | 179,305,765.78 |
| 663 | ඉංජිනේරු දෙපාර්තමේන්තුව | - | - |
| 664 | අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව | - | - |
| 665 | ආදායම් දෙපාර්තමේන්තුව | - | - |
| | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | - |
| | **එකතුව** | 1,858,428,826.33 | 1,865,832,911.31 |

මූලාශ්‍රය:- පළාත් භාණ්ඩාගාරය

## අමාත්‍යාංශ මට්ටමින් පළාත් සභා සංවර්ධන ප්‍රදාන [PCDG] යටතේ අක් මුදල් නිදහස් කිරීම - 2018

| වැය ශීර්ෂය | අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | නිදහස් කරන ලද මුදල(රු) | වියදම(රු) |
|---|---|---|---|
| 600 | ආණ්ඩුකාරවර කාර්යාලය | 4,505,000.00 | 6,838,283.25 |
| 601 | පළාත් සභා ලේකම් කාර්යාලය | 4,772,500.00 | 4,750,890.00 |
| 602 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 1,784,000.00 | 1,795,666.00 |
| 603 | සමුපකාර සේවක කොමිෂන් සභාව | 117,600.00 | 117,050.00 |
| 610 | ප්‍රධාන අමාත්‍යාංශය | 436,750,000.00 | 484,187,396.70 |
| 611 | පළාත් පාලන දෙපාර්තමේන්තුව | 1,726,600.00 | 1,549,273.30 |
| 612 | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 11,400,000.00 | 11,255,894.45 |
| 613 | සංස්කෘතික දෙපාර්තමේන්තුව | 8,500,000.00 | 8,441,200.00 |
| 620 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 1,810,000.00 | 2,071,657.38 |
| 621 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | - | 949,150.00 |
| 622 | සත්ව පාලන දෙපාර්තමේන්තුව | 4,350,000.00 | 5,342,470.00 |
| 630 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 3,700,000.00 | 3,324,888.85 |
| 631 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | - | 3,733,245.00 |
| 632 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 3,000,000.00 | 2,999,584.07 |
| 633 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 1,000,000.00 | 965,924.75 |
| 634 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 6,000,000.00 | 5,776,577.39 |
| 640 | සමුපකාර අමාත්‍යාංශය | 20,000,000.00 | 16,792,230.13 |
| 641 | සමුපකාර දෙපාර්තමේන්තුව | 5,600,000.00 | 8,421,595.54 |
| 642 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 1,000,000.00 | 978,914.98 |

මූලාශ්‍රය:- පළාත් භාණ්ඩාගාරය

| වැය ශීර්ෂය | අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | නිදහස් කරන ලද මුදල(රු) | වියදම(රු) |
|---|---|---|---|
| 643 | ක්‍රීඩා දෙපාර්තමේන්තුව | 6,000,000.00 | 5,835,234.85 |
| 650 | වාරිමාර්ග අමාත්‍යාංශය | 9,930,000.00 | 8,848,218.69 |
| 651 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 5,050,000.00 | 4,729,166.21 |
| 652 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 700,000.00 | 542,707.85 |
| 653 | ග්‍රාමීය සංවර්ධන දෙපාර්තමේන්තුව | 4,200,000.00 | 4,191,053.75 |
| 660 | ප්‍රධාන ලේකම් කාර්යාලය | 319,800,000.00 | 318,514,033.16 |
| 661 | පළාත් භාණ්ඩාගාරය | 48,000,000.00 | 50,153,788.75 |
| 662 | සැලසුම් දෙපාර්තමේන්තුව | 6,570,000.00 | 6,772,628.34 |
| 663 | ඉංජිනේරු දෙපාර්තමේන්තුව | 22,000,000.00 | 21,989,055.47 |
| 664 | අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව | - | 783,995.00 |
| 665 | ආදායම් දෙපාර්තමේන්තුව | 7,450,000.00 | 6,483,854.23 |
| | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | - |
| | **එකතුව** | 1,392,395,700.00 | 999,135,628.09 |

මූලාශ්‍රය:- පළාත් භාණ්ඩාගාරය

## රේඛීය අමාත්‍යාංශ යටතේ අක් මුදල් ලැබීම් - 2018

| අග්‍රිම ලබා දුන් රේඛීය අමාත්‍යාංශය/පොර්තමේන්තුව | ව්‍යාපෘතිය | ප්‍රතිපාදනය (රු) | ලැබූ අග්‍රිමය (රු) | නිකුත් කිරීම (රු) | වියදම (රු) |
|---|---|---|---|---|---|
| අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | ළඟම පාසල - හොඳම පාසල | 4,525,853,819.00 | 1,976,138,066.00 | 1,683,638,066.00 | 1,704,624,736.75 |
| සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය | සංචාරක - මූලධන | 40,727,730.00 | 40,727,727.07 | 40,727,727.07 | 39,569,871.72 |
| සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය | සංචාරක - පුනරාවර්තන | 147,000.00 | 147,000.00 | 147,000.00 | 147,000.00 |
| මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | හබරවත්ත එල්ලංගාව පුනරුත්ථාපනය කිරීම. | 25,315,058.00 | 7,202,509.87 | 23,430,922.82 | 19,311,552.10 |
| මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | පාරිසරික සංවේදී කලාප | 4,118,310.00 | 5,599,620.00 | 4,118,310.00 | 2,782,979.50 |
| මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | මහවැලි ගංගා ද්‍රෝණිය - සත්ත්ව නිෂ්පාදන | 4,104,600.00 | 4,104,600.00 | 4,104,600.00 | 4,104,600.00 |
| මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | මහවැලි ගංගා ද්‍රෝණිය - කෘෂිකර්ම දෙපා. | 5,516,000.00 | 1,103,200.00 | 1,103,200.00 | 3,009,407.00 |
| මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | වැව් ගම් පුබුදුව - වාරිමාර්ග දෙපා. | 1,307,190.00 | 1,307,188.80 | 1,307,188.80 | 806,484.67 |
| මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | වැව් ගම් පුබුදුව - කෘෂිකර්ම දෙපා. | 10,239,250.00 | 7,167,475.00 | 7,167,475.00 | 1,608,960.00 |
| නගර සැලසුම්,ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | නගර සැලසුම් - පළාත් පාලන මාර්ග වැඩි දියුණු කිරීම. | 37,251,766.00 | 37,251,763.80 | 37,251,763.80 | 37,251,764.11 |
| නගර සැලසුම්,ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | | - | 3,648,058.59 | 3,648,058.59 | 3,648,058.59 |

මූලාශ්‍රය:- පළාත් භාණ්ඩාගාරය

| අග්‍රිම ලබා දුන් රේඛීය අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ව්‍යාපෘතිය | ප්‍රතිපාදනය (රු) | ලැබූ අග්‍රිමය (රු) | නිකුත් කිරීම (රු) | වියදම (රු) |
|---|---|---|---|---|---|
| නගර සැලසුම්,ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | නගර සැලසුම් - වාරිමාර්ග වැඩි දියුණු කිරීම. | 5,627,573.00 | 5,627,570.74 | 5,627,570.74 | 5,627,570.74 |
| ක්‍රීඩා දෙපාර්තමේන්තුව | ක්‍රීඩා සංවර්ධන කටයුතු | - | 3,813,870.00 | 3,813,870.00 | 3,813,870.00 |
| කෘෂිකර්ම,ග්‍රාමීය ආර්ථික කටයුතු,පශු සම්පත් සංවර්ධන,වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | ජීවනෝපාය සංවර්ධනය කිරීම. | 1,847,889.00 | 1,847,888.31 | 1,847,888.31 | 1,847,888.31 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | අපි වවලයි අපි කන්නේ | 3,509,810.00 | 3,509,810.00 | 3,509,810.00 | 3,509,810.00 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | ලොකු ළූණු නිෂ්පාදන ඉහළ නැංවීම | 3,476,250.00 | 3,476,250.00 | 3,476,250.00 | 3,460,500.00 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | කෘෂිකර්ම නව්‍යකරණ ව්‍යාපෘතිය | - | 1,611,744.79 | 1,611,744.79 | 1,611,744.79 |
| අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | වෙළඳ සංකීර්ණය - තමන්කඩුව | 210,000,000.00 | 173,495,311.43 | 152,000,000.00 | 167,469,861.30 |
| අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | පැරකුම් ළමා නිවාසය හා බෝසත් ළමා නිවාසය අළුත්වැඩියාව | 2,573,953.00 | 2,281,498.46 | 2,281,498.46 | 1,449,797.10 |
| අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | අශෝක ළමා නිවාසය අළුත්වැඩියාව | 4,175,000.00 | - | - | 3,129,446.30 |
| අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | කඩිනම් ජාතික ආහාර නිෂ්පාදනය | 15,009,675.00 | 14,796,072.25 | 14,796,072.25 | 14,796,072.25 |
| තිරසර සංවර්ධන හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය | තිරසර සංවර්ධනය පිළිබඳ නිළධාරීන් දැනුවත් කිරීම. | - | 1,000,000.00 | 1,000,000.00 | 1,000,000.00 |
| සෞඛ්‍යය,පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ඔසු උයන් සඳහා නළ ළිං සකස් කිරීම. | 2,836,659.00 | 2,836,659.00 | 2,836,659.00 | 2,836,659.00 |
| සෞඛ්‍යය,පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | ආයුර්වේද රෝහල 03 වන මහළ ඉදි කිරීම. | 21,721,600.00 | 18,375,857.04 | 18,375,857.04 | 18,375,857.04 |
| | **මුළු එකතුව** | **4,925,359,132.00** | **2,317,069,741.15** | **2,017,821,532.67** | **2,045,794,491.27** |

මූලාශ්‍රය:- පළාත් භාණ්ඩාගාරය

## උතුරු මැද පළාත් කළමනාකරණ හා සංවර්ධන පුහුණු ඒකකයේ ලියාපදිංචි සම්පත්දායක සංචිතය

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර හා සේවා ස්ථානය | දුරකථන අංකය |
|---|---|---|---|
| 1 | ජී.ඩී. කීර්ති ගමගේ මයා | ලේකම්,සෞඛ්‍ය අමාත්‍යාංශය | 077-3616468 |
| 2 | ආනන්ද කුලරත්න මයා | ලේකම්, ආණ්ඩුකාර කාර්යාලය | 071-4178291 |
| 3 | ඩී.එච්.එම්.එන්.පී. දසනායක මිය | ලේකම්, සමූපකාර අමාත්‍යාංශය | 077-3604296 |
| 4 | එල්.පී. මදනායක මයා | අතිරේක දිස්ත්‍රික් ලේකම් - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,අනුරාධපුර | 071-8042800 |
| 5 | එස්.එම්.එස්. බන්දුලසේන මයා | අතිරේක දිස්ත්‍රික් ලේකම් - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,අනුරාධපුර | 071-0361215 |
| 6 | ජී.ඒ. කිත්සිරි මයා | ප්‍රාදේශීය ලේකම් - මධ්‍යම නුවරගම් පළාත | 071-4459091 |
| 7 | එන්.එච්.ආර්. නිශාන්ත මයා | ප්‍රාදේශීය ලේකම් - කහටගස්දිගිලිය | 071-8105505 |
| 8 | අනුරාධ සීබට් මයා | සහකාර ප්‍රාදේශීය ලේකම් - කහටගස්දිගිලිය | 071-3728952 |
| 9 | කේ.ඩබ්.එච්.එම්.ඒ.සී.කේ. හේරත් මයා | ව්‍යවසායකත්ව සංව. පුහුණු නිල.- දි.ලේ.කා අ/පුර | 071-9658076 |
| 10 | නිලංක පුෂ්ප කුමාර මහතා | ව්‍යවසායකත්ව සංව. පුහුණු නිල.- දි.ලේ.කා අ/පුර | 071-2434141 |
| 11 | ඩී.ජී.ඩබ්.සඳපානි ධර්මසේන මිය | ඵලදායිතා සංව. නිලධාරී,දි.ලේ.කා,අ/පුර | 071-8006984 |
| 12 | ටී.එම්.කේ.බී.ප්‍රේමතිලක මයා | පළාත් අධ්‍යක්ෂ,කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 071-8347904 |
| 13 | පී.එච්.එම්.අයි.විජයබණ්ඩාර මිය | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 077-6214446 |
| 14 | අජන්ත ගුණවර්ධන මයා | සමාජ සේවා අධ්‍යක්ෂ | 071-8003969 |
| 15 | එච්.එම්. ප්‍රියදර්ශන හේරත් මයා | මානව සම්පත් නිලධාරී - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,තඹුත්තේගම | 071-8075837 |
| 16 | එම්.එන්.ආර්.බී. නවරත්න මයා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය | 071-4874377 |

මූලාශ්‍රය:- පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර හා සේවා ස්ථානය | දුරකථන අංකය |
|---|---|---|---|
| 17 | ඩී.එම්.සී.කේ. චන්ද්‍රදාස මිය | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) | 071-8227373 |
| 18 | කේ.ඒ. නොයෙල් මයා | සහකාර ලේකම් (සැලසුම්) - සැලසුම් දෙපාර්තමේන්තුව | 071-8104174 |
| 19 | එස්.වී. ද සේරම් මහතා | සහකාර ලේකම් (විශ්‍රාමික) | 071-6801481 |
| 20 | රේණුකා කුමාරි හේරත් මිය | ප්‍රාදේශීය ලේකම්. - තිරප්පනේ | 071-8226767 |
| 21 | පී. සෝමලතා මිය | පරිපාලන නිල. - සමූපකාර දෙපාර්තමේන්තුව | 077-8883845 |
| 22 | ඩබ්.එම්.ඩබ්.කේ. විජේසිංහ මිය | පරිපාලන නිලධාරී - කළාප අධ්‍යා.කා. කැකිරාව | 075-8216023 |
| 23 | වෛද්‍ය ඩබ්.එම්.එස්. ප්‍රනාන්දු මයා | කථිකාචාර්ය - රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලය | 077-3417444 |
| 24 | නිලූකා ඩී. තිලකරත්න මිය | 718, 2 වන පියවර, අනුරාධපුරය | 7175750616 |
| 25 | ඒ.ජී.එල්.එස්. රණසිංහ මිය | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 071-8276106 |
| 26 | ඩී.එම්.ආර්.ටී.බී. දිසානායක මයා | සංවර්ධන සහකාර -සමාජ සේවා දෙපාර්තමේන්තුව | 077-6201392 |
| 27 | පී.ජී. මාලනී මාග්‍රට් මිය | සංවර්ධන සහකාර -සමාජ සේවා දෙපාර්තමේන්තුව | 071-8096302 |
| 28 | රවීන්ද්‍රා කුමාරි වික්‍රමසිංහ මිය | සංවර්ධන සහකාර -සමාජ සේවා දෙපාර්තමේන්තුව | 071-8096301 |
| 29 | තුෂාරා දමයන්ති මිය | සංවර්ධන සහකාර -සමාජ සේවා දෙපාර්තමේන්තුව | 077-3396080 |
| 30 | ආර්.එම්.ඩබ්.එස්.බී. රත්නායක මයා | පරිපාලන නිලධාරී - කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය | 724084995 |
| 31 | ආර්.එම්.ඩබ්.ඩී. රත්නායක මයා | සහකාර ලේකම් (සැලසුම්) - සැලසුම් දෙපාර්තමේන්තුව | 071-8476064 |
| 32 | ඩී.බී. ජයතිලක මයා | කුඹුක්වැව, කැකිරාව | 077-0825118 |
| 33 | කේ.එම්. ගුණරත්න බංඩා මහතා | පරිපාලන නිලධාරී - දි.ලේ. කාර්යාලය | 025-2235048 |
| 34 | ටී.බී.එස්. ජිනාදරී මිය | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - ක.අ.කා. කැකිරාව | 071-9051380 |
| 35 | එම්.කේ. සෙනෙවිරත්න මයා | සහකාර අ.අ. - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 071-6554205 |
| 36 | බී.එම්.එන්. අබේරත්න මයා | සහකාර අ.අ. - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 077-3419148 |
| 37 | එම්.එන්.ආර්.බී. නවරත්න මයා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය | 071-4874377 |

**මූලාශ්‍රය:- පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය**

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර හා සේවා ස්ථානය | දුරකථන අංකය |
|---|---|---|---|
| 38 | ජේ.එම්.කේ.ආර්. බණ්ඩාර මයා | සහකාර අ.අ. - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 071-2221975 |
| 39 | ටී.එස්.සී. පෙරේරා මිය | සහකාර ලේකම් (පාලන) - ප්‍රධාන අමාත්‍යාංශය | 714870596 |
| 40 | එම්.ඒ. ප්‍රේමලතා මිය | පරිපාලන නිලධාරී (විශ්‍රාමික) | 071-4429660 |
| 41 | ආර්.එම්. වන්නිනායක මයා | ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 072-3458242 |
| 42 | එස්.එන්. ආරියරත්න මෙය | සහකාර අධ්‍ය. (සැලසුම්) | 071-7101131 |
| 43 | එන්.ජී. ගුරුගේ මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - රජරට විශ්ව විද්‍යාලය | 071-4458753 |
| 44 | එස්.එම්. ඉන්ද්‍රානී මිය | සහකාර අ.අ. - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 071-8613032 |
| 45 | එල්.එස්. පතිරාජ මයා | ගණකාධිකාරී,දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 071-8165740 |
| 46 | මහාචාර්ය එස්. හෙට්ටිආරච්චි මයා | මහාචාර්ය - රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලය | 071-8508500 |
| 47 | ආචාර්ය ටී.වී. සුන්දරභාරතී | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලය | 071-8265938 |
| 48 | ආචාර්ය ටී.සී. බමුණුආරච්චිගේ | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලය | 071-8096400 |
| 49 | ආචාර්ය පී.එන්. යාපා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලය | 071-8265938 |
| 50 | පී.බී. දයාරත්න මයා | නි.ප්‍ර.ලේ.(සැලසුම්) - සැලසුම් දෙපාර්තමේන්තුව | 071-6303356 |
| 51 | ඩී.එම්.එස්. දිසානායක මයා | අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන ) - ප්‍රධාන අමාත්‍යාංශය | 071-8272764 |
| 52 | පී.ඒ.යූ. රණසිංහ මයා | සහකාර ලේකම් (සැලසුම්) - සැලසුම් දෙපාර්තමේන්තුව | 071-4416446 |
| 53 | එස්.එම් හලීම් මයා | පද්ධති පරිපාලක, ප්‍රධාන ලේකම් කාර්යාලය | 077-5045100 |
| 54 | ජේ.එස්.වළාකුළුආරච්චි මයා | කළමනාකරණ සහකාර, පළාත් භාණ්ඩාගාරය | 077-2299722 |
| 55 | එම්.එස්.එම්. කාසිම් මයා | ග්‍රාම නිලධාරී, ප්‍රා.ලේ.කා. හොරොව්පොතාන | 077-3673545 |
| 56 | එන්.එස්. ජයවර්ධන මිය | 2425, 3 පියවර, අනුරාධපුර | 077-4613446 |
| 57 | රත්නසිරි ද සිල්වා මයා | විගණන කාර්යාලය, අනුරාධපුර. | 077-3746001 |

මූලාශ්‍රය:- පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර හා සේවා ස්ථානය | දුරකථන අංකය |
|---|---|---|---|
| 58 | සී.එම්.එස්.පී. ප්‍රේමරත්න මයා | ග්‍රාම නිලධාරී, ප්‍රා.ලේ.කා. හොරොව්පොතාන | 071-8335646 |
| 59 | ආර්.එම්.ඩී. රාජපක්ෂ මයා | ව්‍යා.සංව. පුහුණු නිල., දි.ලේ.කා. අනුරාධපුර | 025-2221909 |
| 60 | වයි.ජී. සුමනාවතී මිය | ගුරු උපදේශක - කො.අ.කා. රඹෑව | 071-3383396 |
| 61 | ඒ.එම්.එච්.රංජනී මෙය | කළ.සහකාර සේවය අධි පන්තිය, කලාප අධ්‍යාපන කාර්යාලය, හිඟුරක්ගොඩ. | |
| 62 | ජේ.එම්.ජේ.උපුල්වැහැර මයා | ශ්‍රී ලං. ප.ප.සේ. (විශ්‍රාමික) | 077-3961559 |
| 63 | කුලතුංග බී. හෙට්ටිආරච්චි මයා | ශ්‍රී ලං. ප.ප.සේ. (විශ්‍රාමික) | 077-6060669 |
| 64 | එච්.ජී.එන්.සම්පත් මයා | ගණකාධිකාරී III - දි.ලේ.කා. අනුරාධපුර | 071-5530800 |
| 65 | කේ.ජී.එස්.පී.වීරකෝන් මයා | ප්‍රධාන අභ්‍යා. විගණක, අභ්‍යා. විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව | 071-2293822 |
| 66 | ඒ.විමලරත්න මයා | අධ්‍යක්ෂ (අයවැය), පළාත් භාණ්ඩාගාරය | 071-8167240 |
| 67 | පී.ඒ.ඩී.එම්.ඩී. පොන්වීර මයා | අධ්‍යක්ෂ (මුදල් හා ආදායම්), - එම - | 071-5350548 |
| 68 | ඩබ්.ටී.ඒ. මානෙල් මිය | ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය, උ.මැ.ප. | 071-4544925 |
| 69 | ආර්.එච්. ඒකනායක මයා | පරිපාලන නිලධාරී, මාර්ග සංව.අධි. උ.මැ.ප. | 071-8076622 |
| 70 | කේ.පී.සී.පී.කරුණානායක මයා | ප්‍රධාන ගණකාධිකාරී, ප්‍රධාන අමාත්‍යාංශය | 071-8101581 |
| 71 | එච්.කේ.ජී. නිරෝෂණා මිය | සහකාර දිස්ත්‍රික් ලේකම්, දි.ලේ.කා. පොළොන්නරුව | 077-7003980 |
| 72 | ඩී.එම්. රුවන් ප්‍රසන්න මයා | ඵලදායිතා නිලධාරී,දි.ලේ.කා,පොළොන්නරුව | 071-2107113 |
| 73 | කේ.ඒ.එස්.පී. විමලරත්න මයා | රාජ්‍ය කළ. සහ. දි.ලේ.කා,පොළොන්නරුව | 071-3013190 |
| 74 | පී.ආර්.එන්.කේ. විජේසිංහ මයා | විමර්ශන නිලධාරී, දි.ලේ.කා,පොළොන්නරුව | 071-8319360 |
| 75 | එම්.එම්.එස්.පී. හේරත් මයා | විමර්ශන නිලධාරී, දි.ලේ.කා,පොළොන්නරුව | 071-9545724 |
| 76 | ජී.ඩී. නයනා ඉන්දුමතී මිය | දිස්ත්‍රික් ළමා හිමිකම් ප්‍ර.නිල. දි.ලේ.කා,පොළොන්නරුව | 071-8568430 |

මූලාශ්‍රය:- පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර හා සේවා ස්ථානය | දුරකථන අංකය |
|---|---|---|---|
| 77 | එච්.එම්.ඒ.සී. බණ්ඩාර මයා | රාජ්‍ය නොවන සංවිධාන දි. සම්බන්ධීකාරක | 071-4334182 |
| 78 | ආර්.ජී. ධර්මසේන මයා | දි. සංඛ්‍යා ලේඛනඥ, දි.ලේ.කා,පොළොන්නරුව | 071-8133332 |
| 79 | වයි.ඒ.එන්.එම්. ගුණවර්ධන මිය | පරිපාලන නිලධාරී,ප්‍රා.ලේ.කා. දිඹුලාගල | 077-1817302 |
| 80 | එච්.පී.පී.ආර්.පතිරණ මයා | රා.කළ.සහකාර I ශ්‍රේණිය, ප්‍රා.ලේ.කා, දිඹුලාගල | 071-9754185 |
| 81 | මනෝජි තිලක්ෂිකා ගුරුසිංහ මිය | රා.කළ.සහකාර II ශ්‍රේණිය, ප්‍රා.ලේ.කා, දිඹුලාගල | 071-1015557 |
| 82 | එම්.එල්.රේඛා මිය | රා.කළ.සහකාර II ශ්‍රේණිය, ප්‍රා.ලේ.කා, දිඹුලාගල | 071-6904782 |
| 83 | ඩබ්.එම්.ඒ.වීරකෝන් මයා | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ටර්, ප්‍රා.ලේ.කා, දිඹුලාගල | 071-8046871 |
| 84 | ඩබ්.එම්.යූ.පී.වික්‍රමසිංහ මයා | සංවර්ධන නිලධාරී, ප්‍රා.ලේ.කා, දිඹුලාගල | 071-1094359 |
| 85 | බී.ඩී.කේ.චන්ද්‍රසේන මයා | දිස්ත්‍රික් ඉංජිනේරු III ශ්‍රේණිය, දි.ලේ.කා.පොළොන්නරුව | 077-2396325 |
| 86 | ජයන්ත ධනපාල | සහකාර අධ්‍යක්ෂ, දි.ලේ.කා.පොළොන්නරුව | 077-5688669 |
| 87 | එස්.එම්.කේ.කුමාරිහාමි මිය | ප්‍රාදේශීය ලේකම්, ප්‍රා.ලේ.කා, ඇළහැර | 077-4332338 |

මූලාශ්‍රය:- පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය